

මහාකවි කාලිදාසයන්ගේ

# අභිඥානශාකුන්තලය



# අභිඥාන ශාකුන්තලය



K. Jinada

මහා කවි කාලිදාසයන් ගේ

# අභිඥානශාකුන්තලය

සම්පාදකවරු

පැළෑණේ පණ්ඩිත වජිරවංස ස්ථවිර
තුඩාවේ පණ්ඩිත හෙමාලොක ස්ථවිර

ප්‍රකාශක

ඇස්. වී. සෙනෙවිරත්න මහතා

මුද්‍රණය

රත්න මුද්‍රණාලය ය
අංක 163, පළමු වැනි මරදාන - කොළඹ 10

මිල රු. 5 යි

2499
—— 3. 5
1956

# උපහාරය

මෙ වත් තැනකට අප පුදුසු කළ
පාණදුරේ පල්ලිමුල්ලේ වාලුකාරාමාධීශ්වර,
ම්‍රම්මවංශාඛ්‍ය අමරපුර නිකායයේ කාරකසභාසද,
"ම්‍රම්මවංශාලඞ්කාර වාගීශ්වර ශ්‍රී සද්ධර්ම"
අතිගරු මිහිරිපැන්නේ ජොතිපාල මහා
සථවිර ස්වාමි පාදයන් වහන්සේට
මෙය උපහාර වේ වා.

මෙහි සම්පූර්ණ හිමිකම් ප්‍රකාශකයන් සතු යැ.

# පූර්විකා

අප දන්නා තරමින් ප්‍රථම සංස්කෘත නාටක රචකයා භදන්ත අශ්වඝොෂ ස්වාමී යැ. ඔවුන් ගේ ශාරිපුත්‍ර ප්‍රකරණයෙන් ඇරැඹුණු නාට්‍ය ග්‍රන්ථ කරණය භාසාදි කවීන් ගෙන් පොෂිත විය. කාලිදාස මහා කවීන් ගේ කාලය වන විටැ එය ඉතා උසස් තත්ත්වයෙකැ වැජැඹුණු බවට සැකයෙක් නැති. කාලිදාසයන් ගේ නාට්‍ය ග්‍රන්ථ ඒ සා ප්‍රසාදවහ වූයේ එ කලැ නාට්‍ය කලාව හැම අතින් මැ සමෘධිය කරා ගමන් ගෙනැ තුබූ හෙයිනි.

එහෙත් සංස්කෘත නාටක රචකයන් හැම දෙනකු මැ වාගේ ස්විය නිෂ්පාදනයනට මූල වස්තුව (කතා පුවත) ගත්තේ මහා භාරතයෙන් හෝ රාමායණයෙනි. ඔවුහු ගතානුගතික සම්ප්‍රදායයන් බදා ගැනීම නිසා නාට්‍ය කලාව විකාශනය වූයේ මඳ මඳ විසිනි. දෙව කථා, රාජ කථා, හා වීර කථා ඇසුරු කොටැ ආගමික හැඟීම් ඉස්මතු කිරීම පරමාර්ථය ලෙස ගත් බව පැහැදිලි යි. කාලිදාසයෝ ද සිය අභිඥාන ශාකුන්තලය රුසසිමෙහි දී සමය පූජීක හැඟීම් මුල් කොටැ ගෙතුණු මහා භාරතයෙහි ශකුන්තලොපාඛ්‍යානයෙහි ශ්ලොක 588 කින් පරිමිත, ඓතිහාසික පුවතක් සිය නාට්‍යයෙහි වස්තුව සේ ගත්හ. එය වේදිකාවට සුදුසු සේ දිග හැරැ සරසා වෙනස් කොටැ ඔහු ගේ අසහාය කවිත්වයෙන් ඔපලා ලොවට දුන් හ.

## මහා භාරත පුවත

දුෂ්‍යන්ත රජු දිනක් මහසෙන් ගෙනැ මුව දඩ පිණිස ගියේ මුවකු ලුහු බඳිද්දී අහම්බෙන් මෙන් කසුප් අසපුව වෙතැ පැමිණියේ යැ. සිය සේනාවෙන් වියොවැ හුදකලා වැ අසපුව තුලට වන් ඔහු ශකුන්තලාවන් දකැ ඇගේ දිව්‍යමය රූසපුවෙන් විස්මිත විය. කසුප් තවුසා පලවැල පිණිස බැහැර ගොස් සිටියෙන් ඇය ගෙන් සියලු තොරතුරු දැනගත් රජු

ඇයට විවාහ යෝජනා කෙළේ යැ. තවුස් නාවන් එන තෙක් ඉවසන්නට ඕ ඔහුට කීවා යැ. එතෙක් ඉවසා සිටීමට නො හැකි වූ රජු ගේ ඇවැටිල්ල නිසා ගාන්ධර්ව විවාහයකට ඇය සතුටු වූවා යැ, ඔහු ගෙන් ඇයට ලැබෙන පුතුට රාජ්‍යය පවරන පොරොන්දුවෙන් බැදී. මෙ සේ අඹු සැමියන් වැ මද වේලාවෙකින් රජු සිය නුවරට ආපසු ගියේ ඇය කැඳවා ගෙනෑ ඊමට හමුදාවක් එවන බැව් පවසමිනි. දුෂ්‍යන්ත පිටත් වැ ගිය නොබෝ වේලාවෙකින් කසුප් තවුසා පලවැළත් ගෙනෑ අසපුවට පැමිණියේ යැ. ශකුන්තලා ලජ්ජාවෙන් නමුත් තවුසාට සිදු වූ සියල්ල කීවා යැ. සිය දිවැසින් ඇය ගැබනියක බව දත් හේ එය අනුමෝදන් වැ සිය සතුට ද පළ කෙළේ යැ. දින, මාස, අවුරුදු ගත විය. කිසිවෙක් නම් නො පිවිසියේ යැ ඇය කැඳවා ගෙනෑ යාමට රජවාසලින්. පුරා හවුරුදු 3 ක් ගෙවී ගිය පසු ඇය පුතකු ලැබුවා යැ. ඔහු ගේ උපතත් සමග මල් වැසි වසින්නට විය. ඉන්ද්‍රයා ද ඔහු අනාගත සක්විත්තකු බවට අනාවැකි ද පළ කෙළේ යැ. කුඩා කලැ සිටැ මැ කුමරු යක්ෂ රාක්ෂසාදීන් හා සිංහ ව්‍යාඝ්‍රාදි භීෂණ සතුන් ද මරන්නටත් මැඩලන්නටත් ඇරැඹි. එහෙයින් හේ තවුසන් විසින් සර්වදමන යැ යි නම් කැරිණි. සර්වදමන නව හැවිරිදි වියෙහි වූයේ ශකුන්තලාවනට පිය තවුසා ගෙන් දුෂ්‍යන්ත රාජධානියට යන්නට අණ ලැබිණි පුතු ගේ අකීකරුකම් නිසා මෙ බඳු අණක් ලැබිණැ යි සිතා දුකට පත් ශකුන්තලා සිය පුතු වෙනුවෙන් සමාව යැද්දා යැ එහෙත් එයට නිශ්ශබ්ද වූ කසුප් තෙමේ අසපුවෙහි වූ තවුසන්හට ඇය සමග **ප්‍රතිෂ්ඨානයට** යාමට අණ කෙළේ යැ. මෙ සේ තවුසන් පිරිවැරූ ඕ **ප්‍රතිෂ්ඨානයට** ගියා යැ තවුසන් සමග. නුවරු ශකුන්තලාවන් ගේ හා සර්වදමනයන් ගේ ආකෘතියෙන් ඇලැලී ගියෝ යැ. එහෙත් ජටාධර විවර්ණ වත් හැඳි තවුසන් නො රිස්සූ හ ඇතැමෙක්. නුවරුන් ගේ හැසිරීමෙන් කළකිරුණු තවුසෝ ශකුන්තලාවන් හා සර්වදමන ද තනි කොටැ පලාගියෝ යැ. පුතු සමග හුදකලා වැ රජු ඉදිරියට ගිය ඕ ඔවුන් ගේ අතීත තොරතුරු රජුට කීවා යැ. ලොකාපවාදයට බිය වූ රජු ඇයට නින්දා කොටැ

ඈය පලවා හැරියේ යැ. කෝපයෙන් හා දුකින් හද පැරුණු බි ආපසු තපෝවනයට පා නැගුවා යැ. එ කෙණෙහි ඈය දුෂ්‍යන්ත ගේ බිරිය බවත් පුතා ඔහු ගේ මැ බවත් පවසන දෙව වාණියක් අහසින් ඇසුණි. මල් වැසි ද වසින්නට විය. එයින් ප්‍රමුදිත වූ දුෂ්‍යන්ත ශකුන්තලාවන් හා පුතු පිළිගෙනැ ඔහුට යුව රජය ද පැවැරී යැ,

## වෙනස

මහා භාරතයෙහිත් අභිඥාන ශකුන්තලයෙහිත් එන මේ කතා පුවතෙහි ඇතැම් තැන්වලැ බෙහෙවින් එකිනෙකට වෙනස් තැන් වේ. කාලිදාස කවියා එය ස්වාභාවිකත්වයට මෙන් මැ වේදිකාවට ද ගැලැපෙන සේ වෙනස් කරන්නට ඇතැයි සිතියැ හැකි. මහා භාරත පුවතෙහි දුෂ්‍යන්ත-ශකුන්තලා- සර්වදමන- කාශ්‍යප යන සිවු දෙනකු ගේ චරිත පිළිබිඹු වී ඇතත් ඔවුන්ගෙන් මැ පමණක් නාට්‍යයක් රඟ දැක්වියැ නො හැකි, එහෙයින් හේ ඔහු ගේ ශකුන්තලා-වෙහි තුන් තිසක් පමණ චරිත නිරූපනය කළහ. තම විසින් නවත් චරිත නවයක් පමණ ඇඳූ හ. මේ වෙනස් නම් වැඩියක් **පද්ම පුරාණයෙන්** ගත්තේ යැ යි ඇතමකු ගේ මතයෙකි. පද්ම පුරාණයෙහි හා අභිඥාන ශාකුන්තලයෙහි වදන් සමානකම හා සිඞින් ගේ සමානත්වය බෙහෙවින් ඇතත් **පද්ම පුරාණය කාලිදාසට** පෙරැ ලියැවිණැ යි ඔප්පු කළ හැකි ප්‍රබල සාධක නැති හෙයින් හා පද්ම පුරාණය **කාලි-දාසයනට** පසු වැ ලියැවිණි නම් අභිඥාන ශාකුන්තලයෙන් එයට ආභාෂය ලැබියැ හැකි හෙයින් හා තත් මතය අනාථ වේ. පද්ම පුරාණයේ හෝ මහා භාරතයෙහි හෝ නැති අභිඥාන මුදුවකින් සිය නාට්‍යය සැරසුවේ **කට්ඨහාරී ජාතකය** ඇසුරෙනැයි බොහෝ විඥයෝ සිතති, බෞද්ධ ජාතක කථා වස්තූන් කාලිදාසට පෙරැ සිටැ භාරතයෙහි ප්‍රචලිත වැ තුබුණු හෙයින් හා ජාතක කථා බොහොමයක් ජනකථා ඇසුරෙන් පොෂිත වැ ඇති බව පිළිගෙනැ ඇති හෙයින් හා එය එ සේ වන්නට ඇති.

## ප්‍රමාණය

අභිඥාන ශාකුන්තලය ජවනිකා 7 කින් හා ඇතැම් ජවනිකා එකිනෙකට යා කැරෙන අතුරු ජවනිකා නම් ප්‍රසථාවතා වෙකින්ද (1–ජවනිකා) විෂ්කම්භක යුගලයෙකින් ද (3–4–ජවනිකා) ප්‍රවේශකයෙකින් ද (6–ජවනිකා) යුතු යැ.

## භාෂා

රාජ ඍෂි ආදීහු **සංස්කෘතය** ද, විදූෂකාදීහු **ප්‍රාකෘතය** ද කාන්තාවෝ **ශෞරශෙනිය** ද සේවකාදීහු **මාගධිය** ද ව්‍යවහාර කළහ.

## අප ගේ තැත

සංස්කෘත නාට්‍ය ග්‍රන්ථයන් අතරැ සිළුමිණි අභිඥාන ශාකුන්තලය මෙ තෙක් සිය බසින් රස විඳිමට මහෙක් නො වී යැ. කතා පුවත කෙටියෙන් සංගෘහිත වැ පළ කැරුණු පොත් දෙකක් ඇතත් එවායින් ශකුන්තලාවෙහි ඇති රසය විදි ලෙසින් විඳීමට පිහිටක් නැති බැව් ඔබ දතිති. ප්‍රාචීන අවසාන විභාගයට ද 1955 සිටැ නියමවැ ඇතත් මෙතෙක් කිසිවකු ගෙන් මෙයට ව්‍යාඛ්‍යාදියක් පළ නො විණි. අප හිත වත් කිහිප දෙනකු ගේ මෙහෙයීම නිසා දුබල විසින් හෝ අප ගෙන් මේ තැත දැරිණි.

## අනුවාදය

සංස්කෘත නාට්‍ය ග්‍රන්ථ ලියැ වී ඇත්තේ ද අන් බස්හි මෙන් දෙඩන බසිනි. එ ද එක් බසෙකින් නො වැ කිහිප යෙකිනි. දෙඩන බසෙහි හා ලියන බසෙහි පරතරය අති මහති, එහෙයින් ම එය තවත් බසකට හැරැවීමෙහි දී ඇති දුෂ්කරතා එමට යැ. එය ද, හැරැවෙන බසෙහි දෙඩන බසට සුදුසු සේ කළ යුතු යැ. එ වැනි ප්‍රයත්නයෙකැ දී නාට්‍යය ලියැවුණු බසේ වචනාර්ථ පවා නො තකා හැරීමට සිදු වෙයි. හැරැවෙන බසේ දෙඩන බස උපයෝගී කළ යුතු හෙයින්, මෙහි ලා

**සූත්‍රධාරඃ**- (නෙපථ්‍යාභිමුඛමවලෝක්‍ය) ආර්‍යේ, යදි නෙපථ්‍ය-විධානමවසිතම්, ඉතස්තාවදාගම්‍යතාම්.

**නටී**- (ප්‍රවිශ්‍ය) අජ්ජඋත්ත, ඉඅං ම්හි. ආණවේදු අජ්ජෝ කෝ ණිඕඕ, අණුචිට්ඨීඅදු ත්ති. [ආර්‍යපුත්‍ර, ඉයමස්මි. ආඥාපයතු ආර්‍යඃ කෝ නියෝගෝ'නුෂ්ඨීයතාමිති.]

**සූත්‍රධාරඃ**- ආර්‍යේ, අභිරූපභූයිෂ්ඨා පරිෂදියම්. අද්‍ය ඛලු කාලිදාසග්‍රථිතවස්තුනා'භිඥාන ශාකුන්තලනාමධේයේන නවේන නාටකේනෝ'පස්ථාතව්‍යමස්මාභිඃ. තත්ප්‍රතිපාත්‍ර-මාධීයතාං යත්නඃ.

**නටී**- සුවිහිදප්පඕඅදාඑ අජ්ජස්ස ණ කිං වි පරිහාඉස්සදි. [සුවිහිතප්‍රයෝගතයා'ර්‍යස්‍ය න කිමපි පරිහාස්‍යතේ.]

**සූත්‍රධාරඃ**- ආර්‍යේ, කථයාමි, තේ භූතා'ර්ථම්—

2. ආ පරිතෝෂාද්විදුෂාං න සාධු මන්‍යේ ප්‍රයෝගවිඥානම්
බලවද'පි ශික්ෂිතානාමාත්මන්‍යප්‍රත්‍යයං චේතඃ.

**නටී**- එවං ණේදං. අණන්තරකරණිජ්ජං දාවඅජ්ජෝ අණවේදු. [එවං නු ඉදම්. අනන්තරකරණීයං තාවදාර්‍ය ආඥාපයතු.]

**සූත්‍රධාරඃ**- කිමන්‍යදස්‍යාඃ පරිෂදඃ ශ්‍රුතිප්‍රසාදනතඃ.

**නටී**- අධ, කදමං උණ උදුං අධිකරිඅ ගාඉස්සං? [අථ, කතමං පුන ඍතුමධිකෘත්‍ය ගායිෂ්‍යාමි?]

**සූත්‍රධාරඃ**- නන්විම'මේ'ව තාවදචිරප්‍රවෘත්තමුපභෝගක්ෂමං ග්‍රීෂ්මසමයමධිකෘත්‍ය ගීයතාම්. සම්ප්‍රති හි,

3. සුභගසලිලාවගාහාඃ පාටලසංසර්ගී සුරභි වනවාතාඃ
ප්‍රච්ඡායසුලභ නිද්‍රා දිවසාඃ පරිණාමරමණීයාඃ.

**නටී**- තහ, [තථා] (ගායති)

**අදිසුරු**– (තිරය දෙස බලා) උත්තමාවනි, නෙපථ්‍ය විධානය හමාර නම් මෙහි යහපත් [illegible]!

**නිළිය**– (පිවිස) උතුමාණෙනි, මම මෙහි පැමිණියෙමි. නිදෙසන්නැ උතුමා, කවර අණක් හෝ කළයුතු.

**අදිසුරු**- උත්තමාවෙනි, මේ බෙහෙවින් නැවුම් පිරිසෙකි, අප විසින් අද කාලිදාසයන් කළ "අභිඥාන ශාකුන්තල" නම් නව නළුවෙන් ඔවුන් සැගැනිම වටී. ඉත් වරිහ නිරූපණයන්හි උත්සුක වෙමු.

**නිළිය**- මනා විධාන ඇති හෙයින් ඔබට මෙහි ලා නිගැනුමෙක් නැති.

**අදිසුරු**– ඔබට ඇත්ත කියන්නම්.

2. සිය කිසැ පවා සැක ඇති කලැ පුහුණන් ගේ
සරියැ සි නො සිත, තැත තොස තෙක් වියතුන් ගේ.

**නිළිය**- එයත් එසේ ද? ඉතින් මී ළඟට කළයුත්ත නිදෙසන්නැ.

**අදිසුරු**– අන් කිමෙක් ද, මේ පිරිසේ කන් පිනවීම හැර?

**නිළිය**– එ සේ නම් කවර ඍතුවක්, ගැන ගයම්ද?

**අදිසුරු**- ඇයි; අලුත උදාවූ සම්භොගයට සුදුසුවූ මේ ග්‍රීෂ්ම කාලය පිළිබඳ වැ ගයන්නැ. දූන් වනාහි,

3. සි ලි ලේ ගැලී තුටුවන; වන පලොල් ම ලී
අ වු ලේ රොනින් පියකරු මද පවනී' සි ලි
බ හ ළේ සෙවන වලැ නිදි සුලබ මනක ලී
උ දු ලේ දවස් වෙයි මිහිකැරුමෙන් ළක ලී.

**නිළිය**- එ සේ යැ. (ගයයි)

4. ඊසීසිං චුංබිආඉං හමරෙහිං සුඋමාරකෙසර සිහාඉං,
ඔදංසඅන්ති දඅමාණා පමදාඔ සිරීසකුසුමාඉං.

[ඊෂදීෂච්චුම්බිතානි භ්‍රමරෛඃ සුකුමාරකෙසර ශිඛානි
අවතංසයන්ති දයමානාඃ ප්‍රමදාඃ ශිරීෂකුසුමානි.]

**සූත්‍රධාරඃ**– ආර්‍යෙ, සාධු ගීතම්. අහො! රාගබද්ධචිත්ත-වෘත්තිරාලිඛිත ඉව සර්වතො රංගඃ. තදිදානීං කතම-ප්‍රකරණමාශ්‍රිත්‍යෛනමාරාධයාමඃ?

**නටී**– ණං අජ්ජමිස්සෙහිං පඪමං එව්ව ආණත්තං අහිණ්ණාණ සාඋංදලං ණාම අපුණාඩඅං පඔඑ අධිකරීඅදු ත්ති? [නන්වාර්‍යමිශ්‍රෛඃ ප්‍රථමමෙවාඥප්තමභිඥාන ශාකුන්තලං නාමා'පූර්වං නාටකං ප්‍රයොගෙ'ධික්‍රියතාමි'ති]

**සූත්‍රධාරඃ**– ආර්‍යෙ, සම්‍යග'නුබොධිතොස්මි. අස්මින් ක්ෂණෙ විස්මෘතං ඛලු මයා කුතඃ?

5. තවාස්මි'ගීතරාගෙණ හාරිණා ප්‍රසභං හෘතඃ
එෂ රාජෙ'ව දුෂ්‍යන්තඃ සාරඞ්ගෙනා'තිරංහසා.

(නිෂ්ක්‍රාන්තෞ)

## ප්‍රස්තාවනා

---

(තතඃ ප්‍රවිශති මෘගා'නුසාරී සශරචාපහස්තො රාජා රථෙන සූතශ්ච)

**සූතඃ**– (රාජානං මෘගඤ්චා'වලොක්‍ය) ආයුෂ්මන්,

6. කෘෂ්ණසාරෙ දදච්චක්ෂුස්ත්වයි චාධිජ්‍යකාර්මුකෙ
මෘගානුසාරිණං සාක්ෂාත් පශ්‍යාමී'ව පිනාකිනම්

**රාජා**– සූත, දූරමමුනා සාරඞ්ගෙණ වයමාකෘෂ්ටාඃ. අයං පුනරිදනීම'පි,

4. මඳ මඳ සිඹිමින් යන මේ බඹරුන් මුදු රොන් තුඩු බ්හුලා
සඳ සඳ මුදුනත මහරි මලින් සැරසෙති කුළුණු'ති
කොම ලා.

**අදියුරු-** උත්තමාවෙනි, ගාසනය මැනැවි. මිහිරි ශබ්දමාධුර්‍ය්‍ය යෙන් වෙළුණු සිනැ'ති මුළු රඟ-මඩල සිතුවම් කළා මෙනි. දැන් ඉතින් කවර පැබැඳුමක් ඇසුරු කොටැ මොවුන් පිනවමු ද?

**නිළිය-** ඇයි, උතුමාණන් විසින් මුලින් මැ "අභිඥන ශාකුන්තල" නම් අපූරු නළුවක් රඟන්නට අණ කළා කො වැ?

**අදියුරු** උත්තමාවෙනි, මැනැවින් සිහි කරවන ලද්දේ වෙමි. මේ මොහොතේ සැබැවින් එය මට අමතක විය. කෙ සේ ද?

5. මුව-දඩැ පැමිණී පුරු-වස දුස්සන්ත රද
කලු-තිත් මුවා ගෙන ගිය ලෙස දුවන සෙද
කන්කලු ගීත-රාවෙන් ඔබ ගැයුණු නද
මාව ද බලෙන් ඇදලූ මෙනි දුරට අද

(ඒ දෙදෙන නික්මෙති.)

## ප්‍රස්තාවනාව යි.

---

(ඉක්බිති මුවකු ලුහුබඳනා දුනු-හී රැගත් රජු රියෙන් රියදුරු හා පිවිසෙසි.)

**රියැදුරු-** (රජු ද මුවා ද දෙස බලා) දෙවයෙනි,

6. කලු-තිත් මුවා හා ඇදි දුනු අතැ'ති ඔබ
මුව-දඩැ පැමිණී ඉසුරු ලෙස දකිමි සැබ

**රජ-** රියැදුර, මේ මුවා අප ඈත ගෙන ගියා. මොහු යළිත් දුන්,

7\. ග්‍රීවාභඞ්ගා'භිරාමං මුහුරනුපතති ස්‍යන්දනෙ බද්ධදෘෂ්ටිඃ
පශ්චා'ර්ධෙන ප්‍රවිෂ්ටඃ ශරපතනභයාද්භූයසා පූර්වකායම්
දර්භෛරර්ධා'වලීඪෛඃ ශ්‍රමවිවෘතමුඛභ්‍රංශිභිඃ කීර්ණවර්ත්මා
පශ්‍යෝද්'ග්‍රප්ලුතත්වාද්වියති බහුතරං ස්තෝකමුර්ව්‍යාං ප්‍රයාති.

(සවිස්මයං) තදෙෂ කථමනුපතත එව මෙ ප්‍රයත්නප්‍රේක්ෂ-ණීයඃ සංවෘත්තඃ.

**සූතඃ–** ආයුෂ්මන්, උද්ඝාතිනී භූමිරි'ති මයා රශ්මිසංයමනාද්‍රථස්‍ය මන්දීකෘතො වෙගඃ. තෙන මෘග එෂ විප්‍රකෘෂ්ටා'න්තරඃ සංවෘත්තඃ. සම්ප්‍රති සමදෙශවර්ත්තිනස්තෙ න දුරාසදො භවිෂ්‍යති.

**රාජා–** තෙන හි මුච්‍යන්තාමභීෂවඃ.

**සූතඃ–** යදාඥාපයත්‍යායුෂ්මාන්. (රථවෙගං නිරූප්‍ය) ආයුෂ්මන්, පශ්‍ය, පශ්‍ය.

8\. මුක්තෙෂු රශ්මිෂු නිරායතපූර්වකායා
නිෂ්කම්පචාමරශිඛා නිභෘතො'ර්ධ්වකර්ණා
ආත්මො'ද්ධතෛර'පි රජොභිරලඞ්ඝනීයා
ධාවන්ත්‍ය'මී මෘගජවාක්ෂමයෙ'ව රථ්‍යාඃ.

**රාජා–** සත්‍යම්. අතීත්‍ය හරිතො හරීංශ්ච වර්තන්තෙ වාජිනඃ. තථා හි,

9\. යද ‘ලොකෙ සූක්ෂ්මං ව්‍රජති සහසා තද්විපුලතාං
යදර්ධා විච්ඡින්නං භවති කෘතසන්ධානමිව තත්
ප්‍රකෘත්‍යා යද්වක්‍රං තද'පි සමරෙඛං නයනයොර්
න මෙ දූරෙ කිඤ්චිත්ක්ෂණම'පි න පාර්ශ්වෙ රථජවාත්

7. මුවා පෙරමුණේ-
දිවේ පැනැගෙනේ,

නැමුණු කඳට වෙතට පැමිණී රියෙහි නෙත යො මා
සැරය වැටෙන බියෙහි සිරුර වකුටු කළ ත මා
ඇයුණු මුවෙනි වැටුණු තණිති ගැවසි මග හැ මා
බලනු ගුවන පිවිසැ මඳ වැ බිමැ ද නොවැ ප මා

මුවා පෙරමුණේ-
දිවේ පැනැගෙනේ.

(පුදුමයෙන්) ඇයි, පසු-පස මැ ලුහු බඳනා මට මහත් උත්සාහයෙන් ඌ බැලියැ යුතු වූයේ?

**රියදුරු-** දේවයෙනි, බිම් විසම හෙයින් රැහැන් ලිහිල් කොටැ මා රිය වේගය අඩු කළා. එ හෙයින් මේ මුවා වඩා ඈත්-විය. දැන් සම බිමේ සිටිනා ඔබට ඌ ගැනීම අසීරු නො වේ.

**රජ-** එ සේ නම් රැහැන් මුදන්න.

**රියදුරු-** දේවයන් ගේ අණ ලෙසෙකි. (රිය වේගය පෙන්වා) දේවයෙනි, බලන්නැ, බලන්නැ.

8. මේ මේ රැහැන් ඇද ලිගිල් කැරුමෙන් පෙරත් දික්
කම්පා නුදුන් සෙමෙර කොන් සහ කන් දෙකින් උස්
නැංවූ තමා රජසිනුත් නො ලැඟී සිටින්නෝ
යෙත් දැන් වහා මුව ජවත් තුරගෝ නො සහා.

**රජ-** සැබැවි. මේ අශ්වයෝ සූර්‍ය-දෙවයා ගේ හා ඉන්ද්‍රයා ගේ ද අසුන් ඉක්මවා සිටිති. ඒ එ සේ මැ යි.

9 මොහොතින් කුදු දෙය ද පවා දිසේ ඇසට වී විපු ලී
සැ බැ වි න් නො මැ ගැටුණු දෙය ද ගැටුණු
ලෙසකි නෙතැ එක ලී
නි ය නි න් වක් දෙය ද පවා ඉදු දෙයෙකැ'ති
සිරි ඉසි ලී
ම ට දූ න් දුර, ළඟ, අවට ද නො පෙනේ රිය
වෙසි නැ'ළ ලී.

සූත, පශ්චෙනං ව්‍යාපාද්‍යමානම් (ශරසන්ධානං නාටයති.)

**නෙපථ්‍යෙ**- භො! භො! රාජන්, ආශ්‍රමමෘගො'යං න හන්තව්‍යො, න හන්තව්‍යඃ.

**සූතඃ**- (ආකර්ණ්‍යාවලොක්‍ය ච,) ආයුෂ්මන්, අස්‍ය ඛලු තෙ බාණ පථ වර්තිනඃ කෘෂ්ණසාරස්‍යා'න්තරෙ තපස්වින උපස්ථිතාඃ.

**රාජා**- (සසම්භ්‍රමම්) තෙන හි ප්‍රගෘහ්‍යන්තාං වාජිනඃ

**සූතඃ**- තථා. (රථං ස්ථාපයති)
(තතඃ ප්‍රවිශත්‍යාත්මනා තෘතීයො වෛඛානසඃ)

**වෛඛානසඃ**- (හස්තමුද්‍යම්‍ය) රාජන්, ආශ්‍රමමෘගො'යං න හන්තව්‍යො, න හන්තව්‍යඃ.

10. න ඛලු! න ඛලු! බාණඃ සන්නිපාත්‍යො'යමස්මින්
මෘදුනි මෘග ශරීරෙ පුෂ්පරාශාවිවාග්නිඃ
ක්ව වත හරිණකානාං ජීවිතඤ්චාතිලොලං
ක්ව ච නිශිත නිපාතා වජ්‍රසාරාඃ ශරාස්තෙ.

11. තත් සාධුකෘතසන්ධානං ප්‍රතිසංහර සායකම්
ආර්තත්‍රාණාය වඃ ශස්ත්‍රං න ප්‍රහර්තුමනාගසි.

**රාජා**- එෂ ප්‍රතිසංහෘතඃ. (යථොක්තං කරොති)

**වෛඛානසඃ**- සදෘශමෙතත්පුරුවංශප්‍රදීපස්‍ය භවතඃ.

12. ජන්ම යස්‍ය පුරොර්වංශෙ යුක්තරූපමිදං තව
පුත්‍රමෙවං ගුණො'පෙතං චක්‍රවර්තිනමාප්නුහි.

**ඉතරෞ**- (බාහු උද්‍යම්‍ය) සර්වථා චක්‍රවර්තිනං පුත්‍රමාප්නුහි.

**රාජා**- (සප්‍රණාමම්) ප්‍රතිගෘහීතම්.

**වෛඛානසඃ**- රාජන්, සමිදාහරණාය ප්‍රස්ථිතා වයම්. එෂ ඛලු කණ්වස්‍ය කුලපතෙර'නුමාලිනීතීරමාශ්‍රමො දෘශ්‍යතෙ. න චෙදන්‍යකාර්‍යාතිපාතඃ, ප්‍රවිශ්‍ය ප්‍රතිගෘහ්‍යතාමාතිථෙයඃ සත්කාරඃ අපි ච,

රියැදුර, බලන්නැ, උෟ මරණ රග. (ඊ පිහිටුවීම හඟවයි.)

**පසුබිම**- හා! හා! රජතුමනි, මේ අසපුවේ මුවෙක්. මරන්-නට එපා, මරන්නට එපා.

**රියැදුරු**- (හඬ අසා-බලමින්) දේවයෙනි, ඔබ වහන්සේ ගේ හි වැටෙන සීමාවටත් මුවාටත් අතරැ තවුසෝ එළඹැ සිටිති.

**රජ**- (වෙළෙවි වැ) එ සේ නම් අසුන් නවත්වනු.

**රියැදුරු**- එහෙම යි. (රිය නවත්වයි)

(ඉක්බිති තමා තුන් වැන්නා කොටැ වෛඛානස එයි.)

**වෛඛානස**- (අත ඔසොවා) රජතුමනි, මේ අසපුවේ මුවෙක් මරන්නට එපා, මරන්නට එපා.

10. නො මැන, නො මැන, හීයෙන් මල් රැසෙක්හි'තලක් සේ
මොළකැටි මුව-ගත්හී නැ විදිමෙක් යෙදෙන්නේ.
කොහි වෙ ද ළ-වෙහෙල් ගේ ජීවිතේ බෝ දුඹුල් වූ
තියුණු විදුරු වන් වූ හී ඔබේ; වේ කෙසේ නම්?

11. ලක්-කළ ඔබ හීය මේ හකුළා තාබනු
දුබලුන් රකිත'විය නිවරදුනට නො ලනු

**රජ**- මෙන්න, එය ඉවත්-කළා. (කී ලෙස කරයි.)

**වෛඛානස**- පුරුවංසයට පහනක් වැනි ඔබට එය සුදුසු යි

12. පුරුවසැ උපන් ඔබ හට මෙය සුදුසු මැ නු
සක්විති පුතණුවකු මෙ ගුණෙන් හෙබි ලබ නු

**අනෙක් දෙදෙනා**- (අත් ඔසොවා) නිරනුමාන වැ සක්විති පුතකු ලබන්නෙහි.

**රජ**- (ප්‍රණාමයෙන් යුතු වැ) පිළිගනිමි.

**වෛඛානස**- රජතුමනි, අපි දර ගෙන ඊමට පිටත් වීමු. මාලිනී ගං-ෙ ර කණ්ව තවුස් නාවන් ගේ පන්සල නෙල පෙනේ. ඉදින් අන් කිසෙක් ඔබට නැති නම් එහි ගොස් අතිථි සත්කාර පිළිගනු මැනැවි. තව ද,

13. රම්‍යාස්තපොධනානාං ප්‍රතිහතවිඝ්නාඃ ක්‍රියාඃ සමවලොක්‍ය
ඥාස්‍යසි කියද්භුජො මෙ රක්‍ෂති මෞර්වීකිණාඞ්ක ඉති.

**රාජා**– අපි සන්නිහිතො'ත්‍ර කුලපතිඃ?

**වෛඛානසඃ**– ඉදානීමෙ'ව දුහිතරං ශකුන්තලාම'තිථිසත්කාරාය නියුජ්‍ය, දෛවමස්‍යාඃ ප්‍රතිකූලං ශමයිතුං සොමතීර්ථං ගතඃ.

**රාජා**– භවතු, තාමෙව ද්‍රක්‍ෂ්‍යාමි. සා ඛලු විදිතභක්තිං මාං මහර්ෂේඃ කථයිෂ්‍යති.

**වෛඛානසඃ**– සාධයාමස්තාවත්. (සශිෂ්‍යො නිෂ්ක්‍රාන්තඃ)

**රාජා**– සූත, චොදයා'ශ්වාන්. පුණ්‍යා'ශ්‍රමදර්ශනෙන තාවදාත්මානං පුනීමහෙ.

**සූතඃ**– යදා'ඥාපයත්‍යා'යුෂ්මාන්. (භූයො රථවෙගං නිරූපයති)

**රාජා**– (සමන්තාදවලොක්‍ය) සූත, අකථිතො'පි ඥායත එව යථා'යමාභොගස්තපොවනස්‍යෙ'ති.

**සූතඃ**– කථමිව ?

**රාජා**– කිං න පශ්‍යති භවාන්? ඉහ හි,

13. නැසූ උවදුරු බලා පිළිවෙත් තවුස් දන ගේ
තිතිනි මනහර
බාණයෙන් නැගි කරු'ති ඔබ බා කෙසේ උන්
රකිති දුසි සිහිකර.

රජ- එ සේ නම් තවුස් නාවෝ මෙහි වැඩ සිටිත් ද?

වෛඛානස:- දූත් නම් (ඔහු) ශකුන්තලා-දුව අතිථි සත්-
කාරයෙහි යොදවා, ඇ-ගේ අතිෂට දෛව ශමනය
පිණිස සොමතිර්ථයට ගොසිති.

රජ- වේවා, ඇයත් බැලියැ යුතු යි. සැබැවින් ඈ, මා
ප්‍රකට බැතිමතකු සැටියෙන් තවුස් නාවතට කියනු
ඇති.

වෛඛානස- දූත් අපි යමු. (ශිෂ්‍යයන් හා පිටත්-වෙයි.)

රජ- රිය දුර අසුත් මෙහෙයවනු, පුණ්‍යාශ්‍රම දශීනයෙන්
ආතම ශුද්ධිය ලබමු.

රියදුරු- දෙවයන් ගේ අණ ලෙසකි.

(නැවතත් රිය වේගය පෙන්වයි)

රජ- (හාත්පස බලා) නො කීවත් මේ තවුස් වනයේ
උපචාර භූමිය බව සැබැවින් පැහැදිලි යි.

රියදුරු- කෙසේ ද?

රජ- පින්වත, කිම නො පෙනේ ද? මෙහි වනාහි,

14. නීවාරාඃ ශුකගර්භකොටරමුඛභ්‍රෂ්ටාස්තරූණාමධඃ
ප්‍රස්නිග්ධාඃ ක්වචිදිඞ්ගුදීඵලභිදඃ සූච්‍යන්ත එවො'පලාඃ
විශ්වාසො'පගමාදභින්නගතයඃ ශබ්දං සහන්තෙ මෘගාස්
තොයාධාරපථාශ්ච වල්කලශිඛා නිෂ්‍යන්දරෙඛාඞ්කිතාඃ.

15. අපි ච,

කුල්‍යාම්භොභිඃ පවනචපලෛඃ ශාඛිනො ධෞතමූලා
භින්නො රාගඃ කිසලයරුචාමාජ්‍යධූමොද්ගමෙන
එතෙ චාර්වාගු'පවනභුවිච්ඡින්න දර්භාඞ්කුරායාං
නෂ්ටා'ශඞ්කා හරිණශිශවො මන්ද මන්දං චරන්ති.

**සූතඃ**– සර්වමුපපන්නම්.

**රාජා**– (ස්තොකමන්තරං ගත්වා) තපොවනනිවාසිනාමුපරොධො මා භූත්. එතාවත්‍යෙ'ව රථං ස්ථාපය, යාවදවතරාමි.

**සූතඃ**– ධෘතාඃ ප්‍රග්‍රහාඃ, අවතරත්වා'යුෂ්මාන්.

**රාජා**– (අවතීර්‍ය) සූත, විනීතවෙෂෙණ ප්‍රවිෂ්ටව්‍යානි තපොවනානි නාම. ඉදං තාවද් ගෘහ්‍යතාම්. (සූතස්‍යා'භරණානි ධනුශ්චොපනීය) සූත, යාවදාශ්‍රමවාසිනඃ ප්‍රත්‍යවෙක්ෂ්‍යා'හමුපාවර්තෙ, තාවදාර්ද්‍රපෘෂ්ඨාඃ ක්‍රියන්තාං වාජිනඃ.

**සූතඃ** තථා. (නිෂ්ක්‍රාන්තඃ)

**රාජා**– (පරික්‍රම්‍යා'වලොක්‍ය ච) ඉදමාශ්‍රමද්වාරම්, යාවද් ප්‍රවිශාමි. (ප්‍රවිශ්‍ය නිමිත්තං සූචයන්)

14. රැක් මුල් මේ තැනෙකත් බෙහින් හැලුණු හූරු ගැල්
ලැගීමෙන් සුවන්
තෙල් ගෑවී උපලැ'ත් තැලූ බව'හුනත් පෙන්වා
ලමින් වී වෙසෙස්
විස්වස් බැවි හැකුමෙන් මුවෝ නො පැකිළී අස්වින්
රියේ සක් හඬින්
ගංගා මං වැගැරි කොණින් හුණු දියෙන් රේකා
කෙළේ යැ යි හඟිමි
තාවද,

15. පවන් වැදූ රළ නගන ගඟ-දිය ඉවුරු තුරු මූල් කැල
මැ සෝදන
ගෝම ගින්නෙන් නැඟුණු දුම් වැදූ ළ-පලු
පැහැ නිරතුරු වැ බිඳු වන
ඉදිරි පසැ උප-වන බිමෙහි වූ අළුත සිඳ ලූ අකුරු
දබ් තණ
නැසුණු සැක ඇති හරිණ පොල්ලන් මදින්-මඳ
සප-සපා හැසිරෙන

**රියැදුරු**– සියල්ල මැ සහෙතුක යි.

**රජ**– (මඳක් දුර ඉක්මවා) තවුස් වන වැසියනට අපනසු වෙක් නො වේවා! මොබ මැ රිය නවත්වනු මා බසින තෙක්.

**රියැදුරු**– රැනැත් තද කැරිණි, දේවයන් වහන්සේ බස්නා සේක්වා.

**රජ**– (බැසැ) රියැදුර, තපෝවන නම් දැන්ත වේශයෙන් පිවිසියැ යුතු නැති. මේවා ගන්නැ. (රියැදුරාට අබරණ හා දුන්න ද දී) රියැදුර, මා අරම් වැසියන් දැකැ එන තෙක් අසුන් පිට තෙමන්නැ.

**රියැදුරු**– එ-සේ යි. (නික්මෙයි.)

**රජ**– (හාත්පස ඇවිදැ බලා) මේ අරම් දොරටුව යි. පිවිසියැ යුතු යි. (පිවිසැ, නිමිත්තක් හඟවා)

16. ශාන්තමිදමාශ්‍රමපදං ස්ඵුරති ච බාහුඃ කුතඃ ඵලමිහා'ස්‍ය
අථවා භවිතව්‍යානාං ද්වාරාණි භවන්ති සර්වත්‍ර

**නේපථ්‍යේ**- ඉදො, ඉදො සහීඕ. [ඉත ඉතඃ සඛ්‍යෞ]

**රාජා**- (කර්ණං දත්වා) අයෙ, දක්ෂිණේන වෘක්ෂවාටිකාමාලාප ඉව ශ්‍රූයතෙ. යාවදත්‍ර ගච්ඡාමි. (පරික්‍රම්‍යා'වලෝක්‍ය ච) අයෙ, ඒතාස්තාපසකන්‍යකාඃ ස්වප්‍රමාණා'නුරූපෛඃ සේචනඝටෛර් බාලපාදපේභ්‍යඃ පයෝදාතුමිත ඒවා' භිවර්තන්තෙ, (නිපුණං නිරූප්‍ය) අහෝ! මධුරමාසාං දර්ශනම්.

17. ශුද්ධාන්ත දුර්ලභමිදං වපුරාශ්‍රමවාසිනො යදි ජනස්‍ය
දූරීකෘතාඃ ඛලු ගුණෛරුද්‍යානලතා වනලතාභිඃ.
[තතඃ ප්‍රවිශති යථෝක්තව්‍යාපාරා සහ සඛීභ්‍යාං
ශකුන්තලා]

**ශකුන්තලා**- ඉදො, ඉදො සහීඕ. [ඉත ඉතඃ සඛ්‍යෞ]

**අනසූයා**.- හලා සඋන්දලෙ, තුවත්තො වි තාදකස්සවස්ස අස්සම රුක්ඛආපිඅදරෙ තක්කෙමි. ජං ඉමිණා ණොමාලිආකුසුම පෙලවා තුමං වි එදාණං ආලවාල-පූරණෙ ණිඋත්තා. [හලා ශකුන්තලෙ, ත්වත්තො'පි තාතකාශ්‍යපස්‍යා'ශ්‍රමවෘක්ෂකාඃ ප්‍රියතරා ඉති තර්කයාමි. යදනෙන නවමාලිකා කුසුමපෙලවා ත්වමප්‍යෙ 'තෙෂා-මාලවාලපූරණෙ නියුක්තා.]

16. ඉහා මැ සාන්ත හි පියසත් අරම්හි
සැලේ ම-ගේ බා කිම දෝ පලෙක් ඉන්?
කෙසේ කෙසේ හෝ වියැ යුත්ත වේ මැ යි.
සියල් දෙසේ ඇත් දෙරටුත් අයත් ඒ.

**පසුබිම**- යෙහෙළියෙනි, මෙහෙන්, මෙහෙන්.

**රජ**- (කන් යොමා) ඔහෝ! දකුණු පසැ ගස් වලුලෙන් සැසැඳිල්ලක් බඳු (හඬක්) ඇසේ දැන් එහි යා යුතු යි. (සිසාරා-බලා) මෙන්න! මේ තවුස් දැරියෝ තම පමණට සරිලන (දිය) ඉස්නා කල වලින් පැලෑටි වලට දිය වත්කරන්නට මොබින් මැ ඉදිරිය බලා එති. (ලං වැ බලා) අනේ! මොවුන් ගේ දර්ශනය කොතරම් මිහිරි ද?

17. මේ වනන්තරේ—
රුසිරැ මෙ-ළඳ ගේ අගේ,

සුදනැ දුලබ මෙ-බඳු බොළඳ නිමල සොඳුරි යේ
උයනැ වැඩුණු කොමල ලිය ද පැරැදූ වන ලියේ.

ඉතින් මේ සෙවන ඇසුරැ කොටැ බලා සිටිමි. (බලමින් සිටියි.)

(ඉක්බිති පළමු කී කිසෙහි යෙදුණු ශකුන්තලා යෙහෙළියන් දෙදෙනා සමග පිවිසෙයි.)

**ශකුන්තලා**- යෙහෙළියෙනි, මොබින්, මොබින්.

**අනසූයා**- ප්‍රිය ශකුන්තලා, ඔබටත් වඩා අසපුවේ තුරැ කසුප් පියාණන්ගට ප්‍රිය වෙති යි හඟිමි. එහෙයිනි, මේ නවමල්ලිකා මෙන් මොළකැටි ඔබ ඔවුන් ගේ තෝතැති පූරණයෙහි ඔහු විසින් යොදවන ලද්දේ.

**ශකුන්තලා–** ණ කෙඅලං තාදණිඔඔ එව්ව, අත්ථි මෙ සොදරසිණෙහො එදෙසු.

[න කෙවලං තාතනියොග එව; අස්ති මෙ සොදරස්නෙහ එතෙෂු]

(වෘක්ෂසෙචනං රූපයති)

**රාජා–** (ආත්මගතම්) කථමියං සා කණ්ව දුහිතා? අසාධු-දර්ශී ඛලු තත්‍රභවාන් කාශ්‍යපඃ. ය ඉමාමාශ්‍රමධර්මේ නියුඞ්ක්තෙ.

18. ඉදං කිලා'ව්‍යාජමනොහරං වපුස්
තපඃක්ෂමං සාධයිතුං ය ඉච්ඡති
ධෘවං ස නීලොත්පල පත්‍රධාරයා
සමිල්ලතාං ඡෙත්තු මෘෂිර්ව්‍යවස්‍යති.

භවතු, පාදපාන්තර්හිත එව විස්‍රබ්ධං තාවදේ'තාං පශ්‍යාමි

(තථා කරොති)

**ශකුන්තලා–** සහි අණසූඑ, අදිපිණද්ධෙණ වක්කලෙණ පිඅංවදාඑ ණිඅංතිදම්හි. සිඪිලෙහි දාව ණං. [සඛි අනසූයෙ, අතිපිනද්ධෙන වල්කලෙන ප්‍රියංවදයා නියන්ත්‍රිතා'ස්මි. ශිථිලය තාවදෙනත්.]

**අනසූයා–** තහ. (තථා) (ශිථිලයති)

**ප්‍රියංවදා–** (සහාසම්) එත්ථ පඔහරවිත්ථාරඉත්තඅං අත්තණො ජොව්වණං උවාලහ. මං කිං උවාලංභෙසි. [අත්‍ර පයොධරවිස්තාරයිතෘකමාත්මනො යෞවනමුපාලභස්ව, මාං කිමුපාලභසෙ.]

**රාජා–** සම්‍යගියමාහ,

19. ඉදමුපහිත සූක්ෂ්මග්‍රන්ථිනා ස්කන්ධදෙශෙ
ස්තනයුග පරිණාහාච්ඡාදිනා වල්කලෙන
වපුරභිනවමස්‍යාඃ පුෂ්‍යති ස්වාං න ශොභාං
කුසුමමිව පිනද්ධං පාණ්ඩුපත්‍රො'දරෙණ.

අථවා කාමමනනුරූපමස්‍යා වපුෂො වල්කලං න පුනර-ලඞ්කාරශ්‍රියං න පුෂ්‍යති. කුතඃ?

**ශකුන්තලා**- හුදෙක් පියාණන් ගේ නියෝගය මැ නො වෙයි; ඔවුන් කෙරෙහි මි-ගේ සොයොවුරු පෙම්නුත් තිබේ.

**රජ**- (තමාට මැ) කෙසේ නම් මෝ කාණ්ව තවුසාණන් ගේ දුව වූ ද? යමෙක් මැ අරම් කිසෙති යෙදවී ද: ඒ කසුප් තෙමේ සැබැවින් මනා දකුම් නැත්තෙක් ද?

18. රුමැ'ත් සැබැ මැ මනරම් සිරිත් දුල්
යමෙක් සිතී නම් සුදුසු'යි තවුස් දම්
සිතන්නෙකී හේ'පුල් පත් අවියෙන්
සමීලතාවන් සිඳපීම පාසු යි.

වේවා; ගසට මුවහ වී පහසුවෙන් මැ බලා-ගනිමි., (එසේ කරයි)

**ශකුන්තලා**- යෙහෙළි අනසුයා, ඉතා තදින් වැහැරියෙන් ප්‍රියංවදුවන් විසින් බඳනා ලද්දෙමි. එය ලිහිල් කරන්නැ.

**අනසූයා**- මැනැවි. (ලිහිල් කරයි)

**ප්‍රියංවද**- (සිනාසෙමින්) මෙහි ලා පියොවුරු පතුරුවන තමා ගේ යොවුන් වියට දෙස් නගන්නැ. ඇයි, මට දෙස් පවරන්නේ?

**රජ**- (තමාට මැ) මැ සැබැවෙකි කීයේ.

19. ඝන මඬුලු මහත් බැව් හා වසා ලූ ළසේනී
සැදි තන-පොට වැරීයෙන් සියුම් වූ ගැටින් යුත්
නව තුරුණු මැ-ගේ ගත් නැ වඩන්නේ ලකල් බැව්
කොමල පඩු-වනින් යුත් පත්නි ගැබි වූ මලක් මෙන්.

නො-හොත්

සැබැවින් සිරුරට නුසුදුසු වැහැරී පැලදීමෙන් ඇ-ගේ
රූප සෞන්දර්යය යළි නො මැ නො වඩයි නු, කෙ සේ ද?

20. සරසිජමනුවිද්ධං ශෛවලෙනා'පි රම්‍යං
මලිනමපි හිමාංශෝර්ලක්ෂ්ම ලක්ෂ්මීං තනෝති
ඉයමධිකමනොඥා වල්කලෙනා'පි තන්වී
කිමි'ව හි මධුරාණාං මණ්ඩනං නා'කෘතීනාම්.

**ශකුන්තලා**- (අග්‍රතො'වලොක්‍ය) එසො වාදෙරිද පල්ලවං- ගුලිහිං තුවරෙදි විඅ මං කෙසර රුක්ඛඔ, ජාව ණං සංභාවෙමි. [එෂ වාතෙ'රිත පල්ලවාඞ්ගුලීභිස්ත්වරයති'ව මාං කෙසරවෘක්ෂකඃ, යාවදෙනං සම්භාවයාමි.] (පරික්‍රාමති)

**ප්‍රියංවදා**- හලා සඋන්දලෙ. එත්ථ එව්ව දාව මුහුත්තඅං චිට්ඨ [හලා ශකුන්තලෙ, අත්‍රෛ'ව තාවන්මුහූර්තං තිෂ්ඨ.]

**ශකුන්තලා**- කිං ණිමිත්තං? [කිං නිමිත්තම්?]

**ප්‍රියංවදා**- ජාව තුඑ උවගදඑ ලදසණාහො විඅ අඅං කෙසර රුක්ඛඔ පඩිභාදි [යාවත්ත්වයො'පගතයා ලතා සනාථ ඉවා'යං කෙසරවෘක්ෂකඃ ප්‍රතිභාති.]

**ශකුන්තලා**- අදෙ ක්ඛු පිඅංවදාසි තුමං. [අතඃ ඛලු ප්‍රියංවදා'සි ත්වම්.]

**රාජා**- ප්‍රියම'පි තථ්‍යමා'හ ශකුන්තලාං ප්‍රියංවදා. අස්‍යාඃ ඛලු,

21. අධරඃ කිසලයරාගඃ කොමලවිටපා'නුකාරිණෞ බාහූ
කුසුමමි'ව ලොභනීයං යෞවනමඞ්ගෙෂු සන්නද්ධම්.

**අනසූයා**- හලා සඋන්දලෙ, ඉඅං සඅංවරවහූ සහආරස්ස තුඑ කිද ණාමහෙආ වණජොසිණී ත්ති ණොමාලිආ. ණං විසුමරිද සි? [හලා ශකුන්තලෙ, ඉයං ස්වයංවරවධූඃ සහකාරස්‍ය ත්වයා කෘතනාමධෙයා වනජ්‍යොත්ස්නෙ'ති නවමාලිකා. එතාං විස්මෘතාසි?

**ශකුන්තලා**- තදා අත්තාණං වි විසුමරිස්සං. (ලතාමුපෙත්‍යා'වලොක්‍ය ච) හලා, රමණීඑ ක්ඛු කාලෙ ඉමස්ස ලදාපාඅවමිහුණස්ස වඉඅරො සංවුත්තො. ණවකුසුම- ජොව්වණා වණජොසිණී. සිණිද්ධපල්ලවදාඑ උවභොඅක්ඛමො සහආරො. [තදා'ත්මානම'පි විස්මරිෂ්‍යාමි. හලා, රමණීයෙ ඛලු කාල එතස්‍ය ලතාපාදපමිථුනස්‍ය ව්‍යතිකරඃ සංවෘත්තඃ. නවකුසුමයෞවනා වනජ්‍යොත්ස්නා. ස්නිග්ධ පල්ලවතයො'පභොගක්ෂමඃ සහකාරඃ.] (පශ්‍යන්තී තිෂ්ඨති)

20. සෙවෙල'මල සගස්පත් පිල්හි වූයේ සොබා සිත්
සඳ අඳුරු ලපැ'ත්තෝ මුත් මඩන්නේ යැ සෝබා
තුනුවග මහරම් වෙ වැරීවත්තෙන් වැසූවත්
පියෙවි මිහිරි දූහී ඇයි නො වන්නේ සැදීමෙක්?

**ශකුන්තලා**- (ඉදිරි පස බලා) මේ කේසර ගස සුළඟින් නැමුණු දලු- ඇඟිලි වලින් මා වහා කැඳවන්නාක් මෙනි. දුන් එය ගැන සලකමි. (සිසාරයි)

**ප්‍රියංවදා**- ප්‍රිය ශකුන්තලා, මේ-තැන මැ මොහොතක් සිටින්න.

**ශකුන්තලා** කුමට ද?

**ප්‍රියංවදා** ඔබ ළංවූ කලැ මේ කේසර ගස ලතා ඇතියකු මෙන් පෙනේ.

**ශකුන්තලා** එහෙනම් ඔබ මගුල් කියන්තියක්.

**රජ** (තමාට මැ) ප්‍රියංවදා කියේ සැබැවක්. මැ ගේ වනාහී,

21. ළපලු පැහැ'ති දෙතොල කොමල වෙළෙප් බඳු දෙ බා
පිරුණු යොවුන් සිරුර මලක් විලස වෙ ලොබා.

**අනසූයා** ප්‍රිය ශකුන්තලා, මී-අඹ තුරෙහි සවයංවර වධුව වූ මේ සමන් වැල "වන ජ්‍යෝත්සනා" යි තුඹ මැ කළ නම් ඇත්තී යැ, ඇ අමතක කරන්නෙහි ද?

**ශකුන්තලා** එහෙ නම් මට මාත් අමතක වේවි. (වැල ළඟට පැමිණ බලා) ප්‍රියාවෙනි, මනා කල්හි මැ මේ ලිය රුක් යුවල ගේ සංවාසය වී ද, යම් හෙයකින් නව කුසුම් ගැනීමෙන් වන ජ්‍යොත්ස්නාව යොවුන් බව පළ කරයි ද, සිතිඳු ළපලු ඇති හෙයින් මී අඹ ගස ද වැළඳ ගැනුමට සුදුසුයි.

(බලමින් සිටියි.)

ප්‍රියංවදා– අණසූඑ, ජාණසි, කිං ණිමිත්තං සඋන්තලා වණජෝසිණිං අදිමෙත්තං පෙක්ඛදි ත්ති? [අනසූයෙ, ජානා'සි කිං නිමිත්තං ශකුන්තලා වනජ්‍යොත්ස්නාමතිමාත්‍රං පශ්‍යතී'ති?]

අනසූයා– ණ ක්ඛු විභාවෙමි. කහෙහි. [න ඛලු විභාවයාමි, කථය.]

ප්‍රියංවදා– ජහ වණජෝසිණී අණුරූවෙණ පාඅවෙණ සංගදා අවි ණාම එව්වං අහං වි අත්තණො අණුරූවං වරං ලහෙඅං ත්ති. [යථා වනජ්‍යොත්ස්නා'නුරූපෙණ පාදපෙන සංගතා. අපිනාමෛ'වමහමප්‍යා'ත්මනො'නුරූපං වරං ලභෙයෙ'ති.]

ශකුන්තලා– එසො ණූණං තුහ අත්තගදෙ මණොරහො. [එෂ නූනං තවා'ත්මගතො මනොරථඃ. (කලශමාවර්ජයති)

රාජා– අපි නාම කුලපතෙරියමසවර්ණක්ෂෙත්‍රසම්භවා ස්‍යාත්. අථවා කෘතඃ සන්දෙහෙන,

22. අසංශයං ක්ෂත්‍රපරිග්‍රහක්ෂමා
යදාර්‍යමස්‍යාමභිලාෂි මෙ මනඃ
සතාං හි සන්දෙහ පදෙෂු වස්තුෂු
ප්‍රමාණමන්තඃ කරණප්‍රවෘත්තයඃ.

තථා'පි තත්ත්වත එනාමුපලප්ස්‍යෙ,

ශකුන්තලා– (සසංභ්‍රමම්) අම්මො! සලිලසෙඅසංභමුග්ගදො ණොමාලිඅං උජ්ඣිඅ වඅණං මෙ මහුඅරො අහිවට්ටදි. [අම්මො! සලිලසෙකසම්භ්‍රමො'ද්ගතො නවමාලිකාමුජ්ඣිත්වා වදනං මෙ මධුකරො'භිවර්ත්තතෙ.] (භ්‍රමරබාධාං රූපයති.)

රාජා– (සස්පෘහමවලොක්‍ය)

23. චලා'පාඞ්ගාං දෘෂ්ටිං ස්පෘශසි බහුශො වෙපථුමතීං
රහස්‍යා'ඛ්‍යායී'ව ස්වනසි මෘදු කර්ණා'න්තිකචරඃ
කරංව්‍යාධුන්වත්‍යාඃ පිබසි රතිසර්වස්වමධරං
වයං තත්ත්වා'න්වෙෂාන්මධුකර, හතාස්ත්වං ඛලු කෘතී.

**ප්‍රියංවදා**– අනසූයා, ශකුන්තලා වනජ්‍යොත්ස්නාව වඩ වඩා බලන්නී කුමක් නිසා දැයි දන්නෙහි ද?

**අනසූයා**– සැබැවින් නො දනිමි. කියන්නැ.

**ප්‍රියංවදා**– 'යම් සේ වනජ්‍යොත්ස්නාව සුදුසු ගසක් හා එක් වූවා ද, එ සේ මැ මම ද, මට සුදුසු හිමියකු ලදිම් නම් ඉතා යෙහෙකැ' යි කියා.

**ශකුන්තලා**– සැබැවින් මැ එය ඔබ සිතට වන් අදහසෙක්. (කළය නමයි.)

**රජ**– (තමාට මැ) ඉදින් කුලපතිහු ගේ (දියණිය වූ) මැ නො සම කුලයෙකැ බිරියක ගෙන් උපන්නියක් විය හැකි ද? නැතහොත් සැකයෙන් කම් නැති.

22. රදක් ගටත් මැ සුදුසු යි බිසෝ බැව්
උදුර වූ මා සිත ලෝබ ගන්වයි
කුකුස් දැයේහි උතුමන් සිතුම් පැතුම්
ලෙසින් පවත්නේ නිතයුම්, යෙදේ මැ යි

එ සේ වුවත් මැ පිළිබඳ වැ සැබෑ තතු සොයා ගනිමි.

**ශකුන්තලා**– (කලබල වැ) අම්මෝ! දිය ඉසිම නිසා කලබල වී උඹට නැඟුණු මේ මී මැස්සා සමන් මල හැරැ ම-ගේ මුහුණ වටා කැරකෙයි. (බමර පීඩාව හඟවයි)

**රජ**– (වෙලෙවි වැ බලා)

23. පහස්නෙහි තෝ සසල නෙත් යුග ලෙලෙන
කොන් ඇති පැ උදුල්
රහස් පවසන ලෙසින් මිහිරි වැ සෙමින් නදදෙහි
සවන' සල්
සැලෙන අත් ඈති තුඹුවහා ගේ රති නිදන්
තොල් බිඹු නීමල්
උරඟි බම්රෝ, තා යැ පින් කෙළෙ නටුමු අපි
තතු දත් සියල්

**ශකුන්තලා**– ණ එසො ධිට්ඨො විරමදි, අණ්ණදො ගමිස්සං (පදන්තරෙ ඨිච්චා. සදිට්ඨික්ඛෙපම්) කහං ඉදො වි ආ අණුසරදි? හලා, පරිත්තාහ මං ඉමිණා දුව්විණීදෙණ දුට්ඨමහුඅරෙණ පරිහූඅමාණං. [න එෂ ධෘෂ්ටො විරමති අන්‍යතො ගමිෂ්‍යාමි, කථමිතො'ප්‍යාගච්ඡති. හලා, පරිත්‍රායෙථාං මාම'නෙන දුෂ්ටමධුකරෙණ පරිභූයමානාම්.]

**උභෙ**– (සස්මිතම්) කා වඅං පරිත්තාදුං? දුස්සන්දං අක්කන්ද. රාඅරක්ඛිදව්වාඉං තවොවණාඉං ණාම? [කො ආවාං පරිත්‍රාතුම්? දුෂ්‍යන්තමාක්‍රන්ද. රාජරක්ෂිතව්‍යානි තපොවනානි නාම.]

**රාජා**– අවසරොයමාත්මානං ප්‍රකාශයිතුම්. න භෙතව්‍යම්! න භෙතව්‍යම්! (ඉත්‍යර්ධොක්තෙ ස්වගතම්) රාජභාවස්ත්ව'භිඥාතො භවෙත්. භවතු, එවං තාවදභිධාස්‍යෙ.

**ශකුන්තලා**– (පදන්තරෙ ස්ථිත්වා සදෘෂ්ටික්ෂෙපම්) කහං ඉදො වි මං අණුසරදි? [කථමිතො'පි මාමනුසරති?]

රාජා– (සත්වරමුපසෘත්‍ය)

24. කඃ පෞරවෙ වසුමතිං – ශාසති ශාසිතරි–දුර්විනීතානාම්
අයමාචරත්‍ය'විනයං – මුග්ධාසු තපස්විකන්‍යාසු.

(සර්වා රාජානං දෘෂ්ට්වා කිඤ්චිදිව සම්භ්‍රාන්තාඃ)

**අනසූයා**– අජ්ජ, ණ ක්ඛු කිං වි අච්චාහිදං, ඉඅං ණො පිඅසහී මහුඅරෙණ පරිහූඅමාණා කාදරීභූදා. [ආර්‍ය, න ඛලු කිමප්‍ය'ත්‍යාහිතම්, ඉයං නෞ ප්‍රියසඛී මධුකරෙණ පරිභූයමානා කාතරීභූතා] (ශකුන්තලාං දර්ශයති)

**රාජා**– (ශකුන්තලා'භිමුඛො භූත්වා) අපි තපො වර්ධතෙ?

(ශකුන්තලා සාධ්වසාදවචනා තිෂ්ඨති.)

**අනසූයා**– දාණිං අදිහි විසෙසලාහෙණ, හලා සඋන්දලෙ, ගච්ඡ උඩඅං ඵලමිස්සං අග්ඝං උවහර ඉදං පාදොදඅං භවිස්සදි. [ඉදානීමතිථිවිශෙෂලාභෙන. හලා ශකුන්තලෙ, ගච්ඡොටජම්, ඵලමිශ්‍රමර්ඝමුපහර; ඉදං පාදොදකං භවිෂ්‍යති.]

**ශකුන්තලා**– මේ නිර්ලජ්ජ මී මැස්සා නො නවතියි. වෙන'තක යමි. (පියවර ක්පයක් ගොස් සිට, ආ පසු බැල්මක් හෙලා) කිම, මෙහිත් එයි? අනේ, මේ අවිනීත දුෂ්ට මී-මැස්සා විසින් පෙළන මා බේරා-ගන්නැ.

**යෙහෙළියෝ**– (සිනා සෙමින්) ඔබ රකින්නට අප කවුරුන් ද? දුෂ්‍යන්තට හඬ-ගා කියන්නැ. තපෝවන නම් රජුන් විසින් රැකියැ යුතු මැ යැ.

**රජ**– (තමාට මැ) මේ මා එළියට ආ-යුතු අවසරාව යි. බිය නො වන්නැ. බිය නො වන්නැ. (මෙසේ අඩක් කී කලැ...... තමාට මැ) මා රජු බව හෙළි-වෙයි. හොඳයි, (ඔවුන්ට) මෙසේ කියමි.

**ශකුන්තලා**– (පියවර කීපයක් ගොස් බැල්මක් හෙලා) කිම. මොබටත් උඹ මා ලුහුබඳී ද?

**රජ**– (වහා ළං-වැ)

24. නො සැබියනට දඬුවම් දෙන පුරු රජ රජයන මෙම දි න කවුරු සපන් වෙති. පෙළමට තවුස් කතුන් මෙහි තිවසන.

(සියල්ලෝ රජු දුකැ මඳක් තැති ගත්තා ය,)

**අනසූයා**– උතුමාණෙනි, කිසිදු හිරිහැරයෙක් නැ. අපේ මේ ප්‍රිය යෙහෙළිය බමරකු විසින් වෙහෙසවනු ලැබැ බැගෑ වූවා. (ශකුන්තලාව පෙන්වයි.)

**රජ**– (ශකුන්තලා දෙසට හැරී) ඔබ ගේ තපස සපල ද?

(ශකුන්තලා ලජ්ජාවෙන් නො බැණ සිටියි.)

**අනසූයා**– දැන් විශෙෂ අමුත්තකු ගේ පැමිණීමෙන්, ප්‍රිය ශකුන්තලා; යන්නැ-පැලට. පලතුරු මුසු උපහාරක් රැගෙන එන්නැ, මේ, පා දෝනා දිය යැ.

රාජා– භවතීනාං සූනෘතයෛ'ව ගිරා කෘතමාතිථ්‍යම්.

ප්‍රියංවදා– තෙණ හි ඉමස්සිං පච්ඡාඅසීඅලාඑ සත්තවණ්ණ-වෙදිආඑ මුහුත්තඅං උවවිසිඅ, පරිස්සම විණොදං කරෙදු අජ්ජො. [තෙනහ්‍යස්‍යාං ප්‍රච්ඡාය ශීතලායාං සප්තවර්ණ-වෙදිකායාං මුහුර්තමුපවිශ්‍ය පරිශ්‍රමවිනොදං කරොත්වා'ර්‍ය්‍යඃ.]

රාජා– නනු යූයමප්‍ය'නෙන කර්මණා පරිශ්‍රාන්තාඃ?

අනසූයා– හලා සඋන්දලෙ, උඉදං ණො පජ්ජුවාසණං අදිහිණං. එත්ථ උවවිසම්හ. [හලා ශකුන්තලෙ, උචිතං නඃ පර්‍ය්‍යුපාසනමතිථීනාම්. අත්‍රො'පවිශාමඃ.]

(සර්වා උපවිශන්ති)

ශකුන්තලා– (ආත්මගතම්) කිං ණු ඛු ඉමං පෙක්ඛිඅ, තවොවණ විරොහිණො විආරස්ස ගමණීඅම්හි සංවුත්තා? [කිං නු ඛල්විමං ප්‍රෙක්ෂ්‍ය, තපොවනවිරොධිනො විකාරස්‍ය ගමනීයා'ස්මි සංවෘත්තා.]

රාජා– (සර්වා විලොක්‍ය) අහො! සමවයොරූපරමණීයං භවතීනාං සෞහාර්දම්.

ප්‍රියංවදා– (ජනාන්තිකම්) අණසූඑ, කො ණු ඛු එසො චඋර ගම්භීරාකිදී මහුරං පිඅං ආලවන්තො පහාවවන්තො විඅ ලක්ඛී අදි. [අනසූයෙ, කො නු ඛල්වෙෂ චතුරගම්භීරා-කෘතිර්මධුරං ප්‍රියමාලපන් ප්‍රභාවවානි'ව ලක්ෂ්‍යතෙ.]

අනසූයා– සහි, මම වි අත්ථි කොදූහලං පුච්ඡිස්සං දාව ණං. (ප්‍රකාශම්) අජ්ජස්ස මහුරාලාවජණිදො විස්සංභො මං මන්තාවෙදි, කදමො අජ්ජෙණ රාඑසිණො වංසො අලංකරීඅදි? කදමො වා විරහපජ්ජුස්සුඅජණො කිදො දෙසො? කිං ණිමිත්තං වා සුඋමාරදරො වි තවොවණ-ගමණපරිස්සමස්ස අත්තා පදං උවණීදො? [සඛි, මමා'ප්‍ය'ස්ති කෞතූහලම්. ප්‍රක්ෂ්‍යාමි තාවදෙනම්. ආර්‍ය්‍යස්‍ය මධුරාලාපජනිතො විස්‍රම්භො මාං මන්ත්‍රයතෙ. "කතම ආර්‍ය්‍යෙණ රාජර්ෂෙර් වංශො'ලඞ්ක්‍රියතෙ? කතමො වා විරහ පර්‍ය්‍යුත්සුකජනඃ කුතො දෙශඃ? කිං නිමිත්තං වා සුකුමාරතරො'පි තපොවනගමනපරිශ්‍රමස්‍යාත්මා පදමු-පනීතඃ?]

**රජ**- පින්වතියන් ගේ ප්‍රිය වදනින් මැ අතිථි සත්කාරය කෙළේ වෙයි.

**ප්‍රියංවද**- එ සේ නම් ඔබතුමා මේ ඝන සෙවෙන හා සිහිලැ'ති සත්පත් මඬුල්ලට පිවිසැ මොහොතක් විඩා හරින්නැ.

**රජ**- ඔබ ද මේ ක්‍රියාවලින් විඩා වූවාහු නො වෙත් ද?

**අනසූයා**- ප්‍රිය ශකුන්තලා, අමුත්තන් ආශ්‍රය අපට සුදුසු මැ යි. මෙහි හිඳිමු.

(සියල්ලෝ පිවිසැ හිඳිති.)

**ශකුන්තලා**- (තමාට මැ) සැබැවින් මොහු බලා තපෝ වනයට නුසුදුසු චිත්ත ව්‍යාකුලත්වයකට මා පැමිණියැ යුතු වැ තිබේ ද?

**රජ**- (සියල්ලන් බලා) ඕ! සම-වියෙන් හා සම-රුවින් හෙබි පින්වතියන් ගේ සුහද බව මනා මැ යැ.

**ප්‍රියංවද**- (පසෙකට වී) අනසූයා, චතුර ගැඹුරු පියෙවි ඇති, මිහිරි පිය වදන් බෙණෙන උතුමකු මෙන් පෙනෙන මොහු කවරෙක් විය හැකි ද?

**අනසූයා**- යෙහෙළිය, මට ද ඇත්තේ කුහුළෙකි. මම ඔහු මැ පිළිවිසින්නම්. (ශබ්ද නඟා) ඔබ තුමන් ගේ මිහිරි බසින් ඇති වූ විස්වස මා බණවයි. ඔබතුමා විසින් කි-නම් රාජවංශයෙක් හොබවනු ලැබේ ද? ඔබ ගේ විරහයෙන් දුක් වන කෙ-බඳු මිනිසුන් ඇති, කුමන පෙදෙසෙකින් (පැමිණියාහු ද?) කවර හෙයින් ඉතා සියුමැලි වීත් අරම් පිවිසීමෙන් සිරුර විඩාවට පමුණුවන ලද ද?

**ශකුන්තලා**– (ආත්මගතම්) හිඅඅ, මා උත්තම්ම. එසා තුඑ චින්තිදං අණසූආ මන්තෙදි. [හෘදය, මොත්තාම්‍ය. එෂා ත්වයා චින්තිතම'නසූයා මන්ත්‍රයතෙ.]

**රාජා**– (ආත්මගතම්) කථමිදානීමාත්මානං නිවේදයාමි? කථං වාත්මා'පහාරං කරෝමි? භවතු. එවං තාවදේනාං වක්ෂ්‍යෙ. (ප්‍රකාශම්) භවති, යඃ පෞරවෙණ රාඥා ධර්මා'ධිකාරෙ නියුක්තඃ, සො'හමවිඝ්නක්‍රියො'පලම්භාය ධර්මාරණ්‍යමි'දමා'යාතඃ.

**අනසූයා**– සණාහා දාණිං ධම්මආරිණො. [සනාථා ඉදානීං ධර්මචාරිණඃ.]

(ශකුන්තලා ශෘඞ්ගාරලජ්ජාං රූපයති)

**සඛ්‍යෞ**– (උභයොරාකාරං විදිත්වා ජනාන්තිකම්) හලා සඋන්දලෙ, ජඉ එත්ථ අජ්ජ තාදෙ සණ්ණිහිදෙ භවෙ. [හලා ශකුන්තලෙ, යද්‍ය'ත්‍රා'ද්‍ය තාතඃ සන්නිහිතො භවෙත්]

**ශකුන්තලා**– තාදෙ කිං භවෙ? [තතඃ කිං භවෙත්?]

**සඛ්‍යෞ**– ඉමං ජීවිදසව්වසෙසෙණ වි අදිහිවිසෙසං කිදත්ථං කරිස්සදි. [ඉමං ජීවිතසර්වස්වෙනා'ප්‍යතිථිවිශෙෂං කෘතා'ර්ථං කරිෂ්‍යති.]

**ශකුන්තලා**– තුම්හෙ අවෙධ. කිං වි හිඅඑ කරිඅ මන්තෙධ. ණ වො වඅණං සුණිස්සං. [යුවාමපෙතම්. කිම'පි හෘදයෙ කෘත්වා මන්ත්‍රයෙථෙ. න යුවයොර් වචනං ශ්‍රොෂ්‍යාමි.]

**රාජා**– වයම'පි තාවද්භවත්‍යොඃ සඛීගතං කිම'පි පෘච්ඡාමඃ.

**සඛ්‍යෞ**– අජ්ජ, අනුග්ගහො විඅ ඉදං අබ්භත්ථණා. [ආර්‍ය, අනුග්‍රහ ඉවෙ'යම'භ්‍යර්ථනා]

**රාජා**– "භගවාන් කාශ්‍යපඃ ශාශ්වතෙ බ්‍රහ්මණි ස්ථිත" ඉති ප්‍රකාශඃ, ඉයං ච වඃ සඛී තදා'ත්මජෙ'ති කථමෙතත්?

**ශකුන්තලා--** (තමාට මැ) ශාදය, ඉවසිලි රහිත නො වෙව. මේ ඔබ ගේ සිතැ'ගිය අනසූයා කියන්නේ?

**රජ--** (තමාට මැ) කෙසේ ද දූන් මා හඳුන්වම්ද ? නැත හොත් වලහම් ද? වේවා, දූන් මැට මෙසේ කියම්· (ශබ්ද නගා) පින්වතිය, පෞරව රජකු විසින් යමෙක් ධර්මා'ධිකරණයෙහි යොදවනු ලැබී ද, ඒ මම නිරුපද්‍රැත තවුස් කම් ඇත් දැ'යි සොයා දැනගැනිමට මේ තවුස් වනයට පැමිණියෙමි

**අනසූයා--** තවුසෝ සසරණයෝ යි.

(සකුන්තලා ශෘඞ්ගාර ලජ්ජා දක්වයි)

**යෙහෙළියෝ--** (දෙදෙනාගේ ආකාර දැක පසෙකට වී) ප්‍රිය ශකුන්තලා, ඉදින් අද මෙහි පියා සිටියේ නම්?

**සකුන්තලා--** ඉතින් කිමෙක් ද, වන්නේ?

**යෙහෙළියෝ--** මේ සම්භාවනීය අමුත්තා (ඔහු ගේ) ජීවිතය සතු සියල්ලෙන් සගන්වි.

**සකුන්තලා--** ඔබ ඉවතට යන්නැ කුමක් හෝ සිතේ තබා ගෙන මතුරන්නහුද? මම ඔබ දෙදෙනා ගේ වදන් නො අසමි.

**රජ--** අපි–දූ දූන් ඔබ ගේ යෙහෙළිය පිළිබඳ වැ කිසිවක් අසමූ.

**යෙහෙළියන් දෙදෙනා--** උතුමාණෙනි, මේ ඉල්ලීම (අප) සැලැකිමක් බඳු යි.

**රජ--** ''පින්වත් කාශ්‍යප තෙමේ නිත්‍ය බ්‍රහ්මචාරියෙක් වැ සිටියෙකැ''යි ප්‍රකට යි. ඔබ ගේ මේ යෙහෙළිය ඔහු ගේ දරුයැ'යි කියයි, කිමෙක් ද මේ?

**අනසූයා**– සුණාදු අජ්ජෝ, අත්ථි කො වි කොසිඔ ත්ති ගොත්තණාමහෙඔ මහාප්පහාවො රාඑසී. [ශෘණොත්වා'ර්‍යඃ, අස්ති කො'පි කෞශික ඉති ගොත්‍රනාමධෙයො මහාප්‍රභාවො රාජර්ෂිඃ]

**රාජා**– අස්ති; ශ්‍රූයතෙ.

**අනසූයා**– තං ණො පිඅසහීඑ පහවං අවගච්ඡ. උජ්ඣිආඑ සරීරසංවඩ්ඪණාදිහිං තාදකස්සවො සෙ පිදා. [තාමා'වයොඃ ප්‍රභවම'වගච්ඡ. උජ්ඣිතායාඃ ශරීරසංවර්ධනාදිභිස්තාත කාශ්‍යපො'ස්‍යාඃ පිතා]

**රාජා**– උජ්ඣිතශබ්දෙන ජනිතං මෙ කෞතූහලම්. ආමූ-ලච්ඡ්‍රොතුමිච්ඡාමි.

**අනසූයා**– සුණාදු අජ්ජෝ. ගොදමී තීරෙ පුරා කිල තස්ස රාඑසිණො උග්ගෙ තවසි වට්ටමානස්ස කිං වි ජාදසං-කෙහිං දෙවෙහිං මෙණආ ණාම අච්ඡරා පෙසිදා, ණිඅමවිග්ඝකාලිණී, [ශෘණොත්වා'ර්‍යඃ, ගෞතමීතීරෙ පුරා කිල තස්‍ය රාජර්ෂෙරුග්‍රෙ තපසි වර්තමානස්‍ය කිමපි ජාතශඞ්කෛඃ දෙවෛර් මෙනකා නාමා 'ප්සරා ප්‍රෙශිතා නියමවිඝ්නකාරිණී.]

**රාජා**–අස්ත්‍යෙ'තද'න්‍ය සමාධිභීරුත්වං දෙවානාම්.

**අනසූයා**= තදෝ වසන්තෝ'දාර සමඑ සෙ උම්මාදඉත්තඅං රූවං පෙක්ඛිඅ... [තතො වසන්තා'වතාරසමයෙ තස්‍යා උන්මාදයිතෘකං රූපං ප්‍රෙක්ෂ්‍ය,... (අර්ධො'ක්තෙ ලජ්ජයා විරමති)

**රාජා**– පරස්තාත් ඥායත එව, සර්වථා'ප්සරඃ සම්භවෛ'ෂා?

**අනසූයා**– අහ ඉං? [අථ කිම්?

**රාජා**– උපපද්‍යතෙ;

අනසූයා- උතුමා අසනු මැනැවි. "කෞෂික" ය යි ගොත් නම් ඇති මහිමවත් කිසි රාජර්ෂි කෙනෙක් වෙති.

රජ- වෙති. අසනු ලැබේ.

අනසූයා- ඔහු අප ගේ යෙහෙළිය ගේ මුල් පියා යැ'යි දත මැනැවි. හැර දැමූ ඈ ශරීර සංවර්ධනා'දියෙන් පොෂ්‍ය කළ හෙයින් පිය කසුප් තෙමේ ඈ-ගේ පියා විය.

රජ- "හැර දැමූ" යන වදනින් මා-ගේ කුතුහළ දැනැවිණි. මුල සිටැ අසනු කැමැත්තෙමි.

අනසූයා- උතුමා අසනු මැනැවි. යට-ගිය දවසැ ඒ රාජර්ෂි තුමාණන් උග්‍ර තපස් රකිත කලැ කෙ සේ නමුත් කුකුසට පත් දෙවියන් විසින් තාපසට විත කළ-නැකි "මෙනකා" නම් දෙව් දුවක මෙහෙයවන ලදී.

රජ- මේ අනුන් ගේ සමාධියෙහි බිය බවෙක් දෙවියනට වේ.

අනසූයා- ඉක්බිති වසන්තාරම්භ සමයෙහි දී ඈ-ගේ මදන රුව බලා............ (අඩක් කියා ලජ්ජාවෙන් නවතියි.)

රජ- සිදු වූ දෙය හැඟේ මැ යි. සැබැවින් මැ දෙවඟනක ගෙන් උපත්තියක්,

අනසූයා- තවත් කිම?

රජ- යෙදේ මැ යි.

25. කොමළ මෙ-බඳු රුවෙක් මිනිස් කතුන'තර කොද?
තරල පබා තරුව නො වේ, මිහි තෙලෙන් උද

(ශකුන්තලා බිම බලා-ගෙනැ හිඳී)

මානුෂීෂු කථං වා ස්‍යාදස්‍ය රූපස්‍ය සම්භවඃ
19 න ප්‍රභාතරලං ජ්‍යොතිරුදෙති වසුධාතලාත්

(ශකුන්තලා'ධොමුඛී තිෂ්ඨති)

**රාජා**- ආත්මගතම් ලබ්ධා'වකාශො මෙ මනොරථඃ කිංතු සඛ්‍යාඃ පරිහාසොදාහෘතාං වරප්‍රාර්ථනාං ශ්‍රුත්වා ධෘත ද්වෛධීභාවකාතරං මෙ මනඃ.

**ප්‍රියංවදා**- (සස්මිතං ශකුන්තලාං විලොක්‍ය, නායිකාභිමුඛී භූත්වා) පුණො වි වත්තුකාමො විඅ අජ්ජො. [පුනරපි වක්තුකාම ඉවා'ර්‍යඃ.]

(ශකුන්තලා සඛීමඞ්ගුල්‍යා තර්ජයති,)

**රාජා**- සම්‍යගුපලක්ෂිතං භවත්‍යා. අස්ති නඃ සච්චරිත ශ්‍රවණලොභාදන්‍යදපි ප්‍රෂ්ටව්‍යම්.

**ප්‍රියංවදා**- අලං විආරිඅ. අණිඅන්තණා'ණුඔඔ තවස්සිඅණො ණාම. [අලං විචාර්‍ය, අනියන්ත්‍රණා'නුයොගස්තපස්විජනො නාම.]

**රාජා**- ඉති සඛීං තෙ ඥාතුමිච්ඡාමි,

26. වෛඛානසං කිමනයා ව්‍රතමප්‍රදානා—
ද්ව්‍යාපාරරොධි මදනස්‍ය නිෂෙවිතව්‍යම්
අත්‍යන්තමෙව සදෘශෙ'ක්ෂණ වල්ලභාභි—
රා'හො! නිවත්ස්‍යති සමං හරිණා'ඞ්ගනාභිඃ

**ප්‍රියංවදා**- අජ්ජ, ධම්මචරණෙ වි පරවසො අඅං ජණො, ගුරුණො උණ සෙ අණුරූවවරප්පදාණෙ සංකප්පො. [ආර්‍ය, ධර්මචරණෙ'පි පරවශො'යං ජනඃ, ගුරොඃ පුනරස්‍යා'නුරූපවරප්‍රදානෙ සංකල්පඃ]

**රාජා**- (ආත්මගතම්) න දුරවාපෙයං ඛලු ප්‍රාර්ථනා.

රජ- (තමාට මැ) ම-ගේ මන-දෙළ ලද්'වසරය ඇත්තේ යැ. එ-සේ වුවත් සැමියකු පැනීම ඉලක්කග කොටැ කී සෙහෙළිය ගේ විහිලුව අසා ම-ගේ සිත සැකයෙන් බැගෑ යැ.

ප්‍රියංවද- (සිනා සෙමින් සකුන්තලා දෙස බලා, නායිකාවට අභිමුඛ වැ) යළි-දු උතුමා බෙණෙනු කැමති සේ යැ.

(ශකුන්තලා සෙහෙළියට ඇඟිල්ලෙන් තර්ජනය කරයි)

රජ- පින්වතිය විසින් මනා වැ සැලැකැවිණ. සත් සිරිත් ඇසීමේ ආසාව නිසා, අපට තව ඇසියැ යුත්තෙක් වෙයි.

ප්‍රියංවද- විමසනු මැනැවි. තවුසෝ නම් විරෝධයක් නැති වැ ප්‍රශ්න කළ හැක්කාහු යැ.

රජ- ඔබ ගේ සෙහෙළිය පිළිබඳ වැ මෙ සේත් දැනගනු කැමැත්තෙමි.

26. දීමෙන් අහෝ දළ-තවුස් වත මැ හටත් දූත්
රක්තේ නු, හා! සරණ තෙක් වැලැකු සුවත් කාම
නැත් නම් මැ-ගේ වැනි දෙ-ඇස් දරණා
එකත්නෙහ්
වස්තේ දෙ ගෝ දිවිය තෙක් මෙ වනේ මියුල් හා

ප්‍රියංවද- උතුමාණෙනි, මේ තැනැත්තී ධම්වරණයෙහි දු ඇලුනී යැ. නමුත් පියා ගේ අදහස ඇට-සුදුසු හිමියකු ලබා-දීම යැ.

රජ- (තමාට මැ) සැබැවින් මැ ම-ගේ ප්‍රාර්ථනය මුදුන් පමුණුවා ගැනීම දුෂ්කර නො වේ.

27. සැකසෙනු මැනවි හද-සැක නැ එහි ලා කිසිත්
අනලයැ'යි සිතූ දැයද-රුවනෙක් වී යැ සැබැවින්

27. භව, හෘදය සා'භිලාෂං සම්ප්‍රති සංදෙහනිර්ණයො ජාතඃ
ආශංකසෙ යදග්නිං තදිදං ස්පර්ශක්ෂමං රත්නම්

**ශකුන්තලා**– (සරොෂමිව) අණසූඑ, ගමිස්සං අහං. [අනසූයෙ, ගමිෂ්‍යාම්‍ය'හම්]

**අනසූයා**– කිං ණිමිත්තං. [කිං නිමිත්තම්]

**ශකුන්තලා**– ඉමං අසංබද්ධපපලාපිණිං පිඅංවද අජ්ජාඑ ගොදමීඑ ණිවෙදඉස්සං. [ඉමාමසම්බද්ධප්‍රලාපිනීං ප්‍රියංවදමාර්‍යායෛ ගෞතම්‍යෛ නිවෙදයිෂ්‍යාමි.]

**අනසූයා**– සහි, ණ ජුත්තං තෙ අකිදසක්කාරං අදිහිවිසෙසං විසජ්ජිඅ සච්ඡන්දදො ගමණං, [සඛි, න යුක්තමකෘතසත්කාරමතිථිවිශෙෂං විසෘජ්‍ය ස්වච්ඡන්දතො ගමනම්]

(ශකුන්තලා න කිඤ්චිදුක්ත්වා ප්‍රස්ථිතෛ'ව)

**රාජා**– (ආත්මගතම්) ආඃ! කථං ගච්ඡති? (ග්‍රහීතුමිච්ඡන්නිගෘහ්‍යා'ත්මානං) අහො! චෙෂ්ටා ප්‍රතිරූපිකා කාමිජනමනොවෘත්තිඃ. අහං හි,

28. අනුයාස්‍යන්මුනිතනයාං සහසා විනයෙන වාරිතප්‍රසරඃ
ස්ථානාදනුච්චලන්නපි ගත්වෙ'ව පුනඃ ප්‍රතිනිවෘත්තඃ

**ප්‍රියංවදා**– (ශකුන්තලාං නිරුධ්‍ය) හලා, ණ දෙ ජුත්තං ගන්තුං [හලා, න තෙ යුක්තං ගන්තුම්]

**ශකුන්තලා**– (සභ්‍රූභංගම්) කිං ණිමිත්තං? [කිං නිමිත්තම්]

**ප්‍රියංවදා**– රුක්ඛසෙඅණෙ දුවෙ ධාරෙසි මෙ. එහි දාවං අත්තාණං මොආවිඅ තදො ගමිස්සසි. [වෘක්ෂසෙචනෙ ද්වෙ ධාරයසි මෙ. එහි තාවත්. ආත්මානං මොචයිත්වා තතො ගමිෂ්‍යසි] (බලාදෙනාං නිවර්තයති)

**රාජා**– භද්‍රෙ, වෘක්ෂසෙචනාදෙව පරිශ්‍රාන්තාමත්‍රභවතීං ලක්ෂයෙ. තථා හ්‍ය'ස්‍යාඃ,

**ශකුන්තලා**– (කෝපයෙන් මෙන්) අනසූයා, මම යමි.

**අනසූයා**– කවර හෙයින් ද?

**ශකුන්තලා**– මේ වල්-පල් දෙඩවන ප්‍රියංවද ගැන ගෞතමී උත්තමාවට සැලැකිරීමට.

**අනසූයා**– සෙහෙළිය, නො කළ සත්කාර ඇති ශ්‍රේෂ්ඨ අමුත්තකු හැර සිය කැමැත්තෙන් යාම ඔබට සුදුසු නැ.

(ශකුන්තලා කිසිත් නො බැණැ මැ නික්මෙයි.)

**රජ**– (තමාට මැ) අහ්! කෙසේ යේ ද? (අල්වා ගැනීමට සිතාත් තෙමේ ඉන් වැළැකී) කාමී ජනයා ගේ සිතේ පැවැත්ම ක්‍රියා පිළිබිඹු කොටැ ඇත්තේ යැ. පුදුම යි!

මා වනාහී—

28. තවුස් දුව ලුහුබැඳුණු ගමනැ'ති පද පවා
කුකුස් සිත යෙදි විනය වැළැකු සේ හවා
තොලස් වැ මැ ගොස් පැමිණි සැටියෙන් ගද තවා
වෙසෙස් සිරියෙකි නො සැලි සිටි මට මෙහි පවා

**ප්‍රියංවද**– (ශකුන්තලාව වළක්වා) සෙහෙළිය, ඔබට යාම සුදුසු නැ.

**ශකුන්තලා**– (බැම බිඳිමින්) ඇයි, හේතුව?

**ප්‍රියංවද**– ගස්වලට පැන් ඉසීමේ දී ඔබ ගස් දෙකකට මට ණය යි. එන්නැ, තමා ඉන් මිදී යන්නැ. (බලයෙන් ඈ නවත්වයි.)

**රජ**– භද්‍රාවෙනි, මෙහි ගස්වලට දිය ඉසීමෙන් මැ මේ පින්වතිය වෙහෙසට පත් වූ බව පෙනේ. එ සේ මැ යි. මැ-ගේ ද,

29. ස්‍රස්තාංසාවතිමාත්‍රලොහිතතලෞ බාහූ ඝටො'ත්ක්ෂෙපණා
දද්‍යා'පි ස්තනවෙපථුං ජනයති ශ්වාසඃ ප්‍රමාණා'ධිකඃ
බද්ධං කර්ණශිරීෂරොධි වදනෙ ඝර්මා'ම්භසාං ජාලකං
බන්ධෙ ස්‍රංසිනි චෛ'කහස්තයමිතා පර්‍ය්‍යාකුලා මූර්ධජාඃ

තදහමෙනාමනෘණාං කරොමි, (අංගුලීයං දාතුමිච්ඡති.)
(උභෞ නාමමුද්‍රාක්ෂරාණ්‍ය'නුවාච්‍ය පරස්පරමවලොකයතඃ)

**රාජා–** අලමස්මාන්‍යථා සම්භාව්‍ය. රාඥඃ පරිග්‍රහො'යමිති රාජපුරුෂං මාමවගච්ඡථ.

**ප්‍රියංවදා–** තෙණ හි ණාරිහදි එදං අංගුලීඅං අංගුලීවිඔඅං අජ්ජස්ස වඅණෙණ අණිරිණා දාණිං එසා. (කිඤ්චිද් විහස්‍ය)හලා සඋන්දලෙ, මොඉදා සි අණුඅංපිණා අජ්ජෙණ, අහවා මහාරාඑණ. ගච්ඡ, දාණිං, [තෙන හි නා'ර්හ- ත්‍යෙ'තදඞ්ගුලීයකමඞ්ගුලීවියොගම්. ආර්‍ය්‍යස්‍ය වචනෙනා 'නෘණෙ'දානීමෙෂා. හලා ශකුන්තලෙ, මොචිතා'ස්‍ය'නු කම්පිනා'ර්‍ය්‍යෙණ, අථවා මහාරාජෙන. ගච්ඡෙ'දානීම්.]

**ශකුන්තලා–** (ආත්මගතම්) ජඉ අත්තණො පහවිස්සං, (ප්‍රකාශම්) කා තුමං විස්සජ්ජිදව්වස්ස, රුංධිදව්වස්ස වා. [යද්‍යා'ත්මනඃ ප්‍රභවිෂ්‍යාමි. කා ත්වං විසර්ජිතව්‍යස්‍ය, රොද්ධව්‍යස්‍ය වා.]

**රාජා–** (ශකුන්තලාං විලොක්‍ය, ආත්මගතම්) කිං නු ඛලු යථා වයමස්‍යාමෙවමියමප්‍ය'ස්මාන් ප්‍රති ස්‍යාත්. අථ වා, ලබ්ධාවකාශා මෙ ප්‍රාර්ථනා. කුතඃ,

30. වාචං න මිශ්‍රයති යද්‍ය'පි මද්වචොභිඃ
කර්ණං දදාත්‍ය'භිමුඛං මයි භාෂමාණෙ
කාමං න තිෂ්ඨති මදානනසම්මුඛී සා
භූයිෂ්ඨමන්‍යවිෂයා න තු දෘෂ්ටිරස්‍යාඃ.

29. පැන් කුඹු ඔසොවා රත් පැ ග[illegible]ල් බා
පමණට වැඩියෙන් සුසුමින් පියොවුරු යුග සසලන
සැටි සර බා
සවනත පැලඳුණු කුසුමත් බා–දිය වලහත වත ඔළු බා
ලිහිල්වූ වරලස සැදුමට වත් අත නැවත ද එය සල බා

එ–සේ නම් මම ඇ ණය නැත්තියක කරමි. (මුදුව දෙනු කැමති වෙයි)

(දෙදෙන එහි සෙටූ අකුරු කියවා බලා එකි'ෙනකා දෙස බලති.)

රජ– අප අත් අයුරකින් ගැනීම සුදුසු සි. මෙය රජුගෙන් තෑග්ගෙකි'යි සිතා මා රාජ පුරුෂයකු සේ සලකන්නැ.

ප්‍රියංවදා– එ–සේ නම් නුසුදුසු සි, මේ මුදුව ඇඟිල්ලෙන් ඉවත් කිරීම. උතුමාණන් ගේ වදනින් මැ දූත් මෝ ණය නැත්තියකි. (මඳක් සිනා සී) ප්‍රිය ශකුන්තලා, දයාබර උතුමා විසින් නොහොත් මහරජු විසින් ඔබ (ණයෙන්) මුදන ලදු. දූත් යන්නැ.

ශකුන්තලා– (තමාට මැ) ඉදින් මා මට මැ ස්වාමි නම් (ශබ්ද නඟා) මා යැවීමට හෝ වැලැක්මට ඔබ කවුරු ද?

රජ– (ශකුන්තලාවත් බලා තමාට මැ) අප ඈට ද, ඈ අපට ද හැසුරුණු සැටියෙන් සැබැවින් කිමෙක් ද මේ. නොහොත් මගේ අභිලාෂය ලද අවකාශ ඇත්තේ නු! කෙසේ ද?

30. මා හා වදන් මැය අතේ මුසු නැ කරන්නේ
වුවත් එසේ සවන නම් දෙන සේ පෙනේ මැයි
ඇත්තෙන් ම–ගේ මුව නෙලින් නැනි, ඈ බැලන්නේ
ඈ ගේ බැලුම් ද බෙහෙවින් නො වැටේ වෙනත් කැත්

**නෛපථ්‍යේ**– හෝ! හෝ! තපස්විනඃ! සන්නිහිතාස්තපෝවන සත්ත්වරක්ෂායෛ භවත. ප්‍රත්‍යාසන්නඃ කිල මෘගයා විහාරී පාර්ථිවො දුෂ්‍යන්තඃ.

31\. තුරග ඛුර හතස්තථාහි රේණුර්
විටප විෂක්ත ජලාර්ද්‍ර වල්කලේෂු
පතති පරිණතා'රුණ ප්‍රකාශඃ
ශලභසමූහ ඉවා'ශ්‍රම ද්‍රුමේෂු.

**අපි** ච,

32\. තීව්‍රා'ඝාත ප්‍රතිහතතරුඃ ස්කන්ධලග්නෛක'දන්තඃ
පාද 'කෘෂ්ට ව්‍රතති වලයා'සඞ්ග සංජාත පාශඃ
මූර්තෝ විඝ්නස්තපස ඉව නො භින්න සාරඞ්ගයූථෝ
ධර්මා'රණ්‍යං ප්‍රවිශති ගජඃ ස්‍යන්දනා'ලෝක භීතඃ.

(සර්වාඃ කර්ණං දත්වා කිඤ්චිදි'ව සම්භ්‍රාන්තාඃ)

**රාජා**– (ආත්මගතම්) අහො, ධික්! සෛනිකා අස්මදන්වෙ-ෂිණස්තපෝවනමුපරුන්ධන්ති. භවතු, ප්‍රතිගමිෂ්‍යාමස්තා-වත්.

**සඛ්‍යෞ**– අජ්ජ, ඉමිණා ආරණ්ණවුත්තන්තෙණ පජ්ජා-උලම්හ. අණුජාණාහි ණෝ උඩඅගමණස්ස. [ආර්‍ය, අනෙනා'රණ්‍යකවෘත්තාන්තෙන පර්‍යාකුලම්හ. අනුජානීහි න උටජගමනාය]

**රාජා**– (සසම්භ්‍රමම්) ගච්ඡන්තු භවත්‍යඃ වයමප්‍යා'ශ්‍රමපීඩා යථා න භවති, තථා ප්‍රයතිෂ්‍යාමහෙ.

(සර්වේ උත්තිෂ්ඨන්ති)

**සඛ්‍යෞ**– අජ්ජ, අසම්භාවිද අදිහිසක්කාරං භූඅ වි පෙක්ඛණ ණිමිත්තං ලජ්ජමො අජ්ජං විණ්ණවෙදුං. [ආර්‍ය, අසම්භා විතා'තිථිසත්කාරං භූයො'පි ප්‍රේක්ෂණ නිමිත්තං ලජ්ජා මහෙ ආර්‍යං විඥපයිතුම්.]

**පසුබිම-** ඕ! ඕ! තවුසෙනි, තවුස් වනයෙහි වෙසෙන සතුන් රැකීම පිණිස සුහුඹුලු වෙනු. දඩයමෙහි එන දුෂ්‍යන්ත රජ ඉතා ලං-වී ලු ඒ එසේ මැ යි.

31. තුරඟ කැර ගැටි තැඹී ගියා වූ
අරුණ'ලු මූ-කළ කල්ගි මෙන් රජස් දූන්
පළගැටි පෙළ සේ තුරුන් මතේ ගේ
වෙළෙපැ වැනූ තොත වල්කලැ'ත් අරමිනී

තව ද,

32. තියුණු පහරක් වැදී ඉගිලුණු තුරෙක
ඇමුණුනු දළ දුරු
වෙළුණු පිය ඇදී ලතා පොකුර මැ හැකිල්ලක
ඇති සිරි දුරු
බැමුණු මුව කැල විසුරුවන ලද ලෙසිනී තපසට උවදුරු
දරුණු ඇත් රජ රිය දැකීමෙන් බිය වැ එයි අසපුව තුරු

(සියල්ලෝ කන් දී මඳක් බිය වූවාක් මෙන් සිටිති)

**රජ-** (තමාට මැ) අහෝ! තින්දුවෙකි. සෙනග අප සොයමින් තවුස් වනය සසලවයි. වේවා, ආපසු යා යුතුයි.

**සෙහෙළියෝ-** උතුමාණෙනි, මේ වල් ඇතා පිළිබඳ පුවතින් සසල වූවෙමු. අපට පැලට යාමට අනුදැන මැනැවි.

**රජ-** (වෙළෙවි වැ) පින්වතියෝ යෙත්වා! අපිදු තවුස් වනයට පීඩාවක් නො වන සැටියෙන් පිළිපදිමු.

(සියල්ලෝ නැඟිටිති)

**සෙහෙළියෝ-** උතුමාණෙනි, නො කළ අතිථි සත්කාර ඇති වැ-යළින් මෙහි එන්නැ'යි දැන්වීමට පවා ලජ්ජා ඇත්තෙමු.

රාජා-මා, ශෛණ්'වම්. දර්ශිතෙනෛ'ව භවතීනාං පුරස්කෘතො'ස්මි.

ශකුන්තලා- අණසූඑ, අහිණවකුසසූඊඑ පරික්ඛදං මෙ චලණං. කුරවඅ සාහා පරිලග්ගං ච වක්කලං, දාව පරිපාලෙධ මං, ජාව ණං මොආවෙමි. [අනසූයෙ, අභි-නවකුශසූච්‍යා පරික්ෂතං මෙ චරණම්. කුරබකශාඛා පරිලග්නංච මෙ වල්කලම්. තාවත් ප්‍රතිපාලයතාං මාම්, යාවදෙතං මොචයාමි.

(ශකුන්තලා රාජානමවලොකයන්තී සව්‍යාජං විලම්බ්‍ය සහ සඛීභ්‍යාං නිෂ්ක්‍රාන්තා.)

රාජා- මන්දෞත්සුක්‍යොස්මි නගරගමනං ප්‍රති. යාවදනු යාත්‍රිකාන්සමෙත්‍ය නා'තිදූරෙ තපොවනස්‍ය නිවෙශ-යාමි. න ඛලු ශක්නොමි ශකුන්තලා ව්‍යාපාරාදාත්මානං නිර්වර්තයිතුම්. මම හි,—

33. ගච්ඡති පුරඃ ශරීරං ධාවති පශ්චාදසංස්තුතං චෙතඃ
චීනාංශුක මිව කෙතොඃප්‍රතිවාතං නීයමානස්‍ය.

(නිෂ්ක්‍රාන්තාඃ සර්වේ)

---

## ඉති ප්‍රථමො'ඞ්කඃ

රජ- නැ! (එය) එසේ නො වේ. මිනැ'තියන් ගේ දර්ශන-
යෙන් මැ සත්කාර ලද්දේ වෙමි.

ශකුන්තලා- අනසූයා; නව කුසඟණ තුඩෙකින් ම-ගේ පිය
ගිල් වියැ. කටු කරඹු අත්තකැ වැහැරිය පැටලිණි. එය
මා මුදා-ගන්නා තෙක් නවතින්නැ.

(ශකුන්තලා රජු දෙස බලමින් ව්‍යාජයෙන් පමා
වෙමින් යෙහෙළියන් හා පිටත් වෙයි.)

රජ- දැන් නුවරට යාමට මදක් උකටලී වෙමි. අනුචරයන්
සමග තපෝවනයට නුදුරු වැ නැවතීම සුදුසු යි.
එබැවින් ශකුන්තලා පිළිබඳ වැ යෙදීමෙන් මා නවතන්
නට නො හැක්කෙමි. ම-ගේ වනාහී—

33. සිරුර ඉදිරියට ඇදෙත් මැ
දද යට සේ පෙරට 'රැගත්
ම-සිත යැවේ පසු පසින් මැ
දදය ලෙසින් යටි සුළඟෙහි.

(සියල්ලෝ විසිර යති)

---

## පළමු වන රඟය නිමාවිණි.

# ද්විතීයො'ඞ්කඃ

(තතඃ ප්‍රවිශති විෂණ්ණො විදූෂකඃ)

**විදූෂකඃ**- (නිඃශ්වස්‍ය) භො! දිට්ඨං. එදස්ස මිඅආසීලස්ස රණ්ණො වඅස්සභාවෙණ ණිව්විණ්ණොම්හි. අඅං මිඔ, අඅං වරාහො, අඅං සද්දූලො ත්ති මජ්ඣණ්ණෙ වි ගිම්හවිරලපාඅවච්ඡාආසු වණරාඊසු ආහිංඩීඅදි, අඩවීදෙ- අඩවිං, පත්තසංකරකසාආඉං කඩුණ්හාඉං ගිරිණඊ ජලාඉං පීඅංති. අණිඅද වෙලං සුල්ලමංසභූඉට්ඨො ආහාරො අණ්හීඅදි. තුරගාණුධාවණකංඩිදසංධිණො රත්තිම්මි වි ණිකාමං සඉදව්වං ණත්ථි,තදො මහන්තෙ එව්ව පච්චූසෙ දාසීඑ පුත්තෙහිං සඋණිලුද්ධඑහිං වණග්ගහණ කොලාහලෙණ පඩිබොධිදොම්හි. එත්තඑණ වි දාව පීඩා ණ ණික්කමදි. තදො ගණ්ඩස්ස උවරි පිංඩඔ සංවුත්තො. හිඔ කිල අම්හෙසු ඔහීණෙසු තත්තහොදො මිආණුසාරෙණ අස්සමපදං පවිට්ඨස්ස තාවසකණ්ණආ සඋන්දලා මම අධණ්ණදාඑ දංසිදා, සංපදං ණඅර ගමණස්ස කහං වි ණ කරෙදි, අජ්ජ වි සෙ තං එව්ව චින්තඅන්තස්ස අක්ඛීසු පභාදං ආසි. කා ගදී. ජාව ණං කිදවාර පරික්කමං පෙක්ඛාමි. (පරික්‍රම්‍යා'වලොක්‍ය ච) එසො බාණාසණ හත්ථාහිං ජවණීහිං වණපුප්ඵ මාලා ධාරිණීහිං පඩිවුදෙ ඉදො එව්ව ආඅච්ඡදි පිඅ වඅස්සො. හොදු, අංගභංග විඅලො විඅ හවිඅ චිට්ඨිස්සං, ජඉ එව්වං වි ණාම විස්සමං ලහෙඅං· (දණ්ඩකාෂ්ඨමවලම්බ්‍ය ස්ථිතඃ)

[භො! දිෂ්ටම්, එතස්‍ය මෘගයා ශීලස්‍ය රාඥෙ වයස්‍ය භාවෙන නිර්විණ්ණො'ස්මි, අයං මෘගො'යං වරාහො' යං ශාර්දූල ඉති මධ්‍යා'හ්නෙ'පි ග්‍රීෂ්මවිරලපාදපච්ඡායාසු වන- රාජිෂ්වා'හිණ්ඩ්‍යතෙ'ටවීතො'ටවීම් පත්‍රසංකරකෂායාණි කටූනි කඩුෂණානි ගිරිනදීජලානි පීයන්තෙ; අනියතවෙලං ශූල්‍යමාංසභූයිෂ්ට ආහාරො භුජ්‍යතෙ; තුරගා'නුධාවන-

## දෙ වන රඞ්ගය

(ඉක්බිති විඩාපත් විදූෂක පැමිණෙයි)

**විදූෂක-** (සුසුම් ලමින්) අහෝ! දෛවය. මේ දඩයමේ ලොල් රජුට හිතවත් බව නිසා වැරුණෙමි. 'මේ මුවෙක්' 'මේ ඌරෙක්' 'මේ දිවියෙක්' යි කියමින් මහ දවල්හි පවා, ග්‍රීෂ්ම-ඍතුව නිසා තුනී වූ ගස් සෙවනැති මහවන රොදවල්හි ලැහැබින් ලැහැබට සරනු ලැබේ. කොළ පල් වීමෙන් කසට වූ මදක් කැකැරුණු දෙල-පිහිලි දිය බොනු ලැබේ. අවේලාවන්හි දී, උල්වල ගසා පිලිස්සූ මස් බහුල ආහාර බුදිනු ලැබේ. අසුන් නැගී (සතුන්) ලුහු බැඳීමෙන් කෙටුණු හන්දි ඇති හෙයින් රෑයෙහි දු රිසි සේ නිදීමෙක් නැති. ඉක්බිති ඉතා අලුයමැ බලු රෑළ පිරිවැරූ වැද්දන් ගේ හා වේසා දරුවන් ගේ හා වන වැදීමේ කලබලයෙන් පුබුදු වන ලද්දෙම් වෙමි. මෙ-පමණකිනු දු මේ පීඩා නො නිමෙයි. තවත් ගෙඩියක් පිටැ ගඩුවක් යි කිවාක් මෙන් ඊයේත් අප පසුපස එද්දී මුවකු ලුහුබඳිමින් තවුස් වන පියෙසට පිවිසි ඔහුට, මගේ අවාසනාවට (දෝ) ශකුන්තලා නම් තවුස් කෙල්ලක් පෙනුණී. දූන් තම් නුවර යාම පිළිබඳ වැ කතාවකුදු නො කරයි. අදත් ඈ ගැන සිතන ඔහු ගේ ඇස් ප්‍රභාමත් විය. කවර පිළිසරණෙක් ද? කළ සිරිත්-විරිත් පිරියම් ඇති ඔහු බලන්නට යා යුතු යි. (සිසාරා බලා) මේ; හුනු-හී ගත් අතැ'ති වන මල් දම් දුරූ යවනියන් විසින් පිරිවරන ලද, ම-ගේ ප්‍රිය යහළුවා මොබට මැ එයි. වේවා, අඞ්ග-පඞ්ග කැඩුණු අයකු මෙන් සිටින්නෙමි. මෙ-සේ වත් විවේකයක් ලදෙත් යෙහෙකි.

(ලී සැරයටියෙකැ එල්බැ සිටී)

ඛණ්ඩිතස්‍යෛව රාත්‍රාව'පි නිකාමං ශයිතව්‍යං නා'ස්ති තතො මහත්‍යෙ'ව ප්‍රත්‍යූෂෙ දාස්‍යාපුත්‍රෛඃ ශ්වගණිලුබ්ධකෛර්වනග්‍රහණකොලාහලෙන ප්‍රතිබොධිතො'ස්මි. එතාවතා'පි තාවත් පීඩා න නිෂ්ක්‍රාමති; තතො ගණ්ඩස්‍යො'පරි පිණ්ඩකඃ සංවෘත්තඃ; හ්‍යඃ කිලා'ස්මාස්ව'වහීනෙෂු තත්‍රභවතො මෘගා'නුසාරෙණා'ශ්‍රමපදං ප්‍රවිෂ්ටස්‍ය තාපසකන්‍යකා ශකුන්තලා මමා'ධන්‍යතයා දර්ශිතා. සාම්ප්‍රතං නගරගමනස්‍ය කථාමපි න කරොති. අද්‍යා'පි තස්‍ය තාමෙව චින්තයතො'ක්ෂ්ණොඃ ප්‍රභාතමාසීත්. කා ගතිඃ, තාවත් තං කෘතා'චාර පරිකර්මාණං පශ්‍යාමි., එෂ බාණා'සනහස්තාභිර් යවනීභිර් වනපුෂ්පමාලාධාරිණීභිර් පරිවෘත ඉත'එවා'ගච්ඡති, ප්‍රියවයස්‍යඃ. භවතු. අංගභංග විකල ඉව භූත්වා ස්ථාස්‍යාමි යද්‍යෙ'වම'පිනාම විශ්‍රමං ලභෙය.]

(තතඃ ප්‍රවිශති යථා නිර්දිෂ්ට පරිවාරො රාජා)

**රාජා**- (ආත්මගතම්)

1. කාමප්‍රියා න සුලභා-මනස්තු තද්භාව දර්ශනාශ්වාසි
අකෘතෙ'ථෙ'පි මනසිජෙ රති'මුභයප්‍රාර්ථනා කුරුතෙ.

(සස්මිතං කෘත්වා) එවමාත්මාභිප්‍රාය සම්භාවිතෙ'ෂ්ටජන චිත්තවෘත්තිඃ ප්‍රාර්ථයිතා විඩම්බ්‍යතෙ.

2. ස්නිග්ධං වීක්ෂිතමන්‍යතො'පි නයනෙ යත් ප්‍රේරයන්ත්‍යා
තයා
යාතං යච්ච නිතම්බයොර් ගුරුතයා මන්දං විලාසාදි'ව
මා ගා ඉත්‍යු'පරුද්ධයා යද'පි සා සාසූයමුක්තා සඛී
සර්වං තත් කිල මත්පරායණමහො! කාමී ස්වතාං පශ්‍යති.

**විදූෂකඃ**- (තථා ස්ථිත එව) භො වඅස්ස, ණ මෙ හත්ථපාඅං පසරන්ති. වාආමෙත්තඑණ ජීආවඉස්සං. ජඅදු! ජඅදු භවං! [භො වයස්‍ය, න මෙ හස්තපාදං ප්‍රසරති. වාඞ්මාත්‍රෙණ ජාපයිෂ්‍යාමි, ජයතු! ජයතු භවාන්!

(ඉක්බිති කලින් කී පිරිවර සහිත රජු පිවිසෙයි)

**රජ-** (තමාට මැ)

1. පි ය ක ත   නො ලද හැකි සුවයෙන් යනු තිය   මා
මගෙ සිත්   පවා ඈ-ගෙ ඉඟි-බිඟි වලින් න   මැ
ඇති වත   නො ලද පලවත් බව තිබද වැ   මා
ලෙස සිත   වඩයි පෙම් රස ඔවුනො'වුන් ර   මා

(මඳ සිනාවක් පා)

මෙසේ තම අභිලාෂය ලෙස ප්‍රියජනයා ගේ සිත්-හසර මණ්ඩිත ප්‍රේමියා මුළා කෙරෙයි.

2. ඈ නෙත් කොන් යොමමින් ඉතා සිනිඳු සේ
අන් දෙස බලන්නී ලෙසින්
යන්නී වී ද උකුල් බරින් ලැසි ගමන් පේමෙන්
විලස් පෑ මනා
රොස් බස් දී 'නො යව' සි එ-සේ මැ වැලැකූ
යේළින් හටත් දුන් නිගා
ඒ මේ දූ හැම මා නිසා මැ යැ කියා කාමි සියත් බැව් දකී.

**විදූෂක-** (පලමු සැටියෙන් සිටියේ මැ) එම්බා මිත්‍රය, ම-ගේ අත් පා නො විහිදෙයි. වදන් පමණින් ජය පතමි. ඔබ තුමා දිනේවා! දිනේවා!

**රාජා**- කුතො'යං ගාත්‍රො'පඝාතඃ?

**විදූෂකඃ**- කුදො කිල සඅං අච්ඡි ආඋලිකරිඅ අස්සුකාරණං පුච්ඡෙසි? [කුතඃ කිල ස්වයමක්ෂිණීආකුලීකෘත්‍යා 'ශ්‍රුකාරණං පෘච්ඡසි?]

**රාජා**- න ඛල්වා'වගච්ඡාමි.

**විදූෂකඃ**- භො වඅස්ස, ජං වෙදසො කුජ්ජලීලං විඩංබෙදි; තං කිං අත්තණො පහාවෙණ ණං ණඊවෙඅස්ස? [භො වයස්‍ය, යද්වෙතසඃ කුබ්ජලීලාං විඩම්බයති. තත් කිමා'ත්මනඃ ප්‍රභාවෙණ නනු නදීවෙගස්‍ය,]

**රාජා**- නදීවෙගස්තත්‍ර කාරණම්,

**විදූෂකඃ**- මම වි භවං [මමා'පි භවාන්]

**රාජා**- කථමිව?

**විදූෂකඃ**- එව්වං රාජකජ්ජාණි උජ්ඣිඅ එආරිසෙ ආඋලප්පදෙසෙ වණචරවුත්තිණො තුඑ හොදව්වං. ජං සච්චං පච්චහං සාවදසමුච්චාරණෙහිං සංඛොහිඅ සන්ධිබන්ධාණං මම ගත්තාණං අණීසො ම්හි සංවුත්තො. තා පසීද මෙ එකාහං පි දාව විස්සමීඅදු. [එවං රාජකාර්‍යාණ්‍යු'ජ්ඣිත්වෛතාදෘශ ආකුලප්‍රදෙශෙ වනචරවෘත්තිනා ත්වයා භවිතව්‍යම්. යත්සත්‍යං ප්‍රත්‍ය'හං ශ්වාපදසමුත්සාරණෛඃ සංක්ෂොභිතසන්ධිබන්ධානාං මම ගාත්‍රාණාමනීශො'ස්මි සංවෘත්තඃ. තත් ප්‍රසීද මෙ එකාහමපි තාවද්විශ්‍රාම්‍යතාම්]

**රාජා**- (ස්වගතම්) අයං චෛවමාහ; මමා'පි කාශ්‍යපසුතාමනුස්මෘත්‍ය මෘගයා වික්ලවං චෙතඃ. කුතඃ?

3. න නමයිතුමධිජ්‍යමස්මි ශක්තො
ධනුරිදමාහිත සායකං මෘගෙෂු
සහවසතිමුපෙත්‍ය යෛඃ ප්‍රියායාඃ
කෘත ඉව මුග්ධවිලොකිතො'පදෙශඃ.

රජ- කොහිදීද මේ අත් පා බිඳුණේ?

විදූෂක- (සිනාසෙමින්) සැබැවින් කොහිදී ද? සිය ඇස් කළඹා ගෙනැ ඇයි, (මා) කඳුළු වගුරන හෙතුව පිමසන්නේ?

රජ- සැබැවින් මැ නො දනිමි.

විදූෂක- එම්බා මිත්‍රය, ඉදින් වේවැල කෙකටිය ශොභාව පරදවන්නේ සිය බලයෙන් ද, නැතහොත් නදී වේගයෙන් ද?

රජ- නදී වේගය එහි හෙතුවයි.

විදූෂක- මට ද (හෙතුව) ඔබ යි.

රජ- ඒ කෙසේ ද?

විදූෂක- මෙසේ රාජකාර්‍ය හැර දමා මෙ-බඳු ව්‍යාකූල ප්‍රදෙශයෙකැ වනචාරී පැවැත්මෙක් ඔබ විසින් කළ යුතු ද? ඉතින් ඇත්තෙන් මැ දින පතා මෘගයන් එලවීම නිසා වෙද්දල් වූ සන්‍ධි-බන්‍ධන ඇති අවයව (පවා) මා අයත් නො වේ. එ-හෙයින් මා සලකා එක් දිනක් වත් විවේක ගන්නැ.

රජ- මො-හුත් මෙ-සේ කියයි. මට ද ඇත්තේ කපුප් ද්‍රව සමරු දඩයමෙහි දෙගිඩියා සිතෙහි. මන්ද?

3. නැති, නැති, සවි මේ මුවන් විදීමේ
දිය ඇද ගී සකසා තැබූ තමුන් මා
සමග වැ විසුමෙන් ම-ගේ පියාවන්
බොළඳ බැලුම් උවදෙස් ලැබූ ලෙසින් වූ.

**විදූෂකඃ**– (රාඥො මුඛං විලොක්‍ය) අත්තභවං කිං වි හිඅඑ කරිඅ මංතෙදි. අරණ්ණෙ මඑ රුදිඅං ආසි. [අත්‍රභවං කිමපි හෘදයෙ කෘත්වා මන්ත්‍රයතෙ. අරණ්‍යෙ මයා රුදිතමාසීත්]

**රාජා**– (සස්මිතම්] කිමන්‍යත්, අනතික්‍රමණීයං මෙ සුහෘද්වාක්‍යමිති ස්ථිතො'ස්මි.

**විදූෂකඃ**– චිරං ජීඅ. [චිරං ජීව] (ගන්තු මිච්ඡති)

**රාජා**– වයස්‍ය, තිෂ්ඨ. සා 'වශෙෂං මෙ වචඃ.

**විදූෂකඃ**– ආණවෙදු භවං. [ආඥාපයතු භවාන්]

**රාජා**– විශ්‍රාන්තෙන භවතා මමාප්‍යෙකස්මින්නනායාසෙ කර්මණි සහායෙන භවිතව්‍යම්.

**විදූෂකඃ**– කිං මොදඅඛණ්ඩිආඑ? තෙණ හි අඅං සුගහීදෙ ඛණො. [කිං මොදකඛණ්ඩිකායාම්? තෙන හ්‍ය'යං සුගෘ-හීතඃ ක්ෂණඃ]

**රාජා**– යත්‍ර වක්ෂ්‍යාමි. කඃ කො'ත්‍ර භොඃ?

**දෞවාරිකඃ**– (ප්‍රවිශ්‍ය-ප්‍රණම්‍ය) ආණවෙදු භට්ටා [ආඥාපයතු භර්තා]

**රාජා**– රෛවතක, සෙනාපතිස්තාවදාහූයතාම්.

**දෞවාරිකඃ**– තහ [තථා] (නිෂ්ක්‍රම්‍යසෙනාපතිනා සහ පුනඃ ප්‍රවිශ්‍ය) එසො අණ්ණාවඅණ්ණුකකණ්ඨො භට්ටා ඉදො දිණ්ණදිට්ඨී එව්ව චිට්ඨදි. උවසප්පදු අජ්ජො [එෂ ආඥාවචනො'ත්කණ්ඨො භර්තෙතො දත්තදෘෂ්ටිරෙව තිෂ්ඨති. උපසර්පත්වා'ර්‍යඃ.]

**සෙනාපතිඃ**– (රාජානමවලොක්‍ය) දෘෂ්ටදොෂො'පි ස්වාමිනි මෘගයා කෙවලං ගුණායෛව සංවෘත්තාඃ තථා හි දෙවඃ

**විදූෂක**– (රජු ගේ මුහුණ බලා) මෙහි දී ඔබ කුමක් දෝ සිතා තබා-ගෙන කොදුරයි. මා වනයේ ගැඹුවාක් මෙනැ'යි (හඟිමි)

**රජ**– (සිනා පා) අන් කිමෙක් ද? මා මිතුරා වදන් ඉක්ම වියැ නො හැකි හෙයින් නවතිමි.

**විදූෂක**– සැරදේවා! (යනු කැමති වෙයි)

**රජ**– මිත්‍රය, නවතින්නැ. ම-ගේ කතාව අවසන් නැ.

**විදූෂක**– ඔබ තුමා වදරන්නැ.

**රජ**– ඉසුඹු ලත් ඔබ විසින් ම-ගේත් සුළු වැඩකට උදව් දිය යුතු සි.

**විදූෂක**– කිම, අග්ගලා කැමෙහි ද? එ-සේ නම් මේ ඇරයුම මැනැවින් පිළිගනිමි.

**රජ**– කියන්නම්. ඕ! කව් ද, කව් ද මෙහි?

**දෙරටුපළු**– (පිවිසැ; වැඳැ) හිමිතුමා වදරන්නැ.

**රජ**– රෛවතක, සෙන්පතියා කැඳවනු.

**දෙරටුපළු**– එ-සේ යි. (පිටත්ව ගොස් සෙන්පතියා හා යළි පිවිසැ) මේ නියෝග දීමෙහි උත්සුක වූ දේවයෝ, මෙහි හෙලූ ඇස් ඇති වැ මැ සිටිති, උතුමා එළඹෙන්නැ.

**සෙන්පති**– (රජු දෙස බලා) දක්නා ලද දෙස් ඇතිවත් දේවයන් කෙරෙහි හුදෙක් දඩයමෙන් ප්‍රයෝජනයක් ම වී තිබේ. ඒ එ-සේ මැ යි. රජතුමා,

4. අනවරත ධනුර්ජ්‍යාස්ඵාලන ක්‍රෑර පූර්වං
රවිකිරණ සහිෂ්ණු ස්වෙදලෙශෛරභින්නම්
අපචිතමපි ගාත්‍රං ව්‍යායතත්වාදලක්‍ෂ්‍යං
ගිරිවර ඉව නාගඃ ප්‍රාණසාරං බිභර්ති.

(උපෙත්‍ය) ජයතු! ස්වාමී. ගෘහීතශ්වාපදමරණ්‍යම්. කිමන්‍යත්‍රා'වස්ථීයතෙ?

**රාජා**– මන්දෝ'ත්සාහඃ කෘතො'ස්මි, මෘගයා'පවාදිනා මාඪව්‍යෙන.

**සෙනාපතිඃ**– (ජනාන්තිකම්) සඛෙ ස්ථිරප්‍රතිබන්ධො භව. අහං තාවත් ස්වාමිනඃ චිත්තවෘත්තිමනුවර්තිෂ්‍යෙ, (ප්‍රකාශම්) ප්‍රලපත්‍යෙෂ වෛධෙයඃ. නනු ප්‍රභුරෙවා'ත්‍ර නිදර්ශනම්.

5. මෙදශ්ඡෙද කෘශෝ'දරං ලඝුභවත්‍යු'ත්ථාන යෝග්‍යං වපුඃ
සත්ත්වානාමපි ලක්‍ෂ්‍යතෙ විකෘතිමච්චිත්තං භයක්‍රොධයොඃ
උත්කර්ෂඃ ස ච ධන්විනාං යදිෂවඃ සිධ්‍යන්ති ලක්‍ෂ්‍යෙ චලෙ
මිථ්‍යෛව ව්‍යසනං වදන්ති මෘගයාමීදෘග්විනොදඃ කුතඃ?

**විදූෂකඃ**– අවෙහි, රෙ උච්ඡාහහෙතුඅ. අත්තභවං පකිදිං ආපණ්ණෝ. තුමං දාව අඩවීදො අඩවිං ආහිංඩංතො ණරණාසිආලොලුවස්ස ජිණ්ණරිච්ඡස්ස කස්ස වි මුහෙ පඩිස්සසි. [අපෙහි රෙ උත්සාහහෙතුක, අත්‍ර භවාන් ප්‍රකෘතිමාපන්නඃ. ත්වං තාවදටවීතො'ටවීමාහිණ්ඩමානො නරනාසිකාලොලුපස්‍ය ජීර්ණ ඍක්‍ෂස්‍ය කස්‍යා'පි මුඛෙ පතිෂ්‍යසි.]

**රාජා**– භද්‍රෙ සෙනාපතෙ, ආශ්‍රමසන්නිකෘෂ්ටෙ ස්ථිතාඃ ස්මඃ අතඃ තෙ වචො නා'භිනන්දාමි, අද්‍ය තාවත්,

6. ගාහන්තාං මහිෂා නිපානසලිලං ශෘඞ්ගෛර් මුහුස්තාඩිතං
ඡායාබද්ධ කදම්බකං මෘගකුලං රොමන්ථමභ්‍යස්‍යතු.
විස්‍රබ්ධං ක්‍රියතාං වරාහපතිභිර් මුස්තා ක්‍ෂතිඃ පල්වලෙ
විශ්‍රාමං ලභතාමිදං ච ශිථිලජ්‍යාබන්ධමස්මද්ධනුඃ.

4. කැකුළු පෙර කයැ'ත්තේ සැව් දියේ තීත් ගැටීමෙන්
සහම්න හිරු රැස් ගා සිත් නො ලන්නේ විඩාවෙන්
සිය ගත දැඩි-වීමෙන් දිස් නොවේ වැරි බැව් හෝ
ගිරි සර ගිජිඳා මෙන් දැන් දරු ජීව සාරේ

(එළඹැ) හිමිතුමා දිනේවා! කැලය මෘගයන් සමග වට ලන ලදී කිම, ඔබ වහන්සේ අන් තැනෙකැ සිටින සේක්ද!

**රජ**– දඩයමේ දෙස් දක්වන මාඪව්‍ය විසින් මන්දෝත්සාහී කරනු ලැබීමි.

**සෙන්පති**– (පසෙකට වී) මිත්‍රය, විරොධයෙහි ස්ථිර වැ සිටින්නැ, මා නම් සවාමියා ගේ සිතැ'හි අනුව සෙමි. (ශබ්ද නඟා) මේ මෝඩයා දෙඩවයි. මෙහි ලා ඔබ වහන්සේ මැ නිදසුනෙක් නො වේ ද?

5. යාමෙන් මේද සිඳී කිසෝදර ලිහිල් කම්හී සමත්වේ කයත්
ලක් වේ කෝ බිය ඇ විකල් සිත පවා නෙක් නෙක් සතුන් ගේ වනේ
වායන් ගේ දුනු, දස්කමෙක් මැ හඟවයි වී නම් සැලුම් ලක්හි හී
දක්වත් දෙස් දඩයම්හි නත් ලෙස මුසා මෙවන් විනෝදෙක් කොයින්

**විදූෂක**– බොල දිරිගන්වන්න, ඉවත යව. මෙහි දී දේව යන් වහන්සේ පියෙවි බව ලැබූ, තෝ නම් වනයෙන් වනයට ඇවිදින්නේ මිනිස් නැගැයෙහි ලොල් වූ කිසි යම් ජරා වලසකු ගේ මුවෙහි වැටෙන්නෙහි යැ,

**රජ**– සොඳුරු සෙන්පතිය, අපි අසපුව අසල සිටියෝ වෙමු. එ හෙයින් ඔබ බස නො රිස්සමි. අද නම්–

6. වල් මීමෝ කළඹා විටින් විටැ අඟින් ගෙත්වා නිපානත් දියේ
රැස් වී යම් සෙවෙනෙක්හි ඒ මුව කැලත් කත්වා වමාරා තුටින්
හූරෝ වම්මුතු බෝ සෙයින් උදුරමින් යෙත්වා වනේ විල්හි වූ
මා ගේ දුන්න ද මේ ලිහිල් දිය දරා වේවා, විවේකෙන් උදම්

**විදූෂකඃ**– එදු භවං. [එතු භවාන්]

(උභෞ පරික්‍රම්‍යෝ'පවිෂ්ටෞ)

**රාජා**– මාඪව්‍ය, අනවාප්ත චක්ෂුඃ ඵලෝ'සි යෙන ත්වයා දර්ශනීයං න දෘෂ්ටම්.

**විදූෂකඃ**– ණං භවං අග්ගදො මෙ වට්ටදි? [නනු භවාන' ග්‍රතො මෙ වර්තතෙ]

**රාජා**– සර්වඃ ඛලු කාන්තමාත්මීයං පශ්‍යති. අහං තු තාමා'ශ්‍රමලලාමභූතාං ශකුන්තලාමධිකෘත්‍ය බ්‍රවීමි

**විදූෂකඃ**– (ස්වගතම්) හොදු, සෙ අවසරං ණ දඉස්සං. (ප්‍රකාශම්) භො වඅස්ස, තෙ තාවසකණ්ණආ අබ්භත්ථණීආ දිසදි. [භවතු, අස්‍යා'වසරං න දාස්‍යෙ. භො වයස්‍ය, තෙ තාපසකන්‍යකා'භ්‍යර්ථනීයා දෘශ්‍යතෙ]

**රාජා**– සඛෙ, න පරිහාර්‍ය්‍යෙ වස්තුනි පෞරවාණාං මනඃ ප්‍රවර්තතෙ.

8. සුර යුවති සම්භවං කිල මුනෙරපත්‍යං තදුජ්ඣිතා'ධිගතම්
අර්කස්‍යො'පරි ශිථිලං ච්‍යුතමිව නවමාලිකා කුසුමම්.

**විදූෂකඃ**– (විහස්‍ය) ජඉ කස්ස වි පිණ්ඩඛජ්ජූරෙහිං උව්වෙජිදස්ස තින්තිණීඑ අහිලාසො භවෙ. තහ ඉත්ථිආරඅණ පරිභොඉණො භවදො ඉඅං අබ්භත්ථණා. [යථා කස්‍යාපි පිණ්ඩඛර්ජූරෛරුද්වෙජිතස්‍ය තින්තිණ්‍යා'භිලාෂො භවෙත්, තථා ස්ත්‍රීරත්නපරිභාවිනො භවත ඉයමභ්‍යර්ථනා.]

**රාජා**– න තාවදෙනාං පශ්‍යසි, තෙනෛව'මවාදීඃ.

**විදූෂක**– ඔබ වහන්සේත් එබින්නෑ.

(දෙ-දෙනා මැ සිසාරා හිඳිති)

**රජ**– මාඪව්‍ය, යම් ගෙයකින් ඔබ (වෙසෙසින්) බැලියැ යුතු දෙය නො බැලී නම් නෙත් පල නො ලද්දෙකි.

**විදූෂක**– ඇයි, ඔබ මා ඉදිරියෙහි සිටිනු නො වෙත් ද?

**රජ**– හැම එකා මැ තමා ගේ දෙය රමණීයැ'යි සිතයි. නමුත්, මම අසපුවට ගෝතුවක් වැනි ශකුන්තලා උදෙසා කිමි.

**විදූෂක**– (තමාට මැ) වේවා, මොහුට ඉඩක් නො දෙමි. (ශබ්ද නගා) ප්‍රිය මිත්‍රය, ඔබ තවුස් ළඳක් පතන බව පෙනේ.

**රජ**– මිත්‍රය, ඉවත ලියැ යුතු දෙයෙහි පෞරවයන් ගේ සිත නො යෙදෙයි.

8. බිහිවූල මුනි දුව අසරක ගෙන්-ගැර දැමූ ඇය
වැඩුවෙළූ තවුසා
අක්තුරු මතුයෙහි ගැළැවී හුන්-පිපි දූසප්
කුසුමක් විලසා

**විදූෂක**– (සිනා සී) රට-ඉඳිවලින් තෘප්තිමත් වූවාහු පවා සියඹලා කෑමේ රිසි වෙත්. ස්ත්‍රී රත්නයන් සෙවුනා ඔබ වහන්සේට ද, ඇත්තේ එ බඳු රිසියෙකි.

**රජ**– ඔබ මෙ තෙක් ඇ නුදුටු හෙයින් මෙ සේ කියනි.

**විදූෂකඃ**- තං ඛු රමණිජ්ජං ජං භවදෙ වි විම්හයං උප්පාදෙදි. [තත් ඛලු රමණීයං යද්භවතො'පි විස්මයමුත්පාදයති.]

**රාජා** වයස්‍ය, කිං බහුනා,—

9. චිත්‍රෙ නිවෙශ්‍ය පරිකල්පිත සත්වයොගා
රූපොච්චයෙන මනසා විධිනා කෘතා නු
ස්ත්‍රීරත්න සෘෂ්ටිරපරා ප්‍රතිභාති සා මෙ
ධාතුර් විභුත්වමනුචින්ත්‍ය වපුශ්ච තස්‍යාඃ

**විදූෂකඃ**- ජඉ එව්වං පච්ඡාදෙසො දණිං රූවවදීණං
[යද්‍යෙවං ප්‍රත්‍යා'දෙශ ඉදනී රූපවතීනාම්]

**රාජා**- ඉදං ච මෙ මනසි වතීතෙ,

10. අනාඝ්‍රාතං පුෂ්පං කිසලයමලූනං කරරුහෛ
රනාවිද්ධං රත්නං මධුනවමනාස්වාදිත රසම්
අඛණ්ඩං පුණ්‍යානාං ඵලමිව ච තද්‍රූපමනඝං
න ජානෙ භොක්තාරං කමිහ සමුපස්ථාස්‍යති විධිඃ

**විදූෂකඃ**- තෙණ හි ලහු පරිත්තාඅදු ණං භවං, මා කස්ස වි තවස්සිණො ඉංගුදීතෙල්ලචික්කණස්ස හත්‍ථෙ පඩිස්සදි. [තෙන හි ලඝුපරිත්‍රායතාමෙනාං භවාන්, මා කස්‍යා'පි තපස්වින ඉංගුදීතෛලචික්කණශිර්ෂස්‍ය හස්තෙ පතිෂ්‍යති.]

**රාජා** - පරවතී ඛලු තත්‍ර භවතී. න ච සන්නිහිතො'ත්‍ර ගුරුජනඃ.

**විදූෂකඃ** - අධ භවන්තං අන්තරෙණ කීදිසො සෙ දිට්ඨිරාඔ? [අථ භවන්තමන්තරෙණ කිදෘශස්තස්‍යා දෘෂ්ටිරාගඃ.]

**රාජා** - නිසර්ගාදෙවා'ප්‍රගල්භාස්තපස්විකන්‍යාජනඃ.තථා'පි තු,.

**විදූෂක**- ඔබ වහන්සේ ගේ පවා පි[illegible]දනැ වූ ඈ සැබැවින් කාන්ත වියැ යුතු යි.

**රජ**- මිත්‍රය, බොහෝ කීමෙන් කිම්?

9. සිත්තම්හි ලා මහබඹා පණ ගන්වවාලා
රෑ එක් කිරීමෙහි සමත් කමෙකින් කළා දෝ
දස්කම් සිතත් බඹු ගෙ හා මැය ගේ රුවේ හා
අත් යොත් මිණක් ලෙස මැවූ සෙයෙකැ'යි හඟිම් මම්

**විදූෂක**- ඉදින් එය එසේ නම් සියලු රූප සුන්දරියන් ගේ බැහැර කිරීමෙක් ද?

**රජ**- මෙයත් ම-ගේ සිතේ තිබේ.

10. නො සිඹි මලෙකි – තියෙති නො සිඳි – කොමල දලුවෙ කී
නො විදි මිණෙකි – නො විඳි රසැ'ති – නවමු මීහිරෙ කී
නො සිඳි පලෙකි – එ රුව මෙ ලොව – ලැබුව කුසලෙ කී
එ විදි කෙ බඳු – ලොලකු පමුණු-වති ද නොදතැ කී

**විදූෂක**- එ සේ නම් ඔබ වහන්සේ වහා ඈ රැකැගන්නැ. අඟුත තෙල් ගැමෙන් ඉතා සිනිඳු හිසැ'ති කිසි තවුසකු ගේ අතෙහි (ඈ) නො වැටේවා.

**රජ** – එහි ඈ සැබැවින් අනුන් සතු යි. ඈ-ගේ පියා ද මෙහි නැත.

**විදූෂක** – හොඳයි. ඔබ වහන්සේ වෙත වෙසෙසින් ඈ-ගේ කෙ බඳු නේත්‍රා'නුරාගයෙක් වී ද?

**රජ** – ස්වභාවයෙන් මැ තවුස් දූරියෝ හුළුටිය හ. එසේ වුවත් මැ—

12. අභිමුඛෙ මයි සංහෘතමීක්‍ෂිතං
හසිතමන්‍යනිමිත්තකෘතො'දයම්
විනයවාරිත වෘත්තිරතස්තයා
න විවෘතො මදනෝ න ච සංවෘතඃ.

**විදූෂකඃ** – ණ ක්ඛු දිට්ඨමෙත්තස්ස තුහ අංකං සමාරොහදි. [න ඛලු දෘෂ්ටමාත්‍රස්‍ය තවා'ඞ්කං සමාරොහති]

**රාජා** – මිථඃ ප්‍රස්ථානෙ පුනඃ ශාලිනතයා'පි කාමමාවිෂ්කෘතො භාවස්තත්‍ර භවත්‍යා. තථාහි

12. දර්භා'ඞ්කුරෙණ චරණඃ ක්‍ෂත ඉත්‍ය'කාණ්ඩෙ
තන්විස්ථිතා කතිචිදෙව පදානි ගත්වා
ආසීද් විවෘතා වදනා ච විමොචයන්තී
ශාඛාසු වල්කලමසක්තමපි ද්‍රුමාණාම්.

**විදූෂකඃ** – තෙණ හි ගහීද පාහෙඔ හොහි. කිදං තුඑ උවවණං තවොවණං ත්ති පෙක්ඛාමි [තෙන හි ගෘහීත පාථෙයො භව, කෘතං ත්වයො'පවනං තපොවනමිති පශ්‍යාමි]

**රාජා** – සඛෙ, තපස්විභිඃ කෛශ්චිත් පරිඥාතො'ස්මි, චින්තය, තාවත් කෙනා' පදෙශෙන පුනරාශ්‍රමපදං ගච්ඡාමඃ.

**විදූෂකඃ** – කො අවරො අවදෙසො, ණං භවං රාආ. [කො'පරොප'දෙශඃ, නනු භවාන් රාජා?]

**රාජා** – තතඃ කිම්?

**විදූෂකඃ** – ණීවාරඡට්ඨභාඅං අම්හාණ උවහරන්තු ත්ති. [නීවාර ෂෂ්ටභාගමස්මාකමුපහරන්ත්වි'ති]

**රාජා** – මූර්ඛ, අන්‍යද්භාගධෙයමෙතෙෂාං රක්‍ෂණෙ නිපතති, යද් රත්නරාශීමපි විහාය 'භිනන්ද්‍යම්. පශ්‍ය,

11. ඉදිරියේ මා, ඇස් හකුළා බලා
සුනු ද අත් කරුණෙක් කෙරෙමින් උද
සුමිනයෙන් වැලැකු පැවැතුම් නිසා
නො සැඟැවී සැඟැවී පෙම වූ හදේ

**විදූෂක** – සැබැවින් දුටු පමණින් ඔබ ගේ ඇතැයට නො නගී.

**රජ** – යෙහෙළියන් හා එක් වැ යාමේ දී යලිදු ලජ්ජාශිලී ඇය විසින් එහි දී ඉඟි ද අනාවරණය කැරිණි.

12. දබ් අංකුරින් සිය පතුල් විදි සේ කියා පා
ලස්–ලස් වෙමින් නැවතුනා පිය කිපයක් ගොස්
රුක්–සාහි වල්කල ගැටුම් නො ලදත් මුදන්නී
මා වෙත් යොමා සිය මුවන් සිටියා පමාවත්.

**විදූෂක** – එ සේ නම් මාර්ගොපකරණ ගන්නැ. ඔබ තවුස් වනය මගුල් උයනක් කරන ලදැ'යි හඟිමි.

**රජ** – මිත්‍රය, ඇතැම් තවුසන් විසින් (මම) හඳුනා–ගන්නා ලද්දේ වෙමි. කවර උපායෙකින් නැවතත් අරම් පියෙසට යමුදැ'යි සිතන්නැ.

**විදූෂක** – අන් කුමන උපායෙක් ද? ඔබ වහන්සේ රජු නො වැ?

**රජ** – ඉන් කුමන ඵලයෙක් ද?

**විදූෂක** – හුරු හැල් වලින් සයෙන් කොටසක් ඉල්වා ගෙන යනු මැනැවි.

**රජ** – මෝඩයා, අනුන් ගෙන් ගත් බදු ඔවුන් රැකීම පිණිස යෙදෙයි. යම් හෙයකින් රුවන් රැස හැර සතුටු විය යුතු ද? බලනු.

13. යදුත්තිෂ්ඨති වර්ණෙභ්‍යො නෘපාණාං ක්ෂයි තද්ධනම්
තපඃ ෂඩ්භාගමක්ෂය්‍යං දදත්‍යා'රණ්‍යකා හි නඃ.

**නෙපථ්‍යෙ**- සාධු සිද්ධා'ර්ථෞ ස්වඃ.

**රාජා** - (කර්ණං දත්වා) අයෙ! ධීරප්‍රශාන්ත ස්වරෛඃ තපස්විභිර් භවිතව්‍යම්.

**දෞවාරිකඃ** - (ප්‍රවිශ්‍ය) ජෙදු; ජෙදු; භට්ටා. එදෙ දුවෙ ඉසිකුමාරආ පඩිහාර භූමිං උවට්ඨිදා. [ජයතු, ජයතු. භාර්තා. එතෙ වෙ ඍෂිකුමාරකෞ ප්‍රතීහාරභූමි-මුපස්ථිතෞ]

**රාජා** - තෙන හ්‍ය'විලම්බිතං ප්‍රවෙශය තෞ.

**දෞවාරිකඃ** - එසො පවෙසෙමි. [එෂ ප්‍රවෙශයාමි] (නිෂ්ක්‍රම්‍ය ඍෂිකුමාරාභ්‍යාං සහ ප්‍රවිශ්‍ය) ඉදො, ඉදො භවන්තා [ඉත ඉතො භවන්තෞ.] . (උභෞ රාජානං විලොකයතඃ)

**ප්‍රථම** - අහො! දීප්තිමතො'පි විශ්වසනීයතා'ස්‍ය වපුෂඃ. අථවො'පපන්නමෙතදෘෂිභ්‍යො නා'තිභින්නෙ රාජනි. කුතඃ,

14. අධ්‍යා'ක්‍රාන්තා වසතිරමුනා'ප්‍යා'ශ්‍රමෙ සර්වභොග්‍යෙ
රක්ෂායොගාදයමපි තපඃ ප්‍රත්‍ය'හං සංචිනොති
අස්‍යා'පි ද්‍යාං ස්පෘශති වශිනශ්චාරණ ද්වන්ද්වගීතඃ
පුණ්‍යඃ ශබ්දො මුනිරිති මුහුඃ කෙවලං රාජපූර්වඃ.

**ද්විතීයඃ** - ගෞතම, අයං ස බලභිත්සඛො දුෂ්‍යන්තඃ

**ප්‍රථමඃ** - අථ කිම්?

**ද්විතීයඃ** - තෙන හි,

13 රටුන් දෙන බිලියම් – නැසෙන සුළු මැ යැ රජු ගට
තපසින් සවන බාගය – දෙනි මුනිහු නො නැසෙන සුළු.

**පසුබිම** – ඕ! එලවන් අව් ඇත්තෝ වෙමු.

**රජ** – (කන් දී) ඔහෝ! ගැඹුරු–වෙසෙසින් ශාන්ත හඬෙකි. තවුසන් ගේ විය යුතු සි.

**දොරටුපලු** – (පිවිසැ) හිමියා දිනේවා, දිනේවා. තෙල තවුස් කුමරුවෝ දෙදෙනෙක් බිහි දොරට පැමිණිය හ.

**රජ** – එසේ නම් වහා ඔවුන් පමුණුවනු.

**දොරටුපලු** – එ සේ යැ. පමුණුවමි. (පිටත්වැ ගෙංස් තවුස් කුමරුවන් දෙදෙන හා පැමිණැ) මෙහෙන්! මෙහෙන් පිත්වතුනි;

(තවුස් කුමරුවෝ දෙදෙනා රජු දෙස බලති.)

**පළමුවැන්නා** – අහෝ! මහිමවත් නමුදු මොහු ගේ සිරුර ඇදහිය හැක්කෙකි. නො වේ නම් තවුසන් ගෙන් බොහෝ දුර නො වෙනස් වූ රජු කෙරෙහි එය සුදුසු මැ යි. කෙසේ ද?

14. ව ළ ඳ න කම් සුව ඇති හෝ පොදු අසපුව් සෙවුන් තිසා
ර ජ ය ත දත ඇති වැ ද හෝ රැකි තව දම් අලු ගවසා
පැබැඳි න "රද" පෙරදූරි කළ "ඉසි"
ගරු නම පත් තිදසා
ප තු ර න වැඳි දනන් යුගල බැගින් ගයති තිති සකසා

**දෙවැන්නා** – ගෞතම, ඒ, මේ ඉඳු මිත්‍ර දුෂ්‍යන්ත ද?

**පළමුවැන්නා** – අන් කවරෙක් ද?

**දෙවැන්නා** – එසේ වී නම්,

15. නෛ'තච්චිත්‍රං යදයමුදධිශ්‍යාමසීමාං ධරිත්‍රී—
මෙකඃ කෘත්ස්නාං නගරපරිඝප්‍රාංශු බාහුර් භුනක්ති.
ආශංසන්තෙ සමිතිෂුසුරා බද්ධවෛරාහි දෛත්‍යෛ-
රස්‍යා'ධිජ්‍යෙ ධනුෂි විජයං පෞරහූතෙ ච වජ්‍රෙ.

**උභෞ** – (උපගම්‍ය) විජයස්ව රාජන්.

**රාජා** – (ආසනා' දුත්ථාය) අභිවාදයෙ භවන්තෞ.

**උභෞ** – ස්වස්ති, භවතෙ. (ඵලාන්‍යු'පහරතඃ)

**රාජා** – (සප්‍රණාමං ප්‍රතිගෘහ්‍ය) ආඥප්තිමිච්ඡාමි.

**උභෞ** – විදිතො භවානාශ්‍රම සදමිහස්ථස්තෙන භවන්තං ප්‍රාර්ථයන්තෙ.

**රාජා** – කිමා'ඥාපයන්ති?

**උභෞ** – 'තත්‍ර භවතඃ කණ්වස්‍ය මහර්ෂෙරසාන්නිධ්‍යාද් රක්ෂාංසි න ඉෂ්ටි විඝ්නමුත්පාදයන්ති. තත් කතිපය-රාත්‍රං සාරථි ද්විතීයෙන භවතා සනාථී ක්‍රියතාමාශ්‍රම'' ඉති.

**රාජා** – අනුගෘහීතො'ස්මි.

**විදූෂකඃ** – (අපවාරී) එසා දාණිං අණුඋලා තෙ අබ්භත්ථණා [එෂෙ'දානීමනුකූලා තෙ'භ්‍යර්ථනා]

**රාජා** – (සස්මිතං කෘත්වා) රෛවතක, මද්වචනාදුච්‍යතාං සාරථිඃ. සබාණා'සනං රථමුපහරාපයෙ'ති.

**දෞවාරිකඃ**– ජං දෙවො අණවෙදි. [යද්දෙව ආඥාපයති] (නිෂ්ක්‍රාන්තඃ)

**උභෞ** – (සහර්ෂම්)

15. නුවර දෙරටු අගුළු කණුව මෙන්
                              හිවි දිගු බා යුව ලා
    සසුර දියෙහි සම් වන් හිම තෙක්
                              නතු කළම්හි සක ලා
    කවර පුදුම! එය සැබැවින් මොහු
                              දුනු, ඉඳු විදුර බ ලා
    අසුර න් බැඳි වෙර ඇති සුර ජය
                              සලකති සටනෙහි ලා

**දෙදෙනා** – (එළඹැ) රජතුමා දිනේවා!

**රජ** – (අසුනෙන් නැඟී) ඔබ තුමන් නමදිමි.

**දෙදෙනා** – ඔබට සුව වේවා! (පලතුරු පිළිගන්වති)

**රජ** – (ප්‍රණාම සහිත වැ පිළිගෙනැ) අණ කැමැත්තෙමි.

**දෙදෙනා** – අරම් වැසියනට ඔබ මෙහි සිටිනා බැව් සැලැවී තිබේ. එ හෙයින් ඔබ ගේ පැමිණීම පතති.

**රජ** – කුමක් අණවත් ද?

**දෙදෙනා** – "එහි කණ්ව සෘෂිහු ගේ බැහැරවීම නිසා යම් හෙයකින් රකුසෝ යාගයට උවදුරු නො කෙරෙත් ද, එ ලෙස රියැදුරා දෙවැනි කොට ඇති ඔබ රැ කිපයක් අරම අරක් ගනිත්වා" යනු තවුසන් ගේ අදහස යි.

**රජ** – පිළිගනිමි.

**විදූෂක**– (වළකා) මේ ඇරයුම ඔබ අදහසට රුකුළෙකි.

**රජ**– (මඳ සිනා පා) රෛවතක, දුනු-හී සහිත රිය ගෙන ඊමට ම-ගේ වචනයෙන් රියැ'දුරුට කියනු.

**දෙරටුපලු**– දේවයන් ගේ අණ ලෙසෙකි.

**තවුස්කුමරුවෝ**– (ප්‍රීතියෙන්)

16. අනුකාර්‍ණී පූර්‍වේෂාං යුක්තරූපමිදං ත්වයි
ආපන්නා භය සත්‍රේෂු දීක්ෂිතාඃ බලු පෞරවාඃ

**රාජා**– (සප්‍රණාමම්) ගච්ඡතාං පුරෝ භවන්තෞ. අහමප්‍ය–
'නුපදමාගත එව.

**උභෞ**– විජයස්ව. (නිෂ්ක්‍රාන්තෞ)

**රාජා**– මාධව්‍ය අප්‍ය'ස්ති ශකුන්තලා දර්‍ශනෙ කුතූහලම්?

**විදූෂකඃ**– පඪමං සපරිවාහං ආසි. දාණිං රක්ඛස වුත්තන්–
තෙණ බිංදූ. වි ණා'වසෙසිදො. [ප්‍රථමං සපරිවාහ–
මාසීත්. ඉදානීං රාක්ෂසවෘත්තාන්තෙන බින්දුරපිනා'ව–
ශෙෂිතඃ]

**රාජා**– මා භෛෂීඃ. නනු මත්සමීපෙ වර්‍තිෂ්‍යසෙ?

**විදූෂකඃ**– එස රක්ඛසාදො රක්ඛිදො'ම්හි [එෂ රාක්ෂසාද්
රක්ෂිතො'ස්මි]

**දෞවාරිකඃ**– (ප්‍රවිශ්‍ය) සජ්ජෝ රධො– භට්ටිණො විජඅප්ප–
ත්‍ථාණං අවෙක්ඛදි. එස උණ ණඅරාදො දෙවීණං
ආණත්ති හාරඹ කරභඹ ආඅදො. ]සජ්ජෝරථො.
භර්තුර්විජය ප්‍රස්ථානමපෙක්ෂතෙ. එෂ පුනර්නගරාද්–
දේවීනාමාඥප්තිහරඃ "කරභක" ආගතඃ]

**රාජා**– (සාදරම්) කිමම්බාභිඃ ප්‍රෙෂිතඃ?

**දෞවාරික**– අහ ඉං? [අථ කිම්?]

**රාජා**– නනු ප්‍රවෙශ්‍යතාම්.

**දෞවාරික**– තහ. (නිෂ්ක්‍රම්‍ය කරභකෙන සහ ප්‍රවිශ්‍ය)
එසො භට්ටා.· උවසප්ප, [තථා. එෂ භර්තා, උපසර්ප.]

16. පැරණි රජුන් අනුව කැරෙන ඔබට
මේ-සැටි සුදුසු වූ
පැමිණි කලට හුනැ උවදුරු
පුරුවෝ එහි ඉසුරු වූ

**රජ**– (ප්‍රණාම සහිතවැ) ඔබ වහන්සේලා පෙරටුව වඩින්නැ. මම ඔබ පිය අනුව එමි.

**තවුස් කුමරුවෝ දෙදෙනා**– දිනේවා! (පිටත් වෙති.)

**රජ**– මාඪව්‍ය, ඔබට ශකුන්තලා දැකීමේ ආශාවෙක් නැති ද?

**විදූෂක**– පළමුව තම් ගලා ගියා. දැන් රකුස් කතාවෙන් බිඳකුත් සෙස් නො වී යැ.

**රජ**– බිය නො වෙනු. මා ළඟ සිටිනවා නොවැ?

**විදූෂක**– ඒ මම රකුසන් ගෙනුත් රැකුනේ වෙමි.

**දෙරටුපළු**– (පිවිසැ) රිය සැදිණි. සවාමීන් ගේ විජයග්‍රහණය අපෙක්‍ෂා කෙරෙයි. තවත්, මේ දේවීන් ගේ සන්දේශ ගෙන යන "කරභක" පැමිණ සිටී.

**රජ**– (ආදර සහිත වැ) කිම, මව විසින් එවනු ලැබී ද?

**දෙරටුපළු**– වෙන කා-ගෙන් ද?

**රජ**– එසේ නම් පමුණුවනු.

**දෙරටුපළු**– එහෙම යි. (පිටත් වැ ගොස්, කරභක හා පැමිණ) මේ දේවයන් වහන්සේ ළඟා වන්නැ.

**කරභක-** ජෙදු, ජෙදු භට්ටා. දෙවී ආණවෙදි. ආආමිණී චඋත්ථෙ දිඅසෙ පුත්තපිණ්ඩපාලණො ණාම උවවාසො භවිස්සදි. තහිං දීහාඋණා අවස්සං සංභාවිදව්ව ත්ති [ජයතු, ජයතු භර්තා. දෙව්‍යා'ඥාපයති. ආගාමිනී චතුර්ථෙ දිවසෙ පුත්‍රපිණ්ඩපාලනො නාම උපවාසො භවිෂ්‍යති. තත්‍ර දීර්ඝා'යුෂා'වශ්‍යං සම්භාවනීයෙ'ති.]

**රාජා-** ඉතස්තපස්වි කාර්‍ය්‍යම්. ඉතො ගුරුජනා'ඥා. ද්වය- මප්‍ය'නතික්‍රමනීයම්. කිමත්‍ර ප්‍රතිවිධෙයම්?

**විදූෂක-** තිසංකු විඅ අන්තරාලෙ චිට්ඨ. [ත්‍රිශංකුරිවා'න්තරාලෙ තිෂ්ඨ]

**රාජා-** සත්‍යමාකුලීභූතො'ස්මි.

17. කෘත්‍යයොර් භින්නදෙශත්වා ද්වෛධී භවති මෙ මනඃ
පුරඃ ප්‍රතිහතං ශෛලෙ ස්‍රොතඃස්‍රොතො'වහො යථා.

(විචින්ත්‍ය) සඛෙ, ත්වමම්බයා පුත්‍ර ඉති ප්‍රතිගෘහීතඃ. අතො භවානිතඃ ප්‍රතිනිවෘත්‍ය, තපස්විකාර්‍ය්‍යව්‍යග්‍රමානසං මාමාවෙද්‍ය, තත්‍ර භවතීනාං පුත්‍රකෘත්‍යමනුෂ්ඨාතුමර්හති.

**විදූෂක-** ණ ක්ඛු මං රක්ඛොභීරුඅං ගණෙසි [න ඛලු මං රාක්ෂොභීරුකං ගණයසි.]

**රාජා-** (සස්මිතම්) භො මහාබ්‍රාහ්මණ, කථමෙතද් භවති සම්භාව්‍යතෙ?

**විදූෂකඃ-** ජහ රාආණුඑණ ගන්තව්වං, තහ ගච්ඡාමි. [යදි රාජා'නුජෙන ගන්තව්‍යං- තථා ගච්ඡාමි]

**රාජා-** නනු තපොවනො'පරොධඃ පරිහරණීය ඉති සර්වානනුයාත්‍රිකාංස්ත්වයෛව සහ ප්‍රස්ථාපයාමි.

**කරභක**- ස්වාමීනි වහන්සේ දිනෙන්වා! දිනෙන්වා දේවීන් වහන්සේ අණ කරන සේකි. "ලබන ජලවක් ද "පිතෘ පිණ්ඩ පාලන" උපවාසය වෙයි. එහි ලා දීර්ඝායුෂ්ක තෙමේ සැබැවින් මට සම්භාවනා කට යුතුයි" කියා

**රජ**- මේ පැත්තෙන් තපසුන් ගේ කාර්යයෙක්. මේ පැත්තෙන් මෑණියන් ගේ අණෙක්. දෙක මැ නො ඉක්ම වියැ හැකි යි. කිම, මෙහි පිළියම?

**විදූෂක**- ත්‍රිශංකු මෙන් අතර සිටින්නැ.

රජ- සැබැවින් අවුලක පැටලිණි.

17. එක් වර දෙ-කිසෙකි දෙ-ප සා
කළ යුතු මැ නු මා මන සා
ගැටී ගලෙහි ඉදිරි ප සා
දෙකට බෙදුණු නදිය ලෙ සා

(කල්පනා කොටැ) මිත්‍රය, ඔබ ද මෑණියන් විසින් පුතකු මෙන් පිළිගන්නා ලදී. එ හෙයින් ඔබ මොබින් පෙරළා ගොස් තවුසන් ගේ කටයුත්තෙකැ යුහුසුළු වූ මා ගැන දන්වා, එහි දී මෑණියන් ගේ පුත්‍ර කෘත්‍යය සිදු කිරීම වටී.

**විදූෂක**- සැබැවින් මා රකුසනට බියපත් වූවකු මෙන් නො සලකන්නෙහි ද?

රජ- (සිනා සෙමින්) ඕ! මහා බ්‍රාහ්මණය, ඒ බියසුළු බව ඔබ කෙරෙහි ලා කෙසේ සැලැකිය හැකි ද?

**විදූෂක**- ඉදින් යුව රජකු මෙන් යා යුතු නම් එසේ යමි.

**රජ**- තවුස් වන පීඩා දුරු කටයුතු හෙයින් සියලු පිරිවර මැ ඔබ සමග පිටත් කොටැ යවමි.

**විදූෂකඃ-** තෙණ හි ජුවරාඕ ම්හි දණිං සංවුත්තො. [තෙන හි යුවරාජො'ස්මි' දනීං සංවෘත්තඃ]

**රාජා-** (ස්වගතම්) චපලො'යං බටුඃ. කදාචිදස්මත්ප්‍රාර්ථනා-මන්තඃ පුරෙභ්‍යඃ කථයෙත්. භවතු. එනමෙවං වක්ෂ්‍යෙ. (විදූෂකං හස්තෙ ගෘහීත්වා, ප්‍රකාශම්) වයස්‍ය, ඍෂි-ගෞරවාදශ්‍රමං ගච්ඡාමි න බලු සත්‍යමෙව තාපස-කන්‍යකායාං මමා'භිලාෂඃ. පශ්‍ය,

18. ක්ව වයං ක්ව පරොක්ෂ මන්මථො
මෘගශාවෛඃ සමමෙධිතො ජනඃ
පරිහාස විජල්පිතං සඛෙ,
පරමාර්ථෙන න ගෘහ්‍යතාං වචඃ.

**විදූෂකඃ-** අහ ඉං? [අථ කිම්]

(නිෂ්ක්‍රාන්තාඃ සර්වෙ)

---

## ඉති ද්විතීයො'ඞ්කඃ

විදූෂක- එ-සේ නම් මම දූත් පුම රජේක්ම්.

රජ- (තමාට මැ) මේ සේවකයා චපලයෙකි. කිසි විටෙකැ අප අදහස් ඈතොවුරනට කියන්නේ යැ, වේවා! මොහුට මෙ සේ කියමි. (විදූෂකයන් ගේ අත ගෙනැ ශබ්ද-නගා) මිත්‍රය, තවුසනට ගෞරවයෙන් අසපුවට යමි. ඇත්-තෙන් මැ තවුස් දූරිය කෙරෙහි ම-ගේ අදහසෙක් නැති. බලන්නැ.

18. මේ මුව පොව්වන් හා වැඩී ආලේ
කුම් දූ'යි දත් කිසි ලෙස නො මැ ඈ හා
කවුරු ද මේ අපි, මා විහිලු බස්
මා බඳ නැ පරමත් ලෙස ගත්තේ .

(සියල්ලෝ පිට වැ යති.)

---

## දෙවන රඬගය නිමාවිණි

## තෘතීයෝ'ඞ්කඃ

(තතඃ ප්‍රවිශති යජමාන ශිෂ්‍යඃ)

**ශිෂ්‍යඃ-** (කුශානා'දාය) අහෝ! මහා'නුභාවඃ පාර්ථිවෝ. දුෂ්‍යන්තඃ. යෙන ප්‍රවිෂ්ටමාත්‍රඑවා'ශ්‍රමං තත්‍ර භවති රාජනි, නිරුපප්ලවානි නඃ කර්මාණි සංවෘත්තානි.

1. කා කථා? බාණ සන්ධානෙ ජ්‍යාශබ්දෙනෛ'ව දූරතඃ
හුංකාරෙණෛ'ව ධනුෂඃ ස හි විඝ්නානපෝහති.

යාවදිමාන්වෙදිසංස්තරණා'ර්ථං දර්භානෘත්විග්භ්‍ය උපහරාමි. (පරික්‍රම්‍යා'වලොක්‍ය ච ආකාශෙ) ප්‍රියංවදෙ, කස්‍යෙ'දමුශිරා'නුලෙපනං මෘණාලවන්ති ච නලිනී පත්‍රාණි නීයන්තෙ. (ශ්‍රැතිමභිනීය) කිං බ්‍රවීෂි? ආතපලඞ්ඝනාද් බලවදස්වස්ථා ශකුන්තලා, තස්‍යාඃ ශරීරනිර්වාපණායෙ'ති. තර්හි ප්‍රියංවදෙ, යත්නාදුපචර්‍යතාම්, සා ඛලු භගවතඃ කුලපතෙරුච්ඡ්වසිතම්. අහමපි තාවද් වෛතානිකං ශාන්තමුදකං ගෞතමී හස්තෙ විසර්ජයිෂ්‍යාමි (නිෂ්ක්‍රාන්තඃ)

## විෂ්කම්භකඃ

(තතඃ ප්‍රවිශති කාමයමානා'වස්ථො රාජා)

**රාජා-** (නිශ්වස්‍ය)

2. ජානෙ තපසො වීර්‍යං සා බාලා පරවතී'ති මෙ විදිතම්
අලමස්මි තතො හෘදයං තථා'පි නෙ'දං නිවර්තයිතුම්

(මදනබාධාං නිරූප්‍ය) භගවන් කුසුමා'යුධ, ත්වයා චන්ද්‍රමසා ච විශ්වසනීයාභ්‍යාමතිසන්ධීයතෙ කාමිජනසාර්ථඃ, කුතඃ

# තෙවන රඞ්ගය

(ඉක්බිති යජමාන ශිෂ්‍යයෙක් පැමිණෙයි.)

**ශිෂ්‍යයා-** (කුසතණ රැගෙනැ) අහෝ! මහිමවත් දුෂ්‍යන්ත රජතුමා. මේ පින්වත් රජු අසපුවට පිවිසි ඇසිල්ලේ මැ අප ගේ යාගකම් නිරුපද්‍රැත විය.

1 ගි තැගීමෙහි කුම් ක තා
දිය හඬින් දුර දි මැ ඉ තා
"හුං" හඬින් ලෙස නිසු ල තා
සියලු උවදුරැ දුරැ ලතා.

යඥ වෙදිකාවෙහි විසුරුවනු පිණිස යජමානයන් උදෙසා මේ කුසතණ ගතිමි. (කැරකී අවට හා ඈත ද බලා) ප්‍රියංවදා, කාට ද මේ සුවඳහොට අලෙවු ද නෙලුඹු දලි සහිත නෙලුඹු කොළ ද ගෙන යන්නේ? (කිසිවක් ඇසුණු බව හඟවමින්) කුමක් කියන්නෙහි? ශකුන්තලා උෂ්ණයෙන් බලවත් සේ රෝගාතුර වී! මේවා ඈ-ගේ ඇඟ තිවන්-නට? එ සේ නම් ප්‍රියංවදා ප්‍රවෙශමෙන් උවටැන් කරන්නැ. ඈ භගවත් කුලපති ගේ ප්‍රාණය. මම ද යාගයට නැඹු පිරිත් පැන් ගෞතමිය අත ඇට එවමි. (පිට වැ යයි.)

## විෂ්කම්භකයයි.

(මී-ළඟට කාමාතුර වූ රජ පිවිසෙයි.)

**රජ-** (සුසුම් ලා)

2. තවුස් බලය දනිමි අනෝ-ඇය ද අනුන් සතු දූරි ය කි
එහෙත් ඇගෙන් ම-හද පවා-ඉවත ගැනුම
ඇයි නොකළැකි

(කාමාතුර බව දක්වා) පින්වත් කුසුමවිය, ඇදහියැ හැකි යැ'යි පැවැසෙන ඔබ ද සඳ ද කාමී ජන නැල රවටනු ලැබේ. කෙසේ ද?

3. තව කුසුමශරත්වං ශීතරශ්මිත්වමින්දෝර්
ද්වයමිදමයථා'ර්ථං දෘශ්‍යතෙ මද්විධෙෂු
විසෘජති හිමගර්භෛරග්නිමින්දුර් මයූඛෛ
ස්ත්වමපි කුසුමබාණාන්වජ්‍රසාරී කරොති.

භගවන් කාමදෙව, න තෙ මය්‍ය'නුක්‍රොශඃ. කුතශ්ච තෙ කුසුමා'යුධස්‍ය සතස්තෛක්ෂ්ණ්‍යමෙතත් (විචින්ත්‍ය) ආඃ! ඥාතම්.

4. අද්‍යා'පි නූනං හරකොප වහ්නි
ස්ත්වයි ජ්වලත්‍යෞ'ර්ව ඉවා'ම්බුරාශෞ
ත්වමන්‍යථා මන්මථ මද්විධානාං
භස්මා'වශෙෂං කථමිත්ථමුෂ්ණඃ

අථවා,

5. අනිශමපි මකරකෙතුර් මනසො රුජමාවහන්නා-
භිමතො මෙ
යදි මදිරායත නයනාං තාමධිකෘත්‍ය ප්‍රහරතී'ති.

(සඛෙදං පරික්‍රම්‍ය) ක්ව නු ඛලු සංස්ථිතෙ කර්මණි සදස්‍යෛරනුඥාතඃ ඛින්නමාත්මානං විනොදයාමි. (නිඃශ්වස්‍ය) කිං නු ඛලු ප්‍රියදර්ශනාදෘතෙ ශරණමන්‍යත්. යාවදෙනාමන්විෂ්‍යාමි. (සූර්‍යමවලොක්‍ය) ඉමාමුග්‍රා'තපවෙලාං ප්‍රායෙණ ලතාවලයවත්සු මාලිනීතීරෙෂු සසඛීජනා ශකුන්තලා ගමයති, තත්‍රෛ'ව තාවත් ගච්ඡාමි. (පරික්‍රම්‍ය ස්පර්ශ සුඛං රූපයිත්වා) අහො! ප්‍රවාතසුභගො'යමුද්දෙශඃ.

6. ශක්‍යමරවින්දසුරභිඃ කණවාහී මාලිනී තරංගානාම්
අඞ්ගෛරනඞ්ගතප්තෛරවිරලමාලිඞ්ගිතුං පවනඃ

(පරික්‍රම්‍යා'වලොක්‍ය ච) අස්මින් වෙතසපරික්ෂිප්තෙ ලතාමණ්ඩපෙ සන්නිහිතයා තයා භවිතව්‍යම්. තථා හි,

3. ඔබ කුසුම්'වි ඇත්තේ නු සසක් ඇත් නු ගිම් රැස්
දෙක මැ අයුතු සේ මා වැත්නවුත් වෙත් යෙදේ නු!
තිසයුරු හිම ගැබි රැස්තෙන් වමන්තේ දහන් මැ යි.
ඔබ ද දූඹි කෙරෙත් මල් හී මෙ-සේ දූත් කුලිස් මෙන්!

පින්වත් කාමදේවය, මා කෙරෙහි දයාවක් ඔබට නැත් ද? කුසුම්'වි දරද්දීත් මෙ-බඳු කුරිරු බවෙක් කොයින් ද? (කල්පනා කොට) ඔහෝ දූනේ

4. සමුදුර වන් වඩවා'නල සේදෝ
උරඝර කෝ තල තා තුලැ වේදෝ
පන්සර අලු වූ, නැතහොත් කිමදෝ
මේ'යුර තැවුමක් මා හට දේදෝ

නොහොත්,

5. එ දිගැස නිසා මන්විසි තා දෙන පහ ර
සිත දනවතත් දුක, තා මට රිසි සම ර

(ශෝකයෙන් සිසාරා) යාග කර්මය නිමවීමෙන් පසු එසින් බැහැර වීමට අනුදන්නා ලද්දේ, ම-ගේ දුක කොහි දී දුරු කරම් ද? (හිරු දෙස බලා) මේ ඉමහත් අව් රැස් ඇති වේලෙහි ලියමඬුල්ලෙන් ගැවසුණු මාලිනී ගං තෙරට යෙහෙළියන් සමග ශකුන්තලා බෙහෙවින් යෙති. එහි මැ යා යුතුයි. (සිසාරා පහන් සුව හඟවා) අනේ, සුවඳ නලින් සුව දන වන මේ පෙදෙස!

6. පි යු මි න් සුවඳැ'ති මාලිනි තීරේ
වැ දෙ මි න් එන නල දිය බිඳු සාරේ
ම නයොන් සැර වැදි මේ මා සිරුරේ
බෙහෙවින් වැලඳියැ හැකි නු මෙ වරේ

(කැරකී බලා) වේවැලින් වට කළ ලිය මඬුල්ලෙහි සිටින්නී; සමහර විටැ ඇ විය යුතු යි. එ සේ යැ.

7\. අභ්‍යුන්නතා පුරස්තාදවගාඪා ජඝනගෞරවාත් පශ්චාත්
ද්වාරේ'ස්‍ය පාණ්ඩුසිකතේ පදපඞ්ක්තිර් දෘශ්‍යතේ'භිනවා

යාවද්විටපාන්තරේණා'වලෝකයාමි. (පරික්‍රම්‍ය, තථා කෘත්වා, සහර්ෂම්) අයේ! ලබ්ධං නේත්‍ර නිර්වාණම්. එෂා මේ මනෝරථ ප්‍රියතමා සකුසුමා'ස්තරණං ශිලාපට්ටමධි-ශයානා සඛීභ්‍යාමන්වාස්‍යතේ. භවතු, ශ්‍රෝෂ්‍යාම්‍යා'සාං විස්‍රම්භකථිතානි.

(විලෝකයන් ස්ථිතඃ)

(තතඃ ප්‍රවිශති තථෝ'ක්තව්‍යාපාරා සහ සඛීභ්‍යාං ශකුන්තලා)

**සඛ්‍යෞ**— (උපවීජ්‍ය, සස්නේහම්) හලා සඋන්‍දලේ, අවි සුහේදි දේ ණලිණීපත්ත වාදෝ? [හලා ශකුන්තලේ, අපි සුඛයති තේ නලිනීපත්‍ර වාතඃ.]

**ශකුන්තලා**— කිං වීඅඅංති මං සහිඔ? [කිං වීජයතෝ මාං සඛ්‍යෞ?]

(සඛ්‍යෞ විෂාදං නාටයිත්වා පරස්පරමවලෝකයතඃ)

**රාජා**— බලවදස්වස්ථ ශරීරා ශකුන්තලා දෘශ්‍යතේ. (සවිතර්කම්) තත් කිමයමාතපදෝෂඃ ස්‍යාත්; උත යථා මේ මනසි වර්තතේ. (සාභිලාෂං නිර්වර්ණ්‍ය) අථවා කෘතං සන්දේහේන

8\. ස්තනන්‍යස්තෝශීරං ප්‍රශිථිලමෘණාලෛකවලයං
ප්‍රියායාඃ සා'බාධං කිමපි කමනීයං වපුරිදං;
සමස්තාපඃ කාමං මනසිජ නිදාඝ ප්‍රසරයෝර්
න තු ග්‍රීෂ්මස්‍යෛ'වං සුභගමපරාද්ධං යුවතිෂු

**ප්‍රියංවදා**— (ජනාන්තිකම්) අණසූඑ, තස්ස රාඑසිණෝ පඪම-දංසණාදෝ ආරහිඅ පජ්ජුස්සුආ විඅ සඋන්‍දලා. කිං ණු ක්ඛු සේ තං ණිමිත්තෝ අඅං ආතංකෝ භවේ. [අනසූයේ, තස්‍ය රාජර්ෂේඃ ප්‍රථමදර්ශනාදාරභ්‍ය පර්යුත්සුකේ'ව ශකුන්තලා. කිං නු ඛලු අස්‍යාස්තන්නි-මිත්තෝ'යමාතඞ්කෝ භවේත්.]

7. මෙ ලිය ගොමුව ඉදිරි පසෙහි පෙනෙයි සුසුදු
වැලි තෙලේ
උකුළු බරිනී විලුඹ තෙරුණු තැගුණු පෙර'ග
පිය පෙළේ

ගස් වෙළෙප් අතරෙන් බලන්නට ඕනෑ. (සිසාරා, එසේ කොටැ) ඔහෝ! ඇසට නිවණ ලැබිණි. ම ගේ මතදෙළට අතිශයින් ප්‍රිය වූ මෝ මල් ඇතිරියෙන් හෙබි ගල් තලාවෙහි හොවින්නී යෙහෙළියන් දෙදෙනා විසින් සතසනු ලැබේ. වේවා, මොවුන් ගේ විස්වස් තෙපුල් අසමි. (බලමින් සිටී)

(ඉක්බිති පෙරූ කී කීසෙහි යෙදුණු ශකුන්තලා යෙහෙළියන් හා පිවිසෙයි)

**දෙයෙහෙළියෝ**– (පවන් සලා, ආදරයෙන්) ප්‍රිය ශකුන්තලා පියුම් පත් පවන් ඔබට සුව දේ ද?

**ශකුන්තලා**– කිම, යෙහෙළියෝ මට පවන් සලති ද?

**දෙයෙහෙළියෝ**– (දුක්බර බව හඟවා ඔවුනොවුන් දෙස බලති.)

**රජ**– ශකුන්තලා බලවත් සේ රෝගී බව පෙනේ. (සැක-යෙන්) ඒ කිම? උෂ්ණයේ වරදින් සිදුවූවක් ද, නො වේ නම් ම ගේ සිතෙහි පවත්නා සේ ද? (ආශාවෙන් බලා) නැත. සැකයෙන් කම් නැ.

8. දෙතන 'ලෙවූ දුන් උසීරු හා තෙලුඹු දලී වළලුව දරු
සිටිත පියඹි ගෙ ගිලන් මෙ සිරුර අහෝ රමණී බව දරු
ගිමන හා ආලයේ හා ඇති තැවුම සතතිනී එක පුරු
ගිමන යුවතින් පෙළනු මෙ ලෙසින් නොවේ
සැබැවින් මත හරු

**ප්‍රියංවදා**– (පසෙකට වී) අනසූයා, අර රජතුමා ගේ ප්‍රථම දර්ශනයේ පටන් ශකුන්තලා ආතුර වූ සේ යැ. කුමක් නිසා ඔහු නිමිති කොටැ මෙ බඳු සන්තාපයෙක් වියැ හැකි ද?

**අනසූයා**- සහි, මම වි ඊදිසී ආසංකා හිඅඅස්ස. හොදු, පුච්ඡිස්සං දව ණං (ප්‍රකාශම්) සහි, .පුච්ඡිදව්වා සි කිං පි. බලවං ඛු දෙ සංදාවො. [සඛි, මමා'පි'දෘශ්‍යා' ශංකා හෘදයස්‍ය. භවතු, ප්‍රක්ෂ්‍යාමි තාවදෙනාං, සඛි, ප්‍රෂ්ටව්‍යා 'සි කිම පි බලවාන් ඛලු තෙ සන්තාපඃ]

**ශකුන්තලා**- (පූර්වා'ර්ධෙන ශයනාදුත්ථාය) හලා, කිං වත්තු-කාමා 'සි? [හලා, කිං වක්තුකාමා 'සි?

**අනසූයා**- හලා සඋන්දලෙ, අණබ්භන්තරා ඛු අම්හෙ මදණ-ගදස්ස වුත්තන්තස්ස කිං දු, ජාදිසී ඉතිහාස ණිබන්ධෙසු කාමිඅමාණාණං අවත්ථා සුණීඅදි. තාදිසී දෙ පෙක්ඛාමි. කහෙහි කිං ණිමිත්තං දෙ සන්දාවො. විආරං ඛු පර-මත්ථදො අජාණිඅ අණාරම්භො පඩිආරස්ස. [හලා ශකුන්තලෙ, අනභ්‍යන්තරෙ ඛල්වාවාං මදනගතස්‍ය. වෘත්තාන්තස්‍ය. කින්තු, යදෘශි'තිහාසනිබන්ධෙෂු කාමයමානානාමවස්ථා ශ්‍රූයතෙ තාදෘශි තව පශ්‍යාමි. කථය! කිං නිමිත්තං තෙ සන්තාපඃ විකාරං ඛලු පරමාර්ථතො 'ඥාත්වා 'නාරම්භඃ ප්‍රතීකාරස්‍ය.]

**රාජා**- අනසූයාමප්‍ය'නුගතො මදීයස්තර්කඃ. න හි ස්වාභි-ප්‍රායෙණ මෙ දර්ශිතම්.

**ශකුන්තලා**- (ආත්මගතම්) බලවං ඛු මෙ අහිණිවෙසො. දාණිං වි සහසා එදාණං ණ සක්කොමි ණිවෙදිදුං [බලවාන් ඛලු මෙ'භිනිවෙශඃ. ඉදානීමපි සහසෛ'තයොර් න ශක්නොමි නිවේදයිතුම්.]

**ප්‍රියංවදා**- සහි සඋන්දලෙ, සුට්ඨු එසා භණාදි. කිං අත්තණො ආතංකං උවෙක්ඛසි? අණුදිඅහං ඛු පරිහීඅසි අංගෙහිං. කෙවලං ලාවණ්ණමඊ ඡායා තුමං ණ මුඤ්චදි. [සඛි ශකුන්තලෙ, සුෂ්ඨුවෙ'ෂා භනති. කිමාත්මන ආතංකමු පෙක්ෂසෙ? අනුදිවසං ඛලු පරිහීයසි අඞ්ගෛ. කෙවලං ලාවණ්‍යමයී ඡායා ත්වාං න මුඤ්චති.]

**අනසූයා**– සෙහෙළිය, ම ගේ සිතෙහිද මෙ බඳු සැකයෙකි. වේවා, දැන් ඈ පිළිවිසිමි. (ශබ්ද නඟා) සෙහෙළිය ඇසියැ යුතු කිසිවක් ඇත. ඔබ ගේ තැවුල බලවත්.

**ශකුන්තලා**– (යහනින් උඩු කය නඟා) ප්‍රියාවෙනි, කුමක් අසනු කැමැත්තෙහි ද ?

**අනසූයා**– ප්‍රිය ශකුන්තලා, ආලය පිළිබඳ පුවත් අපට නුහුරු යැ. එහෙත් ඉතිහාස කතාවන්හි මෙ බඳු කාමාතුර යන් පිළිබඳ අවස්ථා ඇසේ. ඔබ පිළිබඳවත් එ සේ දකිමි· කියන්නැ, ඔබ ගේ සන්තාපය කුමක් අරබයා ද? හේතුව නො දැනැ පිළියම් ඇරඹීම විහිළුවකි.

**රජ**– (තමාට මැ) අනසූයා ද ම ගේ අනුමානය අනුව ගියා සිය කැමැත්තෙන් ම ගේ හැඟීම එළි නො කළ යුතුයි.

**ශකුන්තලා**– (තමාට මැ) ම ගේ ප්‍රේමය බලවති. දැන් මොවුනට වහා කීමට ද නො පොහොසත්මි.

**ප්‍රියංවදා**– ප්‍රිය ශකුන්තලා, මෝ සුදුස්සක් කියයි. කො සේ ද ඔබ ගේ වේදනාව පහවී ද? දින පතා අඟ පසඟින් වැහැරෙයි. හුදෙක් ලාවණ්‍යය පමණක් ඔබ නො මුදයි.

**රාජා–** අවිතෘප්තාස්මි ප්‍රියංවදෙ. තථා හි,

9. ක්ෂාමක්ෂාම කපොලමානනමුරඃ කාඨිණ්‍යමුක්තස්තනඃ
මධ්‍යඃ ක්ලාන්තතරඃ ප්‍රකාමවිනතාව‘ංසෞ ඡවිඃ පාණ්ඩුරා
ශොච්‍යා ච ප්‍රියදර්ශනා ච මදනක්ලිෂ්ටෙයමාලක්ෂ්‍යතෙ
පත්‍රාණාමිව ශොෂණෙන මරුතා ස්පෘෂ්ටා ලතා මාධවී

**ශකුන්තලා–** සහි, කස්ස වා අණ්ණස්ස කහඉස්සං. ආආස ඉත්තිආ දාණිං වො හවිස්සං, [සඛි, කස්‍ය වා‘න්‍යස්‍ය කථයිෂ්‍යාමි. ආයාසයිත්‍රී ‘දානි වාං භවිෂ්‍යාමි.]

**උභෙ–** අදෙ එව්ව කඛු ණිබ්බන්ධො .සිණිද්ධජණ සංවිහත්තං හි දුක්ඛං සජ්ඣවෙදණං හොදි. [අත එව ඛලු නිර්බන්ධඃ, ස්නිග්ධජන සංවිභක්තං හි දුඃඛං සහ්‍යවෙදනං භොති.]

**රාජා–** 10 පෘෂ්ටා ජනෙන සමදුඃඛ සුඛෙන බාලා
නෙ‘යං න වක්ෂ්‍යති මනොගතමාධිහෙතුං
දෘෂ්ටො විවෘත්‍ය බහුශො’ ප්‍ය‘නයා සතෘෂ්ණා-
මත්‍රා‘න්තරෙ ශ්‍රවණ කාතරතාං ගතො‘ස්මි,

**ශකුන්තලා–** සහි, ජදෙ පහුදි මම දංසණ පහං ආඅදෙ සො තවොවණ රක්ඛිද රාඑසී. [සඛි, යතඃ ප්‍රභෘති මම දර්ශන-පථමාගතඃ ස තපොවන රක්ෂිතා රාජර්ෂිඃ......] (අර්ධො ‘ක්තෙන ලජ්ජාං නාටයති)

**උභෙ–** කධෙදු, පිඅ සහී, [කථයතු, ප්‍රියසඛී.]

**ශකුන්තලා–** තදෙ ආරහිඅ තග්ගදෙණඅ හිලාසෙණ එතද, වත්ථ මිහි සංවුත්තා.

[තත ආරභ්‍ය තද්ගතෙනා‘භිලාෂෙණෙ‘තදවස්ථා
‘ස්මි සංවෘත්තා.]

**රාජා–** (සහර්ෂම්) ශ්‍රුතං ශ්‍රොතව්‍යම්.

**රජ–** (තමාට මැ) ප්‍රියංවද ඇත්තක් කියයි. ඒ එසේ මැ යි.

9. කෙමෙන් වැගැරෙන කොපොල් ඇති වත
ළයැති නො කැකුළු පියො පිරු
සිහින් ඉඟ හා ඉතා එල්බුණු උදර පඬු පැ සිවි දුරු
පෙමින් ආතුර වූ යැ මෝ, පත් වියෙලි වැද ගත් මද මිරු
සමන් ලිය මෙන් දුනවුවත් සෝ දුකුම් කලු වෙයි තිරතුරු

**ශකුන්තලා–** යෙහෙළිය, වෙන කාට කියම් ද? මා දුන් ඔබට පීඩාවෙකි'යි හඟිමි.

**දෙයෙහෙළියෝ–** සැබැවින් මේ නිසා මැ යි අපේ ඇවටිල් ලත්, හිතවතුන් අතරැ බෙදුනු කල දුක් ඉවසනු හැකි.

**රජ–** (තමාට මැ)

10. බාලා දුකින් සහ සුවෙන් සමවුන් විසින් හෝ
අස්වා තමුන් නො මැ බෙනෙයි සිතැ වූ තිදන් වත්
ඒ නම් නො වේ යුතු. ලොබින් බැලුවත් සිසාරැ
දුන් නම් මැ-ගේ බස ඇසීමෙහි ලා බැගැයෙමි.

**ශකුන්තලා–** යෙහෙළිය, යම් මොහොතක පටන් තපො-වනාරක්‍ෂක ඒ රජතුමා මා ඇස් හමුවට පැමිණියේද......
(අඩක් කියා ලජ්ජාව හඟවයි.)

**දෙයෙහෙළියෝ–** කියන්නැ, ප්‍රිය යෙහෙළිය.

**ශකුන්තලා–** එතැන් සිට ඔහු කෙරෙහි වූ අභිලාෂයෙන් මෙ බඳු තත්‍වයකට පැමිණියෙමි.

**රජ–** (තමාට මැ) (ප්‍රීතියෙන්) ඇසියැ යුත්තක් ඇසීමි.

11. සමර් එව තාපහෙතුර් තිජීාපයිතා ස එව මෙ ජාතඃ
දිවස ඉවා'භ්‍රශ්‍යාමස්තාපාත්‍යයෙ ජීවලොකස්‍ය.

**ශකුන්තලා**– තං ජඉ වො අණුමදං, තා තහ වච්ටහ, ජහ තස්ස රාඑසිණො අණුඅංපිණිජ්ජා හොමි. අණ්ණහා අවස්සං සිංචධ මෙ තිලොදඅං. [තද්‍යදි වාමනුමතාං තද තථා වතේථාමි. යථා තස්‍ය රාජර්ෂේරනුකම්පනීයා භවාමි. අන්‍යථා'වශ්‍යං සිඤ්චතං මෙ තිලොදකම්]

**රාජා**– සංශයච්ඡේදි වචනම්.

**ප්‍රියංවද**– (ජනාන්තිකම්) අණසූඑ, දූරගඅමම්මයා අවබමා ඉඅං කාලහරණස්ස. ජස්සිං බද්ධභාවා එසා සො ලොමභූදෙ පොරවාණාං. තා ජුත්තං සෙ අභිලාසො අභිණන්දිදුං [අනසූයෙ, දූරගතමන්මථා'ක්‍ෂමෙ'යං කාලහරණස්‍ය, යස්මින් බද්ධභාවෙ'ෂා, ස ලලාමභූතඃ පෞරවාණාං, තද්‍යුක්තමස්‍යා'භිලාෂො'භිනන්දිතුම්.]

**අනසූයා**– තහ ජහ භණසි. (ප්‍රකාශම්) සහි, දිට්ඨිආ අණුරූවො දෙ අභිණිවෙසො. සාඅරං උජ්ඣිඅ කහිං වා මහාණඊ ඔදරඉ, [තථා යථා භනසි. සඛි, දිෂ්ට්‍යා'නුරූපස්තෙ'භිනිවෙශඃ. සාගරමුජ්ඣිත්වා කුත්‍ර වා මහා නද්‍ය'වතරති.]

**ප්‍රියංවද**– කො දාණිං සහආරං අන්තරෙණ අදිමුත්තලදං පල්ලවිදං සහෙදි? [ක ඉදානීං සහකාරමන්තරෙණා'තිමුක්තලතාං පල්ලවිතාං සහතෙ?]

**රාජා**– (ආත්මගතම්) කිමත්‍ර චිත්‍රං යදි විශාඛෙ ශශා'ඞ්කලෙඛාමනුවතීතෙ?

**අනසූයා**– කො උණ උවාඔ භවෙ? ජෙණ අවිලම්බිඅං ණිහු–අං අ සහීඑ මණොරහං සංපාදෙ මීහ. [කඃ පුනරුපායො භවෙත්? යෙනා විලම්බිතං නිභෘතං ච සඛ්‍යා මනොරථං සම්පාදයාවඃ]

11. පෙම මැ තැවුම දේ
එය මැ මහට නිවුම දේ

රුදුරු ගිමන අගැ දි මෙ සත් ලොවට සෙත සඳ
අඳුරු වලා පෙළින් සැඳුණු දිනය ලෙස වෙද

**ශකුන්තලා-** ඉදින්, ඔබ දෙ පොළට එය අභිමත නම් මා ඒ රජතුමාගේ දයාවට පාත්‍ර වන සේ පිළිපදින්නැ. නැත-හොත් නියනිත් මා වෙතැ තල මුසු දිය ඉසින්නැ.

**රජ-** (තමාට මැ) සැක දුරලන වදනෙකි.

**ප්‍රියංවදා-** (පසෙකට වී) අනසූයා ඇනට ගිය ප්‍රේමයෙන් යුතු මැ කල් වැරීමට අපොහොසති. මෝ යමකු කෙරෙහි ඇලුනී ද, හේ පෞරවයන් ගේ තිලකය වේ. එ හෙයින් ඈ ගේ ආශා සැපිරියැ යුතු.

**අනසූයා-** කියන සැටියෙකින් වේවා. (ශබ්ද නඟා) යෙහෙළිය, ඔබ ගේ අභිලාෂය දෛවා'නුකූලය. සයුර හැර මහා නදිය කොහි ගලා බසී ද?

**ප්‍රියංවදා-** මී අඹ ගස හැර අන් කවරකු අභිමුඛනක වැල දලු ගැන්වීමට සුදුසු ද?

**රජ-** (තමාට මැ) මෙහි කවර පුදුමයෙක් ද, විශාඛා තැකත් යුවළ ශශ ලේඛාව අනුව යේ නම්?

**අනසූයා-** යම් උපායෙකින් සුහුව ද රහසිව ද යෙහෙළිය ගේ මනදෙළ සපුරමු ද? යළි එබඳු කවර උපායෙක් වේ ද?

**ප්‍රියංවදා**– ණිඋණං තත්ති චින්තණිජ්ජං භවෙ. සිග්ඝං තත්ති සුඅරං [නිපුණමිති චින්තනීයං භවෙත්, ශීඝ්‍රමිති සුකරම්.]

**අනසූයා**– කහං විඅ? [කථමිව?]

**ප්‍රියංවදා**– ණං සො රාඑසී ඉමස්සිං සිණිද්ධ දිට්ඨිඑ සූඉද 'හිලාසො ඉමාඉං දිඅහාඉං පජාඅරකිසො ලක්ඛීඅදි [ නනු ස රාජර්ෂිරස්‍යාං ස්නිග්ධ දෘෂ්ට්‍යා සූචිතා'භිලාෂ එතාන් දිවසාන් ප්‍රජාගරකෘශො ලක්ෂ්‍යතෙ]

**රාජා**– සත්‍යමිත්ථම්භූත එවා'ස්මි.

12 ඉදමශිශිරෛරන්තස්තාපාද් විවර්ණමණීකෘතං
නිශි නිශි භුජන්‍යස්තාපා'ඞ්ග ප්‍රවර්තිභිරශ්‍රුභිඃ
අනභිලුලිත ජ්‍යාඝාතා'ඞ්කං මුහුර් මණිබන්ධනාත්
කනකවලයං ස්‍රස්තං ස්‍රස්තං මයා ප්‍රතිසාර්‍යතෙ

**ප්‍රියංවදා**– (විචින්ත්‍ය) හලා, මඅණලෙහො සෙ කරීඅදු. ඉමං දෙවදසෙසාවදෙසෙණ සුමණො ගොවිදං කරිඅ, සෙ හත්ථඅං පාවඉස්සං [හලා, මදනලෙඛො'ස්‍ය ක්‍රියතාම්. ඉමං දෙවතාශෙෂා'පදෙශෙන සුමනො ගොපිතං කෘත්වා අස්‍ය හස්තං ප්‍රාපයිෂ්‍යාමි.]

**අනසූයා**– රොඅඊ මෙ සුඋමාරො පඔඔ. කිං වා සඋන්දලා භණාදි? [රොචතෙ මෙ සුකුමාරඃ ප්‍රයොගඃ කිං වා ශකුන්තලා භණති.]

**ශකුන්තලා**– කිං ණිඔඔ තුම්හාණං විකප්පීඅදි? [කිං නියොගඃ වාං විකල්ප්‍යතෙ?]

**ප්‍රියංවදා**– තෙණ හි අත්තණො උවණ්ණාස පුව්වං චින්තෙහි. දව කිං වි ලලිඅපදබන්ධණං [තෙන හ්‍යා'ත්මන උපන්‍යාසපූර්වං චින්තය, තාවත් කිම පි ලලිත පදබන්ධනං]

**ශකුන්තලා**– හලා, චින්තෙමි අහං. අවහීරණභීරුඅං පුණො වෙවඉ මෙ හිඅඅං [හලා, චින්තයාම්‍ය'හම්. අවධීරණභීරුකං පුනර් වෙපතෙ මෙ හෘදයම්]

**ප්‍රියංවදා**– "රහසින්" යනු සිනියැ යුතු වෙයි. "වහා" යනු පහසුවෙන් කළ හැකි යැ.

**අනසූයා**– කෙ සේ ද?

**ප්‍රියංවදා**– ඇසි; ඒ රජතුමා මැ කෙරෙහි සෙනෙහෙබර බැල්මෙන් පැහැදිලි ආලය ඇත්තේ මේ දිනවලැ නිදිවරා කෘශ වැ ගිය බැව් නො පෙනේ ද?

**රජ**– (තමාට මැ) සැබැවින් එසේ මැ වීමි. ඒ එ සේ මැ සි.

12 රුයක් පාසා ම හද තැවුමෙන් හැලුණු කඳුලැලි
නෙත'ගි නී
වැකුණු මිණි, නො මැ ගැටුණු නිරතුරු
දුනු දියෙන් නැගි කැළැලි නී
වලය මේ රත්'ලීහිල් වී ඇද හෙත් මැ පහළට වේගෙ නී
නිතර ඔසවනු ලැබේ ඉහළට අබල වූ මිණි බැඳුමෙ නී

**ප්‍රියංවදා**– (කල්පනා කොට) ප්‍රියාවෙනි, ඔහුට "පෙම්පතක්" ලියන්නැ. මෙය රජ පඬුරක නියාවෙන් මැනැවින් සඟවා ඔහු අතට පමුණුවම්.

**අනසූයා**– මාත් කැමතියි මේ පහසු උපායට. ශකුන්තලා කුමක් කියා ද?

**ශකුන්තලා**– කිම, ඔය දෙන්නා ගේ කියමන සැක කළ යුතු ද?

**ප්‍රියංවදා**– එ සේ නම් තමා ගැන කිසි යම් කමනීය රචනයක් කිරීමට සිතන්නැ.

**ශකුන්තලා**– ප්‍රියාවෙනි, මම සිතමි. යළිත් නින්දවට ඇනි බියෙන් ම හද ගැහෙයි.

**රාජා**- (ආත්මගතම්) (සශ්ලාඝම්) හෙ භීරු

13. අයං ස තෙ තිෂ්ඨති සංගමොත්සුකො
විශඞ්කසෙ භීරු යතො 'වධීරණාම්
ලභෙත වා ප්‍රාර්ථයිතා න වා ශ්‍රියං
ශ්‍රියා දුරාපඃ කථමීප්සිතො භවෙත්.

**සඛ්‍යෞ**- අයි! අත්තාගුණාවමාණිණි, කො දාණිං සරීරණිව්වාවඉත්තිඅං සාරදිඅං ජොසිණිං පඩංතෙණ වාරෙදි. [අයි! ආත්මගුණාවමානිනි, ක ඉදානීං ශරීරනිර්වාපයිත්‍රීං ශාරදීං ජ්‍යොත්ස්නාං පට'න්තෙන වාරයති.]

**ශකුන්තලා**- (සස්මිතම්) ණිඔඉද දාණිං මිහි. [නියොජිතෙ'දානීමස්මි.] (උපවිෂ්ට චින්තයති)

**රාජා**- ස්ථානෙ ඛලු විස්මෘත නිමෙෂෙණ චක්ෂුෂා ප්‍රියා 'මවලොකයාමි. යතඃ,

14. උන්නමිතෛක භ්‍රූලතමානනමස්‍යාඃ පදානි රචයන්ත්‍යාඃ
කණ්ටකිතෙන ප්‍රථයති මය්‍ය'නුරාගං කපොලෙන.

**ශකුන්තලා**- හලා, චින්තිදං මඑ ගීදවත්ථු. ණ ක්ඛු සණ්ණිහිදාණි උණ ලෙහණසාහණාණි. [හලා, චින්තිතං මයා ගීතවස්තු. න ඛලු සන්නිහිතානි පුනර් ලෙඛන සාධනානි]

**ප්‍රියංවදා**- ඉමස්සිං සුඔදර සුඋමාරෙ ණලිණීපත්තෙ ණහෙහිං ණික්ඛිත්තවණ්ණං කරෙහි. [එතස්මින් ශුකොදරසුකුමාරෙ නලිනීපත්‍රෙ නඛෛර් නික්ෂිප්තවර්ණං කුරු]

**ශකුන්තලා**- (යථොක්තං රූපයිත්වා) හලා, සුණුහ දාණිං සංගදත්ථං, ණ වෙත්ති [හලා, ශෘණුතමිදානීං සංගතා'ර්ථං න වෙ'ති]

**උභෙ**- අවහිද ම්හ. [අවහිතො'ස්මඃ]

**රජ**– (තමාට මැ) (ප්‍රීතියෙන්) **එම්බා තියැත්තියේ,**

13. වමන් නො රිස්සු ද ඔබත් සමක්හු ගෙන්
ඔහුත් සිරී සංගමයේ කැමැත්තෙත්
සිරි පැතුයේ නො ලබා ලබා හෝ
සිරි කැමැත්තා සැබැවින් ලබයි එයත්.

**දෙයෙහෙළියෝ**– එම්බා තමන් මැ තිගත්තිය, කවරෙක් සිරුර තිවන සරා සඳරැස් රෙදි කොණින් වළක්වත් ද?

**ශකුන්තලා**– (සිනා සහිතව) මම ඔබ විසින් මෙහෙයන ලද්දේ වෙමි.

(වාඩිවී සිතයි.)

**රජ**– සැබැවින් යුතු පරිදි අමතක වූ ඇසිපිය හෙළීම් ඇති ඇසින් ප්‍රියාව බලා ගනිමි. යම් සේ—

14. වදත් රසයත මැ–ගේ මුවනත නෙරුණු
ඉහළට බැම ලියේ
කොපොල ලොම් උදහයෙන් හද තුලැ මෙ මට
ඇති පෙම කියෙ ලියේ

**ශකුන්තලා**– ප්‍රියාවෙති, මා ශියකට අදහස සිතුවා, එහෙත් එය ලිවීමට ලිපිද්‍රව්‍ය කිසිවක් මා ළඟ නැත.

**ප්‍රියංවදා**– ගිරා කුස සේ සුකුමාර පියුම් පතෙකැ තියෙන් අකුරු ලියන්නැ

**ශකුන්තලා**– (කියූ ලෙස රූපණය කොට) යෙහෙළියෙනි, දැන් අසාගන්නැ. අරුත් සහිත ද රහිත දැ 'සි.

**දෙයෙහෙළියෝ**– කන් දෙමු,

**ශකුන්තලා–** (වාචයති)

15. තුජ්ඣ ණ ජාණෙ හිඅඅං මම උණ කාමො දිවාපි රත්තිම්මි
ණිග්ඝිණ තවඉ බලීඅං තුහ වුත්ත මණොරහාඉං අංගාඉං

[තව න ජානෙ හෘදයං, මම පුනඃ කාමො
දිවා'පි රාත්‍රාව පි
නිර්ඝෘණ තපති බලීයස්ත්වයි වෘත්තමනොරථායා අඞ්ගානි.]

**රාජා–** (සහසො'පසෘත්‍ය)

16. තපති තනුගාත්‍රි මදනස්ත්වමනිශං මාං පුනර් දහත්‍යෙ'ව
ග්ලපයති යථා ශශා'ඞ්කං න තථා හි කුමුද්වතීං දිවසඃ

**සඛ්‍යෞ–** (විලොක්‍ය සහර්ෂමුත්ථාය) සාඅදං අවිලම්බිණො මණොරහස්ස. [ස්වාගතමවිලම්බිනො මනොරථස්‍ය]

(ශකුන්තලාභ්‍යුත්ථාතුමිච්ඡති)

**රාජා–** අලමලමායාසෙන.

17. සන්දෂ්ටකුසුමශයනාන්‍යා'ශු විමර්දිත මෘණාල වලයානි
ගුරුපරිතාපානි න තෙ ගාත්‍රාන්‍යු'පචාරමර්හන්ති.

**අනසූයා–** ඉදො සිලාතලෙක්කදෙසං අලංකරෙදු වඅස්සො [ඉතඃ ශිලාතලෛකදෙශමලඞ්කරොතු වයස්‍යඃ]

(රාජා උපවිශති)

(ශකුන්තලා සලජ්ජා තිෂ්ඨති)

**ප්‍රියංවදා–** දුවෙණං පි වො අණ්ණොණ්ණාණුරාඔ පච්චක්ඛො. සහිසිණෙහො උණ මං පුණරුත්තවාදිණිං කරෙදි. [ද්වයොරපි යුවයොරන්‍යො'න්‍යා'නුරාගඃ ප්‍රත්‍යක්ෂඃ සඛීස්නෙහඃ පුනර් මාං පුනරුක්තවාදිනීං කරොති]

**රාජා–** භද්‍රෙ, නෛතත් පරිහාර්‍යම්. විවක්ෂිතං හ්‍ය'නුක්ත-මනුතාපං ජනයති,

**ශකුන්තලා**– (කියවයි)

15. මි ගෙ පිය රජ්වාණ නෝ
ඔබ හද නො දු නෝ

ඔබට ගැරුණු දෙරුතී හද අගේ
සමග බැඳුණු ගත'වයව මගේ
රැය ද දින ද නො නිම් එක රගේ
සෙදිති තෙදිති තවයි තුනු වගේ

**රජ**– (වහා එළඹ)

තුනුවහ මලහා ඔබ ද තවා
එ නමුත් මා නම් තිබඳ දවා
දහවලැ නිසයුරු ලසි මලවා
එ ලෙසක් සරසට නො දෙයි දිවා

**දෙයෙහෙළියෝ**– (රජු දක ප්‍රීතියෙන් නැගී සිටැ) නොලැසි වූ මනොරථයා ගේ මනා පැමිණීමෙකි.

(ශකුන්තලා නැගී සිටිනු කැමති වෙයි.)

**රජ**– කමෙක් නැ, කමෙක් නැ උත්සාහයෙන්.

17. තැලූ මල් යහන බිස දඬු වළලු පෙලී
යෙදේ නො මැ සිරුර මානනයට දුබලී

**අනසූයා**– මිතුරුතුමා මේ ගල් තලාවේ කොණක් සරසන්නැ
(රජ හිඳියි ශකුන්තලා ද ලජ්ජා සහිත වැ සිටියි.)

**ප්‍රියංවදා**– ඔබ දෙපොළ ගේ අන්‍යෝන්‍ය ප්‍රේමය පැහැදිලි යි. නමුත් යෙහෙළියට ඇති ස්නෙහය මා පුනරුක්ත වාදිතියක් කෙරෙයි.

**රජ**– භද්‍රාවෙනි, එය නො සැඟවියැ යුතුයි. සිතැ'ගි නො කිම පසුතැවිලි දනවයි,

**ප්‍රියංවද-** ආවණ්ණසස විසඅණිවාසිණො ජණසස අත්ති- හරෙණ රණ්ණා හොදව්වං ත්ති එසො වො ධම්මො. [ආපන්නස්‍ය විෂයනිවාසිනො ජනස්‍යා'ර්තිහරෙණ රාඥා- භවිතව්‍යමිත්‍යෙෂ 'ෂා' යුෂ්මාකං ධර්මඃ.]

**රාජා-** නා'ස්‍යාත් පරං කිඤ්චිද් ධර්මඃ.

**ප්‍රියංවද-** තෙණ හි ඉඅං ණො පිඅසහී තුමං උද්දිසිඅ ඉමං අවත්ථංතරං භඅවතා මඅණෙණ ආරොවිදා. තා අරිහසි අබ්භුවවත්තිඑ ජීවිදං සෙ අවලංබිදුං [තෙන හි'යමාවයොඃ ප්‍රියසඛී ත්වාමුද්දිශ්‍යෙ'දමවස්ථා'න්තරං භගවතා මදනෙනා- 'රොපිතා. තදර්හා'භ්‍යුපපත්‍යා ජීවිතමස්‍යා'වලම්බිතුම්.]

**රාජා-** භද්‍රෙ, සාධාරණො'යං ප්‍රණයඃ සර්වථා'නුගෘහීතො'ස්මි.

**ශකුන්තලා-** (ප්‍රියංවදාමවලොක්‍ය) හලා කිං අන්තෙඋර විරහපජ්ජුස්සුඅස්ස රාඑසිණො උවරොහෙණ. [හලා, කිමන්තඃපුරවිරහපර්‍යුත්සුකස්‍ය රාජර්ෂෙරුපරොධෙන]

**රාජා-** 18. ඉදමනන්‍යපරායණ මන්‍යථා
හෘදය සන්නිහිතෙ හෘදයං මම
යදි සමර්ථයසෙ මදිරෙක්ෂණෙ
මදනබාණ හතො 'ස්මි හතඃ පුනඃ

**අනසූයා-** වඅස්ස, බහුවල්ලහා රාආණො සුණීඅංති. ජහ ණො පිඅසහී බන්ධුඅණ සොඅණිජ්ජා ණ හොදි, තහ ණිව්වාහෙහි. [වයස්‍ය, බහුවල්ලභා රාජානඃ ශ්‍රූයන්තෙ. යථා නෞ ප්‍රියසඛී බන්ධුජනශොචනීයා න භවති, තථා නිර්වාහය.]

**රාජා-** භද්‍රෙ, කිං බහුනා,

19. පරිග්‍රහ බහුත්වෙ 'පි ද්වෙ ප්‍රතිෂ්ඨෙ කුලස්‍ය මෙ
සමුද්‍රරසනා වො 'ර්වී සඛී ච යුවයොරියම්.

**ප්‍රියංවද**– සිය දෙස වසන විපත් පැමිණි ජනයා ගේ පීඩා දුරලීම රාජධර්මයක් හෙයින් මෙය ඔබ ගේ යුතුකමෙක්.

**රජ**– ඉන් එහා කිසි යුතුකමෙක් නො වේ.

**ප්‍රියංවද**– එ සේ නම් අප ගේ මේ යෙහෙළිය ඔබ නිසා මේ වෙනසට භගවත් මදනයා විසින් පමුණුවන ලදු. එ හෙයින් සැනසීමෙන් ඇ ගේ දිවිරැකුම සුදුසු සි.

**රජ**– භද්‍රාවෙනි, මේ ඉල්ලීම අප දෙදෙනාට මැ සාධාරණ යැ. ගැම අයුරින් මැ අනුග්‍රහ කෙළේ වෙමි.

**ශකුන්තලා**– (ප්‍රියංවද දෙස බලා) යෙහෙළිය, ඇතොවුර විරහයෙන් තලංගු වූ රජතුමාට ඇවිටිලි කිරීමෙන් කෙබඳු ඵලයෙක් ද?

**රජ**– 18. ම හද පිවිසියේ නො මැ අන් සතු මෙසි ත
කෙලෙසින් හෝ ඔබත් අන් ලෙසකින් හගි ත
මලවිඳු කුසුම් සැරයෙන් නට ම ගේ සි ත
මියුලැසියේ, අහෝ ඔබ යලි නසනු ඇ ත

**අනසූයා**– (මිතුරු තුමාණෙනි, රජුනට බොහෝ ප්‍රියාවෝ ඇතැ‘ යි කියති. යම් සේ අප ගේ ප්‍රිය යෙහෙළිය නැයන් වලප්වත්තියක් නො වේ ද, එ සේ පිළිපදිනු මැනැවි.

**රජ**– භද්‍රාවෙනි, බොහෝ කියනු කිම?

19. පියඹුවන් බොහෝ ව ත්
දෙදෙනෙක් ම කුල අග ප ත්
සිඳු වට–කළ මිහි ත්
මෙ ඔබ දෙදෙන ගෙ පිය යෙහෙළියත්

**උභෙ–** ණිව්වුදං මිය. [නිර්වෘතෙසවඃ]

**ප්‍රියංවද–** (සදෘෂ්ටික්ෂෙපම්) අණසුළු, ජහ එසො ඉදෙ දිණ්ණ
දිට්ඨි උස්සුඅ මිඅපොදඔ මාදරං අණ්ණෙසදි. එහි,
සංජොඑම ණං. [අනසූයෙ, යථෛ'ෂ ඉතො දත්තදෘෂ්ටි–
රුත්සුකො මෘගපොතකො මාතරමන්විෂ්‍යති. එහි සං–
යොජයාව එනම්]

(උභෙ ප්‍රස්ථිතෙ)

**ශකුන්තලා–** හලා, අසරණ මිහි, අණ්ණදරා වො ආඅච්ඡදු,
[හලා, අශරණා "ස්මි" අන්‍යතරා යුවයොරාගච්ඡතු]

**උභෙ–** පුහවිඑ ජෝ සරණං. සො තුහ සමීවෙ වට්ටඉ.
[පෘථිව්‍යා යඃ ශරණං. ස තව සමීපෙ වර්තතෙ]

(නිෂ්ක්‍රාන්තෙ)

**ශකුන්තලා–** කහං ගදඔ එව්ව? [කථං ගතෙ එව?]

**රාජා–** අලමාවෙගෙන, නන්වයමාරාධයිතා ජනස්තව සමීපෙ
වර්තතෙ?

20. කිං ශීතලෛඃ ක්ලමවිනොදිභිරාර්දවාතාන්
සඤ්චාරයාමි නලිනීදල තාලවෘන්තෛඃ
අඞ්කෙ නිධාය කරභොරු යථා සුඛං තෙ
සංවාහයාමි චරණා'වුත පද්මතාම්‍රෞ.

**ශකුන්තලා–** ණ මාණණීඑසු අත්තාණං අවරාහඉස්සං. [න
මානනීයෙෂ්වා'ත්මානමපරාධයිෂ්‍යාමි.] (උත්ථාය ගන්තු
මිච්ඡති)

**රාජා–** සුන්දරි, අනිර්වාණො දිවසඃ ඉයං ච තෙ සමවස්ථා,

31. උත්සෘජ්‍ය කුසුමශයනං නලිනීදල කල්පිතස්තනාවරණං
කථමාතපෙ ගමිෂ්‍යති පරිබාධා පෙලවෛරඞ්ගෛඃ.

**දෙයෙහෙළියෝ–** අස්වැසිලි ලදිමු.

**ප්‍රියංවදා–** (බැල්මක් හෙලා) අනසූයා, මෙ දෙසට දුන් ඇස් ඇති උත්සුක වූ මේ මුව පොවුවා මව් සොයයි. එත්නැ මොහු මව හා එක් කරමු.

(යෙහෙළියන් දෙදෙනා පිටත්වැ යති)

**ශකුන්තලා–** යෙහෙළියෙනි, අසරණ වෙමි. දෙදෙනා ගෙන් කෙනෙක් එත්නැ.

**දෙයෙහෙළියෝ–** යමෙක් මිහිකතට සවාමී ද, හේ ඔබ ළඟ සිටියි.

(පිටත්වැ ගිය කලැ)

**ශකුන්තලා–** අනේ! ගියා ද?

**රජ–** කැළඹීමෙන් කම් නැ. ඔබ ගේ ප්‍රේමයට ලක් වූ අය ඔබ ළඟ නො වෙති ද?

20. පවස් පිසිත්තා සිහිලැ'ල් බැවින් පවන්
සැදූ පියුම් පත් වැටෙකින් සලන්න දෝ!
ඇකේ හොවාලා විමලෝ'ය මා පියේ
මදින්න දෝ පා තඹ පැ පියුම් පැ

**ශකුන්තලා–** මානනයට සුදුස්සන් විෂයෙහි තමා අවමානයට ලක් නො කරවමි.

(නැඟිට යනු කැමති වෙයි)

**රජ–** සොඳුර, අව්ව තව මැ නො බැස්සේ යැ. එ සේ මැ මේ ඔබ ගේ තත්‍වය ද,

21. මල් යහන හැර ලා
තන'ඇවිරු පත් දුරැ ලා
අඟ පසඟ විය ලා
කෙසේ යෙද්දෝ අනේ දුබ ලා

මුඛාච්ඡාදනං නාටයති)

**ශකුන්තලා-** පොරව, රක්ඛ විණඅං, මඅණ සංතත්තා වි ණ හු අත්තණො පහවාමි [පෞරව, රක්ෂ විනයම්, මදන-සන්තප්තා'පි න ඛල්වාත්මනඃ ප්‍රභවාමි]

**රාජා-** භීරු, අලං ගුරුජන භයෙන. දෘෂ්ට්වා තෙ විදිත-ධර්මා තත්‍රභවාන්න දොෂං ග්‍රහිෂ්‍යති කුලපතිඃ. අපි ච,

22. ගාන්ධර්වෙණ විවාහෙන බහ්ව්‍යො රාජර්ෂිකන්‍යකා
ශ්‍රූයන්තෙ පරිණීතාස්තාඃ පිතෘභිශ්චා'භිනන්දිතාඃ.

**ශකුන්තලා-** මුංච දව මං, භූඕ වි සහිජණං අණුමාණ-ඉස්සං. [මුඤ්ච තාවන්මාං. භූයො'පි සඛිජනමනුමාන-යිෂ්‍යාමි]

**රාජා-** භවතු, මොක්ෂ්‍යාමි.

**ශකුන්තලා-** කදා?

**රාජා-** 23. අපරික්ෂත කොමලස්‍ය යාවත්
කුසුමස්‍යෙ'ව නවස්‍ය ෂට්පදෙන
අධරස්‍ය පිපාසතා මයා තෙ
සදයං සුන්දරි ගෘහ්‍යතෙ රසො'ස්‍ය

(මුඛමස්‍යාඃ සමුන්නමයිතුමිච්ඡති. ශකුන්තලා පරිහරති නාට්‍යෙන)

**නෙපථ්‍යෙ-** චක්කවාඅ වහුඑ ආමන්තෙහි, සහඅරං. උවට්ඨිආ රඅණී. [චක්‍රවාකවධුකෙ, අමන්ත්‍රයස්ව සහචරං. උපස්ථිතා රජනී]

**ශකුන්තලා-** (සසම්භ්‍රමම්) පොරව, අසංසඅං මම සරීර-වුත්තන්තොවලම්භස්ස අජ්ජා ගොදමී ඉදො එව්ව ආඅච්ඡදි. දව විඩවන්තරිදෙ හොහි. [පෞරව, අසංශයං මම ශරීරවෘත්තාන්තො'පලම්භායාර්යා ගෞතමී'ත එව ආගච්ඡති. තාවද්විටපාන්තරිතො භව]

(බලාත්කාරයෙන් ඈ නවත්වයි)

**ශකුන්තලා**– පෞරවය, විනය රැක ගන්නැ. කාමයෙන් පීඩිත වූවත් සැබැවින් මම මට සවාමී නො වෙමි.

**රජ**– බියසුළු තැනැත්තිය, වැඩිහිටියන් කෙරෙහි බියෙන් කම් නැ. එහි දී දැනගත් සියලු තොරතුරු ඇති පින්වත් තවුස් නාවෝ ඔබ කෙරෙහි දෙස් නො දකිති. තව ද,

22. ගඳඹ විවාහයෙන් රජ ඉසි ලද සොඳු ර
බැඳුන ද ඔවුන් පිළිගත්තලු පියන් පෙ ර

**ශකුන්තලා**– නැවතත් යෙහෙළියන් ගේ අනුමතිය පිළිවිසා එන තෙක් මා මුදන්නැ.

**රජ**– හොඳ යි, මුදන්නම්.

**ශකුන්තලා**– කවදා ද?

**රජ**– 23. නො පෙලූ මැ ඉතා මොළොක් ඔබේ තොල්
බිඟු මෙන් ආදරයෙන් පවස්නි යුත් මා
උරමින් නව මල්හි රොන් විලස්
බොන තෙක් සුන්දරියේ සිටින්නකෝ හා!

(ඇගේ මුව තමා වෙත තමා ගනු කැමති වෙයි. ශකුන්-තලා වැලැක්මම හඟවයි.)

**පසුබිම**– සක්වා වධුව, සහචරයා අමතන්නැ, රැය එළඹි තිබේ.

**ශකුන්තලා**– (කලබල වී) පෞරවය, ම ගේ සිරුර පුවත් අසා ගෞතමී ආර්යාව මෙහි එයි. දූන් අතු අතරෙහි සැඟවෙන්නැ.

**රාජා**- තථා. (ආත්මානමාවෘත්‍ය තිෂ්ඨති)

(තතඃ ප්‍රවිශති පාත්‍රහස්තා ගෞතමී සඛ්‍යෞ ච)

**සඛ්‍යෞ**- ඉදෙ, ඉදෙ අජ්ජා ගොදමී, [ඉත, ඉත ආර්‍යා ගෞතමී

**ගෞතමී**- (ශකුන්තලාමුපෙත්‍ය) ජාදෙ, අවි ලහුසංදවාඉං දෙ අංගාඉං? [ජාතෙ, අපි ලඝුසන්තාපානි තෙ 'ඞ්ගානි?]

**ශකුන්තලා**- අජ්ජෙ, අත්‍ථි මෙ විසෙසො. [ආර්‍යෙ, අස්ති මෙ විශෙෂඃ]

**ගෞතමී**- ඉමිණා දබ්භොදඑණ ණිරාබාධං එව්ව දෙ සරීරං හවිස්සදි. (ශිරසි ශකුන්තලාමභ්‍යුක්ෂ්‍ය) වච්ඡෙ, පරිණදෙ දිඅහො. එහි, උඩජං එව්ව ගච්ඡම්හ. [අනෙන දර්භෝ'දකෙන නිරාබාධමෙව තෙ ශරීරං භවිෂ්‍යති. වත්සෙ, පරිණතො දිවසඃ. එහි, උටජමෙව ගච්ඡාමඃ]

(ප්‍රස්ථිතාඃ)

**ශකුන්තලා**- (ආත්මගතම්) හිඅඅ, පඪමං එව්ව සුහොවණදෙ මණොරහෙ කාදරභාවං ණ මුඤ්චසි. සාණුසඅවිහඩිඅස්ස කහං දෙ සංපදං සංදවො? (පදාන්තරෙ ස්ථිත්වා-ප්‍රකාශම්) ලදාවලඅ, සංදවහාරඅ, ආමන්තෙමි, තුමං භූඔ වි පරිභොඅස්ස. [හෘදය, ප්‍රථමමෙව සුඛොපනතෙ මනොරථෙ කාතරභාවං න මුඤ්චසි. සා'නුශය විඝටිතස්ස කථං තෙ සාම්ප්‍රතං සන්තාපඃ? ලතාවලය සන්තාපහාරක, ආමන්ත්‍රයෙ; ත්වාං භූයො'පි පරිභොගාය.]

(දුඃඛෙන නිෂ්ක්‍රාන්තා ශකුන්තලා සහෙ'තරාභිඃ.)

**රාජා**- (පූර්වස්ථානමුපෙත්‍ය සනිඃශ්වාසම්) අහො! විඝ්නවත්‍යඃ ප්‍රාර්ත්ථිතා'ර්ථ සිද්ධයඃ. මයා හි,

24. මුහුරංගුලි සංවෘතා'ධරොෂ්ඨං
ප්‍රතිෂෙධා'ක්ෂර වික්ලවා 'භිරාමම්
මුඛමංස විවර්ති පක්ෂ්මලාක්ෂ්‍යාඃ
කථමප්‍යු'න්නමිතං න චුම්බිතං තු?

**රජ**- එසේ යි. (තෙමේ සැඟ වී සිටියි)

(බඳුනක් අතැ'ති වැ ගෞතමිය සෙහෙළියන් දෙදෙනා හා එයි)

**දෙසෙයහෙළියෝ**- මෙහෙත්, මෙහෙත්, ගෞතමී ආර්‍යාව.

**ගෞතමී**- (ශකුන්තලා වෙත එළඹැ) දරුව, ඔබ ගේ අත පය රුදාව අඩු ද?

**ශකුන්තලා**- ආර්‍යාවෙනි, මඳක් සනීපයි.

**ගෞතමී**- මේ කුසතණ දියෙන් ඔබ ගේ සිරුර නීරෝගී වෙයි. (ශකුන්තලා ගේ හිසේ දිය ඉසැ) දුව දවස ගෙවී ගියා. එන්නැ, පැලට යමු.

(පිටත් වෙති)

**ශකුන්තලා**- (තමාට මැ) හෘදය පළමුව නිරායාසයෙන් ලැබුණු මනෝරථයෙහි බයාදු බව නො මුදන්නෙහි. පසුතැවිලි සහිත වෙන්වීම් ඇති තට කෙ බඳු සන්තාපයෙක් වේද? (පියවර කීපයක් ඉදිරියට ගොස් ශබ්ද නඟා) ලියමඬුල්ල, සන්තාපහාරකය, නැවත එක් වීම පිණිස ඔබ ගෙන් සමු ගනිමි.

(සෙස්සන් හා ශකුන්තලා දුකින් නික්මෙයි)

**රජ**- (පළමු සිටි තැනට පැමිණැ සුසුම් ලමින්) අනේ! පැතූ දෙය ලබා ගැනීම උවදුරෙන් යුතු යැ. මා විසින් වනාහි

24. තුඹිනි ඇඟිලි ඇවුරු අදර සොඳුරු පියැ'ති නයනි යේ
හිරිනී සැලෙන බසිනි සළුණ වැලැකී මමුව ඇති ලියේ
වරි නි වරිනි ළයට නැඹුරු කැරුණු මුවැ'ති කොම ළියේ
නො සිඹි, නො සිඹි නො වෙද කියව මන්ද පැහැරි
සොඳුරියේ

ක නු බලු සම්ප්‍රති ගච්ඡාමි. අථවා ඉහෛ‘ව ප්‍රියාපරිභුක්තමුක්තෙ ලතාවලයෙ මුහූර්තං ස්ථාස්‍යාමි.

(සර්වතො‘වලොක්‍ය)

25. තස්‍යාඃ පුෂ්පමයී ශරීර ලුලිතා ශය්‍යා ශිලායාමියං
ක්ලාන්තො මන්මථලෙඛ එෂ නලිනීපත්‍රෙ නඛෛරර්පිතඃ
හස්තාද් භ්‍රෂ්ටමිදං බිසා‘හරණමිත්‍යා‘සජ්ජමානෙ‘ක්ෂණො,
නිර්ගන්තුං සහසා න වෙතසගෘහාච්ඡක්නොමි ශූන්‍යාද’පි.

**ආකාශෙ-** රාජන්,

26. සායන්තනෙ සවනකර්මණි සම්පවෘත්තෙ
වෙදිං හුතා‘ශනවතීං පරිතඃ ප්‍රකීර්ණා
ඡායාශ්චරන්ති බහුධා භයමාදධානා
සන්ධ්‍යා පයොධ කපිශාඃ පිශිතාශනානාම්

**රාජා-** අයමහමාගච්ඡාමි.

(ඉති නිෂ්ක්‍රාන්තඃ)

## තෘතීයො‘ඞ්කඃ

දූත් කොහි ගෙම් ද? නැගෑ, මෙහි මැ ප්‍රියාව පරිභොග කොටැ මිදූ ලිය මඬුල්ලේ මොහොතක් සිටිමි.

(හාත්පසැ බලා)

25. ගලමතැ ඇතුරැ මේ මල් යහන යැ මිරිකුණු ඈ ගත තද වී
තඹුරැ පතෙහි නිය හිරි ඇඳ තිම වූ පෙම් පත මේ මැල වි
නෙලුම්ලයෙන් කළ අනුපලදනය ද බිමැ වේ මේ ගැල ඊ
දිස්වන හිස් වූ මේ ලිය ගොමුවෙන් යනු බැ බැ පිට ඊ

**අහසෙහි–** රජතුමනි,

26. කල්හී සැඳැ වන තවුස් මූළු දී සඳ ලූ
ගින්නෙන් දිලූ මෙ මලසුන් විසිරී වටින් හුත්
සේයා බොහෝ සරතුයේ බිය ගන්වමින් නෙක්
මේ-වන් සැඳැ කඹුරැ පැ අමු මස් බුදින්නන්.

**රජ–** මේ, මම එමි.

(පිටත් වැ යයි)

## තෙවන රඟය නිමාවිණි

# චතුර්ථෝඞ්කඃ

( තතඃ ප්‍රවිශති කුසුමාවචයං නාටයන්ත්‍යෞ සඛ්‍යෞ )

**අනසූයා** – හලා පිඅංවදෙ , ජඉ වි ගන්ධව්වෙණ විවාහ විහිණා ණිව්වුත්ත කල්ලාණා සඋන්දලා අණුරූව භත්තුගාමිණී සංවුත්තෙත්ති ණිව්වුදං මෙ හිඅඅං. තහ වි එත්තිඅං චින්තණිජ්ජං [හලා ප්‍රියංවදෙ, යද්‍යපි ගාන්ධර්වේණ විවාහවිධිනා නිර්වෘතකල්‍යාණා ශකුන්තලා භර්තෘගාමිනී සංවෘත්තෙති නිර්වෘතං මෙ හෘදයම්. තථා'ප්‍යේතාවත් චින්තනීයම්.]

**ප්‍රියංවදා** – කහං විඅ? [කථමිව?]

**අනසූයා** – අජ්ජ සො රාඑසී ඉට්ඨිං පරිසමාවිඅ ඉසීහිං විසජ්ජිඔ අත්තණො ණඅරං පවිසිඅ අන්තෙඋර සමාගදො ඉදො ගදං වුත්තන්තං සුමරදි වා ණ වෙ ත්ති [අද්‍ය ස රාජර්ෂිරිෂ්ටිං පරිසමාප්‍ය ඍෂිභිර් විසර්ජිත ආත්මනො නගරං ප්‍රවිශ්‍යා'න්තඃ පුර සමාගත ඉතො ගතං වෘත්තාන්තං ස්මරති වා න වෙති ]

**ප්‍රියංවදා** – වීසද්ධා හොහි. ණ තාදිසා ආකිදි විසෙසා ගුණවිරොහිණො හොන්ති. කිං දු තාදො දාණිං ඉමං වුත්තන්තං සුණිඅ ණ ආණෙ කිං පඩිවජ්ජිස්සදි ත්ති. [විස්‍රබ්ධා භව, න තාදෘශා ආකෘතිවිශෙෂාඃ. ගුණවිරොධිනො භවන්ති. කින්තු තාත ඉදානීම්මං වෘත්තාන්තං ශ්‍රුත්වා න ජානෙ කිං ප්‍රතිපත්ස්‍යත ඉති.]

**අනසූයා** – ජහං ඉමං දෙක්ඛාමි. තහ තස්ස අණුමදං භවෙ ['යථා හං පශ්‍යාමි, තථා තස්‍යානුමතං භවෙත්. ]

**ප්‍රියංවදා**– කහං විඅ? [කථමිව]

**අනසූයා**– ගුණවදෙ කණ්ණආ පඩිවාදණිජ්ජෙත්ති අඅං දාව පඪමො සංකප්පො. තං ජඉ දෙව්වං එව්ව සංපාදෙදි, ණං අප්පආසෙණ කිදත්ථො ගුරුඅණො.[ගුණවතෙ කන්‍යකා ප්‍රතිපාදනීයෙ'ත්‍යයං තාවත් ප්‍රථමඃ සංකල්පඃ. තං යදි දෛවමෙව සම්පාදයති නන්වප්‍රයාසෙන කෘතාර්ථො ගුරුජනඃ]

# සිව් වන රඞ්ගය

(ඉක්බිති මල් නෙලීම ගහවමින් දෙ සෙහෙළියෝ පිවිසෙති)

**අනසූයා–** ප්‍රිය ප්‍රියංවදා, යම් හෙයකින් ගඳඹ විවාහ විධියෙන් නිමැ වූ මඟුල් ඇති ශකුන්තලා සුදුසු හිමියකු වෙත යාමට සිටින්නී යැ යි සිතන ම–ගද සැනසෙයි. එ සේ ද වුවත් මෙයත් සිහිකළ යුත්තෙකි.

**ප්‍රියංවදා–** කිමෙක් ද?

**අනසූයා–** ඒ රජතුමා යාගය නිමවා තවුසන් විසින් බැහැර යවනු ලැබූයේ, නුවරට පිවිසැ ඇතොරවුන් හා එක් වූයේ, මෙහි ආ ගිය පවත් සමරු ද නො සමරු ද යනු.

**ප්‍රියංවදා–** සැක නො කරන්නැ. එ බඳු හැඩ රුව ඇති අඟ සුසිරින් විරෝධිහු නො වෙති. කෙ සේ වුවත් පියා මේ පුවත අසා කුමක් කෙරේද්දැ යි නො දනිමි.

**අනසූයා–** මට පෙනෙන හැටියට ඔහු ගේ අනුමතය ලැබෙයි.

**ප්‍රියංවදා–** ඒ කෙ සේ ද?

**අනසූයා–** ශිෂ්ට සම්පන්නයකුට මැ කාන්තාවක් පාවා දිය යුතු යැ යනු මූලික අදහස යි. ඉදින් එය දෛවය මැ ඉටු කර දෙතොත් වැඩි හිටියෝ නිරුත්සාහයෙන් මැ කෘතාර්ථීහු වෙති.

**ප්‍රියංවදා** – එව්වං ණේදං. (පුෂ්ප භාජනං විලෝක්‍ය) සහි, අව- ඉදඉං බලිකම්මපජ්ජත්තාඉං කුසුමාඉං [එවමිදම්. සඛි අවසිතානි බලිකර්මපර්‍යාප්තානි කුසුමානි.]

**අනසූයා** – ණං සහිඑ සඋන්දලාඑ සොභග්ගදෙවදා අච්චණීඅා? [නනු සඛ්‍යාඃ ශකුන්තලායාඃ සෞභාග්‍යදේවතා'ර්චනීයා]

**ප්‍රියංවදා**– ජුජ්ජදි [යුජ්‍යතෙ] (තදේවකර්මා'භිනයතඃ.)

**නෙපථ්‍යෙ**– අයමහං භොඃ!

**අනසූයා**– (කර්ණං දත්වා) සහි, අදිහිණං විඅ ණිවෙදිදං, [සඛි, අතිථීනාමිව නිවේදිතම්.]

**ප්‍රියංවදා**– ණං උඩජසණ්ණිහිදා සඋන්දලා? [නනු'ටජ සන්නි- හිතා ශකුන්තලා?]

**අනසූයා**– අජ්ජ උණ හිඅඑණ අසණ්ණිහිදා. හොදු, අලං එත්තිඑහිං කුසුමෙහිං [අද්‍ය පුනඃ හෘදයෙනා' සන්නිහිතා. භවතු, අලමේතාවද්භිඃ කුසුමෛඃ.]

(ප්‍රස්ථිතෙ)

**නෙපථ්‍යෙ**– ආඃ! අතිථිපරිභාවිනි,

විචින්තයන්තී යමනන්‍ය මානසා
තපෝධනං වේත්සි න මාමුපස්ථිතම්
ස්මරිෂ්‍යති ත්වාං න ස බොධිතො'පි සන්
කථාං ප්‍රමත්තඃ ප්‍රථමං කෘතාමිව

**ප්‍රියංවදා**– හඩී! හඩී! අප්පිඅං එව්ව සංවුත්තං. කස්සිං පි පූආරුහෙ අපරද්ධා සුණ්ණහිඅආ සඋන්දලා. [හා ධික්! හා ධික්! අප්‍රියමේව සංවෘත්තම්. කස්මින්නපි පූජාර්හේ'පරාද්ධා ශූන්‍යහෘදයා ශකුන්තලා.]

**ප්‍රියංවදා**– මෙයත් එ සේ මැ යි. (මල් බඳුන දෙස බලා) යෙහෙළිය, තෙලුවා, පූජාවට සෑහෙන පමණ මල්.

**අනසූයා**– ශකුන්තලා යෙහෙළිය ගේ සෞභාග්‍ය දේවතාවා පිදියැ යුතු නො වැ?

**ප්‍රියංවදා**– සුදුසු යි. (දෙ දෙනා මැ එම ක්‍රියාවෙහි යෙදෙන බව හඟවති.)

**පසුබිම**– ඕ! මේ මම.

**අනසූයා**– (කන් දෙමින්) යෙහෙළිය, ශබ්දය අමුත්තකු ගේ සේ යි.

**ප්‍රියංවදා**– ශකුන්තලා පැලේ සිටියා නො වේ ද?

**අනසූයා**– අද නම් සිතකින් සිටියා නො වේ. වේවා මේ මල් සෑහෙයි. (පිටත් වෙති)

**පසුබිම**– එම්බල අමුත්තන් නිගන්නිය,

1, සිතේ යමක් ලා නො තකා මැ අන් කිසින්
නො දන්නෙහි නම් වෙතැ ආ තවුස් මා
නො සි කෙරේවා හිමියා නි-ගේ පවත්
නෙ සේ කියූවත් මත් වූ විලස්නෙන්.

**ප්‍රියංවදා**– අනේ! අනේ! විපතෙක්. අරුචි දූයෙක් මැ සිදු-විය. මුළා සිහි ඇති ශකුන්තලා කවර හෝ පූජ්‍යයකුට නිගාදුන් විරූ යැ.

**අනසූයා**– (පුරෝ'වලෝක්‍ය,) ණ හු ජස්සිං කස්සිංපි'එසෝ දුව්වාසො සුලහකෝවො මහෙසී. තහ සවිඅ වවුලප්ඵුල්ල දුව්වාරඑ ගඊඑ පඩිණිවුත්තො. [න ඛලු යස්මින් කස්මින්නපි. එෂ දුර්වාසාඃ සුලභකොපො මහර්ෂිඃ. තථා ශප්ත්වා වවුලො'ත්ඵුල්ල දුර්වාරයා ගත්‍යා ප්‍රතිනිවෘත්තඃ.]

**ප්‍රියංවදා**– කො අණ්ණො හුදවහාදො දහිදුං, පහවදි. ගච්ඡ පාදෙසු පණමිඅ ණිවත්තෙහි ණං. ජාව අහං අග්ඝෝදඅං උවකප්පෙමි. [කො'න්‍යො හුතවහාද්දග්ධුම් ප්‍රභවති. ගච්ඡ, පාදයොඃ ප්‍රණම්‍ය නිවර්තයේ'නං, යාවදහමර්ඝෝදකමුපකල්පයාමි.

**අනසූයා**– තහ. [තථා] (නිෂ්ක්‍රාන්තා)

**ප්‍රියංවදා**– (පදාන්තරෙ ස්ඛලිතං නිරූප්‍ය) අමෙමා! ආවෙඅක්ඛලිදාඑ පබ්භට්ඨං මෙ අග්ගහත්ථාදො පුප්ඵභාඅණං. [අහො! ආවෙගස්ඛලිතයා ප්‍රභ්‍රෂ්ටං මමා'ග්‍රහස්තාත් පුෂ්පභාජනම්.] (පුෂ්පො'ච්චයං රූපයති)

**අනසූයා**– (ප්‍රවිශ්‍ය) සහි, පකිදි වක්කො සො කස්ස අණුණඅං පඩිගෙංහදි, කිං වි උණ සාණුක්කොසො කිදො. [සඛි, ප්‍රකෘතිවක්‍රඃ ස කස්‍යා'නුනයං ප්‍රතිගෘහ්ණාති, කිමපි පුනඃ සානුක්‍රොශඃ කෘතඃ.]

**ප්‍රියංවදා**– (සස්මිතම්) තස්සිං බහු එදං පි. කහෙහි. [තස්මින් බහ්වෙතද්. කථය.]

**අනසූයා**– ජදා අණුණිදො ණිවත්තිදුං ණ ඉච්ඡදි, තදා විණ්ණවිදො මඑ, "භඅවං, පඪමං ත්ති පෙක්ඛිඅ අවිණ්ණාද තවප්පහාවස්ස දුහිදුජණස්ස භඅවදා එක්කො අවරාහො මරිසිදව්වො" ත්ති [යදා 'නුනීතො නිවර්තිතුං නේ'ච්ඡති, තදා විඥපිතො මයා "භගවන්, ප්‍රථමමිති ප්‍රෙක්ෂ්‍යා'විඥාත තපප්‍රභාවස්‍ය දුහිතෘජනස්‍ය භගවතො– 'කො'පරාධො මර්ෂිතව්‍ය" ඉති.]

**ප්‍රියංවදා**– තදො! තදො! [තතස්තතඃ]

**අනසූයා**– (ඉදිරි පස බලා) සැබැවින් එසේ-මෙසේ නො නෙක් නො වෙති. ඒ නිතර කිපෙන සුළු දුර්වාස මහා මුනි ය. එසේ නමා විදුලියක වේගයෙන් නො වැළැක්විය හැකි ගමිනින් පෙරළා එයි.

**ප්‍රියංවද**– ගිනි හැර අන් කිමෙක් දහනයට සුදුසු වේ ද? යන්නෑ. දෙපා වැද එතුමන් නවත්වන්නෑ' මම එතෙක් පූජා ජලය සකසමි.

**අනසූයා**– එ සේ ය. (පිටත්වෙයි)

**ප්‍රියංවද**– (පියවර කිපයක් ගොස් පා පැකුළුණු බව හඟ වමින්) අහෝ! ඉක්මන් කම නිසා පැකිළීමෙන් මගේ අතින් මල් බඳුන ගිලිහුනා.

(මල් එක් කිරීම හඟවයි.)

**අනසූයා**– (පිවිසැ) යෙහෙළිය, සවභාවයෙන් මුරණ්ඩු ඔහු කා ගේ කන්නලව්වක් පිළිගනීත්ද? කෙසේ නමුත් සුළු අනුකම්පාවකට ලක් —. කරනු ලැබුවා.

**ප්‍රියංවද**– (සිනා සහිත වැ) මෙයත් ඔහු කෙරෙහි නම් වැඩියක්. කියන්නෑ,

**අනසූයා**– කන්නලව් කොටත් නැවතීමට නො කැමති වූ බැවින්, මා ඔහුට මෙ සේ දන්වනු ලැබුවා "උත්තමයාණෙනි, ප්‍රථම වතාව බව සලකා ඔබ ගේ තපස් මහිමය නොදත් දියණිය ගේ වරද ඔබ වහන්සේ විසින් කමා කැරෙත සේක්වා!" කියා.

**ප්‍රියංවද**– ඉතින්! ඉතින්!.

**අනසූයා-** "ජධා මෙ වඅණං අණ්ණහා හොදුං ණාරිහදි කිංදු අහිණ්ණාණා'භරණ දංසණෙණ සාවො ණිවත්තිස්සදි" ත්ති මන්තඅන්තො එව්ව අංතරිහිදෙ ["යතො මෙ වචනමන්‍යථා භවිතුං නා'හීති, කින්තු අභිඥානා'භරණ දර්ශනෙන ශාපෝ නිවර්තිෂ්‍යත." ඉති මන්ත්‍රයමාන එවාන්තර්හිතඃ]

**ප්‍රියංවදා-** සක්කං දාණිං අස්සසිදුං, අත්ථි තෙණ රාඑසිණා සංපත්ථිදෙණ සණාමහෙඅංකිඅං අංගුලිඅඅං සුමරණීඅං ත්ති සඅං පිණද්ධං, තස්සිං සාහිණොවාඅා සඋන්දලා හවිස්සදි. [ශක්‍යමිදානීමශ්වසිතුම්. අස්ති තෙන රාජර්ෂිණා සම්ප්‍රස්ථිතෙන ස්වනාමධෙයා'ඞ්කිතමඞ්ගුලීයකං ස්මරණීයමිති ස්වයං පිනද්ධම්. තස්මින් ස්වාධීනො'පායා ශකුන්තලා භවිෂ්‍යති.]

**අනසූයා-** සහි, එහි, දෙවකජ්ජං දාව සෙ ණිව්වත්තෙහ්ම, [සඛි, එහි. දෙවකාර්‍යං තාවදස්‍යාඃ නිර්වර්තයාමඃ]

(පරික්‍රාමතඃ)

**ප්‍රියංවදා-** (විලොක්‍ය) අණසූඑ, පෙක්ඛ දාව, වාමහත්ථොවහිද වඅණා ආලිහිදා විඅ පිඅ සහී. භත්තුගදාඑ චිත්තාඑ අත්තාණං පි ණ එසා විභාවෙදි. කිං උණ ආඅන්තුඅං, [අනසූයෙ, පශ්‍ය තාවත්, වාමහස්තොපහිත වදනා 'ලිඛිතෙව ප්‍රියසඛී, භර්තෘගතයා චින්තයා'ත්මානමපි නෛ'ෂා විභාවයති. කිං පුනරාගන්තුකම්.]

**අනසූයා-** පිඅංවදෙ, දුවෙ ණං එව්වඅංණෙ මුහෙ එසො වුත්තන්තො චිට්ඨදු, රක්ඛිදව්වා ක්ඛු පකිදිපෙලවා පිඅසහී, [ප්‍රියංවදෙ, ද්වයොරෙව නෞ මුඛෙ එෂ වෘත්තාන්තස්තිෂ්ඨතු, රක්ෂිතව්‍යා ඛලු ප්‍රකෘති පෙලවා ප්‍රියසඛී.]

**ප්‍රියංවදා-** කො ණාම උංහොදඑණ ණොමාලිඅං සිංචෙදි. ? [කොනාමො'ෂ්ණො'දකෙන නවමාලිකාං සිඤ්චති.]

(උභෙ නිෂ්ක්‍රාන්තෙ)

## විෂ්කම්භකඃ

**අනසූයා**– "එසේ නම් ම-වදන් වෙනස් වීම නුසුදුසු යි. එසේ වුවත් අභිඥාන ආභරණ දැකීමෙන් ශාපය අවසන් වේ යැ" යි කියමින් මැ අතුරුදහන් විය.

**ප්‍රියංවදා**– දැන් අස්වැසිලි ලද හැකි. ඒ රජතුමා පිටත්වැ යද්දී, සිය නම්–ගොත් කෙටූ මුද්දක් සිහිවටනයක් වශයෙන් ඔහු මැ පළඳවා ගොස් තිබේ. එහි ලා ශාපයෙන් මිදීමේ පිළියම ඇ සතු වන්නේ යැ.

**අනසූයා**– යෙහෙළිය, එන්නැ, පළමුකොට ඇගේ දෙවියන් පිදීම නිමවමු.

( දෙ දෙනා සිසාරති )

**ප්‍රියංවදා**– (බලා ) අනසූයා, අන්න බලන්නැ, ප්‍රිය යෙහෙළිය වම් අතැ එබූ මුහුණ ඇති වැ සිතියමෙකැ ඇන්දක් මෙන් සිටින සැටි. ස්වාමියා වෙතැ ඇදී–ගිය සිතැ'ති වැ ඇ තමා ගැන වත් නො සිතයි අමුත්තන් පිළිබඳ වැ කියනු කිම ?

**අනසූයා**– ප්‍රියංවදා, මේ සිදුවීම අප දෙදෙනා ගේ මුවෙහි පමණක් තිබේවා. ස්වභාවයෙන් දුබල ප්‍රිය යෙහෙළිය සැබැවින් රැකැ ගත යුතු යි.

**ප්‍රියංවදා**– කවුරු නම් උණු දියෙන් සමන් මල් තෙමත් ද?

( දෙ දෙනා පිටත්වැ යති )

## විෂ්කම්භකය නිමි.

(තතඃ ප්‍රවිශති සුප්තො'ත්ථිතඃ ශිෂ්‍යඃ)

**ශිෂ්‍යඃ**– වෙලො'පලක්ෂණා'ර්ථමාදිෂ්ටො'ස්මි, තත්‍ර භවතා ප්‍රවාසාදුපාවෘත්තෙන කාශ්‍යපෙන. ප්‍රකාශං නිර්ගතස්තාවද'වලොකයාමි, "කියදවශිෂ්ටං රජන්‍යා" "ඉති. (පරික්‍රම්‍යා- 'වලොක්‍ය ච) හන්ත ප්‍රභාතම්. තථා හි,

2. යාත්‍යෙක'තො'ස්තශිඛරං පතිරොෂධීනා–
මාවිෂ්කෘතො 'රුණ පුරඃ සර එකතො 'ර්කඃ
තෙජො ද්වයස්‍ය යුගපද්ව්‍යසනො 'දයාභ්‍යාං
ලොකො නියම්‍යත ඉවා'ත්ම දශා'න්තරෙෂු.

**අපි ච,**

3. අන්තර්හිතෙ ශශිනි සෛව කුමුද්වතී මෙ
දෘෂ්ටිං න නන්දයති සංස්මරණීය ශොභා
ඉෂ්ටප්‍රවාස ජනිතාන්‍ය'බලාජනස්‍ය
දුඃඛානිනූනමතිමාත්‍ර සුදුඃසහානි.

**අනසූයා**– (ප්‍රවිශ්‍ය'පටීක්ෂෙපෙණ) ජඉ වි ණාම විස- අපරම්මුහස්ස ජණස්ස එදං ණ විදිඅං, තහ වි තෙණ රණ්ණා සඋන්දලාඑ අණජ්ජං ආඅරිදං. [යද්‍යපි නාම විෂයපරාඞ්මුඛස්‍ය ජනස්‍යෙ'තන්නාවිදිතං. තථා'පි තෙන රාඥා ශකුන්තලායාමනාර්‍යමාචරිතම්.]

**ශිෂ්‍යඃ**– යාවදුපස්ථිතාං හොමවෙලාං ගුරවෙ නිවෙදයාමි. (නිෂ්ක්‍රාන්තඃ)

**අනසූයා**– පඩිබුද්ධා වි කිං කරිස්සං. ණ මෙ උඉදෙසු වි ණිඅ කරණිජ්ජෙසු හත්ථපාආ පසරන්ති, කාමො දාණිං සකාමො. හොදු, ජෙණ අසච්ච සන්ධෙ ජණෙ සුද්ධ හිඅආ සහී පදං කාරිදා. අහවා දුව්වාසසො සාවො එසො විආරෙදි අණ්ණහා කහං සො රාඑසී තාරිසාණි මන්තිඅ එත්ති අස්ස කාලස්ස ලෙහණමත්තං පි ණ විසජ්ජෙදි. තා ඉදො අභිණ්ණාණං අංගුලීඅඅං සෙ විසජ්ජෙම, දුක්ඛ සීලෙ තවස්සිජණෙ කො අබ්භත්ථීඅදු? ණං සහීගාමී දොසො ත්ති' ව්වවසිදා වි ණ පාරෙමි. පවාස පඩිණි- උත්තස්ස තාදකස්සවස්ස දුස්සංද පරිණීදං ආවණ්ණ සත්තං සඋන්දලං ණිවෙදිදුං ඉත්ථං ගඑ අම්හෙහිං කාරණිඑසු කිං ණු කඛු කරණිජ්ජං.

(ඉක්බිති නිදා පිබිදි ශිෂ්‍යයෙක් වේදිකාවට එයි,)

**ශිෂ්‍යයා–** එහි ප්‍රවාසයෙන් පෙරලා පැමිණි කාශ්‍යප මුනින් ගෙන් වේලාව සොයා බැලීමට අණ ලදිමි. එළිමහනට ගොස් බලන්නට ඕනෑ රැයෙන් කොතෙක් ඉතිරි 'දැ යි, අනේ! එළිවෙලා, ඒ එසේ මැයි.

2. යේ එක් දෙසෙක්හි බැසැ අත් ගිරැ නා–තුරුන් ගේ
හා රැස් සගස් පෙර ගිරින් විහිදා නගින්නේ
එක් වන් වැ රැස් දෙ–පනිඳුන් වනසත් උදාවත්
දැක් මෙන් සිතා සිය දසා උවදෙස් ලබා ලෝ.

තව ද,

3. පත් කල්හි අත්ගිරැ තිසා පතිඳුන් ද සෙත් වූ
සෝබා සිතේ කුමුදු විල්, නො පොබා ම ගේ නෙත්
පෙම් පත් පියන් විරහ පත් අබලා දනන් ගේ
හා! හා! කෙසේ දුරියැකි මැ නු සෝ විපුල් වූ

**අනසූයා–** (තිරය විදහා ගෙනැ පැමිණැ) ඉදින් වනාහි කම් සුව නො රිසි වන්තියකට මෙය නො දැනියැ හැකි වුවත් ඒ රජු තම් ශකුන්තලාවට කෙළේ නීච කමෙකි.

**ශිෂ්‍යයා–** හෝම වේලාව පැමිණි බව ගුරුතුමාට දන්වන්නට ඕනෑ. (පිටත්වැ යයි)

**අනසූයා–** පිබිදැ කුමක් කරම් ද, ම–ගේ අත්–පා සුදුරුදු කිසෙහි පවා දිගු නො වන විටැ? යම් බඳු කාමයකු විසින් ඒ පිවිතුරු හදැ'ති යෙහෙළිය බොරු පොරොන්දු කාරයකු කෙරෙහි පමුණුවනු ලැබී ද, ඒ කාමයා දැන් කැමැත්තක් කෙරේවා! නැතහොත් දුර්වාස ගේ මේ ශාපය මෙ–බඳු විපරීතයක් කෙරේ ද? එසේත් නැත් නම්, ඇයි, රජතුමා එ වැනි දේවල් කියා ගොස් මෙ පමණ කලෙකින් ලියමනක් පමණ වත් නො එවන්නේ?

[ ප්‍රතිබුද්ධා'පි කිං කරිෂ්‍යාමි. න මෙ උචිතෙෂ්වපි නිජකරණීයෙෂු හස්තපාදං ප්‍රසරති. කාම ඉදානීං සකාමො. භවතු, යෙනා' සත්‍ය සන්ධෙ ජනෙ ශුද්ධ හෘදයා සඛී පදං කාරිතා අථවා දුර්වාසසඃ ශාප එෂ විකාරයති. අන්‍යථා, කථං ස රාජර්ෂි තාදෘශානි මන්ත්‍රයිත්වෛතාවතඃ කාලස්‍ය ලෙඛන මාත්‍රමපි නවිසර්ජයති. තදිතො'භිඥාන මඞ්ගුලීයකං තස්‍ය විසෘජාමඃ. දුඃඛශීලෙ තපස්විජනෙ කො 'භ්‍යර්ථ්‍යතාම්. ननු සඛීගාමී දොෂ ඉති ව්‍යවසිතා'පි න පාරයාමි; ප්‍රවාසප්‍රතිනිවෘත්තස්‍ය තාත කාශ්‍යපස්‍ය දුෂ්‍යන්ත පරිණීතාමාපන්නසත්වාං ශකුන්තලාං නිවෙද-යිතුම්. ඉත්ථං ගතෙ'ස්මාභිඃ කිං නු ඛලු කරණීයම්.]

**ප්‍රියංවද**- [ ප්‍රවිශ්‍ය, සහර්ෂම්) සහි, තුවර! තුවර! සඋන්දලාඑ **පත්‍ථාණ** කොදුඅං ණිව්වත්තිදුං [සඛි, ත්වරස්ව! ත්වරස්ව! ශකුන්තලායඃ ප්‍රස්ථාන කෞතුකං නිවර්තයිතුම්.]

**අනුසූයා**- සහි, කහං එදං? [සඛි කථමෙතත්]

**ප්‍රියංවදා**- සුණාහි දාණිං. සුහසඉද පුච්ඡිඅා සඋන්දලා සආසං ගදම්හි, [ ශෘණු, ඉදානීං සුඛශයිත ප්‍රච්ඡිකා ශකුන්තලා සකාසං ගතාස්මි ]

**අනසූයා**- තදො, තදො [තතස්තතඃ]

**ප්‍රියංවද**- දාව එණං ලජ්ජාවණදමුහිං පරිස්සජිඅ සඅං තාද-කස්සවෙණ එව්වං අහිණන්දිදං. "දිට්ඨිඅා ධූමාඋලිද දිට්ඨිණො වි ජඅමාණස්ස පාඅඑ එව්ව ආහුදී පඩිදා. වච්ඡෙ, සුසිස්ස පරිදිණ්ණා විඅ විජ්ජා අසොඅණිජ්ජාසි සංවුත්තා. අජ්ජ එව්ව ඉසිරක්ඛිදං තුමං භත්තුණො සආසං විස්සජ්ජෙමි" ත්ති. [ තාවදෙනාං ලජ්ජා' වනතමුඛිං පරිෂ්වජ්‍ය ස්වයං තාතකාශ්‍යපෙනෛවාභිනන්දිතම්. "දිෂ්ට්‍යා ධූමාකුලිත දෘෂ්ටිරපි යජමානස්‍ය පාවක එවා 'හුතිඃ පතිතා. වත්සෙ, සුශිෂ්‍ය පරිදත්තෙව විද්‍යා' ශොචනීයා'සි සංවෘත්තා. අද්‍යෛව ඍෂිරක්ෂිතාං ත්වාං භර්තුඃ සකාසං විසෘජාමී'ති.]

එ හෙයින් මෙහි සිටැ අභිඥාන මුද්‍රිව ඔහුට යවමු ද? දුක් විඳිනසුළු තවුසන් කෙරෙහි කා ගෙන් පිහිටක් පතම් ද? වරද යෙහෙළිය අනැ යැ යි සිතුවත් ප්‍රවාස-යෙන් පෙරළා පැමිණි කසුප් පියාණනට දුෂ්‍යන්ත පරිණය කළ ගැබිණි ශකුන්තලා ගැන දන්වන්නට නො හැක්කෙමි. මෙ සේ වූ කල්හි අප විසින් සැබැවින් කුමක් කට යුතු ද?

**ප්‍රියංවදා**– (පිවිසැ ප්‍රීතියෙන්) යෙහෙළිය, ඉක්මන් කරන්නැ ඉක්මන් කරන්නැ! ශකුන්තලාවන් ගේ ඇරලීමේ මංගලය පිළියෙල කිරීම පිණිස.

**අනසූයා**– යෙහෙළිය, ඒ මන් ද?

**ප්‍රියංවදා**– සවන් දෙන්නැ. මම දූන් නිදි සුව විචාරන්නට ශකුන්තලා වෙත ගියෙමි.

**අනසූයා**– ඉතින්! ඉතින්!

**ප්‍රියංවදා**– "වාසනාවට මෙන් දුමින් ඇවිරුණු ඇස් ඇති වත් යජමානයා ගේ යාග ද්‍රව්‍ය කෙලින් මැ ගින්නෙහි වැටිණ. දුව, හොඳ ශිෂ්‍යයකුට දුන් විද්‍යාවක් මෙන් ශොක නො කටයුතු බවට පැමිණියා. අද මැ තවුසන් විසින් රැකවරණ ගත් ඔබ හිමියා වෙත යවමි." යි පිය කාශ්‍යපයන් විසින් තෙමේ මැ ලජ්ජාවෙන් අවනත වූ මුව ඇති ඈ වැලැඳ ගෙන සතුටු කරවන ලදී.

**අනසූයා**– අධ කෙණ සූඉදෙ තාදකස්සවස්ස වුත්තංතො. [ අථ කෙන සූචිතස්තාත කාශ්‍යපස්‍ය වෘත්තාන්තඃ. ]

**ප්‍රියංවදා**– අග්ගිසරණං පවිට්ඨස්ස සරීරං විණා ඡංදොමඊඑ වාණීආඑ [අග්නිශරණං ප්‍රවිෂ්ටස්‍ය ශරීරං විනා ඡන්දොමය්‍යා වාණ්‍යා. ]

**අනසූයා**– ( සවිසමයම් ) කහෙහිං [කථය, කථය. ]

**ප්‍රියංවදා**– (සංස්කෘතමාශ්‍රිත්‍ය)

1. දුෂ්‍යන්තෙනා'හිතං තෙජො දධානාං භූතයෙ භුවඃ
අවෙහි තනයාං බ්‍රහ්මන්නග්නිගර්භාං ශමීමිව.

**අනසූයා**– (ප්‍රියංවදමාශ්ලිෂ්‍ය ) සහි. පිඅං මෙ, පිඅං මෙ. කිං දු අජ්ජ එව්ව සඋන්දලා ණීඅදි ත්ති උක්කණ්ඨාසාහාරණං පරිතොසං අණුහොමි. [ සඛි. ප්‍රියං මෙ, ප්‍රියං මෙ. කින්තු අද්‍යෛ'ව ශකුන්තලා නීයත ඉත්‍යු'ත්කණ්ඨාසාධාරණං පරිතොෂමනුභවාමි.]

**ප්‍රියංවදා**– සහි, වඅං දාව උක්කංඨං විණොදඉස්සාමො. සා තවස්සිණී ණිව්වුදා හොදු. [සඛි, ආවාං තාවදුත්කණ්ඨාං-විනොදයිෂ්‍යාවඃ. සා තපස්විනී නිර්වෘතා භවතු.]

**අනසූයා**– තෙණ හි එදස්සිං චූදසාහාවලංබිදෙ ණාරිඑරසමුග්ගඑ එදං ණිමිත්තං එව්ව කාලන්තරක්ඛමා ණික්ඛිත්තා මඑ කෙසර මාලිආ. තං තුමං හත්ථසංණිහිදං කරෙහි. ජාව අහං පි සෙ ගොරොඅණා තිත්ථමිත්තිආ දුව්වාකිසලආණි ත්ති මංගලසමාලංභණාණි විරඑමි. [ තෙනෛතස්මින් ශ්චූතශාඛා'වලම්බිතෙ නාලිකෙරසමුද්ගකෙ එතස්මින්නිමිත්තමෙව කාලාන්තර ක්ෂමා නික්ෂිප්තා මයා කෙසරමාලිකා. තාං ත්වං හස්ත සන්නිහිතාං කුරු. යාවදහමපි තස්‍යෛ ගොරොචනාතීර්ථමෘත්තිකා දූර්වාකිසලයානී'ති මංගලසමාලම්භනානි විරචයාමි.]

**අනසූයා**– ඉතින් කවරකු විසින් පිය කාශ්‍යපයනට මේ පුවත දන්වනු ලැබී ද ?

**ප්‍රියංවදා**– අග්නියාග ශාලාවට පිවිසි එතුමාට සිරුරු රහිත ගීතිකාවෙකිනි.

**අනසූයා**– (පුදුම වැ) කියන්නැ ! කියන්නැ !

**ප්‍රියංවදා**– ( සංස්කෘතය ඇසුරු කොට කියයි )

4. ලොවට වැඩ සලකා–දුෂ්සන්ත ලූ තෙද ඇති
දනු. බමුණ, ඔබ දූ–ගිනි ගැබ් " සැමි " ගස ලෙසින්

**අනසූයා**– (ප්‍රියංවද වැලඳ–ගෙනැ) යෙහෙළිය, මට ප්‍රිතියෙකි, මට ප්‍රීතියෙකි. කිම. අද මැ ශකුන්තලා යවති ද ? දුකට සමාන ප්‍රීතියකුත් විඳිමි.

**ප්‍රියංවද**– යෙහෙළිය, අපි දුක දුරැ–ලමු. ඒ අසරණිය සැනසේවා.

**අනසූයා**– එ සේ නම් මේ අඹ අත්තේ මෙය මැ නිමිති කොට එල්ලූ නැඹිලී සුමුහුවෙහි කල් පැවැතියැ හැකි සේ, මා විසින් "කේසර" මල් දමක් තබන ලදී. එය ඔබ අතට ගන්නැ. මමත් ගෝරෝචනා තිත් මැටි, දුර්‍වා තණ දලු යනාදී මඟුල් උවරණ සපයමි.

**ප්‍රියංවදා**- තහ කරිඅදු. [ තථා ක්‍රියතාම්. ]

(අනසූයා නිෂ්ක්‍රාන්තා, ප්‍රියංවදා නාට්‍යෙන සුමනසො ගෘහ්ණාති )

**නෙපථ්‍යෙ**- ගෞතමී, ආදිශ්‍යන්තාං ශාර්ඞ්ගරවමිශ්‍රාඃ ශකුන්තලා නයනාය,

**ප්‍රියංවදා** (කර්ණං දත්වා) **අණසූඑ**, තුවර, තුවර. එදෙ ක්ඛු හත්ථිණාඋර ගාමිණො ඉසිඔ සද්දවීඅන්ති. [අනසූයෙ, ත්වරස්ව, ත්වරස්ව. එතෙ ඛලු හස්තිනාපුර ගාමිනඃ ඍෂයඃ ශබ්දායන්තෙ]

**අනසූයා**- (ප්‍රවිශ්‍ය, සමාලම්භන හස්තා) සහි, එහි ගච්ඡම්හ. [සඛි, එහි ගච්ඡාවඃ]

(පරික්‍රාමතඃ)

**ප්‍රියංවදා**- (විලොක්‍ය) එසා සුජ්ජොදඑ එව්ව සිහාමජ්ජිදා පඩිච්ඡිද ණීවාරහත්ථාහිං සොත්ථිවාඅණීආහිං තාවසීහිං. අහිණන්දිඅමාණා සඋන්දලා චිට්ඨිදි. උවසප්ප ම්හ ණං. [එෂා සූර්යෝදය එව ශිඛාමජ්ජිතා ප්‍රතීෂ්ඨිත නීවාර-හස්තාභිඃ ස්වස්තිවාචිකාභිස්තාපසීභිරභිනන්ද්‍යමානා ශකුන්තලා තිෂ්ඨති, උපසර්පාව එනාම්] (උපසර්පතඃ)

(තතඃ ප්‍රවිශති යථො'ද්දිෂ්ට ව්‍යාපාරා'සනස්ථා ශකුන්තලා)

**තාපසීනාමන්‍යතමා**- (ශකුන්තලාං ප්‍රති) පුත්තිඅඑ, හත්තුණො බහුමාණ සූඅඅං මහාදෙවී සද්දං ලහෙහි. [පුත්‍රිකෙ, භර්තුර් බහුමාන සූචකං මහාදෙවී ශබ්දං ලභස්ව.]

**ද්විතීයා**- වච්ඡෙ, වීරප්පසවිණී හොහි [වත්සෙ, වීරප්‍රසවිනී භව.]

**ප්‍රියංවද**- එ සේ කරන්නෑ.

( අනසූයා නික්මෙයි, ප්‍රියංවද මාලාව ගන්නා බව හඟවයි)

**පසුබිම**- ගෞතමිය, ශාර්ඞ්ගරව ඇතුළු සෙස්සනට ශකුන් -තලා කැටි වැ යාමට දන්වන්නෑ.

**ප්‍රියංවද**- (කන් යොමා) අනසූයා, ඉක්මන් කරන්නෑ, ඉක්මන් කරන්නෑ. සැබැවින් මේ. හස්තිනා පුරයට යන තවුසෝ කැඳවනු ලබති.

**අනසූයා**- (උවරණ ගත් අත් ඇති වැ පැමිණ) යෙහෙළිය, එන්නෑ. යමු.

(සිසාරති)

**ප්‍රියංවද**- (බලා) මේ හිමිදිරියේ මැ හිස් සෝද නෑ ශකුන් -තලා, හුරුහැල් ගත් අතැ'ති වැ සෙත් පතන තවුසි යන් විසින් තුටු කරවනු ලබන්නී සිටින්නී යෑ. ඇය වෙත යමු. (ළංවී)

(ඉක්බිති අසුනක නැගී පෙරැකී කිසෙති. යෙදුනු ශකුන්තලා වේදිකාවට එයි)

**කිසි තවුසියක්**- (ශකුන්තලාවන් උදෙසා) දුව, හිමියා ගේ බුහුමනට ලක් වූ "මහා දේවී" නම ලබනිවා,

**දෙවැන්නී**- දරුව වීර පුතුන් ලබන්නියක් වෙනිවා.

**තාපසියා**- ජාදෙ භත්තුණො බහුමදා හොහි. [ජාතෙ භර්ත්‍රා බහුමතා භව.]

(ආශිෂො දත්වා ගෞතමී වර්ජං නිෂ්ක්‍රාන්තාඃ)

**සඛ්‍යෞ**- (උපසෘත්‍ය) සහි, සුහමජ්ජණං දෙ හොදු. [සඛි සුඛමජ්ජනං තෙ භවතු]

**ශකුන්තලා**- සාඅදං මෙ සහීණං, ඉදො, ණිසීදහ. [ස්වාගතං මෙ සඛ්‍යොඃ; ඉතො නිෂීදතම්.]

**උභෙ**- (මංගලපාත්‍රාන්‍යා'දාය, උපවිශ්‍ය) හලා, සජ්ජා හොහි, ජාව මංගල සමාලංභණං විරඒම. [හලා සජ්ජා භව යාවත් මංගලසමාලම්භනං විරචයාවඃ.]

**ශකුන්තලා**- ඉදං පි බහුමන්තව්වං, දුල්ලහං දාණිං මෙ සහිමංඩණං භවිස්සදි. [ඉදමපි බහුමන්තව්‍යම්. දුර්ලභමිදානිං මෙ සඛී මණ්ඩනං භවිෂ්‍යති] (වාෂ්පං විසෘජති)

**උභෙ**- සහි, උඉඅං ණදෙ මංගලකාලෙ රොඉදුං. [සඛි, උචිතං න තෙ මංගලකාලෙ රොදිතුම්.]

**ප්‍රියංවදා**- ආහරණොඉදං රූවං අස්සම සුලහෙහිං පසාහණෙහිං විප්පඅරිඅදි. [ආභරණො'චිතං රූපමාශ්‍රම සුලභෛඃ ප්‍රසාධනෛඃ විප්‍රක්‍රියතෙ.]

**ඍෂිකුමාරකෞ**- (ප්‍රවිශ්‍යො'පායන හස්තෞ) ඉදමලඞ්කරණම්, අලඞ්ක්‍රියතාමත්‍ර භවතී.

(සර්වා විලොක්‍ය විස්මිතාඃ)

**ගෞතමි**- වච්ඡ ණාරඅ, කුදො එදං? [වත්ස නාරද, කුත එතත්?]

**ප්‍රථමඃ**- තාත කාශ්‍යප ප්‍රභාවාත්,

**තෙවැන්නී-** දියණියෙනි, හිමියා ගෙන් බුහුමන් ලබන්නියක් වෙහිවා.

(ආසිරි දී ගෞතමිය හැර සෙස්සෝ පිටවැ යෙති.)

**දෙයෙහෙළියෝ-** (ළංවී) යෙහෙළිය, ඔබට මංගලා'භි-ෂෙකයෙක් වේවා!

**ශකුන්තලා-** "ම ගේ යෙහෙළියන් ගේ මනා ඊමෙකි" මෙහෙන් හිඳ-ගන්නැ.

**දෙයෙහෙළියෝ-** (මඟුල් කලස් ගෙනැ පිවිසැ) දයාබරිය, සුදුතම් වන්නැ. අපි ඔබ මඟුල් අබරණින් සරසමු.

**ශකුන්තලා-** මෙයත් අගයමි. මා මිතුරියන් ගේ සැරසිලි අදින් අවසන් (දුලබ) වියැ හැකි සි. (කඳුලු සලයි.)

**දෙයෙහෙළියෝ-** යෙහෙළිය, මංගල මොහොතෙහි හැඬීම ඔබට නුසුදුසුයි.

**ප්‍රියංවද-** ආභරණයන්ට සුදුසු රූපය අසපුවේ සුලබ පළඳනාවන් ගෙන් විකාර කෙරෙයි.

**මුනි කුමරුවෝ දෙදෙන-** (පඬුරු අතැ'තිවැ පිවිසැ) මෙන්නැ ආභරණ. මේ පින්වතිය මෙයින් සරසන්නැ.

( සියල්ලෝ බලා පුදුම වෙති )

**ගෞතමී-** පුත නාරද, මේවා කොයින් ද ?

**පළමු වැන්නා-** කාශ්‍යප පියතුමා ගේ මහිමයෙන්.

( තතඃ ප්‍රවිශති ස්නානොත්තීර්ණඃ කාශ්‍යපඃ )

**කාශ්‍යපඃ–**

6 යාස්‍යත්‍ය'ද්‍ය ශකුන්තලේ'ති හෘදයං සංස්පෘෂ්ට
මුත්කණ්ඨයා
කණ්ඨස්තම්භිත වාෂ්පවෘත්තිකලුෂශ්චින්තාජඩං දර්ශනම්.
වෛක්ලව්‍යං මම තාවදීදෘශමහො ස්නෙහාදරණ්‍යෞකසඃ
පීඩ්‍යන්තෙ ගෘහිණඃ කථං න තනයා විශ්ලෙෂ
දුඃඛෛර් නවෛඃ.

( පරික්‍රාමන්ති )

**සඛ්‍යෞ–** හලා සඋන්දලෙ, අවසිද මණ්ඩණාසි. පරිධෙහි සංපදං ඛොමජුඅලං [හලා ශකුන්තලෙ, අවසිත මණ්ඩනා'සි. පරිධත්ස්ව සාම්ප්‍රතං ක්ෂෞමයුගලම්.]

( ශකුන්තලොත්ථාය පරිධත්තෙ )

**ගෞතමී–** ජාදෙ, එසො දෙ ආණංද පරිවාහිණා පරිස්සජං–තො විඅ ගුරූ උවට්ඨිදෙ; ආආරං දාව පඩිවජ්ජස්ස. [ජාතෙ, එෂ ත ආනන්දපරිවාහිණා චක්ෂුෂා පරිෂ්වජමාන ඉව ගුරුරුපස්ථිතඃ; ආචාරං තාවත් ප්‍රතිපද්‍යස්ව.]

**ශකුන්තලා–** (සව්‍රීඩම්) තාද, වංදමි. [තාත, වන්දෙ.]

(වන්දතෙ)

**කාශ්‍යපඃ–** වත්සෙ,

7. යයාතෙරිව ශර්මිෂ්ඨා භර්තුර් බහුමතා භව
සුතං ත්වමපි සම්‍රාජං සේ'ව පූරුමවාප්නුහි

**ගෞතමී–** භඅවං, වරෙ ක්ඛු එසො, ණ ආසිසා. [භගවන්, වරඃ ඛල්වෙ'ෂඃ'නාශීඃ]

**කාශ්‍යපඃ–** වත්සෙ, ඉතඃ සද්‍යො හුතාග්නීන් ප්‍රදක්ෂිණීං කුරුස්ව.

(සර්වේ පරික්‍රාමන්ති)

( ඉක්බිති දිග තා ගොඩ වූ කාශ්‍යප පිවිසෙයි )

**කාශ්‍යප**–

6 සකුන්තලා අද යේ යැ යි මා හද පාරයි සොවින් වෙ ලා
ගෙළ හිර වී එයි දුක් කඳුලින් ගැහුම ද නැති වී දුබ ලා
වත වැසී මා වන් අයටත් සෙනෙහෙන් වෙද
මේ ලෙස විකා ලා
ගරවැසියන් නව දූරි වියොවින් ලද දුක්
කෙලෙසක නො පෙ ළා

(පැදකුණු කරයි)

**දෙ යෙහෙළියෝ**– ප්‍රිය ශකුන්තලා, සැරසුම් ඉවරයි. දැන් දුහුල් සඟල හැඳ–ගන්න.

( ශකුන්තලා නැගිටැ ගනියි)

**ගෞතමී**– දුව, තුටු කඳුලු වැහෙන නෙතින් වැළඳ–ගන්නාක් මෙන් ඔබේ පියා මෙහි එළඹ සිටී. ඔහුට ආචාර කරන්න.

**ශකුන්තලා**– (ලජ්ජා සහිත වැ) පියාණෙනි ඔබ වඳිමි. (වඳියි)

**කාශ්‍යප**– දුව,

7· යයාතිය රජු ගෙන්–සර්මිෂ්ඨා බිසව මෙන්
ලබනිවා බුහුමන්–සක්විති "පූරු" පුතකු ලැබැ.

**ගෞතමී**– උතුමාණෙනි, මෙය සැබැවින් වරයෙක් මැ යි. හුදු ආසිරියෙක් නො වේ.

**කාශ්‍යප**– දුව, දැන් මෙහි පිදූ යාග ද්‍රව්‍ය සහිතවූ හෝම ගින්න පැදකුණු කරන්න.

( සියල්ලෝ පැදකුණු කෙරෙති )

**කාශ්‍යපඃ–** (සෘවජ්ඡන්දසා ශාසෙත)

8. අමී වෙදිං පරිතඃ ක්ලෘප්තධිෂ්ණ්‍යාඃ
සමිද්ධවන්තඃ ප්‍රාන්ත සංස්තීර්ණ දර්භාඃ
අපඝ්නන්තො දුරිතං හව්‍ය ගන්ධෛර්
වෛතානාස් ත්වාං වහ්නයඃ පාවයන්තු.

(ශකුන්තලා ප්‍රදක්ෂිණං කරොති)

**කාශ්‍යපඃ–** ප්‍රතිෂ්ඨස්වෙ‘දානීම්. (සදෘෂ්ටික්ෂෙපම්) ක්ව තෙ ශාර්ඞ්ගරවමිශ්‍රාඃ?

**ශාර්ඞ්ගරව** (ප්‍රවිශ්‍ය) භගවන්, ඉමෙ ස්මඃ.

**කාශ්‍යපඃ–** භගින්‍යා‘සෙත මාගීමාදෙශය

**ශාර්ඞ්ගරවඃ–** ඉත, ඉතො භවතී.

(සර්වෙ පරික්‍රාමන්ති)

**කාශ්‍යපඃ–** භො, භොඃ සන්නිහිතාස්තපොවනතරවඃ.

9. පාතුං න ප්‍රථමං ව්‍යවස්‍යති ජලං යුෂ්මාස්වපීතෙෂු යා
නා‘දත්තෙ ප්‍රියමණ්ඩනා‘පි භවතාං ස්නෙහෙන යා පල්ලවම්
ආද්‍යෙ වඃ කුසුමප්‍රසූති සමයෙ යස්‍යාභවත්‍යුත්සවඃ
සෙ‘යං යාති ශකුන්තලා පතිගෘහං සර්වෛරනුඥායතාම්

(කොකිලරවං සූචයිත්වා)

10. අනුමතගමනා ශකුන්තලා තරුභිරියං වනවාස බන්ධුභිඃ
පරභෘත විරුතං කලං යතඃ ප්‍රතිවචනීකෘතමෙභිරීදෘශම්.

**ආකාශෙ–**

11 රම්‍යාන්තරඃ කමලිනී හරිතෛඃ සරොභිශ්
ඡායාද්‍රුමෛර් නියමිතා‘ර්ක මයූඛ තාපඃ
භූයාත් කුශෙශයරජො මෘදුරෙණුරස්‍යාඃ
ශාන්තා‘නුකූලපවනශ්ච ශිවශ්ච පන්ථාඃ

**කාශ්‍යප**– ( සෘග් වේද මන්ත්‍රයෙකින් ආශිර්වාද කරයි.)

8. මේ මල් අසුන් වට දුමු විදිවත් ලෙසින් බෝ
යුත් වූ දරත් කුස තණත් විහිද සැදූ බෝ
නස්නා දුරින් උවදුරුත් ඇති යාග දුම් බෝ
මේ හෝම ගින්න රැක දේ ඔබ සෙත් දෙමින් බෝ

( ශකුන්තලා පැදකුණු කරයි )

**කාශ්‍යප**– දූන් පිටත් වෙනු. ( වටා බලමින් ) ශාර්ඞ්ගරව ඇතුළු සෙස්සෝ කොහි ද ?

**ශාර්ඞ්ගරව**– (පිවිසැ) උතුමාණෙනි, අපි මෙහි වෙමු.

**කාශ්‍යප**– ශාර්ඞ්ගරව, ඔබ නැගණියට මඟ පෙන්වනු.

**ශාර්ඞ්ගරව**– උත්තමාවෙනි, මෙහෙන්, මෙහෙන් එන්නැ.

( සියල්ලෝ සිසාරති )

**කාශ්‍යප**– එම්බා තපෝවනයෙහිවූ තරුනි

9. ඔබ හට දිය ගෙන දෙන්නට පළමු වැ හා ! හා !
තො මැ පී වා
සැරසිලි රිසි වැ ද සෙනෙහෙන් දළුවක්
හෝ නැති නැති නෙලූ වා
මල් පිදුනු කලැ යමකට සැණ කෙළි මහ උළෙලක් වූ වා
හැම අනුදත්වා සකුන්තලා ඒ, අද හිමි ගෙට යන වා

( කොවුල් හඬක් නැගුනු බව පෙන්වා )

10. අනුදත් ගමනැ'නි සකුන්තලා
වන වැසි නෑ බඳු තුරුන් විසින්
පර පුටුවන් ගේ ඉමිහිරි නාදෙන්
පිළිවදනක් දුනු සේ යැ මෙ සේ වූ.

**අහසෙහි**–

11. පුල් මේ සහස් පනිති සිත්කලු විල් හරිත් පැ
සේයා තුරින් මැඩුණු බෝ හිරු රැස් තැවුල් යුත්
බෝ සේ සහස් පත් රජස් විලසිත් මොළොක් වූ
සෙත් පත් සිහිල් මඳ නලැ'ත් මඟ වත් තීදුක් වේ.

(සවේ සවිස්මයමාකණ්යන්ති)

**ගෞතමී**– ජාදෙ, ණාණාදිජණ සිණිද්ධාහිං අණුණ්ණාද ගමණා සි: තවොවණ දෙවදාහිං පණම භඅවදීණං. [ජාතෙ, ඥාතිජනස්නිග්ධාභිරනුඥාත ගමනාඃ සි. තපොවන දෙවතාභිඃ, ප්‍රණම භගවතීඃ]

**ශකුන්තලා**– (සප්‍රණාමං පරික්‍රම්‍ය, ජනාන්තිකම්.) හලා පිඅංවදෙ, අජ්ජඋත්ත දංසණුස්සුආඑ වි අස්සමපදං පරිච්චඅංතිඑ දුක්ඛෙණ මෙ චලණා පුරදො පවට්ටන්ති. [හලා ප්‍රියංවදෙ, ආර්‍යපුත්‍රදර්ශනොත්සුකායා අප්‍යාශ්‍රමපදං පරිත්‍යජන්ත්‍යා දුඃඛෙන මෙ චරණෞ පුරතඃ ප්‍රවර්තෙතෙ.]

**ප්‍රියංවදා**– ණ කෙඅලං තවොවණ විරහ කාදරා සහී එව්ව, තුඑ උවට්ඨිද විඔඅස්ස තවොවණස්ස වි දාව සමවත්ථා දීසඉ. [න කෙවලං තපොවනවිරහ කාතරා සඛ්‍යෙව, ත්වයොපස්ථිත වියොගස්‍ය තපොවනස්‍යාපි තාවත්සම-වස්ථා දෘශ්‍යතෙ.]

12 උග්ගලිඅ දබ්භකවලා මිආ පරිච්චත්ත ණච්චණා මොරා
ඔසරිඅ පංඩු පත්තා මුඅංති අස්සූණි විඅ ලදාඔ

[උද්ගලිත දර්භකවලා මෘගාඃ-පරිත්‍යක්ත නර්තනා මයූරාඃ
අපසෘත පාණ්ඩුපත්‍රා-මුඤ්චන්ත්‍යශ්‍රූණීව ලතාඃ]

**ශකුන්තලා**– (සමෘත්වා) තාද, ලදාබහිණිඅං වණජොසිණිං දාව ආමංතඉස්සං [තාත, ලතාභගිනීං වනජ්‍යොත්ස්නාං තාවදාමන්ත්‍රයිෂ්‍යෙ.]

**කාශ්‍යපඃ**– අවෛමි තෙ තස්‍යාං සොදර්‍යස්නෙහම්. ඉයං තාවද් දක්ෂිණෙන.

**ශකුන්තලා**· (ලතාමුපෙත්‍ය) වණජොසිණි, චූදසංගදා වි මං පච්චාලිංග, ඉදො ගදාහිං සාහාබාහාහිං; අජ්ජප්පභුදි දූරවත්තිණී දෙ ඛු භවිස්සං. [වනජ්‍යොත්ස්නෙ, චූතසංගතාපි මාං ප්‍රත්‍යාලිඞ්ග; ඉතොගතාභිඃ ශාඛාබාහාභිඃ, අද්‍යප්‍රභෘති දූරවර්තිනී තෙ ඛලු භවිෂ්‍යාමි,]

( සියල්ලෝ පුදුමයෙන් අසා සිටිති )

**ගෞතමී-** දුව, තැයත් බඳු සෙනෙහෙවත් වන දෙවියන් විසින් ද, අනුදත් ගමන් ඇත්තෙහි. නමදින්නැ ඒ දෙවියන්.

**ශකුන්තලා-** ( ප්‍රණාම සහිත වැ පැදකුණු කොටැ පසෙකට වී.) දයාබර ප්‍රියංවදා, ස්වාමියා දැකීමේ ආශා ඇති වුව ද, අසපු පියෙස ඉක්මවන විටැ මගේ දෙ පා ඉතා අසීරුවෙන් ඉදිරියට යැවේ.

**ප්‍රියංවදා-** හුදෙක් තවුස් වන වියෝ දුකින් බැගැ වූයේ යෙහෙළිය පමණක් නො වෙයි. ඔබ ගෙන් පැමිණෙන විරහය ඇති තවුස් වනයේ ද එ බඳු අවස්ථාවෙක් පෙනේ.

12. මුවෝ මුවෙන් ගත් තණ බත් — මි දූ වෝ
මියුරෝ පටන් ගත් නැටුමුත් — මි දූ වේ
ඉදී කසා පැ පත් යුත් — ලතාවෝ
අහෝ ! අහෝ ! නෙත් දිය මෙන් — මි දූ වෝ

**ශකුන්තලා-** ( කල්පනා කොටැ ) පියාණෙනි, වන-ජ්‍යොත්ස්නා ලතා නැගණිය ගෙන් පළමු කොට සමු ගනිමි.

**කාශ්‍යප-** මම දනිමි, ඇයට ඇති ඔබේ සහෝදර ප්‍රේමය. මෙන්නැ ඇ දකුණු පසින්.

**ශකුන්තලා-** ( වැලට ළං වැ ) වන ජ්‍යොත්ස්නාව, මී අඹ ගසේ එතුන ද මේ පැත්තට ගිය අතු අතින් නැවත මා වැළඳ-ගන්නැ. සැබැවින් අද පටන් ඔබෙන් දුර වූවක් වෙමි.

**කාශ්‍යපඃ–**

13 සංකල්පිතං ප්‍රථමමෙව මයා තවා'ථේ
භර්තාරමාත්ම සදෘශං සුකෘතෛර් ගතා ත්වම්
චූතෙන සංශ්‍රිතවතී නවමාලිකෙය–
මස්‍යාමහං ත්වයි ච සම්ප්‍රති වීතචින්තඃ

ඉතඃ පන්ථානං ප්‍රතිපද්‍යස්ව.

**ශකුන්තලා–** (සඛ්‍යෞ ප්‍රති,) හලා, එසා දුවෙණ්ණං වො හත්ථෙ ණික්ඛිවො. [හලා, එෂා ද්වයොර් යුවයොර් හස්තෙ නික්ෂෙපඃ]

**සඛ්‍යෞ–** අඅං ජණො කස්ස හත්ථෙ සමප්පිදෙ? [අයං ජනඃ කස්‍ය හස්තෙ සමර්පිතඃ?]

(බාෂ්පං විහරතඃ)

**කාශ්‍යපඃ–** අනසූයෙ, අලං රුදිත්වා; තනු භවතීභ්‍යාමෙව ස්ථිරීකර්තව්‍යා ශකුන්තලා?

(සර්වේ පරික්‍රාමන්ති)

**ශකුන්තලා–** තාද, එසා උඩජපජ්ජංතචාරිණී ගබ්භමන්ථරා මිඅවහූ ජදා අණඝප්පසවා හොඉ; තදා මෙ කිං පි පිඅණිවෙදඉත්තඅං විසජ්ජඉස්සහ. [තාත, එෂා උටජ පර්‍යන්තචාරිණී ගර්භමන්ථරා මෘගවධූර් යදා'නඝප්‍රසවා භවති, තදා මහ්‍යං කමපි ප්‍රියනිවෙදිතෘකං විසර්ජයිෂ්‍යථ]

**කාශ්‍යපඃ–** නෙ'දං විස්මරිෂ්‍යාමඃ

**ශකුන්තලා–** (ගතිභංගං රූපයිත්වා) කො ණු ඛු එසො ණිවසණෙ මෙ සජ්ජඉ. [කො නු ඛල්වෙෂ නිවසනෙ මෙ සජ්ජතෙ] (පරාවත්තෙ)

**කාශ්‍යපඃ–** වත්සෙ,

**කාශ්‍යප**-

13 මා තී තිමිත්තෙනි දුවේ, පෙර දී සිතූ සේ
යුත් වූ සමින්දකු ඔබේ පිනකින් ලැබූවා
එක් වූ ලෙසින් අඹ ගසත් නවමාලිකා හා
ඈ ගා ඔබත් ගැන අනේ නැත සිත් තැවීමෙක්·

මෙ තැනින් මගට බසින්නෑ.

**ශකුන්තලා**- ( දෙ යෙහෙළියනට ) හිතවතියෙනි, මේ වැල ඔබ දෙ පොළට පවරමි.

**දෙ යෙහෙළියෝ**- මේ අය ( අප ) කා අතෑ තබන්න ද ?

( කඳුලු සලති )

**කාශ්‍යප**- අනසූයා, හැඬීමෙන් කම් නෑ. ඔබ දෙ පොල විසින් ශකුන්තලා සැනසියෑ යුතු නො වේ ද ?

( සියල්ලෝ සිසාරති )

**ශකුන්තලා**- පියාණෙනි, මේ පැල අසල හැසිරෙන ගැබ් බරින් සෙමෙන් යන මේ මුවැත්තී යම් දිනෙක නිදුක් ප්‍රසව ඇත්තී වේ ද, එකලැ මා වෙත ඒ තුටු පුවත දන්වන්නකු එවනු මැනැවි.

**කාශ්‍යප**- එය අමතක නො කරමු.

**ශකුන්තලා**- ( ගමන් වැලැක්ම හඟවා ) මේ කවුරුන් ද මගේ ඇඳුමේ එල්ලෙන්නේ ?

**කාශ්‍යප**- දරුව,

14 යස්‍ය ත්වයා ව්‍රණවිරොපණමිංගුදීනාං
තෛලං න්‍යෂිච්‍යත මුඛෙ කුශසූචිවිද්ධෙ
ශ්‍යාමාකමුෂ්ටිපරිවර්ධිතකො ජහාති
සො'යං න පුත්‍රකෘතකඃ පදවීං මෘගසෙත

**ශකුන්තලා–** වච්ඡ, කිං සහවාස පරිච්චාඉණිං මං අණුසරසි? අචිරප්පසූදඑ ජණණීඑ විණා විවඩ්ඪිදො එව්ව: දාණිං පි මඑ විරහිදං තුමං තාදො චිංතඉස්සදි. ණිවත්තෙහි දාව. [ වත්ස, කිං සහවාසපරිත්‍යාගිනී, මාමනුසරසි? අචිර-ප්‍රසූතයා ජනන්‍යා විනා විවර්ධිත එව. ඉදානීමපි මයා විරහිතං ත්වාං. තාතශ්චින්තයිෂ්‍යති, නිවර්තස්ව තාවත්.]

(රුදතී ප්‍රස්ථිතා)

**කාශ්‍යපඃ–**

15 උත්පක්ෂ්මණොර් නයනයොරුපරුද්ධවෘත්තිං
බාෂ්පං කුරු ස්ථිරතයා විහතා'නුබන්ධම්
අස්මින්නලක්ෂිත නතො'න්නත භූමිභාගෙ
මාර්ගෙ පදානි ඛලු තෙ විෂමී භවන්ති.

**ශාර්ඞ්ගරවඃ–** භගවන්, "ඔදකාන්තං ස්නිග්ධජනො'නුගන්ත-ව්‍ය" ඉති ශ්‍රූයතෙ. තදිදං සරස්තීරම්. අත්‍ර සංදිශ්‍ය ප්‍රතිගන්තුමර්හසි.

**කාශ්‍යපඃ–** තෙන හි'මාං ක්ෂීරවෘක්ෂච්ඡායාමාශ්‍රයාමඃ

(සර්වේ පරික්‍රම්‍ය ස්ථිතාඃ)

**කාශ්‍යපඃ–** (ආත්මගතම්) කිං නු ඛලු තත්‍ර භවතො දුෂ්‍ය-න්තස්‍ය යුක්තරූපමස්මාභිඃ සන්දෙෂ්ටව්‍යම්? (චින්තයති)

**ශකුන්තලා–** (ජනාන්තිකම්) හලා, පෙක්ඛ. ණලිණී-පත්තමෙත්තාංතරිදං පි සහඅරං අදෙක්ඛංතී ආදුරා චක්කවාඊ ආරඩදි. දුක්කරං ක්ඛු අහං කරෙමි. [හලා පශ්‍ය, නලිනීපත්‍රමාත්‍රා'න්තරිතමපි සහචරමපශ්‍යන්ත්‍යා 'තුරා චක්‍රවාක්‍යා'රටති. දුෂ්කරං ඛල්වහං කරොමි,]

14. හා ! මා දුවේ අඟුන තෙල්'වන සාන්ති' නම් වූ
ගැල් වූ ද ඒ කුස තුඹින් වන වූ මුවෙනි
සාමාක නම් තණ කවා ලෙස පේමයෙන් පුත්
පුස්නා මුවා ඔබ පියත් නො හරියි සෙනේහෙන්.

**ශකුන්තලා–** දරුව, කිම සහ-වාසය හැර යන මා අනුව යන්නෙහි ද ? බිහි වැ නො බෝ දිනකින් මැ මවු ගෙන් වියෝ වැ දුක් කරන ලද්දේ මැ යැ. දැනු ද මා වියෝ වුවත් තා ගැන ම-පියා සොයා බලනු ඇති. ඉනින් නවතින්නැ.

( හඬමින් පිටත් වෙයි )

**කාශ්‍යප–**

15. උඩට නෙරුණු පිය දෙනෙතින් යුතු වැ පි යේ
කඳුලු ඉනුම නවතනු දුක් කොටැ තර යේ
නැතගොත් නො දකැ වල් ගොඩැලි ද මගතුර යේ
වැදූ එහි ඔබේ පා නියතින් වැහැරෙනු යේ

**ශාර්ඞගරව–** උතුමාණෙනි, දිය හිම තෙක් සෙනෙහෙවත් නැයනට පසු ගමන් කළ යුතු ලු, එ සේ නම් මේ විල් තෙර. මෙහි දී දැන්වියැ යුත්තක් දන්වා ආපසු යාම සුදුසු යි.

**කාශ්‍යප–** එ සේ නම් මේ කිරි ගස ඇසුරු කරමු.

( සියල්ලෝ සිසාරා සිටිති )

**කාශ්‍යප–** ( තමාට මැ ) සැබැවින් කිම; අප විසින් දුෂ්‍යන්ත රජුට යැවියැ යුතු හසුන ? ( සිතයි )

**ශකුන්තලා–** ( පසෙකට වී ) හිතවතියෙනි, බලන්නැ. නෙලුම් පතකින් වැසුණු පමණින් මැ ප්‍රියයා නො දක්මෙන් ආතුර වූ සක්වා ළිහිණිය හඩ තලයි. මම අසීරු දැයක් කරමි,

**අනසූයා**– සහි, ණ එව්වං මංතෙහි. [සඛි, නෛවං මන්ත්‍රය]

16. එසා වි පිඑණ විණා ගමෙඉ රඅණිං විසාඅදීහඅරං
ගරුඅං පි විරහදුඃඛං ආසා බංධො සාහවෙදි.

[ එෂා'පි ප්‍රියෙණ විනා ගමයති රජනී විෂාදදීර්ඝතරාම්.
ගුර්‍ව'පි විරහදුඃඛමාශාබන්ධඃ සාහයති. ]

**කාශ්‍යපඃ**– ශාර්ඞ්ගරව, ඉති ත්වයා මද්වචනාත් ස රාජා ශකුන්තලාං පුරස්කෘත්‍ය වක්තව්‍යඃ.

**ශාර්ඞ්ගරවඃ**– ආඥාපයතු භවාන්.

**කාශ්‍යපඃ**–

17 අස්මාන් සාධු විචින්ත්‍ය සංයමධනානුච්චෛඃ
කුලං චාත්මනස්
ත්වය්‍යස්‍යාඃ කථමප්‍යබාන්ධවකෘතාං ස්නෙහ
ප්‍රවෘත්තිං ච තාම්.
සාමාන්‍ය ප්‍රතිපත්තිපූර්වකමියං දාරෙෂු දෘශ්‍යා ත්වයා
භාග්‍යා'යත්තමතඃ පරං න ඛලු තද් වාච්‍යං වධූබන්ධුභිඃ.

**ශාර්ඞ්ගරවඃ**– ගෘහීතඃ සන්දෙශඃ.

**කාශ්‍යපඃ**– වත්සෙ, ත්වමිදානීමනුශාසනීයා'සි. වනෞකසො'පි සන්තො ලෞකිකඥා වයම්.

**ශාර්ඞ්ගරව**– න ඛලු ධීමතාං කශ්චිදවිෂයො නාම.

**කාශ්‍යපඃ**– සා ත්වමිතඃ පතිකුලං ප්‍රාප්‍ය,

18. ශුශ්‍රූෂස්ව ගුරූන් කුරු ප්‍රියසඛීවෘත්තිං සපත්නී ජනෙ
භර්තුර් විප්‍රකෘතා'පි රොෂණතයා මා ස්ම ප්‍රතීපං ගමඃ
භූයිෂ්ඨං භව දක්ෂිණා පරිජනෙ භාග්‍යෙෂ්ව'නුත්සෙකිනී
යාන්ත්‍යෙ'වං ගෘහිණීපදං යුවතයො වාමාඃ කුලස්‍යා'ධයඃ

කථං වා ගෞතමී මන්‍යතෙ?

**අනසූයා**– යෙහෙළිය, එසේ නො කියන්නෑ.

සැ ප ත් වියෝගෙන් හිමියා නිසා වූ
රැ ය ත් ගෙවයි මෑ ළ-දුකින් පුළුල් වූ
ම හ ත් වුවත් පෙම් බැඳුමත් පියන් හා
දු ක ත් සහයි කෝම නමුත් අනේ ඈ.

**කාශ්‍යප**– ශාර්ඞගරව, මගේ වචනයෙන් ශකුන්තලා පෙරටු කොටැ ඔබ විසින් ඒ රජුට මෙසේ කියෑ යුතු යි.

**ශාර්ඞගරව**– උතුමාණෝ අණ කරන සේක්වා.

**කාශ්‍යප**–

17. තවුස් දන ඇති අප ද ඔබ සෙට කුලය හා
නො මැ යෙදූ නෑ කෑ ල
ඔබට නතු තළ ඈගේ ආලය ගැන ද
සිහි කොටැ බලා නො පැකි ල
මැය ද ඔබ බිරියක ලෙසින් ගෙනෑ සමව
සලකා දෙවනු. රැකව ල
ඉතික්බිති එය සතුසි ඉරණම නො
කියවනු දෙස් ලවා නෑකු ල

**ශාර්ඞගරව**– සන්දේශය පිළිගනිමි.

**කාශ්‍යප**– දුව, දූන් ඔබට අවවාද දියෑ යුත්තේ නු. වන වැස්සෝ වුව ද, අපි ලෞකික දේ පිළිබඳ වෑ දන්නමෝ වෙමු.

**ශාර්ඞගරව**– නැණවතුනට සැබැවින් කිසිවකුත් අවිෂය නො වේ.

**කාශ්‍යප**– ඒ ඔබ පති කුලයට පැමිණී පසු

18 ගුරුන් හට කිකරු වෑ පවතුව. සපත්නි දනු
යෙහෙළියන් ලෙ ස
හි මි න් කිසියම් දෙසක් කළ හොත්
නො යන් පළිගනු පිණිස පා රෙ ස
නි ති න් පිරිවර දනන් හට දෙව
සැපෙන් උඩඟුව නොවස කිසි ලෙ ස
කා ර න් නී මේ ගැහැණියක් වේ.
බැහැරි වාමා නසා තම වස

ඉකයේ ද, ගෞතමී සිතන්නේ ?

**ගෞතමී**– එත්තිඔ වහුජණස්ස උවදෙසො. ජාදෙ, එදං ක්ඛු සව්වං ඔධාරෙහි. [ එතාවාන් වධූජනස්‍යා'පදෙශඃ ජාතෙ, එතත්ඛලු සර්වමවධාරය. ]

**කාශ්‍යපඃ**– වත්සෙ, පරිෂ්වජස්ව මාං, සඛීජනං ච.

**ශකුන්තලා**– තාද, ඉදො එව්ව කිං පිඅංවදා අණසූආමිස්සා සහිඔ ණිවත්තිස්සංති? [ තාත, ඉත එව කිං ප්‍රියංවදා අනසූයා සඛ්‍යෞ නිවර්තිෂ්‍යෙතෙ? ]

**කාශ්‍යපඃ**– වත්සෙ, ඉමෙ අපි ප්‍රදෙයෙ, න යුක්තමනයො– ස්තත්‍ර ගන්තුම්. ත්වයා සහ ගෞතමී යාස්‍යති.

**ශකුන්තලා**– ( පිතරමාශ්ලිෂ්‍ය ) කහං දාණිං තාදස්ස අංකාදො පරිබ්භට්ඨා මලඅතරොම්මූලිආ චන්දණලදා විඅ දෙසංතරෙ ජීවිඅං ධාරඉස්සං. [ කථමිදානීං තාතස්‍යා– 'ඞ්කාත් පරිභ්‍රෂ්ටා මලයතටො'න්මූලිතා චන්දනලතෙ'ව දෙශා'න්තරෙ ජීවිතං ධාරයිෂ්‍යෙ. ]

**කාශ්‍යපඃ**– වත්සෙ, කිමෙවං කාතරා'සි?

19. අභිජනවතො භර්තුඃ ශ්ලාඝ්‍යෙ ස්ථිතා ගෘහිණීපදෙ
විභවගුරුභිඃ කෘත්‍යෛස්තස්‍ය ප්‍රතික්ෂණමාකුලා
තනයමචිරාත් ප්‍රාචී'වා'ර්කං ප්‍රසූය ච පාවනං
මම විරහජාං න ත්වං වත්සෙ, ශුචං ගණයිෂ්‍යසි.

( ශකුන්තලා පිතුඃ පාදයොඃ පතති. )

**කාශ්‍යපඃ**– යදිච්ඡාමි, තෙ තදස්තු.

**ශකුන්තලා**– ( සඛ්‍යාවුපෙත්‍ය ) හලා, දුවෙ වි මං සමං එව්ව පරිස්සජහ. [ හලා ද්වෙ අපි මාං සමමෙව පරිෂ්වජේථාම්. ]

**සඛ්‍යෞ**– ( තථා කෘත්වා ) සහි, ජඉ ණාම සො රාආ පච්චහිණ්ණාණමංථරො භවෙ, තදො සෙ අත්තණාමහෙ– අංකිදං අංගුලීඅං දංසෙහි. [ සඛි, යදි නාම ස රාජා ප්‍රත්‍යභිඥානමන්ථරො භවෙත්, තතස්තස්‍යෛ'දමාත්ම– නාමධෙයා'ඞ්කිතමඞ්ගුලීයකං දර්ශය. ]

**ගෞතමී**– මේ උවදෙස් විධූවකට සෑහේ. දුව, මේ සියල්ල සිහියේ උන්නෑ.

**කාශ්‍යප**– දුව, මා ද යෙහෙළියන් ද වැළඳෑ ගන්නෑ.

**ශකුන්තලා**– පියාණෙනි, ප්‍රියංවද අනසූයා දෙ යෙහෙළියෝ මෙහි මෑ නවතින්නාහු ද ?

**කාශ්‍යප**– දුව, මොවුනුත් පාවා දෙමි. මේ දෙන්නා එහි යාම සුදුසු නෑ, ඔබ සමග ගෞතමිය යන්නී යෑ.

**ශකුන්තලා**– ( පියා වැළඳෑ ගෙනෑ ) දූන් පියාණන් ගේ ඇකයෙන් ගිලිහී මලය කළු බිමින් උදුරන ලද සඳුන් පැලයක් මෙන් අන් දෙසෙකෑ කෙසේ දිවි ගෙවම් ද ?

**කාශ්‍යප**– දුව, ඇයි මෙසේ බැගෑ වන්නේ ?

19. කු ල ව ත් හිමිඳු ගෙන් ලැබෑ අග තිල ගැහැණී
වෙ හ ප ත් කිසෙහි වෙහෙස වෑ සම්පත් බ රි නී
සි රි ම ත් පුතකු ලැබෑ පෙර දිග දිනිඳු මෙ නී
දු ක ප ත් නො සලකනු මගෙ වියොවින් පැ මි ණී

( ශකුනතලා පියා ගේ පා මුලැ වැටෙයි )

**කාශ්‍යප**– මම යමක් පතමි ද, එය ඔබට වේවා.

**ශකුන්තලා**– ( යෙහෙළියන් වෙතෑ එළඹෑ ) හිතවතියෙනි, දෙන්නා මෑ මා එක විටෑ වැළඳෑ ගන්නෑ.

**දෙ යෙහෙළියෝ**– ( එසේ කොටෑ ) යෙහෙළිය, ඉදින් වනාහි ඒ රජු ඔබ හැඳිනීමට ලස් වී නම් එ විටෑ සිය නම කෙටූ මුද්ද ඔහුට පෙන්වන්නෑ.

**ශකුන්තලා-** ඉමිණා සංදෙහෙණ වො ආකම්පිද ම්හි. [ අනෙන සන්දෙහෙන වාමාකම්පිතා'ස්මි. ]

**සඛ්‍යෞ-** මා භාආහි. අදිසිණෙහො පාවසංකී. [ මා බිභෙහි. අතිස්නෙහඃ පාපශඞ්කී. ]

**ශාර්ඞ්ගරව-** යුගාන්තරමාරූඪඃ සවිතා. ත්වරයාමත්‍ර භවතී.

**ශකුන්තලා-** ( ආශ්‍රමා'භිමුඛී ස්ථිත්වා ) තාද, කදා ණු ක්ඛු භූඔ තවොවණං පෙක්ඛිස්සං. [ තාත, කදා නු ඛලු භූයස්තපොවනං ප්‍රෙක්ෂිෂ්‍යෙ ]

**කාශ්‍යපඃ-** ශ්‍රූයතාම්,

20. භූත්වා චිරය චතුරන්තමහී සපත්නී
දෞෂ්‍යන්තිමප්‍රතිරථං තනයං නිවෙශ්‍ය
භර්ත්‍රා තදර්පිත කුටුම්බභරෙණ සාර්ධං
ශාන්තෙ කරිෂ්‍යසි පදං පුනරාශ්‍රමෙ'ස්මින්.

**ගෞතමී-** ජාදෙ, පරිහීඅදි ගමණවෙලා. ණිවත්තෙහි පිඅරං. අහවා චිරෙණ වි පුණො පුණො එසා එව්වං මන්තඉස්සදි. ණිවත්තදු භවං. [ ජාතෙ, පරිහීයතෙ ගමන වෙලා; නිවර්තය පිතරම්. අථවා චිරෙණා'පි පුනඃ පුනරෙෂෛ'වං මන්ත්‍රයිෂ්‍යතෙ. නිවර්තතාං භවාන්. ]

**කාශ්‍යපඃ-** වත්සෙ, උපරුධ්‍යතෙ, තපො'නුෂ්ඨානම්.

**ශකුන්තලා-** ( භූයඃ පිතරමාශ්ලිෂ්‍ය ) තවච්චරණ පීඩිදං තාද සරීරං, තා මා අදිමෙත්තං මම කිදෙ උක්කණ්ඨ. [ තපශ්චරණපීඩිතං තාතශරීරම්. තන්මා'තිමාත්‍රං මම කෘත උත්කණ්ඨස්ව. ]

**කාශ්‍යප-** ( සනිඃශ්වාසම් ).

**ශකුන්තලා**- මේ සැකයෙන් ඔබ විසින් මම කම්පිත කරන ලද්දේ වෙමි.

**ඥ සෙහෙළියෝ**- නො බව. විපතෙහි සැකය අධික ස්නේහයෙනි.

**ශාර්ඞ්ගරව**- හිරු මුදුන් වී එයි. දූන් පින්වතිය ඉක්මන් කරන්නැ.

**ශකුන්තලා**- ( අසපුව දෙස බලා සිටැ ) පියාණෙනි, කවද යළි තවුස් වනය දකිම් ද ?

**කාශ්‍යප**- අසනු ලැබේවා !

20 වී සිව් සිදුන් කළ මෙවුල් මිහි හා සපත්නී
දුස්සන්ත පුත් එ විරුවන් රජ තන් තබා ලා
සිස් වූ මහා සුව රැසින් සමගින් සමින්ද,
මේ සෙත් අරම් පියෙසෙහී තබනේ යළිත් පා

**ගෞතමී**- දුව, ගමන් වේලාව ඉක්මෙයි. පියාණන් නවත්වන්නැ. නැතහොත්, නැවත නැවත මෝ මෙසේ දෙඩවයි. කාශ්‍යප උතුමා නවතීවා.

**කාශ්‍යප**- දුව, බවුන් වැඩුමත් වැලැකිණි.

**ශකුන්තලා**- ( පියා බොහෝ සේ වැළඳැ ගෙනැ ) තපස් චරණයෙන් පියා ගේ සිරුර පීඩිත යැ. එ බැවින් මා ගැන පමණට වැඩියෙන් දුක් නො වන්නැ.

**කාශ්‍යප**- ( සුසුම් ලමින් )

21. සම්මෙෂ්‍යති මම ශොකඃ කථං නු වත්සෙ
ත්වයා රචිතපූර්වම්
උටජද්වාරි විරූඪං නීවාරබලිං විලොකයතඃ

ගච්ඡ, ශිවාස්තෙ පන්ථානඃ සන්තු.

( නිෂ්ක්‍රාන්තාඃ ශකුන්තලා සහයායිනශ්ච)

**සඛ්‍යෞ**– ( ශකුන්තලාං විලොක්‍ය ) හද්ධි ! හද්ධි ! අංතලිහිද සඋන්දලා වණරාඊඑ. [ හා ධික් ! හා ධික් ! අන්තර්හිතා ශකුන්තලා වනරාජ්‍යා. ]

**කාශ්‍යපඃ**– ( සනිඃශ්වාසම් ) අනසූයෙ, ගතවතී වාං සහ-ධර්මචාරිණී. නිගෘහ්‍ය ශොකමනුගච්ඡතං මාං ප්‍රස්ථිතම්.

**උභෙ**– තාද, සඋන්දලා විරහිදං සුණ්ණං විඅ තවොවණං කහං පවිසාමො. [ තාත, ශකුන්තලා විරහිතං ශූන්‍යමිව තපොවනං කථං ප්‍රවිශාමඃ ]

**කාශ්‍යපඃ**– ස්නෙහප්‍රවෘත්තිරෙවං දර්ශිනී (සවිමර්ෂං පරික්‍රම්‍ය) හන්ත භොඃ! ශකුන්තලාං පතිකුලං විසෘජ්‍ය ලබ්ධමිදානීං ස්වාස්ථ්‍යම්. කුතඃ,

22. අර්ථොහි කන්‍යා පරකීය එව
තාමද්‍ය සම්ප්‍රෙෂ්‍ය පරිග්‍රහීතුඃ
ජාතො මමා'යං විශදඃ ප්‍රකාමං
ප්‍රත්‍යර්පිත න්‍යාස ඉවාන්තරාත්මා

( නිෂ්ක්‍රාන්තාඃ සර්වේ )

## ඉති චතුර්ථෝ'ඞ්කඃ

21. හුරු ගැල් පුද පිණිස නතු කළ පසුව
පැළ දෙරණ වැඩුණු එක ලා
දකිනා මා හද දැනෙන සෝකය කෙසේ වාවම් නා බ ලා

යන්නෑ, ඔබට මාගීයෝ උවදුරු රහිත වෙත්වා !

( නික්මෙති, ශකුන්තලා හා කැටුව යන්නෝ. )

**දෙ යෙහෙළියෝ**– ( ශකුන්තලා දෙස බලා ) අහෝ! දුකෙකි. අහෝ ! දුකෙකි. වන රොදින් ශකුන්තලා අතුරුදහන් වූවා.

**කාශ්‍යප**– ( සුසුම් ලමින් ) අනසූයා, ඔබ දෙ පොළ ගේ සහධම්චාරිණී ගියා නො වෑ ? ශොකය දුර ලා මා සමග එන්නෑ.

**දෙ යෙහෙළියෝ**– පියාණෙනි, ශකුන්තලා වියෝගයෙන් සිස් වූවාක් බඳු තවුස් වනයට කෙසේ පිවිසෙමු ද ?

**කාශ්‍යප**– ස්නේහයේ පැවැත්ම මෙසේ දැක්නා සුළු යෑ. ( විමසුම් සහිත වෑ කැරකි ) ඕ! අනේ! ශකුන්තලා පති කුලයට යවා දැන් සැනසුමක් ලදිමි. කෙසේ ද?

22. වාම පරාංයත් දනයෙක් මෑ වේ ලූ
ඒ දැන් යවාලා හිමියා වෙතේහී
දුන් මෙන් පරායත් දෙය මා යලිත් උන්
හා ! හා ! පහන් වී ම–සිතත් බොහෝ සේ.

( සියල්ලෝ පිටත් වෑ යෙති. )

# සිව් වන රඬගය නිමාවිණි

## පඤ්චමො'ඞ්කඃ

( තතඃ ප්‍රවිශත්‍යා'සනස්ථො රාජා විදූෂකශ්ච )

**විදූෂකඃ**– ( කර්ණං දත්වා ) භො වඅස්ස, සංගීතසාලාන්තරෙ අවධාණං දෙහි. කලවිසුද්ධාඑ ගීදිඑ සරසංජොඔ සුණීඅදි. ජාණෙ තත්තහොදි හංසවදිආ වණ්ණපරිඅඅං කරෙදි ත්ති [ භොඃ වයස්‍ය, සංගීතශාලාන්තරෙ'වධානං දෙහි. කලවිශුද්ධායා ගීතෙඃ ස්වරසංයොගඃ ශ්‍රූයතෙ. ජානෙ තත්‍රභවතී හංසපදිකා. වර්ණපරිචයං කරොතී'ති ]

**රාජා**–– තූෂ්ණීං භව. යාවදාකර්ණයාමි.

( ආකාශෙ ගීයතෙ )

1. අහිණව මහුලොලුවො තුමං–තහ පරිචුම්බිඅ චූඅමංජරිං
කමලවසඉමෙත්තණිව්වුදෙ-මහුඅරවිම්හරිදො
සි ණං කහං?

[ අභිනව මධුලොලුපස්ත්වං තථා පරිචුම්බ්‍ය චූතමඤ්ජරීම්.
කමලවසතිමාත්‍ර නිර්වෘතො මධුකර විස්මෘතො–
'ස්‍යෙ'නාං කථම් ? ]

**රාජා**– අහො ! රාගපරිවාහිනී ගීතිඃ.

**විදූෂකඃ**– කිං දාව ගීදිඑ අවගඔ අක්ඛරත්ථො ? [කිං තාවත් ගීත්‍යා අවගතො'ක්ෂරාර්ථඃ ]

**රාජා**– ( ස්මිතං කෘත්වා ) සකෘත් කෘතප්‍රණයො'යං ජනඃ. තදස්‍යා දෙවීංවසුමතීමන්තරෙණ මදුපාලම්භමවගතො–'ස්මි සඛෙ මාඪව්‍ය, මද්වචනාදුච්‍යතාං හංසපදිකා " නිපුණමුපාලබ්ධො'ස්මී"'ති.

**විදූෂකඃ**– ජං භවං ආණවෙදි, ( උත්ථාය ) භො වඅස්ස, ගහීදස්ස තාඑ පරකීඑහිං හත්ථෙහිං සිහණ්ඩඑ තාඩී–අමාණස්ස අච්ඡරාඑ වීදරාඅස්ස විඅ ණත්ථි දාණිං මෙ මොක්ඛො [ යද්භවානාඥාපයති. භොඃ වයස්‍ය, ගෘහීතස්‍ය තයා පරකීයෛර්හස්තෛඃ ශිඛණ්ඩකෙ තාඩ්‍යමානස්‍යා–'ප්සරසා වීතරාගස්‍යෙව නාස්තී'දානීං මෙ මොක්ෂඃ. ]

# පස් වන රඟය

( ඉක්බිති පිවිසෙති, අසුනකැ හුන් රජු ද විදූෂක ද. )

**විදූෂක**- එම්බා මිත්‍රය, සඟසු හල තුළට සවන් දෙන්නැ. මිහිරි පැහැදිලි ගීතය සංගීත ස්වරයට අනුකූල වැ ඇසේ. එහි හංසපාදිකා දේවිය ස්වර පුහුණුව උගණිති යි හඟිමි.

**රජ**- නිහඬ වෙනු. ඊට සවන් දෙමු.

( ඇත ගැයේ )

1. නව මී ලොල් බම රෝ
මා සිහි නැති කුරි රෝ

අඹ සැනි සිඹ ලා
සියපත දූක ලා
එහි ගොස් එක ලා
විසුමෙන් දූපි ලා

නව මී ලොල් බම රෝ
මා සිහි නැති කුරි රෝ

**රජ**- අහෝ, රාගය වගුරුවන ගීතය !

**විදූෂක**- කිම, ගීතාක්ෂරයන් ගේ අරුත් වටහා ගත්තෙහි ද?

**රජ**- ( සිනාසී ) මේ අය වරක් කළ පෙම් ඇත්තියක්. ඈගේ මේ ගීය වසුමතී දේවිය නිමිති කොටැ මට නින්ද පිණිස යැ යි හඟිමි. මිත්‍ර මාඪව්‍යය, මගේ වචනයෙන් හංසපාදිකාවට කියන්නැ; බුහුටි වැ මා නිගැණු බැව්.

**විදූෂක**- ඔබ වහන්සේ ගේ අණ ලෙසෙකි. ( නැගී සිටැ ) ප්‍රිය මිත්‍රය, ඈ විසින් අනුන් ගේ අත්වලින් ගන්වා ගත් කෙස් වැටිය ඇති, තළනු ලබන්නා වූ මට, දෙවඟනක ගෙන් මිතරාගියකුට මෙන් දූන් මිදුමෙක් නැති.

**රාජා**– හවජ් නාගරිකවෘත්‍යා සංඥපයෛ'නාං.

**විදූෂකඃ**– කා ගඊ ? [ කා ගතිඃ ? ] ( නිෂ්ක්‍රාන්තඃ )

**රාජා**– ( ආත්මගතම් ) කිං නු ඛලු ගීතමෙවංවිධා'ර්ථමා-
කණ්‍යෙ'ෂ්ටජනවිරහාදෘතෙ'පි බලවදුත්කණ්ඨිතො'ස්මි
අථවා–

2. රම්‍යාණි වීක්ෂ්‍ය මධුරාංශ්ච නිශම්‍ය ශබ්දාන්
පය්‍යුත්සුකී භවති යත් සුඛිතො'පි ජන්තුඃ.
තච්චෙතසා ස්මරති නූනමබොධපූර්වං
භාවස්ථිරාණි ජනනාන්තර සෞහෘදානි.

( පය්‍යා'කුලස්තිෂ්ඨති )

( තතඃ ප්‍රවිශති කඤ්චුකී )

**කඤ්චුකී**– අහො ! නු ඛල්වී'දෘශීමවස්ථාං ප්‍රතිපන්නො'ස්මි

3. ආචාර ඉත්‍ය'ධිකෘතෙන මයා ගෘහීතා
යා වෙත්‍රයෂ්ටිරවරොධ ගෘහෙෂු රාඥඃ
කාලෙ ගතෙ බහුතිථෙ මම සෛව ජාතා
ප්‍රස්ථාන වික්ලවගතෙරවලම්බනා'ර්ථා

භොඃ, කාමං ධර්මකාර්‍යමනතිපාත්‍යං දෙවස්‍ය, තථා'පි- 'දානීමෙව ධර්මාසනාදුත්ථිතාය පුනරුපරොධකාරි කණ්ව-ශිෂ්‍යා'ගමනමස්මෙ නො'ත්සහෙ නිවෙදිතුම්. අථවා විශ්‍රාමො'යං ලොකතන්ත්‍රා'ධිකාරඃ. කුතඃ:-

4. භානුඃ සකෘද් යුක්ත තුරඞ්ග එව
රාත්‍රිං දිවං ගන්ධවහඃ ප්‍රයාති.
ශෙෂං සදෛ'වා'හිත භූමිභාරඃ
ෂෂ්ඨාං'ශ වෘත්තෙරපි ධර්ම එෂඃ

යාවත් නි'යොගමනුතිෂ්ඨාමි ( පරික්‍රම්‍ය'වලොක්‍ය ච ) එෂ දෙවඃ,

**රජ–** ඔව්. ශිලාචාර පැවැත්මෙන් ඇට දන්වනු.

**විදූෂක–** කවර පිහිටෙක් ද ? ( පිටතින් මැ යයි )

**රජ–** ( තමාට මැ ) සැබැවින් කිම, මෙ බඳු අරුත් ඇති ගීයක් අසා ඉෂ්ට ජන විරහයක් නැති වත් මහත් සේ දුකට පැමිණියේ ? නොහොත්,

2. යම් සේ ළ ගත් දූය බලා අසමින් සඳත් මී
බෝ සේ පිනා ගිය දනත් කුහුලින් පෙළෙත් නූ
ඒ ඒ ලෙසින් සුහදනා මිතිසුන් අයත් වූ
සි ත් ගී නො වූව ද මුලින් යලි සි කෙරේ මැයි.

( කලබල වැ සිටියි )

( ඉක්බිති කඤ්චුකී පිවිසෙයි. )

**කඤ්චුකී–** අනේ, ගැබැට මැ මාත් මෙ බඳු අවස්ථාවකට පැමිණියා නො වැ ?

3. අ දි යු රු පදවි ලැබැ රජ් ගෙත් සුදහ තුල
ගරු ස රු බව පිණිස අන දූරු මෙ වේවැල
ක ලතු රු ගෙවීමෙන් පැකිලෙන ගහ දුබල
නි රතු රු සැර යටිය වූවා මට මෙ කල

ඔව්. ආගමික කිස පැහැර නො හැරීම දේවයන් ගේ කැමැත්තයි. එ සේ වුවත් මේ දූන් විනිශ්චයාසනයෙන් නැගී සිටියහුට යළි කණ්ව ශිෂ්‍යයන් ගේ පැමිණීම දන්වන්නට අපට දිරි නැත. නොහොත් ලෝ පල් පදවිය ඉසුඹු ලියැ හැක්කෙක් නො වේ.

4. රියේ වරක් මැ සි යෙදුවේ අසුත් රිවි
දිවා රැයේ යේ හමමින් මරුද්වතී
දරා සඳ කල්හි මැ නාරද පොළෝ
සිරිත් මෙ සේ මැ සි නිරිඳුත් රැගත් බලී

මම ම ගේ රාජකාර්‍ය කරන්නම්. ( කැරැකී බලා ) මේ නරනිඳුහු.

5. ප්‍රජාඃ ප්‍රජාඃ ස්වා ඉව තන්ත්‍රයිත්වා
නිෂේවතෙ ශ්‍රාන්තමනා විවික්තම්
යූථානි සඤ්චාර්‍ය රවිප්‍රතප්තඃ
ශීතං දිවාස්ථාන මිව ද්විපෙන්ද්‍රඃ

(උපගම්‍ය) ජයතු, ජයතු දෙවඃ, එතෙ ඛලු හිම-ගිරේරුපත්‍යකාරණ්‍යවාසිනඃ කාශ්‍යපසන්දෙශමාදාය සස්ත්‍රීකාස්තපස්විනඃ සම්ප්‍රාප්තාඃ. ශ්‍රුත්වා දෙවඃ ප්‍රමාණම්.

**රාජා-** (සාදරම්) කිං කාශ්‍යපසන්දෙශහාරිණස්තපස්විනඃ ?

**කඤ්චුකී-** අථ කිම් ?

**රාජා-** තෙන හි මද්වචනාද්විඥාප්‍යතාමුපාධ්‍යායඃ සෝමරාතඃ. අමූනා'ශ්‍රමවාසිනඃ ශ්‍රෞතෙන විධිනා සත්කෘත්‍ය ස්වයමෙව ප්‍රවෙශයිතුමර්හතී'ති. අහමප්‍ය'ත්‍ර තපස්විදර්ශනො'චිතෙ ප්‍රදෙශ ස්ථිතඃ ප්‍රතිපාලයාමි.

**කඤ්චුකී-** යදාඥාපයති දෙවඃ. (නිෂ්ක්‍රාන්තඃ)

**රාජා-** (උත්ථාය) වෙත්‍රවති, අග්නිශරණමාර්ගමාදෙශය.

**ප්‍රතිහාරී-** ඉදෙ ඉදෙ දෙවො. [ ඉත ඉතො දෙවඃ ]

**රාජා-** (පරික්‍රාමන්'අධිකාර ඛෙදං නිරූප්‍ය) සර්වඃ ප්‍රාර්ථිත-මර්ථමධිගම්‍ය සුඛීසම්පද්‍යතෙ ජන්තුඃ'රාඥාං තු චරිතා-'ර්ථතා දුඃඛොත්තරෛ'ව.-

6. ඖත්සුක්‍යමාත්‍රමවසාදයති ප්‍රතිෂ්ඨා
ක්ලිශ්නාති ලබ්ධපරිපාලනවෘත්තිරෙව
නා'තිශ්‍රමා'පනයනාය යථා ශ්‍රමාය
රාජ්‍යං ස්ව හස්ත ධෘත දණ්ඩමිවාතපත්‍රම්.

නෙපථ්‍යෙ

**වෛතාලිකෞ-** විජයතාං දෙවඃ.

5. දනන් රැකිමෙන් දරුවන් ලෙසින් නමින්
සොයා සිරි. හේ වෙහෙසින් විවෙකයක්
සරු හිජින්ද රළයේ ගිමින් තැවී
සොයා සිටින්නා මෙහි හැල් තැනක් සුවැ'ත්

( එළඹැ ) රජතුමා දිනේවා, දිනේවා ! හිමාලය අසල වනයෙහි වසන තවුසෝ කාශ්‍යප තවුසා ගෙන් ගඳුන කුත් ගෙනැ ගැහැණුන් ද කැටුවැ පැමිණ සිටිති. ඒ ගැන අසා දේවයෝ සුදුස්සක් කෙරෙත්වා.

**රජ**– ( ආදර සහිත වැ ) කිම, කාශ්‍යපයන් ගෙන් ගඳුන් ගෙනැ ආ තවුසෝ ද ?

**කඤ්චුකී**– අන් කිම ?

**රජ**– එසේ නම් මගේ වචනයෙන් සෝමරාත පුරෝහිතයාට දන්වන්නැ, මේ තවුසන් වෛදෙක්ත ක්‍රමයෙන් සම්මාන කොටැ තමා විසින් මැ මෙහි කැඳවා ගෙන ආ යුතු බැව්. මම ද මෙහි තවුසන් දක්මට උචිත තැනෙකැ නැවතී සිටිමි.

**කඤ්චුකී**– දේවයන් ගේ අණ ලෙසෙකි. ( නික්ම-යයි )

**රජ**– (නැගී සිටැ) වෙත්‍රවතිය, අග්නි ශාලාවට මග පෙන්වනු.

**පිළිහැරිය**– දේවයන් වහන්සේ මෙහෙන්, මෙහෙන්.

**රජ**– ( සිසාරා, තිල විඩාව නිරූපණය කොටැ ) හැම සත්වයා මැ රිසි දෙය ලබා සුවයට පැමිණෙයි. එහෙත් රජුන් ගේ පැමිණෙන ලද අභිලාෂවත් බව අතිශයින් දුක් පිණිස මැ වේ.

6 පැතූ සුව ලබන හැම රිසි යෙහි ඉව ත
පසුව එය මැ කෙලෙසනු සැබැවින් නිය ත
සිය අත දැරුව සේ සත් දඩු මෙන් සත ත
ඔහු සතු බලය වෙහෙසක් මිසැ නො දෙයි සෙ ත

( පසු බිම )

**වන්දිහු දෙදෙනා**– රජතුමා දිනේවා !

**ප්‍රථමඃ–**

7. ස්වසුඛ නිරභිලාෂඃ ඛිද්‍යසෙ ලොකහෙතොඃ
ප්‍රතිදිනමථවා තෙ වෘත්තිරේවං විධෛ'ව
අනුභවති හි මූර්ධ්නා පාදපස්තීව්‍රමුෂ්ණං
ශමයති පරිතාපං ඡායයා සංශ්‍රිතානාම්.

**ද්විතීයඃ–**

8. නියමයසි විමාර්ගප්‍රස්ථිතානාත්ත දණ්ඩඃ
ප්‍රශමයසි විවාදං කල්පසෙ රක්ෂණාය
අතනුෂු විභවෙෂු ඥාතයඃ සන්තු නාම
ත්වයි තු පරිසමාප්තං බන්ධුකෘත්‍යං ජනානාම්.

**රාජා–** එතෙ ක්ලාන්තමනසඃ පුනර්නවීකෘතා ස්මඃ,

(පරික්‍රාමති)

**ප්‍රතිහාරී–** එසො අහිණව සම්මජ්ජණ සස්සිරීඔ සණ්ණිහිද හොමධෙණූ අග්ගිසරණා'ලින්දෙ. ආරුහදු දෙවො. [ එෂ අභිනව සම්මාර්ජනසශ්‍රීකඃ සන්නිහිතහොමධෙනුරග්නිශරණා'ලින්දඃ. ආරොහතු දෙවඃ ]

**රාජා–** ( ආරුහ්‍ය පරිජනාංසා'වලම්බී තිෂ්ඨති ) වෙත්‍රවති, කිමුද්දිශ්‍ය භගවතා කාශ්‍යපෙන මත්සකාශමෘෂයඃ ප්‍රෙෂිතාඃ ස්යුඃ.

9. කිං තාවද් ව්‍රතිනාමුපොඪතපසාං විඝ්නෛස්තපො දූෂිතං
ධර්මා'රණ්‍යචරෙෂු කෙනචිදුත ප්‍රාණිෂ්ව'සච්චෙෂ්ටිතම්
ආහොස්විත් ප්‍රසවො මමා'පචරිතෛර් විෂ්ටම්භිතො වීරුධා
මිත්‍යා'රූඪබහුප්‍රතර්කපරිච්ඡෙද'කුලං මෙ මනඃ.

**ප්‍රතිහාරී–** සුචරිදණංදිණො ඉසීඔ; දෙවං සභාජිදුංආඅදෙ-ත්ති තක්කෙමි. [ සුචරිතනන්දින ඍෂයො දෙවං සභාජයිතුමාගත ඉති තර්කයාමි.]

( තතඃ ප්‍රවිශති ගෞතමී සහිතාඃ ශකුන්තලාං පුරස්කෘත්‍ය මුනයඃ පුරශ්චෛෂාං කඤ්චුකී, පුරොහිතශ්ච

**පළමු වැන්නා-**

7. ලොවට සුව සලස්වම් යැ යි තිනිත් දුක් විඳින්නේ
සුවය රිසි නො වීමෙන් නු මෙ සේ වූ පැවැත්මෙක්
උසුලමිනි හිසින් ගිම් රැස් කැකුල් රුක් පනින්ද
සෙවනිනැ'සුරන් ගේ දහයත් ලයි මුදලා

**දෙ වැන්නා-**

8. නො දමුණු අය නිත්තෙන් හික්මවාලා බෙලෙන් තුල්
ඔබ ලොව රැකු මේ සිත් ඇත් විවාදත් සිඳිමෙන්
සුව සැප වැඩි වූ කල්හී ඇනත් නැ කැලත් නෙක්
ඔබ වෙත පිරියත් වේ නැ කමේ'රුත් දනන් ගේ

**රජ-** මේ විඩා සිත් ඇති ( අපි ) යළි නව පණ ගන්වන ලද්දෝ වෙමු. ( සිසාරයි )

**පිළිහැරිය-** මේ නව හැමදීමෙන් ශොභන වූ, අසල බැඳි හොම ධෙනුව සිටින අග්නි ශාලාවේ ආලින්දය යි. දේවයන් වහන්සේ එහි නඟීවා.

**රජ-** ( නැඟී සේවකයකු ගේ උරහිසැ එල්බ සිටියි ) වෙත්‍රවතිය, කුමක් සඳහා භගවත් කාශ්‍යප විසින් මා වෙත තවුසෝ එවනු ලැබූ ද ?

9. කිම, කිම කෙලෙසීදෝ තවුසන් දළ තව උවදුරු වලි නි
නැත හොත්, තවවන සත්නට කිසිවකු ගෙන්
වරදක් කැරි නී
ගස් වැල් පල දූරුම ද අඩුවී දෝ මා ගේ වත් දෙසි නි
සැකයෙන් මා සිත කැළඹෙයි. හා එතරක්
නැති නැති සෙයි නි

**පිළිහැරිය-** ( ඔබ ගේ ) සච්චරිතයෙන් සතුටු වූ තවුසන් ඔබට ප්‍රසාදය පළ කිරීමට පැමිණියාහ යි හඟිමි.

( ඉක්බිති ගෞතමිය හා ශකුන්තලාත් පෙරටු කළ තවුසෝ ද, ඔවුනට පෙරටු වැ කඤ්චුකී හා පුරෝහිතයා ද පිවිසෙති )

**කඤ්චුකී**- ඉත ඉතො භවන්තඃ.

**ශාර්ඞ්ගරවඃ**- ශාරද්වත,

10. මහාභාගඃ කාමං නරපතිරභින්නස්ථිතිරසෞ
න කශ්චිද් වර්ණානාමපථමපකෘෂ්ටො'පි භජතෙ
තථා'පී'දං ශශ්වත්පරිචිත විවික්තෙන මනසා
ජනාකීර්ණං මන්‍යෙ හුතවහ පරීතං ගෘහමිව

**ශාරද්වතඃ**- ස්ථානෙ භවාන් පුරප්‍රවෙශාදිත්ථම්භූතඃ සංවෘත්තඃ. අහමපි,

11. අභ්‍යක්තමිව ස්නාතඃ ශුචිරශුචිමිව ප්‍රබුද්ධ ඉව සුප්තම්
බද්ධමිව ස්වෛරගතිර්ජනමිහ සුඛසංගින මවෛමි.

**ශකුන්තලා**- ( නිමිත්තං සූචයිත්වා ) අම්මහෙ ! කිං මෙ වාමෙදරං ණඅණං විප්ඵුරදි ? [ අහො ! මෙ වාමෙතරං නයනං විස්ඵුරති ? ]

**ගෞතමී**- ජාදෙ, පඩිහදං අමංගලං. සුහාඉං දෙ භත්තුකුලදෙවදාඔ විතරංදු. [ ජාතෙ, ප්‍රතිහතමමඞ්ගලම්. සුඛානි තෙ භර්තෘකුලදෙවතා විතරන්තු ]

( පරික්‍රාමන්ති )

**පුරොහිතඃ**- ( රාජානං නිර්දිශ්‍ය ) භො භොස්තපස්විනඃ, අසාව'ත්‍රභවාන් වර්ණා'ශ්‍රමාණාං රක්ෂිතා ප්‍රාගෙව මුක්තා'සනො වඃ ප්‍රතිපාලයති. පශ්‍යතෛ'නම්.

**ශාර්ඞ්ගරවඃ**- භො මහාබ්‍රාහ්මණ, කාමමෙතදභිනන්දනීයම්. තථා'පි වයමත්‍ර මධ්‍යස්ථාඃ. කුතඃ,

12. භවන්ති නම්‍රාස්තරවඃ ඵලා'ගමෛර්
නවා'ම්බුභිඃ දූරවිලම්බිනො ඝනාඃ
අනුද්ධතාඃ සත්පුරුෂාඃ සමෘද්ධිභිඃ
ස්වභාව එෂෛ'ව පරො'පකාරිණාම්

**කඤ්චුකී-** භවත්හු මෙහෙන්, මෙහෙන් ( වඩින්නැ )

**ශාර්ඞ්ගරව-** ශාරද්වත,

10. පින්වත් මෙ රද සල පැවැතුම් නැති අයෙ කි
සුදු රත් පවා නොමගෙහි නො යනු සැබැවෙ කි
එ නමුත් දන රුසැ'ති මේ තැන විවෙ කි
ම සිතට හැගේ ලෙස ගිනිගත් ගෙයක් ස කි

**ශාරද්වත-** සැබැවින් ඔබ නුවරට පිවිසි පැන් සිටැ මෙ බදු අමුත්තෙක් දිස් විය. මම ද,

11. නැවා තෙලින් ගෙම් ලෙසින් නිමලා මලැත් සේ
නින්දේ යෙදී සිටි ලෙසින් පිබිදි සිටියෙක්
බැම්මෙක්හි ලා සිටි ලෙසින් සිත සේ සරන්නෙක්
මේ නත්හි හුන් සුව ගැලී දන රුස් හගිමි දූන්

**ශකුන්තලා-** ( නිමිත්තක් අඟවා ) අනේ ! ඇයි මගේ මේ දකුණු ඇස නටන්නේ ?

**ගෞතමී-** දුව, අයහපත නැසේ වා. ඔබ හිමියා ගේ කුල දෙවියෝ ඔබට සෙත් වඩත්වා. ( සිසාරයි )

**පුරෝහිත-** (රජු දක්වා ) මේ, මේ නවුසෙනි, මෙහි වර්ණා-ශ්‍රමයන් රක්නා මෙ භවත් ( දේවයෝ ) පළමු කොට මැ අසුනෙන් නැගිටැ ඔබ ගැන පොරොත්තු වැ සිටිති. ඔහු බලනු මැනැවි.

**ශාර්ඞ්ගරව-** එම්බා මහ බමුණාණෙනි, සැබවි, මෙය ප්‍රශංසනීය යි. අපි මෙහි දී මැදහත් වෙමු. කෙසේ ද ?

12. නැමී සිටින්නේ පලගත් හෙයින් තුරුත්
අළුත් දියෙන් එල්බැ සිටියි දුරින් වලා
දපක් නො දක්වත් සුදනෝ මහත් සිරින්
පරෝපකාරී සිරිතුත් මෙ සේ මැ වේ.

**පඩිහාරී**– දෙව, පසණ්ණමුහවණ්ණා දීසංති, ජාණාමි විස්සද්ධකජ්ජා ඉසීඔ. [ දෙව ප්‍රසන්නමුඛවර්ණා දෘශ්‍යන්තෙ. ජානාමි විස්‍රබ්ධකාර්‍ය්‍යා ඍෂයඃ.]

**රාජා**– ( ශකුන්තලං දෘෂ්ට්වා ) අථා'ත්‍ර භවති.

13. කා ස්විදවගුණ්ඨනවතී නා'තිපරිස්ඵුට ශරීර ලාවණ්‍යා
මධ්‍යෙ තපොධනානාං කිසලයමිව පාණ්ඩුපත්‍රාණාම්.

**පඩිහාරී**– දෙව, කුතුහලගබ්භො ණ මෙ තක්කො පසරදි. ණං දංසණීආ උණ සෙ ආකිදෙ ලක්ඛීඅදි. [ දෙව කුතූහලගර්භො න මෙ තර්කඃ ප්‍රසරති. නනු දර්ශනීයා පුනරස්‍යා ආකෘතිර් ලක්ෂ්‍යතෙ. ]

**රාජා**– භවතු, අනිර්වර්ණනීයං පරකලත්‍රම්.

**ශකුන්තලා**– (හස්තමුරසි කෘත්වා ආත්මගතම් ) හිඅඅ, කිං එව්වං වෙවසි, අජ්ජඋත්තස්ස භාවං ඔහාරිඅ ධීරං දාව හොහි. [ හෘදය, කිමෙවං වෙපසෙ ? ආර්‍ය්‍යපුත්‍රස්‍ය භාවමවධාර්‍ය්‍ය ධීරං තාවද් භව. ]

**පුරොහිතඃ**– (පුරොගත්වා) එතෙ විධිවදර්චිතාස් තපස්විනඃ කශ්චිදෙෂාමුපාධ්‍යාය සන්දෙශඃ, තං දෙවඃ ශ්‍රොතුමර්හති

**රාජා**– අවහිතො'ස්මි,

**ශාර්ඞ්ගරවඃ**– (හස්තමුද්‍යම්‍ය) විජයස්ව රාජන්.

**රාජා**– සර්වානභිවාදයෙ,
**ශාර්ඞ්ගරවඃ**– ඉෂ්ටෙන යුජ්‍යස්ව.
**රාජා**– අපි නිර්විඝ්න තපසො මුනයඃ?

**ශාර්ඞ්ගරවඃ**–

14. කුතො ධර්මක්‍රියා විඝ්නඃ සතාං රක්ෂිතරි ත්වයි
තමස්තපති ඝර්මාංශෞ කථමාවිර් භවිෂ්‍යති.

**පිළිහැරිය–** දේවයෙනි, ( තවුසන් කෙරෙහි ) ප්‍රසන්න මුඛ ශොභා ඇති බව පෙනේ. සෑෂින් පිළිබඳ වැ විස්වස් කටයුත්තක් ඇතැයි හඟිමි.

**රජ–** ( ශකුන්තලා දැකැ ) ඉතින් මේ කාන්තාව–

13. තවුස් දන'තර සිටින මැ කවරියක මුව වැසුමක් දරා
ඉදුණු පත් මැද ළපලුවක් මෙන් නොපළ
සිරුරැති පැහැසරා

**පිළිහැරිය–** දේවයෙනි, කුහුළින් පිරි මට කෙ සේ වත් තර්කණය කළ නො හැකි. නමුත් සැබැවින් ඇගේ ස්වරූපය නම් දර්ශනීය බැව් පෙනේ.

**රජ–** වේවා. අන් බිරියන් නොවැනියැ යුතු යි.

**ශකුන්තලා–** ( අතක් ළයේ තබා තමාට මැ ) හෘදය, කිම, මෙසේ සැලෙන්නේ ? ස්වාමි පුත්‍රයා ගේ ( පූර්ව ) ස්නෙහය මෙනෙහි කොටැ දිරිමත් වෙව.

**පුරෝහිත–** ( පෙරට ගොස් ) මේ, විදි ලෙසින් පිදූ තවුසෝ. මොවුන් ගේ ගුරුන් ගෙන් කිසි සන්දේශයෙකි. එය දේවයන් වහන්සේට ඇසීම සුදුසු වෙයි.

**රජ–** සවන් දෙමි.

**තවුසෝ–** ( අත් ඔසොවා ) රජතුමා දිනේවා !

**රජ–** සියල්ලන් වඳිමි.

**තවුසෝ–** අභිමතාර්ථයෙන් යුතු වේවා

**රජ–** මුනිහු උවදුරු රහිත තපස් ඇත්තෝ ද ?

**තවුසෝ–**

14. කොසින් දහම් කමැ උවදුරු ඔබ වැනි සුදනන් රජය ත
ගිම් රැස් නුබැ දිලෙතැ අඳුරු කෙසේ
පහල වෙද මෙ දියත

**රාජා**– අනීවාන් බලු මෙ රාජශබ්දඃ. අථ භගවාන් ලොකානුග්‍රහාය කුශලී කාශ්‍යපඃ?

**ශාර්ඞ්ගරවඃ**– ස්වාධීන කුශලාඃ සිද්ධිමන්තඃ. ස භවන්ත-මනාමය ප්‍රශ්න පූර්වකමිදමාහ.

**රාජා**– කිමාඥාපයති භගවාන් ?

**ශාර්ඞ්ගරවඃ**– යන්මිථඃ සමයාදිමාං මදීයාං දුහිතරං භවානුපායංස්ත. තන්මයා ප්‍රීතිමතා යුවයොරනුඥාතම්. කුතඃ,

15 ත්වමර්හතාං ප්‍රාග්‍රසරඃ ස්මෘතො'සි නඃ
ශකුන්තලා මූර්තිමතී ච සත්ක්‍රියා
සමානයංස්තුල්‍යගුණං වධූවරං
චිරස්‍ය වාච්‍යං න ගතඃ ප්‍රජාපතිඃ

තදිදානීමාපන්නසත්වා ප්‍රතිගෘහ්‍යතාං සහධර්මචරණායෙ'ති.

**ගෞතමී**– අජ්ජ, කිං පි වත්තුකාම ම්හි. ණ මෙ වඅණො'-වසරො අත්ථි. කහං ති, [ආර්‍ය, කිම පි වක්තුකාමාස්මි. න මෙ වචනා'වසරො'ස්ති. කථමිති,

16 ණාවෙක්ඛිදො ගුරුඅණො ඉමාඉ ණ තුඑ වි පුච්ඡිදො බංධූ
එක්කක්කස්ස අ චරිඑ කිං භණදු එක්කො එක්කස්ස.

[නාපෙක්ෂිතො ගුරුජනො'නයා න ත්වයා'පි පෘෂ්ටො බන්ධුඃ
එකෛකස්‍ය ච චරිතෙ කිං භණතෙ'ක එකස්‍ය.]

**ශකුන්තලා**– (ආත්මගතම්) කිං ණු ක්ඛු අජ්ජඋත්තො භණාදි. [කිං නු බල්වා'සී පුත්‍රඃ භණති.]

**රාජා**– කිමිදමුපන්‍යස්තම්?

**ශකුන්තලා**– (ආත්මගතම්) පාවඔ ක්ඛු වඅණොවණ්ණාසො. [පාවකඃ බලු වචනො'පන්‍යාසඃ.]

**ශාර්ඞ්ගරවඃ**– කථමිදං නාම? භවන්ත එව සුතරාං ලොක-වෘත්තාන්ත නිෂ්ණාතාඃ

**රජ**– ම ගේ ‘ රජ ’ නාමය අඩීවත් යැ. ඉදින් කාශ්‍යප භගවත්හු ලොවට වැඩ පිණිස සුව යේ වෙසෙත් ද ?

**ශාර්ඞගරව**– චිත්ත වසීහු තිවහල් සුව ඇත්තෝ යැ. ඔහු, ඔබ ගේ තිදුක් බව පිළිසුම් පූජිත වැ මෙය (ඔබට දන්වන්නට ) කිහ.

**රජ**– භගවත් තෙමේ කුමක් අණවා ද ?

**ශාර්ඞගරව**– අන්‍යෝන්‍ය එකඟතාවයෙන් මේ මගේ දුව ඔබ සරණ කළාහු යැ. ඔබ දෙපොල කෙරෙහි සොම්නස් වනු මා විසින් එය පිළිගන්නා ලදී. කෙ සේ ද ?

15. පිදුම් ලබන්නන් අතරේ පදන් ඔබත්
සකුන්තලාවත් සුසිරිත් පිඩක් මැ වූ
සමාන වූ මේ බරුවන් බිරින්ද හා
යොද, බඹන් ලත් කලෙකින් නිදෙස් බවක්.

එ හෙයින් ගැබි ගත් මැ සහධර්මචාරිණිය පිණිස දූන් පිළිගනු මැනැවි. යනු යි.

**ගෞතමී**– ආර්‍යය, මම ද කිසිවක් කියනු කැමැත්තෙමි. කෙසේවත් ම ගේ වචනයට අවසරයෙක් නැති සේ පෙනේ. කෙ සේ ද යත්,

16. මැ ගුරු නො සැලැ කී
ඔබ නෑයනට නො මැ කී
තනි තනි වැ කළ කී
දූයට තවකකු කුමක් කියැ කී

**ශකුන්තලා**– ( තමාට මැ) සැබැවින් ම-හිමියා කුමක් කියා ද ?

**රජ**– මේ කිමෙක් ද මා වෙත එළඹුනේ ?

**ශකුන්තලා**– ( තමාට මැ ) සැබැවින් පිටවූයේ වචන ද, ගිනි ද ?

**ශාර්ඞගරව**– මේ කිමෙක් ද ? ඔබ මැ ලොක සවභාවය මැනැවින් දනිති,

17 සතීමපි ඥාතිකුලෛ'ක සංශ්‍රයාං
ජනෝ'න්‍යථා භර්තෘමතීං විශඞ්කතෙ
අතඃ සමීපෙ පරිණෙතුරිෂ්‍යතෙ
තදප්‍රියා'පි ප්‍රමදා ස්වබන්ධුභිඃ

**රාජා–** කිඤ්චා'ත්‍ර භවතී මයා පරිණීතපූර්වා?

**ශකුන්තලා–** (සවිෂාදම්-ආත්මගතම්) හිඅඅ, සංපදං දෙ ආසංකා [හෘදය සම්ප්‍රතං ත ආශඞ්කා.]

**ශාර්ඞ්ගරවඃ–**

18 කිං කෘතකාර්‍යද්වෙෂො ධර්මං ප්‍රති විමුඛතා කෘතා'වඥා

**රාජා–** කුතොයමසත්කල්පනා ප්‍රශ්නඃ?

**ශාර්ඞ්ගරවඃ–**

18 මූර්ඡන්ත්‍යමී විකාරාඃ ප්‍රායෙණෛශ්වර්‍යමත්තෙෂු.

**රාජා–** විශෙෂෙණා'ධික්ෂිප්තො'ස්මි.

**ගෞතමී–** ජාදෙ. මුහුත්තඅං මා ලජ්ජ, අවණඉස්සං දාව දෙ ඔඋණ්ඨණං තදො තුමං භට්ටා අහිජාණිස්සදි. [ජාතෙ, මුහූර්තං මා ලජ්ජස්ව. අපනෙෂ්‍යාමි තාවත් තෙ'වගුණ්ඨනං තතස්ත්වාං භර්තා'භිඥාස්‍යති]

(යථොක්තං කරොති)

**රාජා–** (ශකුන්තලාං නිර්වර්ණ්‍ය, ආත්මගතම්)

19 ඉදමුපනතමෙවං රූපමක්ලිෂ්ටකාන්ති
ප්‍රථම පරිගෘහීතං ස්‍යාන්නවෙ'ත්‍ය'ව්‍යවස්‍යන්
භ්‍රමර ඉව විභාතෙ කුන්දමන්තස්තුෂාරං
න ඛලු සපදි භොක්තුං නෛ'ව ශක්නොමි හාතුම්

(විචාරයන් ස්ථිතඃ)

17. සතී ගුණැ'ත් මුත් සිය ගේ මිදුම් ලැබූ
සැකත් කෙරෙත් නූ දනතා පිටා ලදත්
එයින් යවත් මැ යි සිය නැ දනෝ පමා
නො රිස්සතත් ඈ හිමියා වෙතේ වහා

**රජ-** කිම, මා විසින් මෝ පෙර ආවාහ කළ විරූ ද ?

**ශකුන්තලා-** ( දුකින් තමාට මැ ) හෘදය, සැකය හරි.

**ශාර්ඞ්ගරව-**

18. කිම තම කිරිය ගැන කොව පළ කළ යුතු ද ?
කිම යුතුකම මෙය ද, කළ අවමන කිම ද ?

**රජ-** මොනවද, මේ වැරැදි හැඟුමෙන් නගන ප්‍රශ්න ?

**ශාර්ඞ්ගරව-**

18. හැ ම මිනිසකු තුලැ මැ ඉසුරෙන් දැපුණු න ද
නොම දින් වියරු දිස් වෙයි සැබැවින් මෙලෙ ද

**රජ-** වෙසෙසින් නින්ද ලද්දේ වෙමි.

**ගෞතමී-** දුව, මොහොතකට ලජ්ජා නො වන්න. දූන් ඔබ ගේ ශිරෝවරණය ඉවත් කරමි. එ විටැ හිමියා හඳුනා ගනීවි.

( කී ලෙස කරයි )

**රජ-** ( ශකුන්තලා මොහොතක් පිරික්සා, තමාට මැ )

19. මෙ ලෙස වෙත වඩා ලූ මේ නිමල් රුපයත් දුල්
කළ නො කළ බවක් නැතැ හැඟුම් මැ විවාපත්
පුබුදු කොඳ මලක් ගැබ් වූ හිමෙන් බොල් පහන්හි
නො කළ හැකි හැරීමක් හෝ විඳීමක් බිඟුන් මෙන්

( මෙනෙහි කරමින් සිටී )

**ප්‍රතීහාරී**- (ස්වගතම්) අහො! ධම්මා'වෙක්ඛිදා භට්ටිණො. ඊදිසං ණාම සුහොවණදං රූවං දෙක්ඛිඅ කො අණ්ණො විආරෙදි. [අහො! ධර්මා'පෙක්ෂිතා භර්තුඃ. ඊදෘශං නාම සුඛො'පනතං රූපං දෘෂ්ට්වා කො'න්‍යො විචාරයති]

**ශාර්ඞ්ගරවඃ**- භො රාජන්, කිමිති ජොෂමාස්‍යතෙ?

**රාජා**- භොස්තපොධනාඃ, චින්තයන්න'පි න ඛලු ස්වීකරණ මත්‍ර භවත්‍යාඃ ස්මරාමි, තත් කථමිමාමභිව්‍යක්තසත්ව -ලක්ෂණාං ප්‍රත්‍යා'ත්මානං ක්ෂෙත්‍රිණමා'ශඞ්කමානඃ ප්‍රතිපත්ස්‍යෙ.

**ශකුන්තලා**- (අපවාර්‍ය) අජ්ජස්ස පරිණඑ එව්ව සංදෙහො. කුදෙ දාණිං මෙ දූරාහිරොහිණී ආසා? [ආර්‍යස්‍ය පරිණය එව සන්දෙහඃ. කුත ඉදානීං මෙ දූරාධිරොහිණ්‍යා'ශා?]

**ශාර්ඞ්ගරවඃ**- මා තාවත්,

20 කෘතා'භිමර්ශාමනුමන්‍යමානඃ
සුතාං ත්වයා නාම මුනිර් විමාන්‍යඃ
මුෂ්ටං ප්‍රතිග්‍රාහයතා ස්වමර්ථං
පාත්‍රීකෘතො දස්‍යුරිවා'සි යෙන

**ශාරද්වතඃ**- ශාර්ඞ්ගරව, විරම ත්වමිදානීම්. ශකුන්තලෙ වක්තව්‍යමුක්තමස්මාභිඃ. සොයමත්‍ර භවානෙවමාහ, දීය-තාමස්මෛ ප්‍රත්‍යය ප්‍රතිවචනම්.

**ශකුන්තලා**- (අපවාර්‍ය) ඉමං අවත්ථංතරං ගදෙ තාරිසෙ අණුරාඑ කිං වා සුමරාවිදෙණ? අත්තා දාණිං මෙ සො-අණීඔ ත්ති වවසිදං එදං. (ප්‍රකාශම්) අජ්ජ උත්ත...... (අර්ධො'ක්තෙ) සංසඉදෙ දාණිං පරිණඑ ණ එසො සමුදආරෙ. පොරව, ජුත්තං ණාම දෙ තහ පුරා අස්සමපදෙ සහාවුත්තාණහිඅඅං ඉමං ජණං සමඅපුව්වං පතාරිඅ සංපදං ඊදිසෙහිං අක්ඛරෙහිං පච්චාචක්ඛිදුං, [ඉදමවස්ථා'න්තරං ගතෙ තාදෘශෙ'නුරාගෙ කිං වා ස්මාරිතෙන? ආත්මෙදානීං මෙ ශොචනීය ඉති ව්‍යවසිතමෙතත්. ආර්‍යපුත්‍ර, (අර්ධොක්තෙ) සංශයිතමිදානීං පරිණයෙ නෛෂ සමුදාචාරඃ. පෞරව, න යුක්තං නාම තෙ තථා පුරා'ශ්‍රමපදෙ ස්වභාවො'ත්තානහෘදයමිමං ජනං සමයපූර්වං ප්‍රතාර්‍ය සාම්ප්‍රතමීදෘශෛරක්ෂරෛඃ ප්‍රත්‍යාචෂ්ටුම්.]

**පිළිහැරිය**– ( තමාට මැ ) අනේ, සවාමීන් ගේ දූහැමි බව. මෙ වැනි නිරායාසයෙන් එළඹි රුවක් දූකැ අන් කවරකු පිමසත් ද ?

**ශාර්ඞගරව**– එම්බා රජතුමිනි, ඇයි, නිගඬ වැ සිටින්නේ ?

**රජ**– එම්බා තවුසෙනි, සැබැවින් සිතන නමුත් මැය පාවා ගත් බවක් සිහි නො කරමි. කෙසේ වුවත් පැහැදිලි ගැබ් ලකුණු ඇති මැය, ( නමින් පමණක් ) හිමියා සී සැක කරනු ලබන මම කෙ සේ පිළිගනිම් ද ?

**ශකුන්තලා**– ( වලකා ) ආසීයනට ඇත්තේ විවාහය මැ පිළිබඳ සැකය යි. ( නමුත් ) කොතන්හිද දූන් ඉහළට මැ නැඟුණු මගේ බලාපොරොත්තු ?

**ශාර්ඞගරව**– සැබැවින් එපා ( ඇය පිළිගන්නැ )

20. බලයෙන් කිළිටි කළ දුව පිළිබඳ ඔබ ට  
අනුමත දෙවන කුලපති නිගණේ කුම ට  
සොරකම් කළ තමා දන යළි දී ඔහු ට  
තවුසිඳු කෙරෙයි ඔබ සොර දසකු මැ නිව ට

**ශාරද්වත**– ශාර්ඞගරව, ඔබ දූන් නවත්වන්නැ. ශකුන්තලා වෙනි, අප විසින් කියැ යුතු දූ කියන ලදී. මෙහි ලා රජු මෙසේ කියයි. මොහුට සුදුසු පිළි වදන් දෙන්නැ.

**ශකුන්තලා**– ( වලකා ) මෙ බඳු විපරීත බවකට ගිය එ බඳු ආලයක් ගැන සිහි කැරැවීමෙන් ඇති ඵලය කිම ? දූන් මගේ ආත්මය ගැනැ සොවියැ යුතු යැ යනු නිශ්චිත යි. ( ශබ්ද නඟා) සවාමි පුත්‍රයාණෙනි, (අඩක් නි කලැ) දූන් විවාහයෙහි සැක ඇති හෙයින් මේ ඇමතීම සුදුසු නො වේ. පෞරවය, පෙර අසපුවෙහි සවභාවයෙන් කපට නො වූ මේ අය පොරොන්දුවකින් පසු රවටා දූන් මෙ බඳු වචනවලින් ප්‍රතික්ෂෙප කිරීම ඔබට සුදුසු ද ?

**රාජා-** (කර්ණෞපිධාය) ශාන්තං පාපම්.

21 ව්‍යපදෙශමාවිලයිතුං කිමීහසෙ ජනමිමං ච පාතයිතුම්
කූලංකෂෙ'ව සින්ධුඃ ප්‍රසන්නමම්භස්තටතරුඤ්ච.

**ශකුන්තලා-** හොදු, ජඉ පරමත්ථතො පරපරිග්ගහසංකිණා තුඑ එව්වං පඋත්තං, තා අහිණ්ණාණෙණ ඉමිණා තුඑ ආසංකං අවණඉස්සං [භවතු, යදි පරමාර්ථතඃ පරපරිග්‍රහශඞ්කිනා ත්වයෛ'වං ප්‍රවෘත්තං තදභිඥානෙනා'නෙන තවා'ශඞ්කාමපනෙෂ්‍යාමි.]

**රාජා-** උදාරඃ කල්පඃ.

**ශකුන්තලා-** (මුද්‍රාස්ථානං පරාමෘශ්‍ය) හද්ධී! හද්ධී! අංගුලීඅඅ සුණ්ණා මෙ අංගුලී. [හා ධික්! හා ධික්! අඞ්ගුලීයකශූන්‍යා මෙ අඞ්ගුලීඃ]

(සවිෂාදම් ගෞතමී මුඛමවෙක්ෂතෙ)

**ගෞතමි—** ණූණං දෙ සක්කාවදාරබ්භන්තරෙ සචීතිත්ථසලිලං වංදමාණාඑ පබ්භට්ඨං අංගුලීඅඅං [නූනං තෙ ශක්‍රා'වතාරාභ්‍යන්තරෙ ශචීතීර්ථසලිලං වන්දමානායාඃ ප්‍රභ්‍රෂ්ටමඞ්ගුලීයකම්]

**රාජා-** (සස්මිතම්) ඉදං තද් ප්‍රත්‍යුත්පන්නමති ස්ත්‍රෛණමිති යදුච්‍යතෙ.

**ශකුන්තලා-** එත්ථ දාව විහිණා දංසිදං පහුත්තණං අවරං දෙ කහිස්සං. [අත්‍ර තාවත් විධිනා දර්ශිතං ප්‍රභුත්වම්, අපරං තෙ කථයිෂ්‍යාමි.]

**රජා-** ශ්‍රොතව්‍යමිදානීං සංවෘත්තම්.

**රජ**– ( දෙකන් වසා ) පව් නැසේ වා.

21. දෙ ගොඩ තලන කැලැඹු අවට පැහැදි දියද ඉවුරු තුරු ද
කඩන හෙළන නදිය ලෙසට කුමට යතනු නසනු මොහු ද

**ශකුන්තලා**– වේවා, සැබැවින් මා අන් අයකු ගේ බිරිද යැ යි සැක කොටැ ඔබ විසින් මෙ සේ පිළිපදී නම් මේ සිහිවටනයෙන් ඔබේ සැක පසිඳලමි.

**රජ**– උදාර කල්පනාවෙකි.

**ශකුන්තලා**– ( මුද්ද තිබුණු තැන පිරිමැද ) අහෝ ! අහෝ ! මගේ ඇඟිල්ලේ මුද්ද නො වේ.

( දුකින් ගෞතමිය ගේ මුහුණ බලයි )

**ගෞතමී**– ශක්‍රාවතාරයෙහි වූ සචී තීර්ථයෙහි දිය පුදන විටැ ඔබ ගේ මුදුව ඒකාන්තයෙන් එහි ගිලිහෙන්නට ඇති.

**රජ**– ( සිනා සහිත වැ ) ස්ත්‍රීහු අවස්ථාවෝචිත කපටි අය යැයි යමක් කියනු ලැබේ ද, මෙයත් එබන්දෙකි.

**ශකුන්තලා**– මෙහි ලා සැබැවින් දෛවය සිය ඓශ්වර්යය දැක්විය. තව කාරණයක් ඔබට කියමි.

**රජ**– දැනු දු ඇසියැ යුතු දෙයක් පැමිණියා.

**ශකුන්තලා**– ණං එක්කස්සිං දිඅහෙ වෙදසලදාමංඩවෙ ණලිණීපත්තභාඅණගදං උඅඅං තුහ හත්ථෙ සණ්ණිහිදං ආසි? [ නන්වේ'කස්මින් දිවසෙ වෙතස ලතා මණ්ඩපෙ නලිනීපත්‍රභාජනගතමුදකං තව හස්තෙ සන්නිහිතමාසීත්?]

**රාජා**– ශ්‍රෘණුමස්තාවත්.

**ශකුන්තලා**– තක්ඛණං සො මෙ පුත්තකිදඔ දීහාපංගො ණාම මිඅපොදඔ උවට්ඨිදො, තුඑ අඅං දාව පඪමං පිඅදු ත්ති අණුඅංපිණා උවච්ඡංදිදො උඅඑණ. ණ උණ දෙ අපරිචඅාදො හත්ථබ්භාසං උවගදො පච්ඡා තස්සිං එව්ව. මඑ ගහිදෙ සලිලෙ ණෙණ කිදො පණඔංතදා තුමං ඉත්ථං පහසිදොසි. " සව්වො සගංධෙසු විස්සසිදි. දුවෙ වි තුම්හෙ අරණ්ණඅා " ත්ති. [ තත්ක්ෂණං ස මෙ පුත්‍රකෘතකො– දීර්ඝා'පාඞ්ගො නාම මෘගපොතක උපස්ථිතඃ. ත්වයා'යං තාවත් ප්‍රථමං පිබත්ත්විත්‍ය'නුකම්පිනො'පච්ඡන්දිත උදකෙන, න පුනරෙන'පරිචයාද්ධස්තාභ්‍යාසමුපගතඃ. පශ්චාත් තස්මින්නෙව මයා ගෘහීතෙ සලිලෙ'නෙන කෘතඃ ප්‍රණයඃ. තදා ත්වමිත්ථමුපහසිතො'සි. " සර්වඃ සගන්ධෙෂු විශ්වසිති. ද්වාවපි යුවමාරණ්‍යකාවි " ති ]

**රාජා**– එවමාදිභිරාත්මකාර්‍ය නිර්වර්තිනීනාමනෘතමයවාඞ්මධුභිරාකෘෂ්‍යනෙත විෂයිණඃ.

**ගෞතමී**– මහාභාඅ, ණ අරුහසි එව්වං මංතිදුං, තවොවණ සංවඩ්ඪිදො අණභිණ්ණො අඅං ජණො කඉදවස්ස. [ මහාභාග, නාර්හස්‍යෙ'වං මන්ත්‍රයිතුම්, තපොවන සං– වර්ධිතො'නභිඥෙ'යං ජනඃ කෛතවස්‍ය. ]

**රාජා**– තාපසවෘද්ධෙ,

22. ස්ත්‍රීණාමශික්ෂිත පටුත්වමමානුෂීෂු
සංදෘශ්‍යතෙ කිමුත යාඃ ප්‍රතිබොධවත්‍යඃ
ප්‍රාගන්තරීක්ෂ ගමනාත් ස්වමපත්‍ය ජාත–
මන්‍යෛර් ද්විජෛඃ පරභෘතාඃ ඛලු පොෂයන්ති.

**ශකුන්තලා**– එක් දිනෙකැ වේවැල් ගොමුවේ නෙලුම් කොළ ගොටුවකින් ගත් දිය ඔබ අතැ තිබුනා නො වේ ද?

**රජ**– සැබැවින් සවන් දෙමු.

**ශකුන්තලා**– එ කෙණෙහි මගේ පුතකු මෙන් වැඩූ දීර්ඝාපාඞ්ග නම් ඒ මුව පොව්වා එළඹියා. ඔබ විසින් මොහු පළමුව පානය කෙරෙත්වා යි අනුකම්පාවෙන් ළං කළ දිය ඇතිවත් ඔබ හා නො ලද පුරුදුකම් ඇති හෙයින් ඌ ඔබ වෙත ළං නො වී යැ. පසු වැ එය මැ මවිසින් ගත් කල ඌ එයට ප්‍රිය කළා. එ කලැ ඔබ මෙ සේ විහිළු කළා. "සියල්ලෝ සමාන ගඳැ'තියන් කෙරෙහි ප්‍රිය වෙති, ඔය දෙන්නා මැ කැලෑ සත්තු යැ''යි කියා.

**රජ**– මේ ආදි විසින් ස්වකාර්ය සාඵල්‍යයෙහි තත්පර වූ තැනැත්තියෝ වතාහි බොරුවෙන් ගෙතුණු මිහිරි වදනින් කාමුකයන් වෙත අදිති.

**ගෞතමිය**– මහා පිතැත්ත, මෙ සේ කිම ඔබට සුදුසු නො වේ. තවුස් අසපුවේ වැඩුණු මේ තැනැත්තී කපටිකම් නොදන්නියකි.

**රජ**– තවුස් මැහැල්ල,

22 පුහුණු නො ලද අඳ බල තිරිසන් කත ද
කපට කමින් අගපත් විටැ නුවණ ල ද
මිනිස් කතුන් ගැන බෙහෙවින් කියැ යුතු ද
අන් දද ලවා රක්වයි දරු කෙවිලිය ද

ශකුන්තලා– ( සරොෂම් ) අණජ්ජ, අත්තණො හිඅආණු-
මාණෙණ පෙක්ඛසි. කො දාණිං අණ්ණො ධම්මකංචු-
අප්පවෙසිණො තිණච්ඡණ්ණ කූවොවමස්ස තව අණුකිදිං
පඩිවජ්ජිස්සදි ? [ අනාර්‍ය්‍යෙ, ආත්මනො හෘදයා'නුමානෙන
පශ්‍යසි. ක ඉදානීමන්‍යො ධර්මකඤ්චුක ප්‍රවෙශිනස්තෘ-
ණච්ඡන්න කූපො'පමස්‍ය තවා'නුකෘතිං ප්‍රතිපත්ස්‍යතෙ ? ]

රාජා– ( ආත්මගතම් ) සංදිග්ධබුද්ධිං මාං කුර්වන්නකෛතව
ඉවා'ස්‍යාඃ කොපො ලක්ෂ්‍යතෙ. තථා හ්‍ය'නයා–

23. මය්‍යෙ'ව විස්මරණ දාරුණ චිත්තවෘත්තෞ
වෘත්තං රහඃ ප්‍රණයමප්‍රතිපද්‍යමානෙ
භෙදාද් භ්‍රැවොඃ කුටිලයො රති ලොහිතා'ක්ෂ්‍යා
භග්නං ශරාසනමිවා'තිරුෂා ස්මරස්‍ය.

( සප්‍රකාශම් ) භද්‍රෙ, ප්‍රථිතං දුෂ්‍යන්තස්‍ය චරිතම්.
අථා'පී'දං න ලක්ෂ්‍යතෙ.

ශකුන්තලා– සුට්ඨු දාව අත්ත සච්ඡංදචාරිණී කිද ම්හි.
ජා අහං ඉමස්ස පුරුවංසප්පච්චඑන මුහමහුණො හිඅඅ-
විසස්ස හත්ථබ්භාසං උවගදා. [ සුෂ්ඨු තාවදත්‍ර ස්වච්ඡන්ද-
චාරිණී කෘතා'ස්මි. යා'හම'ස්‍ය පුරුවංශප්‍රත්‍යයෙන-
මුඛමධොර් හෘදයවිෂස්‍ය හස්තාභ්‍යාසමුපගතා. ] (පටා-
න්තෙන මුඛමාවෘත්‍ය රොදිති. )

ශාර්ඞ්ගරවඃ– ඉත්ථමාත්මකෘතමප්‍රතිහතං චාපලං දහති.

24. අතඃ පරීක්ෂ්‍ය කර්තව්‍යං විශෙෂාත් සංගතං රහඃ
අඥාත හෘදයෙෂ්වෙවං වෛරී භවති සෞහෘදම්.

රාජා– අයි ! භොඃ. කිමත්‍ර භවතී ප්‍රත්‍යයාදෙවා'ස්මාන්
සංයුත දොෂාක්ෂරෛඃ ක්ෂිණුථ ?

ශාර්ඞ්ගරවඃ– ( සා'සූයම් ) ශ්‍රැතං භවද්භිරධරො'ත්තරම්.

**ශකුන්තලා**– (කෝපයෙන්) නීචය, තමා ගේ සිතේ මිම්මෙන් අනුනුත් මනින්නෙහි ද? දැහැමි බවේ සලකුණ වන ලෝගුව තුලට වැද, තණින් වැසුණු තරාවලක් මැනි ඔබ අනුගමනය කරන්නට දූන් කවරෙක් සිතත් ද?

**රජ**– (තමාට මැ) කෛරාපික නො වූ එකියක ගේ මෙන් ඇගේ කෝපය සැකයෙහි බැස ගත් කල්පනා ඇති මට එල්ල කරනු පෙනේ. මැ විසින් වනාහි,

23· වෙත්හි මැ විස්මරණයෙන් රළු වූ සිතැත් මා
දුක්මෙන් මගේ පිළිකෙවුම් නො තැකූ පෙමින් යුත්
රත් වූ නෙතින් දරුණු වූ ඇය කෝප ගින්නෙන්
බින්දේ මැ නු සි අනඟ දුන්න ද වක් බැමින් ඒ.

(ශබ්ද නභා) හද්‍රාවෙනි, දුෂ්‍යන්‍ත ගේ චරිතය ප්‍රකට සි. එහෙත් මෙහිලා එය නො පෙනේ.

**ශකුන්තලා**– ඉතා මැනැවි. මම මෙහි දී වේසියක් කරනු ලැබීමි. යම් බඳු මම පුරුවංශයෙහි තැබූ විස්වස් බව නිසා මූවෙහි මී ඇති හදෙහි විෂ ඇති මොහු අතට පැමිණියා වෙමි. (රෙදි කොණින් මූහුණ වසා හඬ යි)

**ශාර්ඞ්ගරව**– මෙ සේ තමා කළ මූරණ්ඩුකම බාධා රහිත වූයේ දවයි.

24 පුම ඉතිරි දෙ පසෙහි—වෙසෙසින් රහස් එක්වුම
පිරික්සා කටයුතු—නැත, එය මැ විරුද්‍ව එයි

**රජ**– අපොයි, අනේ! මෙහි දී මේ තැනැත්තිය පමණක් විශ්වාස කොට, ඇයි අපට දෙෂාරොපිත වචනයන් ගෙන් පහර දෙන්නේ?

**ශාර්ඞ්ගරව**– (පරිභව සහිත වැ) ඔබ විසින් දූන් හීන පිළිතුරු ඇසුවා නො වේ ද?

25. ආජන්මනඃ ශාඨ්‍යමශික්ෂිතො යස්
තස්‍යා ප්‍රමාණං වචනං ජනස්‍ය
පරා'තිසන්ධානමධීයතෙ යෛර්
විද්‍යෙ'ති තෙ සන්තු කිලා'ප්තවාචඃ.

**රාජා**– භොඃ සත්‍යවාදින්, අභ්‍යු'පගතං තාවදස්මාභිරෙවං. කිං පුනරිමාමතිසන්ධාය ලභ්‍යතෙ.

**ශාර්ඞ්ගරවඃ**– විනිපාතඃ.

**රාජා**– විනිපාතඃ පෞරවෛඃ ප්‍රාර්ථ්‍යත ඉති න ශ්‍රද්ධෙයම්

**ශාරද්වතඃ**– ශාර්ඞ්ගරව, කිමුත්තරෙණ. අනුෂ්ඨිතො ගුරුඃ සන්දෙශඃ. ප්‍රතිනිවර්තාමහෙ වයම්. ( රාජානං ප්‍රති )

26. තදෙෂා භවතඃ පත්නි ත්‍යජ වෛනාං ගෘහාණ වා.
උපපන්නා හි දරෙෂු ප්‍රභුතා.සර්වතො මුඛී.

ගෞතමි, ගච්ඡා'ග්‍රතඃ. ( ප්‍රස්ථිතාඃ )

**ශකුන්තලා**– කහං ඉමිණා කිදවෙණ විප්පලද්ධ ම්හි. තුම්හෙ හි මං පරිච්චඅහ ? [කථමනෙන කිතවෙන විප්‍රලබ්ධා'ස්මි. යූයමපි මාං පරිත්‍යජථ ? ]

( අනුප්‍රතිෂ්ඨතෙ )

**ගෞතමි**– ( ස්ථිත්වා ) වච්ඡ සංගරව, අණුගච්ඡදි ඉඅං කඛු ණො කරුණපරිදෙවිණී සඋන්දලා. පච්චාදෙස ඵරුසෙ හත්තුණි කිං වා මෙ පුත්තිආ කරෙදු ? [ වත්ස ශාර්ඞ්ගරව, අනුගච්ඡතී'යං ඛලු නඃ කරුණපරිදෙවිනී ශකුන්තලා. ප්‍රත්‍යා'දෙශපරුෂෙ භර්තරි කිං වා මෙ පුත්‍රිකා කරොතු ? ]

**ශාර්ඞ්ගරවඃ**– ( සරොෂම් නිවෘත්‍ය) කිං පුරොභාගෙ 'ස්වාතන්ත්‍ර්‍යමවලම්බසෙ ?

25 උපතේ සිටැ කපටකම් ගැන නො මැ       දන්නා
හා, හා! ඔහු තමා මුසවා තෙපල       න්නා
අනුන් රැවටීම විදිලෙස       උගන්නා
සරි, සරි! ඔහු තමා සැබ වස       රකින්නා

**රජ–** එම්බා සත්‍යවාදියාණෙනි, අපි මෙය මෙසේ විකකට පිළිගනිමු. යලි මැ රැවටීමෙන් ලැබෙන්නේ කිමෙක් ද?

**ශාර්ඞ්ගරව–** නිරය!

**රජ–** නිරය පෞරවයන් විසින් පතනු ලැබෙයැයි ඇදැහියැ නො හැකි.

**ශාරද්වත–** ශාර්ඞ්ගරව, පිළිතුරෙන් කිම? ගුරු අණ ඉටු කෙළෙමු. අපි ආපසු යමු. (රජු උදෙසා)

26 මෙන්න ඔබ ගෙ       බිරිය
ගැනුම හැරුම       සරිය
ලොවැ'නි හැමට       වැඩිය
බරුට දෙවුය       බිරිය

ගෞතමිය, පෙරටු වැ යන්නැ (පිටත් වෙති)

**ශකුන්තලා–** කෙ සේ යෝ මේ දුෂටයා විසින් රවටන ලදිමි. ඔබත් මා හරනාහු ද? (පස්සෙන් යයි)

**ගෞතමී–** (නැවතී) පුත ශාර්ඞ්ගරව, බැගෑව වැලපෙන ශකුන්තලා අප පස්සෙන් එයි; ප්‍රතික්ෂෙපයෙන් රළු වූ හිමියා වෙත සිටැ මා-දුව කුමක් කරන්න ද?

**ශාර්ඞ්ගරව–** (කෝපයෙන්) අශිලාචාර කෙල්ල, කිම, රිසිසේ හැසිරෙන්නද ?

( ශකුන්තලා භීතා වෙපතෙ )

**ශාර්ඞ්ගරවඃ-** ශකුන්තලෙ,

27. යදි යථා වදති ක්ෂිතිපස්තථා
ත්වමසි කිං පිතුරුත්කුලයා ත්වයා
අථ තු වෙත්සි ශුචිව්‍රතමාත්මනඃ
පතිකුලෙ තව දාස්‍යමපි ක්ෂමම්.

තිෂ්ඨ'ස්‍රාධයාමෝ වයම්.

**රාජා-** භොඃ තාපස්වින්, කිමත්‍ර භවතීං විප්‍රලභසෙ ?

28. කුමුදන්‍යෙ'ව ශශා'ඞ්කඃ සවිතා බොධයති පඞ්කජාන්‍යෙ'ව
වශිනාං හි පරපරිග්‍රහ සංශ්ලෙෂපරාඞ්මුඛී වෘත්තිඃ.

**ශාරඞ්ගරවඃ-** යදා තු පූර්වවෘත්තමන්‍යසඞ්ගාද්විස්මෘතො
භවාන්ස්තදා කථම'ධර්මභීරුඃ ?

**රාජා-** භවන්තමෙවා'ත්‍ර ගුරුලාඝවං පෘච්ඡාමි.

29. මූඪඃ ස්‍යාමහමෙෂා වා වදෙන්මිථ්‍යෙ'ති සංශයෙ
දාරත්‍යාගී භවාම්‍යා'හො පරස්ත්‍රී ස්පර්ශ පාංශුලඃ

**පුරොහිතඃ-** ( විචාර්‍ය ) යදි තාවදෙවං ක්‍රියතාම්.

**රාජා-** අනුශාස්තු මාං භවාන්.

**පුරොහිතඃ-** අත්‍රභවතී තාවදා ප්‍රසවාදස්මද්ගෘහෙ තිෂ්ඨතු. කුත ඉදමුච්‍යත ඉති චෙත්, ත්වං සාධුභිරාදිෂ්ඨපූර්වඃ ප්‍රථමමෙව චක්‍රවර්තිනං පුත්‍රං ජනයිෂ්‍යසී'ති, ස චෙන්මුනිදෞහිත්‍රස්තල්ලක්ෂණො'පපන්නො භවිෂ්‍යති. අභිනන්ද්‍ය ශුද්ධාන්තමෙනාං ප්‍රවෙශයිෂ්‍යාමි, විපර්යයෙ තු පිතාරස්‍යාඃ සමීප නයන මවස්ථිතමෙව.

**රාජා-** යථා ගුරුභ්‍යො රොචතෙ.

( ශකුන්තලා බිය වැ වෙවුලයි )

**ශාර්ඞගරව**- ශකුන්තලා,

27. මෙ රජ යු ලෙසෙකින් වෙහි නම් ඉදින්
ගුරුට කිම වැතැසු කුලැ'තී නිගෙන්
දනිති නම් සුදු බැව පහිවත් ඔබේ
හිමිදු ගේ තිවසේ මැන දස්කමත්

නවතුව, අපි යමු.

**රජ**- එම්බා තවුසෙනි, කිම, මෙහි දී මේ තැනැත්තිය මුළා කරන්නහු ද ?

28. හරිඳු කුමුදු පුබුදු කරයි, එලෙස සඳු දිනිඳු පියු ම
දෑමුණු අය ගෙ සිරිත තමා පර'ඹු කෙරෙන් දුරුව විසු. ම

**ශාර්ඞගරව**- යම් විටෙකැ වෙන'තක ඇලීමෙන් හෝ අන් හේතුවක් නිසා හෝ ඔබ කලින් වූ දෙය අමතක කළෝ නම් එසේ වූ ඔබ කෙරෙහි කෙ සේ නම් පාප භීරුක බවෙක් වේ ද ?

**රජ**- මේ කාරණයෙහි බර සැහැල්ලුව ගැන ඔබ මැ විමසමි.

29. අහෝ ! මා සිහි මුළා වීදෝ මෝ කියන්නී
බොරු බසක් දෝ
අහෝ ! අඹු පිළිකෙව් කරම් දෝ
පර'ඹුවක ගෙන් කිළිටි වම් දෝ

**පුරෝහිත**- ( විමසා ) එ සේ නම් මෙ සේ කරනු මැනැවි.

**රජ**- ඔබ මට උවදෙස් දෙන්නැ.

**පුරෝහිත**- මේ පින්වතිය ප්‍රසවය තෙක් ම ගේ නිවසේ සිටිවා. කුමක් නිසා මෙ සේ කිවා ද යතහොත්. "පළමු වෙන් මැ සක්විති පුතකු උපදවන්නේයැ" යි සාධූන් විසින් ඔබට ආසිරි දෙන ලද්දේ යැ. ඉදින් වතාහි ඒ තවුස් මුණුබුරා සක්විති ලකුණින් යුතු වී නම් මැ සතුටු කොටැ ඇතොරට පිවිසුවමි. වෙනසක් වූවොත් ඇගේ පියා වෙත යැවියැ යුතු මැ යැ.

**රජ**- ගුරුතුමා රිසි සැටියෙකිනි.

**පුරොහිතඃ–** වත්සෙ, අනුගච්ඡ මාම්.

**ශකුන්තලා–** භඅවදි වසුහෙ, දෙහි මෙ විවරං [භගවති වසුධෙ, දෙහි මෙ විවරම්] ( රුදතී ප්‍රස්ථිතා, නිෂ්ක්‍රාන්තා සහ පුරොධසා තපස්විභිශ්ච )

( රාජා ශාපව්‍යවහිත ස්මෘතිඃ ශකුන්තලා ගතමෙව චින්තයති )

**නෙපථ්‍යෙ–** ආශ්චර්යම් !

**රාජා–** ( ආකර්ණ්‍ය ) කිං නු බලු ස්‍යාත් ?

**පුරොහිතඃ–** ( ප්‍රවිශ්‍ය සවිස්මයම් ) දෙව, අද්භූතං බලු සංවෘත්තම් !

**රාජා–** කිමිව.

**පුරොහිතඃ–** දෙව, පරාවෘත්තෙෂු කණ්වශිෂ්‍යෙෂු,

30. සා නින්දන්තී ස්වානි භාග්‍යානි බාලා
බාහූත්ක්ෂෙපං ක්‍රන්දිතුං ච ප්‍රවෘත්තා

**රාජා–** කිං ච ?

**පුරොහිතඃ–**

30 ස්ත්‍රී සංස්ථානං චා'ප්සරස්තීර්ථමාරා–
දුත්ක්ෂිප්‍යෙ'නාං ජ්‍යොතිරෙකං ජගාම.

( සර්වෙ විස්මයං රූපයන්ති )

**රාජා–** භගවන් ප්‍රාගපි සො'ස්මාභිරර්ථඃ ප්‍රත්‍යාදිෂ්ට එව. කිං වෘථා තර්කේණා'න්විෂ්‍යතෙ ? විශ්‍රාම්‍යතු භවාන්.

**පුරොහිතඃ–** ( විලොක්‍ය ) විජයස්ව. ( නිෂ්ක්‍රාන්තඃ )

**රාජා–** වෙත්‍රවතී, පර්‍යා'කුලො'ස්මි. ශයනභූමිමාර්ගමාදෙශය.

**ප්‍රතීහාරී–** ඉදො, ඉදො දෙවො. [ ඉත ඉතො දෙවඃ ] ( ප්‍රස්ථිතා )

**රාජා–** ( පරික්‍රම්‍ය ස්වගතම් )

31. කාමං ප්‍රත්‍යාදිෂ්ටාංස්මරාමි න පරිග්‍රහං මුනෙස්තනයාම්
බලවත්තු දූයමානං ප්‍රත්‍යායයතී'ව මෙ හෘදයම්.

(නිෂ්ක්‍රාන්තාඃ සර්වෙ )

## ඉති පඤ්චමො'ඞ්කඃ

**පුරෝහිත**- දුව, මං අනුව එන්නැ.

**ශකුන්තලා**- භගවත් මහීකාන්තාව, මට විවරයක් දෙන්නැ.
( හඬමින් පිටත් වෙයි; පෙරෙවි බමුණා සමග තවුසෝ ද නික්මෙති ) රජ ශාපයෙන් වැසුණු සිහි ඇත්තේ ශකුන්තලා ගැනැ මැ සිතයි )

**පසුබිම**- පුදුම යි !

**රජ**- ( අසා ) සැබැවින් කිමෙක් වියැ හැකි ද ?

**පුරෝහිත**- (පිවිසැ පුදුම සහිත වැ) දේවයෙනි, පුදුම දෙයක් සිදුවියැ

**රජ**- ඒ කෙසේ ද?

**පුරෝහිත**- දේවයෙනි, කණ්ව ශිෂ්‍යයන් ආපසු ගියැ කලැ,

30. අහස දෙසට අත් තගමින් අනේ! එ ළඳ මහත් දුකි ති
නිගැණැ නිගැණැ සිය ඉරණම තත් ලෙස යළි
යළි වැළපි ති

**රජ**- ඉනික් වෙන ?

30. එකලැ ගැහැණු රුවක් අතුරු එළියක් දුර සිටැ අවුදි ති
ඇයද රැගෙන අපසර තීරය දෙස යළි ඇදෙනු පෙනු ණි

( සියල්ලෝ පුදුමය හඟවති )

**රජ**- පින්වත, පළමු වැ මැ ඒ දෙය අප විසින් බැහැර ලන ලද්දේ මැ නු. කිම, නිෂ්පල ලෙස අනුමානයෙන් ඇ ගැන සොයන්නේ ? ඔබ විඩා හරින්නැ

**පුරෝහිත**- (රජු දෙස බලා) දිනේවා. (පිටත් වැ යයි)

**රජ**- වේත්‍රවති, විඩාවට පත්විමි. යහන් ගැබට මග පෙන්වනු.

**පිළිහැරිය**- දේවයන් වහන්සේ මොබින්, මොබින්.

**රජ**- ( සිසාරමින්, තමාට මැ)

31. ම වි සි න් බැහැර පාළ එ තවුස් දූරිය අ නේ
සැ බැ වින් විවා කළ බැව් මට නම් නො දැ නේ
බෙහෙවින් පෙළෙන මගෙ සිත ඉමහත් දුකි නේ
හ ඟ ව න් නා සේ යැ ඇති තතු විදි ලෙසි නේ

( සියල්ලෝ නික්ම-යති. )

## පස් වන රඟය නිමාවිණි

# ෂෂ්ඨෝ'ඞ්කඃ

(තතඃ ප්‍රවිශති නාගරිකඃ ශ්‍යාලඃ, පශ්චාද්බද්ධපුරුෂමාද
රක්ෂිණෞ ච)

**රක්ෂිණෞ–** (තාඩයිත්වා) අලෙ කුම්භීලආ, කහෙහි කහිං තුඑ එශෙ මණිබන්ධණුක්කිණ්ණණාමහෙඑ ලාඅකීඑ අංගුලීඅඑ ශමාශාදිඑ? [අරෙ. කුම්භීරක, කථය කුත්‍ර ත්වයෛතන්මණිබන්ධනෝ'ත්කීර්ණනාමධෙයං රාජකීයමඞ්ගුලීයකං සමාසාදිතම්]

**පුරුෂඃ–** (භීතිං නාටයිත්වා) පසීදන්තු භාවමිශ්ශෙ අහකෙ ණ ඊදිසකම්මකාලී. [ප්‍රසීදන්තු භාවමිශ්‍රාඃ. අහං නේ'දෘශකර්මකාරී.]

**ප්‍රථමඃ–** කිං ශොහණෙ බම්භණෙ ත්ති කලිඅ රජ්ජා පඩිග්ගහෙ දිණ්ණෙ? [කිං ශොභනො බ්‍රාහ්මණ ඉති කෘත්වා රාඥා ප්‍රතිග්‍රහො දත්තඃ]

**පුරුෂඃ–** ශුණධ දාණිං. අහකෙ ශක්කාවදලබ්භන්තලවාශී ධීවලෙ. [ශෘණුතෙ'දානීම්. අහං ශක්‍රාවතාරා'භ්‍යන්තරවාසී ධීවරඃ]

**ද්විතීයඃ–** පාඩච්චලා, කිං අම්හෙහිං ජාදී පුච්ඡිදා? [පාටච්චර, කිමස්මාභිර් ජාතිඃ පෘෂ්ටා]

**ශ්‍යාලඃ–** සූඅඅ, කහෙදු සව්වං අණුක්කමෙණ, මා ණං අන්තලා පඩිබන්ධහ. [සූචක, කථයතු සර්වමනුක්‍රමෙණ, මෛනමන්තරා ප්‍රතිබධ්ථ.]

**උභෞ–** ජං ආවුතෙ ආණවෙදි. කහෙහි. [යදාවුත්ත ආඥාපයති, කථය.]

**පුරුෂඃ–** අහකෙ, ජාලුග්ගාලාදිහිං මච්ඡබන්ධණොවාඑහිං කුඩුම්භභලණං කලෙමි. [අහං ජාලෝ'ද්ගාලා'දිභිර් මත්ස්‍යබන්ධනො'පායෛඃ කුටුම්බභරණං කරොමි]

## සවන රඞගය

( ඉක්බිති නගර පාලක ශ්‍යාල ද, ඔහු පස්සෙන් විලංගු ලූ මිනිසකු ද ගෙනැ රකවල් දෙ දෙනෙක් ද පිවිසෙති )

**රක්ෂිගු**– ( තලා ) එම්බල සොර, කියව, තට මේ මිණි බැඳුමෙන් උත්කීර්ණ වූ නමැති පේරුස් මුද්‍රව කොහින් ලැබුනේ ද ?

**පුරුෂයා**– ( බිය හඟවා ) මියන්වරුනි, සමාවන්නැ. මම මේ බඳු වැඩ කරන්නෙක් නො වෙමි.

**පළමු රක්‍ෂකයා**– කිම, වැදගත් බමුණෙකැ යි සලකා රජු විසින් තැග්ගෙක් දෙනු ලැබී ද ?

**පුරුෂයා**– එ සේ නම් දූත් අසන්නැ. මා ශක්‍රාවතාරය තුලැ වසන මස් මරන්නෙක්.

**දෙ වන රක්‍ෂකයා**– පාදඩය, අප ජාතිය ඇසුවා ද ?

**ශ්‍යාල**– සූචක, සියල්ල පිළිවලින් ( ඔහු විසින් ) කියනු ලැබේවා; අතරතුර ඔහුට බාධා නො කරනු.

**දෙ දෙනා**– ඔබතුමාගේ කැමැත්තෙකි. කියව.

**පුරුෂයා**– මම දැල් බිලි කටු ආදියෙන් මස් මැරීමෙ යෙදී මෙන් මගේ පවුල රක්‍ෂා කරමි.

ශ්‍යාලඃ- (විහස්‍ය) විසුද්ධො දාණිං ආජීවො. [විශුද්ධ ඉදානී-මාජීවඃ.]

පුරුෂඃ- භට්ටා, මා එව්වං භණ. [භර්තා මෛ'වං භණ]

1. ශහජේ කිල ජේ විණිංදිඑ ණ හු දෙ කම්ම විවජ්ජණීඅඑ
පශුමාලණකම්මදලුණෙ අණුඅංපා මිදුඑ වි ශොත්තිඑ.

[සහජං කිල යද් විනින්දිතං න ඛලු තද් විවර්ජනීයම්
පශුමාරණකර්මදාරුණෝ'නුකම්පාමෘදුරපි ශ්‍රොත්‍රියඃ]

ශ්‍යාලඃ- තදෙ, තදෙ. [තතස්තතඃ]

පුරුෂඃ- එක්කශ්ශිං දිඅශෙ ඛණ්ඩශො ලොහිඅමච්ඡෙ මඑ කප්පිදෙ. ජාව තශ්ශ උදලබ්භන්තලෙ පෙක්ඛාමි; දාව එශෙ ලදණභාශුල අංගුලීඅඅ දෙක්ඛිඅ, පච්ඡා අහකෙ ශෙ වික්කඅාඅ දංශඅංතෙ ගහිදෙ භාවමිශ්ශෙහිං, මාලෙහ වා මුංචෙහ වා. අඅං ශෙ ආඅමවුත්තන්තෙ. [එකස්මින් දිවසෙ ඛණ්ඩශො රොහිතමත්ස්‍යො මයා කල්පිතඃ, යාවත් තස්‍යො'දරාභ්‍යන්තරෙ ප්‍රෙක්ෂෙ. තාවදෙතද් රත්නභාසුරමඞ්ගුලීයකං දෘෂ්ටම්. පශ්චාදහං තස්‍ය වික්‍රයාය දර්ශයන් ගෘහීතො භාවමිශ්‍රෛඃ. මාරයත වා මුඤ්චත වා, අයමස්‍යා'ගමවෘත්තාන්තඃ]

ශ්‍යාලඃ- ජාණුඅ, විස්සගන්ධී ගොධාදී මච්ඡබන්ධො එව්ව ණිස්සංසඅං, අංගුලීඅඅ දංසණං ශෙ විමරිසිදව්වං. රාඅඋලං එව්ව ගච්ඡාමො [ජානුක, විස්‍රගන්ධි ගොධාදී මත්ස්‍යබන්ධ එව නිඃශංසයම්. අංගුලීයකදර්ශනමස්‍ය විමර්ශයිතව්‍යම්. රාජකුලමෙව ගච්ඡාමඃ]

රක්ෂිණෞ- තහ. ගච්ඡ අලෙ ගංඨිභෙදඅ. [තථා, ගච්ඡ අරෙ ග්‍රන්ථිභෙදක.]

(සර්වේ පරික්‍රාමන්ති)

**ශ්‍යාල–** (සිනාසෙමින්) සැබැවින් පිරිසිදු රක්‍ෂාවක්.

**පුරුෂයා–** ස්වාමිනි, එ සේ නො කියනු මැනැවි.

1. සහජයෙන් ආ කමත් පහතැයි කියා දුරලනු
නො මැ යෙදෙ යි
උගත් විදු දද දයා යුතුවත් සතුන්
මැරුමෙන් දරුණු වෙ යි

**ශ්‍යාල–** ඉතින්, ඉතින් ?

**පුරුෂයා–** මා දිනක් රෝහිත මසකු කැබැලිවලට කැපුවා. උගේ බඩ ඇතුල බැළූ කලැ රුවනින් දිලිසෙන මුදුවක් දුටුවෙමි. පසු වැ මම, එය විකිණීම පිණිස පෙන්වද්දී මහතුන් විසින් අල්වා ගන්නා ලදිමි. මරා වා හෝ මුදා වා. මේ මුද්ද ලැබුණු හැටියි.

**ශ්‍යාල–** ජානුක, මේ අමු පිලිගඳ, ගොධාදී මසුන් ගේ ගඳ බැව් නිසැක යි. මොහුට මුද්ද ලැබුණු හැටි විමසා බැලියැ යුතු යි. රජ වාසලට මැ යමු.

**රක්‍ෂිහු –** එ සේ යි. බොල, ගැට කපන්න යම.

( සියල්ලෝ සිසාරති )

ශ්‍යාලඃ- සූඅඅ, ඉමං පුරදුආරෙ අප්පමත්තා පඩිවාලහ, ජාව ඉමං අංගුලිඅඅං ජධාගමණං භට්ටිණො ණිවෙදිඅ තදො සාසණං පඩිච්ඡිඅ ණික්කමාමි. [සූචක, ඉමං පුරද්වාරේ'ප්‍රමත්තෞ ප්‍රතිපාලයතං, යාවදිමමංගුලීයකං යථාගමනං භර්තුර්නිවේද්‍ය, තතඃ ශාසනං ප්‍රතීක්ෂ්‍ය නිෂ්ක්‍රමාමි.]

උභෞ- පවිශදු ආවුත්තො ශාමිපශාදණාය්ශ [ප්‍රවිශත්වා'වුත්තඃ ස්වාමිප්‍රසාදය.] (නිෂ්ක්‍රාන්තඃ ශ්‍යාලඃ)

ප්‍රථමඃ- ජාණුඅ, චිලාඅදි ක්ඛු ආවුත්තෙ. [ජානුක, චිරයති ඛල්වා'වුත්තඃ]

ද්විතීයඃ- ණං අවශලො'වශප්පණීආ ලාආණො. [නන්ව- වසරෝ'පසර්පණීයා රාජානඃ]

ප්‍රථමඃ- ජාණුඅ, ප්ඵුලංති මෙ හත්ථා ඉමශ්ශ වහශ්ශ ශුමණා පිණද්ධුං. [ජානුක, ස්ඵුරතො මම හස්තෞ ඉමස්‍ය වධස්‍ය සුමනසඃ පිනද්ධුම්] (පුරුෂං නිර්දිශති)

පුරුෂඃ- ණ අලුහදි භාවෙ අකාලණ මාලණෙ භොදුං. [නා'ර්හති භාවෝ'කාරණමාරණෝ භවිතුම්]

ද්විතීයඃ- (විලෝක්‍ය) එශෙ අම්හාණං ශාමී පත්තහත්ථෙ ලාඅ ශාශණං පඩිච්ඡිඅ ඉදො මුහෙ දෙක්ඛීඅදි. ගිද්ධබලී භවිශ්ශශි. ශුණො මුහං වා දෙක්ඛිශ්ශශි. [එෂ නෞ ස්වාමී පත්‍රහස්තො රාජශාසනං ප්‍රතීෂ්‍යෝ'තොමුඛො දෘශ්‍යතෙ. ගෘධ්‍රබලිර් භවිෂ්‍යසි, ශුනො මුඛං වා ද්‍රක්ෂ්‍යසි]

ශ්‍යාලඃ- (ප්‍රවිශ්‍ය) සූඅඅ, මුංචෙදු එසො ජාලොවජීවී උවවණ්ණො ක්ඛු අංගුලීඅඅස්ස ආඅමො, [සූචක, මුච්‍යතාමෙෂ ජාලෝ'පජීවී. උපපන්නො ඛල්ව'ංගුලීයකස්‍යාගමඃ]

ශෘගාල– සුවඝා, මේ මුද්ද ලැබුණු හැටි දේවයන් වහන්සේට දන්වා එතුමා ගෙන් නියොග ලැබැ එන තෙක් නුවර දොරටුව වෙතැ සිටැ මොහු මැනැවින් රකුව.

**දෙදෙනා–** දේවයන් වහන්සේ ගේ අනුග්‍රහය පිණිස ඔබ තුමා යනු මැනැවි.

( ශෘගාල නික්මෙයි )

**ප්‍රථමයා–** ජාතුකා, සැබැවින් ඇමැතිතුමා පමාවන බව පෙනේ.

**දෙ වැන්නා–** රජවරු නම් සුදුසු කල්හි මැ බැහැ–දැකිය යුත්තෝ නොවැ

**ප්‍රථමයා–** ජාතුකා, මොහු මැරීම පිණිස මල් පැලදවීමට මගේ අත් තලියනවා ( මිනිසා පෙන්වයි. )

**පුරුෂයා–** නිකරුණේ මිනීමරුවන් වන්නට මගතුන් හට සුදුසු නෑ.

**දෙ වැන්නා–** ( බලා ) මේ අපේ ස්වාමියා පත්‍රිණියකුත් ගෙනැ රජ අණ ලබා ගෙනැ මෙ දෙසට එන බව පේනවා. නා ගිජුලිහිණියකුට හෝ බිලි වේවි. බලු කටෙකැ හෝ පෙනේ වි.

**ශෘගාල–** ( පිවිසැ ) සුවඝා, මේ දල්කාරයා මුදවනු. මුද්ද ලැබීම ගැන ඔහු කී හැටි හරි.

**සූචක**- ජධ ආවුත්තෙ භණාදි. [යථා'වුත්තො භණති]

**ද්විතීයඃ**- එසෙ ජමසදනං පවිසිඅ , පඩිණිවුත්තෙ. [එෂ යමසදනං ප්‍රවිශ්‍ය ප්‍රතිනිවෘත්තඃ] (පුරුෂං පරිමුක්ත බන්ධනං කරොති)

**පුරුෂඃ**- (ශ්‍යාලං ප්‍රගම්‍ය) භට්ටා, අහ කිලිසෙ මෙ ආජීවෙ, [භර්තඃ; අථ කිදෘශො ම ආජීවඃ]

**ශ්‍යාලඃ**- එසෙ භට්ටිණා අංගුලිඅඅ මුල්ලසම්මිදෙ පසාදෙ වි දවි-දෙ. [එෂ භර්ත්‍රා'ඞ්ගුලීයකමූල්‍යසම්මිතඃ ප්‍රසාදෙ'පි දාපිතඃ]

(පුරුෂායා'ඞ්ං ප්‍රයච්ඡති)

**පුරුෂඃ**- (සප්‍රණාමං ප්‍රතිගෘහ්‍ය) භට්ටා, අණුග්ගහිද ම්හි [භර්තඃ අනුගෘහීතො'ස්මි]

**සූචකඃ**- එසෙ ණාම අණුග්ගහෙ ජෙ ශූලාදෙ අවදාලිඅ හත්ථි-ක්ඛන්ධෙ පඩිට්ඨාවිදෙ, [එෂ නාමා'නුග්‍රහො යච්ඡූලාදවතාර්‍ය්‍ය හස්තිස්කන්ධෙ ප්‍රතිෂ්ඨාපිතඃ]

**ජානුක**- ආවුත්ත, පාලිදෙශිඅං කහෙදි, මහග්ඝරදණෙණ තෙණ අංගුලීඅඑණ භට්ටිණො බහුමදෙණ හොදව්වං ත්ති. [ආවුත්ත, පරිතොෂිකං කථයති. මහා'ර්ඝරත්නෙන තෙනා'ඞ්ගුලීයකෙන භර්තුඃ බහුමතෙන භවිතව්‍යමිති]

**ශ්‍යාලඃ**- ණ තස්සිං මහාරුහං රදණං භට්ටිණො බහුමදං ත්ති තක්කෙමි. තස්ස දංසණෙණ භට්ටිණො අභිමදො ජණො සුමරාවිදො, මුහුත්තඅං පකිදි ගංභීරො වි පජ්ජස්සු ණඅණො ආසි. [න තස්මින් මහා'ර්ඝං රත්නං භර්තුඃ බහුමතමිති තර්කයාමි. තස්‍ය දර්ශනෙන භර්තුරභිමතො ජනඃ ස්මාරිතඃ. මුහූර්තං ප්‍රකෘතිගම්භීරො 'පි පර්‍ය්‍යශ්‍රුනයන ආසීත්]

**සූචකඃ**- සෙවිදං ණාම ආවුත්තෙණ. [සෙවිතං නාමා 'වුත්තෙන]

**සුවක–** මහත්මයා කියන සැටියකට.

**දෙ වැන්නා–** මොහු යම පුරයට ගොස් පෙරලා ආවා.

( මිනිහා බැදුමින් මුදයි )

**පුරුෂයා–** ( ශෘාලයන් වැඳ ) සවාමීනි, කෙ සේ ද, දූන් මගේ ජීවිකාව ?

**ශෘාල–** මෙන්න, දේවයන් වහන්සේ විසින් මුද්දෙකි වටිනා යාමට සෑහෙන පඬුරෙක් ද දෙවා වදරණ ලදී.

( මිනිහාට මුදල් දෙයි )

**පුරුෂයා–** ( ප්‍රණාම සහිත වැ පිළිගෙනැ ) සවාමිනි, මම පිළිසරණ ලදිමි.

**සූවක–** මේ අනුග්‍රහය තම යමකු දිවස් හුලින් ඔසොවා ඇතකු පිටැ තැබීමක්.

**ජානුක–** ඇමතිතුමනි, මාහැගි රුවනින් විසිතුරු නිසා ඒ මුද්ද දේවයන් විසින් උසස් ලෙස සලකන බව ( ඒ ) පඬුර පහදයි.

**ශෘාල–** ඒ මාහැඟි රුවන් නිසා දේවයන් වහන්සේ එය උසස් ලෙස සැලැකියැ යි මම නො සිතමි. එය දකිමෙන් දේවයනට ආදරවත් කෙනකු සිහි වන්නට ඇති. සවභාව යෙන් ප්‍රතාපවත් ඔහු ගේ ඇස් මොහොතක් කඳුලින් පිරී තිබුණි.

**සූවක–** ( එහෙනම්) ඇමතිතුමා විසින් කෙළේ මෙහෙයෙක්.

**ජානුකඃ**– ණං භණාහි, ඉමශ්ශ කඑ මජ්ජිආ ගන්තුණො ත්ති. [නනු භණ, අස්‍ය කෘතෙ මාත්සයීකභර්තුරිති]

(පුරුෂමසූයයා පශ්‍යති)

**පුරුෂඃ**– භට්ටාලක, ඉදෙ අද්ධං තුම්හාණං සුමණො මුල්ලං හොදු. [භර්තාරක, ඉතො ‘ර්ධං යුෂ්මාකං සුමනො මූල්‍යං භවතු.]

**ජානුකඃ**– එත්තකෙ ජුජ්ජඉ. [එතාවත් යුජ්‍යතෙ.]

**ශ්‍යාලඃ**– ධීවර, මහත්තරො තුමං පිඅවඅස්සඅ දාණිං මෙ සංවුත්තො. කාදම්බරි සක්ඛිඅං අම්හාණං පඨමසොහිදං ඉච්ඡීඅදි. තා සොණ්ඩිආපණං එව්ව ගච්ඡාමො, [ධීවර, මහත්තරස්ත්වං ප්‍රියවයස්‍යක ඉදානීං මෙ සංවෘත්තඃ. කාදම්බරී සාක්ෂිකමස්මාකං ප්‍රථම සෞහෘදමිෂ්‍යතෙ. තච්ඡෞණ්ඩිකා‘පණමෙව ගච්ඡාමඃ]

(නිෂ්ක්‍රාන්තාඃ සර්වේ)

## ප්‍රවෙශකඃ

(තතඃ ප්‍රවිශත්‍යා‘කාශයානෙන සානුමතී නාමා‘ප්සරාඃ)

**සානුමතී**– ණිව්වත්තිදං මඑ පජ්ජාඅ ණිව්වත්තණිජ්ජං අච්ඡරාතිත්ථසණ්ණිජ්ඣං ජාව සාහුජණස්ස අභිසෙඅකාලොත්ති සංපදං ඉමස්ස රාඑසිණො උදන්තං පච්චක්ඛී කරිස්සං. මෙණආ සම්බන්ධෙණ සරීරභූදා මෙ සඋන්දලා, තාඑ අ දුහිදු ණිමිත්තං ආදිට්ඨපුව්වම්හි, (සමන්තාදවලොක්‍ය) කිං ණු ක්ඛු උදුච්චවෙ වි ණිරුච්ඡවාරංභං විඅ රාඅඋලං දීසඉ. අත්ථි මෙ විහවො පණිධාණෙණ සව්වං පරිජාණිදුං. කිං දු සහීඑ ආදරො මඑ මාණඉදව්වො හොදු, ඉමාණං එව්ව උජ්ජාණ පාලිආණං තිරක්ඛරණී පඩිච්ඡණ්ණා පාස්සවත්තිණී භවිඅ උවලහිස්සං.

(නාට්‍යෙනා‘වතීර්‍ය ස්ථිතා)

**ජානුක-** මේ ධීවරයාට යහපතක් කෙළේ නැත් ද ?

( ඊර්ෂ්‍යාවෙන් මිනිසා දෙස බලයි )

**පුරුෂයා-** ස්වාමිනි, මෙයින් අඩක් ඔබට මල් මිල වේවා.

**ජානුක-** මෙ පමණ සෑහෙයි.

**ශ්‍යාල-** ධීවරය, ඔබ මිහත්මයෙකි. දැන් මගේ ප්‍රිය මිතුරකු බවට පැමිණියා. සුරාව දෙස් කොට පළමුව අප ගේ මිතුරු දම අරඹමු.

( සියල්ලෝ පිටවැ යති )

## ප්‍රවේශකය නිමි.

( ඉක්බිති අහස් මගින් සානුමතී නම් අප්සරාව පැමිණෙයි )

**සානුමතී-** සාධූන් ගේ ජලස්නාන සමය තෙක් පටි පාටියෙන් පැමිණි අප්සරස්තීර්ථ සේවාව ම විසින් නිමවන ලදී. දැන් මේ රජතුමා ගේ තොරතුරු ප්‍රත්‍යක්ෂ කොටැ දැන ගන්නෙමි. මගේ ( යෙහෙළි ) මෙනකාවගේ සම්බන්ධයෙන් ශකුන්තලාව ශරීරවත් වූවා: ඇය ( මෙනකාව ) විසින් සිය දුව උදෙසා ( යමක් කිරීමට ) අණවන ලද්දේ වෙමි. ( හාත්පස බලා ) සැබැවින් කිමෙක් ද මේ ? වසන්ත පූජා සමයෙහි පවා රජ ගෙදර උත්සව රහිත සේ පෙනේ. සියල්ල දැනැ ගැනීමට හැකි භාවනා බලයෙන් ලැබූ බලයක් මට ඇත. කිම, යෙහෙළිය ගේ දයාවට (විශ්වාසයට) ගරු කළ යුතු ද ? වේවා ! අදෘශ්‍යමාන බලයෙන් වැසී මේ උද්‍යාන පාලිකාවන් දෙ පොල පසෙකින් සිටින්නට ඕනැ.

( බස්නා බව හඟවමින් බැසැ සිටියි )

[නිර්වර්තිතං මයා පශ්චාන්නිර්වර්තනීයමප්සරස්තීර්ථ සාන්නිධ්‍යම්. යාවත් සාධුජනස්‍යා'භිෂේකකාලඃ. සාම්ප්‍රතමස්‍ය රාජර්ෂෙරුදන්තං ප්‍රත්‍යක්ෂී කරිෂ්‍යාමි. මෙනකා සම්බන්ධෙන ශරීරභූතා මෙ ශකුන්තලා. තයා තු දුහිතෘනිමිත්තමාදිෂ්ටපූර්වා'ස්මි, කිං නු ඛලු ඍතූ'ත්සවෙ 'පි නිරුත්සවා'රම්භමිව රාජකුලං දෘශ්‍යතෙ. අස්ති මෙ විභවඃ ප්‍රණිධානෙන සර්වං පරිඥාතුම් කිං තු සඛ්‍යා ආදරො මයා මානයිතව්‍යඃ. භවතු, අනයොරෙවො'ද්‍යානපාලිකයොස්තිරස්කරණී ප්‍රතිච්ඡන්නා පාර්ශ්වවර්තිනී භූත්වො'පලප්ස්‍යෙ.]

(තතඃ ප්‍රවිශති චූතා'ඞ්කුරමවලොකයන්තී චෙටී, අපරා ච පෘෂ්ඨතස්තස්‍යාඃ)

**ප්‍රථමා**–

2 ආඅම්බ හරිඅ පංඩුර වසන්තමාසස්ස ජීඅසව්වස්ස
දිට්ඨො සි චූදකොරඅ උදුමංගල තුමං පසාඑමි.

[ආතාම්‍ර හරිත පාණ්ඩුර වසන්තමාසස්‍ය ජීවසර්වස්ව
දෘෂ්ටොසි චූතකොරක ඍතු මංගල ත්වාං ප්‍රසාදයාමි.

**ද්විතියා**– පරහුදිඑ, කිං එආඉණි මංතෙසි? [පරභෘතිකෙ, කිමෙකාකිනී මන්ත්‍රයසෙ?]

**ප්‍රථමා**– මහුඅරිඑ, චූදකලිඅං දෙක්ඛිඅ උම්මත්තිආ පරහුදිආ හොදි.[ මධුකරිකෙ, චූතකලිකාං දෘෂ්ට්වො'න්මත්තා පරභෘතිකා භවති]

**ද්විතීයා**– (සහර්ෂම්, ත්වරයො'පගම්‍ය) කහං උවට්ඨිදෙ මහුමාසො? [කථමුපස්ථිතො මධුමාසඃ]

**ප්‍රථමා**– මහුඅරිඑ, තව දාණිං කාලො එසො මදවිබ්භමගීදාණං [මධුකරිකෙ, තවෙ'දානීං කාල එෂ මදවිභ්‍රමගීතානාම්.]

( ඉක්බිති අඹ දලුවක් බලමින් දූස්සක් පිවිසෙසි. නව එකියක් ඈ පස්සෙන් එයි. )

**පළමු වැන්නිය**-

2. පැහැදේ අඹ කැකු ලේ
සැතසේ උතු මිතු ලේ

තඹ පැ ඈනියා, කොළ පැ ඈනියා, පඬු පැ ඈනියා මේ
දකිනු ලැබෙති ඔබ වසන්තයේ ජීවය, මී අඹ කුසු මේ

**දෙ වැන්නිය**- පරභෘතිකා, ඈයි, තී හුදකලා වැ මුමුනන්නේ ?

**පළමු වැන්නිය**- මධුකාරිකා, මී අඹ කැකුළ දූකැ පරභෘතිකාව උමතු වෙයි.

**දෙ වැන්නිය**- ( ප්‍රීතියෙන් වහා එළඹැ ) කිම, වසන්ත මාසය එළඹියේ ද ?

**පළමු වැන්නිය**- මධුකාරිකා, ඔබ ගේ ප්‍රේම ගීතයනයට දූන් මේ කාලය යි.

**ද්විතීයා-** සහි, අවලම්බ මං, ජාව අග්ගපාදට්ඨිආ භවිඅ, චූදකලිඅං ගෙණ්හිඅ කාමදෙවච්චණං කරෙමි. [සඛි, අවලම්බස්ව මාං යාවදග්‍රපාදස්ථිතා භූත්වා චූතකලිකාං ගෘහීත්වා කාමදෙවා'ර්චනං කරොමි.]

**ප්‍රථමා-** ජඉ මම වි ඛු අද්ධං අච්චණ ඵලස්ස [යදි මමා'පි ඛල්වා'ර්චන ඵලස්‍ය.]

**ද්විතීයා-** අකහිදෙ වි එදං සංපජ්ජඉ, ජදෙ එකකා එව්ව ණො ජීවිදං දුවාට්ඨිදං සරීරං. [අකථිතෙ'පි එතං සම්පද්‍යතෙ, යත එකමෙව නෞ ජීවිතං ද්විධස්ථිතං ශරීරං.]

(සඛීමවලම්බ්‍ය ස්ථිතා චූතාඞ්කුරං ගෘහ්ණාති)

අඑ! අප්පඩිබුද්ධො'වි චූදප්පසවො, එත්ථ බන්ධනභංගසුරහී හොදි. [අයේ! අප්‍රතිබුද්ධො'පි චූතප්‍රසවො'ත්‍ර බන්ධනභංග සුරභිර් භවති.] (කපොතහස්තකං කෘත්වා)

3. තුමං සි මඑ චූදංකුර දිණ්ණො කාමස්ස ගහිද ධණුඅස්ස
පහිඅ ජණ ජුවඉ ලක්ඛො පංචබ්භහිඔ සරො හොහි.

[ත්වමසි මයා චූතා'ඞ්කුර දත්තං කාමාය ගෘහීත ධනුෂෙ
පථිකජන යුවති ලක්ෂ්‍යඃ පඤ්චා'භ්‍යධිකඃ ශරො භව]

(ප්‍රවිශ්‍යා'පටීක්ෂෙපෙණ කුපිතඃ)

**කඤ්චුකී-** මා තාවත්. අනාත්මඥෙ, දෙවෙන ප්‍රතිෂිද්ධෙ වසන්තො'ත්සවෙ ත්වාම්‍ර කලිකාභඞ්ගං කිමාරභසෙ.

**උභෙ-** (භීතෙ) පසීදදු. අජ්ජො. අග්ගහිදත්ථාඔ වඅං. [ප්‍රසීදත්වා'ර්යඃ. අගෘහීතා'ර්ථෙ ආවාම් ]

**කඤ්චුකී-** න කිල ශ්‍රුතං යුවාභ්‍යාං යද් වාසන්තිකෛස්තරුභිරපි දෙවස්‍ය ශාසනං ප්‍රමාණීකෘතං තදාශ්‍රයිභිඃ පත්‍රිභිශ්ච. තථා හි,

**දෙ වැන්නිය**- යෙහෙළිය, මා අල්ලා ගන්නැ; පා ඇඟිලි වලින් සිටවත් මේ අඹ දලුව නෙලා ගෙනැ කාම දේවයා පුදන්නට.

**පළමු වැන්නිය**- හොඳයි, මටත් පූජා ඵලයෙන් අඩක් දෙනවා නම්.

**දෙ වැන්නිය**- නො කිවත් එය කෙරේවි. සිරුරෙන් දෙ දෙනකු වෙතත් අප දෙ දෙනා ගේ ජීවිතය එක මැ නො වැ.

( යෙහෙළිය අල්ලා ගෙනැ සිටිද්දී අඹ කැකුළ නෙලයි )

ඔහෝ! නොපිපුනද මී අඹ කැකුළ නටුවෙන් නෙළන විටැද සුවඳවත් වෙයි. ( කපොත හස්ත මුද්‍රාව කොටැ )

3. මී අඹ කැකුළේ, මා ඔබ දිනි දුනු ගත් මලවිදුහට මේ
මැගියන් ගේ නව යෝනන් ශදල්ක් පස'විසැ අගවෙතිමේ

( අඹ කැකුළ බිම හෙළයි )

( කිපියා වූ කඤ්චුකී තිරය ඔසොවා ගෙනැ පැමිණෙයි )

**කඤ්චුකී**- හා! එපා. අනුවණ කෙල්ලෙ, දේවයන් වහන්සේ විසින් වසන්ත පූජෝත්සවය වැළැක් වූ කල්හි, ඇයි මේ මී අඹ කැකුළ කඩන්නේ ?

**දෙදෙනා**- ( බිය පත්වැ ) සමාවන්නැ උතුමාණෙනි, අපි එහි අරුත් නො දත්තෙමු.

**කඤ්චුකී**- සැබැවින් නො ඇසුවාහු ද, වසන්තයේ මල් හටගන්නා ගස් හා ඒවා ඇසුරු කරන පක්ෂීන් විසිනු දු රජු ගේ ආඥාව පිළිගන්නා ලද බව ? ඒ එ සේ මැ යි.

4. චූතානං චිරනිර්ගතා'පි කලිකා බධ්නාති න ස්වං රජඃ
සන්නද්ධං යදපි ස්ථිතං කුරවකං තත් කෝරකා'වස්ථයා
කණ්ඨේෂු ස්ඛලිතං ගතෝ'පි ශිශිරේ පුංස්කෝකිලානාං
රුතං
ශඞ්කේ සංහරති ස්මරෝ'පි චකිතස්තූණාර්ධකෘෂ්ටං ශරම්.

**සානුමතී**– ණත්ථි සංදෙහො. මහාප්පහාවො රාඑසී. [ නා'ස්ති සන්දේහඃ. මහාප්‍රභවෝ රාජර්ෂිඃ ]

**ප්‍රථමා**– අජ්ජ, කති දිඅහාඉං අම්හාණං මිත්තාවසුණා රට්ඨිඑණ භට්ටිණෝ පාඅමූලං පෙසිදාණං. එත්ථ අ ණො පමදවණස්ස පාලණකම්මං සමප්පිදං. තා ආඅංතුආදාඑ අස්සුදපුව්වෝ අම්හෙහිං එසො වුත්තන්තෝ. [ ආසී කතිදිවසාවයෝර් මිත්‍රවසුනා රාෂ්ට්‍රියෙන භර්තුඃ පාදමූලං ප්‍රේෂිතායෝඃ. අත්‍ර ච නෞ ප්‍රමදවනස්‍ය පාලනකර්ම සමර්පිතම්. තදාගන්තුකතයා'ශ්‍රුතපූර්වං ආවාභ්‍යාමේෂ වෘත්තාන්තඃ ]

**කඤ්චුකී**– භවතු. න පුනරේවං ප්‍රවර්තිතව්‍යම්.

**උභෙ**– අජ්ජ, කොදූහලං ණො. ජඅ ඉමිණා ජණේණ සොදව්වං කහෙදු අජ්ජෝ. කිං ණිමිත්තං භට්ටිණා වසන්තුස්සවො පඩිසිද්ධො ? [ ආර්‍ය, කෞතූහලං නෞ. යද්‍යනෙන ජනෙන ශ්‍රෝතව්‍යං කථයත්වා'ර්‍යඃ. කිං නිමිත්තං භර්ත්‍රා වසන්තෝ'ත්සවඃ ප්‍රතිසිද්ධඃ ? ]

**සානුමතී**– උස්සවප්පිආ කඛු මනුස්සා. ගුරුණා කාරණේණ හොදව්වං. [ උත්සවප්‍රියා ඛලු මනුෂ්‍යාඃ. ගුරුණා කාරණේන භවිතව්‍යම් ]

**කඤ්චුකී**– බහුලීභූතමේතත්. කිං න කථ්‍යතෙ. කිමත්‍ර භවත්‍යෝඃ කර්ණපථං නා'යාතං, ශකුන්තලා ප්‍රත්‍යාදෙශ කෞලීනම් ?

**උභෙ**– සුදං රට්ඨිඅ මුහාදෙ; ජාව අංගුලීඅඅ දංසණං. [ ශ්‍රුතං රාෂ්ට්‍රියමුඛාත්, යාවදංගුලීයක දර්ශනම් ]

4. නික්මී මුත් කලෙකින් අනේ! මියඹ මල් නෑ නෑ
බඳින්නේ රෙණුත්
හැස් වී මුත් කුරවක් ගසත් සිය හැකියත්
නාමත් මුකුල්ලේ සිටි
ඉන් මී ලත් සිසිරේ ගෙළේ තිනි ගැලේ
මීරේ කොවුල් නාදයත්
තුනීරෙන් අඩෙකින් රුගත් සර නවත්වාදෙ සිතේ පුන්සරු

**සානුමතී**- සැකයෙක් නෑ. රජතුමා මහානුභාව ඇත්තෙකි.

**පළමු වැන්නිය**- උතුමාණෙනි, කීප දිනකට පෙර අප ගේ "මිත්‍රවසු" රාෂ්ට්‍රීන් විසින් අපි මහා රාජිනිය වෙත එවනු ලැබුවෙමු. මෙහි දී ද "ප්‍රමදවන" පාලනය අපට බාරදුනි. එ හෙයින් අපි ආගන්තුකා බැවින් මේ පුවත නො ඇසූ පිරිමු.

**කඤ්චුකී**- වේවා, මින්පසු යලි මෙ සේ නො කරනු.

**දෙදෙනා**- උතුමාණෙනි, අපට කුහුළෙකි. ඉදින් මේ අය (අප) විසින් ඇසියැ යුත්තක් නම් හමුන්නාන්සේ ගෙන් අවසර ලැබෙන්නැ, මොන හේතුවක් නිසා මහ රජාණන් වහන්සේ වසන්ත උත්සවය නැවැත්වූ දැ යි.

**සානුමතී**- මිනිස්සු සැබැවින් උත්සව කැමැත්තෝ යැ. බරපතල කරුණෙකින් වියැ යුතු යි.

**කඤ්චුකී**- ඒක බොහො මැ ප්‍රසිඩ යි. ඇයි, එය නො කියැ යුත්තේ? තොපගේ කන්වලට නා වේ ද ශකුන්තලා පිටමං කිරීමේ පුවත (කේලම)

**දෙදෙනා**- මුද්ද ලැබීම දක්වා රාෂ්ට්‍රීන් ගේ මුවින් මැ ඇසිමු.

**කඤ්චුකී-** තෙන හ්‍යල්පං කථයිතව්‍යම්. යදෛව ඛලු ස්වාංගුලීයකදර්ශනාදනුස්මෘතං දෙවෙන, සත්‍යමූඪපූර්වා මයා තත්‍ර භවතී රහසි ශකුන්තලා මොහාත් ප්‍රත්‍යා-දිෂ්ටෙ'ති තදා ප්‍රභෘත්‍යෙ'ව පශ්චාත්තාපමුපගතො දෙවඃ. තථා හි,

5. රම්‍යං ද්වෙෂ්ටි යථා පුරා ප්‍රකෘතිභිර් න ප්‍රත්‍යහං සෙව්‍යතෙ
ශය්‍යා ප්‍රාන්ත විවර්තනෛර්විගමයත්‍යුන්නිද්‍ර එව ක්ෂපාඃ
දාක්ෂිණ්‍යෙන දදාති වාචමුචිතාමන්තඃ පුරෙභ්‍යො යදා
ගොත්‍රෙෂු ස්ඛලිතස්තදා භවති ච ව්‍රීඩාවිලක්ෂශ්චිරම්.

**සානුමතී-** පිඅං මෙ. [ ප්‍රියං මෙ ]

**කඤ්චුකී-** අස්මාත් ප්‍රභවතො වෛමනස්‍යාදුත්සවඃ ප්‍රත්‍යාඛ්‍යාතඃ.

**උභෙ-** යුජ්ජඉ. [ යුජ්‍යතෙ ]

**නෙපථ්‍යෙ-** එදු එදු භවං. [ එතු එතු භවාන් ]

**කඤ්චුකී-** ( කර්ණං දත්වා ) අයෙ ! ඉත එවා'භිවර්තතෙ දෙවඃ. ස්වකර්මා'නුෂ්ඨීයතාම්.

**උභෙ-** තහ. [ තථා ] ( නිෂ්ක්‍රාන්තෙ )

( තතඃ ප්‍රවිශති පශ්චාත්තාප සදෘශවෙෂො රාජා විදූෂකඃ ප්‍රතිහාරී ච. )

**කඤ්චුකී-** ( රාජානමවලොක්‍ය ) අහො ! සර්වාස්ව'වස්ථාසු රමණීයත්වමාකෘතිවිශෙෂාණාම්. එවමුත්සුකො'පි ප්‍රියදර්ශනො දෙවඃ. තථා හි,

**කඤ්චුකී**- එ,සේ නම් ටිකක් කියා යුතු යි. සිය මුද්ද දුටු හැටියේ මැ දේවයන් වහන්සේ විසින් පෙර රහසින් ශකුන්තලා මැණිකිය ආවාහ කළ බව ද: මුළාවෙන් ඇ බැහැර කළ බව ද සිහිවිය. එ තැන් සිටැ දේවයන් වහන්සේ පසුතැවිල්ලට පැමිණියාහු යැ. ඒ එ සේ මැ යි.

5. රමණී දූයට කොව් පතුර ත
පෙරළ මෙන් ඇමැනින් නොසය ත
සහතැ පසෙකැ ඒ පෙරලෙ ත
නො තිදමින් සද

මේ ලෙස සියලු රැය මැ ගෙව ත
වරෙකැ බිසවු මිහිරි බසි ත
තෙපලතැ වැරැදි වැ අමිත ත
සිටිත විලි වැද

**සානුමතී**- මට ප්‍රීතියෙකි.

**කඤ්චුකී**- මෙ තැන් සිටැ පෙරලීමෙන් උපස්ථාන[illegible]විය.

**දෙ දෙනා**- යෙදෙ යි.

**පසුබිම**- එත්තැ, එත්තැ උතුමා.

**කඤ්චුකී**- ( කන් දී ) ඔහෝ ! මොබට මැ දේවයෝ එති. සිය කිස තිමවනු.

**දෙ දෙනා**- එ සේ යැ. ( පිටත් වැ යති )

( ඉක්බිති පසු තැවීමට සුදුසු වෙස් ගත් රජ් ද විදූෂක හා ප්‍රතිහාරී ද පිවිසෙති )

**කඤ්චුකී**- ( රජු දෙස බලා ) අනේ, සියලු අවස්ථාවන්හි මැ උත්තම වස්තූන් ගේ රමණීය බව ! රජු දෙමිනසින් පසු වෙතත් දකුම් කළු යැ.

6. ප්‍රත්‍යා'දිෂ්ට විශෙෂමණ්ඩනවිධිර් වාමප්‍රකොෂ්ඨා'ර්පිතං
බිභ්‍රත් කාඤ්චනමෙකමෙව වලයං ශ්වාසා'පරක්තා'ධරඃ.
චින්තාජාගරණප්‍රතාම්‍ර නයන තෙජොගුණා දාත්මනඃ
සංස්කාරෝ'ල්ලිඛිතො මහාමණිරිව ක්ෂීණෝ'පි
නා'ලක්ෂ්‍යතෙ.

**සානුමති-** ( රාජානං දෘෂ්ට්වා ) ඨාණෙ ක්ඛු පච්චාදෙස විමාණිදා වි ඉමස්ස කිදෙ සඋන්දලා කිලම්මදි. [ ස්ථානෙ බලු ප්‍රත්‍යාදෙශ විමානිතා'ප්‍ය'ස්‍ය කෘතෙ ශකුන්තලා ක්ලාම්‍යති ]

**රාජා-** ( ධ්‍යාන මන්දං පරික්‍රම්‍ය )

7. ප්‍රථමං සාරඞ්ගාක්ෂ්‍යා ප්‍රියයා ප්‍රතිබොධ්‍යමානමපි සුප්තම්
අනුශය දුඃඛායෙ'දං හතහෘදයං සම්ප්‍රති විබුද්ධම්.

**සානුමති-** ණං ඊදිසාණි තවස්සිණීඑ භඅගෙආණි. [ නන්වී දෘශානි තපස්විත්‍යා භාගධෙයානි, ]

**විදූෂකඃ-** ( අපවාර්‍ය ) ලංඝිදෙ එසො භූඔ වි සඋන්දලා වාහිණා ණ ආණෙ, කහං චිකිච්ඡිදව්වො හවිස්සදි ත්ති. [ ලංඝිතො'යං භූයෝ'පි ශකුන්තලා ව්‍යාධිනා. න ජානෙ, කථං චිකිත්සිතව්‍යො භවිෂ්‍යතී'ති. ]

**කඤ්චුකී-** ( උපගම්‍ය ) ජයතු, ජයතු දෙවඃ. මහාරාජ, ප්‍රත්‍යවෙක්ෂිතාඃ ප්‍රමදවන භූමයඃ . යථාකාම මධ්‍යාස්තාං විනොදස්ථානානි මහාරාජඃ.

**රාජා-** වෙත්‍රවති, මද්වචනාදමාත්‍යාර්‍යපිශුනං බ්‍රෑහි. චිර-ප්‍රබොධනාන්න සම්භාවිතමස්මාභිරද්‍ය ධර්මා'සනමධ්‍යාසිතුම්. යත් ප්‍රත්‍යවෙක්ෂිතං පෞරකාර්‍යමාර්‍යෙණ තත් පත්‍රමා-රොප්‍ය දීයතාම්'ති.

**ප්‍රතිහාරී-** ජං දෙවො ආණවෙදි. [ යද්දෙවා'ඥාපයති ]

( **නිෂ්ක්‍රාන්තා** )

6. බැගැරට කළ වෙසෙස් බර ණ
රත් වළලුව වමත දැර ණ
සුදු මැලි වූ දද අමර න
යුතු වැ සිතැ කිඳ

නිදි වැරුමෙන් රත් දෙනුව න
වැරුණ මූත් මොහු සැබැවි න
ඝන ගල ගැ මිණක් ලෙසි න
පෙනේ හැම සඳ

**සානුමතී–** සැබැවින් බැගැර කිරීමෙන් අවමන් කළත් මොහු ගැන ශකුන්තලා දුක්වෙයි.

**රජ–** ( සිනිවිල්ලෙන් සෙදී සෙමින් සිසාරමින් )

7. පියේ මියුලැසි සොඳුර පළමුව පුබුදු කළ නිදි ගත් අහෝ
ම ගේ මළ හද යලිදු පිබිදිනි තැවුල් දුක් විඳිනුව බොහෝ

**සානුමතී–** තාවුස් දූරිය ගේ භාග්‍යයත් මෙ බඳු නො වේ ද ?

**විදූෂක–** (පැත්තෙක සිටැ) මේ තෙම බෙහෙවින් ශකුන්තලා රොගයෙන් මඩනා ලද්දේ යැ. කෙ සේ පිළියම් කටයුතු දැ යි නො දනිමි.

**කඤ්චුකී–** ( එළඹැ ) දේවයන් වහන්සේ දිනෙත්වා, දිනෙත්වා, මහරජතුමනි, “ ප්‍රමද වන ” භූමිය පරීක්ෂා කරන ලදී. මහරජතුමා කැමැති සේ විනොදස්ථානයන් කරා එළඹෙවා.

**රජ–** වෙත්‍රවතිය, ම ගේ වචනයෙන් ආර්‍ය පිශුන ඇමතියාට කියව, බොහෝ නිදි වැරීම නිසා අද අප විනිශ්චයාශනා රූඪ වීමට සුදුසු නො වන බැවින් සොයා බැලියැ යුතු නගර කාර්‍ය වේ නම් එය එතුමා විසින් පතෙකැ ලියා දෙනු ලැබේවා‘යි කියා.

**පිළිහැරිය–** දේවයන් වහන්සේ ගේ අණ ලෙසෙකි

( නික්මෙයි )

**රාජා**- වාතායන, ත්වමපි ස්වං නියෝගමශූන්‍යං කුරු.

**කඤ්චුකී**- යදාඥාපයති දේවඃ. ( නිෂ්ක්‍රාන්තඃ )

**විදූෂකඃ**- කිදං භවදා ණිම්මච්ඡිඅං. සංපදං සිසිරාතවච්ඡේඅරමණිජ්ජෙ ඉමස්සිං පමදවණුද්දෙසෙ අත්තාණං රමඉස්සසි. [කෘතං භවතා නිර්මක්ෂිකම්. සාම්ප්‍රතං ශිශිරා'තපච්ඡේදරමණීයේ'ස්මින් ප්‍රමදවනෝ'ද්දේශ ආත්මානං රමයිෂ්‍යසි.]

**රාජා**- වයස්‍ය, රන්ධ්‍රෝ'පනිපාතිනෝ'නර්ථා ඉති යදුච්‍යතෙ තදව්‍යභිචාරි වචඃ. කුතඃ?

8 මුනිසුතා ප්‍රණයස්මෘතිරෝධිනා
මම ච මුක්තමිදං තමසා මනඃ
මනසිජේන සඛෙ, ප්‍රහරිෂ්‍යතා
ධනුෂි චූතශරශ්ච නිවේශිතඃ

**විදූෂකඃ**- චිට්ඨ දාව, ඉමිණා දණ්ඩකට්ඨෙණ කංදප්පවාණං ණාසඉස්සාමි. [තිෂ්ඨ තාවත්. අනේන දණ්ඩකාෂ්ඨේන කන්දර්පවාණං නාශයිෂ්‍යාමි.]

(දණ්ඩකාෂ්ඨමුද්‍යම්‍ය චූතා'ඞ්කුරං පාතයිතුමිච්ඡති)

**රාජා**- (සස්මිතම්) භවතු. දෘෂ්ටං බ්‍රහ්මවර්චසම්. සඛෙ ක්වෝපවිෂ්ටඃ ප්‍රියායාඃ කිඤ්චිදනුකාරිණීෂු ලතාසු දෘෂ්ටිං විලෝභයාමි.

**විදූෂකඃ**- ණං ආසණ්ණපරිආරිආ චදුරිආ භවදා සංදිට්ඨා මාහවීමංඩවෙ ඉමං වෙලං අදිවාහිස්සං, තහිං මෙ චිත්තඵලඅ ගදං සහත්ථලිහිදං තත්තහොදීඑ සඋන්දලාඑ පඩිකිදිං ආණෙහි ත්ති. [නන්වා'සන්නපරිචාරිකා චතුරිකා භවතා සංදිෂ්ටා. මාධවීමණ්ඩපෙ ඉමාං වෙලාමතිවාහයිෂ්‍යෙ. තත්‍ර මෙ චිත්‍රඵලකගතං ස්වහස්තලිඛිතං තත්‍ර භවත්‍යාඃ ශකුන්තලායාඃ ප්‍රතිකෘතිමානයේ'ති.]

**රජ-** වාතායන, තොප ද නම් නියොගය හිස් නො කරව.

**කඤ්චුකී-** දේවයන් ගේ අණ ලෙසෙකි. ( නික්මෙයි )

**විදූෂක-** ඔබතුමා විසින් මැස්සකුත් නැති කරන ලදී. දැන් සිසිල හා උණුසුම හා නැති මනහර මේ ප්‍රමදවන පියසෙහි තෙමේ සැනසෙනු මැනැව්.

**රජ-** මිත්‍රය, ප්‍රමාදවලින් උවදුරු වැටෙනි යි යමක් කියනු ලැබේ ද, එය නො වරදින වදනෙකි. කෙ සේ ද,

8. මුනිදු ගැනැ වූ හද පෙම් වැරූ
අඳුර දුන් පහ වී යනැ මා හදේ
පහරනා මනයොන් මිතුරේ නිතින්
දුනු දියේ අඹ හී සැකැසුම් කෙළේ

**විදූෂක-** මොහොතක් ඉන්නැ. මේ සැරයටියෙන් මදන හී බිඳින්නෙමි.
( සැරයටිය ඔසොවා අඹ කැකුළු හෙළිමට සිතයි )

**රජ-** ( සිනා සෙමින් ) වේවා ! බමුණු බලය දක්නා ලදිමි. මිත්‍රය, කොහැනෙකැ යෝ සිටැ ප්‍රියාව හා මඳකිනි දු හුරු ලතාවන් කෙරෙහි ඇස් යවමු ද ?

**විදූෂක-** ඔබ ගේ පෞද්ගලික සේවිකාව වූ චාතුරිකාවට ඔබ විසින් මෙ සේ අණ කළා නො වේ ද, “ මාධවී ලිය මඬුවෙහි මේ වේලාව ඉක්මවන්නෙමි: මා අතින් මැ ඇඳි ශකුන්තලා මැනිකිය ගේ චිත්‍ර ඵලකය එහි ගෙනෙව ” යි කියා,

**රාජා**- ඊදෘශං හෘදයවිනෝදනස්ථානම්. තදමුමේව මාර්ගමා
දේශය.

**විදූෂකඃ**- ඉදෙ, ඉදෙ, භවං. [ඉත ඉතෝ භවාන්,]

(උභෞ පරික්‍රාමතඃ සානුමත්‍යනුගච්ඡති)

**විදූෂකඃ**- එසෝ මණිසිලාපට්ටඅසණාහො මාහවීමංඩවො උවහාර රමණිජ්ජදාඑ ණිස්සංසඅං සාඅදෙණ විඅ ණො පඩිච්ඡදි, තා පවිසිඅ ණිසීදදු භවං, [එෂ මණිශිලාපට්ටකසනාථො මාධවීමණ්ඩප උපහාරරමණීයතයා නිඃශංසයං ස්වාගතෙනෙව නෞ ප්‍රතීච්ඡති, තත්ප්‍රවිශ්‍ය නිෂීදතු භවාන්.]

(උභෞ ප්‍රවෙශං කෘත්වො'පවිෂ්ටෞ)

**සානුමතී**- ලදසංස්සිද දෙක්ඛිස්සං දාව සහිඑ පඩිකිදිං, තදෙ සෙ භත්තුණො බහුමුහං අණුරාඅං ණිවෙදඉස්සං. [ලතාසංශ්‍රිතා ද්‍රක්ෂ්‍යාමි තාවත් සඛ්‍යාඃ ප්‍රතිකෘතිම්. තතස්තස්‍යෛ භර්තුර් බහුමුඛමනුරාගං නිවෙදයිෂ්‍යාමි]

(තථා කෘත්වා ස්ථිතා)

**රාජා**- සඛෙ, සර්වමිදානීං ස්මරාමි. ශකුන්තලායාඃ ප්‍රථමවෘත්තාන්තං, කථිතවානස්මි භවතෙ ච. ස භවාන් ප්‍රත්‍යාදෙශවෙලායාං මත්සමීපගතො නා'සීත්? පූර්වමපි න ත්වයා කදාචිත් සංකීර්තිතං තත්‍රභවත්‍යාඃ නාම. කච්චිදහමිව විස්මෘතවානසි ත්වම්?

**විදූෂකඃ**- ණ විසුමරාමි. කිං දු සව්වං කහිඅ අවසාණෙ උණ තුඑ පරිහාස විඅප්පො එසො ණ භූඅත්ථො'ත්ති ආචික්ඛිදං. මඑ පි මිප්පිංඩ බුද්ධිණා තහ එව්වං ගහිදං, අහවා භවිදව්වදා ක්ඛු බලවදී. [න විස්මරාමි. කින්තු-සර්වං කථයිත්වා'වසානෙ පුනස්ත්වයා පරිහාසවිජල්ප එෂ න භූතා'ර්ථ ඉත්‍යා'ඛ්‍යාතම්. මයා'පි මෘත්පිණ්ඩබුද්ධිනා තථෛ'ව ගෘහීතම්. අථවා භවිතව්‍යතා ඛලු බලවතී.]

**රජ**– සිත් නලවන තැන් මෙ බඳු නු ! එ හෙයින් එයට මග පෙන්වනු.

**විදූෂක**– උතුමා මොබින්, මොබින්.

( දෙදෙනා සිසාරති; සානුමතිය ද අනු වැ යයි )

**විදූෂක**– පළිඟු ගල්ලෑල්ලෙකින් හෙබි මේ මාධවී ලිය මඬුව ( කුසුම ) උපහාරයෙන් රමණීය හෙයින් නිසැකයෙන් සාදරයෙන් පිළිගැනීම පිණිස අප කැඳවන්නාක් මෙනි. එ හෙයින් එහි ගොස් ඔබ වහන්සේ වැඩැ හිඳිනු මැනැවි.

( දෙදෙනා මැ පිවිසැ, හිඳිති )

**සානුමති**– ඉතින් වැලින් මුවා වී සෙහෙළිය ගේ සේරුව බැලියැ යුතු යි. පසු වැ හිමියා ගේ තන් අයුරින් පවතින ස්නේහය ඈට දන්වමි.

( එ සේ සැඟ වී සිටියි )

**රජ**– මිත්‍රය, දූන් ශකුන්තලා පිළිබඳ අතීත සිද්ධිය සම්පූර්ණ යෙන් සිහි කරමි. ඔබට ද එය කියා ඇති. ඒ ඔබත් ඈ පිට මං කරන වේලෙහි මා ළඟ නො සිටියේ ද ? කලිනුත් ඔබ විසින් කිසි විටෙකැ ඒ තැනැත්තිය ගේ නම නො කියන ලදී. ඔබත් මං මෙන් අවසිහියෙන් සිටියෝ ද ?

**විදූෂක**– අවසිහියෙන් නො සිටියෙමි. කිම, ඔබ වහන්සේ විසින් සියල්ල කියා අවසනැ යලි මේ විහිළු අදහස් මසැ ඇත්හ නො වේ යැයි කියන ලද්දේ නො වේ ද? මා විසිනුදු මැටි මොළෙන් එය එ සේ යැයි ගන්නා ලදී. නොහොත් ඉරණම සැබැවින් බලවති.

**සානුමතී**- එව්වං ණේ'දං [එවං නු ඉදම්]

**රාජා**- (ධ්‍යාත්වා) සඛෙ, ත්‍රායස්ව මාම්!

**විදූෂකඃ**- භො, කිං එදං, අණුච්චණ්ණං ක්ඛු ඊදිසං තුහ. කදා වි සප්පුරිසා සොඅපත්තව්වාණො ණ හොංති. ණං පවාතෙ පි ණික්කංපා ගිරිඔ. [භොඃ කිමෙතද්. අනුපපන්නං ඛල්වීදෘශං ත්වයි. කදා'පි සත්පුරුෂාඃ ශොක ප්‍රාප්තා'ත්මනො න භවන්ති ප්‍රවාතෙ'පි නිෂ්කම්පා ගිරයඃ]

**රාජා**- වයස්‍ය, නිරාකරණ වික්ලවායාඃ ප්‍රියායාඃ සමව-ස්ථාමනුස්මෘත්‍ය බලවදශරණො'ස්මි. සා හි,

9 ඉතඃ ප්‍රත්‍යා'දෙශාත් ස්වජනමනුගන්තුං ව්‍යවසිතා
ස්ථිතා තිෂ්ඨෙත්‍යු'ච්චෛර් වදති ගුරුශිෂ්‍යෙ ගුරුසමෙ
පුනර් දෘෂ්ටිං බාෂ්පප්‍රසර කලුෂාමර්පිතවතී
මයි ක්‍රූරෙ යත් තත් සවිෂමිවශල්‍යං දහති මාම්

**සානුමතී**- අම්මහෙ, ඊදිසී සකජ්ජ පරදා. ඉමස්ස සංදවෙණ අහං රමාමි. [අහො! ඊදෘශී ස්වකාර්‍යපරතා. අස්‍ය සන්තාපෙනා'හං රමෙ.]

**විදූෂකඃ**- භො, අත්ථි මෙ තක්කො කෙණ වි තත්තහොදී ආආසචාරිණා ණීදං ත්ති. [භොඃ, අස්ති මෙ තර්කඃ, කෙනා'පි තත්‍ර භවත්‍යා'කාශචාරිණා නීතෙ'ති]

**රාජා**- කඃ පතිදෙවතාමන්‍යඃ පරාමෂ්ටුමුත්සහෙත, මෙනකා කිල සඛ්‍යාස්තෙ ජන්මප්‍රතිෂ්ඨෙ'ති ශ්‍රුතවාන'ස්මි. තත්ස-හචාරිණීභිඃ සඛී තෙ හෘතෙ'ති මෙ හෘදයං ආශංකතෙ

**සානුමතී**- සම්මොහො ක්ඛු විම්හඅණිජ්ජො ණ පඩිබොහො. [සම්මොහඃ ඛලු විස්මයනීයඃ, න ප්‍රතිබොධඃ.]

**සානුමතී–** මෙයත් එ සේ මැයි!

**රජ–** (චින්තා වසඟ වැ) මිත්‍රය, මා රැකැ ගන්නැ.

**විදූෂක–** ඕ! මේ කිමෙක් ද? ඔබ වහන්සේට මෙ බඳු දෙයක් කිසි දිනෙකැ නො වෙයි. සත්පුරුෂයෝ සොවින් වෙළුණු සිත් ඇත්තෝ නො වෙත්. කුණාටුවෙහි පවා කඳු නො සැලෙයි.

**රජ–** මිත්‍රය, පිට මං කිරීමෙන් දුක්වෙන ප්‍රියාව ගේ එම අවස්ථාව සිහිකොටැ සැබැවින් බැගැ වෙමි. ඈ ද,

9 මොබින් එලවූ කල්හි ඈ–සියත් හා යනු තැත් කරත්
ගුරුත් හා සම සිසු විසින් "සිටුව" යැයි රළු හඬ නඟත්
නෙත් දියෙන් අහො අඳුරු වූ–නුවන් රළු මා වෙත හෙළූ
යන යමෙක් වේද එය දවයි–විස හුලක් මෙන් මා හදේ

**සානුමතී–** අම්මෝ! ස්වකාර්යයෙහි නියැලීම මෙ බඳු ද? මොහු ගේ තැවීමෙන් මම ප්‍රීති වෙමි.

**විදූෂක–** ඕ! ඒ උත්තමාව කිසියම් ආකාශ චාරියකු විසින් ගෙනැ යන ලද්දේ දෝ යි මට සැකයෙකි.

**රජ–** පතිව්‍රතා ඈය ස්පර්ශ කරන්නට අන් කවරෙක් උත්සාහ කරත් ද? මෙනකාව ඔබ යෙහෙළිය ගේ උත්පත්තියට හේතු වීයැ යි ඇසූ විරිමි. ඒ හෙයින් ඔබ ගේ යෙහෙළිය ඈ ගේ සහකාරියන් විසින් ගෙනැ යන ලදැයි මගේ සිත සැක කරයි.

**සානුමතී–** මූළාව සැබැවින් පුදුමය පිණිස වේ. අවබොධය පිණිස නො වේ.

**විදූෂකඃ**- ජඉ එව්වං අත්ථි ඛු සමාඅමො කාලෙණ, තත්තභො-හොදීඑ. [යද්‍යෙ'වමස්ති ඛලු සමාගමඃ කාලෙන තත්‍රභවත්‍යාඃ]

**රාජා**- කථමිව?

**විදූෂකඃ**- ණ ඛු මාදාපිදරා භත්තුවිඔඅ දුක්ඛිදං දුහිදරං දෙක්ඛිදුං පාරෙන්ති [න ඛලු මාතාපිතරෞ භර්තෘවියොගදුඃඛිතාං දුහිතරං ද්‍රෂ්ටුං පාරයතඃ.]

**රාජා**- වයස්‍ය.

10. ස්වප්නො නු මායා නු මතිභ්‍රමො නු
ක්ලිෂ්ටං නු තාවත් ඵලමෙව පුණ්‍යම්
අසන්නිවෘත්ත්‍යෛ තදතීතමෙතෙ
මනොරථා නාම තට ප්‍රපාතාඃ.

**විදූෂකඃ**- මා එව්වං. නං අංගුලිඅඅං එව්ව ණිදංසණං අවස්සංභාවි අචිංතණිජ්ජො සමාඅමො හොදි ත්ති. [මෛවම්, නන්වඞ්ගුලීයකමෙව නිදර්ශනමවශ්‍යම්භාව්‍ය-'චින්තනීයඃ සමාගමො භවතී'ති]

**රාජා**- (අංගුලියකං විලොක්‍ය) අයෙ! ඉදං තාවදසුල-භස්ථාන භ්‍රංශි ශොචනීයම්.

**11.** තව සුචරිතමඞ්ගුලීය නූනං ප්‍රතනු මමෙව විභාව්‍යතෙ
ඵලෙන
අරුණනඛ මනොහරාසු තස්‍යාශ්චුතමසි ලබ්ධපදං
යදඞ්ගුලීෂු

**සානුමතී**- ජඉ අණ්ණහත්ථගදං භවෙ. සච්චං එව්ව සොඅණිජ්ජං භවෙ. [යද්‍යන්‍යහස්තගතං භවෙත්, සත්‍යමෙව ශොචනීයං භවෙත්]

**විදූෂකඃ**- භො, ඉඅං ණාමමුද්දා කෙණ උග්ඝාදෙණ තත්ථ-හොදීඑ හත්ථාබ්භාසං පාවිදා. [භොඃ, ඉමං නාමමුද්‍රා කෙනො'ද්ඝාතෙන තත්‍රභවත්‍යා හස්තා'භ්‍යාසං ප්‍රාපිතා

**විදූෂක**- එ සේ නම් ඇය කලෙකින් එන් බිය හැකි යි.

**රජ**- ඒ කෙ සේ ද?

**විදූෂක**- සැබැවින් මව්පියෝ ස්වාමි වියෝගයෙන් දුකට පැමිණි දුව දකිමට සමත් නො වෙති.

**රජ**- මිත්‍රය,

10. මායා, මුළාවෙක් ව ද, සිතයෙක් දෙ
ගෙවී ගියා වූ සුසිරිත් පලෙක් දෙ
ඉක්මී ගියා ළං නො වනා නිසාවෙන්
පාලා බිඳුම් වැන්නැ සිතේ හැඟුම නම්

**විදූෂක**- එ සේ නො වේ. මුදුව තිදසුනෙක් මැ නො වේ ද? නො සිතියැ හැකි ලෙස අවශ්‍යයෙන් මැ එක්වීම සිදු වන්නේ යැ.

**රජ**- ( මුදුව දෙස බලා ) අනේ ! පහසුවෙන් නො ලැබියැ තැනෙකින් ගිලිහුණු මෙය සැබැවින් දුක් එළවයි.

11. අහ ! අහ ! මුදුවේ ඔබේ පිනත් මේ
සුලුවුණු බැව් සැලැකේ අනේ, ම ගේ මෙන්
විසුම්වසරයක් හලේ නු ඈ ගේ
අරුණළු පෑ නියවත් සුරම් ඇඟිල්ලේ

**සානුමතී**- ඉදින් අනිකකු ගේ අතට පැමිණියේ නම් සැබැවට මැ දුක් වියැ යුතු වේ.

**විදූෂක**- ඕ ! මේ පේරස් මුද්ද කුමන අවස්ථාවක දී ඒ උත්තමාව ගේ අතැ පැළඳැ වූයෙහි ද ?

**සානුමතී**- මම වි කොදූහලෙණ ආආපිදෙ එසො. [ මමා'පි කෞතූහලෙනා'කාරිත එෂඃ ]

**රාජා**- ශ්‍රූයතාම්. ස්වනගරාය ප්‍රස්ථිතං මාං ප්‍රියා සබාෂ්පමාහ. " කියච්චිරෙණා'ර්‍ය්‍යපුත්‍රඃ ප්‍රතිපත්තිං දාස්‍යති " ති.

**විදූෂකඃ**- තදො, තදො ? [ තතස්තතඃ ]

**රාජා**- පශ්චාදිමාං මුද්‍රාං තදඞ්ගුලෞ ප්‍රවෙශයතා මයා ප්‍රත්‍යා'භිහිතා-

12 එකෛක'මත්‍ර දිවසෙ දිවසෙ මදීයං
නාමා'ක්‍ෂරං ගණය ගච්ඡසි යාවදන්තම්
තාවත්ප්‍රියෙ මදවරොධ ගෘහ ප්‍රවෙශම්
නෙතා ජනස්තව සමීපමුපෛෂ්‍යතී'ති.

තච්චදාරුණා'ත්මනා මයා මොහාන්නානුෂ්ඨිතම්.

**සානුමතී**- රමණීඔ කඛු අවහී විහිණා විසංවාදිදො [ රමණීයො ඛල්ව'වධිර්විධිනා විසංවාදිතඃ. ]

**විදූෂකඃ**- කහං ධීවලකප්පිඅස්ස ලොහිඅමච්ඡස්ස උදලබ්භන්තලෙ ආසි. ? [ කථං ධීවරකල්පිතස්‍ය රොහිතමත්ස්‍යස්‍යොදරාභ්‍යන්තරෙ ආසීත් ? ]

**රාජා**- ශචීතීර්ථං වන්දමානායාඃ සඛ්‍යාස්තෙ හස්තාද් ගංගා ස්‍රොතසි පරිභ්‍රෂ්ටම්.

**විදූෂකඃ**- ජුජ්ජඉ. [යුජ්‍යතෙ]

**සානුමතී**- අදො එව්ව තවස්සිණීඑ සඋන්දලාඑ අධම්මභීරුණො ඉමස්ස රාඑසිණො පරිණඑ සංදෙහො ආසි, අහවා ඊදිසො අණුරාඔ අහිණ්ණාණං අවෙක්ඛදි? කහං විඅ එදං? [අත එව තපස්වින්‍යාඃ ශකුන්තලායාඃ අධර්මභීරොරස්‍ය රාජර්ෂෙඃ පරිණයෙ සන්දෙහ ආසීත්. අථවා ඊදෘශො'නුරාගො'භිඥානමපෙක්ෂතෙ? කථමිවෛ'තත්?]

**රාජා**- උපාලප්ස්‍යෙ තාවදිදමඞ්ගුලීයකම්.

**සානුමතී-** මොහු ද මගේ මැ වැනි කුතුහලයක් ඇති කළා.

**රජ-** සවත් දෙන්නෑ, සිය නුවරට (රමට) පිටත් වූ මට ප්‍රියාව කඳුලින් යුතු වැ "කොපමණ කලෙකින් ම ගේ ස්වාමියා මට තොරතුරු දන්වන්නේ දෑ"යි ඇසූවා.

**විදූෂක-** ඉනික්, ඉනික්?

**රජ-** පසු වැ මේ මුද්‍රුව ඇගේ ඇඟිල්ලේ පළඳවනු ලැබූ මා විසින් මෙ සේ පිළිතුරු දෙන ලදී.

12 පාසා දිනක් එකිනෙකින් නො තබා ගණින්නේ
මා නම් වණත් දිනෙකෑ යම් අවසන් වැ යේ නම්
මා ගේ පියේ ඔබ සුදත් ගෙවදුම් කරන්නා
වූ යම් අයෙක් එදිනෑ එත් ඔබ වෙත් සෑකෙක් නෑ.

එයත් දරුණු සිතැති මා විසින් සිහි මුළාවෙන් ඉටු නො කැරිණි.

**සානුමතී-** සැබැවින් ලක්‍ෂණ පොරොන්දුවක් දෛවය විසින් නිෂ්පල කැරිණි.

**විදූෂක-** ධීවරයා කැපූ රෝහිත මත්ස්‍යයා ගේ කුසෙහි මුද්‍රුව කෙ සේ වී ද?

**රජ-** සචී තීර්‍ථ පූජාවෙහි යෙදුණු ඔබ ගේ යෙහෙළිය ගේ අතින් එය ගංගා ජලයට වැටිණි.

**විදූෂක-** හරි,

**සානුමතී-** ඒ හෙතුවෙන් මැ පාපභිරුක මේ රජතුමාට ශකුන්තලා තවුස් දූරිය ගේ ආවාහයෙහි සැක ඇති විය. නො එසේ නම් එබඳු ප්‍රෙමයකට සිහිවටනයෙක් අවශ්‍ය ද? මෙය කෙබඳු වී ද?

**රජ-** දැන් මේ මුද්දට දෙස් තහමි.

**විදූෂකඃ-** ( ආත්මගතම් ) ගහිදො ණෙණ පංථා උම්මත්තආණං. [ ගෘහීතො,නෙන පන්ථා උන්මත්තකානාම් ]

**රාජා-** 13. කථං නු තං බන්ධුර කොමලාඞ්ගුලිං
කරං විහායාසි නිමග්නමම්භසි

අථවා

අචෙතනං නාම ගුණං න ලක්ෂයෙන්
මයෛව කස්මාදවධීරිතා ප්‍රියා.

**විදූෂකඃ-** ( ආත්මගතම් ) කහං බුහුක්ඛාඑ ඛාදිදව්වො ම්හි. [ කථං බුභුක්ෂයා ඛාදිතව්‍යො'ස්මි. ]

**රාජා-** අකාරණ පරිත්‍යක්තො අනුශයතප්තහෘදයස්තාවදනු-කම්ප්‍යතාමයං ජනඃ පුනර්දර්ශනෙන.

**චතුරිකා-** ( ප්‍රවිශ්‍යාපටීක්ෂෙපෙන චිත්‍ර ඵලක හස්තා ) ඉඅං චිත්තගදා භට්ටිණී. [ ඉයං චිත්‍රගතා භට්ටිනී ] ( චිත්‍ර ඵලකං දර්ශයති ]

**විදූෂකඃ-** සාහු වඅස්ස, මහුරාවත්ථාණ දංසණිජ්ජො භාවා-ණුප්පවෙසො. ඛලදි විඅ මෙ දිට්ඨි ණිණ්ණුණ්ණෙසු අප්පදෙසෙසු. [ සාධු වයස්‍ය, මධුරා'වස්ථාන දර්ශනීයො භාවා'නුප්‍රවෙශඃ. ස්ඛලතී'ව මෙ දෘෂ්ටිර් නිම්නො'න්නත-ප්‍රදෙශෙෂු ]

**සානුමතී-** අම්මො ! එසො රාඑසිණො ණිඋණදා. ජාණෙ සහී අග්ගදො මෙ වට්ටදි ත්ති. [ අහෝ එෂ රාජර්ෂෙඃ නිපුණතා. ජානෙ සඛ්‍යා'ග්‍රතො මෙ වර්තත ඉති ]

**රාජා-**

14. යද්‍යත් සාධු න චිත්‍රෙ ස්‍යාත් ක්‍රියතෙ තත් තදන්‍යථා
තථාපි තස්‍යා ලාවණ්‍යං රෙඛයා කිඤ්චිදන්විතම්.

**සානුමතී-** සරිසං එදං පච්ඡාදාවගරුණො සිණෙහස්ස අණවලෙහස්ස අ. [ සදෘශමෙතද් පශ්චාත්තාපගුරොඃ ස්නේහස්‍යා'නවලෙපස්‍ය ච. ]

**විදූෂක**– (තමාට මැ) පිස්සන් ගේ මඟ මොහු විසින් ගන්නා ලදී.

**රජ**–

13 ගඟ දියේ නා කෙසේ ගැලුනී දේ හැර දමා ඒ සුරම් අනැඟිලි
නැතහොත්
නැති හෙයින් සිත එ සේ වූ නමුත්. මා අනේ! ඇයි,
ගලේ ඇය ඝලී?

**විදූෂක**– (තමාට මැ) කෙසේ නම් බඩගින්නට කෑ යුතු වෙම් ද?

**රජ**– නිකරුණේ පිටමං කළ තැනැත්තිය, තැවෙන හදැති මේ අය නැවත දැක්මෙන් අනුකම්පා කෙරේවා.

**චතුරිකා**– (තිරය මැත්කොට චිත්‍ර ඵලකය ගෙනැ පැමිණැ) මේ ස්වාමි දුව ගේ පින්තූරය. (චිත්‍ර ඵලකය පෙන්වයි)

**විදූෂක**– සම්භාවනීය මිත්‍රය, මනා ඇඳිමෙන් සුන්දර වූ භාවානුප්‍රවෙශ ඇති මේ චිත්‍රයෙහි උස් පහත් තන්හි මගේ ඇස පැකිළෙන්නාක් මෙනි.

**සානුමතී**– අම්මෝ! මේ රජතුමා ගේ නිපුණකම! යෙහෙළිය මා ඉදිරියෙහි සිටින්නාක් මෙනි.

**රජ**–

14 සිතියමැ යම් දෙයෙක් නො වෙද එ දෙය කෙරෙයි
අන් ලෙසෙකින්
එ සේ කළ ද රේඛායෙන් එරුව ඇඳුනි යම්තමකින්

**සානුමතී**– පසුතැවිල්ලෙන් අධික වැ වැඩුණු ස්නේහයට ද නිරහඞ්කාරතාවයට ද මෙය සුදුසු යි.

**විදූෂකඃ**- භො, දාණිං තිණ්ණි තත්තභොදීඔ දීසංති. සව්වාඔ අ දංසණීආඔ. කදමා ඉත්ථ තත්තභොදී සඋන්දලා ? [ භොඃ, ඉදානීං තිස්‍රස්තත්‍රභවත්‍යො දෘශ්‍යන්තෙ. සර්වාශ්ච දර්ශනීයාඃ, කතමා'ත්‍ර තත්‍ර භවතී ශකුන්තලා ? ]

**සානුමතී**- අණභිණ්ණො ක්ඛු ඊදිසස්ස රූවස්ස මොහදිට්ඨී අඅං ජණො. [ අනභිඥඃ ඛල්වී'දෘශස්‍ය රූපස්‍ය මොඝදෘෂ්ටිරයං ජනඃ. ]

**රාජා**- ත්වං තාවත් කතමාං තර්කයසි ?

**විදූෂකඃ**- ( නිරූප්‍ය ) තක්කෙමි ජා එසා සිඪිලකෙසබංධණුව්වංතකුසුමෙණ කෙසංතෙණ උබ්භිණ්ණසෙඅබිංදුණා වඅණෙණ ! විසෙසදො ඔසරිආහිං බාහාහිං අවසෙඅසිණිද්ධතරුණපල්ලවස්ස චූඅපාඅවස්ස පාසෙ ඊසිපරිස්සංතා විඅ ආලිහිදා, සා සඋන්දලා. ඉදරාඔ සහීඔ ත්ති. [ තර්කයාමි යෙ'ෂා'පසෘතාභ්‍යාං බාහුභ්‍යාමවසෙකස්නිග්ධතරුණපල්ලවස්‍ය චූතපාදපස්‍ය පාර්ශ්ව ඊෂත්පරිශ්‍රාන්තෙ'වා'ලිඛිතා සා ශකුන්තලා. ඉතරෙ සඛ්‍යාවි'ති]

**රාජා**- නිපුණො භවාන්, අස්ත්‍ය'ත්‍ර මෙ භාවචිහ්නම්.

15 ස්වින්නා'ඞ්ගුලි විනිවෙශො රෙඛාප්‍රාන්තෙෂ්වදෘශ්‍යතෙ මලිනඃ
අශ්‍රු ච කපොල පතිතං දෘශ්‍යමිදං වර්ණිකොච්ඡ්වාසාත්

චතුරිකෙ, අර්ධා'ලිඛිතමෙතද් විනොදස්ථානං; ගච්ඡ
වර්තිකා තාවදානය.

**චතුරිකා**- අජ්ජ මාඪව්ව, අවලංබ චිත්තඵලඅං ජාව ආඅච්ඡාමි. [ ආර්‍ය මාඪව්‍ය, අවලම්බස්ව චිත්‍රඵලකම්. යාවදාගච්ඡාමි. ]

**රාජා**- අහමෙව තදවලම්බෙ. ( යථො'ක්තං කරොති )

( චෙටී නිෂ්ක්‍රාන්තා )

**රාජා**- අහං හි.

**විදූෂක–** ඕ! දූත් මෙහි මහත්මාවෝ තිදෙනෙක් දක්නා ලැබෙති. සියල්ලෝ මැ දකුම්කළුය හ. මෙහි සිටින ඒ ශකුන්තලා මහත්මිය කවරී ද?

**සානුමතී–** සැබැවින් මෙ බඳු රුවක් හඳුනා ගැනීමට හැරි මොහු සාණෙකි.

**රජ–** ඔබ කවුරුන් පියැ හැකි යැ යි සිතන්නාහු ද?

**විදූෂක–** (පරීක්ෂාවෙන් බලා) ඕ මෝ ලිහිල් කෙස් බැඳු මෙන් විසුරුණු මල් ඇති වැ, කෙසගින් වැගිරෙන ඩා බිඳුවලින් ගෙබි මූව ඇති වැ, විශෙෂයෙන් පහත යෙලූ අත් ඇති වැ දිය ඉසිමෙන් බබලන ළපලු ඇති මී අඹ ගසැ පසෙකැ මඳක් විඩා ඇත්තියක සේ සිතුවම් කොටැ ඇත්තේ ඒ ශකුන්තලාව යි. අතින් දෙන්නා ඇගේ යෙහෙළියන් යයි සිතමි.

**රජ–** ඔබ බොහො මැ දක්ෂ යි. මෙහි ම ගේ සිතැගි දුක් වෙන සලකුණෙක් ද වෙයි.

15 ඩහ වැකී ඇඟිල්ලෙන් මලින වැ ගිය එ සඳ
සිතුවම් තීරයෙහි දිස් වේ ලකුණු වැද
මේ ඇය කොපොල් තලැ ගිලිහුණු කදුළු බිඳ
සායම් මතැ වැදුණු සුසුමින් නො පළ වෙද

චතුරිකා, මේ ප්‍රෙම නිධානය නිමවූයේ අඩෙකිනි. යව, පින්සල ගෙනෙව.

**චතුරිකා–** මාණ්ඩව්‍ය මහතාණෙනි, මා එත තුරැ ඵලකය අල්වා ගන්නැ

**රජ–** මම මැ එය අල්ලා ගන්නම්. ( කියූ ලෙසින් කරයි )

( දැසිය නික්මෙයි )

**රජ–** මා වතාහි

16. සාක්ෂාත් ප්‍රියාමුපගතාමපහාය පූර්වං
චිත්‍රාර්පිතාං පුනරිමාං බහුමන්‍යමානඃ
ස්‍රොතොවහං පථි නිකාමජලාමතීත්‍ය
ජාතඃ සඛෙ ප්‍රණයවාන් මෘගතෘෂ්ණිකායාම්.

**විදූෂකඃ**– (ආත්මගතම්) එසො අත්තභවං ණදිං අතික්කමිඅ මිඅතිංහිආං සංකන්තො. (ප්‍රකාශම්) භො, අවරං කිං එත්ථ ලිහිදව්වං ? [එෂො'ත්‍ර භවාන්නදීමතික්‍රම්‍ය මෘගතෘෂ්ණිකාං සංක්‍රාන්තඃ. භොඃ, අපරං කිමත්‍ර ලිඛිතව්‍යම් ? ]

**සානුමතී**– ජො ජො පදෙසො සහිඑ මෙ අහිරූවො, තං තං ආලිහිදුකාමො භවෙ. [යො යඃ ප්‍රදෙශඃ සඛ්‍යා මෙ'භිරූපස්තං තමාලිඛිතුකාමො භවෙත් ]

**රාජා**– ශ්‍රූයතාම්.

17. කාය්‍යා සෛකතලීන හංසමිථුනා ස්‍රොතොවහා මාලිනී
පාදස්තාමභිතො නිෂණ්ණ හරිණා ගෞරී ගුරොඃ පාවනාඃ
ශාඛාලම්බිත වල්කලස්‍ය ච තරොර් නිර්මාතු මිච්ඡාම්‍ය'ධඃ
ශෘඞ්ගෙ කෘෂ්ණමෘගස්‍ය වාමනයනං කණ්ඩූයමානාං මෘගීම්.

**විදූෂකඃ**– (ආත්මගතම්) ජහ අහං දෙක්ඛාමි. පූරිදව්වං ණෙණ චිත්තඵලඅං ලංබකුච්චාණං තාවසාණං කදංබෙහිං [යථා'හං පශ්‍යාමි, පූරයිතව්‍යමනෙන චිත්‍ර ඵලකං ලම්බකූර්චානාං තාපසානාං කදම්බෛඃ. ]

**රාජා**– වයස්‍ය, අන්‍යච්ච. ශකුන්තලායාඃ ප්‍රසාධනමභිප්‍රෙත-මත්‍රවිස්මෘතමස්මාභිඃ.

**විදූෂකඃ**– කිං විඅ ? [ කිමිව ? ]

**සානුමතී**– වණවාසස්ස සොඋමාරස්ස විණඅස්ස අ ජං සරිසං භවිස්සදි. [ වනවාසස්‍ය සෞකුමාර්‍යස්‍ය විනයස්‍ය ච යත් සදෘශං භවිෂ්‍යති ]

16. පත් වූ තමා වෙත ඉබේ හැර ද පියාවින්
සිත්තම් නැඟූ ඇය වෙතේ බුහුමන් කරන්නා
සත්තෙන් මගක් හැර දමා දියවන් ගඟක් වූ
ආසා කරන්නකු මෙනි මුවතන් අනේ! මා

**විදූෂක-** ( තමාට මැ ) මෙන්න, ගඟ ඉක්මවා මිරිඟුව පස්සේ යන අය. (ශබ්ද නඟා) හා! මෙහි කුමක් ඇඳිය යුතු ද?

**සානුමතී-** යම් යම් තැනක් ම ගේ යෙහෙළිය ගේ මනොඥ වේ ද, ඒ ඒ තැන් අඳිනු කැමැති වෙයි.

**රජ-** අසනු මැනැවි.

17. මාලිනී වැලි තෙලේ ලැගුණු හස් යුවලක් සමග සො ද
එය අවට මැ වැතිර සිටින මුව කැල යුතු හිමවු ස ද
පිවිතුරු කඳු වැටියැ තුරෙකැ වැහැරිද එල්බෙන සෙ යොද
එහි මුලැ මුව අඟැ'ස කසන මුවැත්තියක අඳිමි ස ද

**විදූෂක-** ( තමාට මැ ) මට හැඟෙන හැටියට මොහු විසින් එල්බෙන රවුල් ඇති තවුසන් රැළෙකින් චිත්‍ර ඵලකය පිරවිය යුතු.

**රජ-** මිත්‍රය, තව එකක්. අප විසින් අදහස් කළ, ශකුන්තලා වන් ගේ පළඳනාව මෙහි ඇඳීමට අමතක විණි.

**විදූෂක-** කෙ සේ ද?

**සානුමතී-** ඇ ගේ වන වැසි බවට, සුකුමාර බවට හා ලජ්ජා, ශිලී බවට ද යමක් සුදුසු වන්නේ ද එය.

**රාජා**- 18 කෘතං න කර්ණා'ර්පිත බන්ධනං සඛෙ
ශිරීෂමාගණ්ඩ විලම්බි කෙසරම්.
න වා ශරච්චන්ද්‍ර මරීචි කොමලං
මෘණාලසූත්‍රං රචිතං ස්තනා'න්තරෙ.

**විදූෂකඃ**- භො, කිං නු තත්තභොදී රත්තපල්ලවසොහිණා අග්ගහත්ථෙණ මුහං ආවාරිඅ චඉද චඉදා විඅ ඨිදා. ( සාවධානං නිරූප්‍ය ) ආ ! එසො දාසිඑ පුත්තො කුසුමරසපාඩච්චරෙ තත්තභොදීඑ වඅණං අහිලංඝදි මහුඅරෙ. [භොඃ, කිංනු තත්‍රභවතී රක්තපල්ලවශොභිනා'ග්‍රහස්තෙන මුඛමපවාර්‍ය චකිත චකිතෙ'ව ස්ථිතා. ආඃ ! එෂ දාස්‍යාඃ පුත්‍රඃ කුසුමරසපාටච්චරස්තත්‍ර භවත්‍යා වදනමභිලඞ්ඝතෙ මධුකරඃ. ]

**රාජා**- නනු වාරිතාමෙෂ ධෘෂ්ටඃ.

**විදූෂකඃ**- භවං එව්ව අවිණීදාණං සාසිදා. ඉමස්ස වාරණෙ පහවිස්සදි. [ භවානෙන'ව'විනීතානාං ශාසිතා'ස්‍ය වාරණෙ ප්‍රභවිෂ්‍යති ]

**රාජා**- යුජ්‍යතෙ, අයි ! භොඃ, කුසුමලතා ප්‍රියා'තිථෙ, කිමත්‍ර පරිපතන ඛෙදමනුභවසි ?

19. එෂා කුසුමනිෂණ්ණා තෘෂිතා'පි සතී භවන්තමනුරක්තා ප්‍රතිපාලයති මධුකරී න ඛලු මධු විනා ත්වයා පිබති.

**සානුමතී**- අජ්ජ අභිජාදං කඛු එසො වාරිදෙ. [ අද්‍යා'භිජාතං ඛල්වෙ'ෂ වාරිතඃ ]

**විදූෂකඃ**- පඩිසිද්ධා වි වාමා එසා ජාදී. [ ප්‍රතිෂිද්ධා'පි වාමෛෂා ජාතිඃ ]

**රාජා**- එවං භොඃ, න මෙ ශාසනෙ තිෂ්ඨසි. ශ්‍රූයතාං තර්හි සම්ප්‍රති.

20. අක්ලිෂ්ට බාලතරුපල්ලව ලොභනීයං
පීතං මයා සදයමෙව රතො'ත්සවෙෂු
බිම්බා'ධරං ස්පෘශසි චෙද් භ්‍රමර. ප්‍රියායා-
ස්ත්වාං කාරයාමි කමලො'දර බන්ධනස්ථම්.

**රජ–**

18. සිරිස මල් රොන් ලඹ දුන් කොපොල් තෙක්
සවන් බැඳීමත් නො කෙළේ නු මා බදේ
දෙ තන් තුරේ ඒ ඇඳ නෑ ගරන් මොළොක්
සරා සඳේ පෑ සියපත් හුයෙන් නෑනු.

**විදූෂක–** හා ! ඇයි, ඒ මහත්මිය රත් ළ-පලු මෙන් බබලන අත්ලෙන් මුව වසා නැති ගත්තාක් මෙන් සිටින්නේ ? ( ලංවැ බලා ) ආ ! මේ වෙසඟන පුප් මල් පැනි හොරා, මී මැස්සා ඈ ගේ මුහුණ පෙළයි.

**රජ–** ඒ දුෂ්ටයා වැලැකියැ යුතු නො වේ ද ?

**විදූෂක–** අවිනීතයන් හික්මවන්නා ඔබතුමා මැ බැවින් මූ වැලැක්වීමෙහි ද ඔබ මැ සමර්ථ යි.

**රජ–** හරි. ආ ! බොල, මල් වැල් ප්‍රිය ආගන්තුකය, ඈයි, මෙ තැනැ බැමීමෙන් ළ-ත වන්නේ ?

19. ල ගි මි න් මලෙහැ නා වෙත බැඳි සෙනෙහසැ' ති
ප වි සි න් පෙලෙන මේ බමරිය බලනු රැ නි
සි ත මි න් හොප ගැනැමැ ඈය මෙහි සිටිනු වෙ නි
තොපගෙන් වියො වැ මල් පැනි නො මැ උරනු ඇ නි

**සානුමතී–** සැබැවින් අද මොහු ආචාරවත් වැ වැලැක් වියැ යුතුයි.

**විදූෂක–** මේ වගීයේ සත්තු එලෙව්වොත් මුරණ්ඩු වෙති.

**රජ–** ඔව්, එසේ යැ. ම ගේ අණැ නො සිටින්නෙහි ද? එ සේ නම් දූන් කන් දෙනු.

20. ආසා බරින් රති මඟුල්හි දි පී බිඹුත් තොල්
ඒ මා පියා නො මැ කැලැල් තුරු පල්ලවන් වන්
යම් සේ පහස්නෙහි වෙතොත් බමරෝ, ඉදින් තා
මම් දූන් තබන්නෙමි කමල් ගැබැ හා ! බැඳුම් ලා

**විදූෂකඃ**– එව්වං තික්ඛණ දංඩස්ස කිං ණ හාඉස්සදි ?

( ප්‍රහස්‍යා'ත්මගතම් ) එසො දව උම්මත්තො. අහං වි එදස්ස සංගෙණ ඊදිස වණ්ණො විඅ සංවුත්තො. ( ප්‍රකාශම් ) භො, චිත්තං ක්ඛු එදං. [ එවං තීක්ෂණ–දණ්ඩස්‍ය කිං න හෙෂ්‍යති ? එෂ තාවදුන්මත්තඃ, අහම–ප්‍යෙ'තස්‍ය සඞ්ගෙනෙ'දෘශවර්ණ ඉව සංවෘත්තඃ. භොඃ චිත්‍රං ඛල්වෙ'තත්. ]

**රාජා**– කථං විභ්‍රම් ?

**සානුමතී**– අහං පි දාණිං අවගදත්ථා. කිං උණ ජහාලිහිදාණුභාවී එසො. [ අහමපි'දානීමවගතා,ර්ථා. කිං පුනර් යථා'ලිඛිතා–'නුභාවේ‍ය'ෂඃ ]

**රාජා**– වයස්‍ය, කිමිදමනුෂ්ඨිතං පෞරොභාග්‍යම්.

21. දර්ශන සුඛ මනුභවතඃ සාක්ෂාදිව තන්මයෙන හෘදයෙන
ස්මෘතිකාරිණා ත්වයා පුනරපි චිත්‍රීකෘතා කාන්තා.

( බාෂ්පං විහරති )

**සානුමති**– පුව්වාවර විරොහී අපුව්වො එසො විරහමග්ගො. [ පූර්වාපරවිරොධ්‍ය'පූර්ව එෂ විරහමාර්ගඃ ]

**රාජා**– වයස්‍ය, කථමෙවමවිශ්‍රාන්ත දුඃඛමනුභවාමි ?

22. ප්‍රජාගරාත් ඛිලීභූතස්තස්‍යාඃ ස්වප්නෙ සමාගමඃ
බාෂ්පස්තු න දදාත්‍යෙ'නාං ද්‍රෂ්ටුං චිත්‍රගතාමපි..

**සානුමතී**– සව්වහා පමජ්ජිදං තුඑ පච්චාදෙස දුක්ඛං සඋන්ද–ලාඑ. [ සර්වථා ප්‍රමාර්ජිතං ත්වයා ප්‍රත්‍යාදෙශ දුඃඛං ශකුන්තලායාඃ ]

**චතුරිකා**– ( ප්‍රවිශ්‍ය ) ජෙදු, ජෙදු භට්ටා. වට්ටිආ කරංඩඅං ගෙංහිඅ ඉදො මුහං පට්ඨිද ම්හි. [ ජයතු, ජයතු භර්තා. වර්තිකාකරණ්ඩකං ගෘහීතෝ'තො මුඛං ප්‍රස්ථිතා'ස්මි. ]

**විදූෂකා**- මේ බඳු නියුණු දඬුවමකට කවරෙක් බිය නො වෙති ද ? (සිනා සී, තමාට මැ ) මේ තෙමේ පිස්සෙක් මැ ය. මා ද මොහු ඇසුරෙන් එබන්දෙක් වියැ හැකි. ( ශබ්ද නගා ) ආ ! මේ සැබැවින් චිත්‍රයෙක්.

**රජ**- මොන චිත්‍රයෙක් ද ?

**සානුමතී**- මට ද දැන් කාරණය වැටහුණා. නමුත් ඇඳිමෙන් මැ අත් දැකිම් ඈනි ඔහු පිළිබඳ වැ කෙසේ ද ?

**රජ**- මිත්‍රය, ඇයි මෙ බඳු අපරාධයක් කෙළේ ?

21. ගදවත් ඇඟිවැ ඈ කෙරෙහි මැ යොමු කැරුණු
මගෙ නෙත් දැකුම් සුව හැබැහින් මෙන් විඳුණු
තොප සිත් ලූ හෙයින් ම-සොඳුර ගැන තුරුණු
ඈ ය සිත් නමෙක් විය යළි මට හද වැරුණු

( කඳුලු වගුරුවයි )

**සානුමතී**- පෙර පසු නො ගැලපෙන මේ විරහ මග පුදුම එකෙකි.

**රජ**- මිත්‍රය, තොරක් නැති මේ දුක් කෙසේ විඳිම් ද ?

22. නිදි නැති හෙයින් සිහිනෙන් වුව නැ එක්වූ මි
නෙත වැකි දියෙන් සිත්තම් රුව බැ නැරඹු මි

**සානුමතී**- ඔබ විසින් ශකුන්තලා එලවා දැමීමේ දුක හැම ලෙසින් මැ පිසැ දැමියැ යුතු සි.

**චතුරිකා**- ( පිවිසැ ) සමිඳු දිනේවා, දිනේවා ! පින්සල් පෙට්ටිය ගෙනැ මෙ දෙසට පිටත් වූයෙමි.

**රාජා**- කිං ච ?

**චතුරිකා**- සො මෙ හත්ථාදෙ අංතරා තරලිආ දුදිආඑ දෙවීඑ වසුමදිඑ අයං එව්ව අජ්ජඋත්තස්ස උවණඉස්සං ත්ති සබලක්කාරං ගහිදෙ. [ස මෙ හස්තාදන්තරා තරලිකා ද්විතීයයා දෙව්‍යා වසුමත්‍යා'යමේවා'ර්‍යපුත්‍රස්‍යෝ'පනෙෂ්‍යාමී'ති සබලාත්කාරං ගෘහීතඃ.]

**විදූෂකඃ**- දිට්ඨිආ'තුමං මුක්කො. [දිෂ්ට්‍යා ත්වං මුක්තා.]

**චතුරිකා**- ජාව දෙවීඑ විඩවලග්ගං උත්තරීඅං තරලිආ මොචෙදි. තාව මඑ ණිව්වහිදෙ අත්තා. [යාවද්දෙව්‍යා විටපලග්නමුත්තරීයං තරලිකා මොචයති, තාවන්මයා නිර්වාහිත ආත්මා.]

**රාජා**- වයස්‍ය, උපස්ථිතා දෙවී බහුමානගර්විතා ච. භවානිමාං ප්‍රතිකෘතිං රක්ෂතු.

**විදූෂකඃ**- අත්තාණං ත්ති භණාහි. (චිත්‍රඵලකමාදායො'ත්ථාය ච) ජඉ භවං අංතෙඋරකාලකූඩාදෙ මුංචෙදි තදෙ මං මෙහප්පඩිච්ඡංදෙ පාසාදෙ. සද්දවෙහි. (ද්‍රුතපදං නිෂ්ක්‍රාන්තඃ) [ආත්මානමිති භණ, යදි භවාන් අන්තඃපුරකාලකූටාන්මුච්‍යතෙ තතො මාං මෙඝප්‍රතිච්ඡන්දෙ ප්‍රාසාදෙ. ශබ්දපය.]

**සානුමතී**- අණ්ණ සංකංත හිඅඔ වි පඪමසංභාවණං අවෙක්ඛදි. සිඪිල සොහදෙ දාණිං එසො. [අන්‍යසංක්‍රාන්තහෘදයො'පි ප්‍රථම සංභාවනමපෙක්ෂතෙ. ශිථිල සෞහෘද ඉදානීමෙෂඃ]

**ප්‍රතීහාරී**- (ප්‍රවිශ්‍ය පත්‍ර හස්තා) ජෙදු, ජෙදු දෙවො. [ජයතු, ජයතු දෙවඃ.]

**රාජා**- වෙත්‍රවති, න ඛල්වන්තරා දෘෂ්ටා ත්වයා දෙවී ?

**ප්‍රතීහාරී**- අහ ඉං ? පත්තහත්ථං මං දෙක්ඛිඅ පඩිණිඋත්තා. [අථ කිම් ? පත්‍රහස්තාං මාං දෘෂ්ට්වා ප්‍රතිනිවෘත්තා]

**රජ**– ඉතින් ?

**චතුරිකා**– මම මැ සවාමියාට ගෙන ගොස් දෙමි'යි කියා තරලිකා දෙ වැන්නී කොටැ වසුමිනි දේවිය මග දී එය මගේ අතින් බලාත්කාරයෙන් උදුරා ගත්තා

**විදූෂක**– නී මිදුණේ වාසනාවෙනි.

**චතුරිකා**– අත්තක පැටලුණු දේවිය ගේ උතුරු සළුව (සාරිපොට) තරලිකා මුදන විටැ මා දිවි ගලවා ගත්තා

**රජ**– මිත්‍රය, බහුමානයෙන් ගර්විත දේවිය ළඟා වුවා. ඔබ මේ පිළිරුව රකින්නැ.

**විදූෂක**– තමා මැ රැකෙන්නැ යි කියන්නැ. (සිතුවම් පුවරුව රැගෙනැ නැඟී සිටැ) ඉදින් ඔබ වහන්සේ ඇතොරැ කාලකූටයෙන් මිදෙන විටැ මම මේඝ ප්‍රතිච්ඡන්ද පායෙහි සිටිමි. හඬගසනු මැනැවි.

**සානුමතී**– දූත් ලිහිල් සුහද බව ඇති මොහු අතිතක කෙරෙහි වූ ගද ඇතිවත් පෙර සැලකීම මැ අපෙක්ෂා කෙරෙයි

**පිළිහැරිය**– (ලිපියක් අතැති වැ පිවිසැ) දෙව්දු දිනා, දිනා.

**රජ**– වෙත්‍රවතිය, තෝ මගැ දී දේවිය තුදුටුවෙහි ද?

**පිළිහැරිය**– තවත් මොනවද? ලිපියක් අතැ'ති මා දූකැ පෙරලා ගියා.

**රාජා-** කාසීඥ කාඝෝ'පරොධං මෙ පරිහරති

**ප්‍රතිහාරී-** දෙව, අමච්චො විණ්ණවෙදි. "අත්ථජාදස්ස ගණණා බහුලදාඑ එක්කං එව්ව පොරකජ්ජං අවෙක්ඛිදං තං දෙවො පත්තා'රූඪං පච්චක්ඛී කරෙදු" ත්ති. [ දෙව, අමාත්‍යො විඥාපයති. අර්ථජාතස්‍ය ගණනා බහුලතයෛ-'කමෙව පෞර කාර්‍යමවෙක්ෂිතම්, තද්දෙවඃ පත්‍රා'රූඪං ප්‍රත්‍යක්ෂී කරොත්වි'ති ]

**රාජා-** ඉතඃ පත්‍රිකාං දර්ශය,

( ප්‍රතිහාරී උපනයති )

**රාජා-** ( අනුවාච්‍ය ) කථම්, "සමුද්‍රව්‍යවහාරී සාර්ථවාහො ධනමිත්‍රො නාම නෞ ව්‍යසනෙ විපන්නඃ. අනපත්‍යශ්ච කිල තපස්වී. රාජගාමී තස්‍යා'ර්ථ සඤ්චය" ඉත්‍යෙ තදමාත්‍යෙන ලිඛිතම්. ( සවිෂාදම් ) කෂ්ටං ඛල්වනපත්‍යතා. වෙත්‍රවති, බහුධනත්වාත් බහුපත්නීකෙන තත්‍ර භවතා භවිතව්‍යම්. විචාර්‍යතාං යදි කාචිදාපන්නසත්වා තස්‍ය භාර්‍යාසු ස්‍යාත්.

**ප්‍රතිහාරී-** දෙව, දාණිං එව්ව සාකෙදඅස්ස සෙට්ඨිණො දුහිආ ණිව්වුත්ත පුංසවණා ජාආ සෙ සුණීඅදි. [ දෙව, ඉදානීමෙව සාකෙතකස්‍ය ශ්‍රෙෂ්ඨිනො දුහිතා නිර්වෘත්ත පුංසවනා ජායාස්‍ය ශ්‍රූයතෙ. ]

**රාජා-** නනු ගර්භඃ පිත්‍ර්‍යං රික්තමර්හති. ගච්ඡ, එවමමාත්‍යං බ්‍රූහි.

**ප්‍රතිහාරී-** ජං දෙවො ආණවෙදි. [ යද්දෙව ආඥාපයති ] ( ප්‍රස්ථිතා )

**රාජා-** එහි, තාවත්.

**ප්‍රතිහාරී-** ඉය ම්හි. [ ඉයමස්මි. ]

**රාජා-** කිමනෙන සන්තතිරස්ති නාස්තී'ති ?

**රජ**– කටයුතු දන්නෝ ම ගේ කටයුතු වැලැක්ම දුරලති.

**පිළිහැරිය**– දෙවයන් වහන්ස, නොයෙක් පලාත්වලින් රැස් වුණු ආදායම ගණන් ගැනීම නිසා වැඩ බහුල වීමෙන්. නුවරුන් පිළිබඳ වැ කළ යුතු එක මැ කිසෙක් ඉතිරි විය. එය මේ ලිපියෙහි සඳහන් කොටැ එවන බැවින් දේවයන් වහන්සේ දැනැ වදාරණ සේක්වා'යි ඇමති දන්වයි.

**රජ**– ලියමන පෙන්වනු.

(පිළිහැරිය රජු වෙත ගෙනෙයි)

**රජ**– (කියවා) "මුහුදු වෙළඳමේ නියුක්ත ධන මිත්‍ර නම් වෙළෙන්ද නාවික අනතුරෙකින් නැසුණි. දරුවන් නැති බැවින් අසරණයෙකි. ඔහු ගේ ධන රාශිය රාජ සන්තක වෙයි" යනු ඇමතියා විසින් ලියා දන්වා තිබේ. (කණගාටුවෙන්) දරුවන් නැති වීම කාලකන්නි කමෙක් වෙත්‍රවතී, බොහෝ ධනවත් හෙයින් ඔහු බොහෝ අඹු-වන් ඇත්තෙක් විය යුතු යි. ඉදින් ඔහු ගේ බිරියන් අතුරෙහි ගැබිනි වූ කිසි එකියක් ඇත්දැයි සොයා බලනු.

**පිළිහැරිය**– දේවයන් වහන්ස, ඔහු ගේ බිරියක් වූ සාකෙත සිටුතුමා ගේ දියණිය පුංසවනොත්සවය ළඟ දී පැවැත්වී යැයි අසනු ලැබේ.

**රජ**– ඇත්තෙන් මැ ගර්භස්ථයා පිතෘ ධනයට සුදුසු නොවැ. යව, මේ බව ඇමතියාට කියව.

**පිළිහැරිය**– දේවයන් වහන්සේ ගේ අණ ලෙසෙකි.

**රජ**– මෙහි එව.

**පිළිහැරිය**– මෙන්න ආවා. (දේවයෙනි)

**රජ**– දරුවන් ඇතත් නැතත් කිම ?

23. යෙන යෙන වියුජ්‍යන්තෙ ප්‍රජාඃ ස්නිග්ධෙන බන්ධුනා
ස ස පාපාදෘතෙ තාසං දුෂ්‍යන්ත ඉති ඝුෂ්‍යතාම්.

**ප්‍රතීහාරී**– එව්වං නාම ඝොසඉදව්වං. ( නිෂ්ක්‍රම්‍ය පුනඃ ප්‍රවිශ්‍ය ) කාලෙ පවුට්ඨං විඅ අහිණංදිදං දෙවස්ස සාසණං. [එවං නාම ඝොෂයිතව්‍යම්, කාලෙ ප්‍රවෘෂ්ටමිවා'භිනන්දිතං දෙවස්‍ය ශාසනම් ]

**රාජා**– ( දීර්ඝමුෂ්ණං ච නිඃශ්වස්‍ය ) එවං භොඃ සන්තතිච්ඡෙද නිරවලම්බානං කුලානං මූලපුරුෂා'වසානෙ සම්පදඃ පරමුපනිෂ්ඨන්ති. මමා'ප්‍යනෙන පුරුවංශශ්‍රිය එෂ වෘත්තාන්තඃ.

**ප්‍රතිහාරී**– පඩිහදං අමංගලං [ ප්‍රතිහතමමඞ්ගලම් ]

**රාජා**– ධිඞ්මාමුපස්ථිත ශ්‍රෙයො'වමානිනම්.

**සානුමතී**– අසංසඅං සහිං එව්ව හිඅඑ කරිඅ ණිංදිදෙ ණෙණ අත්තා. අසංශයං සඛීමෙව හෘදයෙ කෘත්වා නින්දිතො'නෙනා'ත්මා ]

**රාජා**–

24. සංරොපිතෙ'ප්‍යා'ත්මනි ධර්මපත්නී
ත්‍යක්තා මයා නාම කුලප්‍රතිෂ්ඨා
කල්පිෂ්‍යමාණා මහතෙ ඵලාය
වසුන්ධරා කාල ඉවො'ප්තබීජා.

**සානුමතී**– අපරිච්ඡිණ්ණා දාණිං දෙ සංදදී හවිස්සදි. [ අපරිච්ඡින්නෙදානීං තෙ සන්තතිර් භවිෂ්‍යති. ]

**චතුරිකා**– ( ජනාන්තිකම් ) අඑ! ඉමිණා සත්ථවාහ වුත්තංතෙණ දිඋණුව්වෙඔ භට්ටා. ණං අස්සාසිදුං මෙහපඩිච්ඡංදදෙ අජ්ජං මාඪව්වං ගෙංහිඅ ආඅච්ඡෙහි. [ අයි ! අනෙන සාර්ථවාහවෘත්තාන්තෙන ද්විගුණොද්වෙගො භර්තා. එනමාශ්වාසයිතුං මෙඝප්‍රතිච්ඡන්දාදාර්‍යං මාධව්‍යං ගෘහීත්වා'ගච්ඡාසි. ]

23 යම් සම් දෙනෝ පිය සියන් විසොවින් සොවිනම්
දුස්සන්ත ඔබුන ගේ යැයි ගොස්වා දෙසින් මුත්

**පිළිහැරිය-** මෙ සේ සැබැවින් ප්‍රකාශ කළ යුතු යි. (නික්ම ගොස් යළි පිවිසැ ) දේවයන් වහන්සේ ගේ ප්‍රකාශනය සුදුසු කාලයෙහි වස්නා වැස්සක් මෙන් පිළිගනිමි.

**රජ-** (දික් උණුසුම් හුස්මක් හෙලා) ඔව්, අනේ! සනත-තිය සිඳීමෙන් පිහිට රහිත කුලයන් මුල් මිනිසුන් නැති වූ කලැ (ඔවුන් අයත්) වස්තුව අන් සතු වෙ නම් මගේ ඇවෑමෙන් ද පුරුවංශයෙහි යසසට වන්නේත් මෙ බඳු ඉරණමෙකි.

**පිළිහැරිය-** උවදුරු නැසේ වා.

**රජ-** වෙතට පැමිණි සෞභාග්‍යයට අවමන් කළ මට නිසැ වේවා.

**සානුමතී-** (නිසැකයෙන් (ම ගේ) යෙහෙළිය මැ සිහිකොටැ මොහු විසින් තමාට මැ අවමන් කර ගන්නා ලදී.

**රජ-**

24 ගැන්වූ ම ගේ ජීවය සුල රුකුම පතා
ළං වූ බිරිඳ නීතිය ලෙස දුරුකෙළෙ නා
යුත් වූ පොළෝ මෙන් බිජු කලැ වපුල ඉනා
උස් වූ පල පිණිස ඇය යොමුවිණි නිය නා

**සානුමතී-** දූත් ඔබ පරපුර නො සිඳුනේ වෙයි,

**චතුරිකා-** (පසෙකට වී) අහෝ! මේ වෙළෙන්ද ගේ පුව-තින් දෙවයන් වහන්සේ ද්විගුණ වූ විරහ වේදනා ඇත්තෝ යැ. මොහු සනසන්නට මෙඝප්‍රතිච්ඡන්න පහයෙන් මාඪව්‍ය මැතිඳුන් කැඳවා ගෙන එන්නැ.

**ප්‍රතිහාරී–** සුට්ඨු භණාසි. [ සුෂ්ටු භණසි ] ( නිෂ්ක්‍රාන්තා )

**රාජා–** අහො! දුෂ්‍යන්තස්‍ය සංශයමාරූඪාඃ පිණ්ඩභාජඃ. කුතඃ?

25. අස්මාත් පරං වත යථා ශ්‍රුති සම්භෘතානි
කො නඃ කුලෙ නිවපනානි නියච්ඡතී'ති
නූනං ප්‍රසූති විකලෙන මයා ප්‍රසික්තං
ධෞතා'ශ්‍රුශෙෂමුදකං පිතරඃ පිබන්ති.

( මොහ මුපගතඃ )

**චතුරිකා–** (සසම්භ්‍රමමවලම්බ්‍ය) සමස්සසදු භට්ටා, [සමාශ්වසිතු භර්තා]

**සානුමතී–** හද්ධී! හද්ධි! සදි ක්ඛු දීවෙ වවධාණදෙසෙණ එසො අංධආරදෙසං අණුහොදි. අහං දාණිං එව්ව ණිව්වුදං කරෙමි. අහවා සුදං මඑ සඋන්දලං සමස්සාසඅංතිඑ මහෙංද ජණණිඑ මුහාදො, ජණ්ණභාඔස්සුආ දෙවා එව්ව තහ අණුචිට්ඨිස්සංති, ජහ අඉරෙණ ධම්මපදිණිං භට්ටා අහිණංදිස්සදි ත්ති. තා ජුත්තං එදං කාලං පඩිපාලිදුං. ජාව ඉමිණා වුත්තංතෙණ පිඅසහිං සමස්සාසෙමි. (උද්භ්‍රාන්තකෙන නිෂ්ක්‍රාන්තා) [හා ධික්! හා ධික්! සති ඛලු දීපෙ ව්‍යවධානදෙෂෙණෛෂො'න්ධකාරදෙෂමනුභවති. අහමිදානීමෙව නිර්වෘතං කරොමි. අථවා ශ්‍රුතං මයා ශකුන්තලාං සමාශ්වාසයන්ත්‍යා මහෙන්ද්‍රජනන්‍යා මුඛාද්. "යඥභාගො'ත්සුකා දෙවා එව තථා'නුෂ්ඨාස්‍යන්ති යථා චිරෙණ ධර්මපත්නීං භර්තා'භිනන්දිෂ්‍යතී'ති. තද්යුක්ත මෙතං කාලං ප්‍රතිපාලයිතුම්, යාවදනෙන වෘත්තාන්තෙන ප්‍රියසඛීං සමාශ්වාසයාමි.]

**නෙපථ්‍යෙ–** අබ්බම්හණ්ණං අබ්බම්හණ්ණං [අබ්‍රහ්මණ්‍යම්! අබ්‍රහ්මණ්‍යම්]

**රාජා–** (ප්‍රත්‍යා'ගතං, කර්ණං දත්වා) අයෙ! මාඪව්‍යස්‍යෙ'වා ර්තස්වරඃ. කඃ කො'ත්‍ර භොඃ!

**පිළිහැරිය**- සුදුස්සක් කියති (නික්මෙයි)

**රජ**- අහෝ! දුෂ්‍යන්තයනට පිණ්ඩභාජය (පිතෘදනය) පිළිබඳ මැ සැක උපති. කෙ සේ ද,

මේ කී ලෙසින් පසු මගෙන් කුලයේ අපේ මේ
කා දේ ද නත් උවරණින් සැදී පිත් පිදුම් වත්
නිත්තෙන් සිතා පෙර පියෝ වඳ මා පිදූ ඒ
බොත් මැ යි දියත් කඳුලැලින් සැබැවින් මැ සෝද,

(මූසපත් වෙයි)

**චතුරිකා**- (වහා වත්තම් කොටැ) සවාමීන් වහන්සේ අස්-වැසුම් ලබත්වා.

**සානුමතී**- ඔව්, අනේ, අනේ! සැබැවින් ප්‍රදීපය ඇතත් කඩතුරාවේ වරද නිසා අඳුරු දෙස් මැ විඳියි. මට දැන් පවා මොහු සනසන්නට හැකි. නමුත් යඥ භාගය ලබා ගැනීමට උත්සාහවත් වූ දෙවියෝ මැ, නොබෝ කලෙකින් සවාමියා නීත්‍යානුකූල බිරිය සතුටුකරවන්නේ යැ යි ශකුන්තලාවන් සනසන මහෙන්ද්‍ර මාතාව ගේ මුවින් මා විසින් අසන ලදී. එ හෙයින් කල් බැලීම සුදුසු යි. මේ අතරැ මේ පුවතින් ප්‍රිය යෙහෙළිය අස්වසන්නෙමි. (අහසට පැන යයි)

**පසුබිම**- බමුණකුට නො කළ යුත්තක්. බමුණුකුට නො කළ යුත්තක්.

**රජ**- (සිහි එළවා කන් දෙමින්) අපොයි! බැගෑ හඩ මාඪව්‍යයන් ගේ වගෙ යි. ඕයි, කවුද මෙහි.

**ප්‍රතීහාරී–** (ප්‍රවිශ්‍ය, සසම්භ්‍රමම්) පරිත්තාඅදු දෙවො සංස-
අගදං වඅස්සං. [පරිත්‍රායතාං දෙවඃ සංශයගතං වයස්‍යම්]

**රාජා–** කෙනා'ත්තගන්ධො මානවකඃ.

**ප්‍රතීහාරී–** අදිට්ඨරූවෙණ කෙණාවි සත්තෙණ අදික්කමිඅ
මෙහපඩිච්ඡංදස්ස පාදස්ස අග්ගභූමිං ආරොවිදෙ.
[අදෘෂ්ටරූපෙණ කෙනා'පි සත්ත්වෙනා'තික්‍රම්‍ය මෙඝ-
ප්‍රතිච්ඡන්දස්‍ය ප්‍රාසාදස්‍යා'ග්‍රභූමිමාරොපිතඃ.]

**රාජා–** (උත්ථාය) මා තාවත්! මමා'පි සත්ත්වෛ'රභිභූයන්තෙ
ගෘහාඃ. අථවා,

26 අහන්‍ය'හන්‍යාත්මන එව තාව
ජ්ඣාතුං ප්‍රමාදස්ඛලිතං න ශක්‍යම්
ප්‍රජාසු කඃ කෙන පථා ප්‍රයාති
ත්‍ය'ශෙෂතො වෙදිතුමස්ති ශක්තිඃ

**නෙපථ්‍යෙ–** හො වඅස්ස, අවිහා! අවිහා! [භො වයස්‍ය;
අවිහා! අවිහා!]

**රාජා–** (ගතිභෙදෙන පරික්‍රාමන්) සඛෙ, න භෙතව්‍යම්! න
භෙතව්‍යම්!

**නෙපථ්‍යෙ–** (පුනස්තදෙව පඨිත්වා) කහං ණ භාඉස්සං! එස
මං කො වි පච්චාවණද සිරොහරං ඉක්ඛුං විඅ තිණ්ණ
භංගං කරෙදි. [කථං න භෙෂ්‍යාමි. එෂ මාං කො'පි
ප්‍රත්‍ය'වනත ශිරොධරමික්ෂුමිව ත්‍රිභඞ්ගං කරොති]

**රාජා–** (සදෘෂ්ටික්ෂෙපම්) ධනුස්තාවත්!

**යවනී–** (ප්‍රවිශ්‍ය ශාර්ඞ්ගහස්තා) භට්ටා, එදං හත්ථාවාවස-
හිදං සරාසණං [භර්තඃ, එතද්ධස්තාවාප සහිතං ශරාසනම්.]

( රාජා සශරං ධනු රාදත්තෙ )

**නෙපථ්‍යෙ–** 27. එෂ ත්වාමභිනව කණ්ඨ ශොණිතා'ර්ථී
ශාර්දූලං පශුමිව හන්මි චෙෂ්ටමානම්
ආර්තානාං භයමපනෙතුමාත්තධන්වා
දුෂ්‍යන්තස්තව ශරණං භවත්විදානීම්,

**පිළිහැරිය**– ( පිවිසැ, බියෙන්) දේවයන් වහන්සේ අතතුරට පත් මිත්‍රයා රකිත්වා.

**රජ**– කවුරුන් ද මිනීහට පහර දෙන්නේ ?

**පිළිහැරිය**– නො පෙනෙන රුවින් යුතු කිසි භූතයකු විසින් ( ඔහු ) මැඩැලා මෙඝප්‍රතිච්ඡන්ද පහයේ මතු මහලට නංවන ලදී.

**රජ**– ( නැඟී සිටැ ) නැගැ, ම ගේ ගෙ දෙර පවා භූතයන් විසින් මඩිනු ලැබේ ද. නො වේ නම්,

26. දිනෙක් දිනෙක්හි වන මා පමාවන්
දූන්මේ සමත් බැව් නැත්තෝ අද්‍යෝ මැ සි
රටුන් කෙරේහි කවරෙක් කෙ සේ වූ
මහෙක්හි යෙත් ඒ සපුරා කෙ සේ දනිමි.

**පසුබිම**– ඕ මිතුරාණෙනි, අපෝ ! අපෝ !

**රජ**– ( යුහුවැ සිසාරා ) මිත්‍රය, බිය නො වන්නැ, බිය නො වන්නැ.

**පසුබිම**– ( නැවත ද එය මැ කියා ) කෙ සේ ද බිය නො වන්නේ. මේ කවුදෝ ම ගේ බෙල්ල පස්සට නමා උක් ගසක් මෙන් තුනට කඩනවා.

**රජ**– ( බැල්මක් හෙලා ) දුන්න ගෙනෙවු.

**යවනී**– (දුන්න ගෙනැ පිවිසැ) සවාමිනි, මේ අත් වැස්ම සහිත දුන්න.

( රජ ශී සහිත දුන්න ගනිසි )

**පසුබිම**– 27. දගලන තා මෙ ගෙළ නව පහසින් රුහිර
මරමි සතකු මෙන් දිවියෙක් මම මෙවර
දුබලන් රැකුම පිණිස මැ දුනුගත් පවර
දුස්සන්ත මැ තට පිහිට යැ කර සමර

**රාජා–** ( සරොෂම් ) කථං මාමෙවොද්දිශති ? තිෂ්ඨ, කුණපාශන, ත්වමිදානීං න භවිෂ්‍යසි. ( ශාර්ඞ්ගමාරොප්‍ය ) වෙත්‍රවති, සොපාණමාර්ගමාදෙශය.

**ප්‍රතිහාරී–** ඉදෙ, ඉදෙ දෙවො. [ ඉත ඉතො දෙවඃ ]

(සර්වෙ සත්වරමුපසර්පන්ති.)

**රාජා–** ( සමන්තාද් විලොක්‍ය ) ශූන්‍යං බල්විදම් !

**නෙපථ්‍යෙ–** අවිහා ! අවිහා ! අහං අත්තභවන්තං පෙක්ඛාමි තුමං මං ණ පෙක්ඛසි. බිඩාලග්ගහීදො මූසඔ විඅ ණිරාසො ම්හි ජීවිදෙ සංවුත්තො. [ අවිහා ! අවිහා ! අහමත්‍රභවන්තං පශ්‍යාමි ත්වං මාං න පශ්‍යසි. බිඩාලගෘහීත මූෂක ඉව නිරාශො ස්මි ජීවිතෙ සංවෘත්තඃ ]

**රාජා–** භොඃ තිරස්කරිණී ගර්විත, මදීයං ශස්ත්‍රං ත්වාං ද්‍රක්ෂ්‍යසි. එෂ තමිෂුං සන්දධෙ.

28 යො හනිෂ්‍යති වධ්‍යං ත්වාං රක්ෂ්‍යං රක්ෂිෂ්‍යති ද්විජම්
හංසො හි ක්ෂීරමාදත්තෙ තන්මිශ්‍රා වර්ජයත්‍ය'පඃ

(ශස්ත්‍රං සන්ධත්තෙ)

(තතඃ ප්‍රවිශති මාතලිර් විදූෂකශ්ච)

**මාතලිඃ–** රාජන්,

29 කෘතාඃ ශරව්‍යං හරිණා තවා'සුරාඃ
ශරාසනං තෙෂු විකෘෂ්‍යතාමිදම්
ප්‍රසාද සෞම්‍යානි සතාං සුහෘජ්ජනෙ
පතන්ති චක්ෂූංෂි න දාරුණාඃ ශරාඃ

**රාජා–** (අස්ත්‍රමුපසංහරන්) අයෙ! මාතලිඃ, ස්වාගතං මහෙන්ද්‍ර සාරථෙ,

**විදූෂකඃ–** අහං ජෙණ ඉට්ඨිපසුමාරං මාරිදෙ සො ඉමිණා සාඅදෙණ අහිණංදීඅදි. [අහං යෙනෙෂ්ටිපශුමාරං මාරිතඃ, සො'නෙන ස්වාගතෙනා'භිනන්ද්‍යතෙ]

**රජ–** ( කෝපයෙන් ) කෙ සේ ද, ප්‍රාග්‍යාගත් සඳහන් කරයි රාක්ෂස, සිටුව. තා දැන් ඉවරයි! <u>දුන්න</u> <u>තූණ</u> ගෙන වෙත්‍රවතී, සෝපානයට යන මඟ පෙන්වනු.

**පිළිහැරිය–** දේවයන් වහන්සේ මෙමෙහෙන්, මේහෙනී.

( සියල්ලෝ වහා ළංවෙති )

**රජ–** ( හාත්පස බලා ) සැබැවින් මෙය හිස·

**පසුබිම–** අනේ, අනේ! මට මෙහි රජතුමා පෙනෙනවා; ඔබතුමාට මා පෙනෙන්නේ නැත් ද? බළලකු විසින් අල්ලා ගන්නා ලද මීයකු මෙන් ම ගේ ජීවිතයෙහි ආශා නැත්තේ වෙමි.

**රජ–** එම්බල, අදෘශ්‍යමානත්වයෙන් උඩඟුවූව, මි ගේ අවිය තා දකීවි. මෙන්න, මෙය ඒ හිය දරයි.

28. නැසිය යුතු මෑ තා තසමින්
රැකි ය යුතු මෑ දද රකිමින්
ස ර ය සරයි හසහු ලෙසින්
කිරි ගන්නා දිය හරිමින්

( හිය යොදයි )

( ඉක්බිති මාතලී ද, විදූෂක ද පැමිණෙති )

**මාතලී–** රජතුමනි,

29. හරින් කළා හීය ඔබේ, අදිත් ලක්
ඔවුන් කෙරේ නංවනු මේ නැගු හී
පගත් මොලොක් නෙත් සුදනන් මිතුන් වෙත්
වැටේ. තමුන් දරුණ හී නො වේ ලක්

**රජ–** ( දුන්න හකුළා ) ඔහෝ මාතලී, ආයුබෝවන්! මගෙ සඳු රියැදුර.

**විදූෂක–** මම යමකු විසින් යාගයෙහි සිටුපාවකු මරන්නාක් මෙන් මරන්නට තැත් කරනු ලැබී ද, ගේ මොහු විසින් ' සවාගත " යැයි කියමින් තුස්වනු ලැබේ.

**මාතලිඃ**– (සස්මිතම්) ආයුෂ්මන්, ශ්‍රූයතාං යදස්මි හරිණා භවත් සකාශං ප්‍රේෂිතඃ.

**රාජා**– අවහිතෝ'ස්මි.

**මාතලිඃ**– අස්ති, කාලනෙමි ප්‍රසූති දුර්ජයො නාම දානවගණඃ.

**රාජා**– අස්ති. ශ්‍රුතපූර්වං මයා නාරදාත්.

**මාතලිඃ**– 30 සඛ්‍යුස්තෙ ස කිල ශතක්‍රතොරජය්‍ය
ස්තස්‍යස්ත්වං රණ ශිරසි ස්මෘතො නිහන්තා
උච්ඡෙත්තුං ප්‍රභවති යන්න සප්තසප්ති–
ස්තන්නෛ'ශං තිමිරමපාකරොති චන්ද්‍රඃ

ස භවානාත්තශස්ත්‍ර එව ඉදානීං තමෛන්ද්‍රරථමාරුහ්‍ය විජයාය ප්‍රතිෂ්ඨතාම්.

**රාජා**– අනුගෘහීතො'හමනයා මඝවතඃ සම්භාවනයා. අථ මාධව්‍යං ප්‍රති භවතා කිමෙවං ප්‍රයුක්තම්?

**මාතලිඃ**– තදපි කථ්‍යතෙ. කිඤ්චින්නිමිත්තාදපි මනඃ සන්තාපාදායුෂ්මාන් මයා වික්ලවො දෘෂ්ටඃ. පශ්චාත් කොපයිතුමායුෂ්මන්තං තථා කෘතවානස්මි. කුතඃ,

31 ජ්වලති චලිතෙන්ධනො'ග්නිර් විප්‍රකෘතඃ පන්නගඃ
ඵණාං කුරුතෙ
ප්‍රායඃ ස්වං මහිමානං ක්ෂොභාත් ප්‍රතිපද්‍යතෙ හි ජනඃ

**රාජා**– (ජනාන්තිකම්) වයස්‍ය, අනතික්‍රමණීයා දිවස්පතෙරාඥා. තදත්‍ර පරිගතා'ර්ථං කෘත්වා මද්වචනාදමාත්‍යපිශුනං බ්‍රූහි.

32 ත්වන්මතිඃ කෙවලා තාවත් පරිපාලයතු ප්‍රජාඃ
අධිජ්‍යමිදමන්‍යස්මින් කර්මණි ව්‍යාපෘතං ධනුඃ

**විදූෂකඃ**– ජං භවං ආණවෙදි. [යද්භවානාඥාපයති.] (නිෂ්ක්‍රාන්තඃ)

**මාතලිඃ**– ආයුෂ්මාන් රථමාරොහතු.

(රාජා රථා'ධිරොහණං නාටයති)

(සර්වේ නිෂ්ක්‍රාන්තාඃ)

ඉති ෂෂ්ඨො'ඞ්කඃ

**මාතලි-** ( සිනා සෙමින් ) ආයුෂ්මතුනි, ඉන්ද්‍රයා විසින් මම යමකට ඔබ වෙත එවනු ලැබුයෙම් ද, එය අසනු මැනැවි.

**රජ-** සවන් දෙමි.

**මාතලි-** කාල නෙමි අසුරයන් දරු වූ දුර්ජය නම් අසුර ගණයෙක් ඇති.

**රජ-** ඇති. මම නාරද වෙතින් ඇසූ විරිමි.

**මාතලි-** 30 නොඃ දිනිය හැකිය අසුරන් මිතුරු ඉඳුරු ට
මැ ඩැ ලි ය හැකිය යෙනි යුද බිමැ උන් ඔබ ට
නො නැසිය ගැකිය තම රැ කලැ දිනිඳු ග ට
දු රැ ලි ය හැකිය එය සැබැවින් නරිඳු ග ට

ඒ ඔබතුමා දූන් අවියෙන් සැරසී ඒ ඉදුරු රියැ නැගැ විජයග්‍රහණය පිණිස පිටත් වනු මැනැවි.

**රජ-** ඉන්ද්‍රයා ගේ මේ සැලැකිල්ල ම විසින් පිළිගතිමි. තමුත් මාඪව්‍යයට ඔබ විසින් මෙ සේ කරන ලද්දේ මන් ද ?

**මාතලි-** එයත් කියනු ලැබේ. කිසියම් කරුණක් නිසා තැවුලෙන් විකල වූ ඔබ ම විසින් දක්නා ලදු. පසුවැ ඔබ කෝප කරවනු සඳහා මෙ සේ කෙළෙ වෙමි. කෙ සේ ද?

31. ගිනි දිලියෙයි දර සෙලවෙ - න
පෙනය නැඟෙයි නා කුප් ව න
දෙනෝ ලබයි මහිමය සි න
කැලඹීමයි එහි නිදි ව න

**රජ-** ( පසෙකට වී ) මිත්‍රය, දිවස්පති අණ නො ඉක්මවියැ හැකි. එය වටහා දී ම ගේ වදනින් අමාත්‍ය පිශුනට කියන්නැ.

32. මේ තැගු දුනු අත් කිසෙ කා
යොදවන නෙක් මා සල කා
රිසි ලෙස වැසියන් සුරැ කා
වෙසෙනු මැනැවි යැ ' යි නිසැ කා

**විදූෂක-** ඔබතුමන් ගේ අණ ලෙසෙකි ( නික්මෙයි )

**මාතලි-** ආයුෂ්මත් තෙමේ රියට නැඟේවා.

( රජ රිය නැඟීම හඟවයි )

(සියල්ලෝ නික්මෙති)

සවන රඞ්ගය නිමාවිණී

# සප්තමෝ'ඞ්කඃ

(තතඃ ප්‍රවිශත්‍යා'කාශයානෙන රථා'ධිරූඪෝ රාජා මාතලිශ්ච)

**රාජා–** මාතලෙ, අනුෂ්ඨිත නිදෙශෝ'පි මඝවතඃ සත්ක්‍රියා විශෙෂාදනුපයුක්තමිවාත්මානං සමර්ථයෙ.

1 ප්‍රථමෝ'පකෘතං මරුද්වතඃ ප්‍රතිපත්ත්‍යා ලඝුමන්‍යතෙ භවාන්
ගණයත්‍ය'වදාන විස්මිතො
භවතඃ සෝ'පි න සත්ක්‍රියා ගුණාන්

**රාජා–** මාතලෙ, මා, මෛ'වම්! ස ඛලු මනොරථානාමප්‍ය'භූමිර් විසර්ජනා'වසර සත්කාරඃ. මම හි දිවෞකසාං සමක්ෂමර්ධා'සනෝ'පවෙශිතස්‍ය.

2 අන්තර්ගත ප්‍රාර්ථනමන්තිකස්ථං
ජයන්තමුද්වීක්ෂ්‍ය කෘතස්මිතෙන
ආමෘෂ්ටවක්ෂෝ හරිචන්දනා'ඞ්කා
මන්දාරමාලා හරිණා පිනද්ධා

**මාතලිඃ–** කිමිව නාමා'යුෂ්මානමරෙශ්වරාන්නාර්හති. පශ්‍ය,

5 සුඛපරස්‍ය හරේරුභයෛඃ කෘතං
ත්‍රිදිවමුද්ධෘත දානව කණ්ටකඃ
තව ශරෛරධුනා නත පර්වභිඃ
පුරුෂ කෙසරිණශ්ච පුරා නඛෛඃ

**රාජා–** අත්‍ර ඛලු ශතක්‍රතොරෙව මහිමා ස්තුත්‍යඃ.

4 සිධ්‍යන්ති කර්මසු මහත්ස්ව'පි යන්නියොජ්‍යාඃ
සම්භාවනා ගුණමවෙහි තමීශ්වරාණං
කිං වා භවිෂ්‍යදරුණස්තමසාං විභෙත්තා
තං චෙත් සහස්‍ර කිරණෝ ධුරි නා'කරිෂ්‍යත්

## සත් වන රඞ්ගය

( ඉක්බිති අහසින් රිය නැඟුණු රජු මාතලි සමග පැමිණෙයි)

**රජ–** මාතලී, සක් දෙවියන් ගේ අණ පිළිගැනීමෙන් මා කළ දෙය, ඔහු ගේ ඒසා සම්මානයට සුදුසු වී දැයි මට සැකයෙකි.

**මාතලි–** ( සිනා සහිත වැ ) මට සිතෙන්නේ ඔබ දෙ පොළ මැ සෑහීමකට පත් නො වූ බව යි.

1. ඉ දු රු ට  කළ සැලකුම ඔබ සුලු  සේ
සැ බැ වට  සලකනු නො යෙදෙයි කිසි  සේ
වි කු ම ට  ඔබ ගේ පැහැදුනු තිසි  සේ
ග ණ නට  නො ගනී කළ පුද වෙසෙ  සේ

**රජ–** මාතලී, එය එ සේ නො වේ නො වේ. සැබැවින් ඔහු ම ගේ ආශාවනටත් ඉහළින් පිටත් වැ එන වේලෙහි මට සැලකුවා. දෙවියන් ඉදිරියෙහි එක මැ අසුනේ සිටි මට වනාහි,

2. පැන්මෙන් වෙලි සිත් තුලැ වූ ළඟින් උන්
බලා ජයන්තත් තොස්වා සිනා වෙන්
ළයේ අලෙවූ දුන් හරි චන්දනින් ලක්
මාලා මදරා විදුරත් ගෙළේ ලී

**මාතලි–** කෙ සේ නම් ආයුෂ්මත්හු අමරේශ්වරයා හා නො සම වෙත් ද ? බලන්නැ

3. සුවය ලොල් වුණු සක් රදු ගේ තිදස්
දෙදෙනකුයි හළෙ ඒ අසුරන් කටු
දැනුදෙ'බේ ඉදු දික් මෙ මැ හී වලින්
සහ තියෙන් නරසී රදු ගේ පෙරත්

**රජ–** මෙහි ලා සැබැවින් ඉන්‍ද්‍රයා ගේ මහිමය මැ පැසසියැ යුතු යි

4. තන් සේ කෙරෙත් නිල දරු බෙහෙවින් මහත් කම්
ඒ වාසනා ගුණය වේ ඉසුරන් අයත් වූ
වේ ඡේ සමත් අරුණ ඒ, අඳුරු බිඳීමේ
ඇත්තෙන් සහස්පති රියේ යෙදුවේ නො වෙ නම්

**මාතලිඃ**- සදෘශමේතදායුෂ්මතඃ, (සොත්කර්ෂමන්තරමභිනීය) ආයුෂ්මන්, ඉතඃ පශ්‍ය, නාකපෘෂ්ඨප්‍රතිෂ්ඨිතස්‍ය සෞභා-ග්‍යමාත්මයශසඃ,

5 විච්ඡිත්තිශෙෂෛඃ සුරසුන්දරීණාං
වර්ණෛරමී කල්පලතා'ංශුකෙෂු
විචින්ත්‍ය ගීතක්ෂමමර්ථබන්ධම්
දිවෞකසස් ත්වච්චරිතං ලිඛන්ති

**රාජා**- මාතලෙ, අසුරසම්ප්‍රහාරො'ත්සුකෙන පූර්වේද්‍යුර් දිවමධිරොහතා න ලක්ෂිතඃ ස්වර්ගමාර්ගඃ. කතමස්මින් මරුතාං පථි වර්තාමහෙ?

6 **මාතලිඃ**- ත්‍රිස්‍රොතසඃ වහති යො ගගනප්‍රතිෂ්ඨාං
ජ්‍යොතීංෂි වර්තයති ච ප්‍රවිභක්ත රශ්මිඃ
තස්‍ය ව්‍යපෙතරජසඃ ප්‍රවහස්‍ය වායොර්
මාර්ගො ද්විතීය හරිවික්‍රම පූත එෂඃ

**රාජා**- මාතලෙ, අතඃ ඛලු සබාහ්‍යා'න්තඃකරණො මමාන්ත-රාත්මා ප්‍රසීදති. (රථාඞ්ගමවලොක්‍ය) මෙඝපදවීමවතීර්ණෞ ස්වඃ.

**මාතලිඃ**- කථමවගම්‍යතෙ.

7 **රාජා**- අයමර විවරෙභ්‍යශ්චාතකෛර් නිෂ්පතද්භිර්
හරිභිරචිරභාසාං තෙජසා චා'නුලිප්තෛඃ
ගතමුපරි ඝනානාං වාරිගර්භො'දරාණාං
පිශුනයති රථස්තෙ ශීකර ක්ලින්න නෙමිඃ

**මාතලිඃ**- ක්ෂණාදායුෂ්මාන් ස්වාධිකාර භූමෞ වර්තිෂ්‍යතෙ.

**රාජා**- (අධො'වලොක්‍ය) මාතලෙ, වෙගාවතරණාදාශ්චර්‍ය දර්ශනඃ සංලක්ෂ්‍යතෙ මනුෂ්‍යලොකඃ. තථා හි

**මාතලී**- මෙය ආයුෂ්මතුනට ඉතා සුදුසු යි. ( මඳ දුරක් ගොස් ) පින්වතාණෙනි, මෙහි සිට බලන්නැ, දෙව්ලොව මතු පිට පිහිටි ඔබ ගේ යසස් මහිමය.

5. සෙස් අංගරාගෙන් සුර සුන්දරින් ගේ
නන් නන් වණින් කප්ලිය වත් කඩන්නී
සිතා මැ ගීතාරහ'රුත් රුසක් තුම්
ලියත් ඔබේ සත් සිරිතත් සුරෝ ඒ

**රජ**- මාතලී, අසුරයන් හා යුද පිණිස උත්සුක වැ ( එද ) දෙව් පුරයට නැඟුණු මා සවර්ග මාර්ගය නො දක්නා ලදී. මේ කෙබඳු වා මගෙකැ ද අප ඉන්නේ ?

**මාතලී**- 6. ඒ තුන් සළා ඇති අහස් නදියත් ගලා යා
නන් නන් කැළුම් සුබෙදුණු කැරුණෝ නුරුන් ගේ
තම් ලත් පවාහ සුළඟින් දුර ළු රජස් කැන්
මෙ වේ සුදේ මග හරින් දෙව්කුම් කළා වූ

**රජ**- මාතලී, මෙහි දී ම ගේ අභ්‍යන්තර-බාහිර අවයව ඇතුළු අධ්‍යාත්මය පහදියි. ( රියසක් දෙස බලා ) වළා මගට බැස්සෝ වෙමු.

**මාතලී**- කෙ සේ ද දැනගත්තේ ?

**රජ**- 7. අර විවර තුලෝ සාරංගයන් ගේ වැටීමෙන්
දිලෙන විදුලියෙන් නැං වූ පබාවත් අසුන් ගෙන්
හිරි පොද තැවරීමෙන් නිම් වළල්ලත් තෙමීමෙන්
ඔබ රිය දිය ගැබ් වූ මේ මතින් යේ හගිම් මම

**මාතලී**- පින්වතා මොහොතෙකින් (ඔබ) අණසක පවත්නා තැනට පැමිණෙයි.

**රජ**- ( යට පෙදෙස බලා) මාතලි වේගයෙන් බැසීම නිසා මිනිස් ලොව පුදුම එලවන දැකුම් වලින් යුතුවෙයි. එ සේ මැ යි.

8 ශෛලානාමවරොහතී'ව ශිඛරාදුන්මජ්ජතාං මෙදිනී
පර්ණා'භ්‍යන්තරලීනතාං විජහති ස්කන්ධෝ'දයාත් පාදපාඃ
සන්තානාත් තනුභාව නෂ්ටසලිලා ව්‍යක්තිං
භජන්ත්‍යා'පගාඃ
කෙනා'ප්‍යුත්ක්ෂිපතෙ'ව පශ්‍ය භුවනං
මත්පාර්ශ්වමානීයතෙ

**මාතලිඃ**– සාධු දෘෂ්ටම්. (සබහුමානමවලොක්‍ය) අහො! උදාරරමණීයා පෘථිවී.

**රාජා**– මාතලෙ. කතමො'යං පූර්වා'පර සමුද්‍රාවගාඪඃ

කනකරසනිස්‍යන්දී සාන්ධ්‍ය ඉව මෙඝපරිඝඃ සානුමානා-ලොක්‍යතෙ.

**මාතලිඃ**– ආයුෂ්මන්, එෂ බලු හෙමකූටො නාම කිංපුරුෂ-පර්වතස්තපඃ සංසිද්ධි ක්ෂෙත්‍රම්. පශ්‍ය,

9 ස්වයම්භුවාන්මරීචෙඃ ප්‍රබභූව ප්‍රජාපතිඃ
සුරා'සුර ගුරුඃ සො'ත්‍ර සපත්නීකස්තපස්‍යති.

**රාජා**– තෙන හ්‍යනතික්‍රමනීයානි ශ්‍රෙයාංසි ප්‍රදක්ෂිණී කෘත්‍ය භගවන්තං ගන්තුමිච්ඡාමි.

**මාතලිඃ**– ප්‍රථමඃ කල්පඃ. (නාට්‍යෙනා'වතීර්ණෞ)

**රාජා**– (සවිස්මයම්)

10 උපොඪ ශබ්දා න රථා'ඞ්ගනෙමයඃ
ප්‍රවර්තමානං න ච දෘශ්‍යතෙ රජඃ
අභූතලස්පර්ශතයා නිරුද්ධත
ස්තවාවතීර්ණො'පි රථො න ලක්ෂ්‍යතෙ.

**මාතලිඃ**– එතාවානෙව ශතක්‍රතොරායුෂ්මතශ්ච විශෙෂඃ

**රාජා**– මාතලෙ, කතමස්මින් ප්‍රදෙශෙ මාරීචා'ශ්‍රමඃ,

8. සෙමින් සෙමින් ඔතු වන ගිරි කුළින් මිහිය
කිඳවෙනු මෙ නි
ක ඳ න් නැඟීමෙන් තුරු කොළ'තර සැඟවුම
ගරිනුව මෙ නි
සි හි න් නිසා නො පළ නදිගු පැහිරීමෙන්
දල වනු මෙ නී
බ ල න් දෙරණ කිසිවකු මා වෙත ඔසොවා
ගෙනැ ආ මෙ නී

**මාතලී**– මැනැවින් බැලිමි. ( ගෞරවයෙන් යුතු වැ බලා ) අනේ උදුර බැවින් රමණීය පෘථිවිය !

**රජ**– මාතලී, පෙර'පර මුහුදු හා ගැටුණු රන්රස වැහෙන ( දිග පාරක් ඇති ) සැඳෑ වළා පෙළක් වැනී මේ පෙනෙන කඳු වැටිය කවරේ ද ?

**මාතලී**– ආයුෂ්මතුනි, මෙය සැබැවින් හෙමකූට නම් කිඳුරන් වසන ප්‍රීතය සි. තපස් සිඩි සාධනයට කෙතෙකි. බලන්නැ.

9. බඹු ගෙන් උපන් ඒ—මරීචි පුත් පජාපති
සිය බිරිය සමගින් මෙහි – වඩයි තවුස් දම් දූ ඩී

**රජ**– එ සේ නම් යහපත නො ඉක්මවියැ යුතු. ඒ උතුමා පැදකුණු කොටැ යනු කැමැත්තෙමි.

**මාතලී**– උසස් අදහසක්. (බස්නා බව හඟවනි)

**රජ**– ( විස්මයෙන් යුතු වැ)

10. රිය සක් නිම් වළලු නො මැ කළ හඬ ඇත් තේ
රජස් නැඟුණු බවකුත් පැහැදිලි නැත් තේ
නොගැටුණු නිසා වෙති බිමැ කැලැඹුම් නැත් තේ
රිය බට බළ සවා මා නම් නො මැ දත් තේ

**මාතලී**– ඉන්ද්‍රයා ගේ හා ඔබ ගේ හා වෙනස මෙපමණෙකි.

**රජ**– මාතලී, කවර පියසෙකැ ද මාරීචි අසපුව?

**මාතලිඃ**– (ගෘහීත දර්ශයන්)

11 වල්මීකා'ර්ධ නිමග්නමූර්තිරුරසා සන්දෂ්ට සර්පත්වචා
කණ්ඨෙ ජීර්ණලතාප්‍රතානවලයෙනා'ත්‍යර්ථ සම්පීඩිතඃ
අංශව්‍යාපි ශකුන්තනීඩනිචිතං බිභ්‍රජ්ජටාමණ්ඩලං
යත්‍ර ස්ථාණුරිවා'චලො මුනිරසා'වභ්‍යර්කබිම්බං ස්ථිතඃ.

**රාජා**– නමස්තෙ කෂ්ටතපසෙ.

**මාතලිඃ**– (සංයත ප්‍රග්‍රහං රථං කෘත්වා) එතාවදදිති පරිවර්ධිත මන්දාරවෘක්ෂං ප්‍රජාපතෙරාශ්‍රමං. ප්‍රවිෂ්ටෞ ස්වඃ

**රාජා**– ස්වර්ගාදධිකතරං නිර්වෘතිස්ථානම්. අමෘතහ්‍රදමිවා 'වගාඪො'ස්මි.

**මාතලිඃ**– (රථං ස්ථාපයිත්වා) අවතරත්වා'යුෂ්මාන්.

**රාජා**– (අවතීර්‍ය) මාතලෙ, භවාන් කථමිදානීම්?

**මාතලිඃ**– සංයන්ත්‍රිතො මයා රථඃ. වයමප්‍යවතරාමඃ. (තථා කෘත්වා) ඉත ආයුෂ්මන්, (පරික්‍රම්‍ය) දෘශ්‍යන්තාමත්‍රභවතාමෘෂීණාං තපොවන භූමයඃ

**රාජා**– නනු විස්මයාදවලොකයාමි

12 ප්‍රාණානාමනිලෙන වෘත්තිරුචිතා සත්කල්පවෘක්ෂෙ වනෙ
තොයෙ කාඤ්චනපද්මරෙණු කපිශෙ ධර්මා'භිෂෙකක්‍රියා
ධ්‍යානං රත්නශිලාතලෙෂු විබුධස්ත්‍රී සන්නිධෞ සංයමො
යත්කාඞ්ක්ෂන්ති තපොභිරන්‍යමුනයස්තස්මින්
තපස්‍යන්ත්‍ය'මී

**මාතලිඃ**– උත්සර්පිණී ඛලු මහතාං ප්‍රාර්ථනා. (පරික්‍රම්‍ය, ආකාශෙ) අයෙ! වෘද්ධශාකල්‍ය, කිමනුතිෂ්ඨති භගවාන් මාරීචඃ? කිං බ්‍රවීෂි! "දාක්ෂායණ්‍යා පතිව්‍රතා-ධර්මමධිකෘත්‍ය පෘෂ්ටස්තස්‍යෛ මහර්ෂිපත්නී සහිතායෛ කථයති" 'ති.

**මාතලී**– ( අඟින් පෙන්වමින් )

11. මල් මීකොක්හි අඩක් ගැලී ගිය ගහින් ගැත් වූ
ළයේ සප් සැවින්
බෙල්ලේ වූ ලිය මැල් දිරූ පසුරුයෙන් දුත් බෝ
පෙළුම් තත් ලෙසින්
දූලේ එල්බුණු කුඩුවෙන් ගඟන වූ මත්තේ ජටාවක් දරූ
ඒ මාරිව හිඳී සගස් රැස් බලා රක්මින් තපස් මෙන් ටැඹක්

**රජ**– ඒ උග්‍ර තපසට නමස්කාර වේවා.

**මාතලී**– ( රිය රැහැන් ඇද ) දූත් අදිතිය විසින් වවන ලද මඳරා ගස් ඇති ප්‍රජාපති ගේ අසපුවට පිවිසියෙමු.

**රජ**– සවර්ගයටත් වඩා සුව එළවන තැනෙක්. අමා විලැ ගැලුනාක් මෙනි.

**මාතලී**– ( රිය නවතා ) පින්වතුන් බසින්නැ.

**රජ**– ( බැසැ ) මාතලී, ඔබ කෙ සේ ද ?

**මාතලී**– ම විසින් රිය සුරැකිවැ තබන ලදී. අපි ද බසිමු. ( එ සේ කොටැ ) පින්වතුනි, මෙහෙන් ( සිසාරමින් ) මෙහි පින්වත් තවුසන් ගේ තවුස් වන බිම් බලනු මැනැවි.

**රජ**– සැබැවින් පුදුමයෙන් බලමි.

12. ප ව නි න් දිවි ගෙවන කප්රුක්වත් වෙනෙ හි
දෙ ව මි න් පව්, රෙනින් මුසු රත් සර දියෙ හී
ක ර මි න් නව සෙලෙහි, සිල් අසරතැ'සුරෙ හි
ත ප සි න් අන් පතන තැනැ මොහු සිටිති එ හී

**මාතලී**– උතුමන් ගේ අදහස් බොහො මැ ඉහළ යි ( කැරැනි අහසේ සිටැ ) ඔහෝ, මගළු තවුසිය, භගවත් මාරිව කුමක් කරන්නේ ද? ඔබ කුමක් කියත් ද ? දක්ෂායණිය විසින් පතිවත් දහම් විචාරන ලදුවැ මහර්ෂි පත්නියන් අභිත ඇට, ඔහු එය කියති යි කියා ද ?

**රාජා**– ( කර්ණං දත්වා ) අයෙ ! ප්‍රතිපාල්‍යො'වසරඃ ඛලු ප්‍රස්තාවඃ

**මාතලිඃ**– ( රාජානම'වලොක්‍ය ) අස්මින්නශොකවෘක්ෂමූලෙ තාවදාස්තාමායුෂ්මාන්, යාවත්වාමින්ද්‍රගුරුවෙ නිවෙදයිතු- මන්තරාන්වෙෂී භවාමි.

**රාජා**– යථා භවාන් මන්‍යතෙ ? ( ස්ථිතඃ )

**මාතලිඃ**– ආයුෂ්මන්, සාධයාම්‍ය'හම් ( නිෂ්ක්‍රාන්තඃ )

**රාජා**– ( නිමිත්තං සූචයිත්වා )

13. මනොරථාය නා'ශංසෙ කිං බාහො ස්පන්දතෙ වෘථා
පූර්වා'වධීරිතං ශ්‍රෙයො දුඃඛං හි පරිවර්තතෙ.

**නෙපථ්‍යෙ**– මා ඛු ! මා ඛු ! චාවලං කරෙහි. කහං ගදෙ ජෙව අත්තණො පකිදිං? [ මා බලු! මා බලු චාපලං කුරු. කථං ගත එවා'ත්මන ප්‍රකෘතිම් ? ]

**රාජා**– ( කර්ණං දත්වා ) අභූමිරියමවිනයස්‍ය. කො නු ඛල්වෙ'ෂ නිෂිධ්‍යතෙ ? ( ශබ්දා'නුසාරෙණා'වලොක්‍ය සවිස්මයම් ) අයෙ ! කො නු ඛල්ව'යමනුබධ්‍යමානස්ත- පස්විනීභ්‍යාමබාලසත්වො බාලඃ ?

14. අර්ධපීතස්තනං මාතුරාමර්ද ක්ලිෂ්ට කෙසරම්
ප්‍රක්‍රීඩිතුං සිංහ ශිශුං බලාත්කාරෙණ කර්ෂති

( තතඃ ප්‍රවිශති යථා නිර්දිෂ්ට කර්මා තපස්විනීභ්‍යාං බාලඃ )

**බාලඃ**– ජිංභ සිංඝ, දංතාඉං දෙ ගණිඉස්සං. [ජෘම්භස්ව සිංහ, දන්තාංස්තෙ ගණයිෂ්‍යෙ]

**ප්‍රථමා**– අවිණිද, කිං ණො අපච්ච ණිව්විසෙසාණි සත්තාණි විප්පඅරොසි. හංත! වඩ්ඪඉ දෙ සංරංභො ඨාණෙ ක්ඛු ඉසිජණෙණ සව්වදමණො ත්ති කිද ණාමහෙඔ සි ? [අවිනීත, කිං නො'පත්‍යනිර්විශෙෂාණි සත්වානි විප්‍ර- කරොෂි ? හන්ත ! වර්ධතෙ තව සංරම්භඃ ස්ථානෙ ඛලු ඍෂිජනෙන සර්වදමන ඉති කෘත නාමධෙයො'සි ]

**රජ**– ( කන් යොමා ) සැබැවින් අවස්ථාව එබඳ නම් ඉඩක් ලැබෙන තෙක් සිටිමු.

**මාතලි**– ( රජු දෙස බලා ) මේ අශෝක ගස මුලැ පින්වතුන් මඳක් සිටිනු මැනැවි. මම සුර ගුරුට ඔබ ගැන දැන්වීමට අවසරය සොයමින් සිටිමි.

**රජ**– ඔබට සිතෙන සැටියෙකින්.

**මාතලි**– පින්වතුනි, මම යමි. ( පිටත් වෙයි )

**රජ**– ( නිමිත්තක් දැනැ )

13. රිසිත් කිසිත් නැ මහදේ අනේ තවත්
සැලෙන්නෙ ඇයි ! බාහුව මේ නිකාරණේ
යහත් වැලැක්කා පෙරමත් සියත් වූ
දුකක් තමා ඉන් බමවන්නෙ මා වටේ

**පසුබිම**– එපා, එපා සැබැවින් චපලකම් කරන්නට. පිසෙව් ගති දැන්ම මැ පහළි ද !

**රජ**– ( කන් දී) නො හික්මුණු කමට මේ තැන් නො වේ. සැබැවින් කවරෙක් මෙය වලකා ද ? ( ශබ්දය ආ දෙස විමසමින්, විශ්මයෙන්) තවුසියන් දෙ දෙනකු අනුවැ යන පරාක්‍රමයෙන් බාලයෙක් නො වූ මේ ළදරුවා කවරෙක් ද ?

14. කැලඹුණු කෙසුරු යුතු – අඩක් පී නන කිර් ඇති
මේ සිහ පොව්වා අදිත් – බලයෙන් මොහු මව් කෙරෙන්

( ඉක්බිති පිවිසෙයි. පෙරළ කී කිසෙහි යෙදුණු බාලයා තවුසියන් දෙ දෙන සමග.)

**බාලයා**– සිංහය, කට හරු; තා ගේ දත් ගණිමි.

**පළමු වැන්නි**– අකීකරුව, ඇයි දරුවන් යා වෙතසක් නැති මේ සතුන් වෙහෙස වන්නේ ? අහෝ ! ඔබ ගේ නලන කාරී ගති වැඩෙන සැටි, සැබැවින් සුදුසු යි ඔබට සර්ව දමන යයි නම් කිරීම,

**රාජා–** කිං නු ඛලු බාලේ'ස්මින්නෞරස ඉව පුත්‍රෙ ස්නිහ්‍යති. මෙ මනඃ. නූනමනපත්‍යතා මාං වත්සලයති. ]

**ද්විතීයා–** එසා ක්ඛු කෙසරිණී තුමං ලංඝෙදි! ජඉ සෙ පුත්තඅං ණ මුංචෙසි? [ එෂා ඛලු කෙසරිණී ත්වාං ලඞ්ඝයති. යදි තස්‍යාඃ පුත්‍රකං න මුඤ්චසි? ]

**බාලඃ–** ( සස්මිතම් ) අම්මහෙ! බලිඅං ක්ඛු භීදෙ ම්හි. [ අහො! බලීයඃ ඛලු භීතො'ස්මි ] ( අධරං දර්ශයති )

**රාජා–** 15 මහතස්තෙජසො බීජං බාලො'යං ප්‍රතිභාති මෙ
ස්ඵුලිඞ්ගා'වස්ථයා වහ්නිරෙධා'පෙක්ෂ ඉව ස්ථිතඃ

**ප්‍රථමා–** වච්ඡ, ඉදං බාලමිඉංදඅං මුංච. අවරං දෙ කීලණඅං දඉස්සං. [ වත්ස, එනං බාලමෘගෙන්ද්‍රං මුඤ්ච. අපරං තෙ ක්‍රීඩනකං දාස්‍යාමි ]

**බාලඃ–** කහිං? දෙහි ණං. [ කථං? දෙහි තත් ] ( හස්තං ප්‍රසාරයති )

**රාජා—** කථං චක්‍රවර්තිලක්ෂණමප්‍යනෙන ධාර්‍යතෙ? තථා හ්‍යස්‍ය.

16. ප්‍රලොභ්‍යවස්තු ප්‍රණය ප්‍රසාරිතො
විභාති ජාලග්‍රථිතා'ඞ්ගුලිඃ කරඃ
අලක්ෂ්‍ය පත්‍රා'න්තරමිද්ධරාගයා
නවො'ෂසා භින්නමිවෛක පඞ්කජම්.

**ද්විතීයා–** සුව්වදෙ, ණ සක්කො එසො වාආමෙත්තෙණ විරමාවිදුං. ගච්ඡ තුමං. මම්කෙරඑ උඩඑ මක්කංඩෙඅස්ස ඉසිකුමාරඅස්ස වණ්ණචිත්තිදෙ මිත්තිඅ මොරඅ-චිට්ඨිදි. තං සෙ උවහර. [සුව්‍රතෙ, න ශක්‍ය එෂ වාචාමාත්‍රෙණ විරමයිතුම්. ගච්ඡ ත්වම්. මදීයෙ උටජෙ මාර්කණ්ඩෙයස්‍යා'ර්ෂිකුමාරස්‍ය වර්ණචිත්‍රිතො මෘත්ති-කාමයූරකස්තිෂ්ඨති. තමස්‍යා'පහර

**රජ-** සැබැවින් කිම, මේ බාලයා කෙරෙහි ළෙහි ද පුතකුට මෙන් ම ගේ සිත ඇලුම් කරන්නේ ? ඒකාන්ත යෙන් අපුත්‍රකභාවය මා ලවා ආලය කරවයි.

**දෙ වැන්නී-** මේ සිංහ ධේනුව ඇගේ පැටියා නො මිදවී නම් ඔබට පහර දෙනවා ඇති.

**බාලයා-** ( සිනා සහිත වැ ) අම්මෝ ! ඇත්තෙන් මැ බෙහෙවින් බිය වෙමි. ( යටි තොල දක්වයි )

**රජ-15.** ඉමහත් තෙදෙකැ බිජු – වට වැනි මේ ළදරුවා
ගිනි රෙන් අවදියෙහි සිටි -දර රිසි ගිනි මෙන් පෙනේ

**පළමු වැන්නී-** පුතා, මේ සිංහ පැටියා මුදන්නැ. වෙන කෙළි බඩුවක් ඔබට දෙමි.

**බාලයා-** කෝ ? එය දෙන්නැ. ( අත දිගු කරයි )

**රජ-** මොහු සක්විති ලකුණුත් දරනවා නො වේ ද ? එ සේ මැයි; මොහු ගේ ත්,

16. දූලක් ලෙසින් එක් වූ ඇඟිල්ලෙනි යුත්
සිය'ත් නැමූ රිස්ස ලබා ගැනුම් නිසා
ඉතා උදේ වෙන් නො වූ පත් රැසින් හෙබී
සුරත් නෙලුම් සේ බබලයි මෙ සේ දිලි.

**දෙ වැන්නී-** සුසීලාවෙනි, වදන් පමණෙකින් මොහු නවතන්නට නො හැකි. ඔබ යන්නැ. ම ගේ පැළේ මාර්කණ්ඩෙය මුනි කුමරු ගේ මැටි මොනරෙක් ඇති. එය මොහුට ගෙනැවිත් දෙන්නැ.

**ප්‍රථමා**– තය. [තථා] (නිෂ්ක්‍රාන්තා)

**බාලඃ**– ඉමිණා එව්ව දාව් කිලිස්සං [අනෙනෛව තාවත් ක්‍රීඩිෂ්‍යෙ]

(තාපසීං විලොක්‍ය හසති)

**රාජා**– ස්පෘහයාමි බලු දුර්ලලිතායා සෙම.

17 ආලක්ෂ්‍ය දන්තමුකුලානනිමිත්තහාසෛ
රව්‍යක්ත වර්ණරමණීය වචඃ ප්‍රවෘත්තීන්
අඞ්කාශ්‍රයප්‍රණයිනස්තනයාං වහන්තො
ධන්‍යා සතදඞ්ගරජසා මලිනී භවන්තී

**තාපසී**- හොදු, ණ මං අඅං ගණෙදි. (පාර්ශ්වමවලොකයන්තී) කො එත්ථ ඉසිකුමාරාණං? (රාජානමවලොක්‍ය) භද්‍ද-මුහ, එහි දාව. මොඑහි ඉමිණා දුමෙමාඅහත්‍ථග්ගහෙණ ඞිංහලිලෑඑ බාධිඅමාණං බාලමිගුංදඅං, [භවතු න මාමයං ගණයති. කො'ත්‍ර ඍෂිකුමාරාණාම්? භද්‍රමුඛ, එහි තාවත්. මොචයා'නෙන දුර්මොචහස්තග්‍රහෙණ ඞිම්භලීලයා බාධ්‍යමානං බාලමෘගෙන්ද්‍රම්]

**රාජා**– (උපගම්‍ය සස්මිතම්) අයි! භොඃ මහාර්ෂිපුත්‍ර,

18 එවමාශ්‍රම විරුද්ධවෘත්තිනා සංයමඃ කිමිති ජන්මතස්ත්වයා
සත්ව සංශ්‍රය සුඛො'පි දූෂ්‍යතෙ කෘෂ්ණසර්ප
ශිශුනෙව චන්දනඃ

**තාපසී**– භද්දමුහ, ණ හු අඅං ඉසිකුමාරඔ. [භද්‍රමුඛ, න භ්‍ය'යං ඍෂිකුමාරඃ]

**රාජා**– ආකාරසදෘශං චෙෂ්ටිතමෙවා'ස්‍ය කථයති. ස්ථාන-ප්‍රත්‍යයාත්තු වයමෙවං තර්කිණඃ.

(යථා'භ්‍යර්ථිතමනුතිෂ්ඨන් බාලස්පර්ශමුපලභ්‍ය'ආත්ම-ගතම්.)

**පළමු මැන්නි**- එ සේ යැ. ( නික්මුණා )

**බාලයා**- එ හෙයින් මම මූත් සමග ක්‍රීඩා කරන්නම්.

( තවුසිය දෙස බලා සිනාසෙයි )

**රජ**- සැබැවින් මට මේ අකීකරුවා ප්‍රිය යි.

17. හාසෙන් අහේතුක මඳක් දිසි දත් කැලුම්වත්
තෙප්ලෙන් හෙබි නො මැ වියත් මිනහාර බස්යුත්
ගන්නා ගොවා ඇකයෙහි යදිනා සුතන් ඇත්
දූවිල්ලෙනි කිළිටිවූවහු වෙත් පිතැත්තෝ

**තවුසිය**- මොහු මා ගණන් නො ගණියි. ( හැරී බලන්නී ) මෙහි මුනි කුමරුවන් අතුරෙන් මොහු කවුරු ද ? ( රජු දැකැ ) සුවදන, මෙහි එන්නැ; මොහු විසින් නො මිදවියැ හැකි සේ අතින් අල්වා ගෙනැ ලාමක ලෙසින් පෙලනු ලබන මේ සිංහ පැටියා මුදන්නැ.

**රජ**- ( එළඹැ, සිනා සහිතවැ ) එම්බා මහාර්ෂි පුත්‍රය,

18. තවුස් වන නුහුරු පැවැතුම් ඇති නිව ට
සතුන් ඇසුර සොම්නස් දනවතත් න ට
සඳුන් රුකෙහි කලු සප් පැටියකු ලෙස ට
කිම, උපනින් මැ සංයම කෙලෙසනු ද සෙ ට

**තවුසිය**- සුවදන, සැබැවින් මොහු තවුස් කුමරෙක් නො වෙති.

**රජ**- මොහු ගේ විලාසයට සුදුසු ක්‍රියාව මැ එය කියාලයි. නැතේ සැටියෙන් අපි මෙ සේ අනුමාන කෙළෙමු.

(කී ලෙස කොටැ ළමයා ගේ පහස ලැබැ, තමාට මැ)

19 අනෙන කස්‍යා'පි කුලා'ඞ්කුරෙණ
ස්පෘෂ්ටස්‍ය ගාත්‍රෙෂු සුඛං මමෛ'වම්
කාං නිර්වෘතිං චෙතසි තස්‍ය කුර්‍ය්‍යාද්
යස්‍යා'යමඞ්කාත් කෘතිනඃ ප්‍රරූඪඃ

**තාපසී**- (උභෞ නිර්වර්ණ්‍ය) අච්ඡරිඅං! අච්ඡරිඅං! [ආශ්චර්‍ය්‍යමාශ්චර්‍ය්‍යම්!]

**රාජා**- ආර්‍ය්‍යෙ, කිමිව?

**තාපසී**- ඉමස්ස බාලඅස්ස රූවසංවාදිණී දෙ ආකිදි ත්ති විම්හාවිද ම්හි. අපරිඉදස්ස වි දෙ අප්පඩිලොමො සංවුත්තො ත්ති. [අස්‍ය බාලකස්‍ය රූපසංවාදිනී තෙ'ආකෘතිරිති විස්මාපිතා'ස්මි අපරිචිතස්‍යා'පි තෙ'ප්‍රතිලොමඃ සංවෘත්ත ඉති]

**රාජා**- (බාලකමුපලාලයන්) න චෙන්මුනිකුමාරො'යම්? අථ කො'ස්‍ය ව්‍යපදෙශඃ.

**තාපසී**- පුරුවංසො. [පුරුවංශඃ]

**රාජා**- (ආත්මගතම්) කථමෙකා'න්වයො මම. අතඃ ඛලු මදනුකාරිණමෙනමත්‍ර භවතී මන්‍යතෙ? අස්ත්‍යෙ'තත් පෞරවාණාමන්ත්‍යං කුලව්‍රතම්?

20 භවනෙෂු රසා'ධිකෙෂු පූර්වං
ක්ෂිතිරක්ෂාර්ථ මුශන්ති යෙ නිවාසම්
නියතෛ'ක යතිව්‍රතානි පශ්චා
ත්තරුමූලානි ගෘහී භවන්ති තෙෂාම්.

(ප්‍රකාශම්) න පුනරාත්මගත්‍යා මානුෂාණාමෙෂ විෂයඃ

**තාපසී**- ජහ භද්දමුහො භණාදි. අච්ඡරාසංබංධෙණ ඉමස්ස ජණණී එත්ථ දෙවගුරුණො තවොවණෙ පසූදා. [යථා, භද්‍රමුඛො භණති. අප්සරඃ සම්බන්ධෙනා'ස්‍ය ජනන්‍ය'ත්‍ර දෙවගුරොස්තපොවනෙ ප්‍රසූතා]

19. අනේ ! මොහුත් යම් කුල බීජයක් වූ
පහස් කෙනේ ගත්මි මේ වන් සුවක් මම
පිතැත්තකුත් ගත්ති උපන් මේ බාලයා
නිසා ඔවුන් සිත් නිවුමත් කෙ සේ දෙ

**තවුසිය**– ( ළං වැ දෙදෙනා දෙස මැ බලා ) පුදුමයි, පුදුමයි !

**රජ**– උත්තමාවෙනි, කවර හෙයින් ද ?

**තවුසිය**– මේ බාලයා ගේ රුවට සමාන වූ ඔබ රුව ද, නාඳුනන ඔබට අනුකූල පැවැත්ම ද යන මෙයින් පුදුමයට පත් වීමි.

**රජ**– ( ළදරුවා තලවමින්) ඉදින් මේ මුනි කුමරුවෙක් නො වේ ලු. එ සේ නම් මොහු ගේ වංශය කිමෙක් ද ?

**තවුසිය**– පුරුවංශය.

**රජ**– ( තමාට මැ ) කිම, මා හා එක මැ වංශයේ ? නැත හොත් සැබැවින් මා හා සමාන හැඬහුරුකම් ඇති මොහු ගැනැ මේ පිත්වතිය ගේ හැඟීමෙක් ද ? පෞරවයන් ගේ මෙ බඳු අන් කුල සිරිතකුත් වි ද ?

20. පළමු වියේ කම් රස යුතු රජ ගෙහි සිටැ මිහි රකි නි
මහළු වියේ ඔවුනට තව පිණිස ගෙවල් තුරුහු වෙ නි

( ශබ්ද නඟා ) නමුත් මේ පෙදෙස මිනිසුන් ගේ ස්වභාව ගමනට විෂය තැනෙක් නො වෙයි,

**තවුසිය**– ඔබ කියන දෙය එ සේ මැ යි. අප්සරාවක ගේ සම්බන්ධයෙන් මොහු ගේ මව සුරගුරු ගේ තපෝවනයේ බිහි වූවා,

**රාජා**- (ආත්මගතම්) හන්ත! ද්විතීයමිදමාශාජනනම් (ප්‍රකාශම්) අථ සා තත්‍ර භවති කිමාඛ්‍යස්‍ය රාජර්ෂෙඃ පත්නි?

**තාපසී**- කො තස්ස ධම්මදාරපරිච්චාඉණො ණාමං සංකිත්තිදුං චින්තිස්සදි? [කස්තස්‍ය ධර්මදාරපරිත්‍යාගිනො නාම සංකිර්තයිතුං චින්තයිෂ්‍යති?]

**රාජා**- (ස්වගතම්) ඉයං ඛලු කථා මාමෙව ලක්ෂි කරොති, යදි තාවදස්‍ය ශිශොර් මාතරං නාමතඃ පෘච්ඡාමි. අථවා ‘නාර්‍යඃ පරදාර ව්‍යවහාරඃ.

**තාපසී**- (ප්‍රවිශ්‍ය මෘන්මයූරහස්තා) සව්වදමණ, සඋන්දලා වණ්ණං පෙක්ඛ. [සර්වදමන, ශකුන්තලාවණ්‍යං ප්‍රෙක්ෂස්ව.]

**බාලඃ**- (සදෘෂ්ටික්ෂෙපම්) කහිං වා මෙ අජ්ජූ? [කුත්‍ර වා මම මාතා?

**උභෙ**- ණාම සාරිස්සෙණ වංචිදෙ මාඋවච්ඡලො. [නාම සාදෘශ්‍යෙන වඤ්චිතො මාතෘවත්සලඃ]

**ද්විතියා**- වච්ඡ, ඉමස්ස මිත්තිඅමොරස්ස රම්මත්තණං දෙක්ඛත්ති භණිදෙ සි. . [වත්ස, අස්‍ය මෘත්තිකාමයූරස්‍ය රම්‍යත්වං පශ්‍යෙ‘ති භණිතො‘සි]

**රාජා**- (ආත්මගතම්) කිං වා ශකුන්තලෙ‘ත්‍ය‘ස්‍ය මාතුරාඛ්‍යා? සන්ති පුනර් නාමධෙය සාදෘශ්‍යානි. අපි නාම මෘග-තෘෂ්ණිකෙ‘ව නා‘මමාත්‍ර ප්‍රස්තාවො මෙ විෂාදය කල්පෙත

**බාලඃ**- අජ්ජුඑ, රොඅදි මෙ එසො භද්දමොරඔ. [මාතඃ රොචතෙ මෙ එෂ භද්‍රමයූරඃ]

(ක්‍රීඩනකමාදත්තෙ]

**රජ**– ( තමාට මැ ) අපොයි, මේ දෙවන වරටත් බලාපොරොත්තු ඇති කරවීමෙක් ඉතේ ! (ශබ්ද නගා) එසේ නම් ඒ උත්තමාව කිනම් රාජර්ෂියකු ගේ දේවියක් ද ?

**තවුසිය**– සිය බිරිය හැර දූමු ඔහු ගේ නම කීමට කවරෙක් සිතත් ද?

**රජ**– ( තමාට මැ ) සැබැවින් මේ කථාව මා මැ ලක් කරයි. මේ ළමයා ගේ මවු ගේ නම විචාලේ නම් එය අශිෂ්ට පරදාර ව්‍යවහාරය පිණිස පවතී ද ?

**තවුසිය**– (මැටි මොනරා අතැ'නිව පිවිසැ )සර්වදමන, මේ ශකුන්ත–ලාවණ්‍යය බලන්නැ.

**බාලයා**– ( බැල්මක් හෙලා ) කෝ මගේ මව ?

**දෙ දෙන**– සමාන නමින් මාතෘ ප්‍රේමියා රැවටුනා.

**දෙ වැන්නී**– පුතා, මේ මැටි මොනරා ගේ ලක්ෂණ බලන් නට යැ කීයේ

**රජ**– ( තමාට මැ ) කිම, ශකුන්තලා ද මොහු ගේ මවු ගේ නම ? නම් ගොත් සමාන වූවෝ නවද වෙති. මිරිඟුවක් මෙන් මෙහි මේ අවස්ථාව මගේ දුක පිණිස නො පවතී නම් යෙහෙකි.

**බාලයා**– අම්මේ, මේ ලක්ෂණ මොනරාට මා කැමති යි.

( කෙළි බඩුව ගනියි )

**ප්‍රථමා**- (විලොක්‍ය සොද්වෙගම්) අම්මහෙ! රක්ඛාකරංඩ අං සෙ මණිබංධෙ ණ දීසදි. [අහො! රක්ෂාකරණ්ඩකමස්‍ය මණිබන්ධෙ න දෘශ්‍යතෙ]

**රාජා**- අලමලමාවේගෙන. නන්විදමස්‍ය සිංහශාවවිමර්දාත් පරිභ්‍රෂ්ටම්.

(ආදාතුමිච්ඡති)

**උභෙ**- මා ඛු! මා ඛු එදං අවලංබිඅ! කහං ගහිදං ණෙණ? [මා ඛලු! මා ඛල්විදමවලම්බ්‍ය. කථං ගෘහීතමනෙන? (විස්මයාදුරොනිහිත හස්තෙ පරස්පර මවලොකයතඃ)

**රාජා**- කිමර්ථං ප්‍රතිෂිද්ධාඃ ස්මඃ?

**ප්‍රථමා**- සුණාදු, මහාරාඕ. එසා අවරාජිදා ණාම ඔසහී. ඉමස්ස ජාදකම්මසමඑ භඅවදා මාරීඑණ දිණ්ණා. ඉදං කිල මාදාපිදරෙ අප්පාණං ච වජ්ජිඅ අවරො භූමිපඩිදං ණ ගෙණ්හාදි. [ශෘණොතු, මහාරාජඃ. එෂා'පරාජිතා නාමෞෂධිරස්‍ය ජාතකර්මසමයෙ භගවතා මාරීචෙන දත්තා. එතාං කිල මාතාපිතරාවාත්මානං ච වර්ජයිත්වා'පරෙ භූමිපතිතාං න ගෘහ්ණාති]

**රාජා**- අථ ගෘහ්ණාති?

**ප්‍රථමා**- තදො ණං සප්පො භවිඅ දංසඉ. [තතස්තං සර්පො භූත්වා දශති]

**රාජා**- භවතීභ්‍යාං කදාචිදස්‍යාඃ ප්‍රත්‍යක්ෂී කෘතා වික්‍රියා?

**උභෙ**- අණෙඅසො. [අනෙකශඃ]

**රාජා**- (සහර්ෂම්, ආත්මගතම්) කථමිව සම්පූර්ණමපි මෙ මනොරථං නාභිනන්දාමි. (බාලං පරිෂ්වජතෙ)

**ද්විතීයා**- සුව්වදෙ, එහි. ඉමං වුත්තන්තං ණිඅමව්වාවුදාඑ සඋන්දලාඑ ණිවෙදම්හ. [සුව්‍රතෙ, එහි. ඉමං වෘත්තාන්තං නියමව්‍යාපෘතායෛ ශකුන්තලායෛ නිවෙදයාවඃ]

(නිෂ්ක්‍රාන්තෙ)

**පළමු වැන්නී**– (බලා, බියෙන්) අපොයි, කෝ අතේ බැඳ තුබූ ආරක්‍ෂක යන්ත්‍රය!

**රජ**– කලබල වන්නට එපා; එපා ! මෙන්න. සිංහ පැටියා හා පොර ඇල්ලීමෙන් ඔහු ගේ යන්ත්‍රය වැටිලා.

( ගැනීමට සිතයි )

**දෙ දෙනා**– සැබැවින් එපා, එපා ගන්නට! කෙ සේ ද මොහු විසින් ගන්නා ලද්දේ ? ( විෂ්මයෙන් ළයැ තැබූ අත් ඇතිවැ ඔවුනොවුන් දෙස බලති )

**රජ**– ඇයි, මා වැලැක්වූයේ ?

**පළමු වැන්නී**- මහරජ අසනු මැනැවි. මේ අපරාජිත නම් ඔසු වෙයි. මොහුගේ ජාතකර්ම මඟුලේ:දී භගවත් මාරීච විසින් මෙය දෙන ලදී. මවු පියන් හා තමාත් හැර අනිකෙක් බිමැ වැටුණු මෙය නො ගතිති.

**රජ**– ඉදින් ගත්තොත් !

**පළමු වැන්නී**– එ විටැ එය සර්පයෙක් වැ ඩසියි.

**රජ**– ඔබ මේ වෙනස කිසි විටෙකත් අත්හද බැලුවාහු ද ?

**දෙ දෙනා**– නොයෙක් වර.

**රජ**– ( ප්‍රීතියෙන් තමාට මැ ) සැබැවින් කිම, මගේ අභිලාෂය සපිරීත් මා තුටු නො වන්නේ ? (ළමයා වැළඳැ ගනියි )

**දෙ වැන්නී**– සුසීලාවෙනි, එන්නැ; මේ පුවත ව්‍රතයෙහි යෙදී-සිටිත ශකුන්තලාවට දන්වමු.

(පිටත් වෙති)

**බාලඃ**- මුංච මං, ජාව අජ්ජුඑ සආසං ගමිස්සං. [මුඤ්ච මාම්. යාවන්මාතුඃ සකාශං ගමිෂ්‍යාමි]

**රාජා**- පුත්‍රක, මයා සහෛ'ව මාතරමභිනන්දිෂ්‍යසි ?

**බාලඃ**- මම ක්ඛු තාදෙ දුස්සංදෙ, ණ තුමං. [මම ඛලු තාතො දුෂ්‍යන්තඃ න ත්වම්.]

**රාජා**- (සස්මිතම්) එෂ විවාද එව ප්‍රත්‍යායයති.

(තතඃ ප්‍රවිශත්‍යෙ'කා වෙණිධරා ශකුන්තලා)

**ශකුන්තලා**- විආරකාලෙ වි පකිදිත්ථං සව්වදමණස්ස ඔසහිං සුණිඅ ණ මෙ ආසා ආසි භඅධෙඑසු. අහවා ජහ සාණුමදිඑ ආචක්ඛිදං තහ සංභාවීඅදි එදං. [විකාරකාලෙ'පි ප්‍රකෘතිස්ථාං සර්වදමනස්‍යෞෂධිං ශ්‍රුත්වා න ම ආශා'සී දාත්මනො භාගධෙයෙෂු. අථවා යථා සානුමත්‍යා'ඛ්‍යාතං තථා සංභාව්‍යත එතත්]

**රාජා**- (ශකුන්තලාං විලොක්‍ය) අයෙ! සෙයමත්‍ර භවතී ශකුන්තලා, යෛ'ෂා-

31. වසනෙ පරිධූසරෙ වසානා
නියමක්ෂාමමුඛී ධෘතෛ'කවෙණිඃ
අති නිෂ්කරුණෙ'ස්‍ය ශුද්ධශීලා
මම දීර්ඝං විරහව්‍රතං බිභර්ති

**ශකුන්තලා**- (පශ්චාත්තාප විවර්ණං රාජානං දෘෂ්ට්වා) ණ ක්ඛු අජ්ජඋත්තො විඅ තදෙ කො එසො දාණිං කිදරක්ඛාමංගලං දාරඅං මෙ ගත්තසංසග්ගෙණ දූසෙදි. [න ඛල්වා'ර්‍යපුත්‍ර ඉව. තතඃ ක එෂ ඉදානීං කෘත රක්ෂාමඞ්ගලං දාරකං මෙ ගාත්‍රසංසර්ගෙණ දූෂයති]

**බාලඃ**- (මාතරමුපෙත්‍ය) අජ්ජුඑ, එසො කො වි පුරිසො මං පුත්ත ත්ති ආලිංගදි. [මාතඃ, එෂ කො'පි පුරුෂො මාං පුත්‍ර ඉත්‍යා'ලිඞ්ගති]

**රාජා**- ප්‍රියෙ, ක්‍රෞර්‍යමපි මෙ ත්වයි, ප්‍රයුක්තමනුකූලපරිණාමං සංවෘත්තම්, යදහමිදානීං, ත්වයා ප්‍රත්‍යා'භිඥාතමාත්මානං පශ්‍යාමි.

**බාලයා**– මව ළඟට යන්නට මා මුදන්නැ.

**රජ**– මා සමග මැ ( ගොස් ) මව තුටු කරන්නැ.

**බාලයා**– ම ගේ පියා දුෂ්‍යන්ත. ඔබ නො වෙහි.

**රජ**– මේ විවාදය මැ මට කරුණු පහදයි.

( ඉක්බිති එක් කොටැ බැඳි කෙස් වැටියෙන් යුතු ශකුන්තලා පිවිසෙයි )

**ශකුන්තලා**– වෙනස් වියැ යුතු කාලයේ දී පවා නො වෙනස් වූ සර්වදමන ගේ බෙහෙත පිළිබඳ වැ අසා ම ගේ දෛවය ගැන ආශාවෙක් නූපී. නො වේ නම් සානුමතිය කී ලෙස එයත් වියැ හැකි යි.

**රජ**– ( ශකුන්තලා දෙස බලා ) ඕ! මේ ඒ ශකුන්තලා උත්තමාව දෝ? මෙහි ඈ,

21. කිළිටි වත් හැඳැ වැහැරි මුව හා වරල එක්
කොටැ බැඳැ මැ නිරතුරු
නුගුණ මා ගෙන් පැමිණී වියොවත රකියි
සිල් ගුණ දරා පිවිතුරු

**ශකුන්තලා**– ( පසුතැවීමෙන් සුදුමැලි වූ රජු දැකැ ) සැබැවින් මොහු ම-හිමියා වැනි නො වෙති. ඉනික් මේ කවුරු ද, කළ රක්ෂාවරණ මගුල් ඇති මි ගේ ළමයා ශරීරස්පර්ශයෙන් කිළිටි කරන්නේ?

**බාලයා**– (මව් වෙත එළඹැ) අම්මේ, මේ කවුදෝ මිනිහෙක් මා පුතා යැයි වඩා ගනියි,

**රජ**– ප්‍රියාවෙනි, ඔබ කෙරෙහි මා රළු වූවත් සබැඳියාවෙන් එකිනෙකා සතු ස්නෙහය මුහුකුරා පවතී. දැන් මම ඔබ විසින් හඳුනා ගන්නා ලද්දේ යැ යි සිතමි,

**ශකුන්තලා**- (ආත්මගතම්) හිඅඅ, අස්සස! අස්සස! පරිච්චත්ත මච්ඡරේණ අණුඅංපිඅම්හි දෙව්වෙණ. අජ්ජඋත්තො ක්ඛු එසො. [හෘදය, අශ්වසිහි; අශ්වසිහි. පරිත්‍යක්තමත්සරේණා 'නුකම්පිතා'ස්මි දෛවෙන, ආර්‍යපුත්‍රඃ ඛල්වෙෂඃ]

**රජා**- ප්‍රියෙ,

22. ස්මෘතිභින්න මෝහතමසෝ
දිෂ්ට්‍යා ප්‍රමුඛෙ ස්ථිතා 'සි මෙ සුමුඛි
උපරාගා 'න්තෙ ශශිනඃ
සමුපගතා රෝහිණී යෝගම්

**ශකුන්තලා**- ජෙදු, ජෙදු...... [ජයතු! ජයතු!......] (අර්ධො 'ක්තෙ බාෂ්පකණ්ඨී විරමති)

**රජා**- සුන්දරි,

23. බාෂ්පෙණ ප්‍රතිෂිද්ධෙ'පි ජයශබ්දෙ ජිතං මයා
යත් තෙ දෘෂ්ටමසංස්කාර පාටලො'ෂ්ඨපුටං මුඛම්

**බාලඃ**- අජ්ජුඑ, කො එසො? [මාතඃ, ක එෂඃ?]

**ශකුන්තලා**- වච්ඡ, දෙහාඅහෙආඉං පුච්ඡෙහි? [වත්ස, තෙ භාගදෙයානි පෘච්ඡ?] (රෝදිති)

**රජා**- 24. සුතනු, හෘදයාත් ප්‍රත්‍යා 'දෙශව්‍යලීකමපෛතුතෙ
කිමපි මනසඃ සම්මොහො මෙ තදා බලවානභූත්
ප්‍රබලතමසාමෙවං ප්‍රායඃ සුභෙෂු හි වෘත්තයඃ
ස්‍රජමපි ශිරස්‍ය'න්ධඃ ක්ෂිප්තාං ධුනොත්‍ය'හිශඞ්කයා

(පාදයොඃ පතති)

**ශකුන්තලා**- උට්ඨෙදු උට්ඨෙදු අජ්ජඋත්තො, ණූණං මෙ සුඅරිඅප්පඩිබංධඅං පුරාකිදං තෙසු දිඅහෙසු පරිණාමමුහං ආසි ජෙන සාණුක්කොසො වි අජ්ජඋත්තො මඉ විරසො සංවුත්තො. [උත්තිෂ්ඨතු! උත්තිෂ්ඨත්වා'ර්‍ය පුත්‍රඃ. නූනං මෙ සුචරිතප්‍රතිබන්ධකං පුරාකෘතං තෙසු දිවසෙෂු පරිණාම-මුඛමාසීද්‍යේනමනුක්‍රොශො'ප්‍යා'ර්‍යපුත්‍රො මයි විරසඃ සංවෘත්තඃ]

**ශකුන්තලා**- ( තමාට මැ ) හෘදය, සැනසෙව, සැනසෙව. භරතා ලද මාත්සර්‍ය ඇති දෛවය විසින් මැ නැවත අනුකම්පා කරන ලද්දේ වෙමි. සැබැවින් මේ මි-හිමියා මැ යැ.

**රජ**- ප්‍රියාවෙනි,

22. පිනෙත් හැඳිනැ පළවා හැරි මොහඳුරැ' නි
මා අබියෙස්හි පේමිය, දූත් ඔබ සිටි නි
ගහනත මිදුණු රෝහිණී තරුව සහ රැ නි
එක් වීමට පැමිණි ලෙස විය තුරැහු ප නි

**ශකුන්තලා**- දිනේවා, දිනේවා.... (අඩක් කියත් මැ උගුර හිරවීමෙන් නවතියි)

**රජ**- සොඳුර,

23. කඳුලින් වැලැකූ තමූඳු ජය තද
මම තම් දිනිමි සැබැවින් සිතු ලෙද
රත්වන් සුදු මැලි තොල් බිමු නිවරද
යුත් ඔබ ගේ මුව දුටු හෙයිනි අද

**බාලයා**- අම්මේ ! කවුද ඒ ?

**ශකුන්තලා**- පුතා, ඔබ සතු දායාදය ඉල්ලන්නැ ( හඬයි ).

**රජ**- 24. පිටු දැකුමෙන් එද ඔබ හද වත් එ දූක
දුරලනු සොඳුර එය සැබැවින් මූළාවෙක
යහ දෙස පවා පෙරලයි මෝහය වරෙක
අද හිස සලයි මල්දම සැකයෙන් සපෙක

( පා මුලැ වැටෙයි )

**ශකුන්තලා**- නැඟිටින්නැ, නැඟිටින්නැ හිමියෙනි, ඒ දින වලැ පෙරැ මා කළ දෑ (පව්) ඒකාන්තයෙන් ම ගේ සුචරිතයනට විරුදුව මිහි කැරිණි. එ හෙයිනි පෙම්වත් ස්වාමි පුත්‍රයා ද මා කෙරෙහි ඇල්මක් නො දැක් වූයේ.

(රාජා උත්තිෂ්ඨති)

**ශකුන්තලා–** ජය කහං අජ්ජඋත්තෙණ සුමරිද දුක්ඛභාඉං අඅං ජණො?[අථ කථමා'ර්‍යපුත්‍රේණ ස්මෘතො දුඃඛභාග්‍ය'යං ජනඃ?]

**රාජා–** උද්ධෘත විෂාදශල්‍යඃ කථයිෂ්‍යාමි.

25. මෝහාන්මයා සුතනු පූර්වමුපේක්ෂිතස්තෙ
යො බාෂ්පබින්දුරධරං පරිබාධමානඃ
තං තාවදාකුටිල පක්ෂ්මවිලග්නමද්‍ය
කාන්තෙප්‍රමෘජ්‍ය විගතා'නුශයො භවෙයම්

(යථෝ'ක්ත මනුතිෂ්ඨති)

**ශකුන්තලා–** (නාමමුද්‍රාං දෘෂ්ට්වා) අජ්ජඋත්ත, එදං තං අංගුලිඅඅං. [ආර්‍යපුත්‍ර, එතත් තදඞ්ගුලීයකම්]

**රාජා–** අස්මාදඞ්ගුලීයකො'පලම්භාත් ඛලු ස්මෘතිරුප ලබ්ධා;

**ශකුන්තලා–** විසමං කිදං ණෙණ ජං තදා අජ්ජඋත්තස්ස පච්චාඅණකාලෙ දුල්ලහං ආසි. [විෂමං කෘතම'නෙන යත් තදා'ර්‍යපුත්‍රස්‍ය ප්‍රත්‍යායනකාලෙ දුර්ලභමාසීත්]

**රාජා–** තෙන හ්‍යෘතුසමවාය චිහ්නං ප්‍රතිපද්‍යතාං ලතා කුසුමම්.

**ශකුන්තලා–** න සෙ විස්සසාමි. අජ්ජඋත්තො එව්ව ණං ධාරෙදු. [නා'ස්‍යවිශ්වසිමි. ආර්‍යපුත්‍ර එවෛ'තද් ධාරයතු.]

(තතඃ ප්‍රවිශති මාතලිඃ)

**මාතලිඃ–** දිෂ්ට්‍යා ධර්මපත්නී සමාගමෙන පුත්‍රමුඛදර්ශනෙන වා'යුෂ්මාන් වර්ධතෙ.

**රාජා–** අභූත් සම්පාදිත ස්වාදුඵලො මෙ මනොරථඃ. මාතලෙ, න ඛලු විදිතො'යමාඛණ්ඩලෙන වෘත්තාන්තඃ ස්‍යාත්?

( රජ නැඟී සිටියි )

**ශකුන්තලා–** ඉතින් ම හිමියන් විසින් මේ දුප්පත් තැනැත්තිය කෙ සේ සිහි කරන ලද්දේ ද ?

**රජ–** උදුරන ලද සෝ හුල් ඇති මම ( එය ) කියමි.

25. එම්බා පියේ නො සැලැකී පෙරළ වූ ඔබේ නෙත්-
ගී වත් දියත් කිසි ලෙසිත් බිඟු තොල් පෙළූ ඒ
වක් වූ මදක් පිය'ග නෙත් රළුණු එයත් දැන්
ඇත්තෙක් වෙමි පිස දමා පඟ වූ තැවුල් යුත්

( එ ලෙස කරයි )

**ශකුන්තලා–** ( පේරැස් මුදුව දැක ) හිමියෙනි මේ අර මුදුව.

**රජ–** මේ මුදුව දැකීමෙන් පසුවයි ඔබ සිහියට නැඟුනේ.

**ශකුන්තලා–** එදා මා පිටමං කරන වේලෙහි නැති වීමෙන් මේ මුදුව කෙළේ නපුරක්.

**රජ–** එ සේ නම් සෘතු සංගමයේ සලකුණක් වශයෙන් ලිය කුසුම් ගනීවා.

**ශකුන්තලා–** මම එය විශ්වාස නො කරමි. හිමිතුමා මැ එය පළඳින්නැ.

( ඉක්බිති මාතලි පිවිසෙයි )

මාතලි– දෛවයෙන් සිය බිරිය හා එක් වීමෙන් ද පුත් මුව දැකීමෙන් ද පින්වතා සමෘද්ධිමත් ය.

**රජ–** ම ගේ මනදෙළ සැපැයුණු මිහිරි පලින් යුතු යැ. මාතලී, සැබැවින් ඉඳුසා මේ පුවත නො දත්තේ ද ?

**මාතලිඃ**– (සස්මිතම්) කිමිගොචරාණං පරොක්ෂම්. එත්වා'යුෂ්මාන්, භගවාන් මාරීචස්තෙ දර්ශනං විතරති.

**රාජා**– ශකුන්තලෙ, අවලම්බ්‍යතාං පුත්‍රඃ. ත්වාං පුරස්කෘත්‍ය භගවන්තං ද්‍රෂ්ටුමිච්ඡාමි.

**ශකුන්තලා**– හිරිආමි අජ්ජඋත්තෙණ සහ ගුරුසමීවං ගං-තුං. [ජිහ්‍රෙම්‍යා'ර්‍ය පුත්‍රෙණ සහ ගුරුසමීපං ගන්තුම්]

**රාජා**– අප්‍යා'චරිතව්‍යමභ්‍යුදය කාලෙෂු. එහ්‍යෙ'හි!

(සර්වෙ පරික්‍රාමන්ති)

(තතඃ ප්‍රවිශත්‍යදිත්‍යා සාර්ධමාසනස්ථො මාරීචඃ)

**මාරීචඃ**– (රාජානමවලොක්‍ය) දාක්ෂායණි,

26. පුත්‍රස්‍ය තෙ රණශිරස්‍ය'යමග්‍රයායී
දුෂ්‍යන්ත ඉත්‍ය'භිහිතො භුවනස්‍ය භර්තා
චාපෙන යස්‍ය විනිවර්තිත කර්මජාතං
තත් කොටිමත් කුලිශමාභරණං මඝොනඃ

**අදිතිඃ**– සම්භාව අණුභාවා සෙ ආකිදී. [සම්භාවනීයා'නුභාවා'ස්‍යා'කෘතිඃ]

**මාතලිඃ**– ආයුෂ්මන්, එතෞ පුත්‍රප්‍රීතිපිශුනෙන චක්ෂුෂා දිවෞ-කසාං පිතරාවා'යුෂ්මන්තමවලොකයතඃ, තාවු'පසර්ප.

**රාජා**– මාතලෙ,

27. ප්‍රාහුර් ද්වාදශධා ස්ථිතස්‍ය මුනයො යත් තෙජසඃ කාරණං
භර්තාරං භුවනත්‍රයස්‍ය සුෂුවෙ යද්‍ය'ඥභාගෙ'ශ්වරම්.
යස්මින්නාත්මභුවඃ පරො'පි පුරුෂශ්චක්‍රෙ භවායා'ස්පදං
ද්වන්ද්වං දක්ෂමරීචි සම්භවමිදං තත් ස්‍රෂ්ටුරෙකා'න්තරම්.

**මාතලිඃ**– අථ කිම්?

**රාජා**– (උපගම්‍ය) උභාභ්‍යාමපි වාසවනියොජ්‍යො දුෂ්‍යන්තඃ ප්‍රණමති.

**මාතලී**– (සිනා සහිතව) ඉඳුරනට කිමෙක් අවිෂය වේ ද? එන්නැ; පිත්වතාණෙනි, භගවත් මාරිච ඔබ දක්නට රිසි වෙයි.

**රජ**– ශකුන්තලා, පුතා වඩා ගන්නැ. ඔබ පෙරටු කොට භගවතුන් දකිනු රිසියෙමි.

**ශකුන්තලා**– හිමියා සමග ගුරුතුමන් ළඟට යාමට ලජ්ජා ඇත්තෙමි.

**රජ**– අභිවෘධි අවසථාවන්හි එ සේ හැසිරියැ යුතු නො වැ එන්නැ, එන්නැ.

(සියල්ලෝ සිනාරති)

(ඉක්බිති අදිතිය හා අසුනකැ හුන් මාරිච පිවිසෙයි)

**මාරිච**– (රජු දෙස බලා) දාක්ෂායණිය,

26. තී ගේ එ පුත් රණ බිමේ නයුවාණ වූ මේ
දුස්සන්ත යැ යි පළ නමින් ලොව තිත් රකින්නා
දුන්නෙන් නිමූ කිස ඇති එ හෙයින් සහස් නෙත්
වූ යේ හුදෙක් අබරණක් මැ යැ සත් නො සෙල් වූ

**අදිති**– සම්භාවනීය මහිමවත් පෙනුමෙන් එය දත හැකි.

**මාතලී**– පිත්වතාණෙනි, දරු පෙම් හඟවන නෙතින් මේ සුර දෙ ගුරුහු ඔබ දෙස බලති. ඔවුන් වෙත ළඟා වන්නැ.

**රජ**– මාතලී,

27. දෙකට බෙදුණු එක් වැ මැවී, දක්‍ෂ මරිචි බඹ
දරුවෝ යම් යුවලක් බිහි කළෝද ලොවට වැඩ සඳ
දෙළොස් අයුරකින් සිටි හිරු ලොවට දෙනුව මුල් වූ
වන් ඔවුන් වෙනියි මහ ඉසිහු ද, කියති මේ ලෙද
තිලොව ඉසුරු යාගපති ද, පහළ කළෝ නම් සැබැ–
විත් මේ අඹු සැමි යුවල වෙති ද, දිලෙන දළ තෙද–
මහ පුරිසකු බඹුට වඩා, උපත පිණිස නිවෙස්
කළෝ, මොහු ද මහිමයෙන් බබලන මෙනිති හැම සඳ

**මාතලී**– වෙන කවුරු ද?

**රජ**– (එළඹැ) ඉන්ද්‍රයා ගේ සේවක දුෂ්‍යන්ත ඔබ නමදියි.

මාරීචඃ- වත්ස, චිරං ජීව පෘථිවීං පාලය.

අදිතිඃ- වච්ඡ, අප්පඩිරධො හොහි. [වත්ස, අප්‍රතිරථො භව.]

ශකුන්තලා- දුරඅසහිද වො පාදවංදණං කරෙමි. [දුරක-සහිතා වාං පාදවන්දනං කරොමි]

මාරීචඃ- වත්සෙ,

28. ආඛණ්ඩල සමො භර්තා-ජයන්ත ප්‍රතිමඃ සුතඃ
ආශිරන්‍යා න තෙ යොග්‍යා-පෞලොමී සදෘශී භව,

අදිතිඃ- ජාදෙ, භත්තුණො අහිමදා හොහි, අඅං ච දීහාඋ වච්ඡඔ උහඅඋල ණංදණො හොදු, උවවිසහ. [ජාතෙ භර්තුරභිමතා භව. අයං ච දීර්ඝා'යුර් වත්ස උභයකුල නන්දනො, භවතු, උපවිශත.]

(සර්වේ ප්‍රජාපතිමභිත උපවිශන්ති)

මාරීචඃ- (එකෛක'ං නිර්දිශන්)

29. දිෂ්ට්‍යා ශකුන්තලා සාධ්වී සදපත්‍යමිදං භවාන්
ශ්‍රද්ධා විත්තං විධිශ්චෙති ත්‍රිතයං තත් සමාගතම්.

රාජා- භගවන්, ප්‍රාගභිප්‍රෙතසිද්ධිඃ. පශ්චාද් දර්ශනම්. අතො පූර්වඃ ඛලු වො'නුග්‍රහඃ. කුතඃ,

30. උදෙති පූර්වං කුසුමං තතඃ ඵලං
ඝනො'දයඃ ප්‍රාග් තදනන්තරං පයඃ
නිමිත්ත නෛමිත්තිකයොරයං ක්‍රම—
ස්තව ප්‍රසාදස්‍ය පුරස්තු සම්පදඃ

මාතලිඃ- එවං විධාතාරඃ ප්‍රසීදන්ති.

රාජා- භගවන්, ඉමමාඥාකරිං වො ගාන්ධර්වේණ විවාහවිධි-නො'පයම්‍ය කස්‍යචිත් කාලස්‍ය බන්ධුභිරානීතාං සමෘති-ශෛථිල්‍යාත් ප්‍රත්‍යාදිශන්නපරද්ධො'ස්මි. තත්‍ර භවතො 'යුෂ්මාත් සගොත්‍රස්‍ය කණ්වස්‍ය. පශ්චාදඞ්ගුලීයක දර්ශ-නාදූඪපූර්වාං තද්දුහිතරමවගතො'හම්. තච්චිත්‍රමිව මෙ ප්‍රතිභාති.

**මාරීච**— දරුව, සැරද, ලෝ රකුව.

**අදිති**- දරුව. අසමාන වීරයෙක් වෙහිවා.

**ශකුන්තලා**- දරුවා සහිත මම ඔබ පා වඳිමි.

**මාරීච**- දරුව

28. හිමිසක් සදිසි මැ සි
පුත් ජයතුන් අනුරු මැ සි
අන් පැතුම 'යුතු මැ සි
ඔබ පුලෝමිය සදිසි වෙත් මැසි

**අදිති**- දුව, හිමියාට, රිසිවන්තියක් වෙව. මේ දිගා කුමරුවා දෙ කුල පිතවන්නෙක් වේවා. (හිඳගැන්තූ)

(සියල්ලෝ මාරීච ලඟ හිඳගතිති)

**මාරීච**- (එකිනෙකා පෙන්වමින්)

29. සකුන්තලා සුසු දු
ඔබ සමග මේ පුතුනු දු
බැති, විදි ඉසුරු බ දු
තෙපල එක්වුණු මෙලෙස පිතෙනු දු

**රජ**- භාග්‍යවතුනි, පළමු වැ අභිප්‍රෙතාර්ථ සිඬිය යැ. පසු වැ ඔබගේ දර්ශනය යැ; එහෙයින් ඔබගේ අනුග්‍රහය සැබැවින් පෙර නො වූ වෙකි. කෙසේ ද ?

30, මල් ගැන් මෙන් පසු හි පල වැල පූදින්නේ
මේ කුලෙන් පසු සි දිය කඳ බිහිවන්නේ
පල හෙය දෙකෝ අනු පිළිවෙල මෙය වන්නේ
එ නමුත් සුවය ඔබ සතොසට පෙරු වන්නේ

**මාතලි**- මෙසේ විධාතෲහු පැහැදියාව දක්වත්.

**රජ**- භාග්‍යවතුනි, ගන්ධර්ව විවාහ ක්‍රමයෙන් පාවාගත්, කල කට පසු නෑයන් විසින් කැඳවා ගෙනැ ආ, ඔබගේ මේ කිංකරු දියණිය සිහි මුළාවීම නිසා පිටමංකිරීමෙන් ඔබ හා සම ගොත් ඇති කණ්ව සෘෂීන්‍ද්‍රට වරදක් කෙළෙමි. පසු වැ මුදුව දැකීමෙන් එතුමාගේ දුව විවා කළ බව මම දනිමි. එය සිතුවම් පටක් මෙන් මට වැටහෙයි.

31. යථා ගජෝ නේ'ති සමක්ෂරූපෙ
තස්මින්නපක්‍රාමති සංශයඃ ස්‍යාත්
පදානි දෘෂ්ට්වා තු භවෙත් ප්‍රතීතිඃ
තථා විධො මෙ මනසො විකාරඃ

මාරීචඃ- වත්ස, අලමාත්මාපරාධ ශඞ්කයා. සම්මොහො'පි ත්වය්‍යු'පපන්නඃ. ශ්‍රූයතාම්—

රාජා- අවහිතො'ස්මි.

මාරීචඃ- යදෛ'වාප්සරස්තීර්ථාවතරණාත් ප්‍රත්‍යක්ෂවෛ-ක්ලව්‍යාං ශකුන්තලාමාදය මෙනකා දාක්ෂායණීමුපගතා. තදෛ'ව ධ්‍යානාදවගතො'ස්මි දුර්වාසසඃ ශාපාදියං තපස්විනී සහධර්මචාරිණී ත්වයා ප්‍රත්‍යාදිෂ්ටා, නා'න්‍යථෙ-'ති, ස චා'යමඞ්ගුලීයක දර්ශනා'වසානඃ.

රාජා- (සෝ'ච්ඡ්වාසම්) එෂ වචනීයා මුක්තො 'ස්මි.

ශකුන්තලා- (ස්වගතම්.) දිට්ඨිආ අකාරණ පච්චාදෙසී ණ අජ්ජඋත්තො. ණ හු සත්තං අත්තාණං සුමරෙමි. අහවා පත්තො මඑ ස හි සාවො විරහසුණ්ණහිඅආඑ ණ විදිදො. අදො සහීහිං සංදිට්ඨම්හි. භත්තුණො අංගුලීඅඅං දංස-ඉදව්වං ත්ති. [දිෂ්ට්‍යා'කාරණ ප්‍රත්‍යාදෙශී නා'ර්‍යපුත්‍රඃ. න ඛලු ශප්තමාත්මානං ස්මරාමි. අථවා ප්‍රාප්තො මයා ස හි ශාපො විරහශූන්‍ය හෘදයා න විදිතඃ. අථ සඛීභ්‍යාං සංදිෂ්ටා'ස්මි "භර්තුරඞ්ගුලීයකං දර්ශයිතව්‍යාමි"ති]

මාරීචඃ- වත්සෙ, විදිතා'ර්ථා'සි තදිදානීං සහධර්මචාරිණං ප්‍රති න ත්වයා මන්‍යුඃ කාර්‍යා. පශ්‍ය,

32. ශාපාදසි ප්‍රතිහතා ස්මෘතිරොධ රූක්ෂෙ
භර්ත්‍රී'පෙත තමසි ප්‍රභුතා තවෛ'ව
ඡායා න මූර්ඡති මලොපහතප්‍රසාදෙ
ශුද්ධෙ තු දර්පණතලෙ සුලභා'වකාශා.

31 ඇසේ විසේ වූ පියසේ නැතැයි ඇත්
සිතා ගියේ මුත් පියසත් දැකීමෙන්
දූනේ ද ඇත් වේ මැ යැ මේ සිටින්නේ
සිතේ විකාරත් එ ලෙසයි මගේ මේ.

**මාරීච**– පුතා, සිය වරදෙහි සැකයෙන් කම් නැති. ඔබ ගේ මුළාව යුක්ති යුක්තයි. සවන් දෙන්නැ.

**රජ**– සවන් දෙමි.

**මාරීච**– යම් දිනෙකැ දී අප්සරස් තිර්ථයට බැසිමෙන් පසු පැහැදිලි කැලඹිම් ඇති ශකුන්තලාව ගෙන මෙනකාව දාක්ෂායණීය වෙත පැමිණියා ද එදා මැ (ඔබ ගේ) මේ දුප්පත් සහකාරිය ඔබ විසින් ප්‍රතික්ෂෙප කරණ ලද්දේ දුර්වාස ගේ ශාපයෙන් විනා අන් කරුණෙකින් නොවන බවත්, එය මුදුව දැකිමෙන් අවසන් වන බවත් ධ්‍යාන බලයෙන් අවබොධ කෙළෙමි.

**රජ**– (නිදහස් සුසුමක් හෙළා,) චොදනාවෙන් මිදුනේ වෙමි.

**ශකුන්තලා**– (තමාට මැ) නිකරුණේ මහිමියා මං පිටමං නොකළ බව පෙනේ. සැබැවින් මම ද ශාප කළ බව නො දනිමි. නැතහොත් මා වෙත පැමිණි ඒ ශාපය විරහයෙන් ශූන්‍යහදූනි මා විසින් නොදන්නා ලදි. එදා ම- යෙහෙළියන් විසින් හිමියාට මුදුව දැක්වියැ යුතු යැ සි දන්වන ලද්දේ එ හෙයින් වියැ යුතුයි.

**මාරීච** දුව, ඔබ සත්‍යය දතු, එ හෙයින් ඔබ හිමියා කෙරෙහි ක්‍රොධ නොකළ යුතුයි. බලන්නැ.

32. සාපෙන් ඔබත් සිහි විකල් සැමියා හළේ නූ
නැස්මෙන් මුළා’දුරු යලින් ඔබ. සී කෙළේ නූ
ඡේයා රුදී නො මැ පෙනේ නොපහත් දපන්හි
වූයේ පහත් සුලබ වේ බිඹු ගැන්ම සේයා

**රාජා-** යථා'හ භගවාන්.

**මාරීචඃ-** වත්සෙ, කශ්චිදභිනන්දිතස්ත්වයා විධිවදස්මාභිර්-
නුෂ්ඨිතජාතකර්මා පුත්‍ර එෂ ශකුන්තලායාඃ,

**රාජා-** භගවන්, අත්‍ර ඛලු මෙ වංශප්‍රතිෂ්ඨා,

(බාලං හස්තෙන ගෘහ්ණාති.)

**මාරීචඃ-** තථා භාෂිනමෙනං චක්‍රවර්තිනමවගච්ඡතු භවාන්.
පශ්‍ය—

33. රථෙනා'නුද්ඝාතස්තිමිතගතිනා තීර්ණ ජලධිඃ
පුරා සප්තද්වීපාං ජයති වසුධාමප්‍රතිරථඃ
ඉහා'යං සත්වානාං ප්‍රසභදමනාත් සර්වදමනඃ
පුනර් යාස්‍යත්‍යා'ඛ්‍යාං භරත ඉති ලොකස්‍ය භරණාත්.

**රාජා-** භගවතා කෘත සංස්කාරෙ සර්වමස්මින් වයමා-
ශාස්මහෙ.

**අදිතිඃ-** භඅවං, ඉමාඑ දුහිදු මණොරහසංපත්තීඑ කණ්ණොවි
දාව සුදවිත්ථරො කරීඅදු. දුහිදු වච්ඡලා මෙණආ ඉහ එව්ව
උවචරංති චිට්ඨදි. [භගවන්, අස්‍යා දුහිතුර්මනොරථ
සම්පත්තෙඃ කණ්වො'පි තාවච්ඡ්‍රුත විස්තරඃ ක්‍රියතාම්.
දුහිතෘ වත්සලා මෙනකෙ'හෛ'වො'පචරන්තී තිෂ්ඨති]

**ශකුන්තලා-** (ආත්මගතම්) මණොරහො ක්ඛු මෙ භණිදෙ,
භඅවදීඑ. [මනොරථඃ ඛලු මෙ භණිතො භගවත්‍යා].

**මාරීචඃ-** තපඃ ප්‍රභාවාත් ප්‍රත්‍යක්ෂං සර්වමෙව තත්‍ර භවතඃ,

**රාජා-** අතඃ ඛලු මා මනතික්‍රුද්ධො මුනිඃ

**මාරීචඃ-** තථා'ප්‍ය'සෞ ප්‍රියමස්මාභිඃ ප්‍රෂ්ටව්‍යඃ. කඃ කො'ත්‍ර
භොඃ?

**ශිෂ්‍යඃ-** (ප්‍රවිශ්‍ය) භගවන්, අයමස්මි.

**රජ**– භගවත්හු කියන ලෙසෙයින්,

**මාරීච**– දරුව, වේදානුකූල වූ ජාත කර්ම නිමැවූ ශකුන්තලාව ගේ මේ පුතා ගැන ඔබ ප්‍රීතිමත් වන්නාහු ද?

**රජ**– භාග්‍යවතුනි, සැබැවින් මගේ වංශය පැවැත්ම මොහු කෙරෙහි යෑ. (බාලයා අතින් ගනියි.)

**මාරීච**– එසේ කියන ලද මොහු සක්විත්තකු බව දනු ලැබේවා. බලනු මැනැවි.

33, තැනෙකැ නො ගැටෙන නිසල ගමනැ'ති රියෙන්
සිව් සිදු හොර කෙරේවා
සතෙක මහදිව් පෙලින් බබලන පොළොව
සැබැවින් ජය ගනිවා
නිසැකයෙන් හැම සතුන් බලයෙන් මඩත
මොහු සව් දමන වේවා
ලෙවන් පුස්නා හෙයින් මොහු නම බරත යැ යි
අනුරුත් මැ වේවා

**රජ**– භාග්‍යවතුන් විසින් මොහු විෂයෙහි කළ සියලු සංස්කාරයන් අපි පිළිගතිමු.

**අදිති**– භාග්‍යවතුනි, මේ දියණියගේ මනදෙළ සපිරිම කණ්වසෘෂින්හටද දන්ත ගැනීමට සලස්වන්නැ, දුහිතෘ ප්‍රේමයෙන් යුතු මෙනකාව ද මෙහි හැසිරෙමින් සිටී.

**ශකුන්තලා**– (තමාට මැ) මේ උතුමාව විසින් කියන ලද්දේ සැබැවින් මගේ අදහස් යැ.

**මාරීච**– තපස් මහිමයෙන් මේ සියල්ල ඒ උතුමාට ප්‍රත්‍යක්‍ෂයි.

**රජ**– එසේ නම් ඒ මුනිතුමා මට සැබැවින් ක්‍රෝධ නොකරනු ඇති.

**මාරීච**– එසේ වුවත් අප විසින් මේ ප්‍රීතිමත් සිදුවීම දැන්විය යුතුය. ඕ කවුද මෙහි?

**ශිෂ්‍යයා**– (පිවිසැ) භාග්‍යවතුනි, මේ මමයි.

**මාරීචඃ**– ගාලව, ඉදානීමෙව විහායසා ගත්වා මම වචනාත් තත්‍ර භවතෙ කණ්වාය ප්‍රියමාවෙදය. යථා "පුත්‍රවතී ශකුන්තලා තච්ඡාපනිවෘත්තෞ ස්මෘතිමතා දුෂ්‍යන්තෙන ප්‍රතිගෘහීතෙ" 'ති.

**ශිෂ්‍යඃ**– යදාඥාපයති භගවාන්, (නිෂ්ක්‍රාන්තඃ)

**මාරීචඃ**– වත්සෙ, ත්වමපි ස්වාපත්‍යදාරසහිතඃ සඛ්‍යුරාඛණ්ඩලස්‍ය රථමාරුහ්‍ය රාජධානීං ප්‍රවිශස්ව.

**රාජා**– යදාඥාපයති භගවාන්.

**මාරීචඃ**– අපි ච,

34. තව භවතු බිඩෞජාඃ ප්‍රාජ්‍යවෘෂ්ටිඃ ප්‍රජාසු
ත්වමපි විතත යඥඃ ස්වර්ගිණඃ ප්‍රීණයස්ව
යුගශත පරිවර්තානෙ'ව මන්‍යො'න්‍ය කෘත්‍යෛර්
නයතමුභයලොකා'නුග්‍රහා ශ්ලාඝනීයෛඃ

**රාජා**– භගවන්, යථා ශක්ති ශ්‍රෙයසෙ යතිෂ්‍යෙ,

**මාරීචඃ**– වත්ස, කිං තෙ භූයඃ ප්‍රියමුපහරාමි.

**රාජා**– අතඃ පරමපි ප්‍රියමස්ති. යදිහ භගවාන් ප්‍රියං කර්තුමිච්ඡති, තර්හිදමස්තු.

(**භරත වාක්‍යම්.**)

35. ප්‍රවර්තතාං ප්‍රකෘති හිතාය පාර්ථිවඃ
සරස්වතී ශ්‍රැත මහතාං මහීයතාම්.
මමාපි ච ක්ෂපයතු නීලලොහිතඃ
පුනර් භවං පරිගත ශක්තිරාත්මභූඃ

(**නිෂ්ක්‍රාන්තාඃ සර්වෙ**)

## ඉති සප්තමො'ඞ්කඃ

**සමාප්තමිදමභිඥාන ශාකුන්තල නාම නාටකම්**

**මාරීච**– ගාලව, "දරුවා සහිත ශකුන්තලා ඒ ශාපය ගෙවී මෙන් සිහිලත් දුෂ්‍යන්ත විසින් පිළිගත්තා ලදී" යන මේ ප්‍රිය පුවත දූන්ම මැ අහසින් ගොස් මගේ වචන යෙන් ඒ කාණ්ව උතුමාට කියනු.

**ශිෂ්‍යයා**– භාග්‍යවතුන්ගේ අණ ලෙසෙකි. (නික්මෙයි)

**මාරීච**– දරුව, ඔබත් සිය අඹු දරුවන් සමග මිත්‍ර ඉන්ද්‍රයා ගේ රියට නැඟැ සිය නුවරට යන්නැ.

**රජ**– භාග්‍යවතුන් ගේ අණ ලෙසෙකි.

**මාරීච**– තව ද,

34. ඔබ දනට බොහෝ වාරේ කෙරේවා සහස් නෙත්
ඔබද පතල යාගෙන් ඒ සුරන් තොස් කෙරෙත්වා
මෙලෙස ඔවුනොවුන් ගේ සත් කිසෙන් බෝ පසස්නා
යුග සිය පෙරළා යෙත්වා දෙලෝ සෙත් කිරිමෙන්

**රජ**– භාග්‍යවතුනි, දිරි පමණෙකින් යහ වැඩෙහි යෙදෙමි.

**මාරීච**– දරුව, කිම, ඔබට වඩාත් යහපත එළවමි ද?

**රජ**– මෙයටත් වඩා උසස් යහපතෙක් ඇත් ද? ඉදින් මෙහිලා භගවත්හු යම් යහපතක් කරනු කැමැත් තෝ නම් එවිටැ එය ද වේවා.

(භරත වාක්‍යය)

35. සුව සෙත් වැසියනට මිහිපල් සලසා වා
සුභ ව ත් මහතුන්ගෙ බස නිති සලකා වා
තෙ දව ත් පතල යසසැ'නි මෙහෙසුරු දේ වා
උ පතමන් ගෙ යලිදු සසරේ වලකා වා

(සියල්ලෝ නික්මෙති)

## සත් වන රඟය නිමාවිණි.

### අභිඥාන ශාකුන්තල නාටකය නිමි

### අභිඥාන

# ශාකුන්තල හෙළිය

**අන්වය-** යා ස්‍රෂ්ටුඃ ආද්‍යා සෘෂ්ටිඃ, යා විධිහුතං හවිර් වහති. යා ච හෝත්‍රී, යෙ ද්වෙ කාලං විධත්තඃ, ශ්‍රැතිවිෂයගුණා යා විශ්වං ව්‍යාප්‍ය ස්ථිතා. යා සර්වබීජප්‍රකෘතිඃ ඉති ආහුඃ, යයා ප්‍රාණිනා ප්‍රාණවන්තඃ, තාභිඃ ප්‍රත්‍යක්ෂාභිඃ අෂ්ටාභිඃ ප්‍රපන්නඃ තනුභිඃ ඊශඃ වඃ පාතු.

**අර්ථ-** යම් (ජලාත්මක) මූර්තියෙක් ලොකනිර්මාතෘහු ගේ ආදි මැවීම වී ද, යම් (වහ්න්‍යා'ත්මක) මූර්තියෙක් වෙදො-'ක්ත පරිදි පිදූ යාග ද්‍රව්‍යයන් දරා ද, යම් මූර්තියෙක් යජ-මානයා වී ද, යම් (චන්ද්‍ර-සූර්‍ය්‍යාත්මක) මූර්ති යුගලයෙක් කාලය බෙදී ද, කර්ණේ'න්ද්‍රිය විෂය වූ ශබ්ද ගුණක යම් (ආකාශා'ත්-මක) මූර්තියෙක් ලොවැ පැතිර සිටි ද, යම් (පෘථිව්‍යා'ත්මක) මූර්තියක් සියලු බීජයනට මූලය යි කිහු ද, යම් (වාය්වා'-ත්මක) මූර්තියක් විසින් සත්‍වයෝ පණවත් කරනු ලැබෙත් ද, එ බඳු පැහැදිලි අෂ්ටමූර්තියෙකින් යුත් මෙහෙසුරු තොප රකිවා.

නො හොත්

(මේ නාටකයෙහි වූ) යම් ශකුන්තලාවක් බඹු ගේ උත්-කර්‍ෂවත් නිර්මාණයක් වී ද, යම් ශකුන්තලාවක් (දුෂ්‍යන්ත විසින්) සුරත විදියෙන් බැහූ රේතස් (ගැබ) දරා ද, යම් (ශකුන්තලාවක් පිළිබඳ වැ කණ්ව තවුසා) යජමානයා වී ද, යම් යුගලයෙක් (අනසූයා-ප්‍රියංවද) ශාපා'වසානය දත්තෝ ද, (සියලු ලෝවැස්සන් ගේ) කණ් විෂය වූ (ශකුන්තලාවගේ) යම් (පතිව්‍රතා) ගුණයක් ලොවැ පුරා පැතිර සිටියා ද, යම් (ශකුන්තලාවක්) සියලු සතුනට ශ්‍රෙෂ්ඨ භරත ගේ උපතට හේතු වී ය යි කිහු ද, යමෙකින් (දුෂ්‍යන්ත, බිරිය හා පුතු

කැටුවැ සිය නුවරට පැමිණීමෙන්) සිය ප්‍රජාව පණවත් කරනු ලැබී ද, එ බඳු පැහැදිලි අට අයුරෙකින් හෙබි (දුෂ්‍යන්ත) රජු (සිය ප්‍රජාව වූ) තොප රකීවා.

**පහදුව–** මෙහෙසුරු අෂ්ටවිධ රූපයෙකින් ලොවැ පුරා පැතිර සිටී. එය සත්‍වයනට ප්‍රත්‍යක්‍ෂයෙන් දත හැකි, ඉන්‍ද්‍රිය ගෝචර බැවිනි. ලෝ මැවුම්කරු ගේ ආදි මැවීම යැ යි කියනු ලබන ජලය; යාගද්‍රව්‍ය පිළිගන්නා ගින්න; දිවා-රෑ බෙදන සඳ-හිරු; ශ්‍රොතෝ'න්‍ද්‍රිය විෂය වූ ශබ්දය පැතිරැ පවත්නා අහස; සියලු ශෂ්‍ය ඵලා'දියට උත්පත්ති ස්ථානය වූ පොළොව; සත්‍වයන් ගේ පණ දරණ වායුව යන මේවා ඒ අෂ්ට මූර්තීහු වෙති. මෙ බඳු අෂ්ටමූර්තියෙකින් විශ්වව්‍යාපී ඉසුරා අභිඥාන ශාකුන්තල නාටකය තරඹන්නන් රකීවා යි ශිව භක්තික මහාකවි කාලිදාසයෝ සිය නාටකය ආරම්භයෙහි මැ ආසිරි කෙරෙති.

නැතහොත්

මේ නාටකයෙහි නායිකාව වූ ශකුන්තලා බඹු ගේ ඉවිසි-තුරු මැවීමෙකි. "කෞශික" රාජර්ෂින් නිසා 'මේනකා" නම් දෙව් ලිය ගෙන් උපන් හෙයින් ඒ සෙදේ. ශකුන්තලා දුෂ්‍යන්ත විසින් සුරත විදියෙන් බැහූ "රේතස්" (ශුක්‍ර) නිසා ගැබ් දරුවා යැ. සොම තීර්ථයෙහි ශකුන්තලාව ගේ අනිෂ්ට දෛවය නැසීම පිණිස යාග කළ කණ්ව තවුසා යජමානයා වියැ. අනසූයා ප්‍රියංවදා දෙ යෙහෙළියෝ ශාපා'වසානය දත්තෝ යැ. ශකුන්තලා සිය පතිව්‍රතා ගුණය මුළු ලෝක-යෙහි පැතිර වූවා යැ. සක්විත්තකු වූ "භරත" ගේ උපත අන් සියලු උපන් වලට වඩා උතුම් වියැ. දුෂ්‍යන්ත රජු, ශකුන්තලාව හා සර්වදමන හා කැටුවැ සිය නුවරට පැමිණීම නිසා රට වැස්සෝ නව පණ ලද්දවුන් මෙන් පිනා ගියහ. ශාකුන්තලා නාටකයෙහි දුෂ්‍යන්ත රජු ද ඉසුරා මෙන් මේ අට කරුණින් හෙබියේ යැ. එ බදු ඔහු රටවැසියන් වූ තොප රකීවා යි රාජ භක්තක මහාකවි කාලිදාසයෝ ආසිරි කෙරෙති.

**සටහන්–** ස්‍රෂ්ටුඃ– මැවුම් කරු ගේ. ලෝකමාපකයා මහබඹු යැයි යෙති.

**ආද්‍යාසෘෂ්ටිඃ**– ශිවපක්ෂයෙහි– ආදිමැවීම, **මනුස්මෘතියෙහි** "**අප එව සසර්ජාදෞ තාසු වීජමවාසෘජත්**" යි කී හෙයින් ලොව ආදියෙහි මැ වූයේ ජලය යි. ඒ බඹු ගේ ප්‍රථම මැවීම යැ යි "වෙදන්තවාදීහු" කියති. **එහෙත්, ඓතරීය උපනිෂද්හි** මෙයට වඩා ශාස්ත්‍රා'නුකූල මතයෙක් වේ "තස්මාද්වා එතස්මාදාත්මන ආකාශඃ සම්භූතඃ, ආකාශාද්වායුඃ; වායෝරග්නිඃ; අග්නෙරාපඃ; අද්භ්‍යඃ පෘථිවී; පෘථිව්‍යා ඔෂධයඃ; ඔෂධීභ්‍යො'න්නම්; අන්නාද් පුරුෂඃ." ඒ හෝ මේ ආත්මයෙන් අහස ද, අහසින් වායුව ද, වායුවෙන් ගිනි ද, ගින්නෙන් ජලය ද, ජලයෙන් පොළොව ද, පොළොවින් බෙහෙත් ද, බෙහෙතින් අහර ද, අහරින් පුරුෂය යනාදී ක්‍රමයෙන් ලෝකය ආරම්භ වීමේ අනුපිළිවෙල දක්වේ. දුෂ්‍යන්ත පක්ෂයෙහි– ඉවිසිතුරු මැවීම.

**විධිහුතං**– ශිව පක්ෂයෙහි – "විධිර් විධානං ශ්‍රැතිස්මෘතයුක්තං තෙන හුතං දත්තම්" වෙදෙ'ක්ත පරිද්දෙන් පිදූ. වෙදයෙහි නියමිත පරිද්දෙන් පූජාද්‍රව්‍ය ගින්නෙහි බැහූ කලැ ඒවා ඒ ඒ දෙවියනට ද, පිතෘනට ද පැමිණෙති යි ද, එ සේ විධිවත් නොවූ කලැ ඒවා අලු බවට පැමිණෙති යි ද විශ්වාස කරනු ලැබේ. ඒ බව **මහා භාරත** ආදි පඒයේ මෙසේ එයි.

"වෙදෙ'ක්තෙන විධානෙන මය්‍යද් හූයතෙ හවිඃ
දෙවතා පිතරශ්චෛ'ව තෙන තෘප්තා භවන්තිවෛ"

දුෂ්‍යන්ත **පක්ෂයෙහි**– "විධිනා–සුරත විධිනා හුතං නිෂික්තං" සුරත විදියෙන් බැහූ.

**හවිඃ**– ශිව පක්ෂයෙහි "හවනීය ද්‍රව්‍ය ජාතං" පිදිය යුතු යාග ද්‍රව්‍ය. දුෂ්‍යන්ත පක්ෂයෙහි. රේතස්.

**හොත්‍රි**– ශිව පක්ෂයෙහි – යාගකාරක බමුණා. දුෂ්‍යන්ත පක්ෂයෙහි–ශකුන්තලාවන් ගේ අනිෂ්ට දෛවය නසනු පිණිස යාග කිරීමට "සොමතීර්ථයට" ගිය "කණ්ව" තවුසා.

**යෙ ද්වෙ කාලං විධත්තඃ-** ශිව පක්‍ෂයෙහි-දිවා රෑ බෙදන චන්‍ද්‍ර සූර්‍ය්‍ය දෙදෙනා. දුෂ්‍යන්ත පක්‍ෂයෙහි-ශාපානනය දත් අනසූයා හා ප්‍රියංවදා දෙ දෙන.

**ශ්‍රැති විෂය ගුණා යා විශ්වං ව්‍යාප්‍ය ස්ථිතා-** ශිව පක්-ෂයෙහි-"ශ්‍රැතෙඃ-ශ්‍රොතෙ'න්ද්‍රියස්‍ය විෂයඃ නාම ශබ්දඃ ගුණඃ යස්‍යාඃ" කණ් විෂය වූයේ ශබ්දය යි. රූපය චක්‍ෂුරින්ද්‍රියටත්; රසය ජිහ්වෙ'න්ද්‍රියටත්; ස්පර්‍ශය ත්වගින්ද්‍රියටත්; ගන්‍ධය ඝ්‍රාණෙ-න්ද්‍රියටත් විෂය වන්නාක් මෙනි. තර්ක සංග්‍රහයෙහි "ශබ්ද ගුණකමාකාශං" යි කී හෙයින් ශ්‍රොතෙ'න්ද්‍රිය විෂය ශබ්දය ගැබ් වැ විශ්වය පුරා පවත්නා අහස මින් පැවැසේ. දුෂ්‍යන්ත පක්‍ෂයෙහි-ලෝ වැස්සන් ගේ ශ්‍රැති විෂය වූ (කනක් පාසා ගිය) ශකුන්තලාව ගේ පතිව්‍රතා ගුණය මුළු ලොව පැතිර සිටියා හෝ ශාර්ඞ්ගරව; ශාරද්වත, ගෞතමී යන තිදෙන (ගුණ) විසින් දුෂ්‍යන්ත ගේ දෙශයට කැඳවා ගෙනැ යනු ලැබූ හෝ.

**යා සර්‍වබීජ ප්‍රකෘතිඃ-** ශිව පක්‍ෂයෙහි-"සර්‍වෙෂාං බීජානාං ප්‍රකෘතිඃ" සියලු බීජයන් ගේ හට ගැන්මට හේතුව, එනම් පොළොව. දුෂ්‍යන්ත පක්‍ෂයෙහි-සියලු සතුනට ශ්‍රෙෂ්ඨ වූ චක්‍රවර්ති භරත ගේ උපතට නිධානය වූ ශකුන්තලා. රජු සියලු සත්නට ශ්‍රෙෂ්ඨ බව භෘගු ද කියේ මැ නු.

"අග්නි වායු යමශක්‍රානාමින්‍ද්‍රස්‍ය වරුණස්‍ය ච, චන්‍ද්‍රවිත්තෙශ-ජසොශ්චෛ'ව මාත්‍රා නිර්හෘත්‍ය ශාශ්වතිඃ,යස්මාදෙෂාං සුරෙන්-ද්‍රාණං මාත්‍රාභිර් නිර්මිතො නෘපඃ, තස්මාදභිභවත්‍යෙ'ෂ සර්‍ව භූතානි තෙජසා"

**යයා ප්‍රාණිනඃ ප්‍රාණවන්තඃ-** ශිව පක්‍ෂයෙහි,- යමෙකින් සත්‍වයෝ පණවත් කෙරෙත් ද හෙවත් ජීවිතය රඳා සිටිනු ලැබේ ද එය. (වායුව) දුෂ්‍යන්ත පක්‍ෂයෙහි-යමෙකින් රට වැසියන් තව පණ ගැන්වී ද, එ නම් දුෂ්‍යන්ත ශකුන්-තලාවන් හා සිය පුතු ද කැටුව පැමිණීමෙන්.

**ප්‍රත්‍යක්‍ෂාභිඃ-** පැහැදිලි- ඉන්ද්‍රිය විෂය වූ.

**අෂ්ටාභිඃ තනුභිඃ**– ශිව පක්‍ෂයෙහි–අෂ්ටවිධ රූපයෙහින් යුතු. දුෂ්‍යන්ත පක්‍ෂයෙහි–අට කරුණෙකින් හෙබි. **නෛයායික** මතය අනුව, ආකාශය හා වායුව හා ප්‍රත්‍යක්‍ෂ දෑ නො වේ. ඒවා අනුමානයෙන් දත හැකි දෑ යැ. එසේ නම් කාලිදාසයන් ගේ මේ ප්‍රත්‍යක්‍ෂ කථනය කෙසේ ගැලපේ ද? "වෛදාන්තිකයෝ" ආකාශ, වායු ප්‍රත්‍යක්‍ෂ ලෙසින් ගනිති. ඉන්ද්‍රිය ගොචර හෙයිනි. **කාලිදාස වෛදාන්තිකයෙකි**. එ හෙයින් ඔහු ගේ ප්‍රත්‍යක්‍ෂ කථනය එය හා ගැලපේ.

ශිව ගේ අෂ්ටමූර්තිත්වය සංස්කෘත සාහිත්‍යයෙහි බෙහෙවින් පළ යැ. ඉන් කිහිප තැනෙක් මෙහි ලා නිදසුන් වේ. **හර්ෂ චරිතයෙහි** "අවනි පවන වන ගගන දහන තපන කිරණ යජමානමයීර්මූර්තිරෂ්ටා'වපි ධ්‍යාය නතී".

**විෂ්ණුපුරාණයෙහි**– "සූර්‍යෝ ජලං මහීවායුර් වහ්නිරා-කාශමෙව ච, දීක්‍ෂිතො බ්‍රාහ්මණඃ සොම ඉත්‍යෙතාඃ තනවඃ ක්‍රමාත්"

**වායු පුරාණයෙහි**–"භූමිරාපො'නලො වායුරාත්මා ව්‍යොම රවිඃ ශශි, ඉත්‍යෂ්ටෞව සර්වලොකානං ප්‍රත්‍යක්‍ෂා හරමූර්තයඃ"

**නාන්දි**– ආසිරි ගී. "සූත්‍රධාරඃ පඨෙන්නාන්දීඃ" සි නාට්‍ය ශාස්ත්‍රයෙහි දක් වූ පරිදි සූත්‍රධාර විසින් කියැ යුතු ගී වෙසෙසෙකි. භරතයන් විසින් " ආශීර් නමස්ක්‍රියා රූපඃ ශ්ලෝකඃ කාව්‍යාර්ථ සූචකඃ" ආසිරි; නමස්කාර; කාව්‍ය හැඳින්වීම යන මෙසින් යුතු වූයේ නාන්දිය යි කියන ලදි.

**සූත්‍රධාර**– පූර්ව රංගයෙහි පෙනී සිටින්නා. නාටකාරම්භයෙහි කථාවස්තුවට පළමුවෙන් කැරෙන හැඳින්වීම් ආදිය පූර්වරංග නමින් ගැනේ, ඒ පූර්වරංගයෙහි නායකයා සූත්‍රධාර යැ. ඔහු හෙළ වහරෙහි අදියුරු, පොතේ ගුරු යන නම් වලින් හැඳින් වේ.

**නෙපථ්‍ය**– පසු බිම හෝ තිරය. නළු නිළියන් සැරසෙන තැන.

**ආර්‍යේ**- සකු නළුවෙහි ස්වාමි පුරුෂයා බිරියට අමතන් නේ මෙ සේ යැ.

**තාවත්**- මෙහි ( නාටකයෙහි ) හැම තැනෙකැ මැ වාගේ යෙදුණු මෙයට ගෙළ වහරෙහි වෙසෙස් අරුතක් දිය නො හැකි යුතු යැ; ඕනෑ යන අරුත් තිසි තැන දිය හැකි.

**අවසිතම්**- නිමවීම-සම්පූර්ණ වීම.

**ආර්‍යපුත්‍ර**- සකු නළුවෙහි බිරිය සිය හිමියා අමතන්නේ මෙ සේ යැ. එය " සර්වස්ත්‍රිභිර පතිර් වාච්‍ය ආර්‍යපුත්‍රෙ'ති යෞවනෙ, ඌඪායාං දෙවි දෛතෙ පුමාංනාහ ප්‍රියාං ප්‍රති " යනුවෙන් පවසයි.

**ආර්‍යලක්ෂණ**- " කුලං ශිලං දයා දානං ධර්මං සත්‍යං කෘතඥතා, අද්‍රෝහං ඉති යෙෂ්වෙතත් තානා'ර්‍යාං සම්ප්‍රචක්ෂතෙ "

**අභිරූප භූයිෂ්ඨා**- " අභිරූපඃ භූයිෂ්ට ප්‍රභූතවතමො භාගඃ යස්‍යාඃ " බෙහෙවින් නැණවත් පිරිසක් ඇති. රහ හලෙහි සිටි වැඩි දෙනා නැණවතුන් යැ යි කී සැටි යැ.

**පරිෂද්**- " පරිතඃ සීදන්ති අස්‍යාම් " හාත්පස රැස් වැ සිටින්නෝ යැ.

**ප්‍රතිපාත්‍රම්**- " පාත්‍රෙ-පාත්‍රෙ ඉති " හැම චරිත නිරූපණයෙක්හි මැ සේ යි.

2. **අන්වය**- විදූෂාං පරිතොෂාද් ආ, ප්‍රයොග විඥානම් න සාධු මන්‍යෙ. බලවත් ශික්ෂිතානාං අපි චෙතඃ ආත්මනි අප්‍රත්‍යයම් ( ආර්‍ය )

**අපි**- නැණවතුන් ගේ ප්‍රසාදය ( ලැබෙන ) තෙක් උත්සාහය ( ඵලවත් වී ද නො වී දැ යි ) දැනීම සුදුසු යැ යි නො හඟිමි. ( මන්ද ) බෙහෙවින් පුහුණු වූවන් ගේ සිත ද තම ක්‍රියාවන්හි සැක සහිත යැ.

**විස්තර**- නැණවතුන් මේ නාටකය බලා ප්‍රීතිමත් වී නම්, මෙහි ලා දුරූ තැන සාර්ථක බැව් සිතිය හැකි. මක් නිසා ද, බෙහෙවින් නාටකාදියෙහි වෙසෙසින් පුහුණු වූවන් පවා සිය නැණෙහි ශංකාවෙන් පසුවන හෙයිනි. රඟමඬලට ආධුනික වූවන් ගේ ප්‍රයත්නයෙක හොඳ නො හොඳ මැනිය හැක්කේ එය නැරඹූ විඥයන් ගේ ප්‍රසාදය අනුව ය.

**විඥනම්**- විශේෂ හෝ උසස් දැනුම.

3. **අන්වය**- දිවසාඃ සුභග සලිලාවගාහඃ පාටලසංසර්ගී සුරභිවනවාතාඃ ප්‍රච්ඡායසුලභනිද්‍රාඃ පරිණාම රමණීයාඃ [ ච වත්තෙ ] ( ආශී )

**අර්ථ**- දිනයෝ දියෙහි ගිලීමෙන් තුටුවීම් ඇති, පළොල් මල් රොනින් සුවඳවත් වන පවන් ඇති, ඝන සෙවනවලැ සුලභනිද්‍රා ඇතියාහු මිහිකිරීමෙන් රමණීය වෙති.

**පහදුම**- ග්‍රීෂ්මකාලීන සන්ධ්‍යාවන්හි මිනිස්සු දහවිනෝද ය පිණිස දියෙහි ගැලෙති. වෙසෙසින් එකලැ පිපෙන පළොල් ආදි මල් ඇසුරු කිරීමෙන් පවන ද සුවඳවත් යැ. රුක් සෙවනවලැ කල් මැරීම ද සුලබ යැ. මෙ සේ ග්‍රීෂ්ම කාලීන දවස් සැඳෑ විනෝදයෙන් මනහර යැ.

**සටහන්**- **ප්‍රච්ඡාය**- "ප්‍රකාෂ්ඨා ඡායා ප්‍රච්ඡායා" ඝන සෙවන.

**පරිනාම රමණීයාඃ**- මිහිකිරීමෙන් රමණීය වූ. දිනයේ මේරීම නම් සවස් වීම යි. සවස් කල මැ රමණීය හෙයින් යෙදෙයි. නාට්‍ය රඟ දැක්වීම ද සවස් කලැ මැ වූ බවට කදිම නිදසුනෙකි.

4, **අන්වය**- භමරෙහිං ඊසිසිං චුංබිආඉං සුඋමාර කෙසරසිහාඉං සිරිස කුසුමාඉං දඅමාණා පමදාඔ ඔදංසයන්ති. ( ආශී )

**අර්ථ**- බමරුන් විසින් මද-මඳ වැ සුඹුනා ලද මොළකැටි කෙසුරු තුඩු ඇති මහරි මල් දයාබර වනිතාවෝ අවතංස කෙරෙති,

**සටහන්-** **අවතංසයන්ති-** කන් පළඳනා කෙරෙත්. වනිතාවෝ මහරි මලට වෙසෙසින් ලැදියෝ යැ. එ හෙයින් ඒ අවතංස-තෝඩු සේ පළඳිති.

**ආර්‍ය මිශ්‍ර-** ( අජ්ජ මිස්ස ) ආර්‍ය-උත්තම--ශ්‍රේෂ්ඨ යන අරුත් දෙයි. **මිශ්‍ර**-ගරු කටයුතු; පූජාර්හ යන අරුත් දෙයි. ආර්‍ය යන්න නාම පදයක් හා මුලට යෙදේ. ආර්‍ය චාණක්‍ය, ආර්‍ය ගණදාස සේ යැ. මිශ්‍ර පර පදයක් ලෙස වෙසෙසින් බුහු බසැ මැ යෙදේ. මණ්ඩණ මිශ්‍ර, වාචස්පතිමිශ්‍ර මෙනි. එ බැවින් මෙහි **ආර්‍යමිශ්‍ර** යනු අති ගරු උතුමා. සවාමින් වහන්සේ ඈ විසින් අතිශය සම්භාවනාර්හය හඟවයි, මෙහි මැ "භාවමිශ්‍ර" ශාර්ඞ්ගරව මිශ්‍ර යනු ද සැලැකියැ යුතු යි.

5. **අන්වය-** තාව හාරිණා ගීතරාගෙණ අතිරංහසා සාරඞ්ගෙන එෂ රාජා දුෂ්‍යන්ත ඉව, ප්‍රසභං හෘතඃ අස්මි. ( අනුෂ්ටුප් )

**අර්ථ-** ඔබ ගේ කන් පිනවන ගීත මාධුර්‍යයෙන්, ඉතා වේගයෙන් දුවන මුවා විසින් මේ දුෂ්‍යන්ත රජු (ගෙන ගියාක්) මෙන්, මම බලාත්කාරයෙන් බොහෝ දුර ගෙන ගියේ වෙමි.

**පහදුව-** තිළිය ගැයූ ගීතයේ ඉමිහිරියාව කෙබඳු වී ද; සූත්‍රධාරයන් ගේ සිත ඒ ගී රාවය පසු පසැ ලුහු-බැන්දේ යැ. ඔහුට රඟ මඬල ගැන හැඟීමෙක් පවා නැති. කලින් කී දෑ ද අමතක විය. පියෙවි සිහිය ද පලා-ගොස් යැ. එය සැබැවින් මේ නාටකයෙහි නයුවන් වූ දුෂ්‍යන්ත රජු මුවකු පසු පසැ ලුහුබැඳීම බඳු යැ. රජු ගේ රිය දකැ මුවා බියෙන් පණ කඩා ගෙනැ දිවී යැ. රජු ද ඌ ලුහුබැන්දේ යැ. වනයෙහි ඈත තවුස් බිමට පැමිණෙන තෙක් ඔහුට තිබුනේ මුව සිහිය යැ. සූත්‍රධාරයනට ද ගීතරාවය රජුට මුවා මෙන් විය. තිළිය සිහි කරවන තෙක් ඔහුට රඟ මඬල ගැන සිහියෙක් නො වී යැ. රජු වේදිකාවට පැමිණවීම මේ නිදසුනෙන් අදහස් කළ සේ යැ.

**සටහන්-** **හාරිණා-** ශ්‍රැති සුව දෙන-කන් පිනවන හෝ මනහර. "ගීතරාගෙණ", සාරඞ්ගෙන යන දෙ පදයන් මැ වෙසෙස යි.

**අතිරංහසා**- "අතිශයිතඃ රංහඃ වේගඃ යස්‍යාඃ" ඉති. වේගයෙන්.

**සාරඞ්ග**- "සාරං අඞ්ගං යස්‍ය", සාර-තිත්, අඞ්ග-ශරීරය. සිරුර තිත්වලින් ගෙබී හෙයින් මුවා "සාරඞ්ග" නම්. සාරඞ්ග නමින් පශු පක්ෂීහු ද ගැනෙති. එහෙත් මෙ තැනට එ අරුත් අනුචිත යි. "සාරඞ්ගයන" යනු ගීත රාගෙණ යන්ත වෙසෙසියැ යැකි හෙයින් සංගීත රාගය ද මෙ තැනට සුදුසු වැ නු. "සංගීත රාගය" හඳුන්වන **සංගීත රත්නාකර කාරයෝ**:-

"යො'සෞ ධ්වනි විශෙෂස්තු ස්වර වර්ණ විභූෂිතඃ
රඤ්ජකො ජන චිත්තානාං ස රාගඃ කථිතො බුධෛඃ"

අසන්නන් සිත් අලවන; සප්තස්වරයන් ගෙන් හෙබවුණු ධ්වනි විශෙෂය රාග නමින් හඳුන්වති.

**ප්‍රස්තාවනා**- හැඳින්වීම හෝ ආරම්භය. රඟ හලෙකැ රැස් වූවන් බෙහෙවින් කලබල-කාරී වැ ඝෝෂා කරමින් සිටීම ස්වාභාවික යැ. ඔවුන් නිශ්ශබ්ද කොටැ රඟ දක්වෙන නාටකය පිළිබඳ වැ ඔවුන් ගේ සිත, ඇස යෙදවීම වෙසෙ-සින් ඇවැසි යැ. එ හෙයින් රඟ දක්වෙන නාටකය නිෂ්-පාදකයා හා කථා වස්තුව හා හැඳින්වීම එයට උපාය වේ. ප්‍රස්තාවනාව නම් එ බදු හැඳින්වීමෙකි.

**සූත**- "ක්ෂත්‍රියාද්විප්‍රකන්‍යායාං සූතො භවති ජාතිතඃ" (මනුස්මෘති) 'සූත' නම් ක්ෂත්‍රියයකුට දුවැ බැමිණියක කුසින් උපන්නේ යැ. සූත නමින් වෙසෙසින් ගැනෙන්නේ අශ්වසාරථී යැ. ගේ උපතින් රජු ගේ රියැදුරු තිලයට හිමි කම් ලැබූවෙකි.

**ආයුෂ්මන්**- "ආයුෂ්මන්නිති වාච්‍යස්තු රථී සූතෙන සම්ද" යි "නාට්‍ය ශාස්ත්‍රයෙහි" කි හෙයින් රජු ගේ රියදුරු විසින් තම ස්වාමියා අමතන්නේ "ආයුෂ්මන්" යනුවෙනි. "දේවයන්නි" යි හෙළ වියරට සුදුසු ශස් ගැනිණි. "ආයු බෝවන්ඩ" යැ යි වචනාර්ථය සලකා යෙදිය හැකි.

6. **අන්වය**- අයං කෘෂ්ණසාරෙ අධිජ්‍යකාර්මුකෙ ත්වයි ච චක්ෂුඃ දදත් මෘගා'නුසාරිණං සාක්ෂාත් පිනාකිනං ඉව [ ත්වාම් ] පශ්‍යාමි. ( අනුෂ්ටුප් )

**අර්ථ**- මම, කළු තිත් මුවා වෙත ද, ඇදි දුනු ඇති ඔබ වෙත ද ඇස් යොමුවන කල්හි මුවකු ලුහුබඳනා සැබෑ ශිවයා මෙන් ( ඔබ ) දකිමි.

**පහදුව**- රජු දුන්න නගා-ගෙන මුවා විදිනු පිණිස දිවෙයි. මුවා ද දිවෙයි. මේ දුටු රියැ'දුරාට මෙහෙසුරු පිළිබඳ වෘත්තාන්තයක් සිහියට නැගුණි. ඒ මෙ සේ යැ. " දෙවියෝ එක් වැ යාගයක් සැකැසූහ. ශිවයා ගැන නො තකා ඔහුට ඒ පිණිස ඇරයුමකු දු නො කොළෝ ය මෙයට කිපුණු ශිව තම පිනාක දුන්නෙන් හීයක් යඥයා යදෙහි විද්දේ යැ. යඥයා මුව වෙස් ගෙන අහසට නැගි බැවින් ශිව ද ඔහු පසු පසින් දුන්න නගා-ගෙන දිවී යැ.

**සටහන්**- **පිනාකින්**- ඊශ්වර දුන්න **පිනාක** නම්. එ හෙයින් ඉසුරු පිනාකින් නමින් හැඳින් වේ. උසසුන් ගේ අවිවලට වෙසෙස් නම් වේ. විෂ්ණු ගේ අවිය **ශාර්ඞ්ග** නමින් ද, අර්ජුන ගේ දුන්න **ගාණ්ඩිව** නමින් ද පළ යැ.

7. **අන්වය**- අනුපතති ස්‍යන්දනෙ බද්ධ දෘෂ්ටිඃ ග්‍රීවාභඞ්ගා'භිරාමං ශරපතන භයාත් පශ්චාර්ධෙන පූර්වකායං භූයසා ප්‍රවිෂ්ටඃ ශ්‍රමවිවෘතමුඛභ්‍රංශිභිඃ අර්ධාවලීඪෛඃ දර්භෛඃ කීර්ණවර්ත්මා, උදග්‍ර ප්ලුතත්වාත් වියති බහුතරං උර්ව්‍යාං ස්තොකං ප්‍රයාති, පශ්‍ය.

**අර්ථ**- ළඟ මැ ලුහුබඳනා රිය දෙස බඳනා ලද ඇස් ඇති, ( එ හෙයින් මැ වූ ) ගෙළ නැමීම නිසා මනහර වූ, හී වැටීමේ බියෙන් පශ්චාර්ධයෙන් පූර්වාර්ධයට බෙහෙවින් පිවිසි, විඩාව නිසා හැරුණු මුවින් හැලුණු අඩක් සැපුණු දර්භයෙන් ආකීර්ණ මාර්ග ඇති, ( මේ මුවා ) උඩ පැනීමෙන් අහසැ බෙහෙවින් ද පොළොවැ මඳ වැ ද දිවෙයි. බලන්නැ.

**සටහන්- සන්දනො-** "සන්දනෙ ධාවතී'ති." මෙහි නැගැ දිවෙනුයි රිය සන්දන නම්.

**උද්ඝාතිනී භූමි-** විසම බිම. පැකිළිමෙන් ඇද හෙලෙන බිම. " උද්ඝාතිනී කථ්‍යතෙ පාදස්ඛලනං සමුපක්‍රමෙ ච " ( විශ්වකොෂ යි )

8. **අන්වය-** රශ්මිප්‍රමුක්තෙෂු අමී රථ්‍යාඃ නීරායතා පූර්වකායාඃ නිෂ්කම්ප චාමරශිඛාඃ නිභෘතො'ර්ධ්වකර්ණාඃ ආත්මොද්ධතෛඃ රජොභිඃ අපි අලඞ්ඝනීයා මෘගජවා'ක්ෂමයා ඉව ධාවන්ති. ( වසන්තතිලකා )

**අපි-** රශ්මීන් මුදත් මැ මේ අශ්වයෝ, දිගැ'දුණු පෙරකය ඇතියාහු නො සැලූ සෙමර සිළු ඇතියාහු, තිර වැ උඩට නැගූ දෙකන් ඇතියාහු, තමන් විසින් මැ නැංවූ දූවිල්ලෙන් පවා ඉක්මවිනු නො හැක්කාහු; මෘග ජවය නො ඉවසන්න වුන් මෙන් දිවෙති.

**පහදුව-** රශ්මීන් ලිහිල් කරත් මැ අශ්වයෝ දුවන්නට වූ හ. උන් ගේ පෙර කය ඇදී ගියේ යැ. වේගයෙන් දුවන විටැ එ සේ වීම ස්වාභාවික යැ. සැරසිලි පිණිස උන් ගේ සවන් අතර පැළඳ වූ සෙමර සිළු ද නො සැලී සිටී. සවන් අං මෙන් තර වැ සිටි සේ යැ. අසුන් ගේ කුර ගැටී දූවිලි නගී. නැගුණු දූවිල්ලෙන් උන් සිරුරු මැඩෙන්නට පෙර මැ ඒ ඒ තැනින් දිවෙති. දූවිල්ලට පවා උන් නො මැඩියැ හැක්කේ ඒ නිසා යැ. ඉදිරියේ දිවෙන මුවා දකින අසුනට ඇත්තේ ඊර්ෂ්‍යාවෙකි. ඔවුනට මෘගජවය රිසි නො වේ. එ හෙයින් මුවා පසු බෑමේ ආශාවෙහි තර වැ සිටි යෝ යැ.

**සටහන්- නිරායත-** නිතරාං ආයතාඃ-සම්පූර්ණයෙන් දිගැ'දුනු.

**චාමරශිඛා-** සැරසිල්ලක් මෙන් අසුන් ගේ දෙකන් අතරැ කුඩා චාමරයක් රඳවයි. එය හිසින් උඩට ද නැඟී සිටී. **හරිතො හරිංශ්ච**-හරිත-පලාවන්, හරි අශ්වයන්; පලාවන් අසුන් ඇත්තේ හිරුට යැ.

“ හරිරින්ද්‍රෙ හරිර් විෂ්ණෞ හරිරශ්වෙ හරී රවෞ ” යි අනෙකාර්ථ කොෂයෙහි කී හෙයින් ඉන්ද්‍රයා ගේ හෝ රවි ගේ හෝ අසුන් යැ යි ගත මැනැවි.

9. **අන්වය-** යද් ආලොකෙ සූක්ෂ්මං තද් සහසා විපුලතාං ව්‍රජති, යද් අර්ධෙ විච්ඡින්නං තත් කෘත සන්ධානං ඉව භවති, යත් ප්‍රකෘත්‍යා වක්‍රං තද් අපි නයනයොඃ සමරෙඛං; රථ ජවාත් මෙ ක්ෂණං අපි කිඤ්චිද් දූරෙ න. පාර්ශ්වෙ න (ශිඛරිණී)

**අර්ථ-** යමක් දුර සියුම් වී ද, එය වහා මහත් බවට පැමිණේ. යමක් ඒකාන්තයෙන් අසන්ධාන ද, එය කළ සන්ධාන ඇත්තක් මෙන් වෙයි. යමක් ස්වභාවයෙන් වක්‍ර ද, එය ද දෙ-ඇසට ඍජු රේඛාවක් මෙන් යැ. රිය වේගය නිසා මට මොහොතකුත් කිසිත් දුර ද නො පෙනේ; පාර්ශ්වයෙහි ද නො පෙනේ.

**පහදුම-** ඈත වූ විශාල් දූය කුඩාවට පෙනීම ස්වාභාවික යැ. ඒ යථා තත්ත්වයෙන් පෙනෙන්නේ තිබෙන තැනට මැ ගිය කලැ යැ. රජු ගේ ඇසට ඉතා කුඩාවට පෙනුණු දූය නිමේෂයෙකින් විශාල වූයේ ඔහු නැගි රිය වහා එ තැනට ළඟා වීමෙනි. මගැ හාත්පස තැනින් තැනැ ගස් ගල් ආදිය ද වෙයි. රිය වේගය නිසා ඒවා එකට සම්බන්ධ කළ වස්තූන් ලෙස පෙනිණි. හාත්පස හා ඉදිරියෙහි වූ වක් දෑ ද කෙලින් ඉරි ඇන්ද සේ යැ. රිය වේගයෙන් යන විටැ දුර හෝ අවට කිසි දෙයෙකැ පැහැදිලි දශීනයෙක් නො වේ මැ යැ.

**වෛඛානස-** “විඛනසං බ්‍රහ්ම වෙත්ති අසෞ”. විඛනස් යන්නෙන් බඹු ගැනේ. ඔහු අදහන්නා වෛඛානස යි. එනම් බමුණා හෝ තවුසා යි. බඹසර රකින්නා වෛඛානස යන්නේ පැහැදිලි අරුත යි.

**රාජන්-** තාපසයන් විසින් රජුන් උදෙසා කැරෙන ඇමතුමෙකි. එද ගරුත රීතියෙකි.

10. **අන්වය–** අස්මින් මෘදුනි මෘග ශරීරෙ අයං බාණඃ පුෂ්පරාශෞ අග්නිඃ ඉව: න බලු න ඛලු සන්නිපාත්‍යඃ. හරිණකානාං අතිලොලං ජීවිතං ච ක්ව, නිශිත නිපාතාඃ වජ්‍රසාරාඃ තෙ ශරාඃ ච ක්ව ( මාලිනී )

**අර්ථ–** මේ මොළකැටි මුව සිරුරෙහි මේ හිය; මල් රැසෙක්හි ගිනි මෙන් සැබැවින් සැබැවින් නො ලන්නැ. අසරණ මුවන් ගේ දුබල ජීවිතය කෙබඳු ද? නියුණු වැ විනිවිද යන විදුරු මෙන් තද ඔබ ගේ හී කෙබඳු ද?

**සටහන්– න ඛලු න ඛලු–** තවුසා ගේ සිතේ පැවති කලබල ගතිය හා කම්පාව මේ මෙ සේ දෙවරක් කී මෙන් පැහැදිලි වේ.

**වජ්‍රසාරාඃ–** "වජ්‍රස්‍ය සාරඃ, වජ්‍ර සාර ඉව සාරො" වජ්‍රයා ගේ සාරය හෝ වජ්‍රයේ සාරය වැනි සාරය ඇති. හිය වජ්‍ර මෙන් දැඩි බැව් ගැන වූ යැ.

11. **අන්වය–** තත් සාධු කෘත සන්ධානං සායකං ප්‍රතිසංහර; වඃ ශස්ත්‍රං ආර්ත්‍රාණාය, අනාගසි ප්‍රහර්තුං න. (අනුෂ්ටුප්)

**අර්ථ–** එ බැවින් මැනැවින් කළ සන්ධාන ඇති හිය හකුලන්නැ. ඔබ අවිය බැගෑ වූවන් රැකීම පිණිස යි. අහිංසකයන් පෙළීමට නො වේ.

**සටහන්– සන්ධානං–** හිය දුන්නේ පිහිටුවා ඉලක්කය ගැනීම.

**ආර්ත්‍රාණාය–** ක්ෂත්‍රියයන් අවි දරනුයේ අහිංසකයන් රැකීමට යැ. දුෂ්‍යන්ත ද රජෙකි. එ හෙයින් ඔහු අහිංසකයන් රැකියැ යුතු යි.

**අනාගසි–** "නවිද්‍යතෙ ආගං යස්‍ය අනාගස්" වැරැදි නැත්තන් කෙරෙහි. අහිංසකයන් කෙරෙහි.

12. **අන්වය–** පුරොඃ වංශෙ යස්‍ය ජන්ම ( තස්‍ය ) තව ඉදං යුක්තරූපං, එවං ගුණො'පෙතං චක්‍රවර්තිනං පුත්‍රං අවාප්නුහි. ( අනුෂ්ටුප් )

**අර්ථ–** පුරුහු ගේ වංශයෙහි යමකු ගේ උපත වී ද (ඒ) ඔබට මෙය සුදුසු මැ යි. මෙ බඳු ගුණෝ'ති සක්විති පුතකු ලබන්නෙහි.

**සටහන්–** **පූරෝඃ වංශෙ**— වෛවස්වත මනු ගේ හා ඉලා ගේ හා දරු පරපුරෙහි යයාති නම් රජෙක් විය. හේ ශුක්‍රාචාර්යයන් ගේ දූව-දේවයානිය ආවාහ කෙළේ යැ. පසු වැ වෘෂපර්‍ව අසුරිඳු ගේ දියණියන් වූ සර්මිෂ්ඨාව ද පාදපරිචාරිකා කෙළේ යැ. ශුක්‍රා'චාර්යයෝ එයින් කිපි නො කල්හි මහළු වෙව යි ඔහුට ශාප කළා හ. ඒ ශාපයෙන් යයාති මහල්ලෙක් විය. ශොකයට පත් ඔහු සිය පුතුන් කැඳවා තමා ගේ මහළු බව පිළි-ගෙනැ ඔවුන් ගේ තරුණ බව තමාට දෙන සේ යැදි නමුත් වැඩිමහල් පුත්තු එයට අසතුටු වූ හ. බාල පුරු කුමරු පමණක් පියා ගේ ඉල්ලීම පිළිගත්තෙන්, යයාති සිය මහළු බව තපෝ බලයෙන් පුරුට ගත්වා ඔහු ගේ තරුණ බව තෙමේ ලබා ගති. පසු වැ එහි ද කල්කිරුණු හේ තුරුණු බව නැවත පුතුට මැ දී, ඔහු රාජ්‍යයෙහි ද අභිෂේක කොටැ ඉන් පසු සිය වංශය පුරු ගේ නමින් පෞරව වංශය වේවා යි පැතී යැ. මෙ සේ පුරු ගෙන් ඇරඹුණු පෞරව වංශයෙහි අට වැන්නා දුෂ්‍යන්ත යැ.

**චක්‍රවර්තිනං**—'චක්‍රං රාජසමූහං වර්තයිතුං චාලයිතුං ප්‍රශාසෙතුං ශීලං යස්‍ය චක්‍රෙ භූමණ්ඩලෙ රාජමණ්ඩලෙ ච. වර්තයිතුං ශීලමස්‍ය. යද්වා චක්‍රං සෛන්‍යං වර්තයිතුං සර්වභූමෞ චාලයිතුං ශීලමස්‍ය. යනු නිර්වචන හෙයින් රජ සක්හි (මණ්ඩලයන්හි), භූ සක්හි; සේනා සක්හි සිය අණ පවත්වන්නෝ සක්විති නමින් හැඳින් වේ. සම්‍රාට්; අප්‍රතිරථ යනු ද "චක්‍රවර්ති" පර්‍යාය යැ.

**කුලපතිඃ–** "මුනීනං දශසාහස්‍රං යො'න්නපානාදි පොෂණාත්
අධ්‍යාපයති විප්‍රර්ෂිරසෞ කුලපති ස්මෘතඃ"

යනු පුරාණෝ'ක්ති හෙයින් තවුසන් දස දහසකට ආහාර පාන දෙවන බමුණු-ඍෂිනට අධ්‍යාපනය දෙවන මහ තවුස් නාවා කුලපති නමින් ගැනේ.

13 **අන්වය**— තපෝධනානාං ප්‍රතිඝාත විඝ්නාඃ රම්‍යාඃ ක්‍රියාඃ සමවලෝක්‍ය මෞර්වීකිණාඞ්කඃ මෙ භුජඃ කිංස්ත් රක්‍ෂති ඉති ඥාස්‍යසි. (ආර්‍ය්‍යා)

**අර්‍ථ**— තවුසන් ගේ නැසුණු උවදුරු ඇති මනගර පිළිවෙත් නරඹා, දුන්නෙන් කර නැගුණු ම ගේ (තමා ගේ) බාහුව කෙසේ (ඔවුන්) රකිද්දැ යි දැනගන්නෙහි.

**සමහන්**— **ඉදනීමෙව**- මෙයින් කණිව නොබෝ ද පිටත්වැ ගිය බවත් ළඟ දී නො එන බවත් හඟවයි.

**ආභොගඃ**— "ආභොගඃ පරිපූර්ණතා" (අමරකොෂ) 'ආභොග' නම් පිරිපුන් බවයි. කිමෙකැ පිරිපුන් බව ද, තවුස් වන බිමේ පිරිපුන් බව යැ. තවුස් වනයේ පිරිපුන් බව ලැබෙන්නේ උපචාර බිමෙනි. එහෙයින් ආරාම භූමිය වට කළ සීමාව 'ආභොග' නම් වේ.

14. **අන්වය**- ක්වචිත් ශුක ගර්භ කොටර මුඛභ්‍රෂ්ටාඃ නීවාරාඃ තරූණාං අධඃ, [ක්වචිත්] ප්‍රස්නිග්ධාඃ උපලාඃ ඉඞ්ගුදී ඵලභිදඃ සූච්‍යන්ත එව, [ක්වචිත්] විශ්වාසෝපගමාත් අභින්න ගතයඃ මෘගාඃ ශබ්දං සහන්තෙ, [ක්වචිත්] ච තොයාධාර- පථාඃ වල්කලශිඛා නිෂ්‍යන්දරේඛාඞ්කිතාඃ (ශාර්දූල වික්‍රීඩිත)

**අර්‍ථ**- කිසි තැනෙකැ ගිරවුන් ලැගි බෙන මුවින් ගැලුණු හූරු හැල් ඇති රුක් මුල් යැ. (කිසි තැනෙකැ) බෙහෙවින් තෙල් තැවරුණු ගල් අඟුන ගෙඩි තැලූ බැව් හඟවන්නාක් මෙනි., (කිසි තැනෙකැ) විස්වස් බවට පැමිණීම නිසා නො බුන් ගමන් ඇති මුවෝ (රිය) හඬ ඉවසති; (කිසි තැනෙකැ) ජලාශයන් කරා වැටුණු මාගීයෝ (සෝද ගෙනෙනු ලබන) වැහැරි කොතින් ගැලූ දිය බිඳු වලින් ලකුණු වූවෝ වෙති.

**පහදුව**- තවුස් වන බිමේ පිරිවෙස් මඩුල්ල කෙබඳු ද? තන්හි තන්හි බෙන සහිත විශාල ගස් යැ... ඒ බෙනවලැ ගිරවු ලැගැ සිටිති. තවුසෝ ඔවුන්ගේ ආහාරය පිණිස දැමූ හූරු හැල්

කැමට අඳින කලැ ඉඟුදී ඇට ඉපුරා සමඟරක් ඒ ගස් මුල්හි වැටී තිබේ. තැනෙකැ අඟුන ගෙඩි තැලූ ගල් යැ. තවුසෝ තෙල් ලබා ගැනීම පිණිස ඒවා තලති. ඒ පහන් දැල්වීමට, හිස ගැල් වීමට හා තුවාලවලැ ගැල්වීමට ද යැ. තන්හි තන්හි වූ මුවෝ රිය හඬ නො තකා සිටිති. ඒ තවුසන් සමග ඇති විශ්වාසය නිසා යැ. තවුස් බිමෙකැ හැර අන් තැනෙකැ නම් ඒ මුවෝ එසේ නො සිටිති. තවුසෝ ජලාශයන්හි වැහැරි සෝදති. සේදූ ඒවා ආපසු ගෙන එන විටැ එයින් දිය බිඳු වැගිරේ. මාවත් හිරි ඇන්දක් මෙන් ලකුණු වී ඇත්තේ ඒ දිය බිඳුවලිනි

**සටහන්— ඉඞ්ගුදී-** ගස් අඟුන. තාපස තරු යන අපර නාමයෙක් ද වේ. දරුවන් නැති අය දරුවන් ලබා ගැනීම පිණිස අඟුන ගෙඩිවලින් තැනූ මාලා පළඳිත් ලු.

**අභින්න ගතයඃ-** ශබ්දයක් කනැ වැකුණු ඇසිල්ලෙහි පැන දිවීම මුවන් ගේ සිරිතෙකි. එ හෙත් මේ මුවෝ එසේ පැනැ නුදුවා සාමාන්‍ය ගමනින් යෙති.

15 **අන්වය—** ශාඛිනඃ පවන චපලෛඃ කුල්‍යාම්භොභිඃ ධෞතමූලා, කිසලය රුචාං රාගඃ ආජ්‍යධූමෝ'ද්ගමෙන භින්නඃ. එතෙ ච නෂ්ටා ශඞ්කා හරිණ ශිශවඃ අර්වාක් ජනාන දර්භා'ඞ්කු-රයාං උපවනභූමි මන්ද මන්දං චරන්ති. (මන්දාක්‍රාන්තා)

**අර්ථ-** තුරුහු පවනින් කැලැඹූ ඇල-දෙල දියෙන් සේදුණු මුල් ඇත්තෝ යැ. පල්ලවයන් ගේ කාන්තිමත් පැහැය (ගිතෙල්) හෝම දුම් නැඟීමෙන් බිඳුණි. මේ නැසුණු බිය ඇති මුව පොව්වෝ ද ඉදිරි පසැ කඩා ලූ කුසතණ දලු ඇති උපවන බිමෙහි සෙමින් සෙමින් හැසිරෙති.

**පහදුම-** මේ තවුස් වන බිමක් බවට තව ද හේතුහු වෙති. උපවෙනෙහි තවුස් දූරියනට ගස් වැල්වලට දිය ඉසීමේ පහසුව පිණිස තැනූ දිය කඩිති වේ. එහි ඉවුරු අසල වූ ගස් මුල් සුළඟින් කැලැඹුණු දියෙන් සේදුණු සේ යැ. හෝම දුම්

නිරතුරු ව වැදීම නිසා ළ-පලු පැහැය ද විවණී ව ගොස් යැ. එහි වූ මුව පොව්වෝ ද, කිය සැක නැති ව ඉදිරියෙහි කඩා දැමූ කුස දලු සපමින් සෙමින් සෙමින් හැසිරෙති.

**සවහන්**- "කුල්‍යා- කුල්‍යා'ල්පකෘත්‍රිමා සරිත්" (අමර කෝෂ) කැපූ හෝ හෑරූ දිය කඩිති හෝ ළිං පොකුණු.

**අර්වාක්**— ළඟ හෝ ඉදිරිය.

**සව්මුපපන්නම්**- සියල්ල යුක්ති යුක්ත යි. සියල්ල ඇත්ත. ඔක්කොම හරි යනු වඩාත් වහරව හුරු යැ.

**ප්‍රග්‍රහා**- රැහැන්-කටකලියාව බැඳි ලනු.

**විනීත වෙශෙන**- දැමුණකු ලෙසින්-හැදුනකු ලෙසින්. තවුස් වන බිමට සුදුසු ඇඳුමකින් යනු වඩාත් සුදුසු අරුත යි රජ් දඬයමට ඔබින ඇඳුමින් සැරසී සිටි. එ හෙයින් ඒ මුදු, දන්තා වෙස් ගැන්වෙන ඇඳුමක් ඇඳි යැ යුතු යැ. රියදුරුට සිය අබරණ හා දුනු හී බාර දීමෙත් විනීත වෙශය කෙබඳු ද යනු හැඟ වේ. නාට්‍යාලංකාරයෙහි " සුද්ධො විචිත්‍රො මලින සත්‍රිවිධො වෙෂ උච්‍යතෙ දෙවාභිගමනෙ චෛව මඞ්ගලෙ නියම- සජිතෙ වෙෂස්තත්‍ර භවෙච්ඡුද්ධො යෙචා'න්‍යෙ ප්‍රයථා නාරා" යි කී හෙයින් සුද්ධ, විචිත්‍ර, මලින යැ යි වෙෂය තෙ පරිදි යැ. ඉන් සුද්ධ වූ වෙසින් දෙවියන් තවුසන් හමුවට යා යුතු යැ.

**ආර්ද්‍ර පෘෂ්ඨාඃ**- විඩා සිඳුවීම. තෙත් පිටු ඇතියන් කිරීම. වනයෙහි හැසිරීමෙන් අව් රැසින් වියැලුණු පිටු-සිරුරු ඇති අසුන් සෙවනේ තබන්නට කී සැටි යැ. අසුන් ගේ විඩා සිඳුවීමට පිටෙහි දිය ඉසී ල. ආර්ද්‍ර පෘෂ්ඨා යනු මේ දෙ-අරුත මැ පතා සිටි සේ යැ.

16. **අන්වය**- ඉදං ආශ්‍රාම පදං ශාන්තම්; බාහුඃ ච ස්ඵුරති; අස්‍ය ඵලං කුතඃ? අථ වා භවිතව්‍යානාං ද්වාරාණි සර්වත්‍ර භවන්ති. ( ආයී )

**අර්ථ**- මේ අරම් පියෙස සාන්තයි. බාහුව ද සැලේ. එහි ඵලය කිම? නො වේ නම්, සිදු වියැ යුතු දෑ පිළිබඳ දොරටු හැම තන්හි මැ වේ ද?

**පහදුව**- මේ තවුස් වන බිම බැලූ බැල්මට මැ ශාන්ත යැ. නගරයෙහි ඇති කලබලකාරී ගතිය එහි නැති. සියල්ල ඉතා නිශ්චල වැ පවත්නා සේ යැ. මේ නිශ්චල ශාන්ත බවට හේතුව එහි වසන තවුසන් ගේ සුවිනීත සාමකාමී ගති-පැවතුම් විය හැකි යැ. මෙ බඳු තැනෙක දී රජු ගේ දකුණු බාහුව සැලීමට ඇති හේතුව කිම? ඒ ඔහුට පුදුමයෙකි. දකුණු බාහුව සැලීම සුබ ලකුණෙකි. ස්ත්‍රීරත්නයක් ලැබෙන බවට පෙර නිමිත්තෙකි. මේ ශාන්ත තවුස් බිමේ දී එ බඳු දෑ කෙ සේ ලැබිය හැකි ද? තවුසියන් හැර අන් ස්ත්‍රීන් වෙති යි නො සිතිය හැකි. කෙ සේ වුවත් විය යුත්ත කොතැන දී නමුත් විය යුතු යැ. එයට ස්ථාන වෙනසෙක් නැති.

**සටහන්**- **ස්ඵුරති ච බාහුඃ**- "වාමේතරභුජස්පන්දො වරස්ත්‍රීලාභ සූචකඃ" (**අද්භුත සාගර**) දකුණු බාහුව සැලීම ස්ත්‍රී රත්නයක් ලැබීමේ පෙර නිමිත්තයි. හත් වන රංගයෙහි ද හේමකූටයට පිවිසි දුෂ්‍යන්ත ගේ දක්ෂිණ බාහුව ශකුන්තලා හමුවට පෙරැ සැලුණි.

**භවිතව්‍යානාං ද්වාරාණි**- නියමයෙන් සිදුවිය යුතු දෑ පිළිබඳ උපා හෝ දොරටු.

**ඉදෙ ඉදෙ**- (ඉතඃ ඉතඃ)- මෙහි නායිකාව ශකුන්තලාව හෙයින් "නායිකානාං සඛීනාං ච ශෞරසේනී ප්‍රකීර්තිතා" යි භරතයන් විසින් කියූ සේ ඈ **ශෞරසේනී** බස ව්‍යවහාර කරන්නී යැ.

17 **අන්වය**- යදි ආශ්‍රමවාසිනඃ ජනස්‍ය ඉදං ශුද්ධාන්ත දුර්ලභං වපුඃ, උද්‍යාන ලතාඃ වනලතාභිඃ ගුණෛඃ දූරීකෘතාඃ ඛලු. (ආසීා)

**අර්ථ**- ඉදින් අරම් වැසි ජනයා ගේ මේ, (මගේ) ඇතොරැ පුරා දුලබ රූපලාවණ්‍යයෙක් (වේ නම්) උයන් වැල් වන වැල් විසින් ගුණයෙන් දුරු කරන ලද්දේ නු.

**පහදුව**- රජු තරුණියන් තී දෙනා දුටුවා පමණි. ඔහු ගේ ඇස් ඔහුට මැ අදහා ගත නො හැකි. සිය කිසෝ ගෙවලැ රටෙහි මෑ සිටිත ලක්ෂණ කාන්තාවෝ වෙති. එහෙත්

මේ කවර පුදුමයෙක් ද? වන වැසි මේ තවුස් දූරියන් ගේ රූපලාවණ්‍යයට සමාන කරන කලැ බිසෝ ගෙවලැ සිටින සුන්දර කවරු ද? වනයෙහි වැල් ඉබේ වැවේ, නුවර උයන්හි වැල් මහත් වැර වෑයමෙන් වවා ගනු ලබ යි. එහෙත් සුන්දරත් වයෙන් වන වැල්, උයන් වැල්වලට වඩා උසස් වීම සැබෑ-වෙකි. මෙයන් එ බඳු සිදුවීමෙක් දෙ යි දුෂ්‍යන්ත සිතයි.

**ශුද්ධාන්ත**- "ශුද්ධඃ අන්තඃ මධ්‍යභාගඃ යස්‍ය" රජුන් ගේ බිසෝ ගෙය ශුද්ධාන්ත යැ යි වහරවන්නේ එහි අභ්‍යන්තරය පවිත්‍ර වැ තබන නිසා ලු.

**හලා**- "සමානාභිඛ්‍යාථා සඛ්‍යෝ හලා භාෂ්‍යා පරස්-පරම්" යි **නාට්‍ය ශාස්ත්‍රයෙහි** කී හෙයින් එකට ඇසුරු කරන මිතුරියන් ඔවුනොවුන් අමතන්නේ "හලා" යනුවෙනි.

**ආලවාල**- "ආ සමන්තාත් ලවම් ජල ලවම් ආලාති ගෘහ්ණාති" ජලය රැඳැවීම පිණිස ගස් වටේ සාරා තැනූ තෝ-තැනි.

**අසාධුදර්ශි**— "න සාධු දර්ශී" දුර දිග නො බලන්නා. සුතු ලෙසින් ඒ ඒ දූ නො බලන්නා - හරි දැකිම් නැත්තා. කණ්වට හරි දැකිමක් වේ නම් මෙබඳු ළඳ බොළඳ සුරූපී තරුණියක් විඩා දෙන තවුස් ජීවිතයෙකැ නො යොදවනු ඇති. නිතර මැ වැරදි දෙය මැ ගන්නා හෝ දක්නා යන අරුත ද දියැ හැකි හෙයින් සුරූපී තරුණියක් ළඟ තවත්වා ගැනිමෙන් ආශ්‍රමධර්මයට පළිබෝධ කරන්නෙකි.

**ආශ්‍රමධර්ම**— කාලිදාසයෝ මැ රඝුවංශයෙහි—

"ශෛශවේභ්‍යස්ත විද්‍යානාං යෞවනෙ විෂයෛෂිණාම්
වාර්ධකෙ මුනිවෘත්තීනාං යොගෙනාන්තෙ තනුත්‍යජාම්" යි කීහ.

ආශ්‍රමධර්ම සතරෙකි. විද්‍යා, විෂයී, මුනි, යෝගී විසිනි,

18 **අන්වය**— යඃ ඍෂිඃ ඉදං අව්‍යාජ මනොහරං වපුඃ තපඃ ක්ෂමං සාධයිතුං ඉච්ඡති කිල, සඃ නීලෝත්පලපත්‍ර-ධාරයා සමිලතාං ඡෙත්තුං ධ්‍රැවං ව්‍යවස්‍යති (වංශස්ථවිල)

**අර්ථ-** යම් නවුසෙක් මේ අව්‍යාජත්‍වයෙන් මනහර සිරුර තපසට යොග්‍ය යැ සි තබා ගැනීමට කැමති වේ ද, හේ නිලුපුල් පෙතිමය කගින් "සැමි" අත්ත සිඳීමට සැබැවින් තැත් කරයි.

**වල්කලෙන—** "වැහැරියෙන් කළ තනපටින්" යනු මෙතනට සුදුසු අරුත වේ.

19 **අන්වය-** ස්තනයුගපරිණාහච්ඡාදිනා ස්කන්ධදෙශෙ උපහිත සූක්ෂ්මග්‍රන්ථිනා වල්කලෙන [පිනද්ධං] අස්‍යාඃ ඉදං අභිනවං වපුඃ පාණ්ඩුපත්‍රෝදරෙණ පිනද්ධං කුසුමං ඉව ස්වාං ශොභාං න පුෂ්‍යති? (මාලිනී)

**අර්ථ—** දෙ-තන මඬල මහත් බව වසාලන ස්කන්ධ දෙශයෙහි බැඳි තියුණු ගැට ඇති වැහැරි පටින් (වැසුණු) මැ-ගේ මේ යොවුන් සිරුර පඬුවන් පෙති ඇතුළත වැසුණු මලක් මෙන් සිය කාන්තිය නො දක්වයි.

**පහදුම-** ශකුන්තලා දිනෙන් දින වැඩෙයි. ඒ හා ඇගේ පියොවුරු ද වැඩේ. එහෙත් ඇගේ මේ තනපට මේ වැඩීම අනුව තැනුනෙක් නො වේ. පෙර බැඳි තනපට මැ යැ. ඒ කුඩා බැවින් අමාරුවෙන් තද කොට බැඳියැ යුතු යැ. එහි ගැට යොදා ඇත්තේ ස්කන්ධ දෙශයෙහි යැ. තනපට කොපමණ තද විද? ගැට පවා සියුම් බවට පැමිණියේ යැ. ආශ්වාස කරන විට ඒ ඇදී යාමෙනි. මෙ බඳු වැහැරි පළඳනා නිසා ඇය සිය යොවුන් බවට ඔබින සෝභාව නො දක්වයි. කුමක් මෙන් ද? පඬුවන් පියැලි වලින් වැසුණු මලක් සිය සෝභාව නො දෙන්නාක් මෙනි.

20 **අන්වය-** ශෛවලෙන අනුවිද්ධං අපි සරසිජං රම්‍යං. [වර්තතෙ] මලිනං අපි ලක්ෂ්ම හිමාංශොඃ ලක්ෂ්මීං තනොති. වල්කලෙන අපි ඉයං තන්වී අධික මනොඥා [විද්‍යතෙ] මධුරාණාං ආකෘතිනාං කිං ඉව හි මණ්ඩනං න [භවති] (මාලිනී)

**අර්ථ-** සෙවෙලින් වෙලුනත් පියුම සිත්කලු යි. අඳුරු ලප ඇතත් සඳු ගේ ශෝභා පැතිරෙයි. වැහැරියෙන් (වැසුනත්) මේ තුනුවන ඉතා දැකුම්කලු යි. සැබැවින් මිහිරි වස්තූන් පිළිබඳ මැ කවර දෙයින් සැරසීමෙක් නැද්ද ?

**පහදුව—** ලොව්, ඉතා මිහිරි, දැකීමෙන් මැ නුවන් පිනවන වස්තූහු වෙති. එහෙත් ඒවා සැරසිලි රහිත යැ. ඒවායේ සුන්දරත්වයට කුමකින් හෝ බාධා පැමිණ තිබේ. පියුම ඉතා සොඳුරු මලෙකි. එහෙත් එය සෙවෙලින් වෙලී පවති. සඳ කොතරම් රම්‍ය ද, එස ද ලපයෙන් වැසී සිටී. කෙසේ වෙතත් මේ වස්තූන් ගේ සිත් කලු බවට ඉන් හානි-යක් වී නැති එ සේ මැ මේ ලලනාවත් වැහැරියෙන් වෙලී සිටී. එහෙත් වැහැරිය ඇය ගේ ශොභාව නො වලනයි.

**සටහන්—** **ප්‍රියංවදා-** ශකුන්තලාවන් ගේ යෙහෙළියක ගේ නම යැ. ඈ කී වදන මිහිලුව සලකා ඇගේ නමින් මැ සරදම් කළ සේ ඉතා කමනිය යැ. ප්‍රියං–ප්‍රිය දා–මඟුල්, වදා-කියන්නී–මඟුල් කියන්නී. ඈ ගේ නම‘රුත් හා එක සේ යෙදෙයි.

21 **අන්වය-** [අස්‍යාඃ බලු] අධරඃ කිසලය රාගඃ [වත්තෙ] බාහූ කොමලවිටපානුකාරිණෞ [ස්තඃ] අඞ්ගෙෂු කුසුමං ඉව ලොභනියං යෞවනං සන්නද්ධං [අස්ති] (ආසීා)

**අර්ථ-** (මැගේ වතාහි) තොල් ලදලු පැහැ ගනී. දෙ බාහු කෝමල රිකිළි අනුව යෙයි. මලක් මෙන් ඇලුම් කටයුතු යොවුන් බව ශරීරා‘වයවයන්හි ගැවසුණි.

**පහදුව-** වැල රත් නවදලුවෙන් ළා රිකිල්ලෙන් කම-නිය මලින් සැරසී සිටී. ශකුනතලාව ද වැලක් වැනී යැ. ඇයට ද රත් අදරමය නව දලු ද; කෝමල බාහුමය රිකිළි ද; කමනිය යොවුන්මය කුසුමක් ද වේ. එහෙයින් ඇය ද වැලක් මෙන් දැකුම් කලු යැ.

**සටහන්-** **ස්වයංවර-** ‘ස්වයං ප්‍රියතෙ පතිරත්‍ර ඉති’ නමං මැ ස්වාමියා සොයා ගැනීමේ උත්සවය.

**අසවර්ණ ක්ෂෙත්‍ර**- අසවර්ණ - අසමාන, ක්ෂෙත්‍ර - කලත්‍ර - භාර්‍යා වර්ණයෝ සතරෙකි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ, වෛශ්‍ය, ශුද්‍ර විසිනි. ශුද්‍රයෝ හෝ වෛශ්‍යයෝ ක්ෂත්‍රියයනට නො හොබිති. ඒ සලකා සිතු සැටි යැ.

22 **අන්වය-** අසංශයං ක්ෂත්‍ර පරිග්‍රහඃ ක්ෂමා [අසති] යත් මෙ ආර්‍යං මනඃ අස්‍යාං අභිලාෂි. සන්දෙහපදෙෂු වස්තුෂු හි අන්තඃ කරණප්‍රවෘත්තයඃ සතාං ප්‍රමාණම්. (වංශස්ථවිල)

**අර්ථ-** නිසැකයෙන් (මෑ) රජකුට බිරිය වීමට සුදුසු යි, යම් හෙයකින් ම-ගේ උදාර හිත මෑ කෙරෙහි අභිලාෂවත් ද, (එහෙයිනි) සැකසට ලක් වූ වස්තූන් කෙරෙහි සැබැවින් නීරණාත්මක බලය උතුමන් සිතැ'ගි අනුව පවතී.

**පහදුව-** ශකුන්තලාව ගේ රූපලාවණ්‍යය දුටු මොහො-තෙහි මැ දුෂ්‍යන්තගේ සිත ඈ කෙරෙහි බැඳී ගියේ යැ. එ බන්දක් එ තරම් පහසුවෙන් හා ක්ෂණිකවැ ඇති වීමට හේතුව ගැන ඔහුට නා නා හැඟීම් අතර නො දක්වා නගි. නිසැකයෙන් ඔහු ගේ නීරණය ඔහු ගේ වාසිය සඳහා මැ විය. පළමුව ඔහු ඈ-ගේ මවපියන් ගේ වතගොත ගැන සිති යැ. කණ්ව තවුසා ඈගේ පියා බැව් කලින් මැ දැනගත් ඔහු මව කවරක් වියැ හැකි දැ යි අනුමාන කරයි. පියා බමුණකු බව නිසැක යැ. මව බැමිණියක නො වී ක්ෂත්‍රිය කාන්තාවක් වී නම්, ඔහු ගේ මේ ක්ෂණික ප්‍රේමයෙහි ඵල ලැබිය හැකි. කෙසේ වෙතත් ඔහු ගේ නිගමනය ඈ රජකු ගේ බිරිය වීමට සුදුසු බව යි. මක්නිසා ද, ඔහුගේ සිත අභිමානවත් යැ. රාජකීයභාවයෙන් උදාර යැ. එය නුසුදුසු දෑ කෙරෙහි ඇදී නො යන බව ඔහුට සහතික යැ. එ බඳු සිත දන්ම මැ ඈ කෙරෙහි බැඳී සිටි. මේ කාරණය මැ ඈ-ගේ කුලවත් බවට නිසැක නිමිත්තෙකි. එසේ මැ සැක සහිත දේ ගැන නීරණය කිරීම උතුමන්හට කළ හැකි යැ. දුෂ්‍යන්ත ද උතුමෙකි. එහෙයින් තමාගේ නීරණය නිවැරැදි වියැ යුතු යැ යි හේ සලකයි.

**සටහන්- ක්ෂත්‍රපරිග්‍රහක්ෂමා-** බමුණකු නිසා ක්ෂත්‍රිය මාතෘකක ගෙන් උපන් කන්‍යාවක ක්ෂත්‍රියයකුට අවාහ කළ හැකි. එහෙත් බැමිණියක ගෙන් උපන්නියක එසේ කළ නො හැකි.

**අම්මෝ-** බියක්, දුකක් හෝ විස්මයක් ඇති වූ විටැ ගෙළ වගරෙති ද අම්මෝ යනු කියැ වේ.

**භ්‍රමරබාධා රූපයති-** " නිර්ගතං ද්‍රුතතරං විධුතං තත් ප්‍රයුජ්‍යතෙ ශීතාර්තෙ ජ්වරිතෙ භීතෙ " යි කී පරිදි සරස් කළ අත වහ වහා චලනය කිරීම ශීත, ජ්වරිත, භීත අවස්ථා වන්හි යෙදේ.

23. **අන්වය-** මධුකර, වෙපථුමතීං චලා'පාඞ්ගාං දෘෂ්ටිං බහුශඃ ස්පෘශසි; කර්ණාන්තිකචරඃ රහස්‍යා'ඛ්‍යායී ඉව මෘදු ස්වනසි; කරං ව්‍යාධුන්වත්‍යාඃ රතිසර්වස්වං අධරං පිබසි, තත්ත්වා'න්වේෂාත් වයං හතාඃ, ත්වං කෘතී ඛලු. (ශිඛරිණී.)

**අර්ථ-** බමර, සැලෙනසුලු තැනැත්තිය ගේ ලෙලෙන අපාඞ්ග බැලුම් ඇති නෙත බෙහෙවින් පහස්නෙහි. සවන'ස සැරිමින් රහසක් කියන්නකු මෙන් මිහිරි නද දෙහි. අත සලන්නිය ගේ රති නිධාන වූ අධර උරන්නෙහි. ඇති තතු සෙවීමෙන් අපි නටුවෝ වෙමු. තෝ නම් බමර සැබැවින් කෘතා'ර්ථ යැ.

**සටහන්- රතිසර්වස්ව-** රති නිධාන-රතිමූල; පෙම් උල්පත.

**කරංව්‍යාධුන්වත්‍යා-** චුම්බනයේ දී හස්ත චලනය කාම ශාස්ත්‍රයේ දක්වේ.

**කෘති-** සපිරුණු ක්‍රියා ඇත්තා-පිනැත්තා.

24. **අන්වය-** දුර්විනීතානාං ශාසිතරි පෞරවෙ වසුමතීං ශාසති, කඃ අයං මුග්ධාසු තපස්විකන්‍යාසු අවිනයං ආචරති, ( ආර්‍යා )

**අර්ඝ-** අවිනීතයකට දඬුවම් දෙන පෞරවයකු මිහිතන පාලනය කරන කලැ කවරෙක් බොළඳ තවුස් දූරියන් කෙරෙහි නො හික්මුණු කම් කෙරේත් ද ?

**ස්වගත්- ස්වගතම්-** “ අශ්‍රාව්‍යං ස්වගතම් ” රඟයෙ සිටින අයට නෑසෙන සේ තම සිතැති පැවසුම. “ ආත්මගතම් ” යනු ද මෙය මැ යි.

**ප්‍රකාශම්-** “ සර්ව ශ්‍රාව්‍ය ප්‍රකාශං ස්‍යාත් ” යි කී හෙයින් රඟන-නරඹන හැමට මැ ඇසෙන සේ පැවසීම යැ.

**ජනාන්තිකම්-** ත්‍රිපතාක කළ අතින් අන්‍ය කථාවන් වළක්වා වේදිකාවේ පසෙකැ සිට ඔවුනොවුන් විසින් කැරෙන රහස් මන්ත්‍රණය. කියේ මැ යි, **දශරූපකයෙහි**. ත්‍රිපතාක-කරේණ'න්‍යානපවාර්‍ය'න්තරා කථාම්, අන්‍යෝන්‍යාමන්ත්‍රණං යත් ස්‍යාජ්ජනාන්තේ තජ්ජනාන්තිකම් ” මෙහි ත්‍රිපතාක නම් “ ස එව ත්‍රිපතාකඃ ස්‍යාද්වක්‍රිතා නාමිකාඞ්ගුලිඃ ” වක් කොටැ නැමූ ඇඟිලි ඇති බව ත්‍රිපතාක වේ.

**අත්‍යාහිතං-** “ අත්‍යාහිතං මහාභීතිඃ කර්ම ජීවාන-පෙක්ෂි ච ” ජීවත්වීමේ ආශා නැතිවන තරම් මහ බිය.

**සාධ්වසං-** “ දරත්‍රාසෞ භීතිර්භීඃ සාධ්වසං භයං ” යි අමරකොෂයෙහි එන හෙයින් සාධ්වසං යනු බිය අරුත දෙතත් මෙ තැනට සුදුසු කැළැඹීම හෝ ලජ්ජාව යන අරුත් යැ.

**ඵල මිස්සං අග්ඝං-** පලතුරු මුසු උපහාරයක්. “ ආපඃ ක්ෂීරං කුශාග්‍රං ච දධි සර්පි සතණ්ඩුලම් යවඃ සිද්ධාර්ථකශ් චෛව අෂ්ටාඞ්ගඃ ප්‍රකීර්තිතඃ ” (ජල – කිරි – කුසතණ – දී-ගිතෙල්-සහල්-යව සහ අබ යන දෑයින් යුතු දෙවියන් පිණිස, බමුණකු පිණිස හෝ සම්භාවනීය අමුත්තකු පිණිස හෝ පිදිය යුතු උපහාරය අර්ඝ නමි.

**පජ්ජුමාසණං-** මෙත එළඹීම; ඇසුර. සැගැසීම හෝ සැලැකීම වඩා මැනැවි.

**විකාරසස-** "නිර්විකාරාත්මකෙ චිතෙත භාවඃ ප්‍රථම වික්‍රියා" පෙර රාගාදි ආශායෙන් තොර සිතෙකැ පළමුවෙන් උපදනා ශෘඞ්ගාරයෙන් ජනිත චිත්තව්‍යාකුලත්වය විකාර නමි.

**සත්තවණ්ණවෙදිකාය-** රුක් අත්තන ගස වටේ තැනුණු වෙදිකාවේ. රුක් අත්තන ගස සප්තපර්ණී නමින් හඳුන් වන්නේ එක් එක් නටුවෙහි කොළ සත බැගින් ඇති නිසා හෝ ඡත්‍රයක් වැනි හෙයින් හෝ යැ.

**කාදමො අජ්ජෙණ රාජසිණො වංසො අලංකාරිඅදි-** "කඃ පෞරවෙ" යනාදියෙන් රජු නාමං කවුරුන් ද යි හැඳින් විය. එහෙත් මේ තවුස් වනිතාවෝ රජු නො හැඳුණු හ. ඔහු ගේ පෙනුමෙන් කතාවෙන් හා හැසිරීමෙන් උසසකු බව සිත කියනන් නිසැකයෙන් දැන ගැනීම සඳහා මේ පැන නැගූ හ.

**ධම්මාධිකාර-** විනිශ්චයකාර ධුරය, රාජ පදවිය; යුතු අයුතුකම් විසඳීම යා නිති පැන ීම රජු අයත් හෙයින් රාජ පදවිය ධර්මාධිකාර නමින් හැඳින් වෙයි.

**ප්‍රභවම්-** ප්‍රභව වූ තැන, උපතට හේතුව-පියා.

**ජීවිතසව්ස්වෙන -** ජීවිතය පිළිබඳ සියල්ලෙන් ශකුන්තලාවන් ද තවුසා අයත් හෙයින් ඇය ද පාවා දි යැ හැකි යන සැඟවුණු අරුතක් ද පතා සිටී.

**කෞශික-** "කුශස්‍ය වා කුශිකස්‍ය ගොත්‍රාපත්‍යං පුමාං" - කුශ ගේ හෝ කුශික ගේ ගොත්‍රයෙන් පැවත ආවෙක්.

**ශෘඞ්ගාර ලජ්ජා-** ශෘඞ්ගාරය නිසා උපන් ලජ්ජාව. ඒ නොපළඳු ද සි. "පරාඞ්මුඛී නාතං ශිශු පරාවෘතමුඛීරත්තං කන්කාන්ෂකාපලප්ජාදි කෘතෙ වක්ත්‍රාපකාරණෙ" යන්නෙහි පහදැසි.

**සමාධිභීරුත්වං දේවානාං**- උග්‍ර තපසින් ඉන්ද්‍රත්වයට ද පැමිණිය හැකි වේ ල. එයින් සිය පත් ඉන්ද්‍රයා තවුස් දම් බිඳීමට අප්සරාවන් මෙහෙයවයි. බෞද්ධ ජාතක කථා වත්හි ද මෙබඳු පුවත් නලිනී-අලම්බුසා ආදි ප්‍රවෘත්තීන් ගෙන් පැහැදිලි වේ.

**වසන්තාවතාර සමයේ**- වසන්ත සෘතුව ලබා ගෙන, එද්දී

25. **අන්වය**- අස්‍ය රූපස්‍ය සම්භවඃ මානුෂීෂු කථං වා ස්‍යාත්. ප්‍රභාතරලංජ්‍යෝතිඃ වසුධාතලාත් න උදේති (අනුෂ්ටුප්)

**අර්ථ**- මිනිස් මාගමුන් කෙරෙහි මෙබඳු රුවක ගට ගැන්මෙක් කෙසේ නම් වේ ද ? ප්‍රභාවෙන් බබලන තරුව පොළොවින් නො නඟී.

**පහදුම**- අහස ඇසුරු කරන සියල්ල බබලයි. තරු ද බබලයි. දෙවියෝ ද බබලති. ශකුන්තලා දෙවඟනක ගෙන් උපන්නියකි. එ හෙයින් ඇගේ බැබළීම ස්වාභාවික යි. පොළොව නො බබලයි. එය ඇසුරු කරන දූය ද නො බබල යි. මනුෂ්‍යයෝ පොළොව ඇසුරින් සිටින්නෝ යැ. එහෙයින් ඔවුහු නො බබලති. ශකුන්තලා මිනිස් ඉතිරියක වී නම් එ බඳු බබලන රූපයෙක් නො වියැ හැකි.

**සටහන් - ද්වෛධීභාව කාතරං**- දෙගිඩියාවෙන් සැලෙන-සැකයෙන් බැගෑ වූ. දූන් රජු ගේ සිත, වූ මවු-පිය වත ගොත පිළිබඳ සියලු සැක පසිඳිණි. එහෙත් ඇය ස්වාමි පුරුෂයකු පතමින් සිටින බව සෙහෙළිය ගේ විහිළුවෙන් ගැනුණි. **දැන්ම** මැ ඇය හිමියකු හා ගිවිස සිටිනි **ද** යි සිතෙහි අනුමානයෙකි. ඔහු ගේ සිත සැකයෙන් බැගෑ වූයේ මේ නිසා යැ.

26. **අන්වය**- අනයා මදනස්‍ය ව්‍යාපාරරෝධි වෛඛානසං ව්‍රතං ආප්‍රදානාත් නිෂෙවිතව්‍යං කිම් ? අහෝ ! [ ඉයං ] ත්වදෘශේ'ක්ෂණාභිඃ හරිණා'ඞ්ගනාභිඃ සමං අත්‍යන්තං එව නිවත්ස්‍යති. ( වසන්තතිලකා )

**අර්ථ-** මෑ මිහින් කම් සුවයට සතුරු වූ වෛඛානස ව්‍රතය ( හිමියකුට ) පාවාදෙන තෙක් සෙවිය යුතු ද ? නැත හොත් සමාන ඇස් ඇති ප්‍රිය මුවැත්තියන් හා මරණය තෙක් ( මෙහි ) වසන්නී ද ?

**පහදුව-** වෛඛානස ව්‍රතය කම් සුවයට සතුරු යෑ. වෛඛානස නම් බඹසර රැකීම යි. ශකුන්තලා දිවිහිමියෙන් වෛඛානස ව්‍රතය රකින්නී නම් තමා හා සමාන මුවැත්තියන් සමග වනයේ මෑ කල් ගෙවයි. හිමියකුට පාවා දෙන තෙක් වෛඛානස ව්‍රතය රකී නම් රජු ගේ සිතෑ'ඟි සපුරා ලියෑ හැකි යි. මේ ප්‍රශ්නයට ලැබෙන පිළිතුර මතෑ ඔහු ගේ සිතෑ'ඟි ඵලවත් වීම හෝ නො වීම පවතී.

**සටහන්-** **ආහො-** විකල්පා'ර්ථයි. " ආහො උතා 'හො කිමුත විකල්පෙ " ( අමරකොෂ )

**අත්‍යන්තං-** " අත්‍යන්තඃ ( මෘත්‍යොඃ ) අත්‍යන්තං ආමරණං " මරණය තෙක්-දිවි හිමියෙන්.

27. **අන්වය-** හෘදය, සාභිලාෂං භව. සම්ප්‍රති සන්දෙහ නිර්ණයො ජාතඃ. යද් අග්නිං ආශඞ්කසෙ, තද් ඉදං ස්පර්ශ ක්ෂමං රත්නම්. ( ආර්‍යා )

**අර්ථ-** හෘදය, අභිලාෂවත් වෙව. දැන් සැකය විසඳුනේ විය. යමක් ගිනි යෑ යි සැක කෙළෙහි ද, දැන් එය ස්පර්ශ කළ හැකි රත්නයෙකි.

**පහදුව-** ගිනි පහස්නට නො හැකි. පැහැසී නම් දුක් දනවයි. බඹසර රකින්නී ගිනි මෙනි. ඇය පැහැසී නම් නිරා දුක් දනවයි. රුවන පැහැසියැ හැකි. පැළඳීමට ද සුදුසු යෑ, ශකුන්තලා දිවි හිමියෙන් බඹසර නො රකින්නී යකා . හිමියකු ලබන තෙක් ඇ වනයේ වෙසෙයි. එහෙයින් ඇය රජුට ලබා ගත හැකි. රුවනක් මෙන් පැහැසියෑ ද හැකි.

**සටහන්-** **අශම්භාන්ධ්ප්‍රලාපිණී** එකිනෙකට නො ගැලපෙන දෑ කියන්නී. මල්-සෑ දොඩන්නී.

**චේෂ්ටාප්‍රතිරූපිකා**- කායික ක්‍රියාවන් ගේ පිළිබිඹු. කාමීන් ගේ සිරුරින් කළ යුතු දැය ද කරන්නේ සිත යැ. ශකුන්තලාවන් ගේ පසු පසින් ගියේ රජු ගේ කය නො වැ සිත යැ. කය වෙනුවට ක්‍රියාත්මක වූයේ ද සිත යැ. ප්‍රේමා 'තුර අවස්ථාවන්හි කාමීන් ගේ සිහිය පළා යේ. සිහි ලත් විටැ සිතැ'හි ක්‍රියාත්මක වී යැ යි ඔවුහු සැනසෙති

28 **අන්වය**- මුනිපාතයාං සහසා අනුයාස්‍යන් විනයෙන වාරිතඃ ප්‍රසරඃ ස්ථානාද් අනුච්චලන් අපි ගත්වා ප්‍රති නිවෘත්තඃ ඉව. (ආර්‍යා)

**අර්ථ**- තවුස් දුව අනුව වහා යන්නේ විනයෙන් වැළැකූ ගමන් ඇත්තේ යැ. (මා) සිටි තැනින් නො සෙල්වුනේත් ගොස් පෙරළා නැවැත්තාක් මෙනි.

**පහදුම**- ශකුන්තලා පිටත්ව යෙයි. රජු ඇගේ වෙන්ව යාම නො ඉවසයි. ඇය පස්සෙන් යාමට ද සිතයි. එහෙත් තමා රජකු බව සිහියට නැගේ. රජු .හැමට මැ වඩා තික්මීම රැකිය යුතු නු, කොතරම් ආසා ඇතත් සිටි තැනින් නො සෙල්වී සිටි. තමුත් සිත ඔහුගෙන් ඉවත්ව ගියාක් මෙනි. මොහොතක් ඔහු සිහිවිලි රහිත වැ සිටි සේ යැ. සිහි ලැබෙත් මැ ඇය පසු පස ගොස් පෙරළා ආවාක් මෙනි ඔහු ගේ හැඟීම.

**සටහන්**- රුක්ඛ සෙඅණෙ දුවෙ ධාරෙසි මෙ- දිය ඉසීමේ දී ගස් දෙකකට මට ණයයි. සෙහෙළියන් අතර ගස්වලට දිය ඉසීමේ දී යම් කිසි එකඟ බවක් වූ සේ යැ. ගස් කොටස් කොටැ බෙදාගෙන ශකුන්තලාවන් විසින් ප්‍රියංවදා ලවා ඇ අයත් ගස් දෙකකට දිය වත් කරවා ගන්නා ලදි. එ බැවින් ශකුන්තලා ප්‍රියංවදාවන් ගේ ගස් දෙකකට දිය ඉසීමට බැඳී සිටි.

39. **අන්වය**- ඝටෝ'ත්ක්ෂේපණාත් බාහු ස්‍රස්තාං'සෞ අතිමාත්‍රං ලෝහිතතලෞ. ප්‍රමාණා'ධිකං ස්වාසඃ අද්‍යා'පි ස්තන වෙපථුඃ ජනයති. වදනෙ කර්ණශිරීෂරෝධි ඝර්මා'මිභසාං ජාලකං බද්ධං, බන්ධන ස්‍රංසිනී සති මූර්ධජාශ්ච එකහස්ත-යමිතාඃ පර්‍ය්‍යා'කුලාඃ. ( ශාර්දූල වික්‍රීඩිත .)

**අර්ථ**- කළය එසවීමෙන් ( මැ ගේ ) දෙ-බාහු ඇඳුණු උරතල ද, රත් පැහැගත් අලු ද ඇත්තේ වෙයි. උමණට වැඩි ශ්වාසය දනු දූ පියොවුරු සසල කරයි. මුහුණෙහි, කණෑ ( පැළඳි ) මහරි මල් වලකන ඝන-දිය ධාරා බැඳී සිටී. ( කෙස ) බන්ධනය ලිහිල් වන කලැ කෙස් කලඹ ද එක් අතෙකින් වලකන ලද්දි අවුල් විය.

**පහදුම**- කළය එසවීම නිසා එහි බරින් ශකුනතලාවන් ගේ බාහු ඇදී අලු ලේ වන් වැ තිබේ. වෙහෙසින් ඇති වූ ශ්වාසය මහ මහා පියොවුරු උස් පහත් කරයි. නළලින් ගලන ඝනදිය කම්මුල් මතැ බේරේ. එය කනැ පැලැඳි-කම්මුල තෙක් එල්බෙන මහරි මලින් වැලැක් වූ සේ යැ. එ හෙයින් ඝනදිය කල්මුල්හි මැ රැඳි සිටී. බැඳුම ලිහිල් වීමෙන් කෙස් වැටිය බුරැල් වැ ගොස්යැ. එක් අතෙකින් එය සැදීමට ගොස් එසත් අවුල්විණි.

**සටහන්**- **ඡනා හසනයමිනා**- එක් අතෙකැ කළය ඇති හෙයිනි අතෙකින් වරළ සැදීමට වූයේ. වෙසෙසින් තරුණන් අබියසැ කරමුල දක්වීම සත්‍රීන් ගේ සිරිති. ඔවුහු එසට කෙස් වැටිය සැදීම උපයෝගී කෙරෙති. නිසර සන්දෙශ කාරයෝ ද කිහ.

" දුටු දුටු දනා වන ලෙස පාසේ අටිය
කර මූල පපා පිරිමදිනේ'වි කෙස් වැටිය "

කුමාරදාසයෝ ද එයඅන් ලෙසකින් කිහ. "දූරසර්ථ පුෂ්පසනාබකා'වනඞගව්‍යාජෙන සන්දර්ශිත බාහුමූලා "

**රාඥඃ පරිග්‍රහො'යමිති රජපුරුෂං මාමවගමජථ**- මෙතෙක් තමන් හා සම්භාෂණයෙහි යෙදී සිටිත අමුත්තා රජු යැ යි ඒ තවුස් දූරියෝ නො දන්නාහු යැ. මුදුවෙහි නම'කුරු දුටු විටැ නිසැකයෙන් රජු බව දූනැ විසමයට පත් වැ එකිනෙකා මුහුණ බලති. ඔවුන් ගේ විසමයා'නුකූල හැසිරීම දත් රජු තමා අන් ලෙසකින් හැඳින්වීමට සිතා, " මා රජු යැ යි සිතීම සුදුසු නැ; මුද්ද මට රජු ගෙන් ලැබුණු ත්‍යාගයක්;

මම රජ පුරුෂයෙක්මි " යි ඔවුනට කී සේ යැ. " පරිග්‍රහඃ පරිජනෙ පත්න්‍යාං ස්වීකාර මූලයොඃ " යනු විශ්වකොෂා ගත හෙයින් බිරියක සේ පිළිගැනීමට පළමුව මැ දෙන " මංගල මුද්‍රුව " ( ශිවිසුම් ත්‍යාගය ) යනු ද " පරිග්‍රහ " යන්නෙන් කිය වෙයි.

30. අන්වය- යදි අපි [ ඉයං ] මද්වාචොභිඃ වාචං න මිශ්‍රයති. මයි භාෂමාණෙ කර්ණං අභිමුඛං දදති. මද් ආනන-සම්මුඛිනා න තිෂ්ඨති. කාමම්, අස්‍යාඃ දෘෂ්ටිඃ තු භූයිෂ්ඨං අන්‍ය-විෂයා න වර්තතෙ. ( වසන්තතිලකා )

අර්ථ- ඉදින් වනාහි ( මෝ ) ම-වදන් හා ( ඈ-ගේ ) වදන් මුසු නො කෙරෙයි. මා කථා කරන විටැ කන් යොමා සිටී. මගේ මුහුණට මුහුණ ලා නො සිටී යනු සැබැවි. ඈ-ගේ බැලුම ද බෙහෙවින් අන් අතක නො වැටෙයි.

පහදුම- මෙ තෙක් වේලා රජු ශකුන්තලාවන් ගේ පොරතුරු විමසී යැ. ඈ-ගේ යෙහෙළියෝ පිළිතුරු සැපයූහ. මේ අතැරැ ඈ වචන මාත්‍රයකුදු රජු හා නො දෙඩුවා යැ. ඔහු කථා කරන විටැ නම් ඉතා ඕනැ කමින් කන් දුන් නමුත් ඔහු ගේ මුහුණ කෙළින් නො බැලුවා යැ. එ සේ ද වුවත් නිතර මැ වාගේ ඔහු දෙස බලමින් සිටියා යැ. මේ කරුණු ගැනැ සලකන රජු ගේ සිත සැකයෙන් වෙලී තිබේ. 'තමා කී දෑයට ඇහුම්කන් දීම, තමා දෙස බැලීම, ආදිය ඔහු දිරි ගන්වයි. ඔහු හා නො දෙඩීම ද, කෙළින් මූණ දෙස නො බැලීම ද උද්වේග දනවයි.

සටහන්- අන්‍යවිෂයා න වර්තතෙ- නායිකාව ගේ විලාස ලක්ෂණ මෙයින් පාහැදිලි වේ. මේ හැම දෙයකින් මැ අනුරාගය සූචිත යැ. වක් වූ නෙතින් බැලුම; ප්‍රියයා ගේ වදන් ශ්‍රවණයෙහි කැමැත්ත; අන් දෙයක් බලන ව්‍යාජයෙන් ඔහු දෙස බැලීම ද, එහි විලාස ලක්ෂණ යි.
කියේ මැ නු මදනෝදයෙහි-

" විකාරෙ නෙත්‍රවක්‍රත්ව තද්වාක්‍යශ්‍රවණාදරඃ
අන්‍යව්‍යාජෙන තද්වීක්ෂා අනුරාගො'ඞගිතං භවෙත් "

31. **අන්වය-** යථා හි තුරගඛුරහතඃ පරණතා'රුණ- ප්‍රකාශඃ රේණුඃ ශලභ සමූහ ඉව විටපවිශකතජලාර්ද්‍රවල්කලේෂු ආශ්‍රමද්‍රුමේෂු පතති. (පුෂ්පිතාග්‍රා)

**අර්ථ-** ඒ එසේ මැ යි, අසුන් ගේ කුර ගැටුමෙන් නැගුණු මේරූ අරුණ'ලු බඳු රජස්, පලගැටි සමූහයක් මෙන් රුක් විටපයන්හි වැතුනු තෙත් වැහැරි ඇති අරමෙහි වූ ගස් වලැ වැටේ.

**පහදුව-** රජු සමග මුව දඩ පැමිණි රාජපුරුෂයෝ රජු සොයා පැමිණෙති. රිය ඇදූ අසුන් ගේ දිවෙන කුර ගැටුමෙන් දූවිලි අහසට නගි, ඒ දූවිලි මේරූ අරුණ'ලු බඳු යැ. මේරූ අරුණ'ලු නම් සැඳෑ හිරු රැස් යැ. සැඳෑ හිරු රැස් රත් වන් යැ. තවුස් බිමැ පස ද රතු යැ. ඒවා පලගැටි රැසක් මෙන් සුළඟින් ඉහළ නගී. තවුස් අරමේ අතුවලැ, සේදූ වැහැරි වනා තිබේ. ඒවා ද තිලිටි කෙරෙමින් දූවිලි ගස් මතැ වැටේ.

32. **අන්වය-** තීව්‍රා'ඝාතප්‍රතිහතතරුස්කන්ධලග්නෛ'ක දන්තඃ පාද'කෘෂ්ටව්‍රතති වලයා'සඞ්ග සඤ්ජාතපාශඃ, භින්න සාරඞ්ග යූථඃ නඃ තපසඃ මූර්තඃ විඝ්නඃ ඉව ත්‍යන්දනා'ලෝක- භීතඃ ගජඃ ධර්මා'රණ්‍යං ප්‍රවිශති. (මන්දාක්‍රාන්තා)

**අර්ථ-** දරුණු සේ පහර දීමෙන් ඇද හැලුණු රුක් කඳෙහි ලැගුණු දළයක් ඇති, පයින් අදනා ලද වැල් සමූහය මැ හැකිලි කළ, විසුරුවන ලද සිව්පා කැලන් ඇති, අප ගේ තපසට මූර්තිමත් උවදුරක් වන් ඇතා රිය දැක්මෙන් බිය වැ තපෝ වනයට පිවිසෙයි.

**පහදුව-** ඇතෙක් රිය දැකීමෙන් නැති ගත්තේ යැ. ඌ පැනැ යාමට සිතා හැරුනං පමණී. හැරීමේ වේගය කොතරම් වී ද? පසෙකැ වූ ගසෙකැ ඌ-ගේ දළයක් ඇමිණිණි. එය මුද ගනු වස් ගසට වැරයේ පහර දුනි. ගස ඉදිරි වැටුණේ යැ. ඇමිණි දළය ද ඉදිරුණු ගස සමග යැ. ඈත් රජ. දිවෙති; දිවෙති. වැල්-තාල් පාවල පැටලි හැකිළි

මෙන් දිස් වේ. ඇතුට බියෙන් වන සිවිපාවෝ ද තිස් ලූ ලූ අත දිවෙති. එයින් තවුස් වනය කැලැඹිණි. තවුසෝ ද බියෙන් කැලඹී යෙති. එහෙයිනි මේ අලිකුලප්පුව තවුස් වනයට මූර්තිමත් උවදුරක් වූයේ.

**සටහන්- ස්කන්ධලග්නෛකදන්තඃ-** ස්කන්ධ-ගස් කඳ; ශරීරය යන දෙ අරුත මැ පතා සිටී. ශරීරය යන අරුත ගත හොත් හැරෙන විට දළය උගේ මැ සිරුරේ ඇමිණී ගිය සේ යැ. වම් පසට හැරීමට අසීරු හෙයින් ඇතා දකුණු පසට මැ හැරුණේ යැ. දකුණු දළය මැ බිඳුණු සේ යැ. **පාලකාප්‍යයෙහි** කියේ මැ යි. " දක්ෂිණෙ වලිතුං ශක්තො ගජො වාමෙ ප්‍රයත්නතඃ " යි

33. **අන්වය-** ශරීරං පුරඃ ගච්ඡති. අසංස්ථිතං චෙතඃ ප්‍රතිවාතං නීයමානස්‍ය කෙතොඃ චීනාංශුකං ඉව පශ්චාත් ධාවති. (ආර්‍යා)

**අර්ථ-** සිරුර ඉදිරියෙහි යෙයි. චපල සිත යටි සුළඟට ගෙනයනු ලබන කොඩියේ පට රෙද්ද මෙන් පස්සෙන් දිවේ.

**පහදුව-** ශකුන්තලා ගෙන් වෙන් වැ යාම රජු ගේ සිතට කනස්සල්ලෙකි. එහෙන් මේ ඇත් උවදුර නිසා යෙහෙළියන් හා ඇය පිටත් වැ ගියා යැ. රජුට ද එහි සිටි මෙන් පලෙක් නැති. එ හෙයින් හේ එ තැනින් පිටත් වෙයි. ඉදිරියට යන්නේ රජු ගේ සිරුර පමණි. සිත පස්සට ඇදෙයි. ඒ සැබැවින් යටි සුළඟෙහි ගෙන යන පට කොඩියක් මෙනි කොඩිය බැඳි දඬ ඉදිරියෙහි වේ. ඉරිදියෙන් සුළඟ හමයි. පට් රෙද්ද-කොඩිය පසු පසට ඇදේ. පට රෙද්ද සුළඟින් නො යනුයේ දඬෙහි බැඳි හෙයිනි. සිත ද ශකුන්තලා හා නො යෙයි. ඒ රජු ගේ සිරුරට සබඳ හෙයිනි.

**සටහන්- චීනාංශුක-** පෙරළ සිට චීනය පට පිළිවලට ප්‍රසිද්ධ යැ. පට පිළි තනන්නේ චීනයේ යැ. එහෙයින් චීනාංශුක යනු පට රෙද්දට නමෙකි,

# දෙ වන රඞ්ගය

**සටහන්-** **විදූෂකා-** අවයව විරූප කිරීමෙන් හා විරූප වෙශයෙන් හා විහිළු බස් තෙපලීමෙන් රඞ්ගය සිනා ගන්වන්නා. "විකෘතාඞ්ග වචෝ වේශෛඃ හාස්‍යකාරී විදූෂකඃ" (සුධාකරය) සිංහල නළුවෙහි ද බම්මන්නා, කවටයා යන නම් වලින් මොහු හැඳින් වේ. භරත නාට්‍ය ශාස්ත්‍ර නියමය පරිදි විදූෂක ප්‍රාකෘත කථා කළ යුතු යැ.

**ගිම්හවිරලච්ඡාආසු-** ග්‍රීෂ්ම ඍතුවෙහි කොළ හැලීමෙන් ගස් ඉදල් බවට පැමිණේ. එහෙයින් මැ රුක් සෙවන විරල වෙයි.

**පතත සංකර කසාඉං ගිරිණඊ ජලාඉං-** ග්‍රීෂ්මයේ ඇළ-දොළ සිඳී ගොස් නැතීන් තැනැ මඳ මඳ වැ දිය රඳා සිටී. එ-ද ඉදී ඇද-හැලුණු කොළ, පල්වීමෙන් හා දිවා කලැ සැඩ හිරු රැසින් කැකෑරී කසට රසයෙන් යුතු යැ. වනයෙහි සරණුවන් බෙහෙවින් පිව යුතු වැ ඇත්තේ මේ දිය යැ.

**තුරගාණුධාවණ-** 1 රජු ගේ අසුන් අනුවැ පසිත් ලුහුබැඳිම (2) රජු ගේ අසු අනුවැ අශ්වාරොහක වැ ලුහු බැඳීම (3) අශ්වාරොහක වැ වනයේ සතුන් ලුහු බැඳීම. මේ තුන් අරුතින්, අශ්වාරොහක වැ වනයේ සතුන් ලුහු බැඳීම යනු වඩා උචිත යැ.

**ගංඩසොවරි පිංඩො-** ගෙඩියක් මතැ බිබිලක් නැගීමෙන් වේදනා දියුණු වෙයි. දඩයම නිසා වෙහෙසට පත් වැ සිටි විදූෂකට, රජුට ශකුන්තලාවන් හමු වීම නිසා තවත් වනයෙහි පමා වීමට කරුණු සැලසෙන බැව් හැඟුණි. ඒ ඇති කරදර වලට අමුතුවෙන් එක් වෙන ගැහැටෙකි. වනයේ පීඩා විඳිමින් තව ද පමා වීමට හේතුවෙකි සිංහලයේ ද මෙ බඳු අවස්ථා සලකා-අලි මදිවාට හරක්, ඇ පිරුළු වහරවති.

**පරිකම්මං-** දවසේ සිරිත් ලෙස කැරෙන මුව දෙවීම, ස්නානය; දිනයට ඔබින ඇඳුම් පැලඳුම් ආදීන් සැරසීම පරිකම් නමින් ගැනේ.

**යවනී-** දඹයම් පිරිස්හී දූනු ගී රැගෙනැ මහ පෙන්වන් නන් සේ හැසිරෙන මනවාරී ම්ලේච්ඡ මිනිස් වර්ගයක් 'යවන' නමින් ගැනෙති සි ඇතැමකු ගේ මතයෙකි. හමුත් එය අනාර්ථ වන්නේ මෙහි මැ සවන රඞගයෙහි රජු ගේ දුනු හී හාර මැ සිටියේ යවනියක් විසිනි සි සඳහන් නිසා යැ. මේ පිළිබඳ මැ සැකෙවින් කළ හැකි නිගමනයෙක් වෙයි. යවන වනිතාවෝ රජු ගේ අඞගාරක්ෂකයන් සේ සිටියා ශු යුඳ කාලිදාසයන් ජීවත් මැ සිටි අවධියෙහි ද එය එසේ මැ සිය නැති. ග්‍රීක් හෝ ප්‍රසියානු කතුන් යවන නමින් සලකති. ඔවුහු ඉතා රූමත් හ. ආරෝහ පරිණාහයෙන් ද යුක්තය හ. සත්‍රීන් රජුන් ගේ අඞගාරක්ෂකයන් සේ බුඞ කාලයෙහි පවා යොද සිටි බව අජාසත් රජු බුදුන් හමුවට පැමිණි වූ කතා පුවතින් ද පැහැදිලි යැ.

**මාතෘ ගුප්තාචාර්යයෝ ද** යවනී යන්න මෙ සේ පහදති "ගෘඪ කක්ෂා විචාරිණ්‍යස්තතො පවන සංවරාඃ, යාමෙෂු ච නියුක්තානාං යාම ශුද්ධි විශාරදඃ. සංචරිකාස්තු තා ඥෙයා යවනෙ‍්‍යාපි මතාඃ ක්වචිත්" රජු ගේ අන්තඃ පුර රැකීම, උද්‍යාන මුර කිරිම, වෙසෙසින් මුරකාවල්හි සෙදීම, රජු සමග හැසිරීම ආදී ආරක්ෂක කාර්යයන්හි යෙදෙන්නියෝ යවනියෝ යැ.

1. **අන්වය-** ප්‍රියා න සුලභා [ ඉති ] කාමම්. මනස්තු තද් භාව දශීනශ්වාසී. මනසිජේ අකෘතා'ථේ'පි උභය ප්‍රාර්ථනා රතිං කුරුතෙ. (ආර්‍යා)

**අර්ථය-** ප්‍රියාව සුව සේ නො ලැබිය හැකි යනු සැබෑ වෙකි. (ම ගේ) සිත ද ඈ ගේ භාව-භාව දශීනයෙන් සැනසේ. ප්‍රේමය නො ලැබූ ඵල ඇතිවත් අන්‍යෝ'න්‍ය ප්‍රාර්ථනය ආලය වඩවයි.

**පහදුව-** ශකුන්තලාව පහසුවෙන් නො ලද හැකි ය යනු රජු ගේ අදහස සි. දූන් ඈ-ගේ පිය තවුසා ද අසපුවේ නැති. සිටියත් ඔහු ඇය තමාට පාවාදීමට කැමැති වෙත් දැයි කෙසේ සිතිය හැකි ද ? සුව සේ නො ලැබි යැ හැකි ය යන නිශ්චයට හේතුව එය යි. කෙ සේ වේතත් ඈ ගේ ඉඟි-

බිඟි දැකීම නිසා ඔහු ගේ සිතට සැනසීමෙක් ද වෙයි. ඔහු ඇයට ප්‍රේම කරන්නාක් මෙන් ඇයත් ඔහුට ප්‍රේම කරන්නී නම් දුන් එය ඵලවත් නුවූවත් ඔහු එයින් ඵල නෙළිය නො හැකි නො වේ යැ යි හේ අදහස් කරයි.

**සටහන්-** **මනුසිජ-** මනසි - සිතෙහි, ජාතං-උපන්. සිතැ උපදනා හෙයින් ආලය-කාමය මිනසිජ නමි.

2. **අන්වය-** අන්‍යතොʻපි නයනෙ ප්‍රේරයන්ත්‍යා තයා යත් ස්නිග්ධං ඊක්ෂිතම්, නිතම්බයොඃ ගුරුතයා විලාසාද් ඉව යද් ච මන්දං යාතම්. මා ගාඃ ඉති උපරුද්ධයා සා සඛී යද් අපි සාසූයා උක්තා; තත් සර්වං මත් පරායණං කිල, අහො ! කාමී ස්වතාං පශ්‍යති. (ශාර්දූලවික්‍රීඩිත)

**අර්ථ-** වෙනතක පවා ඇස් යවන්නා වූ ඇ විසින් යමක් සෙනෙහසින් සුහුවැ බැලී ද, නිතඹ ගුරු බැවින් කොමළ කරන්නාක් මෙන් සෙමින් ගියා ද, "නො යවයි" වලක් වන ලද ඒ යෙහෙළිය යමක් කෝප සහිත වැ කීවා ද, ඒ සියල්ල සැබැවින් මා සඳහා මැ යැ. අහෝ! කාමී තෙමේ (හැම තැනැ මැ මේ සියල්ල) තමා අයත් යැයි දකී.

**පහදුව-** ශකුන්තලා තමා ඉදිරියෙහි හැසුරුණු විලාශය ඇය ඕනෑ කමින් මැ ඔහු සඳහා මැ කළ ප්‍රේම-විලසිතාවන් සේ රජු සලකයි. අන් දෙයක් දෙස පවා බැලූ ඇගේ දයාබර බැල්ම නිතඹබර නිසා මැ වූ විලම්බිත ගමන, ගමන් වැලැක්වූ යෙහෙළියනට කෝපයෙන් කී වදන් සියල්ල මැ තමා සඳහා කළ කි දේ ලෙසින් රජු සලකයි. පෙම්වතා පෙම්වතිය ගේ හැම ඉරියවුවක් මැ තමා උදෙසා වෙති යි සිතයි. ඒ තමා කාමීන් ගේ මූළාව.

**සටහන්-** **විලාස-** "යො වලලභාසන්න ගතො විකාරො ගත්‍යාසනස්ථාන විලොකනාදෞ" පෙම්වනා හමුවෙහි බැලීම්, සිපීම්, ගමන් ආදියෙහි වෙනස් වැ කෙරෙන ඉරියව්ව.

**ස්නිග්ධ දෘෂ්ටි-** බැම නැටවීම, සෙනෙහෙබරවැ කටාක්ෂ නිරීක්ෂණය ආදිය ස්නිග්ධ දෘෂ්ටි යැ යි කි හු. "විකාසි

ස්නිග්ධා මධුරා චතුරෙ තිහුතී ප්‍රවෙශ-කටාක්ෂිණී සානිලාශා
දෘෂ්ටිඃ ස්නිග්ධා'භිධීයතෙ''

**වඅස්ස-** "විදූෂකෙන වක්තවෙ‍්‍යා වයස්‍යෙති ච භූපතිඃ" නාට්‍යයේ දී විදූෂක, රජු අමතන්නේ වයස්‍ය යනුවෙනි.

**වාඅාමෙත්තඑණ-** අත ඔසොවා රජුට ජය පැතීම සිරිත වේ. එය ද විදූෂකට නො කළ හැකි බව හැඟ වූ සැටි යැ.

**ශුදෙකිල... පුවෙජසි-** නමා තිසා මැ කෙනකු උවදුරට පත් වූ කලැ ඔහු ම එයට හේතු විමසීම කෙබඳු ද යනු මෙයින් ගහවයි.

**බුජ්ජලීලං-**කෙකටිය ස්වභාවයෙන් මැ වක් යැ. වේවැල සෘජු යැ, ජල වේගයට අසුවූ කලැ වේවැල කෙකටිය මෙන් වක් හැඩය ගනී. විදූෂකට ද රජු නිසා ඈහි වී තිබෙන්නේ මෙ බන්දෙකි රජු හා වනයේ දඩයම් කිරීම නිසා සිරුර කෙළින් සිටුවන්නට බැරි තරම් වෙහෙසට පත් වැ සිටි නිසා යැ. මෙහි කුදකු ගේ විලාශය යන අරුත ද පතා සිටී.

**ඝවාපද-** ව්‍යාඝ්‍රාදී වනචර සතුන් මෙ නමින් ගැනේ.

3. **අන්වය-** ඉදං අධිජ්‍යං ආහිත සායකං ධනුං මෘගෙෂු නමයිතුං න ශක්තඃ අස්මි. යෛඃ සහවසතිං උපෙත්‍ය ප්‍රියායාඃ මුග්ධවිලොකිතො'පදෙශඃ කෘතඃ ඉව. (පුෂ්පිතාග්‍රා)

**අර්ථ-** මේ නැඟුණු දුනු දිය ද යෙදුණු හිය ද ඇති දුන්න මුවන් වෙත ලක් කිරීමට නො හැක්කෙමි. යම් බඳු මුවන් විසින් සහවාසයට පැමිණැ ප්‍රියාව ගේ බොළඳ බැලුම් පිළිබඳ උවදෙස් අනුකරනය කරන්නාක් වැනි හෙයිනි.

**අරණ්ණෙ මඵ රුදිඅං ආසි-** කිසිවකු ගෙන් පිහිටක් යැදූ ඒ නො ලැබුණු කලැ "වනයේ හැඬුවාක් මෙනි" යන මේ පිරුළ හෙළ වහරෙහිදු යෙදේ. "දිනයක් හෝ විවේක වැ

සිටින්නෑ ” යි විදූෂක රජු යැද්දේ යෑ. එසට එ කෙනෙහි මෑ ඔහු ගෙන් පිළිතුරක් නො ලැබිණි. තමා ගේ ඉල්ලීම නිෂ්ඵල වියෑ යි හේ හැඟවූයේ මෙ සේ යෑ.

**භට්ටා–** “භට්ටෙති වාධමෙ” පහත් සේවකයන් රජු අමතන්නේ ‘ භට්ටා ’ යනුවෙනි.

**දෙව–** ‘දෙවඃ ස්වාමිනි නෘපති භෘත්‍යෛඃ’– උසස් රාජ සේවකයෝ දෙවයෙනි, සවාමීනි යනුවෙන් නාට්‍යයෙහි දී රජු අමතති.

4. **අන්වය–** අනවරත ධනුර්ජ්‍යාඃ ස්ඵාලනක්‍රූර පූර්වං; රවි කිරණ සහිෂ්ණුඃ ස්වේදලෙශෛඃ අභින්නම්; අපචිතං ගාත්‍රං අපි ව්‍යායතත්වාත් අලක්ෂ්‍යං; ගිරිචර නාගඃ ඉව ප්‍රාණසාරං බිභර්ති. ( මාලිනී )

**අර්ථ–** නිරතුරු දුනු දිය පෙළීමෙන් රළු වූ පෙරකය ඇති නොහොත් නිරතුරු පියල් රුක්හි හා බිමෑ ඇනීමෙන් රළු වූ පෙරකය ඇති; ඉරු රැස් සහන; සුළු විඩාවකුදු නො සලකන කෙට්ටු වූ සිරුරු ඇති නමුදු ව්‍යායාමය නිසා (පූර්ණ වෑ වැඩුණු මස් ගොබ ඇති හෙයින් ) නො පෙනෙන; පර්වතයෙකෑ හැසිරෙන ඇතකු මෙන් ( මොහු ) ජීව බලය දරයි.

**විස්තර–** රජු පර්වතචාරී ඇතකු මෙන් ජීව බලය දරයි. පර්වතචාරී ඇතා වප්‍රක්‍රීඩා කරයි, හිස බිමෑ උලයි, පියල් ගස්හි උලයි, මෙයින් උගේ පෙර කය ( හිස හා නළල ) රළු වෙයි. රජු ද සතුන් විදූ මරණු පිණිස දුනු දිය අදියි. එයින් ඔහු ගේ පෙර කය ( පපුව ) රළු වෙයි. වප්‍ර ක්‍රීඩා කරන ඇතා ද අව්ව හෝ විඩාව හෝ නො සලකයි. දඩයමෙහි යෙදුණු රජු ද ඒවා නො සලකයි. විඩාව නිසාත් ආහාරයෙන් වැලකීම නිසාත් ඇතා කෘශ වෙයි. එහෙත් ව්‍යායාමයෙන් ශක්තිය දියුණු වෙයි. රජු ද විඩාවෙන් හා ආහාර විහරණාදියෙහි විෂමතාවය නිසා කෘශ වී සිටිනත් ව්‍යායාමය නිසා පූර්ණ වෑ වැඩුණු මස් ගොබ ඇති හෙයින් කෘශ බව පැහැදිලි නො කරයි.

**සටහන්-** ධනුර්ජ්‍යාඃ- ධනුෂ්- ( රජු- දුන්න )- (ඇත්- ප්‍රියාලගස්) ජ්‍යා- (රජු- දුනුදිය)-(ඇත්- හිම )

**ආස්ඵලන-** ( රජු- පෙලීම )- ( ඇත්- ඇනීම, ඉලීම )

**ප්‍රූෂ්ං-** ( රජු- මණිබන්ධනය හෝ පපුව )- ( ඇත්- හිස හා තළල )

5. **අන්වය-** වපුඃ මෙදශ්ඡෙද කෘශොදරං ලඝුඃ, උත්ථාන යොග්‍යං භවති., සත්වානාම් අපි භය ක්‍රොධයොඃ විකෘතිමත් චිත්තං ලක්‍ෂ්‍යතෙ, යද් ඉෂවඃ චලෙ ලක්‍ෂ්‍යෙ සිධ්‍යන්ති සච ධන්විනාම් උත්කර්ෂඃ, මෘගයාම් මිථ්‍යෛව ව්‍යසනං වදන්ති, ඊදෘක් විනොදඃ කුතඃ ( ශාර්දූල වික්‍රීඩිත )

**අර්-** සිරුරේ මේදස් සිඳීමෙන් කෘශ වූ උදරය සැහැල්ලු යැ, ( එ හෙයින් ) උද්‍යෝගයට සුදුසු වෙයි. සතුන් ගේ ද භය ක්‍රොධයන් ගෙන් විකෘත වූ සිත පෙනේ, යම් හෙයකින් හි සැලෙන ඉලක්කයෙහි පිවිසියේ නම් එ ද දුනුවායා ගේ සමත් බව ( දක්වයි ), දඩයම බොරුවට මෙ සේ ව්‍යසනයෙකැ යි කියත්, මෙ බඳු විනොදයෙක් කො ද?

**සටහන්-** **ඝ්‍රාණාසි ආලොලුපස්ස-** "හල්ලුකා මනුෂ්‍යාණාං නාසිකා ගෘහ්ණන්ති" ( දශකුමාර චරිත ) වලස්සු මිනිස් නැහැය කඩා ගනිති. එය උනට ප්‍රිය බැවිනි. මෙ රටැ නම් වඩා ප්‍රකට වලසුන් මිනිස් ඇසට ප්‍රිය යැ කියා යි.

6. **අන්වය-** මහිෂාඃ ශෘඞ්ගෛඃ මුහුස්තාඩිතං නිපාන සලිලං ගාහන්තාම්, මෘගකුලං ඡායා බද්ධ කදම්බකං රොමන්ථම් අභ්‍යස්‍යතු. වරාහ තතිභිඃ පල්වලෙ මුස්තාක්‍ෂතිඃ විශ්‍රබ්ධං ක්‍රියතාම්. ඉදං ච අස්මත් ධනුඃ ශිථිලජ්‍යාබන්ධම් විශ්‍රාමං ලභතාම් ( ශාර්දූල වික්‍රීඩිත )

**අර්-** මීයුවෝ අංවලින් මොහොතක් පැහැරි නිපාන ජලය කළඹත්වා. මුව කැල සෙවනෙහි බැඳී වග වැ රොමන්ථය පුහුණු කෙරෙත්වා.. හූරු මුළු විල්හි වම්මුතු ඉදිරීම ශංකා රහිත වැ කරත්වා, මේ අපේ දුන්න ද ලිහිල් වූ දිය බැඳිම් ඇත්තේ ඉසුඹු ලබාවා,

**සටහන්**- නිපාන- 'තිශතං පිබන්ති අස්මින්' නිතර සතුන් හට දිය බීමට පහසු වන සේ වැව්, ගංගා හෝ වෙනත් ජලාශයන් හෝ ඇසුරු කොටැ තැනූ දිය කඩිනි.

7. **අන්වය**- ශම ප්‍රධානෙෂු තපොධනෙෂු දහාත්මකං තෙජඃ ගූඪම් අස්ති හි. ස්පර්ශානුකූලාඃ සූර්යකාන්තා ඉව අන්‍ය තෙජොභිභවාත් තත් වමන්ති. ( උපජාති )

**අර්ථ**- ශමය පදන් කොටැ ඇති තවුසන් කෙරෙහි දවෙන සුළු තෙජසක් සැඟ වී ඇත් මැ යි. ස්පර්ශානුකූල වූ සූර්යකාන්ත ( පාෂාණ ) මෙන් අන් තෙදෙකින් මැඩීමෙන් එය වමාරති.

**පහදුම**- සූර්යකාන්ත පාෂාණ ගිනි ගැබ්කොටැ ඇත්තේ යැ. එහෙන් පැනැසියැ හැකි. අන් තෙදෙකින් ( හිරු රැසින්) මැඩුණු කලැ ගිනි විහිදවයි. එ විටැ ස්පර්ශ වූ දෑ දවෙයි. එ මෙන් තවුසෝ ද ශමය පදන් කොටැ ඇති හෙයින් ඇසුරු කිරීමට බෙහෙවින් සුදුසු යැ. එහෙත් සූර්යකාන්ත පාෂාණ මෙන් තපො බලය ගැබ් කොටැ ඇත්තෝ යැ. ඔවුන් ද අන් බලයෙකින් මැඩි නම් තපො බලය විහිදෙයි. අන් තෙදකින් මැඩීම නම් ඔවුනට රිදවීම යි. රිදවුණු කලැ සැඟවුණු තපො බලය ( ශාපය ) නිසා රිදවූවෝ දැවෙති.

**සටහන්**- **සර්වඃ කාන්තං ආත්මීයං පශ්‍යති**- හැමෝ මැ තමා ගේ දෙය මනහර සේ සැලැකීම ලෝ දහම යි. "උණහපුළු දෙන ට ඇගේ පැටියා මැණික ලු" යන හෙළ පිරුළ පහ දන්නේ ද මෙ මැ අරුත මැ යි. විදූෂක ද රජු එ බඳු කමනී-යත්වයෙකින් සැලැකූ සේ යැ.

8. **අන්වය**- තත් මුනෙඃ අපත්‍යං සුර යුවති සම්භවත්; උජ්ඣිතා'ධිගතම්, ශිථිලං අර්කස්‍ය උපරි ච්‍යුතං නවමාලිකා කුසුමං ඉව ( ආර්‍යා )

**අර්ථ**- ඒ තවුස් දුව දෙවඟනක ගෙන් උපන්නී ල, ඈ හරනා ලදින් ( කාශ්‍යපට ) හමුවී ල, ( සැබැවින් එය ) ගිලිහී වරා ගස මතැ වැටුණු නවමාලිකා මලක් මෙනි.

**සඟළුම්-** ශකුන්තලා නවමාලිකා කුසුමෙක්. ඇය ගේ මව-මෙනකාව නවමාලිකා වැලැකි. ශකුන්තලා මව විසින් අත්හරිනු ලැබුවා යැ. එය, නවමාලිකා කුසුම වැලෙන් ගිලිහීම බඳු යැ. කණ්ව තවුසා වරාගස වැනි යැ. කණ්වට ශකුන්තලා යමු විය. ඇය දුන් ඔහු ගේ රැකවරණ යෙහි යැ. එය නවමාලිකා කුසුම් වරා ගස මත වැටුනාක් මෙනි.

**සමහන්-** **තින්තිණීම් අභිලාෂො-** කොතරම් මිහිරි දෑ ආශ්වාදනය කළත් අමිහිරි දෑ ද ආශ්වාදනයෙහි ලොල් වීම ස්වාභාවික යැ. රජු ද ස්ත්‍රී රත්නයන් හා ගැටුණු කෙනෙකි. ඔහු ගේ ඇතොරළ ද ඉතා මැ රූ සපුවෙන් ගෙබි කාන්තාවෝ එමට වෙති. එහෙත් මේ තවුස් දූරිය දැකීමෙන් ඔහු ගේ ද පොදු රුචිය වැඩුණු සේ යැ.

9. **අන්වය-** විධිනා චිත්‍රෙ නිවෙශ්‍ය පරිකල්පිත සත්ව-යොගා (නු). මනසා රූපොච්චයෙන කෘතානු. ධාතුර්විභුත්වා-නස්‍යාඃ වපුශ්ච අනුචින්ත්‍ය (සජිතස්‍ය) මෙ සා අපරා ස්ත්‍රී රත්න සෘෂ්ටිඃ ප්‍රතිභාති (වසන්තතිලකා)

**අර්ථ-** බඹු විසින් (මැ පළමු වැ) සිතුවමෙකැ තබා (පසු වැ) ගැන් වූ සත්වයොග ඇත්තේ දෝ නොහොත් සිතින් රූ කැටි කිරීමෙන් කළා දෝ යි බඹු ගේ සමත්කම හා ඇගේ රුව ද (ගැන) සිතමින් (සිටිනා) මට ඇය අමුතු ස්ත්‍රී රත්නයක ගේ මැවීමක් යි වැටහෙයි.

**සමහන්-** **ස්ත්‍රීරත්න සෘෂ්ටිරපරා-** ශකුන්තලා අන් හැම ස්ත්‍රීනට මැ වඩා අමුතු හෝ වෙනස් මැවීමෙකි. අන් ස්ත්‍රීන් බඹු මවන්නේ එක්වරැ මැ යැ. එහෙත් පළමු වැ රුව ගඩා නිවැරැදි කොට පසු වැ පණ ගැන්වීමෙන් හෝ සිතින් සියලු විසිතුරු එක්කොටැ පසු වැ එයින් ශකුන්තලා මැවීමෙන් හෝ යන අමුතු විදියෙකිනි. 'අපරා' යන්නට 'අන්' යන අරුත ද දිය හැකි. එ සේ නම් 'මහාභාරතයෙහි' එන තිලොත්තමාව මෙයට පෙරැ මැවූ ස්ත්‍රී රත්නය යි. ඇගෙන් අන්‍ය වූ ස්ත්‍රීරත්නය නම් ශකුන්තලා යැ. තිලොත්තමා මැවූ

-යේ ද අමුතු ලෙසෙකිනි. "තිලං තිලං සමානීය රත්නානාං යද් විනිර්මිතා, තිලොත්තමෙති තත්තස්‍යා නාම චක්‍රෙ පිතාමහඃ" ලොවැ ඇති නාක් රත්නයන් ගෙන් අබ පමණ සුළු කොට ගෙනැ කාන්තාවක් මවා ඇයට තිලොත්තමා යි බඹු විසින් නම් කැරිණ.

10. **අන්වය–** අනඝං තත් රූපම් අනාඝ්‍රාතං පුෂ්පං, කරරුහෛඃ අලූනං කිසලයම්, අනාවිද්ධම් රත්නම්, අනාස්වාදිත රසං නවං මධු, පුණ්‍යානාම් අඛණ්ඩම් ඵලම්ව ච. විධිඃ ඉහ කං භොක්තාරං සමුපස්ථාස්‍යති (තත්) න ජානෙ. (ශිඛරිණී)

**අර්ථ–** නො කැළැල් ඒ රුව නො සිඹි මලෙකි, නියෙන් නො නෙළූ ලපලුවෙකි. නො සිදුරු කළ රුවනෙකි. නො විඳි රසැති නව මධුවෙකි, කුශලයන් ගේ නො සිඳි ඵලය මෙනි. බඹා මෙහි දී කෙබඳු විඳින්නකු පමුණුවා ද (යනු) නො දනිමි.

**සටහන්–** **අනාඝ්‍රාතං පුෂ්පං**– පුෂ්ප–ආමෝදන් බව. ශකුන්තලා–මනොඥ බව.

**අලූනං කිසලයං**– කිසල–අක්ලාන්ත බව. ශකුන්තලා–අපාප බව.

**අනාවිද්ධං රත්නං**– රත්න–නො කැලැල් බව. ශකුන්තලා–අකුටිල බව.

**අනාස්වාදිත රසං**– අලුත් බව.–නිර්මල බව.

**අඛණ්ඩං පුණ්‍යානාං ඵලම්**– සම්පූර්ණ පුණ්‍ය ඵලයෙකින් සත්ත්වයෝ දෙව් ලොවැ උපදිති. එහි දී විඳීම නිසා ඒ පුණ්‍ය ඵලය ක්‍රමයෙන් ගෙවී යයි. එ කලැ සත්ත්වයෝ පාපිවිය ඇතුරු කෙරෙති හෙවත් මිනිසත් බවට පැමිණෙති "තෙතං භුක්ත්වා ස්වර්ගලොකං විශාලං ක්ෂීණෙ පුණ්‍යෙ මර්ත්‍යලොකං විශන්ති" යන්නෙන් ඒ බව පහදයි. එය එ සේ වුවත්–ශකුන්තලා මිනිස් ඉතිරියක රුවින් සිටිය ද; ඇය එ බඳු ගෙවී පුණ්‍ය ඵලයෙකින් උපන්නියක නො වැ පූර්ණ පුණ්‍ය ඵලයෙකින් උපන්නියක.

**අන්තරෙණ-** "අන්තරං රන්ධ්‍රාවකාශයොඃ, මධ්‍යෙ විනාර්ථෙ තාදර්ථ්‍යෙ විශෙෂෙ'වසරෙ'වධෞ" (හෛම) කී හෙයින් මෙ තැනට සුතු අරුත 'මෙසෙයින්' යනු යි

**සවනානං-** සප්තම්‍යර්ථයෙහි ද්විතීයා.

**දිව්සිරබ-**කානනාවන් සිතැඟි පවසන ඉඟි අතර නෙත් බැලුම් මුල් තැන් ගනී. ස්ත්‍රියක ගේ කටාක්ෂ නිරීක්ෂණය ඇගේ ප්‍රේමය විදහා ලයි. විදූෂක 'දෘෂ්ටිරාගය' ගැන විමසූ වේ මෙසෙසින් මේ කරුණ නිසා යැ.

11. **අන්වය-** මයි අභිමුඛෙ ඊක්ෂිතං සංහෘතම්, අන්‍යනිමිත්ත කෘතොදයම් හසිතම්, අතො විනයවාරිතවෘත්තිඃ මදනඃ තයා න විවෘතඃ, න ච සංවෘතඃ (ද්‍රුතවිලම්බිත)

**අර්ථ-** මා (ඇයට) අභිමුඛ වූ කලැ හෙවත් මා ඇය දෙස බැලූ කලැ (ඇ-ගේ) බැල්ම (අන් අතක) යැවූ. අන් හේතුවක් නහා සුනු. එ හෙයින් හික්මීම (ලජ්ජාව) නිසා වැලැකි පැවතුම් ඇති ප්‍රේමය; ඇය හෙළි කෙළේත් නැති. සැඟවූයේත් නැති.

**පහදුව-** රජු ශකුන්තලාවන් දෙස බලන විටැ ඇය ගේ ඇස් ඔහු ගෙන් ඉවත් වෙයි. රජු ගේ ඇස් ඇගෙන් ඉවත් වෙත් මැ ඇය රජු දෙස බලයි. ඇ විටින් විටැ සිනාසෙයි. එහෙත් රජු සමග වූ ප්‍රේමයෙන් නො වන බැව් ගැහෙවෙන සේ හැසිරෙයි. මේ සියල්ල මෙ සේ වූයේ ලජ්ජාව නිසා හෝ තවුස් විනය නිසා ද්දේ යි රජුට කුකුසෙකි. කරුණු මෙ සේ හෙයින් ඇය තමාට ප්‍රේම කරත් ද නො කරත් දැ යි පැහැදිලි වැ නො කියැ හැකි

**සටහන්- හසිත-** මෙයින් අනුරාගය හඟවයි. හසිතය කෙ බඳු දැයි දක්වන මාතෘගුප්තාචාර්‍යයෝ;

"විකාසිත කපොලාන්තමුත්ඵුල්ලාමල ලොචනම්
කිඤ්චිල්ලක්ෂිත දන්තාග්‍රං හසිතං තද්විදො විදුඃ"

යි පහදති. මන්දස්මිතය 'හසිත' යන්නෙන් ගැනේ. ඒ උත්තම නායක-නායිකා ලක්ෂණයෙකි.

**මිථඃ ප්‍රයාණෙ-** සහ ප්‍රයාණෙ-ඡද, සඛීඃ තිස්‍රඃ සඛ්‍යඃ මිලිත්වා නිෂ්ක්‍රාන්තාඃ (මිථඃ-සහිතම්) යෙහෙළියන් තිදෙනා සමග පිටත් වැ යාමේ දී හෝ 'අන්‍යොන්‍යාපයාමෙ' අන්‍යො-න්‍යන් වෙන් වැ යාමේ දී.

12. **අන්වය-** තස්මිං කානිචිත් එව පදානි ගත්වා දර්භාඞ්කුරෙණ චරණඃ ක්ෂතඃ ඉති අකාණ්ඩෙ ස්ථිතා, ද්‍රැමාණාං ශාඛාසු අසක්තම් අපි වල්කලං විමොචයන්ති විවෘත වදනා ච ආසීත් (වසන්තතිලකා)

**අර්ථ-** (ඒ) තුනුවන ඝිහිපයක් මැ පියවර (ඉදිරියට) ගොස් කුශ දලුවක් පය ඇනිණැ යි අහෙතුක වැ (නැවතුනා) සිටියා යැ. ගස් අතුවලැ නො ගැටුණු මැ වැහැරිය මුදන්නී (මා දෙස) හැරුණු මුව ඇත්තී ද වූවා යැ.

**සටහන්-** ෂඩ්භාගං- "පඤ්චාශද් භාග ආදෙයො රාඥා පශු හිරණ්‍යයොඃ ධාන්‍යානමෂ්ටමොභාගඃ ෂෂ්ඨො ද්වාදශ එවවා" (මනු නීතිය) වැසියන් ගෙන් පසේ සාරත්වය අනුව නිපදවන අස්වැන්නෙන් සයෙන්, අටෙන් හෝ දොළොසින් එක් භාගය බැගින් රජුන් විසින් ගත යුතු.

13. **අන්වය-** නෘපාණාම් වර්ණෙභ්‍යඃ යත් ධනම් උත්ති-ෂ්ඨති තත් ක්ෂයි. ආරණ්‍යකාඃ හි අක්ෂය්‍යං තපඃ ෂඩ්භාගං නඃ දදන්ති. (අනුෂ්ටුප්)

**අර්ථ-** රජුනට වර්ණවත් ජනයන් ගෙන් යම් ධනයෙක් නැගේ ද එය නැසෙන සුළු යැ. වන වැස්සෝ වනාහි නො නැසෙන සුළු තපසින් සයෙන් කොටසක් අපට දෙති.

**සටහන්-** වර්ණෙභ්‍යඃ- ක්ෂත්‍රිය; බ්‍රාහ්මණ; වෛශ්‍ය යා ශූද්‍ර යන සිව් කුලයෙන්

**තපඃ-** ෂඩ්භාගම්- "ප්‍රජානං ධර්ම ෂඩ්භාගො රාඥො භවති රක්ෂිතුං අධර්මාදපි ෂඩ්භාගො ජායතෙ යො න රක්ෂති" රජු දැහැමින් වැසියන් රකින කලැ ඔවුන් කැරෙන පුණ්‍ය.

ඵලයෙන් සයෙන් කොටසක් රජුට අයත් වන බව ද; නො දැහැමි වැ රටුන් නො රකින කලැ ඔවුන් ගේ පවින් එතරම් මැ කොටසක් ඔහුට අයත් වන බව ද මිනු නීතිය වේ

14. **අන්වය-** අමූනා අපි සර්වභෝග්‍යේ ආශ්‍රමේ වසතිඃ අධ්‍යාක්‍රාන්තා. අයං අපි රක්ෂායෝගාත් ප්‍රත්‍යහං තපඃ සංචිනෝති. වශිනඃ අස්‍ය අපි කේවලං රාජ පූර්වඃ මුනිඃ ඉති පුණ්‍යඃ ශබ්දඃ චාරණ ද්වන්ද්ව ගීතඃ ද්‍යාං ස්පෘශති. (මන්දාක්‍රාන්තා)

**අර්ථ-** මොහු විසිතුදු සියලු භොග ඇති නොහොත් සියල්ලනට සාධාරණ අසපුවෙහි විසීමට පැමිණ සිටී. මේ තෙමේ ද ප්‍රජාරක්ෂණයෙහි යෙදීමෙන් නොහොත් අලු ආලෙප කිරීමෙන් දිනපතා තපස් රැස් කෙරෙයි. වශී වූ මොහුට ද හුදු රාජ යනු පෙරටු කළ මුනි යන පිවිතුරු ශබ්දය වන්දි යුගලයන් විසින් ගැයෙන්නේ සවගිය ද පුසියි.

**පහදුව-** තවුසා හැමට විරෝධයක් නැති වැ එළඹිය හැකි වානප්‍රස්ථ ආශ්‍රමයෙහි වෙසෙයි. රජු සියලු කම් සුවයෙන් හෙබි ගෘහාශ්‍රමයෙහි වෙසෙයි. රජු දිනපතා ප්‍රජා රක්ෂණයෙහි යෙදීමෙන් පින් රැස් කරයි. තවුසා දිනපතා අලු ආලෙප කිරීමෙන් පින් රැස් කරයි. තවුසා '**ඍෂි**' නමින් හඳුන්වනු ලැබේ. රජු '**රාජර්ෂි**' නමින් හැඳින් වේ. තවුසා ගේ '**ඍෂි**' නම දෙව්ලොව නගින්නේ නිශ්චල වැ යැ. රජු ගේ '**රාජර්ෂි**' නම එහි නගින්නේ වන්දීන් ගේ විසිතුරු ගුණ ගායනයන් සමග යැ. වෙනස මේ පමණෙකි.

**සටහන්- සර්වභොග්‍ය ආශ්‍රමෙ-** පස්කම් සුව රිසි හැම මැ සෙවුනේ ගෘහාශ්‍රමය යි. එය 'රාජ' ශබ්දය හා සබඳි. "යථා නදී නදඃ සර්වේ සාගරේ යාන්ති සංස්ථිතිම්, තථෛවාශ්‍රමිණඃ සර්වේ ගෘහස්ථේ යාන්ති සංස්ථිතිම්". යන්නෙන් එය පහදයි. සග සුව රිසි හැමට එළඹිය හැකි අසපුව වානප්‍රස්ථාශ්‍රම ය යි. එය 'මුනි' ශබ්දය හා බැඳේ.

**රක්ෂා යෝගාත්-** "ක්ෂත්‍රියස්‍ය පරෝ ධර්මඃ ප්‍රජානාමේව පාලනම්, නිර්දිෂ්ටඵල භෝක්තා හි රාජා ධර්මේණ යුජ්‍යතේ'සි

මනුස්මෘතිය කියන හෙයින් රජු ගේ ශ්‍රේෂ්ඨ ධර්මය ප්‍රජා පාලනය බවත් එයින් ඔහු පින් රැස් කර ගන්නා බවත් පැහැදිලි වේ. "රක්ෂායාඃහස්මතඃ යොගාත් ශරීරෙ ලෙපනාත්" හවිසා අලු ආලේපයෙන් සිරුර පවිත්‍ර කොට, හවුස් දම් රකින්නේ ලෝක රක්ෂණය පිණිස යැ. එය "මුනි" සඳ හා බැඳේ.

**යොග-** අෂ්ටාංග යොග; යම නියමාදි කෂ්ටව්‍රත.

**වාරණ-** "වාරයන්ති කීර්තිම්" රටින් රට ගොස් ඔවුනොවුන් ගේ කීර්තිය ගයනු ලබත්තෝ (වන්දිහු.)

**15 අන්වය-** යද් නගරපරිඝප්‍රාංශුබාහුඃ අයම් එකඃ උදධිශ්‍යාම සීමාං කෘත්ස්නාං ධරිත්‍රිං භුනක්ති, එතත් න චිත්‍රම්, හි දෛත්‍යෛඃ බද්ධවෛරාඃ සුරාඃ අස්‍ය අධිජ්‍යෙ ධනුෂි පෞරුහූතෙ වජ්‍රෙ ච සමිතිෂු විජයම් ආශංසන්තෙ (මන්දාක්‍රාන්තා)

**අපි-** යම් නුවර දොරගුලු මෙන් දික් බාහු ඇති මේ තෙමේ හුදකලාව සයුර නිසා සම්වත් වූ හිම් ඇති මුළු මිහිකත වළඳයි; එය ආශ්චර්යයෙක් නො වෙයි. ඒ එසේ මැයි. අසුරයන් හා බද්ධ වෛරී දෙවියෝ මොහු ගේ නැඟුණු දිය ඇති දුන්නෙහි ද; ඉන්ද්‍රයා ගේ විදුරවියෙහි ද ලා සටන්හි ජය අපේක්ෂා කෙරෙති.

**පහදුව-** දුෂ්‍යන්තයන් ගේ බාහු නගරද්වාරය වසාලන දොර පොලු මෙන් දීර්ඝ යැ. බාහු දීර්ඝත්වය මහාවීර ලකුණෙකි. ඔහු මුළු පොළොවට මැ අධිපති යැ. මුළු පොළොවට මැ අධිපති බවට නිසැක ලකුණ ඔහු පාලනය කරන පෘථිවියෙහි සීමා ශ්‍යාමවර්ණ වීමයි. සීමා ශ්‍යාමවර්ණ වූයේ එය සයුරෙන් වට වූ බැවිනි. පෘථිවියෙහි සීමා සයුර හිම් කොට ඇති හෙයින් මුළු පොළොවට අධිපතිය යනු නිසැකයෙන් තීරණය වෙයි එ සේ ඔහු ගේ පෘථිවි ස්වාමිත්වය පුදුමයෙක් නො වේ. මක් නිසා ද? අසුර රණබිමැ දෙවියනට

ජය ලබා දෙන්නේ දුෂ්‍යන්ත රජු ගේ දුන්නත් ඉන්ද්‍රයා ගේ විදුරම්යත් යැ. මෙ සේ දෙව්ලොව පවා විජය ශ්‍රී ලබන රජුට පෘථිවියෙහි අසහාය ස්වාමිත්වය සුළු කරුණෙකි.

**නගර පරිඝ ප්‍රාංශුබාහුඃ-** පෙරැ රජවරු "මැඩහනු දුන්න" නමින් හැඳින්වෙන දුනු වෙසෙසක් භාවිත කළ හ. එය දික් හා ශක්තිමත් බාහු ඇත්තකුට හැරැ අන් අයට භාවිත නො කළ හැකි විය. පෙරැ නගර ද්වාරය වැසීමට ගත්තේ දික් යකඩ පොලු වෙසෙසෙකි. දික් බවත් ශක්තිමත් බවත් නිදෙසියැ යුතු තැනැ එවැනි දොර පොලු (නගර පරිඝ) හා සමකිරීම කවීන් ගේ පුරුද්දෙකි.

**සමිතිඤ්ජ-** "සම් අයන්ති යාසු" මිනිසුන් එක්වෙන තැන. යුද බිම්හි වෙසෙසින් මිනිසුන් එක්වන හෙයින් දෙ මෙහි 'යුද බිම්හි' යන අරුත සඳහා "සමිතිෂු" යි යෙදිණ.

**ඵලාශි උපහරතඃ-** රජකු බැහැ දැකීමට යාමේ දි හිස් අතින් නො යාම සිරිතක් හෙයිනි පලතුරු ද රැගෙනැ රජු බැහැ දැකීමට ගියේ. මෙය ද සලකන්නැ.

"අග්නි හොත්‍ර ගෘහං ක්ෂේත්‍රං මිත්‍රං භාර්‍ය්‍යා සුතං ශිශුම්
රික්ත පාණිර් න පශ්‍යෙත රාජානං දෙවතා ගුරුම්"

16\. **අන්වය-** පුරේෂාම් අනුකාරිණී ත්වයි ඉදං යුක්ත රූපම් . පෞරවාඃ ආපන්නාභය සත්‍රෙෂු දීක්ෂිතාඃ බලු (අනුෂ්ටුප්)

**අර්ථ-** පුරාණයන් අනුවැ යන ඔබට මෙය සුදුසු යි. පෞරවයෝ පැමිණි බිය ඇති යාගයන්හි යාග ස්වාමිහු මැ යි.

**සටහන්-** **අනුපද ආගත එව-** "ආදිකර්මණි නිෂ්ඨා වක්තව්‍යා" කී හෙයින් සමීපාතාගතය පැවැසීම පිණිස අතීත කෘදන්තය යෙදුනු සේ යැ.

**පුත්‍ර පිණ්ඩ පාලනඃ-** "පුත්‍රස්‍ය පිණ්ඩඃ පාල්‍යතෙ අනෙන ඉති පුත්‍ර පිණ්ඩ පාලනඃ" වැ දරුවන් වෙනුවෙන් වෙදෙක්න පරිදි කැරෙන උපවාසය.

**ත්‍රිශංකු-** ත්‍රිශංකු සොලර් වංශික රජෙකි. පියෙවි සිරුරින් ම සවර්ගයට නැගීමට ආශා කළ හේ, ඒ පිණිස කළ යුතු යාගයට උපසම්භක වනු මැනැව යි වශිෂ්ට මුනිවරයාටත් ඔහු ගේ පුතුනටත් ආයාචනා කළ නමුත් ඔව්හු එය පිළිකෙව් කළහ. එයින් මනෝත්සාහි නො වූ ත්‍රිශංකු, විශ්වාමිත්‍ර මුනිදු ගේ අනුග්‍රහය ලැබ යාගය ඇරැඹී යැ. එහෙත් යාගයට යැදි දෙවියන් ද එයට නො පැමිණියෙන් එයින් වියරු වූ විශ්වාමිත්‍ර සිය තපොබලයෙන් ත්‍රිශංකු අහසට නැංවිය. දෙවියෝ ඔහු යළි පහලට තල්ලු කිරීමට යැතු හෙයින් රජු විශ්වාමිත්‍ර ගේ පිහිට ඉල්ලා හඬ නගන්නට විය. විශ්වාමිත්‍ර ඔහු අහසේ රඳවමින් සවර්ගයටත් මිනිස් ලොවටත් අතර අළුත් ලොකයක් මවා ත්‍රිශංකු එහි නැවැත්විය. ත්‍රිශංකුට අනතරාලයෙහි නවතින්නට සිදුවූයේ මෙ සේ යැ. දුෂ්‍යන්තයනට ද මේ බඳු තත්වයෙකි එළඹ සිටියේ. එහෙයින් විදූෂක මවු ගේ ආඥාවටත් තවුසන් ගේ ඇරයුමටත් අතර එකකට වත් සහය නො වී සිටින්නට යැයි මේ කී සැටි යැ.

17. **අන්වය-** කාර්‍යයොඃ භින්නදේශත්වාත් මෙ මනඃ පුරඃ ශෛලෙ ප්‍රතිහතං ස්‍රොතොවහඃ ස්‍රොතො යථා. ද්වෛධී- භවති (අනුෂ්ටුප්)

**අර්ථ-** කටයුතු දෙකක් කළ යුතු සථානයන් ගේ වෙනස නිසා ම ගේ සිත, ඉදිරියෙහි වූ ගලෙක හැපුණු ගංගාවක ගේ දිය දහර යම් සේ ද (එ සේ) දෙකට බෙදෙයි.

**පහදුම්-** දුෂ්‍යන්තයනට එක් වර ම දෙ තැනෙක කටයුතු දෙකෙකි. එකක් තවුස් කිසෙකි. අනික මවු ගේ අණෙකි. මේ දෙක ම එක තැනෙක නම් එය අමාරුවෙන් වුවත් ඉටු කළ හැකි. සථානයන් ගේ දුර බැහැරකම නිසා රජු විචාර මූඪ යැ. නදී ජලධාරාව ගලා අවුත් ගලෙක හැපුණු විටැ දෙපසට බෙදීයාම සවාභාවික යැ. රජු ගේ සිත ද එ මෙන් දෙකට බෙදී ගොස් යැ.

**සටහන්-** චමූඃ- තරුණයා, බ්‍රහ්මචාරියා, බ්‍රාහ්මණ තරුණයා යනාදි අරුත් දිය හැකි වුවත් 'එකා' හෝ 'අය යන අරුත් තැනට සුදුසු යැ.

18. **අන්වය-** වයං ඛලු, මෘග ශාවෛඃ සමම් එධිතාඃ පරොක්ෂ මන්මථඃ ජනඃ ඛලු, සඛෙ, පරිහාස විජල්පිතං වචඃ පරමාර්ථෙන න ගෘහ්‍යතාම් (වෛතාලීය)

**අර්ථ-** අපි කවුරු ද? මුව පැටවුන් හා සම වැ වැඩුණු ආලය කෙ බඳු දැ යි නො දන්නා (ඒ) අය කවුරු ද? මිත්‍රය විහිළුවට කී වචනය සත්‍ය වශයෙන් නො ගන්න.

**විස්තර-** විදූෂක රජු වෙනුවෙන් පුත්‍ර පිණ්ඩ උපවාසයට යයි. රජුට ඔහු කෙරෙහි මහත් සැකයෙකි. කියැ යුතු දැයත් නො කිය යුතු දැයත් කිසි විචාරයක් නැති වැ දොඩවන කට හැකරයකු බව රජු දන්නා හෙයිනි. තවුස් දැරිය ගැන රජු ගේ සිතැඟි රජ වාසල දී කී නම් වියැ හැකි දෑ රජුට හැඟේ. එ හෙයින් ඔහු විදූෂකයනට තවුස් දැරිය පිළිබඳ වැ කී තාක් දෑ විහිළුවට කී දෑ බවත් එහි සත්‍යයක් නැති බවත් කියයි. තවුස් දැරිය හා රජු අතර ඇති පරතරය සිහි කරවයි. ආලය ගැන කෙබඳු හැඟීමක් වත් නැති මුව පොව්වන් හා සම වනචාරී දිවියක් ගෙවන ඇයට තමා වැනි සම්භාවනීය රජකු ආලය කරත් දැ යි විමසයි.

## තුන් වන රඟය

1 **අන්වය—** බාණසන්ධානෙ කා කථා. ස හි දූරතඃ ජ්‍යාශබ්දෙන එව ධනුෂඃ හුං කාරෙණ ඉව විඝ්නාන් අපොහති (අනුෂ්ටුප්)

**අර්ථ—** හී නැගීමෙහි කවර කතා ද, හේ දුරදී මැ දුනු දිය හඬින් මැ ඊශ්වරයා ගේ "හුං" කාර ශබ්දයෙන් මෙන් උවදුරු දුරලයි.

**පහදුව-** ඉසුරු සිය "හුං" කාර නාදයෙන් සතුරන් මැඩලයි. ඔහු ගේ "හුං" කාර ශබ්දය ඇසුණු කෙනෙහි සතුරෝ නැති ගෙනැ පලායෙති. දුෂ්‍යන්ත රජු ද සතුරන් මැඩ ලන්නේ දුනු දිය පෙළීමෙනි. දුනු දිය පෙළීමෙන් "හුං" යන දෝං කාරයක් නැගේ. ඒ දුනු දිය සවිමත් වැ බැඳිණි දැ'යි පිරික්සීම සඳහා යි. මෙ සේ රජු ද සතුරන් මැඩ ලන්නේ ඒ "හුං" කාර නාදයෙනි; හියෙන් නො වේ. හේ ඉසුරු තරම් මැ බලවතකු හෙයිනි.

**සවහන්— සෘත්විග්භ්‍යඃ-** "සෘතෞ යජන්ති තෙ සෘත්විජඃ" සුදුසු කාලයෙහි යාගකරන්නෝ සෘත්විග් නමින් හැඳින්වෙති. හොතෘ-උද්ගාතෘ අධ්වර්‍යු සහ බ්‍රහ්මා යනු-වෙන් ඔවුන් පිළිබඳ ප්‍රධාන කොටස් සතරෙකි

**ආකාශෙ-** 'කිං බ්‍රවීෂ්‍යෙ'වමිත්‍යා'දි විනා පාත්‍රං බ්‍රවීති යත් ශ්‍රැත්වෙ'වා'නුක්තමප්‍යෙ'කස්තත්ස්‍යාදාකාශ භාෂිතම්" ඇත කිසිවකු දුටු නියාව හඟවා පැනයක් නඟා එයට ලැබුණු පිළිතුරක සේ කිසිවක් කිම නාට්‍යයේ දී ආකාශ භාෂිතය වේ.

**උච්ඡ්වසිතම්—** සුසුම්- පණ යනු මෙතැනට වඩා සුදුසු අරුත යි.

**විෂ්කම්භක—** "තත්‍ර විෂ්කම්භකො භූත භාවිවස්තවංශ සූචකඃ, අමුඛ්‍යා පාත්‍රරචිතඃ සංක්ෂෙපෛ'ක ප්‍රයොජනඃ, ද්විධා ස ශුද්ධා මිශ්‍රශ්ච මිශ්‍රඃ ස්‍යාන්නීච මධ්‍යමෛඃ, ශුද්ධඃ කෙවල මධ්‍යෛ'යමෙකානෙක කෘතො ද්විධා" (සුධාකරය) ඉදිරි රංග යේ පැනෙන දෑ පැහැදිලි කිරීමට අතුරු ජවනිකාවක් සේ යොදා නාට්‍යය විච්ඡේද රහිත සේ රඟ පෑමට යෙදෙන්නකි. එ ද ශුද්ධ - මිශ්‍ර විසින් දෙකෙකි. එක් බසෙකින් වූයේ ශුද්ධ ද, මුසු බසින් වූයේ මිශ්‍ර ද වේ.

2 **අන්වය—** තපසො වීර්‍යං ජානෙ, සා බාලා පරවතී ඉති මෙ විදිතම්. තථා අපි ඉදං හෘදයං තතො නිවර්තයිතුං අලං න අස්මි. (ආසී)

**අර්ථ—** තවුස් බලය දනිමි. ඒ දැරිය අන් සතු එකියක්‍ෂ්'යි දුතගන්නට ලැබුණි. එහෙත් මේ හද ඇගෙන් ඉවත් කැරැ-ගැනීමට නො හැක්කේ වෙමි.

**පහදුම—** රජු ශකුන්තලා කෙරෙහි බැඳුණු සිත් ඇත්තේ යැ. ඇය ලබා ගැනීමේ සිත ද බලවත් යැ. එහෙත් ඇය අනුන් භාරයේ සිටින්නියක. භාරකාරයා ද දූන් අසපු වෙ නො වේ. ඔහු ද එසේ-මෙසේ කෙනෙක් නො වෙති. උග්‍ර තපස් බලයක් ඇති කණ්ව තවුසා යැ. තමා රජකු නිසා ඇය බලාත්කාරයෙන් හෝ පවා ගත හැකි වෙතත්, තවුසා කිපුණේ තම් වන විනාශය ද පැහැදිලි යැ. මේවා සිතියට නැගෙන විටැ ඇය කෙරෙහි බැඳුණු සිත ඉවත්කර ගැනුමට නො හැකි විම රජු ගේ සන්තාපයට හේතු යැ.

3 **අන්වය—** තව කුසුමශරත්වං ශීතරශ්මිත්වං ඉන්දෝඃ ද්වයං ඉදං මද්විධෙෂු අයථාර්ථං දෘශ්‍යතෙ. ඉන්දුඃ හිමගර්භෛඃ මයූඛෛඃ අග්නිං විසෘජති. ත්වං අපි කුසුමබාණාන් වජ්‍රසාරී කරොෂි. (මාලිනී)

**අර්ථ—** ඔබ ගේ මල් හි ඇතියාව සඳු ගේ සිහිල් රැස් ඇතියාව යන මේ දෙක මා වැන්නවුන් කෙරෙහි අව්වත් නො වන බව පෙනේ. සඳු සිසිල ගැබ් රැසින් ගිනි විහිදුවයි. ඔබ ද මල් හී විදුරු මෙන් දැඩි කෙරෙති.

**පහදුම—** මදනයා කුසුම් හි දරයි; සඳ සිහිල් රැස් දරයි. කුසුම් ඉතා සියුමැලි යැ; සඳ රැස් ඉතා සීතල යැ. එහෙත් දුෂ්‍යන්ත වැන්නවුනට ඔවුන් ගේ මේ සවභාවය විපර්‍යාශ වැ ක්‍රියාත්මක වී තිබේ. සඳ සීතල රැසින් ගිනි විහිදුවන සේ යැ. මදනයා කුසුම් හි වජ්‍ර මෙන් දැඩි කොට විදින සේ යැ. ඔහු මෙතරම් දහයකට හා පීඩාවකට පත් වූයේ ඒ නිසා යැ. විරහීන් හට සඳ රැස්, මල් දැක්මෙන් රති දහය ඇතිවීම සැබැවෙකි.

**සටහන්— කුසුමශර—** "අරවින්දමශොකඤ්ච චූතඤ්ච නවමල්ලිකා නීලොත්පලඤ්ච පඤ්චෛතෙ පඤ්චබාණාශ්‍රයාඃ" රත්සර හෝපලු-මී අඹ- නවමල්ලිකා-නිලුපුල් ඈ

පස් හි යැ. එ සේ මැ "හර්ෂනං රොචනාඛ්‍යඤ්ච මොහනං ශොෂණං තථා මාරණඤ්චෙති සංඥභිර් මුනිමොහකරාණ්‍යපි" යන පස ද පඤ්චබාණයෝ යැ.

4 **අන්වය**— නූනං හරකොපවහ්නිඃ ත්වයි ඖර්වඃ ඉව අම්බුරාශෞ අද්‍ය අපි ජ්වලති. අන්‍යථා, මන්මථ, භස්මා 'වශෙෂත්වං මද්විධානාං ඉත්ථං උෂ්ණඃ කථං (උපජාති)

**අර්ථ**- සැබැවින් ඉසුරු ගේ කෝප ගිනි ඔබ කෙරෙහි, සයුරෙහි වඩවා තලක් සේ අද දක්වාත් දැවෙයි නු. එසේ නො වේ නම් (එම්බා) අනංගය, අලු බවට පැමිණි තෝ මා වැන්නන් කෙරෙහි මෙබඳු දාහයක් කෙසේ දෙහි ?

**සටහන්**- **හර කොපවහ්නි**- වරක් පාර්වතිය ඉසුරු පතා සිටියා යැ. අනංගයා ඉසුරුට මල් හි විද්දේ යැ. මෙයින් කෝපවූ ඉසුරා ගේ නළලතැ වූ නෙතින් ගිනි විහිදෙන්නට විය. එයින් අනංගයා හලු විණ. පසු වැ රතිය ගේ යාච්ඤා-වෙන් ඉසුරා අනංගයාට ජීවය ලබා දුන් නමුදු ඔහු ගේ දැවුණු සිරුර ඔහුට මේ විනතුරු මැ නො ලැබිණ.

**ඖර්ව**- උර්ව යනු පොළොවට නමෙකි. පොළොව ඇතුළතැ වූයේ ඖර්ව යැ. එනම් ගින්නයි. සංස්කෘතයෙහි **ඖර්ව** නමින් දන්නා වඩබාග්නිය පිළිබඳ නොයෙක් මතාන්තර වේ. එහෙත් වඩබා–වළවා අග්නිය යනු සිංහලයෙන් සංස්කෘතයට ගිය ශබ්දයෙකැ'යි හැඟේ. සිංහලයේ වඩ–වළ ජලවාචී යැ. ජලය ඇසුරු කොටැ ඇති ගින්න වළවාග්නි හෝ වඩබා ග්නි යනු යෙදෙයි. එයට කදිම නිදසුනෙකි "වළවේ"යනු. මහත් ජලවේගයක් ඇති හෙයින් ඒ ගඟට වළවේ යනු යෙදුණු සේ යැ. සිතා බලන්නැ.

5 **අන්වය**- තාං මදිරා'යත නයනාං අධිකාත්‍ය ප්‍රහ-රති ඉති අතිශං මනසො ව්‍යථං ආවහන් අපි මකරකෙතුඃ මේ අභිමතඃ (ආඛ්‍යා)

**අර්ථ**- ඒ (දුටුවන්) මත්කරන දිගැසිය නිසා පහර දෙහි යි නිති සිතැ වේදනා දනවතත් අනංගයා මට ප්‍රියයි.

6 **අන්වය**- අරවින්දසුරභිඃ මාලිනීතරඞ්ගාණාං කණවාහී පවනඃ අනඞ්ගතප්තෛඃ අඞ්ගෛඃ අවිරලං ආලිඞ්ගිතුං ශක්‍යම්. (ආර්‍යා)

**අර්ථ**- පියුමින් සුවඳවත් මාලිනී නදියෙහි දිය රළ බිඳ දරන පවන, කාමයෙන් තැවුණු අඟ පසඟින් බෙහෙවින් වැළඳ ගන්නට හැකි යි.

**පහදුව**- මාලිනී නදිය පියුමින් සැරසී සිටී. ඒවා සිප ගෙනැ පවන් හමයි. ගං-දිය ද ඇසුරු කොටැ හමන බැවින් දියබිඳු ද ඒ හා මුසුවැ තිබේ. එ හෙයින් මාලිනී ගං-පියසේ පවන් සුවඳවත් යැ. සීතල යැ. දුෂ්‍යන්ත වැනි ප්‍රේමයෙන් ඇවිලැ ගත්තකුට එ බඳු පවනක පහස ලැබීම කොතරම් සැනසීමෙක් ද ?

**සටහන්**- **පවනඃ**- සුරභි; ශෛත්‍ය, මාන්ද්‍ය පවන විඩා හරනට සමති. අරවින්දයන් ගෙන් සුරභි බව හා කණවාහී බැවින් ශෛත්‍යය හා මාලිනී තරඞ්ගානාං යනුවෙන් මාන්ද්‍යය ද හැඟ වේ.

**රඝුවංශයෙහි** "පෘක්තස්තුෂාරෛර් ගිරි නිර්ඣරාණාං මනොකහා කම්පිත පුෂ්ප ගන්ධි" යන මෙහි දු මාන්ද්‍යය වළහා කියන ලද්දේ යැ.

**අස්මින් වෙලායාං මාලිනී තීරෙෂු ශකුන්තලා ගමයති**- මෙයින් නායිකා සංස්පෘෂ්ටත්වය ද හඟවයි. "ආලිඞ්ග්‍යන්තෙ ගුණවති මයා තෙ තුෂාරාර්ද්‍රවාතාන්, පූර්වං ස්පෘෂ්ටං යදි කිල භවෙදඞ්ගමෙභිස්තවෙ'ති" යි මේඝදූතයෙහි කියන ලදී.

**විෂාද**- "යා දෘෂ්ටිං පතනාපාඞ්ගා විස්තාරිත පුමද්‍රයා, නිමෙෂිණ්‍යස්ත තාරා ච විෂණ්ණා සා විෂාදිනී" (දශ රූපක) ඇස් තරු දෙ කොනට යවා නෙත් පිය බෙහෙවින් හැර පිය සැලුම් රහිත වූ ද නො සැලෙන නෙත් තරු ඇති වැ සිටුම විෂාදය හැඟවීම යි.

7. **අන්වය**- අස්‍ය පාණ්ඩුසිකතෙ ද්වාරෙ පුරස්තාත් අභ්‍යුන්නතා. පශ්චාත් ජඝන ගෞරවාත් අවගාඪා අභිනවා පදපඞ්ක්තිඃ දෘශ්‍යතෙ. (ආර්‍යා)

**අර්ථ**- මේ (ලිය මඬුල්ලේ) පඬුවන් වැලි ඇති දොරටු ඉදිරියෙහි උස් වූ ගිය, පසු පස උකුළු බරින් නෙරා ගිය අලුත් පියවර පෙළක් පෙනේ.

**සටහන්**- **නිර්වාණ**- ශකුන්තලා දක්නට නො ලැබීමෙන් විෂාදයට පත් රජුට හදිසියේ ඇ දක්මෙන් ඇති වූ ප්‍රීතිය මෙයින් පැහැදිලි වේ.

8. **අන්වය**- ස්තනන්‍යස්තොශීරං ප්‍රශිථිලමෘණාලෛ-'කවලයං ප්‍රියායාඃ සාබාධං ඉදං වපුඃ කිං අපි කමනීයං. මනසිජ නිදාඝප්‍රසරයොඃ තාපඃ සමං [ඉති] කාමං යුවතිෂු ග්‍රීෂ්මස්‍ය තු අපරාද්ධං එවං සුභගං න [අස්ති] (ශිඛරිණී)

**අර්ථ**- තන මතැ තැබූ සැවැඳෑරු ආලෙපවත් ඉතා ලිහිල් වූ නෙළුම් දළු වළල්ලක් පැළඳි, ප්‍රියාව ගේ ආතුර මේ සිරුර කිසියම් මනහර බවක් දරයි. ආලයේ හා ග්‍රීෂ්මයේ තැවුම් සමය (යනු) සැබැවෙකි. යුවතීන් කෙරෙහි ග්‍රීෂ්ම කාලයා ගේ මෙ සේ පෙළීම් නම් මනහර නො වේ.

**සහළුව**- රජුට ශකුන්තලා වැතිර සිටින අයුරු පෙනේ. ඇගේ පියොවුරු මතැ ආලේප කැරුණු සැවැන් දරා යැ. එක මෑ නෙළුම් දළු වළලුවක් ද පැළඳ සිටී. ඒ විරහිනියක් බව පළ-කරනු සඳහා යැ. එ ද ලිහිල් වැ ගොසිනි. රෝගී වුවත් ඇ ගේ ශොභායෙහි වෙනසෙක් ද වී නැති. ග්‍රීෂ්මයේ තැවීමත් ප්‍රේමයේ තැවීමත් එක් බඳු යැ යන මතය සත්‍ය බැව් දැන් රජුට අවබොධ වී තිබෙන්නා සේ යැ. ඔහු ද එයින් තැවෙන හෙයිනි. එහෙත් ඇය ගේ මේ තැවීම ප්‍රේමය නිසා නො වැ ග්‍රීෂ්මය නිසා නම් එය උචිත නො වේ යැ යනු ඔහු ගේ හැඟීම යි.

**සටහන්- ඉතිහාස-** "ධර්මාර්ථ කාම මොක්ෂාණාමුපදෙශ සමන්විතං, පූර්ව වෘත්තං කථා යුක්තමිතිහාසං ප්‍රචක්ෂතෙ" යි කී හෙයින් ධර්ම-අර්ථ-කාම-මොක්ෂයන් ලබා ගැනීමේ උවදෙස් සහිත පූර්ව වෘතාන්තයන් ගෙන් යුතු වූයේ ඉතිහාස යි.

**පජ්ජුස්සු ආ විඅ-** මෙහි "විඅ" ශබ්ද ප්‍රයොගයෙන් ශකුන්තලාවට මිථ්‍යා- බොරු ආරෝපණයට සෙහෙළියන් බිය වූ සේ හඟවයි.

**හිඅඅසස-** සිත් පොපිය වන පමණ මිස තණ විසින් නො වේ.

**ලවණ්ණමර් ඡාආ-** කෘශ බව ප්‍රධාන වූ රූපය මැ පෙනේ. අවයව නො පෙනේ. අතිශයින් කෘශ බව නැඟ වූ සැටි යැ.

9. **අන්වය-** ආනතං ක්ෂාමක්ෂාම කපොලම්. උරඃ කාඨින්‍යමුක්තස්තනම්. මධ්‍යඃ කලාන්තතරඃ. අංසෞ ප්‍රකාම විනතෞ ඡවිඃ පාණ්ඩුරා. මදනක්ලිෂ්ටාඉයංපත්‍රාණාං ශොෂ-ණෙන මරුතා ස්පෘෂ්ටා මාධවී ලතා ඉව ශොච්‍යා ච ප්‍රියදර්ශනා ච ආලක්ෂ්‍යතෙ. (ශාර්දූල වික්‍රීඩිතම්)

**අර්ථ-** මුහුණ බෙහෙවින් වැහැරෙන කොපොල් ඇත්තේ යැ. ළය තද බව මිදූ පියොවුරු ඇත්තේ යැ. ඉඟ අතිශයින් කෘශ යැ. උර හිස් බෙහෙවින් එල්බෙයි. සිවිය සුදුමැලි යැ. කාමයෙන් ආතුර යැ. මෝ පත් වියැලුණු සුළඟට අසුවූ මාධවී ලතාවක මෙන් සෝ දනවන්නීත් දැකුම් කලු වන්නීත් වෙයි.

**පහදුව-** ශකුන්තලාවන් ගේ කම්මුල් වැහැරී ගොස් යැ. මුහුණ හොඳු ඇකිලුණු බවක් පායි. තාරුණ්‍යය නිසා ඝනබද වැ තුබූ පියොවුරු ලිහිල් වැ ළය මතැ එල්බෙමින් සිටි. ඉඟ ද කෙට්ටු වීම නිසා ඉතා සිහින් යැ. උර හිස් ද එල්බෙයි. සිවිය ද සුදුමැලි යැ මේ සියල්ල ඈ බලවත් රෝගයකින් පෙළෙන බවට ලකුණු යැ. රෝගය ද ආලය

නිසා හට ගත්තේ යැ. මේ වදු ඇයට සමාන කිරීමට සුදුසු උවමෙක් ද වෙයි. පත් පියැලුණු මාධවී වැල සුළඟින් ඒ මේ අත වැනෙන කලැ විසලි පත් ඇද හැලෙයි. එහෙත් එය දකුම්කලු යැ. බැලීමට ආශා උපදවන හෙයිනි. එහි පෙරැ තුබූ ශොභාව නැති හෙයින් සොව ද දනවයි. ශකුන්තලාව ද මෙ සේ වැරී සුදුමැලි වැ සිටිනත් දකුම්කලු බවක් පායි. එ සේ මැ ඇ ගේ පෙරැ ශොභාව ගැන සිතත් මැ දුක් උපදවයි.

**සටහන්- මධ්‍යඃ ක්ලාන්තතරඃ-** ඉහ සිහින් වීම වනිතා ලක්‍ෂණයෙකි. එය වඩාත් සිහින් වී තිබීමෙන් රෝගී බව පළ කරයි.

**ප්‍රකාම විනතෞ අංසෞ-** උරහිස් එල්බීම වනිතාව ගේ සුන්දරත්වය විදහා පාන්නකි. අතිශයින් එල්බෙනුයේ රෝගී බවේ පීඩනය නිසා යැ.

**මදන ක්ලිෂ්ටා-** රාගයෙන් වියලී ගිය බව යැ. අව්වෙන් පත් වියලී ගියා මෙනි මාධවී ලියෙහි.

**ස්නිග්ධ....වෙදනාං භවති-** ප්‍රියයන් අතරැ දුක බෙදා-ගත් කලැ එය ඉවසනු හැකි-වෙයි. තම සිතැ'ති දුක් වේදනා ප්‍රියයනට කීමෙන් එය තුනී වෙයි. ඔවුන් ගෙන් එයට සුදුසු බස් හා උවදෙස් හා ලැබෙයි. මෙ අදහස මැ නාගානන්දයෙහි "අවෙදයම්මාත්මීයං පුත්‍ර දුඃඛං සුදුඃසහං, මයි සංක්‍රාන්ත මෙතතෙන යෙන මහ්‍යං භවිෂ්‍යති"

10. **අන්වය-** ඉයං බාලා සමදුඃඛ සුඛෙන ජනෙන පෘෂ්ටා මනොගතං ආධිහෙතුං න වක්‍ෂ්‍යති. [ඉති] න. අනයා විවෘත්‍ය බහුශඃ දෘෂ්ටඃ සතෘෂ්ණං අපි අත්‍ර අනන්තරෙ ශ්‍රවණ-කාතරතාං ගතො'ස්මි. (වසන්තතිලකා)

**අර්ථ-** මේ දුරිය සම දුක්-සුවයෙහි පවතින අය විසිනු දු විචාරන ලදුවත් සිත තුළැ වූ තැවුලට මුල නො කිය යි. (මේ සුදුසු) නො වේ. මා විසින් කැරකී බොහෝ ආශාවෙන් (මා දෙස) බලන ලදුවත් මෙ තන්හිදී (ඇ කියන දෙය) ඇසීමේ බයාදු බවට පැමිණියේ වෙමි.

**පැහැදුම්-** යෙහෙළියෝ ශකුන්තලාවන් ගෙන් දුකයට හේතුව විමසති. ඈ එය නො කියයි. එ සේ නො කීම නුසුදුසු බැව් දුෂ්‍යන්ත ගේ වැටහිමයි. තාපනයට හේතුව දැන ගැනීම යෙහෙළියනට මෙන් මැ ඔහුට ද ඉතා ඇවැසි යැ. තමා එයට හේතුව දෝ'යි ඔහු ගේ සිත තුළ සැකයෙකි. ඇය එදා කැරකි කැරකී තමා දෙස බැලූ බැව් ඔහුට මතක යැ. ඒ කෙසේ වුවත් දැන් නම් ඈ කියන දෙය ඇසීමට තරම් ඔහුට චිත්ත ධෛර්යයෙක් නැති. තමා ගේ අභිලාෂයේ ඉරණම විසඳෙන අවස්ථාව හෙයිනි.

11. **අන්වය-** සම්ර එව තාපහෙතුඃ න එව තිම්පයිතා ජාතඃ. තපාත්‍යයෙ ජීවලොකස්ස අභ්‍රශ්‍යාමඃ දිවසඃ ඉව. (ආශී)

**අර්ථ-** ආලය මැ තාපන හේතුව යි. එය මැ (මා) සනසන්නා විය. ග්‍රීෂ්මයා ගේ කෙළවර සත්ව ලෝකයට වළා කුළින් ඇඳිරි වූ දවස මෙනි.

**පැහැදුම-** දුකයට හේතුව රජු කෙරෙහි කළ ප්‍රේමයැ යි ශකුන්තලා කීවා යැ. එයින් රජුට ඇති වූ සැනසීම කෙබඳු වී ද, ග්‍රීෂ්මයෙන් පීඩිත ලෝකයාට වැස්ස තරම් අන් දෑයෙක් නැති. ඉදින් අහස යම් දිනෙක වැසි වලාවන් ගෙන් ඇඳිරි වේ ද, නිසැකයෙන් වැසි ලැබීමේ හේතුව බව දන්නා ලෝකයාට එය මහත් සැනසීමක් පිණිස පවතී. එ බඳු සැනසීමෙකි ඇගේ තාප හේතුව ඇසූ රජුට ඇති වූයේ.

**සටහන්-** **තපාත්‍යයෙ-** තපස්‍ය-නිදාඝස්‍ය, අත්‍යයඃ-අවසානඃ-ග්‍රීෂ්මකාලාවසාන යෙහි.

**නිශලාදඅං-** තල මුසු දිය ඉසින්නේ සොහොනෙහි යැ. භූමිදන ; කෘත්‍යා'වසානයෙහි ඒ මතැ තල මුසු දිය ඉසීම භාරතීය සිරිතෙකි. ශකුන්තලාවනට රජු ලබා ගැනීමට නො හැකි වී නම් මරණය ඒකාන්ත බැව් කී තියා යැ.

**සාඅරං උජ්ජකිඩා-** මහා නදිය සයුරට මැ ස්වභාව ධර්මය විසින් පමුණුවයි. ශකුන්තලා ද දෛවයෙන් (පුරු) රාජ මහේෂිකාවක් වනු ඇතැයි හැඟෑ වූ අයුරු යැ.

**විශාඛෙ ශශාඞ්කමෙලෙවා-** විශාඛ නැකතෙහි රෝහිණී තරුව හා ග්‍රහණයෙන් පසු චන්ද්‍රයා හා එක් වීම පුදුමයක් නො වෙ. රජු හා ශකුන්තලා ගේ එක්වීම ඉතා ළං වී යැ යි සැක වූ සේ යැ.

12. **අන්වය-** නිශි නිශි භුජන්‍යස්තාපාඞ්ග ප්‍රවර්තිභිඃ අන්තස්තාපාදශිශිරෛඃ අශ්‍රුභිඃ විවර්ණමණීකෘතං. අනභිලුලිත ජ්‍යාඝාතාඞ්කං ඉදං කනකවලයං ස්‍රස්තං ස්‍රස්තං මණිබන්ධනාත් මයා මුහුඃ ප්‍රතිසාර්‍යතෙ. (හරිණී)

**අර්ථ-** රැයක් පාසා බාහුවෙ පැළැඳි නෙතගින් වැගිරෙන ඇතුළත තැවීමෙන් උණුසුම් කඳුලින් විවර්ණ කළ මැණික් ඇති, නො පහස්නා ලද දුනු දියෙන් තැගි කැළැල් ඇති මේ රන් වළල්ල ලිහිල් වැ හෙන්නේ මණිබන්ධනයෙන් උඩට තිතර ඔසවනු ලැබේ.

**පහදුව-** රජු දිවා-රෑ ශකුන්තලා ගැන සිතමින් කල් ගෙවයි. තැංවූ කඳුලින් මැ පසු වෙයි. ඒ කඳුලු වැටීමෙන් බාහුවෙ පැළැඳි වළල්ලෙහි එබ්බූ මැණික් ද දුර්වර්ණ වී ගොස් යැ. ඒ රන් වළල්ලද පෙරැ නම් දුනු දිය තිසා මණි- යණිබන්ධනයෙහි වූ කැළල ස්පර්ශ නො කැරිණ. දැන් එය මතැ තිතර තිතර හැලෙයි. රජු ද එය තිතර ත්තර උඩට ඔසවයි. රජු එ තරම් මැ වැහැරී ගොස් යැ.

**සටහන්- එකමෙව කනක වලයං-** විරහි බව පළ කිරීමට එක මැ වළල්ලක් පළඳින සේ කවි සමයැ දැක් වේ.

**ලලිත පදබන්ධනං-** "ලලිතානාං මනොහරාණාං පදානාං බන්ධනංජෙදුරචනං" මිනහර පදයන් යොදා ගෙතූ ගීයක්. "රතිශොකොත්සාහප්‍රධානං ලලිතං මතම්" රතිය ශෝකය උත්සාහය ප්‍රධාන වූයේ ලලිත යැ යි දක්නා ලැබේ. මේ බඳු රචනාවින් සකු සාහිත්‍යයේ සුලභ යැ. දණ්ඩිහු ද "සුභග කුසුමසුකුමාරං ජගදනවද්‍යං විලොක්‍ය තෙ රූපං, මම මානස මභිලෂති ත්වං චිත්තං කුරු තථා මෘදුලම්"

13. **අන්වය-** භීරු, යතඃ අවධීරණාං විශඞ්කසෙ, සඃ අයං තෙ සඞ්ගමොත්සුකඃ තිෂ්ඨති. ප්‍රාර්ථයිතා ශ්‍රියං ලභෙත වා න., ඊප්සිතඃ ශ්‍රියා කථං දුරාපඃ භවෙත්. (වංශස්ථවිල)

**අර්ථ-** එම්බා බියැත්තිය, යමකු ගෙන් නිඳුම් නො කැමති ද, ඒ මොහු ඔබ ගේ සංගමයෙහි උත්සුක ව සිටී. පතන්නේ ලක්ෂ්මිය ලබන්නේ හෝ නො ලබන්නේ හෝ වේ. එහෙත් ඊප්සිතයාට ලක්ෂ්මිය ලැබීමට කෙසේ නම් දුෂ්කර වේ ද ?

**පැහැදුම-** ශකුන්තලාවන් ගේ සිත මුළුමණින් ම දුෂ්‍යන්ත කෙරෙහි බැඳී සිටී. එහෙත් දුෂ්‍යන්ත, තමා කෙරෙහි කෙබඳු අදහස් දරන් ද' යි ඇය නො දනී. පෙම් හසුනක් ලියන්නට යෙහෙළියන් ඇවිටිලි කළත් ඈ නිඳුවට බියෙන් පසුවෙයි. ඒ පෙම් හසුනට දුෂ්‍යන්ත ගෙන් කෙ බඳු නිගාවෙක් වේ ද. ඒ නිසා යැ ශකුන්තලා ගේ බිය. ඔහුත් ඈ-ගේ සංගමය අපේක්ෂා කෙරෙත් නම් දෙදෙනා ගේ මැ තත්වය සමාන වන්නා හා මැ සෞභාග්‍යය ද වෙතැ එළඹ සිටී. පැතීම් පමණින් සෞභාග්‍ය ලබා නො වේ. සෞභාග්‍යයත් එය ඉවසා නම් එහි දී කෙබඳු දුෂ්කරත්වයක් එළඹේ ද ? නො වේ මැ යි.

**ශ්‍රියා දුරාපඃ......භවෙත්-** සුරූපී කාන්තාවක් දැක ඇය ලබමි 'යි කෙනෙක් පතයි. ඔහු ගේ ඒ පැතීම ඵලවත් වන්නට හෝ නො වන්නට පිළිවනි. ඇයත් ඔහු පතා නම් ඔහුට ඇය ලැබීමේ බාධාවෙක් නැතැ යි කී නියා යැ.

14. **අන්වය-** පදනී රචයන්ත්‍යාඃ අස්‍යාඃ උන්නමි-තෛකභ්‍රූලතං ආනනං කණ්ටකිතෙන කපොලෙන මයි අනුරාගං ප්‍රථයති. (ආර්‍යා)

**අර්ථ-** පද බඳනා මැගේ උඩට එසවුණු බැමලියක් ඇති මුහුණ රෝමෝද්ගත වූ කොපොළින් මා කෙරෙහි වූ අනුරාගය පෙන්වයි.

**සටහන්- අනුරාගඃ-** "අංකුර පල්ලව ප්‍රසූන ඵල භොග භාගියං ක්‍රමශඃ, ප්‍රෙමා මානඃ ප්‍රණයඃ ස්නෙහො රාගො'නුරාග ඉත්‍යුක්තඃ" සුධාකරයේ දැක් වූ සැටියෙන් ප්‍රේමයේ -රාගයේ උසස් මැ අවස්ථාව අනුරාගය බැව් පළ යැ.

15. **අන්වය-** තුජ්ඣ හිඅඅං ණ ජාණෙ. කාමො උණ ණිග්ඝිණ තුඉ වුත්තමණොරහාඉං අංගාඉං දිවා වි රත්තිම්මි බලිඅං තවඉ. (ගීති)

**අර්ථ-** ඔබේ හිත නො දනිමි. අනංගයා යළිත් (එම්බා) අකාරුණිකය, ඔබ කෙරෙහි වූ මනදෙළින් යුතු මගේ අවයව දහවලැ ද රැයෙහි ද බලවත් සේ තවයි.

**පහදුව-** ඇගේ පෙම් ගිය ඉතා සරල යැ. වනයෙහි ඇති-දැඩි වූ දූරියක නිසා පෙම් ගී නුපුරුදු බැවින් හෝ සිතෙහි පැන-නගින අදහස් රැස ගොණු-කිරීමට නො හැකි නිසා හෝ වියැ යුතු යැ. ඇයට දුෂ්‍යන්ත පෙනෙන්නේ දරුණු වූවකු සේ යැ. එ හෙයින් නිර්ඝෘණ යැ යි ඔහු අමතයි. ඔහු කෙරෙහි වූ ඇගේ සිත දිවා රැයෙහි කාමයා විසින් දවනු ලබතත් දුෂ්‍යන්ත ගේ සිතැ හි ඇය නො දනී.

**සටහන්- අඩගානි-** අතිශය මෘදු බව සලකා බහු වදනින් පැවැසිණ.

**මනොරථ-** ආලිඞ්ගන, දර්ශන, ශ්‍රවණ, ඝාතන, කුච-මර්දන, ආරොහනාදිය මෙහි දී මනොරථ සේ ගැනේ.

**ණ ජාණෙ-** ඔබ පළමු ද යෙහෙළියනට මුදුව දීමෙන් මා ණයෙන් නිදහස් කළා. එ හෙත් ඔබ වෙත යැවූ හෘදය ඇති මා ශම සේ දූවෙද්දී එයට පිහිටෙක් නො වේ. ක්ෂත්‍රිය යන් දුබලුන් රැකිය යුතු නමුදු මෙ සේ වූ මට රැකුම් නො යොදනුයේ නිම. තව ද පළමුව තැවීමෙන් හික්මවනු කැමති වෙද්ද, ඇ-ශකුන්තලා නත්-ලෙස විමසත් නමුදු ඔහුගේ චිත්තාචාරය නො දනි යි කී සැටි යැ.

16. **අන්වය-** තනුගාත්‍රි මදනඃ ත්වාං තපති. මාං පුනඃ අනිශං දහති එව. දිවසඃ හි යථා ශශාඞ්කං ගලපයති., තථා කුමුද්වතීං න. (ආසීා)

**අර්ථ-** (එම්බා) තුනුවඟ, කාමයා ඔබ තවයි., නමුත් මා නිරතුරු දවයි යම් සේ දහවල, සඳ මිලාන කරතත් විලට එබන්දක් නො කරයි.

**පහඳුව-** අනංගයා දිවා කලැ යැ. ඔහු ගේ පීඩනය සඳටත් කුමුදු විලටත් එක හා සරි යැ. සඳ සේ කෝමළ වූ ශකුන්තලා ද ශකුන්තලා නිසා ප්‍රබොධමත් වූ දුෂ්‍යන්ත විල ද, දිවස-හිරු අනඟ සැර වැදී තැවෙති. එහෙත් මේ තැවුම් ද දෙ අයුරෙකින් වීම මහ අසිරියෙකි. දිවස සඳ කෙසේ ගිලන් කෙරේ ද? දිවස උදුවත සඳ නිෂ්ප්‍රභා වේ; ගිලන් වේ. සඳ ගිලන් වත්නා හා මැ කුමුදු විල මැලවේ. දිවස සැඩ බව; ලබත් ලබත්, විල වියලී වියලී යත්තේ යැ. අනංග තාපයෙන් රජු දැවෙන සැටි පහඳ කියන ලදී. ශකුන්තලා -වගේ ගිලන් බව දැකිමෙන් රජු අනිශයින් දැවෙන්නට වූ සේ යැ.

17 **අන්වය-** සන්‍දෂ්ටකුසුමශයනානි ආශුවිමර්දිතමෘණාලවලයානි ගුරුපරිතාපානි තෙ ගාත්‍රානි උපචාරං න අර්හන්ති (ආසීා)

**අර්ථ-** ඇලුණු මල් යහන් ඇති; වහා තැලුණු නෙළුම් දැලි වළලු ඇති මහත් වේදනාවත් ඔබ ගේ අවයවයෝ උපචාර කිරීමට නුසුදුසු වෙත්.

**සටහන්-** සන්‍දෂ්ට කුසුමශයනානි අප්‍රාණික වැ බොහෝ වේලා යහනෙහි වැතිර සිටී. ශකුන්තලා ගේ උණුසුම් සිරුරේ බරින් තැලුණු මල් ඇඟට මැ ඇලී සිටී.

**අශුවිමර්දිතමෘණාලවලයානි-** එක මැ වළලුවක් අතෙහි වී ද, එය ද අනංගතාපිත ඇගේ සිරුරු පහයින් වියලී යැ. තෙත් නෙළුම් දැලි පවා වහා වියලීමට ඇගේ ගත සමත් යැ.

**අඛණ්ඩවචන්ත්ථ**— අනුග්‍රහය - සැනසීම - රක්‍ෂාවරණය, ඇය පිළිගැනීමෙන් දිවි රැකෑ දීම රජුට භාරයැ. "අර්ථානුග්‍ර- ප්‍රහත්ති රනුග්‍රහඃ" යි ශාස්ත්‍රයෙහි ආයේ යැ.

**සාධාරණ්‍යෝ'යං ප්‍රණයඃ**- මේ ඉල්ලීම දෙ දෙනාට මැ සාධාරණ යැ. ශකුන්තලා ගේ දිවි රැක දෙන සේ ඉල්ලන්- නාක් මෙන් මැ දුෂ්‍යන්ත ගේ ද දිවි රැක දෙන සේ ද ඉල්- ලියැ යුත්තේ යැ. දෙ දෙනා තුළ මැ සමාන ප්‍රේමයක් වන බව දක්වා කි සැටි යැ.

18 **අන්වය**- හෘදයෙ සන්නිහිතෙ, අනන්‍යපරායණං ඉදං මම හෘදයං යදි අන්‍යථා සම්භාවයසෙ, මදිරෙක්‍ෂණෙ, මදනබාණහතඃ අස්මි; පුනඃ ත්වයා හතඃ [අස්මි] (ද්‍රුතවිලම්බිත)

**අර්ථ**- (එම්බා මා) හද ළං කොට ගත්තිය, අනුන් අයත් නො වූ මේ ම-ගේ හද, ඉදින් අන් ලෙසෙකින් ගනින් නෙහි නම්, (එම්බා) ශොභන ඇස් ඇත්තිය, (ඒ මම) මදනයා ගේ හීවලින් නසන ලද්දෙමි; නැවත (තී විසිනුත්) නසන ලද්දෙමි වෙමි.

**පහදුව**- ඇතොරත් ගෙන් වෙන් වීම නිසා රජු ප්‍රේම යෙන් ආතුර යැ යි ශකුන්තලා සිතුවා. එ හෙයින් රජුට ඇවටිලි කිරීමෙන් ඵලයෙක් නො වේ යැ යි ඕ පැවසුවා. මෙයින් රජු ගේ හද අතිශයින් පැරිණි. රජු තම සිත අන් කෙනෙකුට නො අයත් බව ඉදුරා පළ කරන සේ යැ. ඔහු සිත අන් අයෙක් උදෙසා නො මෙහෙය වූ යැ. ප්‍රේමය නො ඉඳුල් යැ. එය පිදෙනුයේ ශකුන්තලා උදෙසා යැ. ඈ දුටු කෙනෙහි මැ අනඟා විදි හී වැදී රජු නට හෙයින් යළි යළි ඇගේ සැක සහිත බස් ; පහරින් යළි දූ නට සේ පළ කෙරේ. අනඟ හීයට වඩා තම ප්‍රියාව ගේ ශඞ්කා බස් දැඩි වී

**සටහන්**- **මදිරෙක්‍ෂණෙ**- මනහර නෙත් තරු කර කවා හළ ඇස් පිය ඇති වැ නෙත් අගින් බැලීමෙන් තුරු- ණන් විසි කැරෙන බැව් භරතයන් විසිනු දු කියන ලදී. "ආඝූර්ණිමානමධ්‍යායා ක්‍ෂාමාචාඤ්චිත තාරකා. දෘෂ්ටිර් විකා- සිතාපාඞ්ගා මදිරා තරුණෙ මදෙ" යි

19 **අන්වය**- පරිග්‍රහ බහුත්වෙ'පි මෙ කුලස්‍ය ද්වෙ ප්‍රතිෂ්ඨෙ. සමුද්‍රරසනා උර්වී ච යුවයොඃ ඉයං සඛී ච. (අනුෂ්ටුභ්)

**අර්ථ**- (මට) භාර්‍යාවන් බොහෝ වුවත් මගේ කුලයට දෙ දෙනෙක් මූලික වෙති. මුහුදු මේඛලාවෙන් (වට කළ) පොළොව ද, ඔබ දෙදෙනා ගේ මේ ප්‍රිය යෙහෙළිය ද වෙති.

20 **අන්වය**- ශීතලෛඃ ක්ලමවිනොදිභිඃ නලිනිදල-තාලවෘන්තෛඃ ආර්ද්‍රවාතාන් සඤ්චාරයාමි කිම්? උත, කරභොරු, තෙ පද්මතාම්‍රෞ චරණෞ අඞ්කෙ නිධාය යථා සුඛං සංවාහයාමි (කිම්) (වසන්තතිලකා)

**අර්ථ**-- සිහිල් වූ විඩා දුරු ලන නෙලුම්පත් විජිනි-පතින් සීතල පවන් සලම් ද? නැතහොත්; එම්බා මනා වටොර ඇත්තිය, ඔබ ගේ පියුම් වැනි තඹ පැ දෙපා ඇකයෙහි හොවා රිසි පරිදි පිරිමදිම් ද?

**සටහන්**- **කරභොරූ**- ඇත් සොඬ,වැනි-ඔටු පැට වකු ගේ ගෙළ වැනි මනහර ඌරු ගෝ ක්‍රමයෙන් සිහින් වූ ඌරු.

**යථා සුඛං**- රජු රති කලාවේ විඥයකු හෙයින් ඈ සැනසීම එතරම් අසීරු නො වේ.

**අනිර්වාණඃ**- නො නිවුණු-සිහිල් නො වූ. අච්ච තව මැ නො බැස්සේ යැ යි කී සැටි යැ.

**මානනීඤ්සු**- රජු පිදයැයුත්තන් අතුරු කෙනකු හෙයින් ඔහු ලවා එබඳු පහත් වැඩ ගැනීම නො වටී. නැත හොත් එ බඳු පහත් දෙයක් ඔහු ලවා වීමෙන් වැඩිහිටි යන් ගෙන් නින්‍දා ලැබෙයි. වැඩිහිටියන්-අවිවාහක තරුණි-යන් මානනී ශබ්දයෙන් ගැනේ. අවිවාහක ඈ, පුරුෂයකුට ඇගේ කැමැත්තෙන් පයස්කට ඉඩ දුනහොත් ඒ ක්‍රියාවෙන් ඈ අන්‍ය මානනීන් හට අවමන් ලබා දෙන්නී යැ.

21 **අන්වය-** නලිනීදලකල්පිතස්තනාවරණං කුසුම-ශයනං උත්සෘජ්‍ය පරිබාධපේලවෛඃ අඞ්ගෛඃ ආතපෙ කථං ගමිෂ්‍යති. (ආර්‍යා)

**අර්ථ--** පියුම් පතින් කළ පියොවුරු වැසුම්-තනපට ඇති මල් සයන හැර, ලෙඩින් දුබල අඟ-පසඟින් යුතු ඔබ අව්වෙ කෙසේ යෙත් ද?

**පහදුව-** ශකුන්තලා ලෙඩින් දුබල යැ. අඟ-පසඟ වේදනාවෙන් පිඩිත යැ. තව ළුරටත් දැහැය නිවුම පිණිස කළ ප්‍රතිකාර ඉවසියැ යුතු යැ. මේ සියල්ල නො සළකා ඇ එ තැනින් ඉවත් වැ අව්වේ යෑම නුසුදුසු යැ.

**සටහන්- පේලවෛඃ-** සියුමැලි. දුබල යනු වඩා සුදුසු සේ යැ.

**පරිබාධා** "පරි-පරිතඃ ආ සමන්තාත් බාධඃ පීඩා" හැම් අතින් මැ වූ පිඩාව, වේදනාව.

**පොරව රක්‍ෂා විණ්ඩං** දූෂ්‍යන්ත වැනි උසසකුට එවැනි නොහොබනා කමක් නුසුදුසු බව හැඟ වූ යැ.

**ණ ගු අනතණො පහගමාමි-** තව මැ ශකුන්තලා ගුරුන් ගේ රැකවරණයේ හෙයින් මෙසේ පැවසිණ.

22 **අන්වය-** බහ්ව්‍යඃ රාජර්ෂිකන්‍යකාඃ ගාන්ධර්වේණ විවාහෙන පරිණීතාඃ ශ්‍රූයන්තෙ, තාඃ ච පිතෘභිඃ අභිනන්දිතාඃ (අනුෂ්ටුභ්)

**අර්ථ-** බොහෝ රජුන් ගේ හා තවුසන් ගේ දූවරු ගාන්ධර්ව විවාහයෙන් [ආවාහ වූ ලෙසි අසනු ලැබේ. ඇලා ද (ඔවුන් ගේ) පියවරුන් විසින් සතුටින් පිළිගන්නා ලදූ.

**පහදුව-** පෙරත් මෙබඳු ප්‍රේම විවාහ සිදුවී තිබේ. ඒ ගාන්ධර්ව විවාහ නමින් පළ යැ. සාමාන්‍ය ස්ත්‍රී-පුරුෂයන් අතර පමණක් නො වැ රජුන් ගේ හා ඍෂිවරුන් ගේ

දියණිවරුන් අතර ද, මෙබඳු විවාහ බොහෙවින් සිදුවී තිබේ. එහෙයින් ශකුන්තලාව හා තමන් අතර ප්‍රේම විවාහයක් සිදුවීමට කිසිදු සරසක් නැති බැව් දුෂ්‍යන්ත ගේ හැඟීම යැ

**සටහන්- රාජර්ෂිකන්‍යකාः—** රජුන් ගේ හා තවුසන් ගේ දූවරු-රාජ ඍෂින් ගේ දූවරු නො හොත් රජුන් ගේ ඍෂින් ගේ දූවරු

**ගාන්ධර්වේණ විවාහෙන-** ස්ත්‍රී පුරුෂයන් ආලය නිසා ඔවුනොවුන් ගේ මැ කැමැත්තෙන් කැරෙන ප්‍රෙම විවාහයෙන්.

23. **අන්වය-** යාවත් සුන්දරි පිපාසිතා මයා අපරික්ෂත කොමලස්‍ය අස්‍ය තෙ අධරස්‍ය රසඃ ෂට්පදෙන නවස්‍ය කුසුමස්‍ය [රසඃ] ඉව සදයං ගෘහ්‍යතෙ (ඖපච්ඡන්දසික.)

**අර්ථ-** එම්බා සුන්දරිය, පිපාසිත මා විසින් නො නැලීමෙන් (නො සිඹීමෙන්) කෝමල තෙල ඔබ ගේ අධර රසය බමරකු නව මලෙක රෙන් මෙන් ප්‍රේමයෙන් උරණ තෙක් සිටිනු මැනැවි

**සටහන්- සමුන්නමයිතුං-** ත්‍රිපතාක කළ දෙඅතින් මැද‘ඇඟිලි දබර‘ඇඟිලි කෙළවරින් නිකට දෙසට යොමු කිරීමට

**ආමන්ත්‍රණ සහචරං-** සක්වා ලිහිණියා ද එම ව්ධුව ද රැයෙහි වෙන් වෙති. මේ පෙම්වතුන් දෙදෙනා ද වෙන් කිරීමට ගෞතමිය එළඹියා යැ. පසු බිමින් සක්වාවන් අමතන සේ මේ පෙම්වතුන් අමතා ගෞතමිය රජනිය සේ ගෙන ඇය එන බැව් ඔවුනට දැන්විණි

**ලඳුවලඅ-** ශකුන්තලා ගෞතමිය සමග පිටත් වැ යතත් ඒ කැමැත්තෙන් නො වේ. තම පෙම්වතා ගෙන් වෙන්වැ යාම නො කළ හැක්කෙකි. එහෙත් ගෞතමියට කීකරු වියැ යුතු යැ ඇට රජු ගෙන් සමු ගැනීමට ද මගෙක් නැති රජු ලිය මඬුල්ලෙහි සැඟවී සිටී. එහෙයින් ඇ ඔහු ලියමඬුල්ල ලෙස ගෙන එයට අමතන ව්‍යාජයෙන් ඔහු ගෙන් සමුගත්තා යැ,

**සන්තාපහාරක-** රජු හෝ ලියමඬුල්ල.

24 **අන්වය-** පක්ෂ්මලාක්ෂ්‍යාඃ අංගුලිසංවෘතා'ධරෝ'ෂ්ඨඃ ප්‍රතිෂේධා'ක්ෂර වික්ලවාභිරාමං මුහුඃ අංස විවර්ති මුඛං උන්නමිතං චුම්බිතං තු න. (ඖපච්ඡන්දසික)

**අර්ථ-** තමනිය ඇසි පිය ඇත්තිය ගේ ඇඟිලි වලින් ඇවුරූ යටි තොල් තිබූ ඇති ප්‍රතිෂේධ වදන් ගොත ගැසීම නිසා මනහර වූ විටින් විටැ දසරුව දෙසට හැරුණු මුහුණ (මා විසින්) කෙ සේ හෝ ඔසවන ලද්දේ නො සිඹිනා ලද්දේ නු.

25. **අන්වය-** ඉයං තස්‍යාඃ ශරීර ලුලිතා ශිලායාං පුෂ්පමයී ශය්‍යා. එෂ නලිනී පත්‍රෙ නඛෛඃ අර්පිතඃ මන්මථ-ලෙඛඃ. ඉදං හස්තාද් භ්‍රෂ්ටං බිසාභරණං ඉති අක්ෂ්ණඃ ආසජ්ජ-මානෙ ශූන්‍යාත් අපි වෙතස ගෘහාත් සහසා නිර්ගන්තුං න ශක්නොමි. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ-** මේ ඇ ගේ සිරුරින් මැඩුණු ගල් තෙලෙහි වූ මල් යහන යැ. මේ පියුම් පතේ නියෙන් ලියූ මැලැවුණු පෙම් පත යැ. මේ අතින් ගිලිහුණු නෙලුඹුදැලි වළල්ල යැ. මෙසේ ඇස හාත්පස යොමන කලැ මේ හිස් වූ වේතස ගෘහයෙන් පිට වැ යන්නට නො හැක්කේ වෙමි.

**පහදුව-** ශකුන්තලා නො පෙනී ගියා යැ. රජු ගේ සිත දුකින් වෙලුණේ යැ. එක්වර මැ ලියමඬුල්ලෙන් පිටවැ යාම ඔහුට කළ නො හැකි. හේ ලියමඬුව පිරික්සමින් සැතපුනි. ඇ වැතිර හුන් මල් යහන පසෙකින් ඔහුට පෙනේ. පියුම් පතැ ලියූ පෙම් පත තවත් පසෙක යැ. එයත් මැලවී ගොස් යැ. තවත් තැනෙකැ ඇගේ අතින් ගිලිහුණු නෙලුඹු දැලි වළල්ල යැ. ඇය පරිහරණය කළ මේ දේ දක්නා ඔහුට එසින් ඉවත් වැ යාමට සිත නො කියයි. ප්‍රියාව නැතත් ඇ පරිහරණය කළ දෑය දැකීමෙන් ඔහු ගේ සිත මඳක් සංසිඳුවා ගත හැකි හෙයිනි.

26. **අන්වය**- සායන්තනෙ සවනකර්මණි සම්ප්‍රවෘත්තෙ හුතාසනවතීං වෙදිං පරිතඃ ප්‍රකීර්ණාඃ; සන්ධ්‍යාපයොදකපිශාඃ පිශිතා'ශනානාං ඡායාඃ බහුධා භයං ආදධානාඃ චරන්ති (වසන්තතිලකා)

**අර්ථ**- සවසැ යාග විධි අරඹන කලැ ගිනි දැල් වූ පූජාසනය හාත්පස විසුරුණා වූ සැඳෑ වලා මෙන් කපෝවන් හුනයන් ගේ සෙවනැලි නන් අයුරින් බිය දනවමින් හැසිරෙයි.

**පහදුම්**- රජු ලිය මඩුවෙහි සුසුම් ලමින් කල් ගෙවයි. හිරු අවර ක්ෂිතිජය වෙත ළඟා විය. යාග විධි අරඹන කාලය එළඹිණි. පූජාසනය හාත්පස හෝම ගින්න ඇවිලී ගියේය. එවිට මැ රකුසන් සැඳෑවලා පැහැ ගත් සිය සෙවනැලි විහිදු වමින් නන් ලෙසින් තවුසන් බිය ගන්වමින් හැසිරේ යන හඬ ඉතා ඈතින් රජු ගේ කණැ වැකුණි.

## සිව් වන රඟය

1. **අන්වය**- අනන්‍ය මනසා යං විචින්තයන්ති තපොධනං මාං උපස්ථිතං න වෙත්සි සඃ බොධිතඃ අපි සන් ප්‍රමත්තඃ ප්‍රථමං කෘතාං කථාං ඉව ත්වාං න සමරිෂ්‍යති. (වංශස්ථවිල)

**අර්ථ**- බාහිර කිසිවකු නො හඟන සිතින් යමකු ගැනැ මැ සිතමින් තපස් මැ ධනය කොට ඇති මා (ළඟට) එළඹිත් නො දන්නී යැ. (තී විසින්) ඔහු සිහි කරවනු ලැබූවත් උමතුවා කලින් කළ කථා (සිහි නො කරන්නාක්) මෙන් තී සිහි නො කරන්නේ යැ.

**පහදුම්**- දුර්වාස ශකුන්තලාවන් වෙතැ පැමිණෙන විටැ ඇය ගේ පියවි සිහිය පලා ගොස් සැ. හිමියා ගැන මැ සිතමින් උමතුවූවක මෙන් සිටියා සැ. දුර්වාසයන් ගේ පැමිණීම ද ඇය නො දත් පිරූ ය. ඇය ගේ ඒ හැසිරීමෙන් කිපුණු දුර්වාස ඇය තමාට පිළිපන් සැටියෙන් ඈ ගේ සැමියා ඇයට පිළිපදීවා හි ඔහු ශාප කෙළේ ය. ඇය ද හිමියා වෙත

පැමිණි කලැ ඔහු ගේ පියෙවි සිහිය පලා යන්නේ ය. ඇය හා ඔහු හා අතර පැවති පෙම් පුවත්, සමාගමය හා ආවාහය ආදිය අමතක කරගන්නේ යැ.

**සවහන්- යං විචින්තයන්ති-** ශකුන්තලා යම් පුරුෂයකු ගැන සිතමින් සිටින බැව් දුර්වාස දත්තේ කෙසේ ද ? හේ ලොකතත්වය මැනැවින් දත්තකු විය. තරුණියක ගේ සිත එබඳු සිහිමුළා බවකට පෙරළෙන්නේ බෙහෙවින් පෙම්වතකු ගේ වියෝගයෙනැ යි සිතූ නිසා යැ. නොහොත් තපෝබලයෙන් ඈ ගේ සිතැ'ගි දත් සේ යැ.

**හද්ධි හද්ධි-** දුර්වාසයන් ගේ ශාපය ඇසීමෙන් බියට පත් යෙහෙළියෝ තම බිය මෙ සේ හඟවති.

**ණ හු ජස්සිං කස්සිං අපි-** සාමාන්‍ය කෙනෙක්-එ සේ මෙ සේ කෙනෙක් නො වෙයි.

**වටුලජ්ජුල්ල-** ඉමහත් වේගය-විදුලියට බඳු වේගය.

**කො අණ්ණො හුදවහාදෙ-** දහනයට සුදුසු ගිනි යැ. අන් කිසිවක් එයට නුසුදුසු යැ. එ මෙන් ශාපයට දුර්වාසයන් හැර අන් කවරෙක් සමත් වෙත් ද ?

**අග්ඝොදඅං-** ගරු කටයුත්තකුට පළමු වැ දෙනු ලබන පැන්. පා දෙවීම් ආදිය පිණිස පළමු පැන් පිළිගැන්වීම සිරිතෙකි.

**ගච්ඡාණද අග්ග-** ප්‍රාකෘතයෙහි නිපාත යෙදුම අනියත හෙයින් මෙ සේ යෙදෙයි. අන්ලෙත් යනු යැ වඩා සුදුසු අරුත.

**පබ්බවිඨං-** දුර්වාසයන් ගේ ශාපය නො වරදින බවට වූ නපුරු පෙර නිමිත්තෙකි.

**බහු එදං-** දුර්වාසයන් යම් ශාපයක් කෙළේ ද, එය ලිහිල් කැරිණි නම් එද වැඩියෙකි, එ බඳු ලිහිල් බවක් මින් පෙර නො කළ සේ යැ.

**දුහිදූ ජණස්ස**- කණ්ව ගේ දුව ඔහුට ද දුවක් වැනී යැ තවුස් නාවනට ඔවුන් ඇසුරෙහි වූවෝ දරුවන් සම්වෙතියි සැලකූ සේ යැ.

**සාහිණොවාආ**- මුදුව ඇ සතු හෙයින් ශාපයෙන් මිදීමේ උපාය ඇ සතු යැ යි ප්‍රියංවද සිතුවා යැ.

**ණො මුහෙ**- නෙ වැන්නකුට නො කියයුතු බැව් සැලකූ සැටි යැ.

**උණ්හොදඑණ**- උණු දියෙන් මල් තෙමීමෙක් නැති මැලැ වී විනාශවන හෙයිනි. ශාප පුවත ශකුන්තලාවනට කී නම් ඇය ද මැලැ වී-වියලී යනු නිසැක යැ. ඇය ගේ දිවියට අනතුරක් වෙතැ යි බියැ වුණු සේ යැ.

**විෂ්කම්භක**- මේ හුදු ප්‍රාකෘතයෙන් මැ කළ හෙයින් ශුද්ධ විෂ්කම්භකයෙකි. මෙහි "විචින්තයන්ති" යන සංස්-කෘත ශ්ලෝකයෙක් ද ඇති හෙයින් ශුද්ධ විෂ්කම්භකයෙක් නො වියැ හැකි ද? එය නෙපථ්‍ය භාෂිතයක් හෙයින් ශුද්ධ විෂ්කම්භකත්වය නො කෙලෙසෙයි.

**හන්ත**- බලාපොරොත්තු කඩවීම නිසා ඇති වූ ඛේදය හා බිය හැඟවීමට යෙදුනේ යැ. විදෙශයට ගොස් ආපසු පැමිණි කණ්ව තවුසාට ප්‍රභාතයෙහි කළ යුතු යාගකර්මය සඳහා සුදුසු වේලාව-යොග දැනගැනීමට අවශ්‍ය විය. ඔහු ඒ පිණිස සිසුවකු යෙදී යැ. අරුණ'එ නැගෙන තෙක් ඔහු නො පිබිදියේ යැ. හදිසියෙන් නින්දෙන් නැඟුණු හේ පහන් වූ බව දැක තැනි ගැනීම නිසා ඔහුට ඉබේ මැ "හන්ත" යැ යි කියැවිණි.

**අන්වය**- එකතඃ ඔෂධිනාං පතිඃ අස්තශිඛරං යාති. එකතඃ ආවිෂ්කෘත අරුණපුරඃසරඃ අර්කඃ [උදෙති] තෙජොද්වයස්‍ය යුගපත් ව්‍යසන උදයාභ්‍යං ලොකඃ ආත්මදශා'න්තරෙෂු නියම්‍යත ඉව. (වසන්තතිලකා)

**අර්ථ-** දෙසෙකින් තරුපති අත් ගිරි යෙයි. දෙසෙකින් පහළ වූ අරුණ'එ පෙරටු කළ හිරු (එයි) තෙදවතුන් දෙදෙන කුන් පිළිබඳ වැ එකවිටැ සෙදුණු උද-ව්‍යසනයන් ගෙන් ලොකය. සිය දිවියෙහි දු ඇති පෙරළිය පිළිබඳ වැ උවදෙස් ලබනු මෙනි.

**පහදුම-** සඳ රුයෙහි බබලයි. තරු ද රුයෙහි වේ. තරුනට මඩා ආලෝකයක් හා විශාලත්වයක් දරන හෙයින් සඳ තරුපති නම් තරුපති අලුය මැ අවරගිර දෙසට බසිමින් සිටි. ඒ හා මැ පෙර දිග දෙසින් අරුණ'එ පෙරටු කළ හිරු නැගෙමින් සිටි. හිරු-සඳු දෙදෙනා මැ තෙදවත්තු යැ. ලොව ආලොක කරන හෙයිනි. එක් තෙදවතකු ගේ ව්‍යසනයත් අනිකා ගේ උදවත් මෙසේ එක් වර මැ සිදුවී-මෙන් ලොවට උවදෙසක් ලැබෙයි. ඒ තමන් ගේ දිවියෙහි දු මෙ බඳු විපර්‍යාශ ඇතැ'යි ලෝ වැස්සන් ලවා මෙනෙහි කර-විමයි. එකකු ගේ අභ්‍යුදයට අනතුරු වැ තවෙකකු ගේ විනාශය ද, එකකු ගේ විනාශයට අනතුරු වැ තවෙකකු ගේ අභ්‍යුදය ද පවත්නා සැටි ලෝකයාට ලැබියැ හැකි පාඩමෙකි.

3 **අන්වය-** ශශිනි අන්තර්හිතෙ, සා එව කුමුද්වතී සංස්මරණීය ශොභා, මෙ දෘෂ්ටිං න නන්දයති. නූනං අබලා ජනස්‍ය ඉෂ්ටප්‍රවාෂජනිතානි දුඃඛානි අතිමාත්‍ර සුදුඃසහානි. (වසන්තතිලකා)

**අර්ථ-** සඳ අතුරුදගත් වූ කලැ එ මැ කුමුදු විල සැමැරියැ යුතු ශොභාවත් වූයේ (තව දුරටත්) මා ඇස නො පිනවයි. ඒකාන්තයෙන් අබලාවන් ගේ ඉෂ්ටප්‍රවාසයෙන් (ප්‍රිය විරහයෙන්) දනැවුණු දුක් ඉතාමත් මැ නො ඉවසියැ හැකි.

**සටහන්-** අන්තර්හිතෙ ශශිනි සෛව කුමුද්වතී- කුමුදු විල පුබුදු කෙළෙ සඳ යැ. එ සඳ අතුරුදහන් වී තිබේ. එ මෙන් ශකුන්තලා නමැ'ති කුමුදු විල පුබුදු කෙළේ දුෂ්‍යන්ත නමැ'ති සඳ යැ. ඔහු සිය රාජධානියට ගොස් හෙයින් ඔහු ද අතුරුදහන් වී සිටි,

**අසච්චසංධ-** "සංධා ප්‍රතිඥා මර්‍යාද" (අමර කොෂ) සංධා නම් ප්‍රතිඥයි. අසච්ච-බොරු, බොරු පොරොන්දු.

**අබ්හඤ්ඤී අදූ-** තවුසෝ ජන ශූන්‍ය වනයෙහි වෙසෙත් නෝ යැ. ඔවුනට විපතක් වන් කලැ එයට පිහිට වන්නන් වනයෙහි නැති එ සේ මැ වනය ද රජු සතු යැ. රජු මැ මේ විපත කළ හෙයින් පිහිටක් පතන්නට කෙනකු සිටියත් ඔහු ගෙන් ද එය ද නො ලැබේ.

**කොත්තු අං-** "කෞතුකං නර්මණිච්ඡායාමුත්සවෙ කෘතකෞමුදි, පාරම්පර්‍යාගතාඛ්‍යාති මඞ්ගලොද්වාහ සූත්‍රයොඃ" (හෙම) දූරියක සැමියා වෙත යවන කලැ කළ යුතු පාරම්පරික සිරිත්-විරිත් හා ආගමික ක්‍රියා.

**දිට්ඨි ආ ධුමා උළිද දිට්ඨිණො-** යජමානයා ගිතෙල් ඈ යාග ද්‍රව්‍යයන් ගින්නෙහි බහයි. ඉන් නැගෙන දූමින් ඔහු ගේ ඇස් පීඩාවට පත්වන හෙයින් ඇස් නො පෙනී යයි. එ සේ ද වුවත් අතැ වූ යාග ද්‍රව්‍යයන් හෙළියැ යුතු යැ. ඒවා බැහැර නො වැටී ගින්නෙහි මැ පිවිසිණි නම් ඒ දෛව මහිම යෙනි. එ මෙන් ශකුන්තලාවන් ගේ පාණිග්‍රහණ සිඩිය ද එ බඳු දෛව මහිමයෙකින් සිදු වූ නියා යැ.

**සුසිස්ස පරිදිණ්ණා-** යහපත් ශිෂ්‍යයකුට දුන් විද්‍යාව කිසි කලෙකැ නැවීමට හේතු නො වේ. ඔහු එය නො මහැ නො යොදන හෙයිනි. එ මෙන් සුදුසු හිමියකු හා විවාහ වූ සිය දියණිය නිසා ඔහුට ප්‍රීතියක් මිසැ දුකක් නො වේ.

**සංස්කෘතමාශ්‍රිත්‍ය-** අනුවාදයක් හෙයින් සකුවෙන් ගෙඳීම නාට්‍ය න්‍යායයෙකි. "කාරණාත් සංස්කෘතං ක්වචිත්" යී මාතෘ ගුප්තාචාර්‍යයෝ ද කී හු.

**4. අන්වය-** බ්‍රහ්මන්, තනයාං භුවඃ භූතයෙ දුෂ්‍යන්තෙන-නාහිතං තෙජඃ දධානාං ශමීං ඉව අග්නිගර්භාං අවෙහි. (අනුෂ්ටුභ්)

**අපි**– එම්බා බමුණ, (ඔබ ගේ) දුව ලොකාභිවෘද්ධිය පිණිස දුෂ්‍යන්ත විසින් පිහිටවූ තේජස් දරන්නී අග්නිගර්භවත් "සැමිගස" මෙන් දනුව.

**සවගත්**– තෙජඃ– තේජස්-රේතස් (ශමී-තේජස් ශකුන්තලා-රේතස්)

**භූතයෙ භුවඃ**– ශකුන්තලාවට ලැබෙන පුතු සක්විත් හකු වන බව හැඟ වූ සැටි යැ.

**ශමීමිව අග්නිගර්භාම්**– "භෘගො ශාපාද් භිතො ජාතවෙදෙ ප්‍රතාපවාන්, ශමීගර්භම්ථාසාද්‍ය තත්‍රාශ භගවාංස්තතඃ" යනාදී මහා භාරතෝ'ක්තිය පරිදි භෘගු නම් සෘෂින් ගේ "සර්වභක්ෂ වේවා" යන ශාපයට බිය වූ අග්නිය සැම ගසෙහි සැඟවුනේ ලු.

**උක්ඛංඨාසාහාරණංපරිතොසං**– ශකුන්තලා වෙන්වැ යාම නිසා කාන්සිය ද, ඇයට වන අභ්‍යුදය නිසා පරිතොෂය ද සම වැ නැඟී සිටි.

**තවස්සිණී**– "තපස්වී අනුකම්පා'භීා" (අමර කොෂ' අනුකම්පාවට සුදුසු තැනැත්තිය. අසරණිය. ශාපය ගැන සිතා මෙ සේ කිවා වියැ හැකි.

**මංගලසමාලම්භණාණී**– "සමාලම්භ්‍යතෙ භූෂ්‍යතෙ එභිඃ ඉති සමාලම්භනානි" මනාලිය පිණිස කළ යුතු සැරසිලි මඞගලසමාලම්භණ යන්නෙන් ගැනේ. "සමාලම්භණමාලෙපෙ තිලකෙලඞකෘතාවපි" සී කී හෙයින් ආලේප යන අරුත ද ගත හැකි.

**ශාර්ඞගරවමිශ්‍රාඃ** "ශාර්ඞගරවෙණ මිශ්‍රාඃ" ශාර්ඞගරව යන් හා මිශ්‍ර වුණු-එක් වුණු ශාර්ඞගරව ඇතුළු සෙස්සෝ. නැත හොත් "ශාර්ඞගරවඃ මිශ්‍රඃ-පූජ්‍යඃ-ප්‍රධානඃ යෙෂාං තෙ" ශාර්ඞගරව ප්‍රධාන වූයේ යම් පිරිසකට ද ඔවුහු ශාර්ඞගරව මිශ්‍රාඃ යන්නෙන් ගැනේ.

**හස්තිනාපුර-** මහාභාරත කථාවට අනුව හස්තිනාපුරය ගොඩ නැඟුවේ භරත රජු ගේ මී මුණුබුරකු විසිනි, (භරත-සුමන්‍යු-සුහොත්‍ර-හස්ති) එහෙයින් හස්තිනා පුර ගොඩ නැංවීමට පළමු සිදු වූ මේ පුවතෙහි ලා මේ නම යෙදීම නුසුදුසු යැ.

**සිහාමජ්ජිද-** "ශිඛායාං මජ්ජිතා, මජ්ජනං ස්නානං කාරිතා" මඞ්ගල අවස්ථාවල දී පමණක් හින්දු කන්‍යාවෝ හිස සිට නහති යි යෙති. එහෙයින් හිස් සෝද නහා යන අරුත් සුදුසු යැ යි හැඟේ.

**ගෝරොඅණං-** ඖෂධ පිණිසත් භූතොපද්‍රව දුරු කිරීම පිණිසත් ගොරොචන භාවිත කෙරේ.

**පඩිච්ඡිද ණීවාර හත්ථාහිං-** හුරු හැල් මඞ්ගලයෙහි හා යාගයෙහි ඉපිවිතුරු දූයක් ලෙස යෙදේ. හුරු හැල් නමින් ගන්නේ එයින් කළ විලඳ වියැ යුතු. ආසිරි පැතීම පිණිස විලඳ හිසෙහි දැමීම හින්දූන් ගේ සිරිතෙකි.

**සුහමජ්ජණං-** මඞ්ගලා'භිෂේකයක්. ඔබ දූත් ලැබූ මඞ්ගලා'භිෂේකය ඔබට සැප පිණිස පවතීවා" යි පැතූ සේ යැ.

**මාණසී සිද්ධි-** සිතින් මැවීම-කාණ්වයන් ගේ තපෝ මහිමයෙන් ඒ අබරණ මැවීයේ යි ගෞතමිය සිතුවා යැ.

5. **අන්වය-** කෙනචිත් තරුණා මාඞ්ගල්‍යං ඉන්දුපාණ්ඩු ක්ෂෞමං ආවිෂ්කෘතම්. කෙනචිත් චරණෝ'පභෝග සුලභඃ ලාක්ෂාරසඃ නිෂ්ඨ්‍යූතඃ. අන්‍යෙභ්‍යඃ ආපර්වභාගොත්ථිතෛඃ කිසලය උද්භෙද ප්‍රතිද්වන්ද්විභිඃ වනදෙවතා කරතලෛඃ නඃ ආභරණානි දත්තානි. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ-** කිසි රුකෙකින් මඞ්ගලයට සුදුසු වූ සඳ මෙන් සුදු දුහුලක් එළවිණි. අනිකෙකින් පා ගැල්වීම පිණිස අනගි ලතු දිය පහළ කැරිණි. සෙසු තුරුන් ගෙන් මැණික් කට්ටුව දක්වා එළියට නෙරුණු ළ දලු හා තරඟකාරී වන දෙවතාවන් ගේ අත්ලෙන් අපට අබරණ දෙවිණි.

**සංහෘත්- ආපර්භාගගොප්මෙතඃ-** වත දෙවියෝ සිය සිරුර මුළුමණින් නො දක්වා මැණික් කට්ටුව තෙක් සිය අත් පමණක් දක්වූ හ.

**කිසලයොද්භෙද ප්‍රතිද්වන්ද්විභිඃ-** ළ-දලු ඉතා රත් පැ යැ. වන දෙවිසන් ගේ අත්ල ළ-දලු වලට ද වඩා අධික රත් පැයෙන් යුතු යැ.

**මාඞ්ගල්‍ය-** . මගුලට සුදුසු හෝ ඉපිවිතිරියාව පිණිස දවලු හෝරොචනයෙන් ලකුණු කළ.

**චිත්තකාමපරිචජණ-** ඔවුන් මෙයට පෙර අබරණ පැළඳ හෝ පදවා නැති. එහෙත් සිතුවම්හි අබරණ පැළඳි කතුන් දක තිබේ. ඒ පුරුද්දෙන් සුදුසු තැන ඔවුනට මේ අබරණ පැළඳවීම උගහට නො වේ.

**6. අන්වය-** ශකුන්තලා අද්‍ය යාස්‍යති ඉති උත්කණ්ඨයා සම්පෘෂ්ටං හෘදයං කණ්ඨඃ සතම්භිත බාෂ්පවෘත්ති කලුෂඃ දශීතං චිතතාජඩං. අහො! අරණ්‍යෞකසඃ මම තාවත් ස්නෙහාත් ඊදෘශං වෛක්ලව්‍යං, ගෘහිණඃ තනෙ‍යෙඃ තනයා විශ්ලෙෂ දුඃඛෛඃ කථං නු පිඩ්‍යන්තෙ, (ශාර්දූලවික්‍රීඩිත)

**අර්-** ශකුන්තලා අද යේ යැයි දුකින් හද පැරෙයි. බොටුව තද වූයේ කඳුළු ගැලීමෙන් හිරවෙයි. පෙනීම (යැහීම්) දුකින් දුබල යැ. අහෝ! වන වැසි (කවුසතු වූ) මට ස්නේහය නිසා මෙ බඳු විපරීතයක් වී නම් ගිහියෝ (සිය) නවවූ දියණිවරුන් ගේ විරහ දුකින් කෙ සේ නම් නො පෙලෙති ද ?

**7. අන්වය-** ශර්මිෂ්ඨා යයාතෙඃ ඉව භර්තුඃ බහුමතා භව. ත්වං අපි සා ඉව පුරුං සම්‍රාජං සුතං අවාප්නුහි. (අනුෂ්ටුභ්)

**අර්ථ-** ශර්මිෂ්ඨා දේවිය යයාතී රජු ගෙන් මෙන් හිමියා ගෙන් බුහුමන් ලබන්නියක් වෙහි වා! තුබත් ඈ පුරු ප්‍රසූතා කළාක් මෙන් සක්විති පුතකු ලබහිවා !

**සමහන්-** **ශර්මිෂ්ඨා-** ශර්මිෂ්ඨා යයාති රජු ගේ දෙවන බිරිඳ යැ. ඇය ද ශකුන්තලා මෙන් ගාන්ධර්ව විවාහ විධියෙන් පාවා ගන්නා ලදී. ඈ ගේ ගුණ-දහම් නිසා ක්‍රමයෙන් හිමියා සිත් ගෙන අග බිසෝ බවට පත් වූවා. පුරුවංශයෙහි ආදිමයා වූ පුරු කුමරු ගේ මව ද මේ ශර්මිෂ්ඨා යැ.

8. **අන්වය-** අමී වෙදිං පරිතඃ ක්ලෘප්තධිෂ්ණ්‍යාඃ සමිද්ධවන්තඃ ප්‍රාන්තසංස්තීර්ණදර්භාඃ හවිඃ ගන්ධෛඃ දුරිතඃ අපඝ්නන්තඃ වෛතානාඃ වහ්නයඃ ත්වාං පාතු. (ත්‍රිෂ්ටුභ්)

**අර්ථ-** මේ පූජාසනය හාත්පස නියම තැන්හි වූ දර සහිත වටා විසුරුණු දර්භතණ ඇති යාග ද්‍රව්‍ය ගන්ධයෙන් දුරිත් මැ උවදුරු නැසෙන ශ්‍රෞත යාග වහ්නීහු ඔබ රකිත්වා.

**සමහන්-** **ක්ලෘප්ත ධිෂ්ණ්‍යාඃ-** පූජාසනය හාත් පස ත්‍රිවිධ අග්නි දැල්වීම පිණිස දර දැමීමට සුදුසු ස්ථාන පිළියෙල කොට ඇති හෙයින් ඒ ඒ ගිනිවලට නියම තැන්හි. ත්‍රිවිධ අග්නි නම්. ගාර්හපත්‍ය, ආහවනිය සහ දක්ෂිණ.

9 **අන්වය-** යුෂ්මාසු අපීතෙෂු යා ප්‍රථමං ජලං පාතුං න ව්‍යවස්‍යති. යා ප්‍රිය මණ්ඩනා'පි භවතාං ස්නෙහෙන පල්ලවං නා'දත්තෙ. වඃ ආද්‍යෙ කුසුමප්‍රසූති සමයෙ යස්‍යාඃ උත්සවඃ භවති. සා ඉයං ශකුන්තලා පතිගෘහං යාති. සර්වෛඃ අනුඥායතාම්. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ-** තොප නො පී කලැ යම් එකියක් දිය පිමට නො යා ද, යම් එකියක් සැරසිලි කැමතිවත් තොප කෙරෙහි ස්නෙහයෙන් ලපලුවකුදු නො කඩා ද, තොප ගේ පළමු මල් ගැන්මේ දී (පිදීමේ දී) යම් එකියකට උත්සව වේ ද, ඒ මේ ශකුන්තලා හිමි ගෙට යෙයි. සියල්ලන් විසින් අනුදනු ලැබේවා.

10 **අන්වය-** ඉයං ශකුන්තලා වනවාස බන්ධුභිඃ තරුභිඃ අනුමත ගමනා. තතඃ කලං පරභෘත විරුතං එභිඃ ඊදෘශං ප්‍රතිවචනීකෘතම්. (අපරවක්ත්‍රා)

**අර්ථ-** මේ ශකුන්තලාව වනවාසී නෑයන් විසිනු දු අනු දත් ගමන් ඇත්තී යැ. ඒ බැව් මිහිරි කොවුල් හඬින් මේ ගස් විසින් මෙ බඳු පිළිවදන් දිනි.

**ශටහන්-** **පරභෘතවිරුතං-** කණ්ව ශකුන්තලා-වන් ගේ ප්‍රශ්නයට අනුමතය දෙන සේ තුරුනට කියයි. එවිට මැ කොවුල් හඬක් නැගුණි. එය ඇය ගේ ගමනට රුක් ද අනුමතය දුන්නාක් මෙනි

11 **අන්වය-** කමලිනී ශ්‍යාමෛඃ සරෝභිඃ රම්‍යාන්තරඃ ඡායා ද්‍රැමෛඃ නියමිත අර්ක මයූඛතාපඃ, කුශෙශයරජෝ මෘදුරේණුඃ අස්‍යාඃ පන්ථාඃ ශාන්ත අනුකූලපවනඃ ච ශිවඃ ච භූයාත්. (වසන්ත තිලකා)

**අර්ථ-** විල් හරිතවන් ජලජ වලින් සිත් කලු මග'තුරු යැ සෙවනැ ති ගස් වලින් ප්‍රමිත වූ හිරුරැස් තවුල යැ. පියුම් රෙණු මෙන් මොළොක් රජසින් යුතු මැ ගේ ගමන් මාර්ගය ශාන්ත වූ ද, අනුකූල පවන් ඇත්තේ සුබ ද වෙයි.

**පහදුව-** වන දෙවියෝ ශකුන්තලාවන් ගේ ගමන් මාර්ගය මෙ සේ වණති. වන දෙපසැ තැනින් තැන විල් යැ. එහි පියුම් පතින් නිල්ල ගැසීමෙන් රම්‍ය වූයේ යැ. බහුල වැ වැවුණු ගස් නිසා සෙවනින් යුතු යැ. අව් රැසින් තැවීමෙක් එහෙයින් නැති. පියුම් රෙණු මෙන් ඉතා සියුම් වැල්ලෙන් සැරැසී සිටින මග පියුම් පිපි විල් ඇසුරැ කොට හමන මඳ සුළඟින් ද සුවඳ වත් යැ. උවදුරු රහිත හෙයින් නිසලව ද සෙවනින් යුතු හෙයින් නො වෙහෙසී ද ඇය ගේ මංගල ගමන යා හැකි. අනුකූල වූ ද, සුවඳ වත් වූ ද පවන ගමන් යන්නවුනට සුබ පෙර නිමිති යැ.

**සටහන්-** **රම්‍යාන්තරඃ-** කාලිදාසයන් . දවසැ වූ මාර්ගයන් ගේ තත්වය මෙයින් මැනැවින් පහදයි. මගීන් ගේ විඩා සංසිදෙන සේ මග දෙපස අද මෙන් ඡායා සම්පන්න ගස් සිටුවා තන්හි තන්හි ජලාශ පිහිටුවා තිබෙන්නට ඇති.

**කුශෙශයරජොමෘදුරෙණු**- "කුශෙශය රජඃ-කමල පරාගඃ ඉව මෘදුඃ රේණුඃ-වාලුකා යස්මින්" මගැ වූ පියුම් රේණු මෙන් මොලොක් දූවිලි නොහොත් "කුශෙශය රජසා මෘදු රේණු යත්‍ර" පියුම් රේණු හා මිශ්‍ර වූ මොලොක් දූවිලි.

**හරිතෛතඃ**- පියුම් විල් තිල්ල ගැසුනේ මේ කාලය තුළැ වැස්ස හෝ හිම පතනය නො වූ නිසා යැ.

12. **අන්වය**- මිඅා උග්ගලිඅ දබ්බ කවලා, මොරා පරිච්චත්ත ණච්චණා. ඔසරිඅ පංඩුපත්තා ලදාඕ අස්සු මුඅන්ති විඅ. (ආසීා)

**අර්ථ**- මුවෝ වැමෑරූ දර්භ තණ පිඩු ඇත්තාහු යැ. මොනරු දුරලූ නැටුම් ඇත්තා හ, හලනා පඬු පැහැපත් (ඉදුණු) පත් ඇති වැල් කඳුලු හෙළනු මෙනි.

**පහදුව**- ශකුන්තලා හිමි ගෙට යේ හවුස් වන හැර පියා. එය මුවන්හට ද දැනුණු සේ යැ. කටට ගත් දර්භ තණ පවා හෙලුයේ එ හෙයින් වියැ යුතු. වෙත ද පිල් විදහා රඟන මොනරු අද නිසල යැ. එහෙත් ද ? අචේතනික ලතාවනට ද මේ ප්‍රිය විප්‍රයොගය දැනී තිබේ. ඉදීමෙන් පඬු පැ පත් කඳුලු නියාවෙන් හෙළන්නාක් මෙන් දිසේ. ස්ත්‍රියක ගේ වියොමින් කඳුලු සලන්නෝ ස්ත්‍රීහු මැ යැ. එහෙයිනි ලතාවෝ මැ ඉදුණු පත්මය කඳුලු සලන්නෝ.

13. **අන්වය**-මයා තවාපි ප්‍රථමං එව සංකල්පිතං ආත්ම සදෘශං භර්තාරං ත්වාං සුකෘතෛඃ ගතා. ඉයං නවමාලිකා චූතෙන සංගතවතී. සම්ප්‍රති අහං අස්‍යාං ත්වයි ච වීතචින්තාඃ (වසන්තතිලකා)

**අර්ථ**- මා විසින් ඔබ උදෙසා පළමු වැ අදහස් කළ පරිදි තමාට සුදුසු හිමියකු වෙත ඔබ පෙර පිනින් පැමිණුනා. මේ නව මාලිකාව මී අඹ ගස හා එක්වුණි (එමෙන්) දැන් මම මේ වැල කෙරෙහි ද ඔබ කෙරෙහි ද සිතිවිලි රහිත වෙමි.

**පහදුව-** දියණියට සුදුසු හිමියකු ලබා දීම පිණිස දෙගුරුහු දිවා-රෑ වෙහෙසෙති. වැඩිවිය පැමිණි දියණිය පතිකුලයට යැවීමට ඔවුන් බැඳී සිටිනා හෙයිනි. කණ්ව ගේ සිතැ ද මේ ස්වාභාවික යුතුකම ඉටු කිරීමෙහි ලා බලවත් අභිලාෂයෙක් විය. එහෙත් ශකුන්තලාවන් ගේ පිනෙකින් මැ එය නිරුත්සාහයෙන් ඉටුවිණි. එමෙන් නවමාලිකා වැල ද කණ්ව විසින් රෝපණය කරන ලද්දකි. එය හෙවෙන්නට මැස්සක් බැඳුම හෝ සුදුසු ගසෙකැ එතිමට ලං කිරීම හෝ රෝපණය කළහු අයත් යුතුකමෙකි. එහෙත් එයට ද ඔහුට ඉඩෙක් නො ලැබුණු සේ යැ. නො වේ නම් වැලක් ගසකැ එතිම ස්වභාවයෙකි. ගස වැලෙහි සැමියා ලෙස සලකන හෙයිනි. නවමාලිකාව නොමෝ මැ අසලැ වූ මී අඹ ගසැ වෙලී හැස්වී සිටි. ශකුන්තලාව ද, නවමාලිකාව ද කණ්ව ගේ උත්සාහයක් නැති වැ මැ ඔහු ගේ අභිලාෂ සාධනය කොට සිටිනි. එහෙයින් දෙ දෙනා ගැන මැ ඔහු අපෙක්ෂා රහිත යැ, මැදහත් යැ,

**සටහන්-** **අඹං ජණො කාස්ස හත්‍ථෙ සමප්පිදෙ—** ශකුන්තලා ඇය හැදූ - වැඩූ ප්‍රිය වස්තූන් එකිනෙක සිය යෙහෙළියනට පවරයි. යෙහෙළියනට ද ඇය ප්‍රේම කරයි මහත් සේ. එහෙත් ඔවුන් පැවරීමට කෙනෙක් එහි නැති. මේ අප කාට බාර දෙන්නිදැයි යෙහෙළියෝ පිළිවිසිති.

**14 අන්වය-** යස්‍ය කුශසූච්විද්‍ධෙ මුඛෙ ත්‍වයා ව්‍රණ-විරොපණංඉඞ්ගුදීනාං තෛලං න්‍යසිඤ්චත. සඃ අයං ශ්‍යා-මාක මුෂ්ටිපරිවර්ධිතකඃ පුත්‍රකෘතකඃ මෘගඃ තෙ පදවිං න ජහාති. (වසන්තතිලකා)

**අර්ථ-** යමකු ගේ කුසතණ තුඩින් සිදුරු වූ මුවෙහි තුඹ විසින් අගුන ගෙඩිවලින් කළ ව්‍රණශාන්ති තෛලය ගැල්වී ද, ශ්‍යාමාක මිටි-කවා පුතකු මෙන් වැඩූ මේ මුව පොව්වා ඔබ පිය නො හරියි.

**15 අන්වය-** උත්පක්ෂ්මණොඃ නයනයොඃ උපරුද්ධ වෘත්තිං බාෂ්පං ස්ථිරතයා විහතා'නුබන්ධං කුරු. අලක්ෂිත නතොන්නත භූමිභාගෙ අස්මින් මාගේ තෙ පදානි විෂමී භවන්ති (වසන්තතිලකා)

**අර්ථ**- උඩට නෙරුණු පිය ඇති දෙ නෙතින් වළහන ලද කඳුලු තර වූ තැසුණු අනුබැඳීම් ඇත්තක් කරව. නො පෙනෙන වල් හා ගොඩැලි සහිත බිම් පියෙස් ඇති මේ මාර්ගයේ දී තිගේ පා විසම බවට පැමිණියැ හැකි.

**පහදුව**— ශකුන්තලා ප්‍රියයන් ගෙන් වෙන් වැ සුපුරුදු අසපුවෙන් ඉවත්වැ යාම නිසා හටගත් දුක් ඇත්ති යැ. එය සිහි කරන ඇය ගේ ඇස් කඳුලින් පිරී ඇසිපිය නො ගසා හැරුණු ලෙසින් මැ තිබේ. එය කණ්වයනට ද රහසක් නො වී යැ. ඇය ගමන් කරන මාර්ගය විෂම යැ. වල්-ගොඩැලි ගල්-මුල්වලින් යුතු යැ, ඇස් කඳුලින් පිරී තිබෙන කලැ පෙනීම දුර්වල වන හෙයින් මාර්ගය නොපෙනි යා හැකි. එසේ වුවොත් වල් -ගොඩැලි ගල්-මුල්වල හැපී ඇයගේ පා තුවාල වීමට හැකි යැ. පා පැකිළී වැටීමට ද හැකි කරුණු මෙසේ හෙයින් ඇඬීම නවත්වන්නට යැ යි ඇයට අවවාද කරයි.

**සටහන්**- **උත්පක්ෂමණොඃ**- "උද්ගතානි- පක්ෂමානි යයොඃ" හැරුණු නෙත් ඇති.

**අනුබන්ධිම්**-නො කඩවා වැගිරීම, යළි යළි කඳුලු ඉණීම.

**ඔදකාන්තම්** - "උදකාන්තං මසීාදිකෘත්‍ය ඔද කාන්තම්" (ආ-උදකාන්තාම්-ඔදකාන්තම්) ප්‍රිය නෑයන් විසින් පසු ගමන් කළ යුත්තේ ජලාශයක් හමුවන තෙක් පමණි.

**ක්ෂීරවෘක්ෂ**- කිරිගස්, ක්ෂීරවෘක්ෂ නමින් නුග-කිරිපලු, උදුම්බර, ඇසතු සහ මි යන රුක් ගැනේ. ක්ෂීරවෘක්ෂ ඡායා සම්පන්න -සෙවන බහුල හෙයින් එබඳු තැනකට යාමට කණ්ව රිසි විය.

(16) **අන්වය**- එසා වි පිළුණ විණා විසඅදිහඅර රඅණිං ගමෙඉ. ආසාබංධො ගරුඅං විරහ දුක්ඛං සහාවෙදි. (ආසීා)

**අර්ථ-** මැය ද ප්‍රියයා ගෙන් වියෝ වැ විෂාදයෙන් දිගු රැය ගෙවයි. ප්‍රේම බන්ධනය මහත් වුවහොත් විරහ දුක ඉවසයි.

**පැහැදුම-** ප්‍රේමයෙන් සක්වා ලිහිණියනට වැඩි කෙනෙක් නැති. ඔවුහු රැයෙහි වෙන්ව, දවල එක් වැ වෙසෙති. වියෝගය නිසා මුළු රැය දුකින් හඬ නලමින් මැ ගත කෙරෙති. ප්‍රේමය කොතරම් මහත් වුවත් විරහ දුක ඉවසමින් රැය ඉක්මවති. එකකු මළ කලැ අනිකා ද දුකින් වැලැපැ මිය යෙති'යි යෙති.

**සටහන්-** 'පිජණි විනා- සීතා හරණයෙන් සොවට පත් රාමයන් දැක මේ ලිහිණියෝ සිනා සී ල එයින් කෝපයට පත් රාම ඔවුනට මෙ බඳු වියෝවක් වේවා යි ගැරිලි කෙළේ ලු.

**විෂාද දිඝඅරං-** ශෝකය දික් යැ ප්‍රීතිය කෙටි යැ.

**17. අන්වය-** අස්මාන් සංයමධනාන් ආත්මනඃ උච්චෛඃ කුලං ච ත්වයි අස්‍යාඃ කථමපි අබාන්ධවකෘතාං තාං ස්නෙහ ප්‍රවෘත්තිං ච සාධු විචින්ත්‍ය ත්වයා ඉයං සාමාන්‍ය ප්‍රතිපත්ති පූර්වකං දාරෙෂු දෘශ්‍යා, අතඃ පරං භාග්‍යායත්තං. තද් වධූ බන්ධුභිඃ න ඛලු වාච්‍යම්. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ-** සංයමය ධනය කොට ඇති අප ගැන ද ඔබ ගේ කුලවත් බව ද ඔබ කෙරෙහි කෙසේ වත් නෑයන් විසින් නො කළ විරූ ඇගේ ප්‍රේමය ගැන ද, මැනැවින් සිතා ඔබ විසින් මැය බිරියන් අතුරෙන් සාධාරණ සැලකුම් ලබන්නියක හැටියට රැකැ බලා ගන්නැ. ඉන්පසු (වන්නක්) භාග්‍යය සතු යැ. එය සැබැවින් බිරිය ගේ නෑයන් ලවා නො මැ කියැ වියැ යුතු යි.

**සටහන්-** **සංයමධනාන්-** සංයමය නම් ආත්ම දමනය යි. හෙවත් චිත්තසමාධි යයි තවුසන් සතු ධනය ද එය යි. ශකුන්තලා වෙනුවෙන් දෑවැද්දක් දියැ යුතු වුව ද එය

නො දියැ හැක්කේ ලෞකික ධනයක් ඔවුනට නැති හෙයිනි තවුසන් නිර්ධනයන් යැ යි රජු දන්නා බැවි කණ්වයනට නිසැක යැ. එසේ දයාද රහිත වැ මැ ඇය එවීම නිසා ඇයට නො තිසි ලෙස නො සලකනු මැනැවැ යි සලකන නිසාවෙනි. එසේ මැ ඈ බිරිය සේ නො ගෙන බැහැර ලීමට ද රජුට හැකි හෙයින් "සංයමධනාන්" යන පදය යෙදුවා විය හැකි. පෙරැ මැ කී පරිදි "ගුඪං හි දහාත්මකමස්ති තෙජඃ" යනුවෙන් රජු මැ දන්නා සැටියෙන් එ වැනි දූයක් වී නම් තවුසන් ගේ ශාපය වෙසෙසින් කණ්වයන් ගේ ශාපය රජුට එන බැව් හඟවා කී සැටි යැ. එ සේ මැ, කණ්වයන් අසපුවෙහි නැති අතර යැ දුෂ්‍යන්ත ශකුන්තලාවන් ආවාහ කෙළේ. එයට ඔහු ගේ සතුට ලබා ගනු නො හැකි විය මේ නිසා කණ්ව දුෂ්‍යන්ත හා කෝපයෙන් සිටී දෝ යි ඔහුට සැකුස් ඇති වියැ හැකි හෙයින් තමා කෙරෙහි එ වැනි කෝපයක් නැතැ'යි හැඟවීම හෝ "සංයමධනාන්" යන්නෙන් අදහස් කළා වියැ හැකි.

**උච්චෛඃ කුලම්**- උසස් කුලවතුන් නො හොබිනා කම් නො කෙරෙති. යුතුකම මැ ගරු කෙරෙති; පිළිණ කඩ නො කෙරෙති. දුෂ්‍යන්ත ද උසස් කුලවතකු හෙයින් තමා නිසා අනාථ වූ ශකුන්තලාව බැහැර නො කොටැ සිය පිළිණයට අනුව ඇය පිළිගනිති'යි සිතන බැවි කණ්ව මෙයින් ද හඟවයි.

**අබාන්ධව කෘතාම්**- දුෂ්‍යන්ත-ශකුන්තලා විවාහය නෑයන් ගේ අනු දැනීමක් නැති වැ කැරුණෙකි. එහෙයින් ඒ පිළිබඳ වැ පැන නගින හැම දෙයකට මැ මුහුණ දියැ යුත්තේ ඔවුන් දෙදෙනා මැ යැ.

**ස්නේහ ප්‍රවෘත්තිම්**- ඔවුන් ගේ සම්බන්ධය වූයේ ඔවුන් ගේ මැ ප්‍රේමය නිසා යැ.

**සාමාන්‍ය ප්‍රවෘත්ති පූර්වකම්**- කණ්ව සිය දූව පිළිබඳ වැ විශෙෂ සැලැකිලි බලාපොරොත්තු නො වේ. රජුට බොහෝ බිරියන් ඇති බැව් හේ දනී. ඒ බිරියනට මෙන් සමාන සැලැකුම් කරන සේ සලකවයි,

**භාග්‍යායත්තම්**- විශෙෂ සැලකිලි-බුහුමන්-පදවි ඇ ලැබෙතොත් ඒවා ඇය ගේ භාග්‍යය-වාසනාව අනුව මතු සිදු විය හැකි.

18. **අන්වය**- ගුරූන් ශුශ්‍රූෂස්ව, සපත්නී ජනෙ ප්‍රිය සඛීවෘත්තිං කුරු. භර්තුඃ විප්‍රකෘතා අපි රොෂණතයා ප්‍රතීපං මා ගමඃ. පරිජනෙ භූයිෂ්ඨං දක්ෂිණා භව; භාගෙ‍ය්‍යෂු අනුත්සෙකිනී [භව] එවං යුවතයොඃ ගෘහිණීපදං යාන්ති. වාමාඃ කුලස්‍ය ආධයඃ. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ**- වැඩි හිටියනට කීකරු වෙනු. සපත්නීන් කෙරෙහි ප්‍රිය යෙහෙළියනට මෙන් පිළිපදිනු. හිමියා නො හොබනා ලෙස සැලකුවත් තරහෙන් ඔහුට විරුද්ධ වැ නො යනු. පිරිවර ජනයාට ත්‍යාගවතියක් වෙනු. සම්පත්තියෙහි දී ගර්වයෙන් **නො දපෙනු.** මෙසේ තරුණියෝ ගෘහිණී පදවියට යෙති. සත්‍රිහු කුල පිළිල වෙති.

**සටහන්- සඛී ජනෙ ප්‍රිය සඛී වෘත්තිං කුරු**- සිය සැමියා අන් ඉතිරියක දෙස බැලීම ද බිරිය නො රිස්නීය. සතා කිරීම ගැන කවර කතා ද,එ බඳු අන් ඉතිරියක සිය බරුවා ගේ මැ බිරිය වීම ගැහැණියක් කෙසේ ඉවසා ද, රජවරුනට බොහෝ බිරියෝ වෙති. රජු එක් බිරියක හා ඇලෙන කලැ අන් බිරියෝ ගැහැණු ගතිය නිසා ඇයට ඊර්ෂ්‍යා කෙරෙති. රජුට ද වෛර කරති. කරණු මෙසේ හෙයින් ඇ ලා යෙහෙළියන් සේ සිතා පිළිපදිතොත් ඊර්ෂ්‍යාවකට හා වෛරයකට ඉඩ නො ලැබේ. එ කලැ ඔවුනොවුනට සාමයෙන් කල් ගෙවිය හැකි.

**සපත්නි**- "සමානං පත්නී යස්‍ය සා" එක් බරුවකුට බොහෝ බිරියන් ඇති කල ඇලා ඔවුනොවුනට සපත්නී යැ.

**මාස්ම ප්‍රතීපං ගමඃ**- සවාමියා ගෙන් වරදක් සිදු වූ කලැ එයට පලිගන්නට යාමෙන් අඹු-සැමියන් අතර භේදය දියුණු විම නියති. එහි අවසානය ඔවුන් ගේ වෙන්වීම හෙයින් සවාමියා ගේ වරද ඉවසීම පවුලේ සමගිය පවත්වා ගැනීමට හේතු වෙයි,

**භූයිෂ්ඨා භව දක්ෂිණා පරිජනෙ-** සේවකාදීනට පරිත්‍යාග ශිලී වීමෙන් ඔවුන් වඩාත් ස්වාමිනියට ප්‍රිය කෙරෙති. එකලැ ඔවුහු භක්තිමත් වැ ඇය පිළිබඳ සියල්ල කෙරෙති.

**අනුත්සෙකිනී-** "න උත්සෙකඃ අවලෙපඃ විද්‍යතෙ අස්‍යාඃ සා "වෙසෙසින් කාන්තාවෝ අහංකාරයෙන් යුතු යැ. එ වැනි කාන්තාවෝ ඉසුරින් ආඪ්‍ය වූ කලැ සිය ගුණයෙන් අහංකාර වෙති. ශකුන්තලාවන් ගැන සලකන කලැ දුක් සහිත තවුස් දිවියක් ගත කළ කාන්තාවෙකි. ඇය සැපයෙන් ආඪ්‍ය වූ කල එයින් මත් වී යනු තියති. ඉයට ඉඩ නො තබනු පිණිස කණ්ව මෙසේ කියයි.

**ගෘහිණීපදඃ-** ගෘහිණී යන අධිකාරය හෝ උපාධිය ස්ත්‍රියක විසින් ලැබිය හැකි ඉතා උසස් ගරු නාමයෙකි. ගෘහිණී නම් ගෙදර ප්‍රධාන තැනැත්තී යැ පෙර කී උවදෙස් අනුව පිළිපදින කාන්තාව ගෘහිණී නමින් හඳුන්වති. මෙය ද සලකන්නැ. "න ගෘහං ගෘහමිත්‍යාහුර් ගෘහිණී ගෘහමුච්‍යතෙ ගෘහන්තු ගෘහිණී හිනං කාන්තාරාදතිරිච්‍යතෙ"

**කුලස්‍යාධයඃ-** "ආධිර් මානස පීඩායාං ප්‍රත්‍යාශායං ච බන්ධනෙ ව්‍යසනෙ චාප්‍යධිෂ්ඨිතෙ"යි කී හෙයින් ත්‍රාසනය හෝ විනාශය යන අරුත් මෙහි ලා සුදුසු යැ. පෙරළ කී ලෙස ක්‍රියා නො කරන ස්ත්‍රිහු තම කුලය විනාශ කරන්නියෝ වෙති.

19. **අන්වය-** අභිජනවතො භර්තුඃ ශ්ලාඝ්‍යෙ ගෘහිණීපදෙ ස්ථිතා තස්‍ය විභව ගුරුභිඃ කෘත්‍යෛඃ ප්‍රතික්ෂණං ආකුලා අචිරාත් ප්‍රාචී ඉව අර්කං පාවනං තනයං ප්‍රසූය; වත්සෙ, මම විරහජාං ශුචං ත්වං න ගණයිෂ්‍යසි. (හරිණී)

**අර්ථ-** කුලවත් හිමියා ගේ ඉතා උසස් ගෘහිණී පදවියෙහි සිටියේ; ඔහු ගේ සම්පත් බරින් වූ කටයුතු වලින් නිතර ආකුල වූවා නො බෝ කලෙකින් පෙරදිග හිරු (උදකරන් නාක් මෙන්) පින්වත් දරුවකු බිහිකොට, දියණියෙනි, ම ගේ වියෝගයෙන් වූ ශොකය නුඹ නො සලකන්නෙහි යැ.

**සටහන්-** අභිජනවතඃ- කුලවත් අන අරුත මෙන් මැ පිරිවර ජනයා ඇති යන අරුත ද දෙයි

**යුගාන්තර-** "අන්‍යත් යුගම් යුගාන්තරම්" යුග යනු "ප්‍රහර" තුනකින් හෙබි කාල මිණුමෙකි. දිනය යුග අටකට බෙදු තිබේ. 6 සිට 9 තෙක් එක් යුගයෙකි. එය ගෙවී-ගිය බැවින් නවත් යුගයක් එළඹ තිබෙන බව කී සැටි යැ. දුවල වන කල අව්ව තද විය හැකි හෙයින් යාමන් අපහසු වෙයි. කල් නො මරා පිටත් විය යුතු බැව් ශාර්ඞගරව අදහස් කරයි.

20. **අන්වය-** චිරාය චතුරන්තමහීසපත්නී භූත්වා අප්‍රතිරථං දෞෂ්‍යන්තිං තනයං නිවෙශ්‍ය තදර්පිතකුටුම්බභරෙණ භර්ත්‍රා සාර්ධං අස්මින් ශාන්තෙ ආශ්‍රමෙ පදං කරිෂ්‍යසි. (වසන්තතිලකා)

**අර්ථ-** බොහෝ කලක් සිව්-සයුරු හිමි කොට ඇති පොළොවට සපත්නියක් වැ අනභිභවනීය රිය ඇති අසම වීර දුෂ්‍යන්ත පුතු පිහිටුවා එකල් හී බහා තැබූ සම්පත් බරින් යුතු හිමියා සමග මේ ශාන්ත වූ අසපුවෙහි යළිත් පා තබන්නෙහි.

**පහදුව-** ශකුන්තලා ඒකාන්තයෙන් දුෂ්‍යන්තයන් ගේ අග මෙහෙසී වන බව කණ්ව දනියි. ඇ හා සමාන තවත් පත්නියක් ඔහුට සිටී. ඇ නම් සිව් සයුරෙන් වට වූ මිහිකත යි. දෙදෙනා මැ දුෂ්‍යන්ත ගේ පත්නියන් හෙයින් එකිනෙකාට ඔවුහු සපත්නිහු වෙති. මෙ සේ දිගු කලක් ගෙවෙත් මැ දුෂ්‍යන්තයන් ගේ පුත් තිසි වියට පැමිණෙයි. එකලැ සියලු සම්පත් බර පියා ගෙන් පුතුට පැවරෙයි. ඒ ශකුන්තලාවට ආපසු සිය අරමට පැමිණීමට කාලය වේ. පෞරවයෝ මහලු විය ගෙවන්නෝ වානප්‍රස්ථ නම් තුන් වන ආශ්‍රමයෙහි හෙයිනි.

**සටහන්-** දෞෂ්‍යන්තම්- "දුෂ්‍යන්තස්‍ය අපත්‍යං පුමාන්" දුෂ්‍යන්තයන් ගේ පුත් දෞෂ්‍යන්ත යි.

**අප්‍රතිරථං**– "න විද්‍යතෙ ප්‍රතිරථඃ යස්‍ය" ප්‍රතිවිරුද්ධ රියක් නැති. භරත කුමරුට ප්‍රති විරුද්ධ වැ නැඟී සිටින්නට හැකි පිළිමලෙක් නැති.

**නිවෙශ්‍ය**– "නිවෙශං ශිබිරෙද්වාහ වින්‍යාසෙෂු ප්‍රකීර්තිතාඃ (විශ්ව) කී හෙයින් "නිවෙශ්‍ය" යන්නෙන් විවාහය. දුෂ්‍යන්ත පුතු පිහිටුවීම යන දෙ අරුත මැ එයි. "තදර්පිත කුටුම්බභරෙණ" යනු තෙ වන පදයෙහි එන හෙයින් විවාහයෙන් පසු සම්පත් භාරය පවරණ හෙයින් විවා මඟුල් කොටැ යන අරුත ද සුදුසු යැ යි හැගේ.

21. **අන්වය**– වත්සෙ, ත්‍වයා රචිතපූර්‍වං උටජද්වාරි විරූඪං නීවාරබලිං විලොකයතඃ මම ශොකඃ කථං නු සමමෙෂ්‍යති." (ආර්‍යා)

**අර්‍ථ**– එම්බා දියණියෙනි, නුඹ විසින් පෙර පුදන ලද්‍ව පැල් දොර වැඩුණු පූජා පිණිස වූ හුරු හැල් බලන්නා වූ ම ගේ ශෝකය කෙසේ නම් සංසිඳේ ද ?

22. **අන්වය**– කන්‍යා පරකීය එවහි අර්ථඃ. තාං අද්‍ය පරිග්‍රහීතුං සම්ප්‍රෙෂ්‍ය අයං මම අන්තරාත්මා ප්‍රත්‍යර්පිතං න්‍යාස ඉව ප්‍රකාමං විශදෙ ජාතඃ (ඉන්ද්‍රවජ්‍රා)

**අර්ථ**– කන්‍යාව අනුන් සතු මැ වස්තුවෙකි. ඈ අද හිමියා වෙත යවා මේ ම ගේ අධ්‍යාත්මය අනුන් සතු දෙය නැවත හිමියකට දුන්නාක් මෙන් අතිශයින් නිශ්චල විය.

**පහදුව**– කන්‍යාව වස්තුවක් සම යැ. කොතරම් ප්‍රේමයෙන් සුව දෙවමින් වැඩුවත් පුරුෂයකුට පාවා දියැ යුතු යැ එහෙයින් ඇය අනුන් අයත් වස්තුවක් සේ යැ. එ බඳු පරකීය වස්තුව ස්වාමි පුරුෂයා වෙත යැවීමෙන් කණ්වයන් ගේ සිතට ඇත්තේ මහත් සැනසීමෙකි. කෙබඳු සැනසීමෙක් ද? තමන් වෙත ආරක්ෂා පිණිස තැබූ ධනය එය හිමියාට මැ බාරදීමෙන් පසු කෙනකුට යම් බඳු සැනසීමෙක් වේ ද, එ බඳු සැනසීමෙකි ඔහුට ඇත්තේ,

**සටහන්- පරිගෘහීතා-** "සප්තපදී නම් හෝම පූජාව පවත්වන කලැ එහි දල් වූ ගින්න පැදකුණු කරමින් කිරිඳ ලබා ගන්නා හෙයින් බරුවා පරිග්‍රහීතා නම් වේ.

## පස් වන රඞ්ගය

**සටහන්- කල විසුද්ධාඃ-** "ධ්වනෞතු මධුර ස්ඵුටො කලඃ" (අමර) කල-මිහිරි නො පැහැදිලි ශබ්දය, විසුද්ධ පිරිසුදු-අනුකූල ශුද්ධා නම් ගී වෙසෙසක්.

**ස්වරසංයොග-** සංගීත ස්වරයන් ගේ සම්බන්ධය. සංගීතරත්නාකරයෙහි ගීතස්වරය "ගීතයඃ පඤ්ච ශුද්ධාඛ්‍යා භින්නා ගෞඩා තිවෙසරා සාධාරණී විශුද්ධාස්‍යාදවක්‍රෙ ලලි- තෛඃ" සි පස් පරිද්දෙකින් දක්වා ඇති.

1 **අන්වය-** අභිණව මහුලොලුවො තුමං චූදමංජරිං තහ පරිචුංබිඅ කමල වසතිමෙතනණිව්වුදෙ ණං කහං විම්හ- රිදෙ සි. (අපරවක්ත්‍ර)

**අර්ථ-** එම්බා බමර, නව මල් මිහිරෙහි ලොල් තෝ මී අඹ මල් පොකුර එසේ (සිත් සේ) සිඹැ, නෙලුම් මලැ විසුම් ගත් පමණින් ප්‍රීතවැ එය (ඇ) කෙසේ නො සමළෙහි.

**පහදුව-** හංසපදිකා කලක් රජු ගේ ප්‍රේමයට ලක් වූ බිසවකි. දැන් රජු ඇය ගැන නො සලකා වසුමතී දේවිය යා කල් ගෙවයි. රජ තෙමේ රසිකයකු හෙයින් මෙ සේ නව නව රස සොයනු වියැ හැකි. ඔහු ගේ මේ පැවැත්ම හංසපදිකාව ගේ අමනාපයට හේතු විය, අප්‍රසාදය කෙළින් පළ කිරීමට බිය වූ හෙයින් දෝ ඔහු ගේ ක්‍රියාවේ අයොග්‍ය- ත්වය මෙසේ ව්‍යඞ්ගයෙන් බමරකු ලක් කොටැ කියාපායි කෙසේ ද, බමරා ද නව-නව රස සොයා යන්නෙකි. වරෙක ඌ අඹමල් පැණි උරයි. පියුම දුටු කලැ අඹමල හැරැ එයට පිවිසෙයි; පිවිසැ එහි මැ ඇලී සිටියි. පෙර රස විඳි අඹමල

ගැන නිකමට වත් නො සිතයි. පියුම් රසයෙන් මත්වී සිටින හෙයිනි. බමරාට සිදු වූ දෑ මැ රජුට ද සිදු වී ඇතැ'යි මෙසේ හංසපාදිකාවෝ අරුත් වලහා කියති.

**සටහන්-** මහුඅර- "මධුව්‍රතෙමධුකරඃ කාමුකෝ'පි ප්‍රකීර්තිතඃ" (විශ්ව) බමරා කාමුකයා යන අරුත් දෙකට මැ සාධාරණ යැ.

**චූදමංජරිං-** මී අඹ මල් කැන. හංසපදිකාවට උප-මිත යැ.

**කමලවසතිමෙත්ත-** කමල හෝ වසුමතිය හා විඳුම්ගත් පමණින්.

**නිපුණමුපාලබ්ධො'ස්මි-** හමර ව්‍යාජයෙන් නමුත් බුහුටි වැ රජු උපහාසයට ලක්කළා යැ. රජු ගේ සිත ලජ්ජාවෙන් පිරී සෝ දැනවිය.

**ශබ්දස්ස......** **මොකෙබා**- හංසපදිකාව ඇගේ නියමය ලෙස සිය සේවිකාවන් ලවා කෙස්වලුයෙන් අල්වා ගෙන තමාට තලති'යි විදූෂක බිය වූයේ යැ. එසේ වුවොත් අප්සරාවකට අසු වූ වීතරාගියකුට මෙන් ඔහුට මිදීමෙක් නැති. දෙවඟනක ගේ වශයට ගිය පසු මොක්ෂය පිළිබඳ බලාපොරොත්වක් නැති. බඹසර එකතින් බිඳී යන තිසා යැ. මෙහි "මො-කෙබා" යනු විදූෂක හා බැදෙන්නේ හංසපාදිකා දේවීන් ගේ සේවිකාවන් ගෙන් මිදීම යන අරුත දීම සඳහා යැ. මොක්ෂය හෙවත් නිර්වාණ යන අරුත බැඳෙන්නේ වීතරාග යන පදය හා යැ,

**සාගර්**— රාජ නියමය නිසා උල්ලඞ්ඝනය කළ ද නො හැකි. හංසපාදිකාවන් වෙත ගිය කල්හි කුපිත අන්ත-වරයකට මුහුණපාන්නට වේ දෑ යි ද, සිනි යැ නො හැකි. එහෙයින් ඔහුට මෙ බඳු තැනෙක දී ලැබෙන පිහිටක් නැති නියා යැ,

**ඉෂ්ටජනවිරහාදතෝ'පි-** ප්‍රිය විප්‍රයෝගයක් ගැන රජුට හැඟීමෙක් නැති. එසේ නැති වත් එබන්දක් වූවකුට මෙන්, හංසපදිකාවන් ගේ ගීතයට කන්දුන් පසු රජුට ඇති විය. දුර්වාස ගේ ශාපය ක්‍රියාවට නැඟී ඇති හෙයින් ශකුන්තලාවන් ගැන ඔහුට මතකක් නැතත්, ප්‍රිය විප්‍රයොගයෙකැ අනුමානාත්මක වේදනාවක් ඔහුට දැනවිය.

2 **අන්වය-** යත් සුඛිතඃ අපි ජන්තුඃ රම්‍යාණි වීක්‍ෂ මධුරාන් ශබ්දාන් ච නිශම්‍ය පර්‍ය්‍යුත්සුකීභවති. තත් නූනං භාවංස්ථිරාණි ජනනාන්තරසෞහෘදනි චෙතසා අබොධපූර්වං සමරති (වසන්තතිලකා)

**අර්ථ-** යම් හෙයකින් (කලෙකැ) සුඛිත ජනයා ද රමණීය දෑ බලාත්; මිහිරි හඬ අසාත් මහත් සේ නලංගු වේ ද, එ ලෙසින් ඒකාන්තයෙන් පෙරැ වාසනාවෙන් සාවැදුණු (තර වූ) අන් ජීවිතයන් අතරැ වූ සුහදතා සිතින් (පෙරැ මැ) සිහි නො කළ ද (පසු වැ) සිහි කරති.

**පහදුව-** හංසපදිකාව ගේ ගීතය කණැ වැකුණු ඇසිල්ලේ සිටැ රජු ගේ සිතැ අපූර්ව නලංගු බවෙක් විය. ඉෂ්ටජන විරහ පිළිබඳ වැ නම් ඔහුට බෙහෙවින් පුරුදු ඇතත්, මේ සා සිත නො සන්සුන් වීමක් මෙයට පෙරැ නො වූ විරූ ය. මේ අත් බැව්හි දී මෙ වැනි තත්වයක් ඇති කළ හැකි සිදුවීමක් ගැන ඔහුට සිහි කළ නො හැකි. එහෙයින් හේ පෙරැ ආත්මයෙකැ පුරුදු කමක් නිසා 'එය වියැ හැකි'යි සිතන්නේ යැ. එයට දෘෂ්ටාන්තයක් ද පිළිසරණ කොට ගත්තේ යැ. පෙරැ මනහර රූ ද මියුරු හඬ ද බෙහෙවින් විඳි සැපවත් මිනිසා, අහම්බෙන් මුණ ගැසුණු මනහර රුවක් නිසා හෝ, කනැ වැකුණු මිහිරි හඬක් නිසා හෝ උකටලී වෙයි. ඒ ගැන මැ සිතමින් කල් ගෙවයි. එයට හේතුව පෙරැ ආත්මයන් හා බැඳි වාසනා හෙවත් පුරුදු කම් වියැ හැකි. පූර්ව ජාතීන්හි වූ අන්‍යෝන්‍ය සම්බන්ධය සිතෙහි කා වැදී තිබෙන හෙයින්. පළමු වැ මැ ඒ සුහදතා පිළිබඳ සිහි නො වෙතත්, පසු-පසු වැ

සිහියට ඊම සිරිතෙකි. තමාට ද එබඳු සිත් තැවුලක් වූයේ පෙරළ ආත්මයක් හා බැඳි සිතැ තිදන් වූ සුහද බවක් ඇවිස්සී මෙතැ'යි රජු සිතූ සේ යැ.

**සටහන්- භාවංසථිරාණි-** 'භාව' නම් සංස්කාර භාවනා වාසනා යන පදයන් හා සමාන අරුත් දෙයි. "සථිර" නම් 'තිසල හෝ තිර යැ. පෙරළ ජාතීන් හි ඇති වූ පුරුදු කම් සිතැ වෙලී කා වැදී පැවතීම මින් අදහස් කෙරෙයි. නැත හොත් "භාවෙ හෘදයෙ සථිරාණි බද්ධමූලානි" හෘදයෙහි තිසල වැ බැඳුණු මුල්. (නැත් පත් වූ) කලින් නො දුටු රුවක් දුටු පමණින්, පෙරළ බෙහෙවින් පුරුදු දෑ ලෙස සිතැ කා වැදෙයි.

**අබොධපූර්වං ස්මරති-** ඇතැම් රූ ඇතැම් හඬ, ඇතැම් තැන් කලින් දුකැ අසා යෝ වැසැ පුරුදු නැතත් පෙරළ බෙහෙවින් පුරුදු දෑ ලෙස සිතැ කා වැදෙයි. ඒ පෙරළ ජාතීන්හි වූ පරිචිත බව නිසා වන්නකි.

**කඤ්චුකී-** කඤ්චුකයක් හෙවත් ලෝගුවක් දරන හෙයින් රජු ගේ බිසෝ ගෙය පාලකයා ඒ නමින් හැඳින්වේ.

"අන්තඃ පුරවරෝ වෘද්ධෝ විප්‍රෝ ගුණගණාන්විතඃ
සර්වකාර්‍යා'ර්ථ කුශලඃ කඤ්චුකීත්‍ය'භිධීයතෙ"

යන භරතොක්තිය අනුව ඇතොරළ හැසිරෙන ශිලා'දි ගුණ සමූහයෙන් හෙබි සියලු කිසෙහි බුහුටි වෘද්ධ බ්‍රාහ්මණයා කඤ්චුකී නම් වේ.

"යෙ නිත්‍යං සත්‍ය සම්පන්නාඃ කාමදෙෂ විවර්ජිතාඃ
ඥාන විඥාන කුශලාඃ කඤ්චුකී යාස්තු තෙ මතාඃ"

සත්‍යවාදී, රාගා'දී දෙස් නැති, නයවිදු, බුහිටි, නැණවත්හු කඤ්චුකී නමින් මාතෘගුප්තා'චාර්යයෝ සලකති.

3. **අන්වය-** රාඥ අවරෝධගෘහෙෂු අධිකෘතෙන මයා [illegible] ඉති යා වෙත්‍රයෂ්ටිගෘහීතා. සා එව බහුතිථෙ කාලෙ [illegible] ප්‍රස්ථාන විශ්ලවගතෙඃ මම අවලම්බනා‘එා ජාතා. [illegible])

**අර්ථ-** රජු ගේ බිසෝ ගෙවලැ තිලලත් මා විසින් ආචාරයැ‘යි යම් වේවැලක් ගන්නා ලද ද, ඒ වේවැල මැ බොහෝ කලක් ගිය පසු ගමනෙහි පැකිලුම් ඇති ම ගේ සැර යටිය වූවා.

**පහදුව-** රජු ගේ බිසෝ ගෙවල් පාලන තිලය ලබද්දී කඤ්චුකී සවි බලයෙන් හෙබියෙකි. සිය තිලය හඳුන්වනු වස් වේත්‍ර යෂ්ටියක් අතැ දැරීම ඔහු සතු චාරිත්‍රයෙකි. ඔහු ඒ තිලය මිහළු වන තුරැත් දැරී යැ. මහළු බව නිසා ඔහු ගේ ගත කුදු වී ගොස් යැ. පෙරැ සේ යාම-ඊම් ආදිය කිරීම ද සුකර නො වේ ගමන්හි ඔහු පැකිළෙ යි. නො පැකිළැ-නො වැටී ගමින් පිණිස ඔහුට සැරයටියක් අවශ්‍ය යැ. තිල දණ්ඩ වූ වෙත්‍ර යෂ්ටිය අතැ තිබෙන හෙයින් හේ එය මැ සැරයටිය ලෙසින් භාවිත කරයි.

**සටහන්-** **අවරොධ-** (අවරුද්ධ්‍යනෙත ප්‍රමදාඃ අත්‍ර ඉති අවරොධඃ) සත්‍රීන් සිර කොටැ ඇති තැන (බිසෝ ගෙය) අවරොධ නම්.

**වෙත්‍රයෂ්ටි-** තිලබලය හඳුන්වන යෂ්ටිය. වේවැලින් තැනුවෙකි. සිංහල රජුන් දවස පවා අපරාධ කාරීනට දඬුවම් දීමට බල ලැබූවහු අතැ ද වේවැලක් දුරූ බැව් පෙනේ. දූත් ‘සත්කෝලය” නමින් හඳුන්වන්නේ ද මේ තිලදණ්ඩ යි. බහු තිථෙ-බහු ආදී සමූහ වාචී නාමයන් ගෙන් පූරණා‘එයේ තිථුක්” ප්‍රත්‍යය වේ. **ධර්ම්කාර්‍යම්-**ආගමික කටයුත්තක් තාවුසන් දුටු කඤ්චුකී ඔවුන් පැමිණියේ ආගමික කටයුත්තක් පිළිබඳ වැ යැ යි සිතයි.

**අනතිපාත්‍යම්-** (අතිපාතඃ කාලාත්‍යයඃ තං සොඪුං න අර්හති තත්) කල් ඉක්මවීම නුසුදුසු යි.

4. **අන්වය**- නානුඃ සකෘද් යුක්තතුරඞ්ගඃ එව, ගන්ධ-වහඃ රාත්‍රිං දිවං ප්‍රයාති. ශෙෂඃ සදෘ එව ආහිතභූමිභාරඃ. ෂෂ්ඨාංශවෘත්තෙඃ අපි එෂධර්මඃ. (ඉන්ද්‍රවජ්‍රා)

**අර්ථ**- හිරු රියෙහි එක් වරක් මැ යෙදූ තුරඟුන් ඇත්තේ මැ යැ. සුළඟ රෑ-දවලැ හමයි. අනන්ත නා රජ හැම ද දරූ බිම්බර ඇත්තේ යැ. සයින් කොටසක් බදු ගන්නා රජු ගේ ද මේ සවභාවය යි.

**පහදුව**- හිරු සිය රියෙහි අසුන් යෙදූයේ වරෙකි. ඔවුන් මුදා සතප්පවා ගැනීමට ඉඩෙක් නැති. නො කඩවා ඔහු ගේ කාර්‍ය්‍ය කළ යුතු හෙයිනි. එසේ මැ වාසුව ද දිවා-රෑය හමයි. නැවතීමෙක් නැති. අනන්ත නා රජ ද, හැම විටැ මැ පොළෙංව උසුලමින් සිටියි. එ මෙන් රජු ද වැසියන් ගෙන් බදු ගන්නා හෙයින් ඉසුඹුවක් නැති වැ දිවා-රෑය ප්‍රජාව රැකියැ යුතු යැ.

**සටහන්**- **ශංෂ්ඨාංශවෘත්තෙඃ**- රටෙහි නිපද වන දූයෙන් සයෙන් කොටසක් රජුන්ට බදු පිණිස ගෙවනු ලැබේ. ඒවා ලබන්නා (රජු) මේ නමින් හඳුන්වයි.

5. **අන්වය**- ප්‍රජඃ සවාං ප්‍රජාඃ ඉව තන්ත්‍රයිත්වා ශ්‍රාන්ත මනාඃ, ද්විපෙන්ද්‍රඃ යූථානි දිවා සඤ්චාර්‍ය රවිප්‍රතප්තඃ ශිතං සථානං ඉව විවික්තං නිෂෙව්‍යතෙ, (උපජාති)

**අර්ථ**- ප්‍රජාව සිය දරුවන් සේ පාලනය කොට වෙහෙස වැ, ගිජිඳු ඇත් මුළු (ගෙන) දහවලැ හැසිර අව්වෙන් තැවුනේ සිහිල් තැනෙක මෙන්, විවෙක තැනෙක් සෙවුනේ යැ.

**සටහන්**- **දෙව**- සකු නළුවෙහි සෙන්පති, ඍෂි, කඤ්චුකී අදීන් රජු අමතන්නේ "දෙව" යනු වෙනි.

**උපාධ්‍යාය** - (උපෙත්‍ය'අධියතෙ අසමාත්) වෙතැ එළඹ සිසුනට උගන්වන්නා. 'මනු' ඔහු හඳුවන්නේ මෙසේ යැ. 'එකදෙශං තු වෙදස්‍ය වෙදාඞ්ගානි වා පුනඃ, යො'ධ්‍යාපයති වෘත්ත්‍ය'ර්ථමුපාධ්‍යායඃ ස උච්‍යතෙ"

**ප්‍රතිහාරී**– මාතෘගුප්තාචාර්යයෝ ප්‍රතීහාරී මෙසේ හඳුන් වති. "සන්ධිවිග්‍රහ සම්බන්ධං නානා කාර්ය සමුත්ථිතං නිවෙද-යති යඃ කාර්‍ය්‍යා ප්‍රතිහාර්‍ය්‍යස්තු නා සම්‍යතා" යි

**අග්නිශරණං**– අග්නි ශාලාවෙහි දී තපස්වින් පිළිගත්තේ ලු "අග්න්‍යාගාර ගතඃ කාර්‍ය්‍යං පශ්‍යෙද්වෙද්‍ය තපස්විනාම් පුරෝහිතා'චාර්‍ය්‍ය සබ්‍යඃ ප්‍රත්‍යුත්ථාභිවාද්‍ය ච" (කෞටිල්‍ය අර්ථ ශාස්ත්‍ර)

6. **අන්වය**– ප්‍රතිෂ්ඨා ඖත්සුක්‍යමාත්‍රං අවසායයති. ලබ්ධපරිපාලනවෘත්තිඃ එව ක්ලිශ්නාති. ස්වහස්තධෘත දණ්ඩං රාජ්‍යං ස්වහස්තධෘතදණ්ඩං ආතපත්‍රං ඉව යථා ශ්‍රමාය, අති-ශ්‍රමා'පනයනාය න. (වසන්තතිලකා)

**අර්ථ**– අභිලාෂ සාධනය හැම රිසි නිමවයි. ලැබූ තනතුර මැ වෙහෙසයි. තම අතැ දරූ විධායක බලය ඇති රට; තම අත දරූ දඬු (මිට) ඇති සේ සත මෙන් පීඩා පිණිස මිස ශ්‍රම විනෝදය පිණිස නො වේ.

**ප්‍රතිෂ්ඨා**– සාධනය, සමෘද්ධිය, වෙසෙසින් මෙහි ප්‍රතිෂ්ඨා නම් අභිලාෂ සාධනය යි. පැතූ දෙය ලැබීම අභිලාෂ සාධනය වේ.

**ක්ලිශ්ණාති**– කෙලෙසයි, වෙහෙසයි. ඉමහත් ආශා වෙන් ලද දෙය රැකීම පහසු කාර්යයෙක් නො වේ. එයින් ඔහු විඩාවට පත්වීම සිදුවන්නෙකි.

**වෛතාලිකො**– (විවිධාඃ තාලාඃ විතාලාඃ) විවිධ තාල යෝ විතාල නමු. (විතාලා ගානම් ශිල්පං යස්‍ය ස වෛතාලිකඃ) එය ශිල්පය රැකියාව කොටැ ඇත්තේ වෛතාලික (වන්දි භට්ට) නමින් හැඳින් වේ. "වෛතාලිකාඃ ප්‍රබොධකරාඃ" යි අමරකොෂයෙහි එයි. වෙසෙසින් රජුන් ගේ යශොකිර්තිය ගයමින් ඔවුන් උදෑසන නින්දෙන් පුබුදුවාලීම වන්දීන් අයත් යැ. එසේ මැ දිනපි නියමිත ඒ ඒ කිස සඳහා කල් දැන්වීමද ඔවුන් ගේ සේවයට අයත් යැ. රටින්-රට පවා ගොස් රජුන් ගේ කිර්තිය පැතිරවීමද ඔවුන්ගෙන් සිදු වේ.

7. **අන්වය**- සවසුඛ නිරභිලාෂඃ ලොකහෙතොඃ ප්‍රතිදිනං ඛිද්‍යසෙ අථවා තෙ වෘත්තිං එවං විධා එව පාදපො හි මූර්ධ්නා තීව්‍රං උෂ්ණං අනුභවති; සංශ්‍රිතානාං ඡායයා පරිතාපං ශමයති. (මාලිනී)

**අර්ථ**- සිය සුවයෙහි අභිලාෂ රහිත වූයේ ලොවට හිත පිණිස දිනපතා වෙහෙසෙයි. නැතහොත්, ඔබ ගේ වෘත්තිය මෙ බඳු මැ නු. තුර හිසින් දරුණු උණුසුම දරයි. එහෙත්, සෙවනින් ඇසුරු කළවුන් ගේ දහය දුරුලයි.

8. **අන්වය**- ආතතදණ්ඩඃ විමාර්ගප්‍රස්ථිතාන් නියමයසි විවාදං ප්‍රශමයසි. රක්‍ෂණාය කල්පසෙ. විභවෙෂු අතනුෂු ඥාතයඃ සන්තු නාම. ප්‍රජානාං බන්ධුකෘත්‍යං තු ත්වයි පරිසමාප්තම්. (මාලිනී)

**අර්ථ**- දණ්ඩන බලය දරණ ඔබ නො මග පිවිසවුන් මැඩ ලති (මැඩලන්නෙහි) විවාද සංසිඳුවති. රැකවරණය පිණිස යතති. සම්පත් බොහෝ කල නෑයෝ වෙත් මැ යි. (එ හෙත්) වැසියන් ගේ නෑ කිස ඔබ කෙරෙහි පරිසමාප්ත වේ.

**සටහන්**- **ප්‍රජානාං බන්ධුකෘත්‍යං**.....- "උත්සවෙ ව්‍යසනෙ චෛව සංග්‍රාමෙ ශත්‍රු නිග්‍රහෙ, රාජ ද්වාරෙ ශ්මශානෙ යස්තිෂ්ඨති සබාන්ධවඃ" යි කී සැටියෙන් නෑ දහම පළ යැ. ලොවැ වැසි විසින් සිටින්නෝ සැපතෙහි ළං වන, විපතෙහි මග හරින නැයෝ යි. එබඳු වැසියනට විපතෙහි පිහිට වීම යන නෑ කිස කරන්නේ දුෂ්‍යන්ත රජු යැ. එහෙයින් රජු වැසියනට නෑයකු වැනි යැ.

**නවීකෘතාඃ**- (අනිනවං නවං කුර්වන්ති නවීකෘතාඃ) පැරැණි වූවක් අලුත් කිරීම නවීකෘතයි. විඩාවෙන් සිටි රජු වන්දීන් ගේ තුති ගායනයෙන් පිනා ගියේ යැ. එයින් නව පණක් ලත් සේ ඔහුට දැනිණි.

9. **අන්වය**- කිං තාවත් ව්‍රතිනාං උපෝඪතපසාං තපඃ විඝ්නෛඃ දූෂිතම්; උත, ධර්මා'රණ්‍යචරෙෂු ප්‍රාණිෂු කෙනචිත් අසත් චෙෂ්ටිතම්, ආහොස්විත් වීරුධාං ප්‍රසවඃ මම අපචරිතෛඃ විෂ්ටම්භිතඃ; ඉති ආරූඪ බහුප්‍රතර්කං මෙ මනඃ අපරිච්ඡෙද'කුලම්. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ**- කිම හුදෙක් නියමයෙන් ලද උග්‍ර තපස් ඇති තවුසන් ගේ තපස උවදුරු වලින් කෙලෙසී ද, නැතහොත් තපොවනයෙහි හැසිරෙන ප්‍රාණීන්ට කිසිවකු විසින් නපුරක් කරන ලද ද, ලතාවන් ගේ පල දුරීම මගේ වැරිදි ක්‍රියාවලින් අඩාල වී ද, මෙසේ නැගුණු බොහෝ සැක ඇති ම ගේ සිත නෙරක් නැති වැ කළඹෙයි.

**සටහන්**- **ආහොස්විත්**- විකල්පයෙහි හා ප්‍රශ්නා-'ර්ථයෙහි නිපාතයෙකි.

**අපචරිත**- නො මනා හැසිරීම, නො දැමි පාලනය. රජු නො දැහැමි වී මෙන් සුදුසු කලැ දෙවියන් පිණිස කෙරෙන යාග හෝමා'දිය නො පැවැත්වෙයි. එසේ වත් මැ දෙවියෝ කිපි කලට වැසි නො වස්වති. ජලය නො ලැබීම නිසා ගස්-වැල් වියලීමෙන් ශෂ්‍ය ඵලා'දිය අඩාල වෙයි. එකල සත්ව වර්ගයා අල්පා'යුෂ්ක වෙයි; දිළිඳු වෙයි; රෝගී වෙයි. "රාජ්‍ය-'පචාරාත් පෘථිව් ස්වල්ප ශෂ්‍යා භවෙත් කිල, අල්පායුෂඃ ප්‍රජාඃ සර්වා දරිද්‍රා ව්‍යාධි පීඩිතාඃ" යනුවෙන් එය පහදයි.

10. **අන්වය**- මහාභාගඃ අසෞ නරපතිඃ අභින්නස්ථිතිඃ. වර්ණානං අපකෘෂ්ටො'පි කශ්චිත් අපථං න භජතෙ කාමම්. තථා'පි ශශ්වත්පරිචිතවිවික්තෙන මනසා ඉදං ජනා'කීර්ණං හුතවහපරීතං ගෘහං ඉව මන්යෙ. (ශිඛරිණී)

**අර්ථ**- මහා භාග්‍ය ඇති මේ රජ තෙම නො බුන් රාජ මාර්ග ඇත්තෙකි. සිව් කුලයන් ගෙන් හීන අය පවා නො මග නො සොයයි. යනු සැබැවෙකි. එ සේ ද වුවත් නිතර පුරුදු ම ගේ විවේක සිත නිසා ජනා'කීර්ණ මේ ස්ථානය ගින්නෙන් වට වූ ගෙයක් මෙන් හඟිමි.

**පහදුව**- මෙ බඳු ජනාකීර්ණ තැනකට ඔවුන් මෙයට පෙරැ නො පැමිණියේ යැ. එකි'නෙකා ගේ සිතැ හැඟීම් නන් අයුරු විය. වෙසෙසින් ශාර්ඞ්ගරවයන් ගේ තත්ත්වය දියෙන් ගොඩ ගත් මසකු ගේ මෙනි. වටින් ගිනි ඇවිල ගත්

ගෙයක් මෙන් එ තැන ඔහුට වැටහිණි. ඔහුට ඇත්තේ දූත් එ තැනින් වහා ඉවත් වීමේ සිත යැ. මේ බඳු විපරීතයක් සිතැ ඇතිවීම ඔහුට මහත් පුදුමයෙකි. ඔවුන් පැමිණීමේ කාය්‍යීය සඵල නො වීමේ අසුබ පෙර නිමිති හැඟවීමක් දැයි ඔහු ගේ සිතැ ද සැකයෙකි. දූත් රජු ගේ විලාසය දකිත ඔහුට එ බඳු සැකයකට ද තුඩු නො දෙන සේ යැ. රජු ගේ ගැඹරුවින් ඔහු මහ පිතැ'ත්තකු සේ පෙනේ. රාජ කාය්‍යීය නො ඉක්මවන හෙයින් කුලවතුන් පමණක් නො වැ කුල හිතයන් ද ඔහුට බැතිමත් බව ද පෙනේ. රජු ගේ තත්ත්වය එබඳු නිසා තමන් පැමිණි කාය්‍යී සඵල නො වේ යැ යි නො සිතිය හැකි. එ හෙයින් තමන් ගේ චින්තා විපරීතය පෙරළ නුපුරුදු ජනාකීර්ණත්වය නිසා වී යැයි ශාර්ඞ්ගරවයෝ සිතති.

**සටහන්**- **අභින්නස්ථිතිඃ**- (න භින්නා ස්ථිතිඃ මය්‍යාීදා) නො බුන්-නො කඩ කළ රාජමාගීය හෝ රාජනීතිය ඇත්තේ.

11 **අන්වය**- ඉහ සුඛසංගිතං ජනං, ස්නාතං අභ්‍යක්තං ඉව, ශුචිඃ අශුචිං ඉව ප්‍රබුද්ධඃ සුප්තං ඉව, ස්වෛරගතිඃ බද්ධං ඉව අවෛමි. (ආය්‍යාී)

**අර්ථ**- මෙහි සුවයෙහි ඇලුණු ජනයා, නැවහු තෙල් ගැවකු මෙන් ද පිරිසුදු වූවහු අපිරිසුදු වූවකු මෙන් ද, පිබිදියහු නිදිගත්තකු මෙන් ද, නො වැළැකු ගමන් ඇත්තහු බැඳියකු මෙන් ද හඟිමි.

**පහදුව**- නුවර පරිසරය පිළිබඳ වැ ශාරද්වතයන් ගේ හැඟුම ශාර්ඞ්ගරවයන් ගේ හැඟුමට වඩා වෙනසි. ශාර්ඞ්ගරව එහි බාහිර දශීනයෙන් ආකුල විය. ශාරද්වත එහි සිටියවුන් ගේ අභ්‍යන්තර දශීනයෙන් කාරුණික විය. එහි වූවන් කම්සුවයෙහි ඇලුනවුන් හෙයින් ස්නාතයන් අභ්‍යක්ත යන් මෙන් ද, ඔවුන් ගේ ශුචිත්වය අශුචිත්වය මෙන් ද, ප්‍රබුද්ධයන් සුප්තයන් මෙන් ද, ස්වෛරගතයන් බද්ධයන් මෙන් ද, හේ සලකයි. මෙහි ලා දෙහ ශුද්ධිය චිත්ත ශුද්ධිය තත්ත්ව-

ඥාතය හා මොක්ෂය ද ඔවුන් කෙරෙන් ඈත්වැ ඇති බැවි ශාරද්වතයන් ගේ හැඟීම යෙයින් මේ යෙදේ. එයින් හේ ඔවුන් කෙරෙහි අනුකම්පා සහගත විය.

**ෂවගත්- අභ්‍යක්තම්ව—** නෑමට පෙරැ සිරුර තෙල් ගැල්වීම ඉන්‍දියානුවන් ගේ සිරිතෙකි. තෙල් ගැල්වීමෙන් සිරුර කිලිටි වේ. පමින් කිලිටි බැවින් දෙහ ශුද්ධියක් නැති ලෙස ශාරද්වත හඟියි.

**අශුචිම්ව-** බාහිර ශුද්ධිය ඇතත්, සිත රාගා'දී කෙලෙ සින් යුතු යැ. පති පත්න්‍යා'දීන් කෙරෙහි ස්නේහයෙන් යුතු හෙයින් මෙයින් අභ්‍යන්තර අපිරිසුදු බැවි හඟවයි.

**සුප්තම්ව-** ඇතිපතු නොදන්නා-තත්වඥානය නැත්තා පිබිදූ සිටිතත් නිදිගත්තකු මෙනි.

**බද්ධම්ව-** නිදහස් වැ හැසිරෙතත් පමින් යුතු හෙයින් සසර බැඳී සිටින්නකු මෙනි.

**වාමෙදරං ණඅණං-** දකුණු ඇස නැටීම සවාමි වියෝ ගය හඟවයි. දකුණු ඇස හෝ දකුණු බාහුව නැටීම වාමා-වනට අසුබ ඵල එළවන්නාක්.මෙන් මැ වම් ඇස හෝ වම් බාහුව නැටීම ඔවුනට සුබ පල පිණිස පවතී. පුරුෂයනට නම් දකුණු ඇස හෝ දකුණු බාහුව නැටීම සුබ ඵල දෙයි. වම් ඇස හෝ වම් බාහුව නැටී නම් අසුබ ඵල දෙයි. මෙය ද සලකන්නැ. "දක්ෂිණමඞ්ගං පුංසඃ සත්‍රියාශ්ච වාමං ශුභාවහං ස්ඵුරිතම් නිවේ‍ය'ච්ච මධ්‍යමාත්‍රඃ ඵලනි ච ගාත්‍රො චිතඃ ස්පන්දඃ" (ශාර්ඞ්ගධරපද්ධති)

12 **අන්වය-** තරවඃ ඵලා'ගමෛඃ නම්‍රා භවන්ති. ඝනාඃ නවා'ම්බුභිඃ දූරා'වලම්බිනඃ. සත්පුරුෂාඃ සමෘද්ධිභිඃ අනුද්ධ-තාඃ. පරෝ'පකාරිණාං එෂඃ සවභාව එව. (වංශසථවිල)

**අපි-** තුරුහු ඵල ඊමෙන් නැමෙති. වළා කුළු අලුත් දියෙන් දුරින් මැ පහළට එල්බේ. සත්පුරුෂයෝ සමෘද්ධි යෙන් උඩඟු නො වෙති. පරෝ'පකාරීන් ගේ මේ සවභාවය මැ යි.

**සටහන්- විස්සද්ධකප්පා**— ශාන්ත-විශ්වාස කටයුතු. “විස්‍රබ්ධසතු හවෙ ව්‍යාඝ්‍රෙ ශාන්ත විශ්වස්තයොර'පි” (විශ්ව)

13 **අන්වය-** පාණ්ඩුපත්‍රාණාං කිසලයං ඉව තපො-ධනානාං මධ්‍යෙ අවගුණ්ඨනවතී නා'තිපරිස්ඵුට ශරීරලාවණ්‍යා කා ස්විත්? (ආර්‍යා)

අර්- (ඉදුණු) පඬු පැහැ කොළ අතරැ දලුවක් මෙන්, තවුසන් මැද අවගුණ්ඨනය (මොට්ටැක්කිළිය) ඇති වැ, නො පැහැදිලි සිරුරු සෝබාවෙන් යුතුවැ සිටින මැය කවරක් වියැ හැකි ද?

**පහදුම-** ඉදී පඬුවන් වූ පත් අතරැ වූ ළ-පලුව සිය සෝබා ප්‍රකට නො කරයි. පියලියෙන් වැසී ඇති හෙයින් කෙසේවත් පැහැය හෝ ආකෘතිය නො දත හැකි. එමෙන් තවුසන් අතරැ අවගුණ්ඨනයෙන් යුතු ශකුන්තලාවන් ගේ පියෙවි සෝබාව රජුට නො දත හැකි. තවුසන් වැහැරි වතින් සැරැසී සිටින හෙයින් ඉදී පඬුවන් වූ පත් වැනි යැ. ශකුන්තලා අවගුණ්ඨනයෙන් වැසී සිටින්නී පියලියෙන් වැසු-ණු ළ-පලුවක් වන්නැ. එහෙයින් ඇය පඬුවන් පත් මැද පියල්ලෙන් වැසුණු ළ-පලුවකියි කීම සුදුසු මැ යි.

**සටහන්- අවගුණ්ඨන-** පර්ධාව-වේල්. යවනයන් ගෙන් භාරත කතුන්ට පුරුදු වීම් නිසා හෝ මහමදිකයන් භාරතා'ක්‍රමණය කිරීමෙන් පසු උසස් කාන්තාවන් ගේ ඇඳුමක් ලෙස සම්මත වීම නිසා හෝ කාලිදාස ආදී කවින් මෙ සේ සඳහන් කළා වියැ හැකි.

14. **අන්වය-** ත්වයි රක්ෂිතරි සතාං ධර්මක්‍රියා විඝ්නඃ කුතඃ. සමී'ංශෞ තපති තමඃ කථං ආවිර්භවිෂ්‍යති. (අනුෂ්ටුභ්)

අර්- ඔබ ලෝ රක්නා කල්හි සත් පුරුෂයන් ගේ ධර්ම ක්‍රියාවනට උවදුරු කොයින් ද? හිරු බබලද්දී අඳුරු කෙසේ පහළ වේ ද?

**සටහන්-** **කුශලී-** බමුණා ගෙන් "කුශලී" ද ක්ෂත්‍රි-යයා ගෙන් "අනාත්මය ද, වෛශ්‍යයා ගෙන් "ක්ෂෙම," ද, ශුද්‍රයා ගෙන් "ආරෝග්‍යය" ද පිළිවිසියැ යුත්තේ යැ යි කියන ලදී.

"බ්‍රාහ්මණං කුශලං පෘච්ඡෙත්-ක්ෂත්‍රබන්ධුමනාමයම්
වෛශ්‍යං ක්ෂෙමං සමාගම්‍ය-ශූද්‍රමාරෝග්‍යමෙව ච"

15. **අන්වය-** ත්වං අර්හතාං ප්‍රාග්‍රසරඃ නඃ සම්මතො'සි. ශකුන්තලා ච මූර්තිමතී සත්ක්‍රියා, තුල්‍යගුණං වධූ-වරං සමානයන් ප්‍රජාපතිඃ චිරස්‍ය වාච්‍යං න ගතඃ (වංශස්ථවිල)

**අර්ථ-** ඔබ බුහුමන් කළ යුත්තන් අතරැ ප්‍රධානතම යැයි අප ගේ හැඟීමෙකි. ශකුන්තලාව ද මූර්තිමත් සත්ක්‍රියා ඇතියක. සම ගුණ ඇති බරු-බිරි දෙදෙනකුන් එක් කොට මහ බඹා බොහෝ කලෙකින් (දෙස්) නො කියැ යුතු බවට ගියේ යැ.

16. **අන්වය-** ඉමාඉ ගුරු අණො ණාවෙකඛිදෙ. තුඑ වි බංධු ණ පුච්ඡිදෙ. එකකකකස්ස ච චරිඑ එකක එකකස්ස කිං භණාදු. (ආර්‍යා)

**අර්ථ-** මැ විසින් ගුරු ජනයා අපෙක්ෂා නො කරන ලදී. ඔබ විසින් ද (ඇගේ) නෑයෝ නො විචාරන ලදු. එකිනෙකා තනි වැ කළ දේ ගැන තවෙකෙක් තවෙකකුට කුමක් කියන්න ද ?

**සටහන්-** **උපන්‍යසනම්-** (උප-සමීපෙ නයස්‍යතෙ අසෞ) ඉදිරියෙහි තැබූ-තමා වෙතැ එල්ලවුණු.

**එක්කක්කස්ස-** එකකකක මණෙණා'ණණං- (දෙශීය කොෂ) අන්‍යො'න්‍ය-ඔවුනො'වුන්.

17. **අන්වය-** ඥතිකුලෙ'කසංශ්‍රයං භර්තෘමතීං සතීං අපි ජනඃ අන්‍යථා විශංකතෙ. අතඃ ස්වබන්ධුභිඃ ප්‍රමදා තදප්‍රියා'පි පරිණෙතුඃ සමීපං ඉෂ්‍යතෙ. (වංශස්ථවිල)

**අර්ථ-** හුදෙක් නෑ කුලය (තම පියා ගේ ගෘහය) පමණක් ඇසුරු කරන විවාහක සත්‍රිය පතිව්‍රතාවක් වුව ද ජනයා අන් ලෙසකින් සැක කෙරෙයි. එහෙත් සිය නෑයන් විසින් ඒ කාන්තාව සවාමියා අප්‍රිය වුව ද ඔහු වෙත යවනු කැමති වේ.

**පහදුව-** විවාහක සත්‍රිය හිමි ගෙයි විසියැ යුත්තී යැ. ඇය හිමියාට අප්‍රිය වුව ද කළ යුත්තේ එය මැ යි. පතිව්‍රතාවක වුවත් මා-පියන් ගේ ගෙයැ ඇය ගේ වාසය නො හොබනේ යැ. මක් නිසා ද ? බැහැරියන් මතු නො වැ සිය නෑයන් විසිනුදු, ඇයට අභූත චෝදනා නැගියැ හැකි. එ හෙයින් හිමියා අකැමැති වුවත් ඇය හිමි කුලයට පැමිණවීම නෑයන් සතු යුතු කමෙකි.

**සටහන්-** අන්‍යථා විශඞ්කතෙ- අන් පිරිමින් හා සම්බන්ධ කොටැ ඕපා-දූප කතාවනට ලක් වෙයි. මෙය මැ පද්ම පුරාණයේ "කන්‍යා පිතෘ ගෘහෙ තෛ'ව සුචිරං වාසමර්හති; ලොකා'පවාදඃ සුමහාන් ජායතෙ පිතෘ වෙශ්මනි."

18. **අන්වය-** කෘතකාර්‍ය්‍යද්වෙෂඃ කිම් ධර්මං ප්‍රතිවිමුඛතා. කෘතා අවඥා. අමී විකාරාඃ ප්‍රායෙණ ඓශ්වර්‍ය්‍යමත්තෙෂු මූර්ඡන්ති (ආර්‍ය්‍යා)

**අර්ථ-** කළ ක්‍රියාව නො රිසි ද? ධර්මයට පිටු පෑමෙක් ද, කෙළේ අවමානයක් ද, මේ විකාරයෝ ඉසුරෙන් මත්වූවන් කෙරෙහි බෙහෙවින් වැඩෙති.

**පහදුව-** දූන් රජු නමා හා ශකුන්තලාත් අතරැ වූ ගාන්ධර්ව විවාහය අමතක කරන සේ ඔහුට හැඟේ. එය සිහි කරවීම ද රජුට රිසි නො දෙන සේ යැ. නැතහොත් රජු තමා විසින් මැ රැක්ක යුතු ධර්මයට පිටුපා, තරුණියක බොරු පොරොන්දුවෙන් රවටා, ඇය දූෂණය කොට, දූන් එය නො දත්තකු සේ හඟවන්නට තැත් කරන සේ යැ. මේ කවර විධියෙන් හෝ රජු තම තමතට කරන්නේ අවඥවෙකි'යි ශාර්ඞ්ගරව ගඟියි. මෙබඳු පැවතුම් ඉසුරු මදයෙන් මත්වූවන් කෙරෙහි බෙහෙවින් ඇති බැව් වන වැසි වුවත් ලෝකතත්ත්වය දත්තකු හෙයින් හේ දනියි,

**සටහන්-** මූර්ජනනී- වැඩෙන්, "මූර්ඡා මොහ සමුච්ඡ්‍රායයොඃ"

19. **අන්වය-** එවං උපනතාං ඉදං අක්ලිෂ්ටකාන්ති රූපං ප්‍රථමපරිගෘහීතාං ස්‍යාත් න වා ඉති අව්‍යවස්‍යන්. භ්‍රමර ඉව විභාතෙ අන්තස්තුෂාරං කුන්දං සපදි භොක්තුං න එව ශක්නොමි. හාතුං න එව. (මාලිනී)

**අර්ථ-** මෙසේ ළඟට මැ එළඹි මේ නො කැළැල් (නො කිළිටි) කාන්තිමත් රුව පළමුව ආවාහ කෙළේ ද, නො කෙළේ ද'යි තීරණය නො කට හැකි. බමරකු මෙන් අලුයමැ ඇතුළතැ පිනි පිරුණු කොඳ මලක් එ කෙනෙහි විඳීමට නො මැ හැක්කෙමි. හැරීමට ද නො මැ හැක්කෙමි.

**පහදුව-** ශාර්ඞ්ගරව කුමක් කිවත් රජුට ශකුන්තලා ගැන හැඟීමෙක් නැති. එය එසේ වුව ද ඇගේ දිව්‍යමය රූප සෞන්දර්‍ය්‍ය ඔහු ගේ සිතැ පතුළට මැ බැස තිබේ. ආවාහ කළ බව සිහියට නො එන හෙයින් ගැබ් ගත් ඇය පිළිගැනීම ද ඔහුට නො කළ හැකි. ඇගේ අසාමන්‍ය රූප විලාශය නිසා හැර දැමීමට ද ඔහු ගේ සිත නො කියයි. දැන් ඔහු වැටී ඇති අසරණ තත්වය අලුයම පිපුණු පිනි ගැබ් වූ කොඳ මලෙක වැසූ බමරු ගේ තත්වය මෙනි. පිනි ගැබ් වූ හෙයින් සොඳ පැනි ඉරීමට ද නො හැකි. පැනියෙහි පින්න බමරුට මෙන් ගැබිණි බව රජුට ද සරස් වැ සිටියේ යැ. එහි ලොල් හෙයින් එය හැර දැමීමට ද නො හැකි.

**සටහන්-** ක්ෂෙත්‍රිණම්- (ක්ෂෙත්‍රං පත්නී යස්‍ය අසෞ ක්ෂෙත්‍රී තං ක්ෂෙත්‍රිණාම්) පත්නියක් ඇත්තේ ක්ෂෙත්‍රින් නම්.

20. **අන්වය-** කෘතා'භිමර්ශාං සුතාං අනුමන්‍යමානඃ මුනිඃ ත්වයා; විමානිතා නාම. යෙන මුෂ්ටං ස්වං අර්ථං ප්‍රතිග්‍රාහයතා දස්‍යුඃ ඉව පාත්‍රීකෘතො'සි. (උපජාති)

**අර්ථ-** බලාත්කාර කම් කළ දියණිය පිළිබඳ වැ අනුමැතිය දෙනු ලබන තවුසාට ඔබ විසින් අවමන් කරනු ලැබේ මැ යැ. යමකු විසින් පැහැර ගත් සිය ධනය නැවත (ඔහුට මැ) පිළිගැන්වීමෙන් ඔබ සොරකු සැටියෙන් සලකන ලද්දැහු.

**පහදුව**- රජු ශකුන්තලාව රවටා ඇය දූෂණය කෙළේ ඇ ගේ පියා වූ "කණ්ව තවුසා අසපුවේ නො වන කල යැ. තමා නැති අතර සිය දුවට අපරාධ කළහුට කිපීම වෙනුවට ඔහු එය අනුමෝදන් වැ ඇය ඔහුට මැ පාවා දීමට එඩිය. එසින් කාණ්ව කෙළේ සොරාගත් දෑ සොරාට මැ පැවරීම වැනි ක්‍රියාවෙකි. එසේ වූ ඒ උතුම් තවුසාට දූත් සොරකු වූ රජු විසින් ඔහු වෙතැ එවූ ශකුන්තලාව පිළිකෙව් කිරීමෙන් නින්දා කෙරෙයි.

**සටහන්**- **ප්‍රත්‍යය ප්‍රතිවචනම්**- සුදුසු පිළිතුරු- ඇය ගේ හා රජු ගේ හා විවාහය පිළිබඳ සිද්ධිය සිහි ගැන්වෙන තොරතුරු

**සමඅපුච්චං**- "ගාන්ධර්ව: සමයාන්මිථ:" (යාඥවල්ක) ගාන්ධර්ව විවාහ විධිය සමයපූර්ව නම් වේ.

21. **අන්වය**- කූලංකෂා සින්ධු: ඉව ප්‍රසන්නම් අම්භ: තටතරුං ච ව්‍යපදේශම් ආවිලයිතුම් ඉමං ජනං ච පාතයිතුං කිම්හසෙ (ආසී)

**අර්ථ**- ඉවුරු කඩා ගලන නදිය මෙන් පැහැදිලි දිය, ඉවුරු ගස් හා හාත්පස කැලඹීමට, මේ ජනයා ද පිරිහෙලීමට කිම, තැත් කරන්නෙහි.

**පහදුව**- නදිය සිය ඉවුරු මැ බිඳ හෙලයි. ශකුන්තලා ද සිය කුලය නින්දාවට ලක් කරයි. නදිය ජලය කලඹයි. ශකුන්තලා ද මේ දෝෂාරෝපණයෙන් මහ ජනයා කලඹයි. නදිය ඉවුරු ගස් ඇද හෙළයි. ශකුන්තලා ද දුෂ්‍යන්ත සිය හිමියා යි කීමෙන් ඔහු ඇදෑ හෙළීමට ගෙවත් ඔහු ගේ කීර්තිය නැසීමට යතයි. මෙ නයින් බලත් මැ ශකුන්තලා "කූලංකෂා" නදියක් වැන්නැ.

**සටහන්**- **කල්ප:**- සාධකයෙක්, අදහසක් හෝ හෝ යෝජනාවෙක් "කල්ප: ස්‍යාත් ප්‍රත්‍යයෙ න්‍යායෙ" (විශ්ව)

**ප්‍රත්‍යුත්පන්නමති**- "තත් කාලිකීතු ප්‍රතිභා ප්‍රත්‍යුත්පන්නමතිඃ ස්මෘතාඃ (සුධාකර) නැතට පුදුසු නුවණ.

22. **අන්වය**- ස්ත්‍රීණාම් අශික්ෂිත පටුත්වම් අමානුෂීෂු සංදෘශ්‍යතෙ. යාඃ ප්‍රතිබෝධවත්‍යඃ කිමුත ? පරභෘතාඃ ස්වම් අපත්‍ය ජාතම් අන්තරීක්ෂ ගමනාත් ප්‍රාක් අන්‍යෛඃ ද්විජෛඃ පොෂයන්ති බලු (වසන්තතිලකා)

**අර්ථ**- ගැහැණුන් ගේ නො පුහුණු දක්ෂතාවය (සහජ යෙන් ලත්) නො මිනිස් ඉතිරින් කෙරෙහි පවා දක්නා ලැබේ. අවබොධ කරවීමේ ශක්තිය ඇති (නැණවත්) යම් එකියක ගැන කියනු කිම ? කොවුලිය සිය දරු කැල පියාසර කරන් නට පෙරැ අන් පක්ෂීන් ලවා පොෂණය කරවත් මැ යි.

**පහදුම**- ස්වභාවයෙන් ස්ත්‍රී ජාතිය කපට යැ, මායාවී යැ. නොමිනිස් ඉතිරින් කෙරෙහි ද එය පැහැදිලි වැ දක්නා ලැබේ. ඒ පිළිබඳ වැ ඔවුනට පුහුණුවක් ද නො ලැබේ. පුරුද්දෙන් මැ සිදුවන්නෙකි. නො මිනිස් ඉතිරින් කෙරෙහි ද ඒ තත්වය එ බඳු නම් නැණවත් උගත් මිනිස් ඉතිරින් ගේ කපට-මායා ශිලීත්වය ගැන කියැ යුතු නො වේ. ශකුන්තලාවන් ගේ මවු ද නොමිනිස් ඉතිරියකි. ඇය ද සිය දියණිය බැහැරැ ලා ද්විජ යකු (කණ්ව) ලවා පොෂණය කරවිය.

23. **අන්වය**- රහඃ වෘත්තං ප්‍රණයමප්‍රතිපද්‍යමානෙ විස්මරණදාරුණ චිත්ත වෘත්තෞ මයි එව අතිලොහිතාක්ෂ්‍යා කුටිලයොඃ භ්‍රුවොඃ භෙදාත් ස්මරස්‍ය ශරාසනං අතිරුෂා භග්නමිව. (වසන්තතිලකා)

**අර්ථ**- රහසින් පැවැති ආලය නො පිළිගන්නා අමතක වීමෙන් දරුණු වූ සිත් හසර ඇති මා කෙරෙහි මැ ඉතා රත් ඇස් ඇත්තිය විසින් වක් වූ බැම බිඳීමෙන් මදන දුන්න දැඩි කෝපයෙන් බින්දක් මෙනි.

**සටහන්**- කුටිලයොඃ භ්‍රැවොඃ- ගැහැණුන් ගේ ඇස් බැම අනඟ දුන්න හා සම කොටැ කවීහු සලකති. වක් වූ

එය දුනු ශෝභාව උසුලන හෙයිනි. ඉඳිනී ඇස සිඳුණු කල බැම උඩට නෙරී යන හෙයින් දුනු ශෝභාව විදාළේයි (ආ)ළෙස් හෙයින් අනඟ දුන්න බින්දක් මෙන් යි කිම් සුදුසු යි.

24. **අන්වය-** අතඃ සංගතඃ, විශේෂාත් රහඃ පරීක්‍ෂ්‍ය කර්තව්‍යම්. අඥාතහෘදයෙෂු සෞහෘදමෙවං වෛරී භවති. (අනුෂ්ටුභ්)

**අර්ථ-** එ හෙයින් සංවාසය, වෙසෙසින් රහස් සංවාසය පිරික්සා කට යුතු. නො හැඳිනි හද ඇත්තවුන් කෙරෙහි වූ සුහද බව මෙ සේ වෛරය පිණිස වේ.

**සටහන්-** **අධරොත්තර-** 'අධරෙ දන්ත වසනෙ- 'න්‍යූර්ධ්වෙ හීනෙධරොත්‍යවත්' (විශ්ව) හින පිළිවදන්. පහත් පිළිතුරු.

25. **අන්වය-** යඃ ආජන්මනඃ ශාඨ්‍යමශික්‍ෂිතඃ තස්‍ය ජනස්‍ය වචනම් අප්‍රමාණම්. යෛඃ පරාතිසංධානං විද්‍යෙති අධීයතෙ තෙ ආප්ත වාචඃ සන්තු කිල ! (උපජාති)

**අර්ථ--** යමෙක් උපන් දා සිටැ කපට කම නො උගත් තෝ ද, ඒ අය ගේ වචනය මුසාවෙකි. යම් අය විසින් අනුන් රැවටීම විද්‍යාවෙකි යි හදාරණු ලැබේ ද, ඔව්හු සැබැවින් සත්‍ය වාදීහු වෙති ලු !

**පහදුව-** රජ කුමරුවනට ප්‍රයෝගය විද්‍යාවක් මෙන් ඉගැන් වේ. අනුන් රැවැටීම එ හෙයින් ඔවුනට අසිරු නො වේ. තවුසෝ නම් ප්‍රයොගය හා අසත්‍යය දුරු කළෝ'යැ. එය එසේ වුවත් කරුණු විපරීත වැ යෙදුණු සේ යැ. දැන් රජු බස සත්‍ය ලෙසත්, තවුසන් ගේ බස අසත්‍ය ලෙසත් තැඹී සිටී. ශාර්ඞරව දුෂ්‍යන්තු වෙතැ එල්ල කළ මේ දරුණු පහර ඔහු හද විනිවිද ගියා සේ පෙනුණි.

**සටහන්-** **ආප්තවාචඃ-** ආප්තයන් ගේ බස. ආප්තයෝ නම් ප්‍රමාද රහිත සත්‍ය වදන් ඇත්තෝ යි.

**කිල–** රජු කෙරෙහි ශාර්ඞ්ගරවයන් කෙරෙහි වූ පිළිකුල හෝ අප්‍රසාදය පහදයි.

**සත්‍යවාදින්–** ශාර්ඞ්ගරවයනට එල්ල කළ උපහාස යෙකි.

26. **අන්වය–** තද් එෂා භවතඃ පත්නී. එතාං ත්‍යජ වා ගෘහාණ වා. හි දරෙෂු ප්‍රභුතා සර්වතොමුඛී උපපන්නා (අනුෂ්ටුභ්)

**අර්ථ–** මෙන්න, මෝ ඔබ ගේ බිරිය යි. මැ හරුව හෝ ගනුව. ඒ එ සේ මැ යි. බිරියන් කෙරෙහි ස්වාමිත්වය හැමට වඩා ප්‍රධානය යනු න්‍යායානුකූල යි.

**සටහන්– සර්වතොමුඛී–** හැර දැමීම, තාඩනය, ස්වීකාරය, දානය යන ඈ හැම එකක් මැ හිමියනට බිරිය උදෙසා කළ හැකි,

**පුරොභාගෙ–** 'දෘෂෛකදෘක් පුරොභාගී' (අමර) එක් පසෙකැ මැ දොස් දකින්නී. ශකුන්තලා, රජු තමා හැර දැමීමේ දොෂය මැ සිතමින් නැවත තවුසන් හා කැටුවැ යාමට සිතීම ඇය විසින් කැරෙන වරද යි.

**ස්වාතන්ත්‍ර්‍යම්–** සිය සිතැඟි ලෙස හැසිරීම. වෙසෙසින් ගැහැණියක නිදහස් ලෙස හැසිරීම මනු නීතියට විරුද්ධ යැ. "බාල්‍යෙ පිතුර්වශෙ තිෂ්ඨෙත්-පාණිග්‍රහස්‍ය යෞවනෙ, පුත්‍රාණාං භර්තරි ප්‍රෙතෙ–න භජෙ ස්ත්‍රී ස්වතන්ත්‍රතාම්. (මනුස්මෘති)

27. **අන්වය–** යදි ක්ෂිතිපඃ යථා වදති යථා ත්වමසි. උත්කුලයා ත්වයා පිතුඃ කිම්. අථ තු (යදි) ආත්මනො ව්‍රතං ශුචි වෙත්සි. පතිකුලෙ දාස්‍යමපි තව ක්ෂමම් (ද්‍රුතවිලම්බිත)

**අර්ථ–** ඉදින් රජු යම් සේ කියා ද එ සේ නී වෙහි නම් කුලයට නිගා දුන් තිගෙන් පියාට කිම ? නැතහොත් (ඉදින්) තමන් ගේ හැසිරීම පවිත්‍ර යැ යි දන්නෙහි නම් හිමි කුලයෙහි දාසකම ද නිට සෑහේ,

**සටහන්-** **උන්කුලයා-** "උත්ක්‍රාන්තා කුලම්" ඉක්මැ වූ කුල සිරිත් ඇති-කුලයට නො හොබිනා සේ හැසුරුණු.

28. **අන්වය-** ශාශාඞ්කඃ කුමුදානි එව බොධයති, සවිතා පඞ්කජානි එව. හි වශිනාං වෘත්තිඃ පරපරිග්‍රහ සංශ්ලෙෂ පරාඞ්මුඛී. (ආර්‍යා)

**අර්ථ-** සිසි කුමුදු මැ පොබයි සි. හිරු පියුම් මැ (පොබයි සි) ඒ එසේ මැ යි හික්මුණු තැනැත්තන් ගේ පැවැත්ම අන් බිරියන් ගේ පහසින් දුරුවීම යැ

**පහදුව-** සිසි ගේ පියඹ කුමුදු යැ. දිනකර පියුම්ය ගේ හිමි යැ. කිසි දිනෙකැ සිසි පියුම් හෝ දිනකර කුමුදු හෝ නො පුබුදුවයි. ඔවුන් එකිනෙකා ගේ පහස විපරීතයන් කරා නො යෙයි. හැදුනවුන් ගේ හැසිරීම ද එ බඳු යැ. කිසි දිනෙකැ ඔව්හු සිය පහස අන් බිරියන් වෙතැ නො යොදයි.

29 **අන්වය-** අහං මූඪඃ ස්‍යාම්, එෂා වා මිථ්‍යා වදෙත් ඉති සංශයෙ (අහං) දාරත්‍යාගී භවාමි, අහො පරස්ත්‍රීස්පර්ශපාංසුලඃ (භවාමි) ?

**අර්ථ-** මම මුළා වීම් ද ? (සිහි විකල් වීම් ද) මෝ හෝ බොරු කියන්නී ද යන සැකයෙහි ලා අහෝ මම සිය බිරිය පිළිකෙව් කරන්නෙක් වෙම් දෝ නොහොත් අන් ගැහැණියක ගෙන් කිළිටි වූවෙක් වෙම් දෝ ?

**පහදුව-** දූන් පැන තැගී ඇති ප්‍රශ්නය විසඳීමෙහි ලා රජු වෙතැ තර්ක ප්‍රතිතර්කයෝ එළඹැ සිටිති. කළ යුතු දෑ ඔහුට නො වැටහෙයි. සැබැවින් තමා ශකුන්තලා ආවාහ කෙළේ නම් ඇය හැරැ දැමීම ද පව්ටු කමෙකි ඉදින් තමා හා ඇය අතරැ විවාහයක් වී යැ යි ඇ ගේ කියමන මුසාවක් නම් ඉන් ඔහුට වන අවැඩෙක් නැති. එ සේ මැ ඇය ගේ කියමන විශ්වාස කොටැ ඇය සිය බිරියක වශයෙන් පිළිගත හොත් පරස්ත්‍රී සංසර්ග දෙෂයෙන් තමා දූෂිත වේ දෝ යි රජු බිය වෙයි. බිරිය අත් හැරීමේ අයිතිය තමාට ඇතත් පරදාර දෙෂය රජකු විසින් නො ලැබියැ යුතු යැ.

**සටහන්-** පාංසුලඃ- "පාංසුලඃ පුංශචලඃ" (විශව) කිළිටි.

30. **අන්වය-** සා බාලා සවානි භාග්‍යානි නින්දන්ති බාහුක්ෂේපං ක්‍රන්දිතුං ප්‍රවෘත්තා ච, සත්‍රී සංස්ථානමේකං ජ්‍යොතිඃ ආරාද් එනාම් උත්ක්ෂිප්‍ය අප්සරස්තීර්ථං ජගාම ච. (ශාලිනී)

**අර්ථ-** ඒ දූරිය සිය දෛවයට නින්ද කරමින් අත් උඩට විදහමින් හඬන්නට වූවා. (එ විටැ) ගැහුණු රුවක් වැනි ආලොකයක් දුරදීම ඇ ඔසොවා ගෙනැ අප්සරස්තීර්ථය දෙසට ගියා.

**සටහන්- සත්‍රීසංස්ථානම්-** ගැහැණු රුවක් වැනි. ආලොක පුඤ්ජයක් නිසා පැහැදිලි වැ නො පෙනුණු හෙයින් "සංස්ථාන" යනු යෙදුනේ යැ.

**ආරාත්-** "ආරාද් දූර සමීපයොඃ" (අමර) දූර, ළඟ යන දෙ අරුත මැ දියැ හැකි යැ.

31. **අන්වය-** ප්‍රත්‍යාදිෂ්ටාං මුතෙසානයාං පරිග්‍රහං න සමරාමි ඉති කාමම්. බලවත් දූයමානං හෘදයං තු (මාං) ප්‍රත්‍යායයති ඉව. (ආර්‍යා)

**අර්ථ-** බැහැර කළ තවුස් දූව හා ආවාහයක් නො සමරමි යනු සැබැවෙකි. (නමුත්) බලවත් සේ පෙළෙන මගේ හිත නම් (මට ඇත්ත) අවබොධ කරවනු ලබන්නාක් මෙනි.

**පහදුව-** දුර්වාසයන් ගේ ශාපයෙන් ශකුන්තලා පිළිබඳ අතීතය රජු ගේ සිහියට නො නැගිණි. තමා අවමානයට ලක් කිරීමට පැමිණි කපට ගැහැණියක සේ සලකා; ඇය පිටමං කැරිණි. එහෙත් රජු ගේ සිතැ ඇය වියෝවත් මැ මහත් සේ සැලෙන්නට විය. ඔහු සිතැ දූත් නම් සිහිනයෙකින් මෙන් ඔහු හා ඇගේ අතීතය හා මඳ මඳ විසින් සිහියට නැග එතත් එය තීරණාත්මක වියැ යුතු පමණට ද නො වේ. කෙ සේ වුවත් ඇගේ කියමනෙහි යම්කිසි සත්‍යයෙක් ද ඇත්තේ වනැ යි රජුට අවබොධ කරවන්නා සේ යැ.

# සවන රඞ්ගය

**නාගරිකඃ ශ්‍යාලං–** නගර පාලක ධුරය සිරිත් විසින් රජු ගේ මස්සිනා කෙනකු විසින් ඉසුලුණු සේ යැ. ක්‍රොෂට පාලකයා වූයේ ද ඔහු මැ යි. 'ශ්‍යාල' නම් බිරිය ගේ සොහොවුරා ය. "මාගධීරාක්‍ෂසාදෙඃ ස්‍යාත්" යන භරතොක්තිය පරිදි ශ්‍යාල මාගධී බස වහරවයි. රක්‍ෂිත් හා ධීවරාදීන් ගේ බස ද එය මැ යැ.

**කුම්භීරක–** 'කුම්භීරකොගණ්ඩපදසනස්කාරශච මලම්ලුචඃ" (නාමමාලා) ගැට කපන්නා, සොරා යන අරුත් දෙයි.

**භාවමිශ්‍රාඃ–** "මනෙ‍්‍යාභාවස්තු වක්තව්‍යඃ" භාව යනු මාන්‍යනීයයන් කෙරෙහි යෙදේ. "මිශ්‍ර පදං ගෞරවාර්‍ථ යුක්තම්" ධීවර, ග්‍රාමීණයන් ඈ පහතුන් විසින් උසසුන් ඇමැතීමේ දී මිශ්‍ර යන ගරු පදය අතිශය ගෞරවාර්ථය පිණිස යොදනු ලැබේ.

**පාටච්චර–** "දස්‍යුඃ පාටච්චරඃ ස්තෙනඃ" (හෙම) මෙ ද යෙදුණේ සොරා යන අරුත සඳහා යි. "පාදඩයා" යන හෙළ වහර හා සසඳන්නැ.

**ආවුත්ත–** "භගිනී පතිරාවුත්තඃ" (අමර) සොහොවුරිය ගේ සැමියා. වචනාර්ථය එය වුව ද උසස් නිලදරුවකු ඇමතීමට "මස්සිනා" යන වචනය නො යෙදෙන හෙයින් අනුවාදයෙහි ඇමැතිතුමා" යනුවෙන් යෙදිණි

1 **අන්වය**—ජෙ විනිහිඑ කම්ම සහජෙ දෙ හු ණවිවජ්ජණීඅඑ කිල ශොත්තිඑ අණුඅංපා මිදුඑ වි පශුමාලණ කම්මදාලුණො (වෛතාලීය)

**අර්ථ–** යම් පහත් කර්‍මාන්තයක් (වුවත්) ජන්මයෙන් ආවා නම් එය නො හළ යුතු මැ යි. උගත් බමුණා අනුකම්පාවෙන් මෘදු වුවත් සතුන් මැරීමෙන් දරුණු වෙයි.

**සටහන්- ශ්‍රොත්‍රියඃ–** "ජන්මනා බ්‍රාහ්මණො ඥෙයඃ, සංස්කාරෛර් ද්විජ උච්‍යතෙ, විද්‍යයා යාති විප්‍රත්වං, ත්‍රිභිඃ ශ්‍රොත්‍රිය එව ච" උපතින් බමුණෙක් ද, සංස්කාර කර්මයෙන් පසු ද්විජයෙක් ද, විද්‍යා පුහුණුවෙන් විප්‍රයෙක් ද, මේ තුන මැ එක් වූ කලැ ශ්‍රොත්‍රියෙක් ද වේ.

**සුමනො මූල්‍යම්—** මල් පිණිස මිලක්, හොඳ හිත නිසා එයට පාරිතොෂයක් වශයෙන් දෙන මිලක්. තමාට වධමල් පැලැඳවීමට රක්ෂිත් කලින් කළ සංවාදයට එල්ල කළ ඇණුමකි.

**කාදම්බරී–** "කුත්සිතම් අම්බරම් කදම්බරම්, කදම්බරං අස්‍ය අස්ති අසෞ කදම්බරඃ. කදම්බරස්‍ය ඉයං කාදම්බරී– කාදම්බරී නම් සුරාව යි. එය පානය කළහු ඇඳිවත පවා බුරුල් වැ නිසි විදියෙන් ඉහෙහි නො වන හෙයින් එය සලකා මේ නම් වීලු. නැතහොත් "කාදම්බර නීලාම්බරඃ ඉත්‍යර්ථඃ, තස්‍ය ඉයං කාදම්බරී" බලරාමයන් ගේ උසස් මැ බීම සුරාව හෙයින් ඒ නිසා හෝ ඔහුගේ නමින් සුරාව "කාදම්බරී" යැ යි නම් වූවා වියැ හැකි.

**ප්‍රවෙශක–** "යත්නීචෛඃ කෙවලං පාත්‍රෛඃ භාවීභූතාර්ථසූචනම් අඞ්කයොරුභයොර්මධ්‍යෙ සවිඥෙයඃ ප්‍රවෙශකඃ" හුදු නිච කුලිකයන් ගේ රඟය ප්‍රවෙශක නමින් හැඳින් වේ. එහෙත් මෙහි රජු ගේ මස්සිනා–ශ්‍යාල ද ඇදී ඇති හෙයින් එය කෙසේ සනාථ වේ ද? ශ්‍යාලයන් පවා මෙහි බණන බස නාට්‍යයෙහි නීච භාෂා නමින් හැඳින්වෙන¦ භාෂාවෙකි. එ නම් මාගධී යැ. එ හෙයින් එය නීච ප්‍රවෙශකයට අ.තුළු වේ·

2 **අන්වය–** ආ අම්බහරිඅ පාණ්ඩුර වසන්තමාසස්‍ස ජීඅසව්වස්‍ස උදුම්ඹගල චූදකොරඅ, දිට්ඨොසි තුමං පසාඑමි (ආසීා)

**අමි–** (එම්බා) ළා–රත් කොළ පඬු පැහැය, වසත් මසේ ජීවය, උතුම්හුලේ (පෙරු නිමිත්ත වූ) මී අඹ කැකුළ, තෝ දක්නා ලද්දේ වෙහි. තා සතහමි (පහදවමි)

**පහදුව–** වසන්තයේ උදුව හා අඹ කැකුළු හටගනී. එය ලා රත්කොළ පඬු වණීන් යුතු යැ. වසන්ත කාලය පිළිබඳ ජීවය රඳා සිටින්නේ ද එහි යැ. සෘතු උත්සවයට පෙරළු නිමිත්ත ද අඹ කැකුළු හෙයින් එය තුස්වනු යෙදෙයි.

3 **අන්වය–** චූදංකුර, ගභිදධණුඅසස තුම්ං මළු දිශෙණෂා අසි. පහිඅජණ ජුවඉ ලකෙබා පඤ්චබ්හාතිඹ සරෙ හොති (ආඪා)

අර්ථ– මී අඹ කැකුළ, ගත් දුනු ඇති මලවියාට තෝ මී විසින් දෙන ලද්දේ වෙහි. පථික ජනයා ගේ තුරුණු බිරියන් ලක් කැරෙන පස්මල්–හී අතුරු ශ්‍රෙෂ්ඨ වෙහි.

4 **අන්වය–** චූතානාං කලිකා විරතිගිතාපි සවං රජඃ නබධ්නාති. යදපි කුරවකං සන්නාඩම් තත් කොරකාවසථ්‍යා සපිතම්. පුංස්කොකිලානාං රුතං ශිශිරෙ ගතොපි කණ්ඨෙෂු ස්ඛලිතම්. ශඞ්කා සමරොපි චකිතඃ තුණාධිකෘෂ්ටං ශරං සංහරති. (ශාර්දූල වික්‍රීඩිතම්)

**අර්ථ**—මී අඹ කැකුළු කලෙකින් නික්මුණත් සිය රොන් නො බඳියි. කෙළිඳ ගස මල් ගන්වන්නට සැරසුනත් එය කැකුළු අවධියැ සිටියි. කොවුලන් ගේ නද ශිශිර සෘතුව ගත වීත් ගෙලෙහි පැකිළෙයි. සැකයෙකි, අනඞගයා ද බිය වූයේ හියොවුරෙන් අඩක් ඇදි හී නවත්වා දූ යි.

**පහදුව**— දුෂ්‍යන්ත රජු සිය චිත්ත වික්ෂෙපය නිසා වසන්තොත්සවය වැළැක්වී. නුවරු ද එයට අවනත වූහ. ගස් වැල් පවා රජ අණ පිළිගත් සෙයෙකි. සවභාව ධර්මය අනුවැ ඔවුන් ගේ මල් ඈ හටගත් නමුත් පිපිම් බවට නො පමුණුවයි. ශිශිර සෘතුව අවසනැ වසන්තයේ සේයා විසින් අඹ කැකුළු, කුරවක් කැකුළු ඈ නැගේ. කොවුලෝ සිය නද පුහුණුවෙති. අනඞගයා මේ සියලු නිමිති දැකැ සිය දුන්න සකසා හී අඩෙකින් අදී. එහෙත් අඹ මල් කැකුළු හෝ කුරවක් කැකුළු නො පිපේ. කොවුල් නද ද උන් ගෙලැ මැ

හිර වූ සේය. අන් වසන්තයන්හි මෙන් හඬ පැතිරීමෙක් නැති. රජ අණ අචෙතනිකයෝ පවා පිළිගත්තු යැ. මෙසේ හෙයින් අනඞ්ගයා ද අඩක් ඇදී ගී නැවත හියොවුරෙහි මැ බැහියැ හැකි. පෙරළ මෙන් හි විදීමට කරුණු නො යෙදුනු හෙයිනි.

**සවහන්—කෞලීනාම්** – 'ස්‍යාත් කෞලීනම් ලොකොප වාදෙ'' (අමර) ලොකොපවාදය, කේලම හෝ පුවත යනු වඩා තැනට සුදුසුයැ.

**හච්චිනී**—':හට්ටිනී ද්විජභාය්‍යාර්‍යාං;' භරත මතය අනුව "දේවී" සී අමතන්නේ අභිෂෙක ලත් අග මෙහෙසියට බවත් අන් බිරියනට "හට්ටිනී" සී අමතන බවත් පෙනේ. වෙසෙසින් බැමිණියක වූ බිරිය 'හට්ටිනී' සී අමතනු ලැබේ. එහෙත් මෙහි එසේ නොයෙදුණු සේ යැ.

**5 අන්වය**— රම්‍යං ද්වෙෂ්ටි. යථා පුරා ප්‍රකෘතිභිඃ ප්‍රත්‍යහං න සෙව්‍යතෙ. ශය්‍යාප්‍රාන්ත විවර්තනෛඃ උන්නිද්‍රා එව ක්ෂපාඃ ගමයති. යදා දාක්ෂිණ්‍යෙන අන්තඃපුරෙභ්‍යඃ උචිතාං වාචං දදාති, තදා ගොත්‍රෙෂු ස්ඛලිතඃ චිරං ව්‍රීඩා විලක්ෂඃ භවති (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ**—සිත්කළු දෑයට ද්වෙෂ කෙරෙයි. පෙරළ මෙන් ඇමැතියන් විසින් දිනපතා නො සෙවුනා ලැබේ. යහනෑ පසෙකැ පෙරළෙමින් නිදි වර්ජිත වැ මුළු රැය ගෙවයි. ඇතැම් විටෙකැ අනුකූලතාවයෙන් මෙහෙසියනට සුදුසු වදන් දුන්නත් ඔවුන් ගේ නම් වරදවා කියා බොහෝ වේලා ලජ්ජා වෙන් වෙළුනේ වෙයි.

**6 අන්වය**—ප්‍රත්‍යාදිෂ්ට විශෙෂමණ්ඩනවිධිඃ වාමප්‍රකොෂ්ඨාර්පිතං කාඤ්චනමෙකමෙව වලයං බිභ්‍රත් ශ්වාසාපරක්තාධරඃ චින්තාජාගරණ ප්‍රතාම්‍රනයනඃ (දෙවඃ) ක්ෂීණො'පි, සංස්කාරොල්ලිඛිතඃ මහාමණිරිව න ආලක්ෂ්‍යතෙ (ශාර්දූල වික්‍රීඩිතම්)

අර්‍ථ බැගැර කළ වෙසෙස් සැරසිලි විදි ඇති, වම් අතෙහි ලූ එක මැ රත් වළල්ලක් දරන සුදුමැලි තොල්ඇති, සිතිවිලි නිසා තිදි වැරීමෙන් ඉතා රත් නෙත් ඇති (දේවයෝ) කෘශවූවාහු නමුදු හණගල අල්ලූ (ගෙවී ගිය) මහ මිණක් මෙන් නො පෙනෙත් ද?

**පහදුම**- තෙවැනි රඞ්ගයෙහි ප්‍රියංවද, ශකුන්තලාවන් ගැනැ සිතූ නියාවෙන් **කඤ්චුකී** ද රජු ගැනැ සිති ය. රජු විරහයට සුදුසුයේ සියලු සැරසිලි බැහැර-කොටැ වම්'තැ රන් වළලුවක් පැළැඳැ සිටී. තොල් සුදුමැලියැ. නිරතුරු සිති විල්ලෙහි යෙදී සිටින නිසා තිදි නැතිවීමෙන් ඇස් රතු වැ කෝට්ටුවී ගොස් යැ. එහෙත් හේ කමනීය ශොභාවක් දරයි. කුමක් මෙන් ද? හණගලැ ගෑ මහ මිණක් මෙනි. හණගලැ ගැමෙන් මැණික ගෙවී ගියත් එය ශොභාවෙන් අධිකතරයැ.

**7 අන්වය** ප්‍රථමං සාරඞ්ගාක්‍ෂ්‍යා ප්‍රියයා ප්‍රතිබොධ්‍ය මානමපි සුප්තම් ඉදං හත හෘදයං සංප්‍රති අනුශය දුඃඛාය විබුඩම් (ආයඝී)

අර්‍ථ- පළමු වැ මියුලැසි ප්‍රියාව විසින් පුබුදුවනු ලැබූ මේ මළ හද පසුතැවිලි දුක් විදීම පිණිස පිබිදියේ යැ.

**සටහන්**- **තපස්විනී**- "තපස්වීචානුකම්පාහී" (අමර) අනුකම්පාවට සුදුසු නැතැත්තිය, අසරණ තැනැත්තිය.

**ප්‍රමදවන**- 'විධෙයං ප්‍රමදවනං නෘපසත්‍රුයසම්ඤ්ජ්‍ඣාඩාහෙනෘසහරමතෙ පුරෙපකණ්ඨම්'' (හලායුධ) ඇතො-රන් හා රමණිය පිණිස හැසිරෙන නගරෝද්‍යානය-මඟුල් උයන.

**රන්ධ්‍රොපනිපාතිනොනර්ථා**- "ඡිද්‍රෙෂ්වනර්ථා බහුලී භවන්ති'' (පඤ්චතන්ත්‍ර) ප්‍රමාදයෙන් බොහෝ අනර්ථයෝ වෙති.

8 **අන්වය**- සඛෙ, මූන්සුතාප්‍රණයසමෘතිරොධිනා තමසා මම ඉදං මනඃ මුක්තං ච, ප්‍රහරිෂ්‍යතා මනසිජෙන ධනුෂි චූතශරඃ නිවෙශිතශ්ච, (දෘතවිලම්බිත)

**අර්ථ**– මිත්‍රය, තවුස් දූරිය කෙරෙහි වූ ආලය පිළිබඳ මතක වැලැක්වූ අඳුරෙන් මගේ මේ සිත මිදුනේද, පහර දෙන මදනයා විසින් දුන්නෙහි අඹ හී යොදන ලද්දේද වෙයි

**සටහන්**– බ්‍රහ්මවර්චසී-බමුණු බලය

**පරිචාරිකා**– "සංවාහනෙ ච ගන්ධෙ ච තථාෙවෙව ප්‍රසාධනෙ, තථාභරණ සංයොගමාල්‍යසංග්‍රන්ථනෙෂු ච විඥෙයා නාමතඃ සා තු නෘපතෙඃ පරිචාරිකො" මාතෘ-ගුප්තාචාර්යයෝ, පිරිමැදීම්, සුවඳ ගැල්වීම්, අබරණ පැළැඳවීම්, අබරණ සැකැසීම්, මාලා ගෙතීම් ඈ රජු ගේ සියලු කටයුතු කරන්නී පරිචාරිකා' යි කියති.

9 **අන්වය**- ඉතඃ ප්‍රත්‍යාදෙශාත් ස්වජනමනුගන්තුං ව්‍යවසිතා, ගුරුසමෙ ගුරු ශිෂ්‍යෙ "තිෂ්ඨ" ඉති උච්චෛඃ වදති (සති) සපිතා වාෂ්පප්‍රසර කලුෂාං දෘෂ්ටිං ක්‍රූරෙ මයි පුනඃ අර්පිතවතී (ඉති) යත් තත් සවිෂමිව ශල්‍යං මාං දහති. (ශිඛරිණී)

**අර්ථ**– මොබින් පිටමං කිරීමෙන් (පසු) සිය පිරිස හා අනුව යාමට උත්සාහ කළ ඈ ගුරුන් සමාන ගුරුන් ගේ ශිෂ්‍යයා විසින් "සිටුව" යි උස් හඬින් කියද්දී (එහි) සිටි ඈ කඳුලු වැගිරීමෙන් කිලිටි වූ ඇස ක්‍රූර වූ මා කෙරෙහි නැවත හෙළී ද යන යමක් වේ ද, එය විෂ සහිත හුලක් මෙන් මා දවයි.

**පහදුව**– රජු ශකුන්තලා නො පිළිගනී. දුකින් හද පැරී ගිය ඕ සිය පිරිසත් කැටුවැ ආපසු යාමට පිටත්වූවා. එහෙත් සිය පියා වැනි තෙදවත් ශාර්ඞ්ගරව "සිටුව" යි තර්ජනය කොටැ ඇය නැවැත්වී. එයින් අසරණ වූ කළ යුතු දෑ නො දත් ඒ අහිංසක තරුණිය ක්‍රූර රජු කෙරෙහි බැගෑපත් බැල්මක් හෙළුවා යැ. ඇගේ ඒ අහිංසක බැගෑපත් බැල්ම, මුදුව දැකීමෙන් ශකුන්තලා පිළිබඳ තතු සිහියට නැඟුණු ඔහුට දූන් තිරතුරු විස හුලක් මෙන් හද විනිවිද යේ

10 **අන්වය**- ස්වප්නො නු, මායා නු, මතිභ්‍රමො නු, තාවත් ඵලමෙව ක්ලිෂ්ටං පුණ්‍යං නු. තද් අසන්නිවෘත්තෛ අතීතම්. එතෙ මනොරථාඃ තටප්‍රපාතාඃ නාම (උපජාති)

**අර්ථ**- සිහිනයෙක් ද, මායාවෙක් ද, මුලාවීමෙක් ද, ගෙවුණු පිනෙකැ විපාකයෙක් ද, එය යළි නො ලංවන සේ ඉක්මැ ගියා. මේ මනොරථයෝ ඉවුරු ඇදැ හෙළීම් බඳු යැ.

**පහදුව**- රජු හා ශකුන්තලා යළි එක්වෙන බව විදූෂක කියයි. රජුට එය අදහාගත නො හැකි. ඔහු තර්ක කරයි. යළි ඇය හා තමා එක්වන්නේ සිහිනයෙන් ද, නිදි නැති හෙයින් එය ද නො වියැ හැකි. නැතහොත් මායා බලයෙ- කින් ද, ඇය සිටින තැන නො දන්නා හෙයින් එය ද නො වියැ හැකි. සිහි විකල වීමෙකින් ද, එසේ වූවොත් ඇය යළිත් බැහැර කරනු ඇති. විපාක දී අවසන් වූ පිනෙකින් නම් එයත් පල පිණිස නො පවතියි. එකිනෙක ඇද හැලෙන ඉවුරු මෙන් සිතැ ගි-ආශා එකිනෙක ඇදැ හැලෙන බැව් හේ පවසයි.

11 **අන්වය**- (හෙ) අඞ්ගුලීය, තව සුචරිතං මම ඉව ප්‍රතනු (ආසීද් ඉති) ඵලෙන විභාව්‍යතෙ. යත් අරුණනඛ- මනොහරාසු තස්‍යාඃ අඞ්ගුලීෂු ලබ්ධපදං ච්‍යුතමසි (පුෂ්පිතාග්‍රා)

**අර්ථ**- (එම්බා) මුදුව, තා ගේ පිනත් මගේ මෙන් සුළු (වී යැ යි තා ලැබූ) විපාකයෙන් සිතියැ හැකි. යම්හෙයකින් අරුණුවන්නියෙන් මනහර ඇගේ ඇඟිලිවලැ (ලැගීමට) ලද අවසථා ඇත්තේත් ගිලිහුනේ වෙයි.

12 **අන්වය**- අනු දිවසෙ එකෛකං මදීයං නාමාක්ෂරං ගණය, යාවත් අන්තං ගච්ඡසි තාවත් (හෙ) ප්‍රියෙ, මදවරොධ ගෘහප්‍රවෙශං නෙතා ජනඃ තව සමීපම් උපෙෂ්‍යති ඉති (ප්‍රියා මයා ප්‍රත්‍යභිහිතා) (වසන්තතිලකා)

**අර්ථ**- දිනක් පාසා එක් එක් මා අයත් නම්කුරු ගණිනු සම්තාක් (එය) අවසන් වේ ද, ඒතාක් (එම්බා) ප්‍රියාවෙනි, මගේ ඇතොවුරට ඔබ කැඳවා ගෙනැ යන්නා වූ කෙනෙක් ඔබ වෙතැ පැමිණෙති. (ගිවිස්නා ලදී)

13 **අන්වය**- බන්ධුර කොමලාඞගුලිං තං කරං විහාය කථං නු අම්භසි නිමග්නමසි. අථවා අචේතනං ගුණං න ලක්‍ෂයෙත් නාම. මයා එව කසමාත් ප්‍රියා අවධීරිතා (වංශස්ථවිල)

**අර්ථ**- පැහැපත් රමණීය මොළොක් ඇඟිලි ඇති ඒ අත හැර කෙසේ නම් දියේ ගිලුනෙහි ද? නොහොත් (මුදුව) අචේතනික හෙයින් ගුණය නො තකා නම්, (සචෙ-තනික මා විසින් මැ කවර හෙයින් ද ප්‍රියාව හැර දමන ලද්දේ?

14 **අන්වය**- චිත්‍රෙ යත් යත් සාධු න ස්‍යාත් තත් තත් අන්‍යථා ක්‍රියතෙ තථාපි රෙඛයා තස්‍යාඃ ලාවණ්‍යං කිඤ්චිත් අන්විතම් (අනුෂ්ටුභ්)

**අර්ථ**- සිතුවමෙහි යමක් යමක් මැනැවින් නො වේ ද, ඒ ඒ දූ අන් ලෙසෙකින් කැරෙයි. (සැකැසෙයි) එසේ වුවත් රේඛාවෙන් ඇගේ රමණීයත්වය මඳක් පිහිටවිණි.

**සවහන්**- **අන්‍යථා ක්‍රියතෙ**- විපරීත කෙරෙයි

15 **අන්වය**- මලිනඃ ස්විහ්නාඞගුලිවිනිවෙශඃ රෙඛා ප්‍රානෙතෂු දෘෂ්‍යතෙ. ඉදං ච කපොල පතිතං අශ්‍රු වර්ණි-කොච්ඡ්වාසාත් දෘශ්‍යම් (ආර්‍යා)

**අර්ථ**- ඩහ දිය වැකුණු ඇඟිලි තැබීමෙන් කිළිටි රේඛා (පින්තූර) වාටියෙහි පෙනේ. මේ ඇගේ කොපොල්හි වැටුණු (මගේ) කඳුලු සායම් මතැ වැටුණු සුසුමින් පැහැදිලි යි.

**පහදුව**- රජුට චිත්‍රාර්පිත ශකුන්තලා හඳුන්වා දීමට කදිම ලකුණු රුසෙක් වෙයි. රේඛාවන් ගේ බැහැරින් ඔහු ඒ සේයාරුව පැහැසීමෙන් ඩහ දිය වැකී ඇඟිලි වැදීමෙන් කිළිටි වී ගොස් යැ. රජු ඒ රුව අඳිත් මැ ශකුන්තලා ගේ යථා සවභාවය පිළිබිඹු වෙයි. එ කලැ ඔහු ගේ ශොකය

ඉමහත් වැ නැඟී සිටි. නෙතින් කඳුලු වැගිරෙන්නට වෙයි. එය සේයා (ශකුන්තලා) කොපොල් මතැ හැලෙයි. සුසුම් ද පිටවෙයි. පෙරැ මැ ගිලිහුණු කඳුලු වැදූ දිය වූ සායම්, සුසුම් වැදී පැතිරෙයි. එසේ මැ තැතින් තැනැ තද මඳ පැහැ ගනී.

**අන්වය-** පූර්වං සාක්ෂාත් උපගතාං ප්‍රියාම් අපහාය පුනඃ චිත්‍රාර්පිතාම්මාං බහු මන්‍යමානඃ (අහංහි) නිකාම ජලාං ස්‍රොතොවහාං පථි අතීත්‍ය (හෙ) සඛෙ, මෘගතෘෂ්ණිකායාං ප්‍රණයවාන් ජාතඃ (වසන්තතිලකා)

**අර්ථ-** පෙරැ ප්‍රත්‍යක්ෂ වැ ළඟට පැමිණි ප්‍රියාව හැර දමා යළි සිතුවමට නැගූ මැයට බුහුමන් කරන්නා වූ (මම වනාහි) පිරුණු දිය ඇති ගංගාවක් වූ මාගීයක් ඉක්මවා, (එම්බා) මිත්‍රය, මිරිඟුවට ආශා ඇත්තෙක් වීමි

17 **අන්වය-** සෛකතලීන හංසමිථුනා ස්‍රොතොවහා මාලිනී කාර්‍යා. තාම් අභිතඃ නිෂණ්ණහරිණාඃ ගෞරිගුරොඃ පාවනඃ පාදාඃ (කාර්‍යාඃ) ශාඛාලම්බිත වල්කලස්‍ය ච තරොඃ අධඃ කෘෂ්ණමෘගස්‍ය ශෘඞ්ගෙ වාමනයනං කණ්ඩූයමානාං මෘගී නිර්මාතුම්වඡාමි. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ-** වැලිතලාවෙහි සැඟවුණු (හුන්) හංස යුවළක් සහිත මාලිනී නදිය කළ යුතු. එය දෙ පසැ වැතිර සිටින මුවන් ඇති හිමාලයයේ පිවිතුරු කඳු වැටි ද, අතුවලැ එල්ලූ වල්කලා ඇති, ගස යට කළු තිත් මුවකු ගේ අහෙහි වම් ඇස කසන මුවැත්තියක නිර්මිත කරනු කැමැත්තෙමි

**පහදුව-** තිසංසල තවුස් අරමෙකැ සෝබාව හහවන්නට සිතුවමෙහි යම් යම් දෑ ඇඳියැ යුතු. තවුස් අරම අසලින් ගලන මාලිනි නදිය, එහි වැලිතලාවන්හී ලැගුණු හංස මිථුන, නදිය දෙ පසැ හිමාලය කඳු වැටි, කඳු මුලැ ලැගැ සිටින මුවන්, අරමෙහි රුක් සාහී එල්ලූ වැහැරි සිවුරු, එහි මැ ගසක් යට මුවකු ගේ අහකැ වම් ඇස කසන මුවැත්තියක

යන මේ ඇ තත් ලෙයින් තවුස් අරමේ ශාන්ත ස්වාභාවික දර්ශනයන් නිරූපනය කළ යුතු, එසේ මැ ප්‍රේමය විදහාලන යම් යම් දූ ද රූ ගැන්විය යුතු.

18 **අන්වය**- (හෙ) සඛෙ, කණ්ණාර්පිතබන්ධනම් ආගණ්ඩවිලම්බිකෙසරං ශිරීෂං න කෘතම්. සතනාන්තරෙ ශරච්චන්ද්‍රමරීචිකොමලං මෘණාලසූත්‍රං වා න රචිතම්. (වංශස්ථවිල)

**අර්ථ**- මිත්‍රය, කණෙහි පැළැඳි කොපොල දක්වා එල්බෙන කෙසරු ඇති මහරි මලක් නො ඇඳිණි. දෙ පියොවුරු මැද සරා සඳ රැස් මෙන් කෝමල නෙලුඹුදලි හූමය හරෙකින් ද නො සැරසිණි.

19 **අන්වය**- එෂා භවන්තමනුරක්තා කුසුමනිෂණ්ණා මධුකරී තෘෂිතාපි සති (භවන්තං) ප්‍රතිපාලයති. ත්වයා විනා සා මධු න බලු පිබති. (ආර්‍යා)

**අර්ථ**- මේ, තා කෙරෙහි ඇලි මලෙහි හුන් මී මැස්සිය පිපාසිත වුවද (තා ගැන මැ සිතමින්) සිටියි. තාගෙන් වෙන් වැ ඇය මල් පැනි සැබැවින් නො උරයි.

20 **අන්වය**- අක්ලිෂ්ටබාලතරුපල්ලවලොභනීයං මයා රත්‍යොත්සවෙෂු සදයමෙව පීතං ප්‍රියායාඃ බිම්බාධරං, (හෙ) භ්‍රමර, ස්පෘශසි චෙත්. ත්වාං කමලොදර බන්ධනස්ථං කාරයාමි (වසන්තතිලකා)

**අර්ථ**- නො කිළිටි තරු ළපලු වැනි ආශා කටයුතු මා විසින් රති උත්සවයෙහි දී සාදරයෙන් මැ උරන ලද ප්‍රියාවගේ අදර බිඹු, (එම්බා) බමර, පහස්නෙහි නම්, තා පියුම් ගැබැ බැඳුනකු කරමි.

21. **අන්වය**- තන්මයෙන හෘදයෙන සාක්ෂාදිව දර්ශන-සුඛමනුභවතඃ මෙ කාන්තා සම්වෘතිකාරිණා ත්වයා පුනඃඅපි විප්‍රකෘතා (ආර්‍යා)

**අර්ථ-** ඈ කෙරෙහි මැ වූ හද නිසා ප්‍රත්‍යක්‍ෂයෙන් මෙන් දර්‍ශිත සුවය විඳිනා මට සොඳුරිය සිහිකර වූ තා විසින් නැවත ඈය සිතුවම් කරනු ලැබුවා.

22. **අන්වය-** ප්‍රජාගරාත් තස්‍යාඃ ස්වප්නෙ සමාගමඃ බිලීභූතඃ. බාෂ්පස්තු චිත්‍රගතාං අපි එතාං ද්‍රෂ්ටුං න දදාති (අනුෂ්ටුභ්)

**අර්ථ-** නිඳි වැරීමෙන් ඇගේ ස්වප්නයෙහි එක්වීම ද වැලැකිණි. කඳුලු ද සිතුවමෙහි වූ මැ දැකුමට නො දෙයි.

**සමහන්- ආත්මානමිති භණ-** රජු විසින් චිත්‍ර ඵලකය රක්නට කී කලැ විදූෂක "ආත්මාන" ශබ්දයෙන් රජු මැ තැකූ සේ යැ. නො හොත් චිත්‍ර ඵලකය රැකීමෙන් මැ රජු ද රැකියා නම් වේ. දේවිය ගේ උදහසින් හෝ චිත්‍රිත ශකුන්තලා නිසා හෝ රජු ගේ දිවි රැකුනා වේ.

**කාලකූට-** වසුමතී දේවිය සැඩ ඵරුෂ වහා කිපෙන ස්ත්‍රියක හෙයින් කාලකූට යනු යෙදුවා වියැ හැකි.

23. **අන්වය-** ප්‍රජාඃ යෙන යෙන ස්නිග්ධෙන බන්ධුනා වියුජ්‍යන්තෙ ස ස පාපාද් ඍතෙ තාසාම් දුෂ්‍යන්තඃ ඉති ඝුෂ්‍යතාම් (අනුෂ්ටුභ්)

**අර්ථ-** ප්‍රජාවෝ යම් යම් ස්නේහවත් නෑයන් ගෙන් වියෝ වෙති ද ඒ ඒ (අය) ඔවුන් ගේ දුෂ්‍යන්ත යැයි ඝෝෂණය කෙරේවා.

24. **අන්වය-** ආත්මනි සංරොපිතෙ අපි කුලප්‍රතිෂ්ඨා ධර්මපත්නී මයා ත්‍යක්තා නාම, (යා) කාලෙ උප්තබීජා වසුන්ධරා ඉව මහතෙ ඵලාය කල්පිෂ්‍යමාණා [ආසීත්] (උපජාති)

**අර්ථ-** (මගේ) ආත්මය රොපණය කරන ලදුවත් කුලයට ප්‍රතිෂ්ඨාව වූ ධර්මපත්නිය මා විසින් හරනා ලද්දී යැ.

(යම් පත්නියක්) සුදුසු කාලයෙහි වපුල බිජු ඇති පෘථිවිය මෙන් උසස් ඵල පිණිස යොමු වූවා යැ.

**සටහන්-** ආත්මනි සංරොපිතෙ- "ආත්මාවෛජායතෙ පුත්‍රඃ" ආත්ම ශබ්දයෙන් පුත්‍ර යන අරුත් දෙයි. තමා ගේ ආත්මය මැ දරුව යළි උපදින් නම් කුලය රැක්මේ ප්‍රතිෂ්ඨාව ද එය මැ යි.

25. **අන්වය-** නඃ කුලෙ අසමාත් පරං වත යථා ශ්‍රැති සංභෘතානි නිවපනානි කඃ න්‍යවජ්ති ඉති පිතරඃ ප්‍රසූතිවිකලෙන මයා ප්‍රසික්තම් උදකම් නූනං ධෞතාශ්‍රැශෙෂං පිබන්ති (වසන්තතිලකා)

**අර්ථ-** අපේ කුලයේ ම ගෙන් පසු ඒකාන්තයෙන් වේදයෙහි යු සැටියෙන් බොහෝ උවරණින් යුතු පිතෘ පූජාවන් කා දේ දූ යි (සිතමින්) පියවරු (මිතුන් මිත්තෝ) වඳ වූ මා විසින් පුදන ලද ජලය සැබැවින් දෙවුණු කඳුලින් සෙස් වූයේ බොත්.

**සටහන්-** නිවපනානි- පිතෘදනයන්, මළ මිතුන් මිත්තන් වෙනුවෙන් කළ යුතු වෛදෙක්හ දන විධි.

26. **අන්වය-** ආත්මතඃ එව තාවත් අහනි අහනි ප්‍රමාදස්ඛලිතං ඥතුං න ශක්‍යම්. ප්‍රජාසු කඃ කෙන පථා ප්‍රයාති ඉති අශෙෂතඃ වෙදිතුං ශක්තිඃ අස්ති. (උපජාති)

**අර්ථ-** තමා ගේ මැ පළමු කොට, දිනක් දිනක් පාසා ප්‍රමාදයෙන් වන වැරැදි දූන ගැනිමට නො හැක්කෙමි. ප්‍රජාව අතරැ කවරෙක් කවර මාර්ගයෙකින් යේ දූ යි නිරවශෙෂයෙන් දූනීමට හැකියාවක් (කිම) ඇත් ද ?

**සටහන්-** අවිහා- නිර්වේදය හඟවන නිපාතයෙකි. **ගතිභෙදෙන-** සාමාන්‍ය ගමනින් වෙනස් වැ. සවභාවයෙන් කැරෙන ගමනට වඩා වේගයෙන්.

27. **අන්වය**- එෂ අභිනව කණ්ඨශොණිතාර්ථී (අහං) ශාර්දූලඃ පශුමිව, වෙෂටමානං ත්වාං හන්මි. ආර්තානං භය-මපනෙතුමාත්තධන්වා දුෂ්‍යන්තඃ ඉදානීං තව ශරණං භවතු (ප්‍රහර්ෂිණී)

**අර්ථ**- මේ තව ගෙළ ලේ පවසින් පෙළෙන (මම) දිවියෙක් සිවුපාවකු මෙන් දඟලන තා මරමි. පීඩිතයන් ගේ බිය දුරු කිරීමට ගත් දුනු ඇති දුෂ්‍යන්ත දැන් තට පිහිට වේවා.

28. **අන්වය**- යඃ (ඉන්‍ද්‍රඃ) වධ්‍යං ත්වාං හනිෂ්‍යති රක්ෂ්‍යං ද්විජං රක්ෂිෂ්‍යති, හි හංසඃ ක්ෂීරමාදත්තෙ, තන්මිශ්‍රාඃ අපඃ වර්ජයති. (අනුෂ්ටුභ්)

**අර්ථ**- යම් (හියක් නැසියැ යුතු තා නසන්නේ යැ. රැකියැ යුතු බමුණා රකින්නේ යැ. ඒ එසේ මැ යි හංසයා කිරි මැ ගනියි. එය හා මුසු දිය හරියි.

29. **අන්වය**- හරිණා අසුරාඃ තව ශරව්‍යං කෘතාඃ, ඉදං ශරාසනං තෙෂු විකෘෂ්‍යතාම්. සතාං සුහෘත් ජනෙ ප්‍රසාද සෞම්‍යානි චක්ෂූංෂි පතන්ති, දාරුණඃ ශරාඃ න (වංශස්ථවිල)

**අර්ථ**- ඉන්‍ද්‍රයා විසින් අසුරයෝ ඔබ ගේ ඉලක්කය කරන ලදහ. මේ දුන්න ඔවුන් වෙතැ නහවා. හිතවතුන් කෙරෙහි සත්පුරුෂයන් ගේ ප්‍රසාදයෙන් මොළොක් වූ නෙත් වැටෙයි. දරුණු හී නො වැටෙයි.

30. සඃ (දානවගණඃ) කිල තෙ සඛ්‍යුඃ ශතක්‍රතොඃ අජය්‍යඃ. ත්වං තස්‍ය රණශිරසි නිහන්තා සමෘතඃ. යත් නෛශං තිමිරම් උච්ඡෙත්තුං සප්තසප්තිඃ න ප්‍රභවති තත් චන්‍ද්‍රඃ අපාකරොති (ප්‍රහර්ෂිණී)

**අර්ථ**- ඒ (අසුර රැස) වනාහි ඔබ මිතුරු ඉඳුරුට නො දිනියැ හැකි. ඔබ ඔහු ගේ යුද බිමැ දී (ඔවුන්) නසන්නා යි දන්නා ලදී. යම්බඳු නිශාගත අඳුර නැසීමට හිරු අපොහොසත් වෙයි ද එය චන්‍ද්‍රයා දුරලයි.

**සටහන්-** **ශතක්‍රතෝඃ-** පුරාණ මතය අනුව අශ්ව-මේධ යාගයන් සියයක් කළ බැවින් ඉන්ද්‍රයා මෙ නම් වීල. "ක්‍රතු" යනු යාග යන අරුත්හි නො වේ. බල සියයක් ඇත්තා යනු වචනාර්ථයි.

**සප්තසප්තිඃ-** "සප්ත සප්තයඃ අශ්වාඃ යස්‍ය" අසූන් සත් දෙනකු රියේ යොදන බැවින් හිරු මෙ නමින් හැඳින් වේ.

31. **අන්වය-** අග්නිඃ වලිතෙන්ධනඃ ජ්වලති. පතඞ්ගඃ විප්‍රකාතඃ උෂ්ණාං ක්‍රුරුතෙ. හි ප්‍රායඃ ජනඃ සවං මහිමානං ක්ෂොභාත් ප්‍රපද්‍යතෙ (ආර්‍ය්‍යා)

**අර්ථ-** ගින්න සෙලවුණු දර ඇත්තේ දිලියෙයි. නයා කෝප කෙළේ පෙණය නඟයි. ඒ එසේ මැ යි. බෙහෙවින් ජනයා තම් ප්‍රතාපය කැලැඹීමෙන් ලබයි.

32. **අන්වය-** (යාවත්) ඉදම් අධිජ්‍යං ධනුඃ අන්‍යස්මින් කර්මණි ව්‍යාපෘතං තාවත් කෙවලා ත්වත්මනිඃ ප්‍රජාඃ පාලයතු (අනුෂ්ටුභ්)

**අර්ථ-** (යම් තාක්) මේ දිය නැඟු දුන්න වෙනත් කිසෙකැ යොදවන්නේ ද ඒ තාක් හුදෙක් ඔබ කැමැත්තට අනු වැ ප්‍රජාව පාලනය් කෙරේවා.

## සත් වන රඝගය

**අනුපයුක්තම්ව-** "උපයොග රහිතම්ව" නුපුදුස්සකු සේ. ඉන්ද්‍රයා තිසා රජු යම් කිසිවක් කෙළේ ද, එය ඉන්ද්‍රයා ඔහු වෙනුවෙන් කළ පූජෝපහාරයන්ට අලගු තබන්නට වත් නො හැකි.

**අපරිතොෂම්-** "න පරිතොෂඃ පූර්ණසමාධානං" සම්පූර්ණයෙන් සෑහීමට පත් නො වීම. දුෂ්‍යන්ත තමා පිණිස කළ සේවය ඉන්ද්‍රයා ඉතා උසස් සේ සලකයි. එ සේ මැ තමාට කළ ගෞරවාදර සත්කාර ඉතා වැඩි ලෙසින් දුෂ්‍යන්ත සලකයි.

1. **අන්වය-** භවාන් මිරුද්වතඃ ප්‍රතිපත්‍යා ප්‍රථමෝපකෘතං ලඝු මන්‍යතෙ සො'පි භවතඃ අවදාන විස්මිතඃ සත්ක්‍රියා ගුණාන් න ගණයති. (වෛතාලීය)

**අර්ථ-** පින්වත් තෙමේ ඉන්ද්‍රයා තිසා (ගෞරවයෙන්) මුලින් කළ දෙය (මෙහෙය) සැහැල්ලු කොට සිතයි. ඔහු ද ඔබ ගේ පරාක්‍රමයෙන් විස්මිතවූයේ (ඔබට) කළ සත්කාරයන් ගණනට නො ගනියි.

**අවදාන-** (අපදාන) "අවදානං ශුද්ධකර්ම"-( අමර කොෂ) පිවිතුරු කිස· පරාක්‍රමය, විශෙෂ-සාමර්ථ්‍ය.

**සත්ක්‍රියා ගුණාන්-** "පෞනඃ පුණ්‍යෙන කෘතාන් සත්-කාරාන්" නැවත නැවත කළ සත්කාරයන්.

**මනොරථානාමපි අභූමි-** ආශාවනටත් ඉහළින්.

2. **අන්වය-** අනතිකසථං අනනර්ගත ප්‍රාර්ථනං ජයන්තං උද්වීක්‍ෂ්‍ය කෘතස්මිතෙන හරිණා ආමෘෂ්ටවක්‍ෂොහරිචන්දනාඞ්කා මන්දාරමාලා පිනද්ධා.

**අර්ථ-** සිතැ තුළවූ අභිලාෂ ඇති ළඟ සිටි ජයන්ත දෙස බලා කළ සිනා ඇති ඉන්ද්‍රයා විසින් ළයෙහි වූ හරි චන්දනයෙන් ලකුණු වූ මදරා මල්දම (මට) පළඳවන ලදි.

**සටහන්-** **ආමෘෂ්ටවක්‍ෂො හරිචන්දනාඞ්කා-** පැහැසීමෙන් ළයෙහි වූ හරිචන්දන ආලේප තැවරුණු.

3. **අන්වය-** සුඛපරස්‍ය හරෙඃ ත්‍රිදිවං උභයෛඃ උද්ධෘත දානවකණ්ටකං කෘතං අධුනා නතපර්හිඃ තව ශරෛඃ, පුරා පුරුෂ කෙශරිණඃ නඛෛඃ ච (**ද්‍රු**තවිලම්බිත)

**අර්ථ-** සුවයෙහි ලොල් වූ හරිහු ගේ සවගිය දෙදෙනකු විසින් උදුරණ ලද අසුර කටු ඇති කරන ලදී. දැන් දිඝ් සෘජු ඔබ ගේ හී ඊලින් ද, පෙර නෘසිංහයා ගේ නැමුණු පුරුක් ඇති නිය පදුරුවලින් ද වේ.

**පහදුව-** ඉන්ද්‍රයා නිරතුරු පස්කම් සුවයෙහි ගැලී වෙසෙසි. එ හෙයින් ඔහු ගේ ස්වර්ග රාජ්‍යය ආරක්ෂා කිරීමට ඔහුට කාලයෙක් නැති. ඒ බව දත් අසුරයෝ. කලින් කලැ ත්‍රිදශය කරා කඩා-වදිති. මේත් එබඳු අවස්ථාවෙකැ යැ දුෂ්‍යන්ත ස්වර්ගයට කැඳවූයේ. මේ වර ස්වර්ගරාජ්‍යය අසුරයන් ගෙන් මුදා ගැන්මට යැකි වූයේ දුෂ්‍යන්ත ගේ සෘජු-දික් විනි විද යන හි වලට් පින් සිදුවන්නට යැ. මීට පෙර වරෙකැ ත්‍රිදශය මුදා ගත්තේ නෘසිංහාවතාරයට පැමිණි විෂ්ණු විසින් ඔහු ගේ නැමුණු පුරුක් සහිත නියවලින් හිරණ්‍ය කශිපු අසුරයා විදාරණය කිරීමෙනි.

**සටහන්-** නතපර්වභිඃ- ශර පක්ෂයෙහි-දික්-සෘජු. නඛ පක්ෂයෙහි- නැමුණු පුරුක්.

**4. අන්වය-** යත් නියොජ්‍යඃ මහත්සු අපි කර්මසු සිධ්‍යන්ති; තං ඊශ්වරාණාං සම්භාවනාගුණං අවෙහි. අරුණඃ තමසාං විභෙත්තා අභවිෂ්‍යද් වා කිම් සහස්‍රකිරණඃ තං ධූරි න අකරිෂ්‍යත් චෙත්. (වසන්තතිලකා)

**අර්ථ-** යම් හෙයකින් නිලධාරීහු (නියෝජිතයෝ) මහත් ක්‍රියාවන් ද සිදු කෙරෙති. එහෙත් එය ස්වාමීන් ගේ සම්භා- වනාත්මක බලය යි දනුව. (වාසනා ගුණ ය යි දනුව) කිම, අරුණ අඳුරු බිඳින්නා හෝ වී ද, (ඉදින්) සහස් රැස් ඔහු ධූර යෙහි නො යෙදූ වේ නම්.

**පහදුව-** දුෂ්‍යන්ත අසුරන් හා සටනට ගියේ සුර රද ගේ මෙහෙසීමෙනි. එ හෙයින් ඔහු ඉන්ද්‍රයා වෙනුවෙන් මෙහෙ කරන්නෙකි. ස්වාමියා ගේ නියෝගය ලෙස පිළිපැදීමෙන් යම් මැ කාර්යයෙක් සිද්ධ වේ නම් එහි ගෞරවය හා අයිතිය ස්වාමියා සතු යැ. ඒ ඔහු ගේ වාසනා මහිමය නිසා ලැබුවෙකි. බලමු. අරුණ අඳුර බිඳින්නා යැ යි කියමු ද, නො කියමු. ඔහුට මැ හුදු එ බඳු බලයෙක් නැති. හිරු අරුණ සිය රියේ යෙදූ කලැ පමණි ඔහුට එය කළ හැක්කේ.

5. **අන්වය**- අමී දිවෞකසඃ ගීතක්‍ෂමං අපි ජාතං විචින්‍ත්‍ය, සුරසුන්‍දරීණාං විච්ඡිත්තිශෙෂෛඃ වර්‍ණෛඃ කල්පලතාංශුකෙෂු ත්‍වච්චරිතං ලිඛන්ති. (උපජාති)

**අර්ථ**- මේ දෙවියෝ ගීතයට ඔබිනා අරුත් රුස සිතා දෙව්ඟනන් ගේ අංගරාගයෙන් ශෙෂ වූ වර්‍ණයන් ගෙන් කප් තුරුවලින් ගත් වස්ත්‍රයන්හි ඔබ චරිතය ලියති.

**සටහන්**- **විච්ඡිත්ති**- අංගරාග-ශරීරාලෙපන-සුවඳ විලවුන් "විච්ඡිත්තිරඞ්ගරාගෙ'පි හරවිච්ඡෙදයොරපි" යනු විශ්වයි.

6. **අන්වය**- යඃ ගගනප්‍රතිෂ්ඨාං ත්‍රිස්‍රොතසං වහති. ජ්‍යොතීංෂි ච ප්‍රවිභක්තරශ්මි වර්ත්‍තයති; තස්‍ය ව්‍යපෙතරජසඃ ප්‍රවහස්‍ය වායොඃ එෂ ද්විතීය හරිවික්‍රමපූතඃ මාර්‍ගඃ. (වසන්ත තිලකා).

**අර්ථ**- යම් (මාර්‍ගයක්) අහසැ පිහිටි සරස්වතිය උසුලා ද, තාරකාවන් ගේ වෙසෙසින් බෙදුණු රුස් බමවා ද; ඒ පහ කළ රජස් ඇති ප්‍රවාහ නම් වායුවෙන් යුතු මේ දෙවන හරිවික්‍රම යෙන් පිවිතුරු මගයි.

**පහදුව**- රජු සමග එන දෙව් රිය ප්‍රවාහ නම් අහස් මාර්‍ගයට බටුයේයැ. එහි ස්වර්‍ගයෙන් ගලා එන ත්‍රිස්‍රොතස් නම් අහස් ගඟ පිහිටියේ යැ. පොළොව කරා වැටෙන තාරකාවන් ගේ රශ්මිය මේ වායුවෙන් බමවා අහසැ මැ පතුරුවයි. අන් හැම තැන මැ පැතිරී පවත්නා රජස් ද මෙහි නො වේ. වාමන රූපී විෂ්ණු විසින් දෙවන පිය තැබීමෙන් මේ අහස් මග පවිත්‍ර කරන ලද්දේ ද වෙයි.

**සටහන්**- **ත්‍රිස්‍රොතස්**- (ත්‍රිණි ස්‍රොතාංසි යස්‍යාඃ) ජලධාරා තුනක් ඇති-අහස් ගඟ. අහසැ පිහිටි ජලධාරාව සරස්වතී නමින් ද, පොළොව මතැ වූ ජලධාරාව ගංගා නමින් ද, පාතාල ගත වූ ජලධාරාව භගීරථ නමින් ද හඳුන්වති. මේ නම් අවිශෙෂයෙන් ද යෙදේ.

**ප්‍රවිභක්තරශ්මි**- (ප්‍රවිභක්තා රශ්මයඃ යස්මින් කර්මණි යථා තථා) තරු රැස් පෘථිවිය කරා කෙළින් ම නො වැටේ. ඒ ප්‍රවාහ වායුවෙන් ඈඹරී විහිදී යේ. පැරැණියෝ ද රශ්මිය නැමී විහිදී යන බව විශ්වාස කළ සේ යැ. නවීන විද්‍යාඥයන් ගේ පරීක්ෂණ තොරතුරු අනුව ග්‍රහ ලෝක දෙකක් අතර වායුවෙන් හිස් ප්‍රදේශයක් තිබේ. එහි වැටෙන හැම දෙයක් මැ ඉතා වේගයෙන් නො නැවති කැරකෙයි. එ සේ මැ ඉතා මැ සැහැල්ලු ද වේ. ආකර්ෂණයක් ඇත්තේ මැ නැති. චන්ද්‍ර මණ්ඩලය කරා අනාගතයේ යනෙන රොකට් ගුවන් යානා තොටුපළ තැනෙන්නේ මේ ප්‍රවාහවායු තමින් කාලිදාසයන් සඳහන් කැරෙන තැනැ වියැ හැකි.

**ව්‍යපෙතරජසඃ**- පහ වූ රජස් ඇති. විෂ්ණු ගේ පාද-ස්පර්ශයෙන් හෝ පොළොවට ඉතා ඈත අහසේ පිහිටි හෙයින් හෝ රජසින් තොර වූවා වියැ හැකි.

**ද්විතිය හරිවික්‍රමපූතඃ**- දෙවන හරි වික්‍රමයෙන් පිවිතුරු වූ. "විරෝචන පුත්‍ර බලි නම් බලවත් අසුරයෙක් විය. තුන් ලොව මැ යටත් කළ හේ ඉන්ද්‍රයා පවා රාජ්‍යයෙන් පහ කෙළේ යැ. මෙයින් පෙළුණු සුරයෝ ලොව ගලවන සේ විෂ්ණු යැද්දහු යැ. වාමන වෙස් ගත් විෂ්ණු දනපති බලි ගෙන් ඉන්නට බිමක් ලබා ගෙනැ එක් පියවරකින් සවර්ගය ද අනික් පියවරින් පෘථිවිය ද වසා සිට ගති. විෂ්ණු හඳුනා ගත් බලි ඔහුට නමස්කාර කිරීමට හිස නමා සිටියෙන් තෙවන පාදය ඔහු ගේ හිසැ මතැ තබා පාතාලයට තෙරපා දැමී යැ මේ සේ ලොව ගලවා ගත් විෂ්ණු ගේ දෙවන පියවරින් සුර මග පිවිතුරු වූ සේ සලකනු ලැබේ.

**සබාහ්‍යාන්තඃ කරණ**- අභ්‍යන්තර-බාහිර ඉන්ද්‍රියයන් සහිත. ඉන්ද්‍රිය නොහොත් කරණ අභ්‍යන්තර බාහිර විසින් දෙ පරිදි වැ බෙදෙයි. බාහ්‍යකරණ දෙවැදෑරුම්. ඥානේන්ද්‍රිය හා කර්මේන්ද්‍රිය. එ ද පස්-පස් පරිදි වේ. "ශ්‍රොත්‍රං ත්වක්චක්ෂුෂී ජිහ්වා නාසිකා චෛව පඤ්චමී පායූපස්ථං හස්තපාදං වාක් චෛව දශමී සම්මතා"

7. **අන්වය–** අයං තෙ ශිකරක්ලින්නනෙමිඃ, අරවිව-රේභ්‍යඃ නිෂ්පතද්භිඃ වාහකෛඃ, අචිරභාසාං අනුලිප්තෛඃ හරිභිඃ ච වාරිගර්භෝ'දරාණාං ඝනානාං උපරිගතං පිශුනයති. (මාලිනී)

**අර්ථ–** මේ ඔබ ගේ, හිරිකඩින් තෙත් නිම්වළලු ඇති රිය ගරාදි විවර වැටෙන කැදත්තන් ගෙන් ද, විදුලි එළියෙන් දිලිසෙන අශ්වයන් ගෙන් ද, දිය ගැබ් වූ වලාකුළු මතැ යන බැව් හඟවයි.

**පහදුව–** වලාහක මණ්ඩලයට රිය ළඟා විය. ගැටීමෙන් රියේ නිම් වළලු තෙත් වී. වලාකුළු ඇසුරු කළ කැදැත්තෝ වේගයෙන් බසින රිය අර විවරයන් ගෙන් ඇතුළට කා වැදුනෝ යැ. විදුලි කෙටීමෙන් නැගි ආලෝකයෙන් රියෙහි යෙදූ අශ්වයෝ වෙසෙසින් බබලන්නට වන්හ. මේ හේතූන් නිසා දූෂ්‍යන්ත නැගි දෙව් රිය වලාහක මණ්ඩලයට පැමිණි බැව් නියතයෙන් දත්තේ යැ. පොළොවට වැටුණු දිය නො බොන හෙයින් කැදැත්තෝ දිය බීමට වලාකුළු ඇසුරු කෙරෙති. වලාකුළු අතරැ වූ කැදැත්තන් වේගයෙන් බස්නා රියේ ගරාදි අතරින් වැටෙත්තේ උනුදු වේගයෙන් සරසට පියා හඹන හෙයිනි.

**සටහන්–** **වාරිගර්භොදරාණාං–** (වාරි – උදකං ගර්භේ යේෂාං තානි වාරිගර්භාණි-වාරිගර්භාණි උදරාණි යේෂාං තෙ, තෙෂාම්) දිය ගැබ් වූ කුස ඇති. ගර්භ උදර යන එකාර්ථ පද දෙකක් යෙදුම සුදුසු යැ යි නො හැගේ.

8. **අන්වය–** මෙදිනී උන්මජ්ජතාං ශෛලානාං ශිඛරාත් අවරෝහති ඉව පාදපාඃ ස්කන්ධෝ'දයාත් පර්ණා'භ්‍යන්තරලීනතාං විජහති. තනුභාවනෂ්ට සලිලාඃ ආපගාඃ සන්තානාත් ව්‍යක්තිං භජන්ති., පශ්‍ය, උත්ක්ෂිප්තා කෙනා'පි භුවනං මත්-පාර්ශ්වං ආනීයත ඉව (ශාර්දූලවික්‍රීඩිත)

**අර්ථ–** පොළොව (සෙමින්-සෙමින්) උඩට මතුවන ගිරිශිඛරයන් ගෙන් කිඳ බසින්නාක් මෙනි. තුරුහු කඳන්

නැඟීමෙන් කොළ අතර සැඟවුණු බැව් හරිනි. සිහින් වීමෙන් නො පෙනුණු දිය ඇති ගංගාවෝ පැතිරීමෙන් පැහැදිලි බව ලබති. බලනු. කිසිවකු විසින් පොළොව ඔසොවා මා වෙත ගෙන ආවාක් මෙනි.

**පහදුව**- දෙව් රියෙන් දුෂ්‍යන්ත මනුලොවට ළඟා වෙයි. පළමුව මැ පොළොව ඔහුට පෙනෙන්නේ සම-තලා සේ යැ. ලං-ලං වත් මැ කඳු ශිඛර මදින් මද පෙනෙයි. තව-තවත් පහළට එත් මැ ඒවා ද, කෙමෙ . විශාල වෙමින් පෙනේ. එ විටැ පොළොව ගිලෙන්නාක් වැනි වේ. ඉතා ඈත අහසේ සිටැ බලද්දී ගස් එක මැ කොළ වියනක් සේ දිස් වෙයි. පහළට එත් මැ කඳන් ද පැහැදිලි වෙයි. එහෙයිනි ඒවා කොළ අතර සැඟවීම හළේ. මිහිපිට ගලා බස්නා ගංගා මුලින් නො පෙනි පසුව රේඛා වැනි වැ යළි මදින්-මඳ විශාල වෙමින් පෙනෙන්නට පටන් ගති. මේ චමත්කාර දර්‍ශනයන් ගෙන් වශී වූ දුෂ්‍යන්තට තමා පොළොව කරා එනු වෙනුවට පොළොව තමා වෙත කෙනකු ඔසොවා ගෙන ආවාක් මෙන් හැඟී ගියේ යැ.

**සටහන්**- **උන්මජ්ජතාං**- උඩට තෙරීම-මතුවීම.

**පූර්වාපරසමුද්‍රාවගාඪඃ**- පෙරපර මුහුදුවලැ ගිලුණු. පෙරදිග සාගරයේ සිට අපරදිග සාගරය තෙක් පැතුරුණු.

**කනකරසනිස්‍යන්දි**- රන් රස දහර ගලන. හෙම කූටය කනකමය'යි සැලැකේ. එයින් ගලන දිය දහර රන් පැහැ හෝ රන් මුසු හෝ වේ.

**සන්ධ්‍යා ඉව මෙඝ පරිඝඃ**- සැඳෑ වළා පොල්ල-දණ්ඩ වැනි හෝ සැඳෑ වළා පවුරක් වැනි හෝ සැඳෑ වළා පෙළක් වැනි. "පරිඝ" යනු දෙර පොල්ල-අගුල, පෙළ, පවුර යන තන් අරුත්හි වැටේ. හෙමකූටය පෙර දිග සයුරෙහි පටන් අපර දිග සයුර දක්වා පැතිරී සිටී. එය කනකමය හෙයින් සැඳෑ වළා වැනි වැ දිස් වේ වෙසෙසින් ක්‍ෂිතිජය අසල

සන්ධ්‍යා කාලයෙහි වලා රත් පැහැයෙන් යුක්ත යැ. එය දූෂ්‍යන්තට පෙනෙන්නේ සන්ධ්‍යාවලාවන්ගෙන් නිර්මිත දෙර පොල්ලක් මෙනි. නොහොත් සන්ධ්‍යාවලා පේළියක් මෙනි. නොහොත් සන්ධ්‍යාවලා පවුරක් මෙනි.

**කිම්පුරුෂ පර්වත**- කිම්පුරුෂයන් වසන පර්වතය. පුරාණ හූ විද්‍යා අනුව ලෝකය මහාද්වීප සතකට බෙදති. ජම්බුද්වීප, ප්ලක්ෂද්වීප, ශාල්මලද්වීප කුශද්වීප, ක්‍රෞඤ්ච-ද්වීප, සහ ශාක ද්වීප යනුවෙනි. යළිදු මේ එක් එක් ද්වීප වර්ෂ හෝ රාෂ්ට්‍ර නවයකට බෙදති. මෙසේ බෙදුණු එක් එක් වර්ෂය මුහුදකින් වට වී කඳුවලින් ගැවසී ගති. ජම්බුද්වීප වර්ෂ නවය නම් කුරු, හිරණ්මය, රම්‍යක, ඉලාවෘත, හරි, කෙතුමාලා, භද්‍රාශ්ව, කින්නර (කිම්පුරුෂ) සහ භාරතයත් යැ. හෙමකූටය පිහිටියේ හිමාලය කඳු වැටියෙන් උතුරිනි. භාරත වර්ෂය හා කිංනර වර්ෂය අතර පිහිටියේ යැ. මිනිස් හිසකින් හා අශ්ව සිරුරෙකින් ද, අශ්ව සිරුරෙකින් හා මිනිස් හිසෙකින් ද! යුක්තවූවෝ කිම්පුරුෂයෝ යි.

9 **අන්වය**- ස්වායංභුවාත් මරීචෙඃ යඃ ප්‍රජාපතිඃ ප්‍රබභූව. සුරා'සුරගුරුඃ සඃ සපත්නීකඃ අත්‍ර තපස්‍යති. (අනුෂ්ටුභ්)

**අර්ථ**- බඹු ගෙන් උපන් මරීචිගෙන් යම් ප්‍රජාපති-යෙක් පහළ වී ද, සුරා'සුර ගුරුවූ හෙතෙම බිරිඳ සමග මෙහි තපස් කෙරේ.

**පහදුව**- ස්වයම්භූ නමින් දන්නා මහ බඹුගේ මනසින් මරීචි උපන්නේ යැ. මරීචිගෙන් ප්‍රජාපති උපන්නේ යැ. මොහු ප්‍රජාපති, මරීච, කාශ්‍යප යන නම් වලින් හැඳින් වෙයි. සුර අසුරයන් ගේ පියා වූයේ ද මේ තෙමේ යැ. මොහු ගේ භාර්‍යාවන් අතුරෙන් අදිතිය ගෙන් සුරයෝ ද, දිතිය ගෙන් අසුරයෝ ද බිහි වූහ. එ බඳු ප්‍රජාපති අදිති නම් බිරියත් සමග හෙමකූටයෙහි තපස් කෙරෙයි.

10 **අන්වය**— රථා'ඞ්ගනෙමයඃ උපෝඪශබ්දඃ න. රජඃ ප්‍රවර්තීමානං න දෘශ්‍යතෙ. අභූතලස්පර්ශිතයා නිරුද්ධතඃ තව රථඃ අවතීර්ණඃ අපි න දෘශ්‍යතෙ. (වංශස්ථවිල)

**අර්ථ—** රිය සක් නිම්වළලු නො කළ හඬ ඇති, දූවිලි නැගුණු බවෙක් ද නො පෙනේ. බිම නො ගැටීම නිසා නො ගැස්සුණු ඔබ රිය බිමට බට බවැ නො දත හැකි විය.

**පහදුව—** දුෂ්‍යන්ත පැමිණි දෙව් රිය පොළොවට පැමිණියේ යැ. එහෙත් පුදුමයෙකි. අන් රථයන්හි මෙන් නිම්වළලු බිමැ ගැටෙන හඬෙක් නැති. දූවිලි, ඇවිස්සීමෙක් ද නැති ගැස්සීමෙක් කොයින් වේ ද, මේ නිසා දුෂ්‍යන්තට රිය පොළොවට බට බව නො දත හැකි විය. දෙව් රිය පොළොවේ නො ගැටෙන නිසා යැ මේ මෙසේ සිදු වූයේ.

**සටහන්—** **එතානෙව...විශෙෂඃ-** ඉන්ද්‍රයා ගේ හා දුෂ්‍යන්ත ගේ ඇති වෙනස මෙ පමණෙකි. ඉදුරු ගේ රිය පොළොව ස්පර්ශ නො කෙරේ; දුෂ්‍යන්ත ගේ රිය පොළොවැ ගැටෙයි. පොළොව හා අහස ඇසුරු කිරීම දෙ දෙනා අතර ඇති වෙනසයි.

11 **අන්වය—** යත්‍ර අසෞ වල්මීකා'ර්ධ නිමග්නමූර්තිඃ, සංදෂ්ටසර්පත්වචා උරසා, ජීර්ණලතාප්‍රතානවලයෙන කණ්ඨෙ අත්‍යර්ථ සම්පීඩිතඃ. අංසව්‍යාපි ශකුන්තනීඩනිචිතං ජටාමංඩලං බිභ්‍රත්, මුනිඃ ස්ථාණුඃ ඉව අචලඃ අභ්‍යර්කබිම්බං ස්ථිතඃ (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ—** යම් තැනෙකැ තුඹසෙකැ අඩක් ගිලුණු සිරුරු ඇති, ඇළුණු සර්ප සැවක් ළයෙන් දරණ, දිරූවැල් පසුරු වළල්ලෙන් ගෙළ බෙහෙවින් මිරිකුණු, දැලවර තෙක් පැතුරුණු කුරුළු කූඩුවලින් ගහණ වූ ජටා මඬුලු දරණ, මේ (මාරීච) මුනිතෙම කණුවක් මෙන් නො සැලී හිරු මඩල ඉදිරි පිටැ සිටියේ යැ.

**පහදුව -** මාරීච මුනි උග්‍ර තපස් කරයි. හේ ටැඹක් මෙන් නො සැලී හිරු දෙස බලා සමාධි ගතවැ සිටී. එ සේ දිනක්-දෙකක් නොවැ දිර්ඝ කාලයක් නො නැඟී සිටියේ යැ, මෙ සේ දිගු කලක් ගෙවීමෙන් ඔහු අවට බැඳුණු තුඹසෙකි

ඒ තුඹසට ඔහු ගේ සිරුරින් අඩක් අනු වැ ගැලී ගියේ යැ. තුඹසේ වසන සර්පයෝ ඔහු ගේ සිරුර මතැ නිදහසේ හැසිරෙති. සිත්-පිත් නැත්තකු සේ නො සැලී සිටින හෙයින් සැක රහිත සර්පයෝ සැවයනුදු ඔහු මතැ හැරලති. ඒ සැවයන් මුනිහු ගේ ළය මතැ අබරණක් සේ විය. අවට වූ වැල් ද සිරුරැ කලැක් හෙවෙමින්-වැවෙමින් දිරමින් ගෙළ තෙක් නැඟී සිටී. මෙයින් බොටුව ද අතිශයින් පීඩිතවැ-තදවැ සිටුනා සේ යැ. දෙ උර තෙක් ඔහු ගේ ජටා මඬුලු ඇසුරැ කොට කුරුල්ලෝ කැදලි බැඳ සිටිති. හිරු දෙස බලා මේ මුනිතෙම අති දරුණු කෂට ව්‍රතයක් රකින්නේ වේ

12 **අන්වය**- සත්කල්පවෘක්ෂෙ වනෙ උචිතා ප්‍රාණානාං වෘත්තිඃ අනිලෙන, කාඤ්චන පද්මරේණුකපිශෙ තොයෙ ධර්මා'භිෂෙකක්‍රියා. රත්නශිලාතලෙෂු ධ්‍යානම්. විබුධස්ත්‍රීසන්නිධෞ සංයමඃ. යද් අන්‍යමුනයඃ තපොභිඃ කාඞ්ක්ෂන්ති. තස්මින් අමී තපස්‍යන්ති. (ශාර්දූල වික්‍රීඩිත)

**අර්ථ**- යහපත් කප්රුක් ඇති වෙනෙහි අවශ්‍ය දිවි පැවැත්ම පවනින් ද, රන් පැ නෙලුම් රෙණින් පිඟුවන් දියෙහි ධර්මා'භිෂෙක (පාපධොවන) ක්‍රියා ද, රුවන් ගල් තලා-වන්හි ධ්‍යානය ද, දෙව'ඟනන් ඇසුරෙහි (සමීපයේ) සංයමය ද,.(කෙරෙති) යම් තැනක් අන් මුනිහු තපසින් අපේක්ෂා කෙරෙත් ද, එතැනැ මොවුහු තපස් රකිති.

**පහදුව**- මේ තවුස් ගණයා තවුස් දම් රකින්නේ එසේ මෙසේ තැනෙකැ නොවේ. මෙහි අවට සිතූ පැතූ දේ දෙන කප් රුක් එමට වෙයි. ඔවුනට ඕනෑ නම් දිව බොජුන් දිව සලු ඈ ඕනෑ මැ දෑයක් ඒවායින් ලබාගත හැකි. එහෙත් ඔවුහු පවන මැ ආහාර කොට දිවි ගෙවන්නෝ යැ. එය ද ප්‍රමාණවත් පමණ නො ගනිති. එතරම් අල්පෙච්ඡ හා රූක්ෂ තවුස් දහමෙකි ඔවුහු පුරන්නෝ. රන් පියුම් රොන් මුසු වීමෙන් පිඟුවන් වූ පොකුණු ඇතත් එහි ධර්මා'භිෂෙකක්‍රියා මිසැ

විනෝදය පිණිස ජල ක්‍රීඩා නො කෙරෙති. රුවන් ගල්තලා-වන්හි සමාධි වඩති. එහෙත් විනෝදය පිණිස ඒවායේ කල් නො මරති. සිල් රකින්නාහු දිව්‍ය'ප්සරාවන් ඇසුරෙහි යැ. බොහෝ තවුසනට සත්‍රීන් අතරෙහි සංයමය බිඳෙනමුත් මොවුනට සීල සමාධියට ඒ බාධාවක් නො වේ. එය කොතරම් ආශ්චර්‍ය ජනක ද? අන්‍ය තාපසයන් තපස් රැක යම් තැනක් අපෙක්‍ෂා කෙරෙත් ද, මොවුහු ඒ තැනැ සැබැවින් මැ සිටිනාහු යැ. එ නම් හෙම-කූටයෙහි යැ. ඒ තවුස් දම් රැක්ම පිළිබඳ ඉතා ප්‍රසිද්ධ තැනෙකි.

**සටහන්- ධර්‍මා'භිෂෙකක්‍රියා**-පාපධෞවනය පිණිස දියේ ගිලීම. (ධර්‍මචරණාර්ථං යඃ අභිෂෙකඃ-ස්නානම්)

**උපසර්පිනි**- (උපසීසුපරිධාවන්ති) මතුමත්තෙහි දිවෙයි. උතුමන් ගේ අභිලාෂ එකිනෙ'කින් උසස් වැ පවති.

**අනනරාන්වෙෂි**- (අනන්තරං සන්ධිං අන්විෂ්‍යති අසෞ) ඉඩ සොයන්නෙක්. දුෂ්‍යන්ත මාරීචට හඳුන්වා දීමට සුදුසු අවසථාව සොයා දැන්වීමට මාතලී උත්සාහ කරයි.

13 **අන්වය**- මනොරථාය න ආශංසෙ. බාහො: වෘථා කිං ස්පන්‍දසෙ? ශ්‍රෙයඃ පූර්‍ව'වර්‍ධිතං. දුඃඛං හි පරි වර්‍තතෙ. (අනුෂ්ටුභ්)

**අර්‍ථ**- සිතැ'හි පිළිබඳ ආශාවෙක් නැති. එම්බා බාහුව ඇයි නිකරුණේ සැලෙන්නේ. යහපත පෙරැ මැ තෙරපූයෙමි. (දුන්) දුක මැ කැරකෙයි.

**සටහන්- ප්‍රකෘතිම්**-පියෙවි ගති. රජකු තුලැ පිහිටියැ යුතු ධෛර්‍යය.

14 **අන්වය**- ආමර්‍ද ක්ලිෂ්ටකෙසරං අර්ධපීතස්තනං සිංහශිශුං ප්‍රක්‍රීඩිතුං බලාත්කාරෙණ මාතුඃ කර්‍ෂති' (අනුෂ්ටුභ්)

**අර්‍ථ**— (මේ ළදරුවා) රළු වැ ඇදීමෙන් අවුල් වූ කෙසුරු ඇති අඩක් පි තන ඇති සිංහ පොතකයා ක්‍රීඩා පිණිස බලාත් කාරයෙන් මවගෙන් අදී.

16 **අන්වය-** මහතෙජසඃ බීජං අයං බාලඃ එධා'-පෙක්‍ෂඃ ස්ඵුලිඞගා'වස්ථයා ස්ථිතඃ වහ්නිඃ ඉව මෙ ප්‍රතිභාති. (අනුෂ්ටුභ්)

**අර්ථ-** මහත් තේජසෙකැ බීජය වූ මේ ළදරුවා දර අපෙක්‍ෂිත ගිනිපුපුරු අවස්ථාවෙහි සිටි ගින්නක් මෙන් මට වැටහෙයි.

**පහදුව-** දුෂ්‍යන්තට බාලයා මහත් තෙජෝමහිමයක් ඇති අනාගතපුරුෂශ්‍රෙෂ්ඨයකු ගේ අංකුර අවස්ථාවක් සේ පෙනිණ. ගිනි පුපුර ඉතා සුළු නමුත් එහි ද දහන-දිලෙන තෙදවත්කම වෙයි. දර ලද පමණට ගිනිපුපුරෙහි බලය ප්‍රකට කෙරේ. මේ බාලයා ද එ ලෙසින් මහා පුරුෂයකු ගේ අප්‍රකට අවස්ථාවෙහි ද වන ප්‍රභාවත් කමින් අනූනව සිටින්නේ යැ.

16 **අන්වය-** ප්‍රලොභ්‍යවස්තු ප්‍රණය ප්‍රසාරිතඃ ජාලග්‍ර-පිතා'ඞගුලිඃ කරඃ ඉඬරාගයා නවො'ෂසා භින්නං අලක්‍ෂ-පත්‍රාන්තරං එකපඞකජං ඉව විභාති. (වංශස්ථවිල)

**අර්ථ-** ආශා කළ වස්තුව ඉල්ලීම පිණිස දිගු කළ දැලක් මෙන් බැඳුණු ඇඟිලි ඇති අත, දීප්තිමත් රතු පැ ගත් ඉතා අලුයමැ පිපුණු නො පෙනෙන පෙති අතර ඇති එක මැ පියුමක් මෙන් බබලයි.

**පහදුව-** බාලයා ඔහු රිසි දෙය ලබා ගැනීමට අත දිගු කෙළේ යැ. ඔහු අතෙහි ඇඟිලි එකින් එක දැලක් මෙන් අතර නැති වැ බැඳී සිටී. එය සක්විති ලකුණෙකි. ඉතා උදයේ මැ මදක් විකසිත වූ පෙති අතර නො පැහැදිලි එක මැ පියුමක් මෙන් ඒ අත බබලයි. ඉතා අලුයමැ තෙලුම් මදක් විකසිත වන කලැ එහි ඇතුළත අති රක්ත ප්‍රභාව ඉතා රමණීය යැ. මේ බාලයා ගේ අත ද එ වන් රමණීය හා දුර්ලභ ලක්‍ෂණයක් උසුලයි.

**සටහන්- ජාලග්‍රපිතා'ඞගුලිඃ**-"අතිරක්තඃ කරො යස්‍ය ග්‍රපිතා'ඞගුලිකෞ මෘදුඃ, චාපා'ඞ්කිතඃ සො'පි චක්‍රවර්තිං

භවෙන් දාවම්" දූලක් මෙන් ගෙතුණු ඉතා රත් පැ ඇඟිලි ද, සැම් අකුස් ලකුණු තලුද ඇත්තේ ඒකාන්තයෙන් සක්විති වේ ල.

17 **අන්වය**– අනිමිත්තහාසෛඃ ආලක්ෂ්‍යදන්තමුකුලාන් අව්‍යක්තවර්ණරමණීය වචඃප්‍රවෘත්තින් අඞ්කා'ශ්‍රය ප්‍රණයිනඃ තනයාන් වහන්තො ධන්‍යාඃ තදඞ්කරජසා මලිනී භවන්ති. (වසන්තතිලකා)

**අර්ථ**– අහේතුක සිනාවෙන් මඳක් පෙනෙන දත් කැකුළු ඇති, අවියත් වදන්වලින් මනහර වූ කතා ඇති උකුළෙහි හොවා ගන්නා ලෙස යදින දරුවන් උසුලන්නා වූ හෙතු සම්පන්නයෝ ඔවුන්ගේ දූවිල්ලෙන් කිළිටිවූවෝ වෙති.

**අන්වය**– ආශ්‍රමවිරුද්ධවෘත්තිනා ත්වයා සත්වසංශ්‍රයසුඛඃ අපි කෘෂ්ණසර්ප ශිශුනා චන්දනඃ ඉව, සංයමඃ කිං ඉති ජන්මතඃ එවං දූෂ්‍යතෙ. (රථෝද්ධතා.)

**අර්**– තවුස් බිමට නුසුදුසු පැවැත්මෙන් යුතු ඔබ විසින් සතුන් ඇසුර ප්‍රීතිය පිණිස වුවත්, සඳුන් ගස කළු සප් පැටියකු විසින් මෙන්, සංයමය අ යි ජන්මයෙන් මැ කිළිටි කරනු ලබන්නේ?

**සටහන්**– උපතින්. ළදරුවියේ පටන්. (ජායතෙ අස්මාත් ඉති ජන්ම) පියා යන අරුත ගත නොත් සර්පයන් වෙලී සිටිනා සඳුන් ගස් මිනිස්සු ඇසුරු නො කෙරෙති. එහෙයින් සර්‍ව දමන ගේ පියා සියල්ලන් විසින් ඇසුරු කළ යුතු සඳුන් ගසෙකි. එය සර්‍වදමනයන් විසින් හිංසාවත්ගෙන් කිළිටි කරනු ලැබේ. සර්‍ව දමනයන්ගේ පියා සඳුන් ගසෙක් වුවහොත් ඔහු ද සඳුන් පැලයකි. ඔහුගේ මුරණ්ඩුකම් නමැති සර්පයා එය වෙළා සිටියහොත් අන්‍යයෝ සර්‍වදමනයන්ට ආදරය නො කෙරෙති යි ද ගත හැකි යැ.

19 **අන්වය**— කස්‍යා'පි කුලා'ඞ්කුරෙණ අනෙන ස්පෘෂ්ටස්‍ය මම ගාත්‍රෙෂු එවං සුඛම්. අයං යස්‍ය කෘතිනඃ අඞ්ගාත් ප්‍රරූඪඃ, තස්‍ය චෙතසි කාං නිර්වෘතිං කුර්‍යාත්. (උපජාති)

**අර්ථ-** කා ගේ හෝ කුලයකැ බීජයක් වූ මොහු විසින් පහස්නා ලද ම ගේ ශරීරා'වයවයන්හි සුව මෙ බඳු වී නම්; මොහු යම් භාග්‍ය සම්පන්නයකු ගේ ශරීරයෙන් වැඩුනේ ද, ඔහු සිත කෙබඳු තිවුමෙක් කරා ද ?

**සටහන්- අංගාත් ප්‍රරූඪඃ-** සිරුරෙන් වැඩුණු. පුතකු හටගන්නේ පියාගේ සිරුරෙන් හෙයින් මේ යෙදේ.

20 **අන්වය-** පූර්වං රසා'ධිකෙෂු භවනෙෂු ක්ෂිතිරක්ෂාර්ථං නිවාසං උශන්ති. පශ්චාත් තෙෂාං නියතෛකයතිව්‍රතානි තරුමූලානි ගෘහී භවන්ති. (ඖපච්ඡන්දසික)

**අර්ථ-** පළමු වයස (පස්කම්) රස බහුල වූ රාජ භවනයන්හි පෘථිවි රක්ෂණය පිණිස විසුම් කැමැති වෙති. පසු වයසැ ඔවුනට ඒකාන්ත හුදු මුනිවත් රැකීම පිණිස රුක් මුල් ගෘහ වෙති.

**පහදුව**-ළදරුවා පුරුවංශික යෙකැ යි ඇසූ පමණින් දුෂ්‍යන්ත ගේ කුතුහලය ඇවිස්සිණි.පුරුවංශිකයෝ නම් යොවුන් වියැ පස් කම් සුව විඳිමින් රාජ මැඳුරුවලැ දවස් යවති. එ කලැ සුවිසල් මැඳුරු වාසස්ථාන වේ. මහළු වියෙහි දී රජ සුව සිය පුතුනට පවරා තවුස් බව ලබති. එ කලැ ඔවුන් ගේ නිවෙස් රුක් මුල් යැ. ඒ එ සේ නම් මෙ බඳු ළදරුවකු එහි කෙසේ වියැ හැකි ද ?, කිසියම් පුරුවංශිකයකු තවුස් දම් රැක්මට යද්දී පුතකු හෝ මුණුබුරකු ගෙන ගියාහු ද රජ දන්නා තාක් එබන්දකු ගැන සිහි කළ නො හැකි. නො වේ නම් තවුස් බිමට පැමිණි කිසිවකුට සිය බිරියක ගෙන් මේ ළමයා ලැබුණා වියැ හැකි ද ? එ ද නො වන්නෙකි; තවුසෝ බ්‍රහ්මචාරීහු හෙයිනි.

**සටහන්- ආත්මගත්‍යා-** පියෙවි ගමනින්. ස්වභාව ගමනින්.

**පරදාරව්‍යවහාර-** අන් සතු බිරියක ගේ තොරතුරු සෙවීම.

**ශකුන්තලාවණ්‍ය-** ශකුන්ත-ලාවණ්‍ය-කුරුල්ලා ගේ රුව. ශකුන්තලා-වණ්‍ය ශකුන්තලාව ගේ රුව. තවුසිය මැටි මොනරා ගේ ලක්ෂණය බැලීමට කීවා. එ හෙත් සජී දමන මව බැලීමට කීවා සේ සිතී. වචන සමාන කමින් ළදරුවා රැවටුණු සෙයෙකි,

**රක්‍ෂාකරණ්ඩකං**– ආරක්‍ෂා යන්ත්‍රයක්. මෙය සර්ව දමන ගේ පියා පැහැදිලිව, මැ සොයා දැන ගැනීම පිණිස ජාත කර්ම දිනයෙහි දී මාරීච විසින් පළඳවන ලදී.

**උරොනිහිත හස්ත**– දෙ-අත් ළයෙහි තබා. බලාපොරොත්තු නො වූ පුදුමයක් සිදු වූ කලැ අත් ළයෙහි තබනු සිරිති. දුෂ්‍යන්ත සර්ව දමන අතින් ගිලිහුණු යන්ත්‍රය අහුලා ගැනීම නිසා විශ්මයත්, පියා නො වන්නකු ගත හොත් ඔහු ගේ ජීවිත හානිය වන හෙයින් භීතියත් මෙ සේ පළ කැරැවිණි.

**ජාතිකර්ම**- දරුවකු උපන් කලැ පියා විසින් කළ යුතු සංස්කාර විශෙෂයක්. පෙකනිවැල කපන කලැ පියා විසින් ඒ පිණිස උචිත යඥ විධි වලින් පසු වැ ගිතෙල් මී පැනි මුසු වැ ගෙනැ රන් හැන්දකින් ළමයා ගේ දිවේ ගානු ලැබේ.

21. **අන්වය**– පරිධූසරෙ වසනෙ වසානා නියමක්‍ෂාමමුඛී, ධෘතෛකවෙණිඃ ශුද්ධශීලා අතිනිෂ්කරුණස්‍ය මම දීර්ඝං විරහව්‍රතං බිභර්ති (ඖපච්ඡන්දසික)

**අර්ථ**– කිළිටි දෙ-වතක් හැඳ, ව්‍රතය නිසා වැහැරී ගිය මුව ඇති, එක් කොට ගෙතුණු වරල ඇති, පිවිතුරු සිල් ඇති (මැ) ඉතා අකාරුණික මා පිළිබඳ දීර්ඝ විරහ ව්‍රතය (වියෝවත) රකියි.

**පහදුව**- ශකුන්තලා ස්වාමි විරහය නිසා කිළිටි වත් හැඳැ සිටියා යැ. විරහ ව්‍රතය රැකීම නිසා ඉතා කෘශ සිරුරක් දැරුවා යැ. වරල එක් වෙණියක් සේ බැන්දා යැ. පතිව්‍රතා ශීලය පිවිතුරු සේ රැක්කා යැ. ඒ ලෙසින් ඇ දුෂ්‍යන්ත ගෙන් වියෝ වැ අවුරුදු සයක් හෝ සතක් දුක් විඳි බව පැහැදිලි විය.

**සටහන්**- **ධෘතෛකවෙණී**- ස්වාමියා ගෙන් වියෝ වූ බව හැඟවීමට එක් වෙණියක් දැරීම භාරතීය කතුන් ගේ සිරිති. තුනකට හෝ පසකට හෝ බෙදා වරල සාමාන්‍ය කාන්තාවෝ බඳිති,

**විරහවූත**- අබරණ-හිස් සැරසිලි-සුවඳ විලවුන්-කාන්ති මත් වස්ත්‍ර ආදිය නො දැරීම.

22. **අන්වය**- සුමුඛි, දිෂ්ට්‍යා ස්මෘතිභින්නමොහතමසා මෙ ප්‍රමුඛෙ ස්ථිතා'සි උපරාගාන්තෙ රොහිණී ශශිනඃ යොගං සමුපගතා. (ආර්‍යා)

**අර්ථ**- මනා මුව ඇත්තිය, දෛවයෙන් හැඳිනීම නිසා පලවා හැරි මොහඳුර ඇති මා ඉදිරියෙහි ඔබ සිටිති. ග්‍රහණා-'න්තයෙහි රොහිණී තාරකාව චන්ද්‍රයා හා එක්වීමට පැමිණියා.

**පහදුව**- තමා වෙතට පෙර පැමිණි ශකුන්තලා නො දැනීම නිසා පලවා හැරියේ අවාසනාවෙන් යැ යි දුෂ්‍යන්ත ගේ හැඟීම යි. දූන් දෛවයෙන් ඔහු මුළා කළ අඳුර පහවැ ගොස් ප්‍රියාව පිළිබඳ සිහියත්, තමා කළ කුරිරු කමෙහි පසු තැවීමත්, ඇ අහම්බෙන් මුණ ගැසීමත් යන සියල්ල සිදු විය. ග්‍රහණා-'වස්ථාවෙහි රොහිණී තාරකාව සඳින් වියෝ වන ලෙසක් පෙනේ. ග්‍රහණය අවසන් වත් මැ එය ද සඳ ළඟ මැ වෙයි. දුෂ්‍යන්ත-ශකුන්තලා දෙදෙනා ගේ වියොවත්, එක් වීමත් එ සේ යැ.

**සටහන්**- **උපරාගා'න්තෙ**- විශාඛ නැකත උදවත් මැ චන්ද්‍ර ග්‍රහණය වේ රොහිණී තාරකාව එතෙක් නො පැනී, වෙන් වැ සිට යළි සඳ හා එක් වේ. මේ බව ශකුන්තලා ගේ විරහාවස්ථාවේ දී ද රජු මැ කීය. "යදි විශාඛෙ" යනු වෙත්.

23. **අන්වය**- බාෂ්පෙණ ජයශබ්දෙ ප්‍රතිෂිද්ධෙ අපි මයා ජිතම්. යද් අසංස්කාරපාටලොෂ්ඨපුටං තෙ මුඛං දෘෂ්ටම් (අනුෂ්ටුභ්)

**අර්ථ**- කඳුලින් ජය හඬ වැලකුණු නමුදු මම දිනීමි. යම් අව්‍යාජයෙන් (සුදුමැලි) පළොල් වන් තොල් බිඹු ඇති ඔබ ගේ මුව දිටිමි. (එහෙයිනි)

සමාසන්- භාගධෙයානි- ඉරණම හෝ වාසනාව.

24. අන්වය- සුතනු, ප්‍රත්‍යා'දෙශව්‍යලීකං තෙ හෘදයාත් අපෛතු. තද මෙ මනසඃ බලවාන් සම්මොහඃ කිමපි ආසීත්. හි, ප්‍රබලතමසාං ශුභෙෂු එවං ප්‍රායඃ වෘත්තයඃ භවන්ති. අන්ධඃ ශිරසි ක්ෂිප්තාං ස්‍රජං අපි අහිශඞ්කයා ධුනොති. (හරිණී)

අර්ථ- එම්බා මනා අඟ පසඟ ඇත්තිය, එලවා දැමීමෙන් වූ දුක ඔබ හදින් පලවා හරින්නැ. එද, ම ගේ සිතෙහි බලවත් මුළාවෙක් කෙසේ හෝ විය. ඒ එසේ මැ යි. මහත් මොහය නිසා සුභ වස්තුන්හි පවා මෙ බඳු පෙරළි වෙති. අන්ධයා හිස මතැ තැබූ මල් දම නයෙකැ යි යන සැකයෙන් සලයි.

25. අන්වය- සුතනු, අධරං පරිබාධමානං යඃ බාෂ්ප බින්දුඃ මොහාත් මයා පූර්වං උපෙක්ෂිතඃ, ආකුටිලපක්ෂ්ම- විලග්නං තං අද්‍ය තාවත් ප්‍රමෘජ්‍ය, කාන්තෙන, විගතා'නුශයො භවෙයම්. (වසන්තතිලකා)

අර්ථ- සොඳුර, (ඔබ ගේ) අධරය පෙළන්නා වූ යම් කඳුලු බිඳුවක් මුළාවෙන් මා විසින් පෙරැ නො සලකා හරින ලද ද, මඳක් වක් වූ නෙත් පිය'ග රැඳුණු එය (කඳුළු බිඳුව) දැන් පිස-ද, එම්බා ප්‍රියාවෙනි, පහ වූ පසුතැවිලි ඇත්තෙක් වෙමි.

පහදුව- තමා වෙතැ පැමිණැ පිටමං කරන විටැ තද දුකින් නෙතින් ගලා-ආ අධරය පෙලූ කඳුලු එද, දුෂ්‍යන්ත ගේ සැලැකිල්ලට ලක් නො වී යැ. එහෙත් අද අධරය දක්වා තබා, ඇසින් ගිලිහීමට ද පෙරැ ඇස් පියේ ගැටෙන විටැ මැ දුෂ්‍යන්ත සිය අතින් පිස දමයි. එ සේ පිසැ හෙතෙම පසු තැවිල්ලෙන් මිදී සැනසෙයි.

26. අන්වය- අයං තෙ පුත්‍රස්‍ය රණ ශිරසි අග්‍රයායී. දුෂ්‍යන්තඃ ඉති අභිහිතඃ භුවනස්‍ය භර්තා, යස්‍ය වාපෙන

විනිවර්තිතකම් තත් කොටිමත් කුලිශං මඝොනඃ ආභරණං ජාතම්. (වසන්තතිලකා)

**අර්ථ**- මේ තෙම, ඔබ ගේ පුත්‍රයා ගේ රණ බිම්හි ඉදිරි යෙන් යන්නා යැ. දුෂ්‍යන්ත ය යි කියනු ලබන්නා යැ ලෝකය රක්නා යැ යමකු ගේ දුන්තෙන් නිමවන ලද කිස ඇති; (එ හෙසින් මැ) නො මොට විදුරවිය ශක්‍රයා ගේ (හුදු) ආභර ණය වී ද (ඒ මොහු යි)

27. **අන්වය**- ඉදං තත් දක්‍ෂමරීචි සම්භවං ස්‍රෂ්ටුඃ එකාන්තරං ඨාත්ධාං, යත් මූතයඃ ඨාදශධා සජිතස්‍ය තෙජසඃ කාරණං ආහුඃ. යද් භුවනත්‍රයස්‍ය භතීරං යඥභාගෙශ්වරං සුෂුවෙ, යස්මින් ආත්මභුවඃ පරෝ'පි පුරුෂඃ භවාය ආස්පදං චක්‍රෙ. (ශාර්දූලවික්‍රීඩිත)

**අර්ථ**- දක්‍ෂ-මරීචි දෙදෙනා ගෙන් උපන් බඹු ගෙන් එකෙක් වැ ඉපිදූ දෙකට බෙදුණු, මූතිහු දෙළොස් අයුරකින් සිටි තේජසේ (හිරු ගේ පහළ වීමට) හේතුව කිහු ද, එය මැ (මේ යුවළ මැ) තුන් ලොවට සවාමී වූ යාග භාගයන්හි ඉසුරා (ඉන්ද්‍රයා) බිහි කළෝ ද, යම් තැනෙකැ බ්‍රහ්මයාටත් වඩා උසස් පුරුෂයෙක් උත්පත්තිය පිණිස නිවෙස් කෙළේ ද ඒ මේ යුවළ යි.

28. **අන්වය**- භතීා ආඛණ්ඩලසමඃ, සුතඃ ජයන්ත ප්‍රතිමඃ, තෙ අන්‍යා ආශීඃ න යොග්‍යා, පෞලොමිසදෘශි භව. (අනුෂ්ටුභ්)

**අර්ථ**- හිමියා ඉන්ද්‍රයා සම යි. පුතා ජයන්තට සමාන යි. තොපට අන් ආසිරි සුදුසු නො වේ. තී පෞලොමිය සමාන වෙව.

**සටහන්**- ආඛණ්ඩල-' තස්නා-විනාශ කරන්නා. අසුර බල කොටු නැසූ හෙයින් ඉන්ද්‍රයාට මේ නම කියති.

**පෞලොමී**- ඉන්ද්‍ර භාර්‍යාව-පෞලොමන් අසුරයා ගේ දුව.

29. **අන්වය**- දිෂ්ට්‍යා සාධ්වී ශකුන්තලා, ඉදං සදපත්‍යං භවාන් ශ්‍රද්ධා. විත්තං විධිඃ චේ'ති ත්‍රිතයං සමාගතම්. (අනුෂ්ටුභ්)

**අර්ථ**- දෛවය නිසා, සාධුශිලි ශකුන්තලා මේ උතුම් දරුවා සහිත ඔබ ද, ශ්‍රද්ධාව වාසනාව, ක්‍රියාව යන ත්‍රිත්වය හා එක් වූ. (මෙති)

**පහදුව**- ශකුන්තලා - සර්වදමන- දුෂ්‍යන්ත බිරිය-පුත්‍ර-ස්වාමියා යන තිදෙනා යාග කර්මය හා බැඳි ශ්‍රද්ධාව, වාසනාව, ක්‍රියාව යන ත්‍රිත්වය හා සමය. ත්‍රිතයෙන් යාග කර්මය සපිරෙන් නා සේ මේ තිදෙනා ගෙන් වංශස්ථිතිය වේ.

30. **අන්වය**- පූර්වං කුසුමං උදෙති; තතඃ ඵලං. ප්‍රාක් ඝනො'දයඃ; තදනන්තරං පයඃ. අයං නිමිත්ත නෛමිත්තික-යොඃ ක්‍රමඃ. සම්පදඃ තව පසාදස්‍ය තු පරඃ. (වංශස්ථවිල)

**අර්ථ**- පළමු වැ මල් ඇති වෙයි. ඉන් පසු ඵලය යි. ප්‍රථමයෙන් මේඝයන් ගේ පහළ වීම ය; ඊට අනතුරු වැ ජලය යැ මේ නිමිත්ත-නෛමිත්තික දෙදෙනා ගේ පිළිවෙළ යි. සුබ සිද්ධිය ඔබ තුමන් ගේ ප්‍රසාදයට පෙරටු වැ මැ ආයේ යැ.

**පහදුම**- ඵල හේතුව මල යි; වැසි හේතුව මේඝය යි. මේ හේතු-ඵල දෙදෙනා ගේ අනුපිළිවෙල යැ. එහෙත් මාරීච ගේ ප්‍රසාදයට පෙරටු වැ මැ ඵලය උදා විය. මාරීච ගේ ආශිර්වාදයට පෙරතු වැ සිය බිරිය හා දරුවා හමුවීම මේ හේතු-ඵල දෙදෙනා ගේ විපරීත ක්‍රමයක් සේ දුෂ්‍යන්ත අදහස් සෙරේ.

**සටහන්**- **සගොත්‍ර**- (සමානං ගොත්‍රං යස්‍ය සඃ) සමාන වංශයෙකැ උපන්-නැ සබඳ වූ.

31. **අන්වය**- යථා සමක්ෂරූපෙ ගජෝ න ඉති අප-ක්‍රාමති, තස්මින් සංශයඃ ස්‍යාත්; පදනි දෘෂ්ටවා තු ප්‍රතීතිඃ භවෙත්. තථා විධඃ මෙ මනසඃ විකාරඃ. (උපජාති)

**අර්ථ**- යම් සේ තම ඇසට රුව හමු නො වන නෙක් ඇතෙක් නැතැ'යි සැකයෙන් යේ ද, පියවර දක මැ අවබොධය ලබයි. ම ගේ සිතෝ පෙරළිය ද, එබදු (විය.)

**පහදුව**- ඇසට විෂය වූ ප්‍රදෙශයෙහි ඇතකු හෝ ඇත් පියවරක් හෝ නො පෙනෙන කලැ වනයේ ඇතෙක් ඇද්දේ

හෝ නැද්දේ හෝ යි සැකයෙන් මැ යෙති. අහම්බෙන් වාගේ ඇත් පියවර ලකුණක් පෙනුණු විටැ ඇතකු ඒකාන්තයෙන් වෙති යි නිගමනය කෙරෙති. ශකුන්තලා බැහැර කිරීමෙන් පසු ඇ විවාහ කෙළෙම් ද නො කෙළෙම් ද යන සැකය දුෂ්‍යන්ත ගේ සිත තුළ රජයන්නට විය. මුද්ද දුටු කල ඇත් පියවර දුටු කල මෙන් "ඇ විවාහ කෙළෙමි" යි නිගමනයට බැස ගති.

32 **අන්වය**- ශාපාත් හත්‍රි සමෘති රෝධරූක්ෂෙ ප්‍රති-හතා අසි. හත්‍රි අපෙත තමසි තමෙව'ව ප්‍රභුතා. ම්ලො-පහත ප්‍රසාදෙ දර්පණතලෙ ඡායා න මූර්ජති. ශුද්ධෙ තු සුලභා'වකාශා. (වසන්තතිලකා)

**අර්ථ**- ශාපයෙන් හිමියා සිහි විකල වැ රළු වූ කලැ ඔබ පිටමං කරනු ලැබුවෙහි. හිමියා කෙරේහි පහ වූ මොහ'ඳුර ඇති කලැ ඔබ මැ ස්වාමිනිය වූ යෙහි. මළ බැඳීමෙන් නැසුණු පැහැදිලි බව ඇති කැට පතෙහි ඡායාව නො වැටෙයි. එය පිරිසිදු වූ කල (ඡායාවට) සුළභ වූ ඉඩ ඇත්තේ යැ.

**පහදුව**- දුර්වාසස් ගේ ශාපය නිසා දුෂ්‍යන්තට ශකුන්තලා අමතක විය. මුදුව දැකීමෙන් ශාපයා ගේ කෙළවර වීමෙන් දුෂ්‍යන්තට ඇය සිහි විය. දුෂ්‍යන්ත දර්පණය සේ ද, මුළාව දර්පණයේ ඡායාව නො වැටෙන්නට තුබූ රජස් සේ ද ඡායාව ශකුන්තලා සේ ද මෙහි දී සලකන ලදී.

33. **අන්වය**- අනුද්ඝාතස්තිමිතගතිනා රථෙන තීර්ණ-ජලධිඃ අයං සප්තද්වීපාං වසුධාං පුරා ජයති. සත්ත්වානාං ප්‍රසභ-දමනාත් ඉහ අයං සර්ව දමනඃ ලොකස්‍ය භරණාත් පුනඃ භරත ඉති ආඛ්‍යාං යාස්‍යති. (ශිඛරිණී)

**අර්ථ**- නො ගැටෙන නිසල ගමන් ඇති රියෙන් තරණය කළ මුහුදු ඇති මේ සප්තමහා ද්වීපයකින් හෙබි පොළොව සැබවින් දිනයි. සත්ත්වයන් බලයෙන් මැඩලන හෙයින් මෙහි දී මොහු සර්වදමන වේ. ලෝකයා පුස්නා හෙයින් භරත යන නමට පැමිණෙයි.

**පහදුව**- මාරීච සිය දිවසින් දුන අනා වැකියක් පළ කරයි. "සර්වදමන මතු සක්විති වෙයි. ඔහු රිය අහස් ගමන් ඇති හෙයින් කිසිවක නො ගැටෙයි. මුහුදින් වට වූ ද්වීප සතෙකින් හෙබි මේ පොළොව සිය අණසකට නතු කරයි. මෙහි දී කාය බලයෙන් සතුන් මැඩලන හෙයින් මේ බිළිඳ සර්ව දමන නම් වේ. අනාගතයේ ලෝකයා පුස්නා හෙයින් භරත නම් ලබන්නේ යැ"

**සංස්කාර-** වෛදෝක්ත චාරිත්‍ර විධි. ඒ ද්වාදශයෙකි. ගැබ් ගත් දින සිට විවාහය තෙක් මේ සිරිත් පැවැත් විය යුතු ඒවා යැ. (1) ගර්භදාන (2) පුංසවන (3) සීමන්තෝන්නයන (4) ජාතකර්ම (5) නාමකර්ම (6) නිෂ්ක්‍රමණ (7) අන්නප්‍රාශන (8) චූඩා (9) උපනයන (10) කේශාන්ත (11) සමාවර්තන (12) විවාහ. යනු වෙන් දක්වා ඇති අතර තවත් තැනෙක දස අටක් සේ දක්‌ වේ.

34. **අන්වය-** විඩෞජාඃ තව ප්‍රජාසු ප්‍රාජ්‍යවෘෂ්ටිඃ භවතු. විතතයඥඃ ත්වං අපි ස්වර්ගිණඃ ප්‍රීණයස්ව එවං උභයලෝකා-'නුග්‍රහශ්ලාඝනීයෛඃ අන්‍යෝ'න්‍ය කෘත්‍යෛඃ යුගශත පරිවර්-තාන් නයථ. (මාලිනී)

**අර්ථ-** ඔබ ගේ ප්‍රජාව කෙරෙහි ඉන්ද්‍රයා ගේ මහත් වර්‍ෂාව වේවා. පතලා වූ යාග ඇති නුඹ ද දෙවියන් තුටු කෙරෙහිවා. මෙ සේ දෙලොව අනුග්‍රහය නිසා පැසසීමට ලක් අන්‍යෝ'න්‍ය කිසෙන් යුතු වැ යුග සියයක් ඉක්මවන්නහුවා !

**සටහන්- යුගශත පරිවර්තාන්-** හවුරුදු පසක් යුගයෙකි. යුග සියයක් නම් වර්‍ෂ පන්සියයක් වේ. ද්වාපර යුගයේ දී පරමායුෂ වර්‍ෂ 500 ක් හෙයින් මෙ සේ ආශිර්වාද කැරුණු සේ යැ.

**භරතවාක්‍ය-** (භාරතානං - නාටකානාං වාක්‍යම්.) නාට්‍යා'වසානයේ සියලු නළුවන් එක් වැ කියැ යුතු පද්‍යයෙකි. "භරත" යනු "නළු" යන්න සලකා කී සැටි යැ.

36. **අන්වය-** පාර්ථිවඃ ප්‍රකෘතිහිතාය ප්‍රවර්තතාම්. ශ්‍රුත-මහතාං සරස්වතී මහීයතාම් පරිගතශක්තිඃ ආත්මභූඃ නීල-ලෝහිතඃ මමා'පි ච පුනර්භවං ක්‍ෂපයතු. (රුචිරා)

**අර්ථ-** රජු වැසියනට හිත පිණිස පවතීවා. නැණවත් ශ්‍රුතවත් මහතුන් ගේ වදන් පුදුවා ! ව්‍යප්ත වූ මහිමවත් ශිවයා ම ගේ ද පුනර්භවය නසාවා !



